සිළුමිණ

සිළුමිණ The Silumina

- ආරම්භය - 1930 මාර්තු 30
- 92 වැනි කාණ්ඩය 17 වැනි පත්‍රය
- ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී
- ශ්‍රී බුධ වර්ෂ 2564ක් වූ මේෂ රවි 12 භාග බක් පුර තෙළෙස්වක ඉරිදා
- වර්ෂ 2021ක් වූ අප්‍රේල් මස 25 වැනි ඉරිදා

අද පත්‍රය පිටු 104 | මිල රුපියල් 80.00

එතෙර මෙතෙර වරාය නගර 16-17 ▶▶

කොවිඩ් පැතිරීමේ අවදානම ඉදිරි දෙසතියේ භයානකයි

ග්‍රාම සේවා වසම් රැසක් හුදකලා කෙරේ

උපකාරක පන්ති යළි වැසේ

සංචරණ සීමා පැනවේ

දිනක ආසාදිතයෝ 700ට වැඩියි

පාසල් යළි වැසෙයිද?



(තාරක වික්‍රමසේකර)

ඉදිරි සති දෙක තුළ මෙරට කොවිඩ් 19 රෝගීන්ගේ විශාල වර්ධනයක් මෙන්ම රෝග ව්‍යාප්තියක් සිදුවීමට ඉඩ ඇති හෙයින් එය පාලනය කිරීමට ජනතාව උපරිම අවධානය යොමු කළ යුතු බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන වසංගත රෝග විද්‍යාඥ වෛද්‍ය සුදත් සමරවීර සිළුමිණට කීය. ▶ 2 වැනි පිටුවට

මෙවර මැයි රැලි නැහැ

(අමිල මලවිසූරිය)

රටතුළ පවතින කොවිඩ් අවදානම්කාරී තත්ත්වය හමුවේ දේශපාලන පක්ෂ බහුතරයක් විසින් මෙවර මැයි දින පෙළපාළි සහ රැලි නොපැවැත්වීමට සාමූහිකව එකඟ වුවද පක්ෂ කිහිපයක් පමණක් මැයි දින රැස්වීම් සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අනුව පවත්වන බව දන්වා තිබේ.

ඒ අනුව සමසමාජ සහ කොමියුනිස්ට් පක්ෂ ඒකාබද්ධ මැයි දින සැමරුම බොරැල්ල කොමියුනිස්ට් පක්ෂ කාර්යාලයේදී 'වැඩ කරන ජනතා අයිතීන් රැක ගනිමු' තේමාව යටතේ පැවැත්වෙන බව ලංකා සමසමාජ පක්ෂය නිවේදනය කර සිටී.

එමෙන්ම ජනතා විමුක්ති පෙරමුණද මැයි දින රැස්වීම කොළඹ හයිඩ් පාර්ක් පිටියේදී පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති බවත් ඒ සඳහා වගකිව යුතු පාර්ශ්වයන්ගෙන් ඉල්ලීම් කළද නිශ්චිත අවසරයක් ලැබී නොමැති බව ජවිපෙ ප්‍රචාරක ලේකම් විජිත හේරත් කීය. ▶ 2 වැනි පිටුවට

නෝමිබි ඇල්ලූ මාධ්‍යවේදීන් කියන කතා 07 ▶▶

මහනුවර විදුලිබල සේවකයන්ට එරෙහිව පාර මැද්දේ මාර යුද්දේ 13 ▶▶

තහනම් මැයි දින ඉතිහාසය 26 ▶▶

වෙසක් මස ඔබේ ග්‍රහ ඵල 27 ▶▶

වරාය ආර්ථික කොමිසමේ තීන්දුව කථානායකට

කොළඹ වරාය ආර්ථික කොමිසම් සභා කෙටුම්පතට එරෙහි ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වූ නඩුව පසුගිය සිකුරාදා අවසන් විය. ඒ පිළිබඳ තීන්දුව කථානායකවරයා වෙත දන්වන බව විනිසුරු මඬුල්ල දැනුම් දෙන ලදී.

මිහින්තලා මහ සෑයේ හුණු පිරියම් කිරීම 29දා

රාජ්‍ය පොසොන් උත්සවය නිමිත්තෙන් මිහින්තලේ මහ සෑයේ හුණු පිරියම් කිරීම සහ සෙසු විහාරාංගයන්හි තීන්ත ආලේප කිරීමේ සමාරම්භය 29 වැනිදා පෙරවරු 9.00ට මිහින්තලේ රජමහා විහාරාධිපති හා භාරකාර ආචාර්ය වළවාහැංගුණුවැවේ ධම්මරතන හිමියන්ගේ අනුශාසනා හා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන්ගේ හා අගමැති මහින්ද රාජපක්ෂයන්ගේ උපදෙස් පරිදි ආරම්භ කෙරේ.

ව්‍යාපාරික ඩඩ්ලි සිරිසේනගේ අනුග්‍රහයෙන් හුණු පිරියම් කිරීම සහ තීන්ත ආලේපනය සිදු කෙරෙන අතර ලේක්හවුස් සභාපති ජනාධිපති නීතිඥ ඩබ්ලිව්. දයාරත්න අතුළු අධ්‍යක්ෂ මණ්ඩලය සහභාගිත්වයෙන් ආරක්ෂක ලේකම් කමල් ගුණරත්නගේ උපදෙස් පරිදි ගුවන් හමුදාවේ ශ්‍රම දායකත්වයෙන් මේ පින්කම් සිදු කෙරේ.

ඔබ්සර්වර් සහ SLT මොබිටෙල් පාසල් ක්‍රිකට් සම්මාන උලෙළ - 2020

ඔබ්සර්වර් පුවත්පත සහ SLT මොබිටෙල් සංවිධාන කරන වසරේ පාසල් ක්‍රිකට් 2020 සම්මාන උලෙළ අප්‍රේල් 20 වැනිදා පස්වරුවේ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී හිටපු ටෙස්ට් ක්‍රිකට් නායක සනත් ජයසූරියගේ ප්‍රධානත්වයෙන් උත්සවාකාරයෙන් පැවැත්විණි. එහිදී වසරේ විශිෂ්ටතම ක්‍රිකට් ක්‍රීඩකයා ලෙස ගාල්ල මහින්ද විද්‍යාලයේ නවෝද් පරණවිතාන සිසුවා හා වසරේ විශිෂ්ටතම ක්‍රිකට් ක්‍රීඩිකාව ලෙස රජ්ගම දේවපතිරාජ විද්‍යාලයේ කවීෂා දිල්හාරි සිසුවිය සම්මාන ලැබීමෙන් පසු (දකුණ ඡායාරූපය) හා උත්සවයේ ප්‍රධාන අමුත්තා වන සනත් ජයසූරිය සහ එයට එක් වූ විශේෂ ආරාධිතයන් වූ ජනමාධ්‍ය අමාත්‍ය කෙහෙළිය රඹුක්වැල්ල, ලේක්හවුස් ආයතනයේ සභාපති ජනාධිපති නීතිඥ ඩබ්ලිව්. දයාරත්න, එස්එල්ටී මොබිටෙල් ආයතනයේ සභාපති රොහාන් ප්‍රනාන්දු, සන්ඩේ ඔබ්සර්වර් පුවත්පතේ ප්‍රධාන කර්තෘ දිනේෂ් වීරවංශ ඇතුළු පිරිස මෙහි වම් පස ඡායාරූපයේ වෙති. *(ඡායාරූප - සුදත් මලවීර)*

මාස දෙකට අල්ලස් පැමිණිලි 534ක්

(තාරක වික්‍රමසේකර)

මේ වසරේ මාස දෙකක් තුළ අල්ලස් ගැනීම් පිළිබඳ පැමිණිලි 534ක් ලැබී ඇතැයි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පවසයි. එමෙන්ම පසුගිය සිකුරාදා දක්වා වන මේ වසරේ පළමු කාර්තුව තුළ අල්ලස් ගැනීමේ සිද්ධි සම්බන්ධයෙන් පැමිණිලි 917ක් ලැබී ඇතැයිද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පෙන්වා දෙයි. ▶ 2 වැනි පිටුවට

ලිට්‍රෝ ගෑස් හිඟයක් නැතිලු

▶ 2 වැනි පිටුවට

සිම්පල් මෑන්

'කොවිඩ් තැන්කි යූ මවං. උඹ නැත්තං මැයි දවසේ අපේ පක්ෂයේ සාමාජිකයන් කීදෙනෙක් ඉන්නවද කියල මුළු රටම ආයෙත් පාරක් දැන් ගන්නවා.'

මහජන සාමයට ත්‍රිවිධ හමුදාව

මහජන ආරක්ෂාව සහ සාමය පවත්වාගෙන යාම සඳහා දිවයිනේ දිස්ත්‍රික්ක 25ම ආවරණය වන පරිදි ත්‍රිවිධ හමුදාව කැඳවීමට ජනාධිපති විසින් අතිවිශේෂ ගැසට් නිවේදනයක් අප්‍රේල් මස 19 නිකුත් කර තිබේ. ▶ 2 වැනි පිටුවට

පාස්කු වින්දිතයෝ කෝටි 200ක් ඉල්ලා නඩු පවරති

පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් විපතට පත් වූවන් හා ඔවුන්ගේ යැපෙන්නන් විසින් එවකට රාජ්‍ය පාලකයන්ට හා පොලිසියේ ප්‍රධානීන්ගෙන් වන්දි ඉල්ලා නඩු 284ක් ගොනු කර තිබේ. එසේ නඩු පවරා ඇති අය ඉල්ලා ඇති වන්දි මුදල රුපියල් කෝටි 200කට අධිකය. ▶ 2 වැනි පිටුවට

චීන ආරක්ෂක ඇමැති 27දා එයි

තෙදින නිල සංචාරයක් සඳහා චීන ආරක්ෂක ඇමැති ජෙනරාල් වෙයි ෆෙන්ගි අප්‍රේල් 27 වැනිදා ශ්‍රී ලංකාවට පැමිණේ. චීන ජනරජයේ රාජ්‍ය මන්ත්‍රීවරයකුද වන වෙයි ෆෙන්ගි මෙරටට පැමිණෙන පළමු චීන ආරක්ෂක අමාත්‍යවරයා බව කියති.

චීන ආරක්ෂක ඇමැතිවරයා මෙරට රැඳී සිටින කාලසීමාවේදී රාජ්‍ය නායකයන් මෙන්ම ආරක්ෂක ප්‍රධානීන්ද හමුවීමට නියමිතය.

සරසවි යළි කල්යයි පාසල් වැසේද?

- සරසවි ආචාර්යවරුන්ට කොවිඩ් එන්නත දිය යුතුයි
- සරසවි විවෘත කිරීම සෞඛ්‍ය අනුමැතිය හිමිවීමෙන් පසුවයි

● සුභාෂිණී ජයරත්න

කොරෝනා වසංගතය හේතුවෙන් පාසල් වසා දැමීම සිදුවූයේ ඉකුත් වසරේ මාර්තු මාසයේය. ඒ වන විට පාසල් අධ්‍යන වැඩ කටයුතු පවත්වා තිබුණේ මාස දෙක හාමාරකට ආසන්න කාලයක් පමණි. සාමාන්‍යයෙන් පාසල්වල මුල් මාස අනිවාර්යයෙන් වෙන් වන්නේ බාහිර පාසල් වැඩ කටයුතු වෙනුවෙනි. එයිනුත් පාසල් ක්‍රීඩා උත්සව වලට හිමි වන්නේ සැලකිය යුතු ස්ථානයකි. එමෙන්ම පාසල් විනෝද චාරිකා ආදියට වෙන්වීම හා අලුත් සිසුන් ඇතුළත් කිරීම් ආදිය නිසා වසරේ මුල් මාසවල එතරම් දුරට විෂය මාලාව ආවරණය වන්නේ නැත.

නමුත් ලංකාවේ මුල්ම කොවිඩ් ආසාදිතයා වර්තා වීම හා ඔහුගේ දරුවන් කොළඹ ප්‍රධාන පාසලක අධ්‍යාපනය ලැබීම යන කරුණු නිසා මාර්තු මස 11 වැනිදා පාසල් නිවාඩු ලබා දීම සිදුවූ අතර පසුගිය වසර පුරාම පාසල් පවත්වා ඇත්තේ දින 50ත් -70ත් අතර සීමිත දින ගණනක් බව වාර්තා විය.

සාමාන්‍යයෙන් වසරකට පාසල් පැවැත්විය යුතු දින ගණන වසරින් වසරට වෙනස් වෙයි. එහෙත් සාමාන්‍යයෙන් වසරකට දින 194- 210 ක් අතර කාලයක් පාසල් පැවැත්විය යුතු අතර පාසල් විවෘත කළ යුතු කාල සීමාවට අනුව පාසල් විෂය මාලා සකස් වන්නේය.

එහෙත් බාධක මැද මේ සියල්ල සාර්ථකව නිමා කිරීමට හැකි වූයේ දුරස්ථ අධ්‍යාපනය නිසාවෙනි.

- දින 214 න් පාසල් පවත්වා ඇත්තේ දින 50 - 70 ක් පමණයි

- කොවිඩ් නිසා නේවාසික ගැටලු උග්‍රයි

කෙසේ වෙතත් පාසල් පසුගිය වසරේ කොටස් වශයෙන් පැවැතීමට අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු කළ අතර පවත්නා කොවිඩ් තත්ත්වය අනුව සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවසරය මත යළිත් බස්නාහිර පළාත ඇතුළුව ලංකාවේම සියලු පාසල්වල සියලුම ශ්‍රේණි විවෘත වූයේ පසුගිය මාර්තු 29 වැනි දාය.

ඒ කලින් අධ්‍යාපන අමාත්‍යාංශ විසින් දින ලබා දි තිබූ අප්‍රේල් 19 දිනට පෙරය. ඒ අනුව අවුරුදු නිවාඩුව සතියකට පමණ සීමා වූ අතර යළිත් අප්‍රේල් 19 වනිදා පාසල් දෙවැනි වාරය ආරම්භ වූ අතර ගෙවී ගිය සතියේ සිසුන්ගේ පැමිණීම 90% ක් දක්වා සාධනීය මට්ටමක තිබූ බව අධ්‍යාපන අමාත්‍යාංශය සඳහන් කරන්නේය.

කෙසේ වෙතත් අවුරුදු නිවාඩුවෙන් ව්‍යාප්ත වෙමින් පවතින තෙවැනි කොවිඩ් රැල්ල හේතුවෙන් නැවතත් පාසල් වසා දැමේ යැයි යම් පිරිස් අතර අදහසක් පැතිර යමින් පැවැතියද පවතින කොරෝනා තත්ත්වය හමුවේ පාසල් වසා දැමීමට මෙතෙක් කිසිදු තීරණයක් ගෙන නැති බව අධ්‍යාපන අමාත්‍යාංශය පවසයි.

යම් පාසලකින් කොරෝනා ආසාදිතයෙකු හමු වුවහොත් මීට පෙර ක්‍රියාත්මක කළ ආකාරයට එම පාසල්වල පන්ති පමණක් තාවකාලිකව නැවැත්වීමට කටයුතු කරන බව අධ්‍යාපන ලේකම්වරයා පවසා සිටියි.

එසේම නිදහස් අධ්‍යාපනය දරුවන්ගේ අයිතියක් වන හෙයින් එය ආරක්ෂා කර දීමේ වගකීම රජයට ඇති නිසාවෙන් මෙතෙක් දුරස්ථ අධ්‍යාපනයට පමණක් සීමා වූ විශ්වවිද්‍යාල අධ්‍යාපන කටයුතුද එළැඹෙන 27 වැනි දින විවෘත කිරීමට තිබුණද සෞඛ්‍ය නිර්දේශයන්ට අනුකූලව යළි ආරම්භ කිරීම සති දෙකකින් කල් දැමූ බව අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී. ඇල්. පීරිස් ප්‍රකාශ කළේ ය.

කෙසේ වෙතත් පාසල් පවත්වා ගෙන යන්නේ දැඩි සෞඛ්‍ය නිර්දේශවලට යටත්වය. එහිදි විශේෂ අවධානයක් යොමු වන්නේ පන්තියක සිටිය යුතු සිසුන් ප්‍රමාණයය.

(වමේ සිට) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී. ඇල්. පීරිස්, අධ්‍යාපන ලේකම් මහාචාර්ය කපිල සී. පෙරේරා, * විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සභාපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග, ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුදන්ත ලියනගේ, අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ සභාපති වසන්ත මුදලිගේ

මේ පිළිබඳ අධ්‍යාපන ලේකම්වරයා විසින් විශේෂ චක්‍රලේඛයක් නිකුත් කර ඇති අතර ඒ අනුව ලංකාවේ සියලුම පාසල්වලට සිසුන් ගෙන්වා ගැනීම තීරණය වෙයි.

“ පාසල්වලට සිසුන් ගෙන්වීම සම්බන්ධයෙන් සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නව නිර්දේශ ඉදිරිපත් කරන තුරු පසුගිය පාසල් වාරයේ ක්‍රියාත්මක කළ ආකාරයට කටයුතු කරනවා.

ඒ අනුව, පන්තියක සිසුන් සංඛ්‍යාව 15 ට අඩු නම් සියලු සිසුන් දිනපතා පාසල් වෙත කැඳවිය හැකි අතර, සිසුන් 16-30 අතර සිටියි නම් කණ්ඩායම් දෙකක් වශයෙන් ද, 30 ට වැඩි නම් කණ්ඩායම් 3 ක් වශයෙන් ද කැඳවීමට උපදෙස් ලබාදී තියෙනවා. සමාජ දුරස්ථභාවය ආරක්ෂා කිරීම, දෑත් සේදීම, මුඛ ආවරණ පැලඳීම, ආහාර හුවමාරු කර නොගැනීම, නිවසේ පිළියෙල කළ ආහාර පමණක් ගෙන ඒම ඇතුළු සෞඛ්‍ය උපදෙස් පිළිපදිමින් දරුවන් පාසල් වෙත කැඳවීමට සෞඛ්‍ය, ප්‍රවාහන, ආරක්ෂක අංශ ඇතුළු විවිධ පාර්ශ්ව වෙතින් මෙතෙක් ලබා දුන් සහායට කෘතවේදීත්වය පළ කරනවා. “ යැයි අධ්‍යාපන ලේකම් මහාචාර්ය කපිල සී. පෙරේරා සිළුමිණට පැවැසිය.

ලොව පුරා තෙවැනි කොවිඩ් රැල්ල ආරම්භ ව ඇත්තේය. ලංකාවට ආසන්නට රට වන ඉන්දියාවේ මේ වන විට ඉතා දරුණුව කොවිඩ් වසංගතය පැතිර යන්නේය. එහෙයින් එන්නත් ලැබීමේ ප්‍රමාදයක්ද පවතින්නේය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම බලාපොරොත්තු වූයේ සියලු සිසුන්ට හා ආචාර්ය මණ්ඩලයට මේ එන්නත ලබා දීමෙන් අනතුරුව සරසවි විවෘත කරන්නටය.

කෙසේ වෙතත් දැනට දුරස්ත අධ්‍යාපනය ඔස්සේ පවත්වාගෙන යන විශ්වවිද්‍යාල ආරම්භ කිරීමේ දිනය ඉදිරියේදි තීරණය වන අතර මේ සම්බන්ධයෙන් සිළුමිණට අදහස් දැක්වූයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සභාපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංගය.

“ අපිට අවශ්‍ය වූයේ විශ්වවිද්‍යාල ආරම්භ කරන්නට පෙර සියලු සිසුන්ට එන්නත ලබා දීමට. ඉදිරියේදි විශ්වවිද්‍යාල ආරම්භ කළ පසු ඒ සඳහා තම විශ්වවිද්‍යාල තුළට සිසුන් ගෙන්වා ගන්නේ කෙසේද යන්න තීරණය කිරීමට ඒ ඒ උපකුලපතිවරුන්ට සිදු වෙනවා.

විශ්වවිද්‍යාල වසා තිබුණා කියා දරුවන්ගේ අධ්‍යාපනයට කිසිදු ආකාරයේ හානියක් සිදු වුණේ නැහැ. සියලු විභාග පැවැත්වූවා. ඒ වගේම දරුවෝ පවා විශ්වවිද්‍යාලයට පැමිණ අවදානමක් දරා ගැනීමට කැමැති නැහැ. විශේෂයෙන්ම නේවාසිකාගාරවල දැඩි අවදානමක් පවතින නිසා ගොඩාක් දරුවෝ කැමැතියි දුරස්ථ අධ්‍යාපනය ඉදිරියට කරගෙන යාමට. විශ්වවිද්‍යාල නැවත ආරම්භ කිරීමේදි නේවාසිකාගාර ප්‍රශ්නය දැඩිව දැනෙනවා. මෙහි යටිතල පහසුකම් කොවිඩ් සෞඛ්‍ය නිර්දේශයන්ට කොහෙත්ම ගැළපෙන්නේ නැහැ. ඉදිරියේදී සරසවි විවෘත කළ පසු සිසුන්ව ගෙන්වා ගැනීම ඒ ඒ විශ්වවිද්‍යාලවල පවතින පරිසරය උපකුලපතිවරුන්ගේ තීරණය සිදු වෙයි. වෛද්‍ය පීඨවල වෛද්‍යවරු ඉන්නවා. මේ අයගේ සහය අනිවාර්යයෙන්ම ලබා ගත හැකියි.....“ ඒ විශ්වවිද්‍යාල කොමිසමේ සභාපතිවරයාගේ අදහසයි.

ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිසුන් 13,500 ක් පමණ අධ්‍යාපනය ලබති. කැලණිය විශ්වවිද්‍යාලයේ සිසුන් 10,500 ක් පමණ අධ්‍යාපනය ලබති. එසේම රජරට විශ්වවිද්‍යාලයේ සිසුන් 7000 ක් පමණ අධ්‍යාපනය ලබති. පාසල මෙන් නොව මෙයින් බොහෝ සිසුන් සිටින්නේ පොදු නේවාසිකාගාර තුළය. උදාහරණයක් ලෙස ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිසුන් 13,500 න් 8000 ක්ම නේවාසිකාගාරවලය. කොවිඩ් නිර්දේශ අනුගමනය කරයි නම් නේවාසිකාගාර දිය හැකි වන්නේ සිසුන් 1500 කට පමණි. එසේම පාසල් මෙන් නොව සරසවිවල ලංකාවේ සියලු පළාත්වල සිසුන් අධ්‍යාපනය ලබති.

මෙහි ගුරුවරු බොහෝමයක්ම වයස අවුරුදු 50 සම්පූර්ණ වූ නිදන්ගත රෝග ඇති අයය. සරසවි විවෘත කිරීමේදි මේ පිළිබඳ දැඩි අවධානයක් යොමු කළ යුතු වෙයි.

“ කොවිඩ් නිසා අපේ සරසවියේ සිසුන්ට පාඩුවක් වුණේ නැහැ. අධ්‍යාපන කටයුතු වගේම විභාගත් දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේදයෙන්ම කරගෙන ගියා. ශාස්ත්‍ර පීඨ සිසුන් වගේම කළමනාකරණ පීඨවල සිසුන් ඉදිරියෙන්ම මෙහි සාධනීයත්වය පෙන්නුම් කළා. නමුත් සමහර අවස්ථාවලදි භෞතික විභාග සාර්ථක බව පෙන්නුම් වුණා. නමුත් පාසලක් ආරම්භ කිරීම සේ විශ්වවිද්‍යාලයක් ආරම්භ කළ නොහැකියි. නේවාසිකාර මෙන්ම අධ්‍යයන ශාලාවලට සිසුන් ගෙන්වා ගැනීම සංවිධානත්මකව සිදු කළ යුතුයි. එසේම මෙහිදී සිසුන්ගේ කල් ක්‍රියාවද වැදගත්.

මේ නිසා ඉදිරියේදි අපි බලාපොරොත්තු වෙන්නේ අත්‍යාවශ්‍ය විභාග සඳහා පමණක් සිසුන්ව ගෙන්වා ගැනීමටයි. ඒ වගේම අපේ ආචාර්ය මණ්ඩලයෙන් සියයට 50 ක්ම අවුරුදු 50 ට වැඩි අයයි. මේ අය අපි ආරක්ෂා කළ යුතුයි. ඒ වගේම විශ්වවිද්‍යාලවල නේවාසිකාගාර ප්‍රශ්නය ප්‍රබලයි. විවිධ පළාත්වලින් පැමිණෙන නිසා පැතිරිම වේගයෙන් සිදුවිය හැකියි. විශ්වවිද්‍යාල ආරම්භ කළ යුත්තේ මනා සැලසුමකින් අනතුරුවයි. එහෙම නැතිව සරසවි පොකුරක් නිර්මාණය කිරීමේ අදහසක් අපිට නැහැ...“ ඒ ජයවර්ධන පුර විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුදන්ත ලියනගේය.

වසරකට වැඩි දිගු නිවාඩුව නිවසේ සිට අධ්‍යාපනය ලැබූ මේ සිසුන්ට යළිත් සරසවි ජීවිතය අත් විඳීමේ ආසාව ඇත්තේය. ඔවුන්ගේ එකම අභිලාෂයද සරසවි පියසට ගොඩ වීමයි. එහෙත් කොවිඩ් නිසා ඇවැසි පහසුකම් තියේද?

“ විශ්වවිද්‍යාල ආරම්භ කරන්නට ප්‍රායෝගික ප්‍රශ්න ගොඩාක් තියෙනවා. නේවාසිකාගාර, දේශන ශාලා ප්‍රශ්න තියෙනවා. ඒ නිසා විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්ට ලබා දී ඇති නිති රීතිවලට අනුව මේවා ආරම්භ කරන්න අමාරුයි. ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිසුන් 13,000 ක් ඉන්නවා. කැලණියේ සිසුන් 10,500 ක් රජරට සිසුන් 7000 ක් ඉන්නවා. විශ්වවිද්‍යාල ඇරීමට කිසිදු සෞඛ්‍ය ප්‍රතිපාදනයක් හෝ ලබා දී නැහැ. අපිත් කැමතියි විශ්වවිද්‍යාල ආරම්භ කරනවට. ...“ ඒ අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ සභාපති වසන්ත මුදලිගේය.

ජූලියස් සීසර් 02 දා එල්ගින්ස්ටන්හිදී

ශ්‍රී ලංකා ශේක්ෂ්පියර් පදනමේ නිර්මාතෘ ඔබිනාමුණි ගාමිණී ද සිල්වාගේ නාට්‍ය දිවියේ 50 වසර නිමිත්තෙන් ශේක්ෂ්පියර් පදනම නිෂ්පාදනය කරන ජූලියස් සීසර් නාට්‍යය මැයි 02 වැනිදා සවස මරදාන එල්ගින්ස්ටන් රඟහලේදී වේදිකා ගත කිරීමට නියමිතය.

ලෝක සාහිත්‍යයේ ඉතා දරුණු ඝාතනයක් සේ සැලකෙන සීසර් ඝාතන සිද්ධිය මූලිකව නිෂ්පාදිත. ජූලියස් සීසර් වේදිකා නාට්‍යයේ ඔබිනාමුණි ගාමිණී ද සිල්වා, විජේසිරි මැණික්පුර, නිශාන්ත බඹරන්ද, මහේන්ද්‍ර වීරරත්න, මෝක්ෂා සමෝෂි, නිදීශානි විමලරත්න, නිශානී හේරත් බන්නැහැක, රංග වීරකෝන්, මනීෂා බන්නැහැක, අනුර ආටිගල, විමුක්ති බන්නැහැක, කේෂානි වොන්හට්, පත්මා අරඹේගෙදර, ශිරන්ති විතානගේ, නිරෝෂා මධුවන්ති ඇතුළු පිරිසක් එක්ව සිටිති.

ඉන්දීය අනවසර සංක්‍රමණිකයන්ට වැට

ඉන්දියාවේ කොවිඩ් 19 රෝගීන් අසීමිත ලෙස වැඩිවීම නිසා පෝක් සමුද්‍ර සන්ධිය හරහා මෙරට මුහුදු සීමාවට පැමිණෙන ඉන්දීය ධීවරයන් මෙන්ම මත් ජාවාරම්කරුවන් ගැන මෙන්ම අනවසර සංක්‍රමණිකයන් සම්බන්ධ වැඩි අවධානයක් යොමු කිරීමට කටයුතු කර ඇතැයි නාවික හමුදා මාධ්‍ය ප්‍රකාශක කපිතාන් ඉන්දික සිල්වා සිළුමිණට කීය.

නාවික හමුදාපති වයිස් අද්මිරාල් නිශාන්ත උළුගේතැන්න පසුගියදා උතුරේ සංචාරයක නිරතව පළාත් නාවික ආඥාපතිවරන් දැනුම්වත් කර ඇත්තේ කොවිඩ් රෝගය මෙරට ව්‍යාප්ත වීම වැළැක්වීමට අදාළ සියලු පියවර ගන්නා ලෙසය..

ජපානයේ ත්සුකුබා ශ්‍රී ලාංකික මිත්‍ර සංවිධානය විසින් ත්සුකුබා හා අධ්‍යාපන හා පර්යේෂණ ආයතනවල සේවය කරන හා එම ප්‍රදේශයේ අධ්‍යාපනය ලබන සිසුන් හා එහි ආදි විද්‍යාර්ථීන් හා ඔවුන්ගේ පවුල්වල අය එක්ව සංවිධානය කරන ලද අවුරුදු උත්සවයක් ජපානයේ ත්සුකුබා හි පිහිටි ක්‍රීඩාංගණයකදී පවත්වන ලදී. එහිදී ශ්‍රී ලංකාවේ අවුරුදු ක්‍රීඩා සිහි ගන්වමින් කණා මුට්ටි බිඳීමේ ඉසව්ව නව ආකාරයකින් සිදු කළ අතර කුඩා දැරියක එම තරගයට සහභාගි වූ අවස්ථාවකි මේ.

දුම්රිය මුල් පුටුවත් පීලි පැනලා

(තාරක වික්‍රමසේකර)

දුම්රිය සාමාන්‍යාධිකාරි ධුරය පුරප්පාඩු වී මාස කිහිපයක් ගත වුවත් ඒ සඳහා ස්ථිර සාමාන්‍යාධිකාරිවරයකු පත් නොකිරීම නිසා සේවාව පවත්වා ගෙන යාමට නොහැකි වීමත් දුම්රිය දෙපාර්තමේන්තුවේ අනෙකුත් කටයුතු සිදු කර ගැනීමත් අර්බුදයකට පත්ව තිබේ.

අමාත්‍යාංශ මට්ටමින් සම්මුඛ පරීක්ෂණ පවත්වා සුදුසුකම් ඇති 1 ශ්‍රේණියේ පරිපාලන නිලධාරීන්ගෙන් ඉහළම ලකුණු ලැබූ සංඥා ඉංජිනේරුවකු වන ජේ.අයි.ඩී. ජයසුන්දර සාමාන්‍යාධිකාරි ධුරයට පත් කිරීමට සුදුසු බවට නිර්දේශ වී ඇත. එහෙත් වෙනත් වෘත්තීය සමිති විසින් ඉංජිනේරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවීම පිළිබඳව විරෝධය පළ කර නැවතත් සම්මුඛ පරීක්ෂණ කරන ලෙස බලපෑම් කර තිබේ.

1 වැනි පිටුවෙන්

ලිට්‍රෝ ගෑස් හිඟයක් නැතිලු

රට පුරා 14,000කට අධික ගෑස් අලෙවිසල් ජාලය තුළින් පාරිභෝගිකයන්ට හිඟයකින් තොරව ගෑස් ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සලසා ඇතැයි ලිට්‍රෝ ගෑස් සභාපති අනිල් කොස්වත්ත නිවේදනයක් නිකුත් කරමින් පවසා සිටී. ලිට්‍රෝ සමාගම සඳහන් කරන පරිදි ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව නව හයිබ්‍රිඩ් ප්‍රීමියම් ලීටර් 18ක ගෑස් සිලින්ඩරයක් වෙළෙඳ පොළට හඳුන්වා දීමට කටයුතු කර ඇති අතර එය සිවු දෙනකුගෙන් යුත් පවුලක මසක ගෑස් අවශ්‍යතාවය සපුරයි.

කොවිඩ් පැතිරීමේ අවදානම...

පසුගිය උත්සව සමයේ ජනතාව සෞඛ්‍ය උපදෙස් නොතකා කටයුතු කිරීම හේතුවෙන් මේ වසංගත රෝගී තත්ත්වය වර්ධනය වූ බව පෙන්වා දුන් වෛද්‍ය සමරවීර මේ දිනවල පැතිර යන රෝගී තත්ත්වය පෙර වයිරසවලට වඩා පැතිරයාම ශීඝ්‍ර වන්නක් විය හැකි බව හෙළි කෙළේය.

එමෙන්ම මේ වන විට දෙමසකට පමණ පසු යළිත් ග්‍රාම සේවා වසම් හුදකලා කිරීමට සිදුව ඇති අතර එයින් වැඩි වසම් ප්‍රමාණයක් හුදකලා කර ඇත්තේ වයඹ පළාතේ වන අතර සිකුරාදා වන විට හුදකලා කළ ග්‍රාම සේවා වසම් සංඛ්‍යාව 13ක් වූ අතර හුදකලා නොකළද දිවයිනේ ගම්මාන රැසක රෝගීන් වාර්තා වීම නිසා ගම් රැසක පවුල් දහස් ගණනක් ස්වයං නිරෝධායනයට පත් කර තිබේ.

රෝගයට ගොදුරු විය හැකි තරුණ පරපුර හා දරුවන් වැඩි අවධානයක් යොමු කළ යුතු බව සෞඛ්‍ය අංශ අනතුරු අඟවා සිටින අතර පළමු එන්නත ලබා ගත් අයට දෙවන එන්නත ලබා දීමද ලබන මාසයේ ආරම්භ කෙරේ.

මහජන සාමයට...

එය අප්‍රේල් 22 සිට එය බලාත්මකය.ඒ අනුව ශ්‍රී ලංකා යුද හමුදාව, ගුවන් හමුදාව හා නාවික හමුදාව කැඳවීමට කටයුතු කරන බව එම ගැසට් නිවේදනයේ සඳහන් කර තිබේ.

සන්ථව කාව්‍ය විචාර සම්මාන 30 දා

සන්ථව කාව්‍ය විචාර සම්මාන උලෙළ මේ මස 30 දා නිට්ටඹුව බණ්ඩාරනායක පුස්තකාල ශාලාවේදී පැවැත්වේ. ‘2019 වර්ෂයේ ප්‍රකාශිත නූතන ම සිංහල කවිය සහ එහි අභියෝග‘ මැයෙන් මෙහි ප්‍රධාන දේශනය පවත්වනු ලබන්නේ සිසිර කුමාර මහගම විසිනි. මෙහිදී ජයග්‍රාහී ප්‍රශස්ථ මට්ටමේ විචාර උදෙසා සහතික පත්‍ර ප්‍රධානය කෙරෙන අතර, වසරේ විශිෂ්ට ම කාව්‍ය විචාරය උදෙසා සන්ථව කාව්‍ය විචාර සම්මානය පිරිනැමේ.

මෙවර මැයි රැලි...

සමඟි ජන බලවේගයද මැයි දින රැලි නොපවත්වන බව සමඟි ජන බලවේගයේ මහ ලේකම් රංජිත් මද්දුම බණ්ඩාර පැවැසීය.

ශ්‍රීලනිපයද තනි පක්ෂයක් ලෙස මෙවර මැයි රැලිය පොළොන්නරුවේ පැවැත්වීමට තීන්දු කළද කොවිඩ් පැතිරීම මත මැයි දින සැමරුම සිදු නොකරන බව ශ්‍රීලනිප අනුරාධපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී දුමින්ද දිසානායක පැවැසීය.

සෙසු සියලුම පක්ෂද මෙවර මැයි දිනය නොපැවැත්වීමට තීන්දු කර ඇති බවත් උඩරට සහ උතුරු නැගෙනහිර පළාත්හි දේශපාලන සහ වෘත්තීය සමිතිද මැයි දින සැමරුම් සිදු නොකරන බව වාර්තා වේ.

මාස දෙකට අල්ලස් ...

කොමිෂන් සභාවේ නිලධාරියකු පැවසුවේ වසර ආරම්භයේ සිට මේ දක්වා ලද පැමිණිලිවලින් 337ක් විමර්ශනයට මේ වන විටත් කොමිෂන් සභාව විසින් පියවර ගෙන ඇති බවයි.

විමර්ශනය කෙරෙන පැමිණිලි 337න් 276 ක්ම අල්ලස් ලබා ගැනීමේ සිද්ධීන් වන බවත් සෙසු පැමිණිලි 61 වත්කම් සම්බන්ධයෙන් ලැබී ඇති පැමිණිලි බවද එම නිලධාරියා පැවසීය.

පාස්කු වින්දිතයෝ ...

එහි වග උත්තරකරුවන් ලෙස නම් කර ඇත්තේ හිටපු ජනාධිපති, හිටපු අගමැති හිටපු පොලිස්පති ඇතුළු පිරිසකි. ඔවුන්ගේ වරදින් මේ ප්‍රහාරය වළක්වා නොගත් බව පවසමින් අගතියට පත් වූවන් මෙසේ නඩු පවරා ඇති අතර එම නඩු 284න් නඩු නඩු 102ක් කොළඹ දිසා අධිකරණයට හා වන්දි නඩු 182ක් මීගමුව දිසා අධිකරණයේ ගොනු කර තිබේ. .

මේ සම්බන්ධවෙයන් මහජන ආරක්ෂක අමාත්‍ය විශ්‍රාමික රියර් අද්මිරාල් සරත් වීරසේකර පවසන්නේ රජයෙන් නිසි පරිදි නීතිමය ක්‍රියා මාර්ග ගෙන ඇති බවත් අදාළ පුද්ගලයන්ට විරුද්ධව නීතිපතිවරයා විසින් ඉදිරියේදී නඩු පවරා අගතියට පත් වූවන්ට සාධාරණය සිදු කරන බවයි.

ඔබේ කොළඹ වරාය නගරය ගැන දැනගන්න

කොළඹ වරාය නගරය කලාපයේ තරගකාරී ව්‍යාපාරික හා ජීවන රටා ගමනාන්තයක් ලෙස සැලැසුම් කර ඇත. යෝජිත කොළඹ වරාය නගර 2021 ආර්ථික කොමිෂන් සභා පනත කෙටුම්පත් කරන ලද්දේ ගෝලීය ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමටත්, කොළඹ වරාය නගරය පිළිබඳ ව්‍යාපාර කටයුතු සහ රාජ්‍ය අධීක්ෂණය පහසු කිරීමටත්, රජයේ අරමුදල් දායකත්වයන් අවම කිරීමටත් හැකි පරිසරයක් තනි කවුළු පහසුකම් මධ්‍යස්ථානයක් හරහා නිර්මාණය කිරීම සඳහා ය.

මතය: වරාය නගරය මඟින් ශ්‍රී ලංකාවට කිසිදු ආදායමක් උපයා නොදෙනු ඇත.

යථාර්ථය: වෙළෙඳාම් කළ හැකි රජයේ ඉඩම් ප්‍රමාණයේ බදුවලින් 99%ක් සහ සියලුම ප්‍රාදේශීය බදු රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කෙරේ.

මතය: කොළඹ වරාය නගරය ලංකාවේ නීති මගින් පාලනය නොවේ.

යථාර්ථය: BOI කලාප සහ ලොව පුරා පිහිටි ආර්ථික කලාප වල මෙන්, මෙම විශේෂ ආර්ථික කලාපයේ ස්වභාවය අනුව ව්‍යාපාර කටයුතු කිරීමේ පහසුව වැඩි දියුණු කිරීම සඳහා අදාළ වන නිදහස් කිරීම්වලට යටත්ව, ශ්‍රී ලංකා නීතිය මගින් කොළඹ වරාය නගරය පාලනය කරනු ලැබේ.

මතය: කොළඹ වරාය නගරය විසින් කොළඹ මහ නගර සභාව මඟහැර ඇත.

යථාර්ථය: ලොව අනෙකුත් ආර්ථික කලාප වල ආකාරයටම, දේපළ කළමනාකරණ ආයතනයක් විසින් පොදු පහසුකම් සපයනු ලැබේ. කොළඹ වරාය නගරය වැනි විශේෂ ප්‍රදේශයකට මූල්‍ය පිරිවැයක් දරමින් විශේෂඥ දැනුම සහ තාක්ෂණය ලබාගැනීම අත්‍යවශ්‍ය වේ. රජය විසින් වරාය නගරයට එවැනි සේවාවන් සඳහා සහනාධාර ලබාදීම අවශ්‍ය නොවන බව මෙයින් සහතික කෙරේ.

මතය: කොළඹ වරාය නගරය යනු චීන කොලනියකි.

යථාර්ථය: කොළඹ වරාය නගරය සැබැවින්ම ගෝලීය කේන්ද්‍රස්ථානයක් බවට පත්කිරීම සඳහා කොමිෂන් සභාව විසින් ලොව පුරා ආයෝජකයින් වෙත ඉදිරිපත් කෙරෙනු ඇත. වරාය නගරය ඉදිකර ඇත්තේ ෆෝචූන්-500 ආයතනයක් වන චයිනා හාබර් ඉංජිනේරු සංස්ථාව විසිනි. එමඟින් මෙම ව්‍යාපෘතිය සඳහා ඇමෙරිකානු ඩොලර් බිලියන 1.4ක් ආයෝජනය කිරීමට නියමිතය. ඉදිකිරීම් අදියරේ දී යොදාගත් ශ්‍රම බලකායෙන් වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලාංකිකයන් වීම විශේෂත්වයකි.

මතය: වරාය නගරය ශ්‍රී ලංකාවට අයත් නොවේ.

යථාර්ථය: ගොඩ කරන ලද මුළු භූමි ප්‍රමාණයම කොළඹ දිස්ත්‍රික්කයට අයත් රජයේ ඉඩමක් ලෙස 2019 ඔක්තෝබර් මස නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා ඇත. පනත සම්මත වූ පසු මෙම ඉඩම කොළඹ වරාය නගර ආර්ථික කොමිසම වෙත පැවරෙනු ඇත.

මතය: වරාය නගරයෙහි සේවය කරනු ලබන්නේ විදේශිකයන් පමණි.

යථාර්ථය: සෑම අංශයකටම අදාළ රැකියා අවස්ථා ශ්‍රී ලාංකික පුරවැසියන්ට විවෘත වන අතර ඔවුන්ට විදේශ මුදලින් වැටුප් ගෙවනු ලැබේ. මෙය ශ්‍රී ලංකාවේ බුද්ධිගලනය අවම කිරීමට මෙන්ම කම්කරු ශ්‍රමිකයන්ට මෙරටදීම වැඩි ප්‍රමාණයක රැකියා ලබා දීමට මහඟු අවස්ථාවකි.

මතය: පළාත් පාලන ආයතන මඟින් වරාය නගර අධීක්ෂණය මඟහැර ඇත.

යථාර්ථය: ව්‍යාපාර කටයුතු පහසු කිරීම සඳහා කොමිෂන් සභාව ක්‍රියාත්මක වන්නේ සියලු ගනුදෙනු කටයුතු තනි කවුළුවක් තුළින් සිදුවන ආකාරයට ය. කොමිෂන් සභාව සියලු කාරණා සම්බන්ධයෙන් අදාළ පළාත් පාලන ආයතන සමඟ කටයුතු කරනු ඇත.

මතය: කොමිෂන් සභාවේ සාමාජිකයන් නීතියට යටත් නොවන රාජ්‍යයක් පවත්වාගෙන යනු ඇත.

යථාර්ථය: කොමිෂන් සභාවේ සාමාජිකයන් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන අතර සාමාජිකයන් ඉවත් කිරීම ද සිදු කරනු ලබයි. ඔවුහු පාර්ලිමේන්තුවට පිළිතුරු දීමට බැඳී සිටින අතර ශ්‍රී ලංකා අධිකරණයට යටත් වේ.

මතය: ශ්‍රී ලංකා පොලිසියට කොළඹ වරාය නගරය පාලනය කළ නොහැක.

යථාර්ථය: වරාය නගරය තුළ ආරක්ෂක කටයුතු ශ්‍රී ලංකා පොලිසියට භාර වන අතර වරාය නගරය හා සම්බන්ධ සියලුම නඩු ප්‍රාදේශීය අධිකරණ පද්ධතිය තුළ විභාග කරනු ලැබේ. ආශ්‍රිත නඩු සඳහා උසාවියේ දී ප්‍රමුඛතාව ලබා දෙන අතර ආයෝජකයින්ගේ විශ්වාසය වැඩි දියුණු කිරීම සඳහා වේගයකින් හා අනුකූලතාවකින් සමන්විත වාණිජ ආරවුල් විසඳීමේ මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමට නියමිතය.

මතය: ශ්‍රී ලාංකිකයන්ට වරාය නගරයේ දී දේශීය මුදල් භාවිත කළ නොහැක.

යථාර්ථය: ශ්‍රී ලංකා රුපියල් වලින් වරාය නගරය තුළ ගනුදෙනු කිරීම සඳහා අවසර ඇති නමුත් සුළු බද්දකට යටත් වේ. වරාය නගරයෙන් පිටත සිටින වෙළෙඳුන්ට සහ ව්‍යාපාරයන්ට සාධාරණයක් ඉෂ්ඨ වන ආකාරයෙන් මෙම පියවර ගෙන ඇත.

මතය: වරාය නගරය පාර්ලිමේන්තුවට පිළිතුරු දීමට බැඳී නැත.

යථාර්ථය: වරාය නගර පනතට පාර්ලිමේන්තු අධීක්ෂණය ඇතුළත් වේ. පනත යටතේ ක්‍රියාත්මක කරන සෑම රෙගුලාසියක්ම ගැසට් කිරීමෙන් අනතුරුව පාර්ලිමේන්තුව විසින් අනුමත කළ යුතුය.

මතය: වරාය නගර කොමිෂන් සභාව රජයට අමතර පීඩනයක් වනු ඇත.

යථාර්ථය: කොමිෂන් සභාව මුලින් අරමුදල් සපයන්නේ ව්‍යාපෘති සමාගමේ ප්‍රාග්ධනයෙන් වන අතර කල්බදු මුදල් සහ CHEC වරාය නගරයේ අතුරු බදු ගෙවන ඉඩකඩම් වලින් 1%ක ස්වයං අරමුදල් ලබා දෙනු ඇත.

මතය: ශ්‍රී ලාංකිකයන්ට වරාය නගරය තුළ ආයෝජනය කළ නොහැක.

යථාර්ථය: විදේශ සෘජු ආයෝජන ඉහළ නැංවීමේ වරාය නගර පරමාර්ථයට අනුකූලව ශ්‍රී ලංකාවෙන් පිටත එවැනි අරමුදල් රැස් කර ඇති තාක් ඕනෑම ශ්‍රී ලාංකිකයෙකුට වරාය නගරයෙහි ආයෝජනය කළ හැකි ය.

මතය: විදේශිකයන් විසින් සමස්ත වරාය නගරය ම මිල දී ගනු ඇත.

යථාර්ථය: වරාය නගරය තුළ ඉඩම් බදු දීමට හැක්කේ ඉඩම් පනතේ සීමාවන්ට යටත්ව පමණි; එම නිසා සින්නක්කර පදනම මත මාරු කිරීමක් කළ නොහැක. ශ්‍රී ලාංකිකයන්ට සහ විදේශිකයන්ට ඉඩම් බදු දීම සඳහා විවෘතය.

මතය: වරාය නගරය මුදල් විශුද්ධිකරණයේ මධ්‍යස්ථානයක් වනු ඇත.

යථාර්ථය: මුදල් විශුද්ධිකරණය වැලැක්වීමේ පනත, මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත සහ ත්‍රස්තවාදී මූල්‍යකරණය මැඩපැවැත්වීමේ සම්මුතිය ඇතුළුව ශ්‍රී ලංකාවේ බැංකු පනතේ සියලුම වැදගත් අංග වරාය නගරයට ද අදාළ වේ.

මතය: වරාය නගරය බදු තෝතැන්නක් වනු ඇත.

යථාර්ථය: දේශීය ආදායම් පනතට අනුකූලව, අක් වෙරළ සමාගම්වල ඉපැයීම් මේ වන විටත් ආයතනික බද්දෙන් නිදහස් කර ඇත. එබැවින් යම් සමාගමක් වරාය නගරය තුළ හෝ ඉන් පිටත ක්‍රියාත්මක වුව ද අපනයන ඉපැයීම් සඳහා වෙනස් බදු අයකිරීමක් නොමැත.

මතය: වරාය නගරය රටේ සෙසු ප්‍රදේශවලින් හුදෙකලා වනු ඇත.

යථාර්ථය: භෞතික වශයෙන් මෙන්ම සියලු ජාලයන් හරහා කොළඹ වරාය නගරය ශ්‍රී ලංකාවේ සහ එහි ආර්ථිකයේ කොටසක් වනු ඇත. ඕනෑම ශ්‍රී ලාංකික පදිංචිකරුවෙකුට හෝ ව්‍යාපාරයකට වරාය නගරය තුළ සිටින අයට භාණ්ඩ හා සේවා සැපැයිය හැකිය.

මතය: වරාය නගරය වෙත පිවිසීමට අපට වීසා බලපත්‍ර අවශ්‍ය වේ.

යථාර්ථය: සියලු ශ්‍රී ලාංකිකයන්ට වරාය නගරය වෙත නොමිලේ පිවිස ශ්‍රී ලංකා රුපියලින් ගනුදෙනු කරමින් දිවි ගෙවීමට, සේවය කිරීමට, සාප්පු සවාරි යාමට සහ විනෝද වීමට ඉඩ සලසා ඇත.

SEC | SECURITIES AND EXCHANGE COMMISSION OF SRI LANKA

BOI SRI LANKA

සංචාරක අමාත්‍යාංශය
சுற்றுலாத்துறை அமைச்சு
MINISTRY OF TOURISM

කොවිඩ් රෝගීන් ලක්ෂයකට ආසන්නයි

● **සුරේකා නිල්මිණි ඉලංකෝන්**

මෑත ඉතිහාසයේ වැඩිම පිරිසක් පීඩාවට පත්කළ ගෝලීය කොවිඩ් 19 වසංගතය මේ වන විට ලොව පුරා මිලියන 145ක් ආසාදිතයන් බවට පත්කොට මිලියන 3.07ක් මරු වසඟයට ගෙන ඇත. දැනට වසංගතයේ බලපෑම අතින් ලොව දෙවැනි ස්ථානයේ පසුවන ඉන්දියාවේ ඉකුත් 22 වැනිදා පමණක් වාර්තා වූ මරණ සංඛ්‍යාව 2,102කි. ද්විත්ව කොරෝනා විකෘති ප්‍රභේදයට අමතරව ඉන්දියාවෙන් ත්‍රිත්ව කොරෝනා විකෘති ප්‍රභේදයක් ද පැතිර යමින් පවතින බවත් ඉන්දියාවේ දෛනික ආසාදිතයන් දිනපතා ලක්ෂ දෙකට වඩා වැඩි වන්නේ මේ ත්‍රිත්ව කොරෝනා විකෘතිය නිසා බවත් එරට සෞඛ්‍ය අංශ අනතුරු අඟවා ඇත.

මේ වන විට ලොව රටවල් කිපයකින් විකෘතිකරණයට ලක්වූ කොරෝනා වයිරස ප්‍රභේද හමුවී ඇති නමුත් මෙකී ද්විත්ව සහ ත්‍රිත්ව කොරෝනා විකෘති හමුවී ඇත්තේ ඉන්දියාවෙන් පමණි. මේ අතර සිංහල හා හින්දු අලුත් අවුරුදු සැමරුමෙන් පසු ශ්‍රී ලංකාවේ කොවිඩ් ව්‍යාප්තිය වැඩිවීම සම්බන්ධයෙන් දිවයිනේ ප්‍රදේශ රැසකින් රතු එළි දැක්වෙමින් තිබේ.

දෛනිකව වාර්තා වන නව ආසාදිතයන් සංඛ්‍යාව යළිත් ඉහළට

මාස දෙකකට ආසන්න කාලයක් තිස්සේ මෙරට දෛනික කොරෝනා ආසාදිතයන් සංඛ්‍යාව 300ට අඩුවෙන් පවත්වාගෙන ඒමට සෞඛ්‍ය අංශ සමත් වුවද අලුත් අවුරුදු සැමරුමෙන් පසු ඉකුත් 21 වැනිදා පළමු වරට දෛනික කොවිඩ් ආසාදිතයන් සංඛ්‍යාව යළිත් 500 ඉක්මවා ගියේය. අලුත් අවුරුද්දෙන් පසු අයි.ඩී. එච් රෝහලට කොරෝනා රෝගීන් ඇතුළත් වීමේ වැඩිවීමක් සිදුව ඇති බව එම රෝහලේ අධ්‍යක්ෂ වෛද්‍ය හසිත අත්තනායක පැවසූ අතර ඒ අනුව ඉකුත් 21 වැනිදා පමණක් එම රෝහලට අලුත් කොරෝනා රෝගීන් 150 දෙනකු ඇතුළත් වී ඇත. ඉකුත් මාර්තු මාසය වන විට රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටි කොරෝනා රෝගීන් ඉතාමත් අවම මට්ටමකින් වාර්තා වී තිබුණද ඉකුත් සතියෙන් පසු එම ගණන වේගයෙන් වැඩිවූ බවත් මේ වන විට රෝහලේ ඇති හදිසි ප්‍රතිකාර ඒකක දෙකම රෝගීන්ගෙන් පිරී ගොස් ඇති බවත් වාර්තා විය. ඉකුත් 22 වැනිදා මෙරටින් නව කොවිඩ් ආසාදිතයන් 700කට ආසන්න සංඛ්‍යාවක් වාර්තා විය.

මේ අතර අලුත් අවුරුදු උත්සව සමයේදී ජනතාව නොසැලකිලිමත් ලෙස කටයුතු කිරීමෙන් කොවිඩ් -19 වසංගතය තදින්ම පැතිර යෑමේ දැඩි අවදානමක් හට ගැනීම නිසා දැඩි තීන්දු ක්‍රියාත්මක කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය තීරණය කොට ඇත. ඒ අනුව දිනකට අවම වශයෙන් පී. සී. ආර් පරීක්ෂණ 15,000ක් බැගින් සිදු කිරීම, නිරෝධායන නීති දැඩිව ක්‍රියාත්මක කිරීම හා නිරෝධායන නීති කඩකරන්නන්ට එරෙහිව දඬුවම් ක්‍රියාත්මක කිරීම සහ විදේශ රටවල සිට පැමිණෙන පුද්ගලයන් සඳහා විශේෂිත නිරෝධායන නීති අලුතින් සකස් කිරීම ඇතුළු දැඩි පියවර 8ක් වහාම ක්‍රියාත්මක කිරීමට තීන්දු කළ බව සෞඛ්‍ය අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි පැවසුවාය.

ඊට අමතරව රෝහල්වල දැඩි සත්කාර ඒකකවල ඇඳන් ධාරිතාව වැඩි කිරීම, රෝගීන්ට අවශ්‍ය හයිෆ්ලෝ ඔක්සිජන් ලබා දීම, දත්ත රැස් කිරීමේ ක්‍රමවේද ශක්තිමත් කිරීම හා වෛද්‍යවරුන්, හෙදියන් ඇතැම් සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සඳහා ආරක්ෂිත ඇඳුම් වැඩිපුර ලබාදීමටත් පියවර ගෙන ඇත.



උත්සව, සාද අවලංගුයි

ඇස්ට්‍රාසෙනිකා එන්නත ලබා ගැනීමෙන් පසුව රුධිරය කැටි ගැසුණු මෙරට හය දෙනකුගෙන් තිදෙනකු මරණයට පත්ව ඇතැයි සෞඛ්‍ය ඇමතිනී පවිත්‍රා වන්නිආරච්චි ඉකුත් 21 වැනිදා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළාය. මෙම එන්නත ලබා ගැනීමෙන් සති කිහිපයකට පසුව රුධිරය කැටි ගැසුණු රෝගීන් වෙනත් රටවලින් ද වාර්තා වී ඇති බවත් මෙවැනි සිදුවීම් වාර්තා වන්නේ මිලියනයකට 4ත් 6ත් අතර ප්‍රමාණයකින් බවද සඳහන් කළාය. ලෝක සෞඛ්‍ය සංවිධානය රුධිරය කැටි ගැසීම හා එන්නත් අතර සෘජු සම්බන්ධතාවක් හඳුනා ගෙන නැතැයිද ඇමතිවරිය වැඩිදුරටත් සඳහන් කළාය. කෙසේ වෙතත් කොවිඩ් එන්නත ලබා ගැනීමෙන් පසු සංකූලතා ඇතිවුවහොත් ඒ පිළිබඳව දැනුම් දීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 011-3415985 දුරකථන අංකය හඳුන්වා දී ඇත.

කොවිඩ් ආසාදිතයන්ගේ වැඩිවීමත් සමඟ කුරුණෑගල,ගනේවත්ත ප්‍රදේශයේ තිත්තවැල්ගාල ග්‍රාම නිලධාරී කොට්ඨාසයට වහාම ක්‍රියාත්මක වන පරිදි සංචරණ සීමා පනවනු ලැබුවේ ඉකුත් 21 වැනිදාය. එදිනම ගම්පහ දිස්ත්‍රික්කයෙන් කොවිඩ් ආසාදිත මරණ 5ක් වාර්තා විය. මෙරට කොවිඩ් 10 දෙවැනි රැල්ල වාර්තා වූ ගම්පහ දිවුලපිටියෙන් නැවතත් කොවිඩ් පොකුරක් නිර්මාණය වීමේ අනතුරු අඟවමින් දිවුලපිටිය මැල්ලවගෙදර ප්‍රදේශයේ නව ආසාදිතයන් 44 දෙනෙකු එදින වාර්තා විය.

නිරෝධායන නීති දැඩිවෙයි නීති කඩන අයට දැඩි දඬුවම්

ගම්පහ දිස්ත්‍රික්කය තුළ ප්‍රදේශ කිහිපයක මේ වනවිට යළි කොරෝනා රෝග තත්ත්වය ව්‍යාප්තවීමේ අවදානමක් පවතින බැවින් ජනතාව විශේෂ අවධානයක් යොමු විය යුතුයැයි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සඳහන් කළේය. මේ අතර අප්‍රේල් 27 වැනිදා සියලු විශ්වවිද්‍යාල ආරම්භ කිරීමට තීරණය කළඳ සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ලද උපදෙස් මත එම දිනය තවත් සති දෙකකින් කල්දැමීමට අධ්‍යාපන අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිණි.

වැඩිවෙමින් පවතින කොවිඩ් අවදානම හමුවේ මැති ඇමැතිවරුන් පාර්ලිමේන්තු සභාගර්භයේදී හා ඉන් පිටතදී හැසිරිය යුතු ආකාරය සහ කොරෝනා නීති සම්බන්ධයෙන් ඔවුන්ට යළි සිහි කැඳවීම් කෙරෙන නිවේදනයක් කථානායකවරයාගේ උපදෙස් අනුව ඉදිරි දිනවල නිකුත් කරන බව පාර්ලිමේන්තු මහ ලේකම්වරයා සඳහන් කළේය.

මේ අතර ඉදිරි සති දෙක සහ තුනක කාලය ඉතා තීරණාත්මක හා අවදානම් බැවින් ඉදිරියේදී කිසිදු උත්සව අවස්ථාවක ඒකරාශීවීමක් සිදු නොකරන ලෙස සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය අසේල ගුණවර්ධන මහජනතාවගෙන් ඉල්ලා සිටී.

කුලියාපිටිය, දිවුලපිටිය, යාපනය සහ ගම්පහ ප්‍රදේශවල රෝගීන් පොකුරු වශයෙන් වාර්තා වන බැවින් රෝගීන් සංඛ්‍යාව වැඩි වුවහොත් දෛනික PCR පරීක්ෂණ ප්‍රමාණය 15,000ක් දක්වා වැඩිකිරීමට තීරණය කර ඇති බව වසංගත රෝග විද්‍යා අංශයේ ප්‍රධාන වසංගත රෝග විද්‍යාඥ, විශේෂඥ වෛද්‍ය සුදත් සමරවීර සඳහන් කළේය. PCR හා ඇන්ටිජන් කට්ටල අවශ්‍ය තරමට තිබෙන බවත් අලුතින් ලබාගැනීම සඳහා මේ වනවිට කටයුතු කරමින් සිටින බවත් හෙතෙම වැඩිදුරටත් පැවසීය.

කොවිඩ් එන්නතින් සංකූලතා ඇතිවුණොත් 011-3415985 අංකයට කියන්න

කොවිඩ් වයිරසයේ වත්මන් ව්‍යාප්තිය සම්බන්ධයෙන් වැඩිදුරටත් අදහස් දක්වමින් විශේෂඥ වෛද්‍ය සුදත් සමරවීර සඳහන් කළේ මේ දක්වා මෙරට කොවිඩ් ආසාදිතයන් වැඩිවශයෙන් වාර්තා වූයේ අවුරුදු 60ට වැඩි නිදන්ගත රෝග තිබෙන පිරිස අතර වුවත් මේ වනවිට වයස අවුරුදු 30, 40, 50ට අඩු වයස් කාණ්ඩවල පිරිස වැඩිපුර වාර්තා වන බවය.

මේ මොහොත වන විට සමාජය තුළ විශාල ආසාදිතයන් සංඛ්‍යාවක් සිටින බැවින් ඔවුන් හඳුනාගැනීම සඳහා සංචරණ සීමා පැනවීම අත්‍යාවශ්‍ය බව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමයේ සභාපති උපුල් රෝහණ සඳහන් කළ අතර කොරෝනා ව්‍යාප්තිය පාලනය කිරීමට ගතයුතු ක්‍රියාමාර්ග ගැන තීරණය කිරීමට කොරෝනා මර්දන ජනාධිපති කාර්ය සාධක බළකාය ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන්ගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති කාර්යාලයේදී සිකුරාදා පස්වරුවේ රැස්විය. මෙරටට නව කොවිඩ් ප්‍රභේදයක් පැමිණ ඇතැයි ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ප්‍රතිජීව විද්‍යා හා අණුක විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය නිලිකා මලවිගේ සඳහන් කළේ සිකුරාදා පස්වරුවේ පැවැති කොවිඩ් -19 පාලනය පිළිබඳ විශේෂ මාධ්‍ය සාකච්ඡාවේදීය. මීට පෙර වාර්තා වූ කොවිඩ් ආසාදිතයන්ට වඩා මේ මොහොතේ වාර්තා වන ආසාදිතයන්ගේ ලක්ෂණවල යම් යම් වෙනස්වීම් දක්නට ලැබෙන අතර එම වෛරසය වාතය මඟින් බෝවීමක් පෙන්නුම් කරන නිසාවෙන් වෙනදාට වඩා මුව ආවරණ සැලකිලිමත්ව පැලඳීම වැදගත් බව ද මහාචාර්ය නිලිකා මලවිගේ අවධාරණය කළාය.

එම මාධ්‍ය හමුවේදී අදහස් දැක්වූ යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා පැවසුවේ මෙම අවස්ථාවේදී රට වසා දැමීමක් හෝ සංචරණ සීමා පැනවීමක් නොකරන අතර රෝග ව්‍යාප්තිය අනුව ගත යුතු පියවර ගන්නා බවය.

නව ප්‍රභේදයෙන් වළකින්න මුඛ ආවරණ පලඳින්න

ඉදිරි දිනවලදී කොවිඩ් ආසාදිතයන් තවත් ඉහළයෑමේ අවදානමක් ඇති බැවින් නිසි සෞඛ්‍ය උපදෙස් අනුගමනය කරමින් ආරක්ෂා වන්නැයි ජනතාවට දැනුම් දෙන බවද හෙතෙම සඳහන් කළේය. ඒ අනුව සති අන්තයේ නිවෙස්වල සිටින ලෙසත් සංවිධානය කර ඇති චාරිකාවල නිරතවීමෙන් වළකින ලෙසත් ජනතාවගෙන් ඉල්ලා සිටින බව කී හමුදාපතිවරයා තමා කොවිඩ් ආසාදිතයකු වීමෙන් වැළකී සිටීමේ වගකීම සෑම පුරවැසියකුටම පැවරෙන බව ද අවධාරණය කළේය.

දැරණියගල සභාපතිගේ ජල මීටර් කොල්ලේ

● **අමිල මලවිසූරිය**

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් පළාත් පාලන ආයතන 12න් එකක් වන දැරණියගල ප්‍රාදේශීය සභාවේ බලය එක්සත් ජාතික පක්ෂය සතු වේ. 2018 වසරේ පෙබරවාරි 10 වැනිදා පැවැති පළාත් පාලන මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය ඡන්ද 10790ක් ලබාගනිද්දී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ඡන්ද 11460ක් ලබාගත්තද දැරණියගල ප්‍රාදේශීය සභාවේ 'බලය' එජාපය සතු වූයේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මන්ත්‍රීවරු දෙදෙනෙක්ද එජාපයට සහාය දුන් හෙයිනි.

ඒ අනුව වසර 12කට පසුව එනම් 2006 වසරෙන් පසු එජාපය බලයට දැරණියගල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස පත්වීම් ලැබුවේ ලක්ෂ්මන් රාජකරුණා හෙවත් චීප් සයිඩ් රාජාය.

දැරණියගල ලස්සේගම කොට්ඨාසය නියෝජනය කරමින් දේශපාලනයට පිවිස ප්‍රථම වතාවට දැරණියගල ප්‍රාදේශීය සභාවට තේරී පත්වූ ලක්ෂ්මන් සිය පියාගෙන් උරුම වූ ව්‍යාපාර කටයුතුවල නිරත වූ අයෙකි. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස පත්වීම් ලැබ මාස කිහිපයකින්ම එනම් 2018 අගෝස්තු මාසයේදීම ලක්ෂ්මන් ගැන කරළියට ආවේ සමාජ මාධ්‍ය ඇතුළු මාධ්‍යයන්හි සැරිසැරූ වීඩියෝවක් නිසාවෙනි.

එම වීඩියෝවෙන් දිස්වූයේ දැරණියගල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වන ලක්ෂ්මන් ඉතාම පහත් අන්දමින් හැසිරෙමින් අසභ්‍ය වචනයෙන් වැඩිහිටියකුට බැණ වදින ආකාරයයි. මුස්ලිම් ජාතිකයෙකු වන එම වැඩිහිටියාට ජාතිවාදය අවුස්සමින් බැණ වදිමින් තර්ජනය කරන්නෙ දැරණියගල ප්‍රාදේශීය සභාවට අයත් ගොඩනැගිල්ලක පවත්වාගෙන යන එම වැඩිහිටි ව්‍යාපාරිකයාගේ ව්‍යාපාරික ස්ථානය ඉවත් කරගන්නා ලෙසටයි.

ඔහුගේ එම හැසිරීම ඒ දිනවල බොහෝ දෙනෙකුගේ දැඩි දෝෂදර්ශනයට ද ලක්වූයේ මෙවන් දේශපාලනඥයන් සමාජයටද පිළිලයක් බව පවසමිනි. කෙසේ හෝ එදා එලෙස හැසිරුණු එම ප්‍රාදේශීය සභා සභාපතිවරයා පිළිබඳව නැවතත් ගෙවී ගිය සතියේ කරළියට ආවේ රාජ්‍ය දේපළ සොරකම් කිරීමේ වරදට පොදු දේපළ පනත යටතේ පොලිස් අත්අඩංගුවට පත්ව අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු ලබන මස 03 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කිරීම නිසාවෙනි.

ලක්ෂ්මන් රාජකරුණා සිදු කළ මහජන දේපළ සොරකම් කිරීමේ කතාන්දරය මෙලෙසිනි.

ජල සම්පාදන මණ්ඩලය විසින් මීට වසර හයකට පමණ පෙරදී දැරණියගල, සමන්පුරගම ප්‍රදේශයේ ජල ව්‍යාපෘතියක් ආරම්භ කර තිබිණි. පෞද්ගලික සමාගමක් විසින් සිදු කළ එම ව්‍යාපෘතිය සඳහා ගෙනැවිත් තිබූ උපකරණ තොගයක් පසුගිය කාලයේ අතුරුදන් විණි. ඒ

සොරකම් කරන ලද ජල මීටර් තොගය

අතර පසුගිය 28 වැනිදා එම ව්‍යාපෘතියේ සිවිල් ඉංජිනේරුවකු වශයෙන් සේවය කළ අබේවික්‍රම නමැත්තාට එම ව්‍යාපෘතියේම ගබඩා පාලකවරයකු වන කරුණාරත්න නැමත්තා විසින් එම ව්‍යාපෘතියේම රියදුරෙකු වන සංජීව නැමත්තා විසින් පීවීසී බට තොගයක් සොරකම් කර ඇති බවට දැනුම් දී තිබිණි.

එසැණින් සිවිල් ඉංජිනේරු අබේවික්‍රම විසින් සිදුකළ සමීක්ෂණයකදී හෙළි වී තිබුණේ පීවීසී බටවලට අමතරව රුපියල් 1812600 ක් වටිනා පිත්තලවලින් සාදන ලද ජල මනු 477 ක් හා රුපියල් 621000ක් වටිනා ෆේරුල්වෑල් 540 ක්ද අතුරුදන් වී ඇති බවයි. ඒ අනුව රුපියල් 2433600ක් වටිනා උපකරණ තොගයක් අතුරුදන්ව ඇති බවට එම සිවිල් ඉංජිනේරුවරයා විසින් පසුගිය 30 වැනිදා දැරණියගල පොලිසියට පැමිණිල්ලක් යොමු කෙරිණි.

ඒ අනුව දැරණියගල පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක වසන්ත අලහාකෝන්ගේ මෙහෙයවීමෙන් විමර්ශනයක් ආරම්භ කෙරුණේ එහි අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක රදලගේ ඇතුළු කණ්ඩායම විසිනි. එම විමර්ශනයේ ප්‍රතිඵලයක් ලෙස පසුගිය 01 වැනිදා මහියංගනය,පදියතලාව පාර,45 කණුව පදංචි එහි ගබඩා පාලක කරුණාරත්න මුදියන්සේලාගේ සුනිල් කරුණාරත්න අත්අඩංගුවට ගනු ලැබුවේ සමන්පුරගමදියි. ඔහුගෙන් සිදුකළ ප්‍රශ්න කිරීම් හමුවේ එම ව්‍යාපෘතියේ රියැදුරකු වන දැරණියගල සමන්පුරගම පදිංචි සංජීව කුමාරට එම උපකරණ තොගය ලබාදුන් බවට හෙළි විණි. ඒ අනුව එදිනම සංජීවද පොලිස් අත්අඩංගුවට ගැනිණි. සංජීව පොලිසියට පාපෝච්චාරණය කළේ එම උපකරණ තොගය ගබඩා පාලක කරුණාරත්නගෙන් ලබාගෙන තමා විසින් එම භාණ්ඩ වෙනස්කොට ඉන් ප්‍රමාණයක් දැරණියගල, උඩපොල වත්තෙහි පදිංචි දැරණියගල නගර මධ්‍යයේ පරණ යකඩ බඩු එක්රැස්කරනා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන ගෝවින්ද සාවි ගජේන්ද්‍රන්ට විකුණු බවයි. ඒ අනුව අදාළ බඩු තොගය සමඟ ගෝවින්ද සාවිද පොලිස්

සොරකම් කරන ලද ජලනළ උපකරණ තොගය පරීක්ෂා කරන දැරණියගල පොලිස් ස්ථානාධිපති වසන්ත අලහකෝන් ප්‍රමුඛ නිලධාරිහු

අත්අඩංගුවට පත්වූයේ පසුගිය 01 වැනිදාමයි. එසේම සංජීව විසින් එම උපකරණ තොගයෙන් කොටසක් දැරණියගල කොස්ගහකන්ද මියනවිට පදිංචි අමරසිරි කරුණාරත්නටද විකුණු බව හෙළි වීමත් සමඟ විමර්ශන නිලධාරිහු එදිනම ඔහුද අත්අඩංගුවට ගත්හ.

අමරසිරි පිත්තල වැඩ පොළක් පවත්වාගෙන යන්නෙකි. ඔහු සන්තකයේ තිබී සොරකම් කරන ලද ජලනළ කොටස් කිලෝ 28 ග්‍රෑම් 45 කවර දෙකක බහා තිබිය දී පොලීසිය විසින් අත්තඩංගුවට ගැනිණි. එසේ ජල ව්‍යාපෘතියේ උපකරණ සොරකම් කිරීම නිසා අත්අඩංගුවට පත් සිවුදෙනා අප්‍රේල් මස 02 වැනිදා අවිස්සාවෙල්ල මහෙස්ත්‍රාත් අධිකරණය වෙතට ඉදිරිපත් කිරීමෙන් පසු රක්ෂිත බන්ධනාගාරගත කෙරිණි. මේ අතර මෙකී සොරකම සම්බන්ධ-

දැරණියගල ප්‍රාදේශීය සභාව

සැකකාර දැරණියගල ප්‍රාදේශීය සභා සභාපති ලක්ෂ්මන් රාජකරුණා සහ තවත් සැකකරුවෙක් අධිකරණයෙන් බන්ධනාගාරයට රැගෙන ගිය අයුරු.

යෙන් දැරණියගල පොලිස් ස්ථානාධිපතිවරයාට තොරතුරුකරුවකුගෙන් තවත් හෝඩුවාවක් ලැබුණේ පසුගිය 16 වැනිදායි.

ඒ, දැරණියගල ප්‍රාදේශිය සභාවේ සභාපති ලක්ෂ්මන්ගේ සහෝදරයකුගේ ලස්සේගම පිහිටි නිවෙසකද සොරකම් කරන ලද ජල ව්‍යාපෘතියේ උපකරණ තොගයක් තිබෙන බවටයි. ඒඅනුව ස්ථානාධිපතිවරයාගේ මෙහෙයවීමෙන් එදින රාත්‍රියේම එම නිවෙසට ගිය පොලිස් නිලධාරීන්ට සභාපතිවරයාගේ මියගිය සහෝදරයාගේ බිරියගෙන් කළ ප්‍රශ්න කිරීම් හමුවේ සොරකම් කරන ලද ජලනළ උපකරණ ගැන හෝඩුවාවක් ලැබිණි.

ඒ, පසුගිය දිනෙක එම නිවෙසේ තිබී ජල මීටර් සහිත පෙට්ටි දෙකක් සභාපතිවරයාගේ මවගේ නිවෙසට රැගෙන ගිය බවයි. එසැණින් එම නිවෙසටද ගිය පොලිස් නිලධාරීන්ට නිවෙස පරීක්ෂාවේදී පෙට්ටිවල අසුරා තිබූ ජල මීටර් 98 ක් සොයා ගැනීමට හැකි විණි. ජල මීටර් තොගය එකී නිවෙසේ තිබියදී පොලිස් අත්අඩංගුවට පත්වෙද්දී 16 වැනිදා රාත්‍රියේදීම දැරණියගල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාද දෙහිඕවිට ප්‍රදේශයේදී අත්අඩංගුවට ගැනීමට දැරණියගල පොලිස් නිලධාරීන් සමත් වූයේය.

රාජ්‍ය දේපළ සොරකම් කිරීම නිසාවෙන් පොදු දේපළ පනත යටතේ අත්අඩංගුවට පත් ලක්ෂ්මන් රාජකරුණා ද අවිස්සාවේල්ල මහේස්ත්‍රාත් ජනක සමරසිංහ වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සෙසු සැකකරුවන් සිවුදෙනාද සමඟ ලබන මැයි මස 03 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගතකිරීමට මහේස්ත්‍රාත්වරයා නියෝග කළේය. එසේම මෙකී දැරණියගල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට එරෙහිව මීට පෙරද අධිකරණයේ නඩු කටයුත්තක් විභාග වී තිබිණි.

මෙලෙස රාජ්‍ය දේපළ සොරකම් කිරීම නිසාවෙන් රක්ෂිත බන්ධනාගාරයට නියම වූ දැරණියගල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට එරෙහිව ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව අප විමසීමක් කළේ සබරගමුව පළාත් ආණ්ඩුකාර ටිකිරි කොබ්බෑකඩුවගෙනි. එහිදී ආණ්ඩුකාරවරයාගේ ප්‍රකාශකයෙක් සඳහන් කළේ දැරණියගල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට එරෙහිව ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග කුමක්ද යන්න ප්‍රකාශ කළ හැක්කේ එම සොරකම සම්බන්ධයෙන් සභාපතිවරයාට එරෙහිව අධිකරණය ලබාදෙන තීන්දුව සහ අභ්‍යන්තරව සිදු කෙරෙන පරීක්ෂණයෙන් ගන්නා ඉදිරි පියවර අනුව පළාත් ආණ්ඩුකාරතුමාද ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිත බවයි.

සිය ධන බලය, මැර බලය ඔස්සෙ දේශපාලනයට පිවිසි මෙවැනි අධම පුද්ගලයන් රටටම බරකි. එම නිසාවෙන් රටේ අහිංසක ජනයාගේ බදු මුදලෙන් යැපෙමින් රාජ්‍ය දේපළද සොරකම් කරන මෙවන් දේශපාලුවන්ට නැවත දේශපාලනයේ පස් පැගීමටවත් ඉඩ නොතබා 'පාඩම්' ඉගැන්වීම රටේ ජනතාවගේම පරම වගකීමක් බව අපි අවධාරණය කරන්නෙමු.

මීට පෙරද දැරණියගල ප්‍රාදේශීය සභාවේ සභාපතිත්වය දැරූ සභාපතිවරයෙක් වූ අනිල් චම්පික විජේසිංහ හෙවත් අතකොටා නමැත්තාද මහත් ආන්දෝලනයක් ඇතිකළ අයෙකි. 2013 වසරේ ජූනි 05 වැනිදා දැරණියගල නූරි වත්තෙ වතු අධිකාරිවරයාව සිටි නිහාල් පෙරේරා නමැත්තා අමානුෂික ලෙස ඝාතනය කිරීම නිසාවෙන් අතකොටා සමඟ ඔහුගේ සහචරයන් 18 දෙනකු මේ වන විට මරණ දඬුවමට නියමව මහඋළුගෙදර සිටින්නෙ කළ වැරැදිවලට වන්දි ගෙවමිනි.

ජල සම්පාදන මණ්ඩල ජල ව්‍යාපෘතියේ සොරකම පිළිබඳව දැරණියගල පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක වසන්ත අලහකෝන්ගේ උපදෙස් මත උප පොලිස් පරීක්ෂවරුන් වන ජයතිස්ස, චන්ද්‍රසේන, පොලිස් සැරයන් (57066) නිශාන්ත යන නිලධාරිහු විමර්ශනවලට එක්වූහ.

පසුබිම් තොරතුරු සහ ඡායාරූප
බුලත්කොහුපිටිය සමූහ - ඩබ්ලිව්. රොහණ

අම්මයි දුවයි තනිකර තාත්තයි පුතයි ගිය ගමන

මියගිය හේමන්ත, හේසර පුතු, බිරිය තුෂාරි සහ දියණිය සමඟින් කලකට ඉහතදී ගත් පවුලේ ඡායාරූපයක්

හේමන්තගේ සහ හේසර පුතුගේ මෘතදේහ අවසන් ගෞරව දැක්වීම සඳහා නිවෙසේ තැන්පත් කර තිබූ අයුරු

● **සුරේකා නිල්මිනී ඉලංකෝන්**

කොශවලට යටත්ව හෝ මෙවර සිංහල අවුරුද්ද සැමරීමට අවකාශ ලැබීම බොහෝ සිත්වලට ගෙන ආවේ විශේෂ සතුටකි. එසේ සතුටු සිතින් අලුත් අවුරුද්ද සැමරූ මහරගම ප්‍රදේශයේ ආදරණීය පවුලක සතුට, සැනසීම දිය රකුසකුට බිලිවූ අනුවේදනීය පුවතක් ඉකුත් 15 වැනිදා වාර්තා විය.

ඒ විපත සිදුව තිබුණේ මහරගම, පමුණුව, දෙල්ගහ වත්ත පාරේ පදිංචිව සිටි හේමන්ත කුමාර සුද්දසිංහල (52) තුෂාරි වත්සලා මාපිටියගේ(47) කැදැල්ලටය. හේමන්ත, බොරලැස්ගමුව පෞද්ගලික බැංකුවක කළමනාකරුවකු ලෙස සේවය කළ අතර තුෂාරි බිරියක, මවක හා ගෘහිණියක ලෙස සිය යුතුකම් මනාව ඉටුකරමින් පවුලට ආදරණීය ශක්තියක් වූවාය. හේමන්තගේ සහ තුෂාරිගේ ලෝකය සුන්දර කළේ 18 හැවිරිදි දියණියත් 14 හැවිරිදි තුල්නිත් හේසර පුතුණුවන්ය. තුල්නිත් පුතු කොළඹ කේරි විද්‍යාලයේ 9 වැනි වසරේත් දියණිය කොල්ලුපිටිය ලින්ඩ්සේ බාලිකා විද්‍යාලයේත් ඉගෙනුම ලැබුවාය.

කිසිවකුට කරදරයක් නැතිව හැකි පමණින් සියලු දෙනාට උදවු උපකාර කරමින් ජීවත් වූ හේමන්ත අසල්වැසියන් අතර ජනප්‍රියව සිටියේ හිත හොඳ මිනිසකු ලෙසටය. ඒ නිසාම හේමන්තගේ පවුල කාටත් ආදර්ශවත් පවුලක් විය. එහෙත් දෛවයේ සරදමකට මෙන් අද ඒ ආදරණීය පවුලේ විසල් රැකවරණය වූ පියා, හේමන්තත් පවුලට පහනක් වූ හේසර පුතත් සදහටම මෙලොව හැර දා ගොස් අවසන්ය.

ඒ බේදවාචකය පිළිබඳ අම්හිරි මතකය අවදි කළේ මියගිය හේමන්තගේගේ ඥාති සහෝදරියකි.

● සුනඛ සුරතලාගෙන් බාධා වෙවී ගිය ගමන පිය පුතුගේ මරණවලින් කෙළවර වේ

"හේමන්ත අයියගේ උපන් ගම බණ්ඩාරවෙල, මාරබැද්ද. අයියා අනිවාර්යයෙන්ම සෑම අවුරුද්දකම ගමට යනවා නෑදෑයො බලන්න. මේ පාරත් 14 වැනිදා උදේ ආහාර අනුභව නැකතට පස්සේ අයියගේ යාළුවෙක්ගේ වාහනේකින් යන්නයි කට්ටිය ලෑස්ති වෙලා ඉඳලා තියෙන්නෙ. ඒත් එදා උදේ අයියගේ යාළුවට එන්න බැරිවුණ නිසා හවස යන්න කතාවෙලා. ඒත් එදා හවසත් යන්න බැරිවුණු නිසා අයියා අක්කට කියලා පහළොස් වැනිදා උදේම යමු කියලා. එදා උදේ හතහමාරට විතර අයියයි අක්කයි ළමයි දෙන්නයි ගමේ යන්න ලෑස්ති වෙලා ඉන්නකොට ගෙදර හුරතලේට හදන බල්ලා කන්පට ගහලා. ඒ වෙලාවේ අක්කා කියලා තියෙනවා ගමන කීපසැරයක්ම බාධා වුණ නිසත් බල්ලා කන්පට ගහපු නිසත් තව ටිකක් පරක්කු වෙලා යමු කියලා. ඒ වෙලාවේ අයියා කියලා ඔය මනස්ගාත විශ්වාස කරන්න එපා අපි දැන් පිටත් වෙමු කියලා."

හේමන්ත එසේ කීවද සිය හාම්පුතුන් පසුපස එමින් තිබුණු අනතුර සුනඛ සුරතලාට කලින් ඉව වැටුණා සේය. හේමන්ත බිරිය සහ දරු දෙදෙනා සමඟ ගමන් ගත් මෝටර් රථය පසුපසින් බලු සුරතලා මහරගම පමුණුව පාරටම දිවගොස් තිබුණේ ඒ නිසා වන්නට ඇත. හේමන්ත බලු පැටවා මෝටර් රථයට නංවාගෙන නිවෙසට ගෙනැවිත් දමා යළි යන්නට හදද්දී ද බලු පැටවා ඔහුගේ ගමන වළක්වන්නට තැත් කර ඇති බව හේමන්තගේ නැඟණිය කීවේ කඳුළු සලමිනි.

"එවෙලෙත් බලුපැටියා අයියාගේ කලිසමේ කකුලෙන් ඇදලා තියෙනවා. ඒ වෙලාවේ අයියා බලු පැටියාගේ ඔළුව අතගාලා කියලා තියෙනවා අපි ඉක්මනට එනවා උඹ ගෙදර බලාගෙන හිටපන් කියලා. ඒත් බලු පැටියා කවදාවත් එහෙම හැසිරිලා නැති නිසා අක්කට පොඩි සැකයකුත් ඇවිත් මේක ගමනට බාධාවක්ද කියලත්. කොහොමහරි බලු පැටියා ගෙදර දාලා කට්ටිය ගමන යන්න පිටත් වෙලා."

එහෙත් උපන් ගමට ගොස් මව ඇතුළු ඥාතීන් දකින්නට හේමන්තට වරම් ලැබුණේ නැත. හල්දුම්මුල්ල, කළුපහන ප්‍රදේශයේදී හේසර පුතු වේලිඔයෙන් දිය නාන්නට යෝජනා කළද හේමන්ත ඊට කැමැත්තක් දක්වා නැත. එහෙත් පුතු කිහිප වරක්ම එම ඉල්ලීම කරද්දී ඔහුගේ කැමැත්තට ඉඩ දෙන්නට හේමන්ත තීරණය කරන්නේ ඔහු කවදත් දරුවන්ගේ සතුට ගැනම හිතන පියකු වූ නිසාය. ඒ අනුව තුෂාරි වාහනයේම රැඳී සිටියදී හේමන්ත, ඔහුගේ මිතුරා සහ දරුවන් දෙදෙනා ඔයේ පහළට බැස ඇත්තේ දිය නාන්නටය.

"හේමන්ත අයියයි පුතයි නාමින් හිටපු තැන ඒ වෙලාවේ වතුර අඩි දෙකක්වත් තිබිලා නැහැ.

● තාත්තයි පුතයි මරුවාට බිලිවී තිබුණෙත් එකිනෙකා වැලඳගෙන

දුවත් එතැනමයි ඉඳලා තියෙන්නෙ. අයියගේ යාළුවා ඊට ටිකක් දුරින් ඉඳලා තියෙන්නෙ. එකපාරටම විදුලි වේගයෙන් වගේ වතුර පාර වැඩි වෙලා අඩි පහක් හයක් විතර උඩට වතුර ආවා කියලා අක්කා කිව්වා. ඒ වෙලාවේ ඔයේ බැහැලා හිටපු ගොඩක් දෙනෙක් වතුර පාරට අහුවෙලා ගහගෙන ගිහින් තියෙනවා. හේමන්ත අයියට හොඳට පීනන්න පුළුවන්. අයියා ගහගෙන යන දුවව අරන් ගලක් උඩින් තියලා බලනකොට පුතා ගහගෙන යනවලු. ඒ පාර අයියා පුතාව ගන්න ගිහින්. ගහගෙන ගිය කට්ටිය ගල්පරවල හා වැල්වල එල්ලිලා ගොඩට ආවත් අයියයි පුතයි පේන්නේ හිටියෙ නැහැලු."

හේමන්ත සිය බිරිය තුෂාරි සමඟින්

ඉන් එහාට ඒ කඳුළු කතාව පවසාගත නොහැකිව ඇය හඬා වැටෙන්නට වූවාය.

ඔයේ දිය නාමින් සිටි පිරිසට සිදුවූ අනපේක්ෂිත අනතුර දුටු ගම්වැසියන් ද එතැනට දිව විත් පිරිස බේරාගන්නට උත්සාහ කර ඇත්තේ ඉන් පසුවය. ඉනිමගක් ආකාරයෙන් සකස් කරගත් ලී දඬු කිහිපයක් ආධාරයෙන් දියේ සිටි හේමන්තගේ දියණිය ඇතුළු තවත් අයකුගේ දිවි බේරාගන්නට ගම්වැසියන් සමත් වූව ද හේමන්ත සහ පුතු සොයාගන්නට නොහැකි විය. හල්දුම්මුල්ල, කළුපහන, පාලම් දෙක අතර වේලිඔයේ දිය නෑමට ගොස් එසේ අතුරුදන් වූ හේමන්තගේ සහ පුතු හේසර ගේ මළ සිරුරු පොලිසිය සහ ප්‍රදේශවාසීන් විසින් සොයාගනු ලැබුවේ ඊට පසු දින එනම් 16 වැනිදා දහවල්ය. ඒ, ඔවුන් දිය නාමින් සිටි ස්ථානයේ සිට මීටර් 800ක් පමණ දුරින් පිහිටි ගල්පරයක් තුළ සිර වී තිබියදීය.

"මේ තාත්තයි පුතයි හරියට එක කුස උපන් සහෝදරයෝ වගේ ළඟින්ම හිටියේ. ඔය සිද්ධිය වෙලා අයියගේ පුතාගෙයි සිරුරු දෙක හොයා ගන්න කොටත් දෙන්න එකට බදාගෙන තමයි ගල්පරය අස්සෙ හිර වෙලා ඉඳලා තියෙන්නෙ. අයියයි පුතයි යාළුවෝ වගේ පුදුමාකාර බැඳීමකින් හිටියේ. ඇඟුමක් ගත්තත් එකම පාට ඇඟුම් තමයි දෙන්නටම ගන්නෙ. මේ වෙච්ච විපත අපි කාටවත් දරාගන්න පුළුවන් දෙයක් නෙවෙයි. අක්කයි දුවයි ඒ දුක දරාගන්නෙ කොහොමද කියල හිතාගන්නවත් බැහැ"

හේමන්තගේ ඥාති සොයුරිය පැවසුවේ බලාගත් අත බලාගෙන සුසුම් හෙළන හේමන්තගේ බිරියත් දියණියත් දෙස බලාගෙනය. හේමන්තගේ බිරියගේ පියා ද සිය වැඩිමහල් දියණියගේ පවුලට සිදුවූ විපත ගැන හඬ අවදි කළේ හැඬූ කඳුළිනි.

"මේ වෙච්ච දේ අපි හැමෝටම වේදනාවක්. 14 වැනිදා මටත් බුලත් දීලා වැඳලා තෑගිබෝග දීලා හේමන්ත පුතාටයි දරුවටයි මෙහෙම දෙයක් වුණා කියනෙක හීනයක් වගේ. මේ නැති වුණේ අපි හැමෝගෙම වගේම ගමේ අයගෙත් ආදරය ලබපු අපේ රත්තරන් බෑනයි මුනුපුරයි.

මේ අනතුර ගැන ගෙදරට පණිවුඩේ ලැබුණේ වූටි පුතාගේ ෆෝන් එකෙන්. ඒ වෙලාවේ මට උන්හිටි තැන් නැතිවුණා. මට හිතුණා මේ වයසක අපි මැරුණා නම් කියලා. තව කාලයක් ජීවත් වෙලා රටට වැඩක් කරන්න හිටපු දෙන්නෙක් මේ නැතිවුණේ."

හේමන්තගේත් හේසරගේත් ජීවිත කතාව එතැනින් අවසන් වුවද ඔවුන්ගේ හදිසි නික්ම යෑම බොහෝ දෙනකුට දරාගත නොහැකි කම්පනයකි. හේමන්ත සහ පුතු වෙනුවෙන් කඳුළක් නොනැඟි දෙනෙතක් නොවූ තරම්ය.

"හේමන්ත කියන්නේ බොහොම නිව්ච්ච ගති පැවතුම් ඇති ඉතාම සුහදශීලී මනුස්සයෙක්. මෙහේ පදිංචියට ආ දවසේ සිට අපිට සහෝදරයෙක් වගේ හිටපු කෙනෙක්.

● අවුරුද්දට අම්මා බලන්න ගිය ගමන වේලිඔයෙන් අවසන් වෙයි

අපේ ගමේ පොදු වැඩවලදී මුල්තැන අරගෙන වැඩ කළා. කිසිමදාක නැහැ, බැහැ කියන වචනෙ එයා ළඟ තිබුණෙ නෑ. හේමන්ත වගේම තුෂාරි නංගිත් ඒ දරුවො දෙන්නත්, බොහොම සමාජශීලී ගති පැවතුම් තියෙන, නැති බැරි අයට ගොඩක් උදවු කරපු අය. මේ වෙලා තියෙන දේ අපට අදහාගන්නවත් බෑ." හේමන්තගේ අසල්වැසියකු එසේ පැවසුවේ බොහෝ සංවේගයෙනි. හල්දුම්මුල්ල මූලික රෝහලේදී පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වීමෙන් අනතුරුව හේමන්තගේ සහ පුතුගේ මෘතදේහ හේමන්තගේ උපන් ගම වන බණ්ඩාරවෙල නිවෙසට ගෙනගොස් ඊටපසු දින සන්ධ්‍යාවේදී ආගමික වතාවත් ඉටු කෙරුණි. 18 වැනිදා එම මෘතදේහ හේමන්ත පදිංචිව සිටි මහරගම, පමුණුව, දෙල්ගහවත්ත පාර ප්‍රදේශයේ පිහිටි නිවෙසට රැගෙන එන ලැබිණි. එදින ආගමික වතාවත්වලින් අනතුරුව පියාගේත් පුතුගේත් දේහයන් මහරගම ගොඩිගමුව පොදු සුසාන භූමියේ එකම වළක් තුළ මිහිදන් කරනු ලැබුවේ නෑහිතමිතුරන් සෝ සයුරක ගිල්වමිනි.

සංක්‍රමණික සේවක සහයට ස්විට්සර්ලන්තය සහ ඇමෙරිකාව ඒකාබද්ධ සත්කාරයක

'සුරක්ෂිත සහ ප්‍රතිපත්ති සංක්‍රමණික සේවකයන් ගෙවන් SRMW වැඩසටහන ශ්‍රී ලංකාවට හඳුන්වා දීම වෙනුවෙන් ස්විට්සර්ලන්ත සහ එක්සත් ජනපද රජයන් අත්වැල් බැඳගෙන ඒකයි.

ශ්‍රී ලාංකේය සංක්‍රමණික සේවකයන්ට අනාවරණ ඔප්පුවීම සහ සුසැලතා සංවර්ධනය පිරිහැලීම අරමුණු කරගනිමින්, SRMW වැඩසටහන, අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඇමෙරිකානු එක්සත් ජනපද නියෝජිතායතනය USAID ඩොලර් මිලියන18ක අරමුදලකින් ගොඩනැගුණු කරුණ නිසාත් සංවර්ධන හා ව්‍යවසායකත්ව වාහනය වන You Lead පමණ පූර්ණ ලෙස ඒකාබද්ධව ක්‍රියාත්මක වනු ඇත. සංක්‍රමණික සේවකයන්ගේ සමස්ත යහපැවැත්ම වර්ධනය කිරීම වෙනුවෙන් කටයුතු කරන සංවර්ධනය සහ සහයෝගීතාව පිළිබඳ ස්විස් නියෝජිතායතනය (SDC) මේ වසර 10ක අත්දැකීම් සමග වෘත්තීය මාර්ගෝපදේශනය සහ වෘත්තීය සුසැලතා සංවර්ධනයේ සිය වසර 3ක යෙදීම සහිත You Lead ඒකාබද්ධ වීම, මෙම කාර්යයෙහිලා සුසංයෝජනයකි.

ඩොලර් මිලියන1.5ක ස්විට්සර්ලන්ත මූල්‍ය ආයතනවලින් මගින් අනුත් වසර 3ක කාලය තුරා දහස් ගණනක් වූ සංක්‍රමණික සේවකයන්ගේ සුසැලතා සුරක්ෂිත වෙනුවෙන් මෙහෙයවන සැමිණෙක සංක්‍රමණික සේවකයන්ට මුදල් විදේශයන්හිදී ලබාගත් සුසැලතාවන් තක්සේරු කරමින් මුදුන්ව ශ්‍රී ලංකාවේ රැකියා සහ ව්‍යවසායකත්ව අවස්ථා සමග පමිබන්ධ කිරීම පිණිස කටයුතු කර තිබේ

මත ගැටෙන තැන

● සුභද්‍රා දේශප්‍රිය

1. වරාය නගරය චීන කොලනියක් ද ?
2. මෙය පාලනය කරන්නේ කොමිෂන් සභාවක් මඟින් ද? එහිදී ලංකාවේ ඇතැම් අණපනත් බලාත්මක නොවන්නේ ද ?
3. මෙහි ආයෝජනය කළ හැක්කේ චීනයට පමණක්ද?
4. සම්මත මුදල් ඒකකය රුපියල නොවෙයිද? සාමාන්‍ය පුරවැසියකුට මෙයට ඇතුළු වීමට නොහැකිද?
5. වරාය නගර ව්‍යාපෘතියෙන් රටේ ආර්ථික ප්‍රවර්ධනයට කිනම් දායකත්වක් ලබා දෙන්නේ ද?

මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳ පොළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍ය
අජිත් නිවාඩ් කබ්රාල්

1 චීන කොලනියක් කියන කතාව සම්පූර්ණ අසත්‍ය කටකතාවක්. එහෙම කිසි තැනක අවකාශයක් ලබා දීලා නැහැ. අනිත් කාරණාව යම් කිසි ආකාරයකින් රටේ ඒකීභාවය, ස්වෛරීත්වයට තර්ජනයක් තිබෙනවා නම්, නීතියේ තියෙන ඒවැනි කොටස් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සම්පූර්ණයෙන්ම ඉවත් කරනු ලබයි. අපි දන්නවා එහෙම දෙයක් වෙන්නේ නෑ කියලා. මොකද අපිට දැනටමත් නීතිපතිතුමා දීලා තියෙනවා නිර්දේශ මේ පනතේ එවැනි කිසි දෙයක් නැහැ කියලා. ඒ වුණත් දැනට පෙත්සම් 21ක් ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ ගොනු කරලා තියෙනවා. ඒ පෙත්සම් ගැන සොයා බලා ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කරාවි එහෙම ප්‍රශ්නයක් තියෙනවා ද නැද්ද කියලා. අපිට ප්‍රශ්නයක් නෑ, මෙවැනි දෙයක් නැති බව අපිට තහවුරු කරන්න පුළුවන්. මේ අය නඩු දැම්මට දිගින් දිගටම එහෙම දෙයක් පැවසුවට එවැන්නක් කිසිවිටෙක වෙන්නේ නැති බව අපිට තහවුරු කරන්න පුළුවන්.

2 වරාය නගරය පරිපාලනය සඳහා වරාය නගර කොමිෂන් සභාවක් ජනාධිපතිතුමා විසින් පත් කරලා, ඒ හරහායි සම්පූර්ණ පාලනය කරන්නට බලාපොරොත්තු වෙන්නේ.

3 ඕනෑම රටකින් මේ වරාය නගරයට ආයෝජනය සිදු කරන්න පුළුවන්. ඕනෑම මුදල් ඒකකයකින් ගනුදෙනු කරන්නත් පුළුවන්. වරාය නගරයේ සියලුම වැඩ කටයුතු සිදුවන්නේ එක කවුළුවකින්. ඒ තුළින් ආයෝජකයන්ට සම්පූර්ණයෙන්ම සහාය ලැබෙනවා; ඒ වගේම පහසුව ලැබෙනවා. ඒ නිසා විවිධ පනත්වලින් ලියැවී තිබෙන දේවල් වලට අනුව කටයුතු කරනවාට වඩා පහසුයි එක පනතක් යටතේ කරන්න. සැලසුමක් අනුමත කර ගන්න අවශ්‍ය නම් හෝ ඒ අයට ගොඩනැගිල්ලක් හදන්න අවශ්‍ය නම් එය අනුමත කරගන්න වෙන්නේ මේ කොමිෂන් සභාව යටතෙයි. යම් කිසි වෙළඳාමක් කිරීම සඳහා අවකාශයක් වේ නම්, බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය නම්, ඒක ලැබෙන්නේ මේ කොමිෂන් සභාව තුළින්. ඒ වැඩ කටයුතු සියල්ලම මේ කොමිෂන් සභාව හරහා සිද්ධ වෙනවා. ඒ නිසා තමයි ඒ ඒ ආයතනවලට තියන බලතල එතනින් අයින් කරලා තියෙන්නේ. මොකද ඒ කටයුතු සියල්ලම එක තැනකින් සිද්ධ වෙනවා.

4 ශ්‍රී ලංකා රුපියල් මෙහිදී පාවිච්චි කළ හැකියි. නමුත් මේ කලාපය තුළ අපේ අවශ්‍යතාව තමයි පිටරට මුදල් වලින් ගනුදෙනු කිරීම. මොකද පිටරට මුදල් ගලාගෙන එන්න තමයි මේ ප්‍රවේශය අපි පාවිච්චි කරන්නේ. එතනදී ඒ අයට මුදල් පිටින් ගෙන ආවොත් පමණයි අපේ රටේ විදේශ විනිමය ප්‍රශ්නෙත් බොහෝ දුරට විසඳෙන්නේ. සියලුම අවස්ථාවලදී විදේශ විනිමය මෙරටට ගලා එන්නට කටයුතු කරන ගමන්ම අපේ අදහස රුපියල්වලින් ගනුදෙනු කරන්න අවශ්‍ය අයට ගනුදෙනු කිරීමට කිසිම බාධාවක් නෑ. ඕනෑම කෙනෙකුට වරාය නගරයට යන්න පුළුවන්. ඒ නිසා බොරු කියලා මිනිස්සුන්ව මුලාවට පත් කරලා, මිනිස්සුන්ට භීතියක් ඇති කිරීම තමයි මෙතන කරන්නේ. මේ වගේ ව්‍යාපෘති සම්බන්ධයෙන් මිනිසුන් නොමඟ යවලා මේවාට බාධා කිරීම සම්බන්ධයෙන් ඇත්තේ කනගාටුවක්. ඒ වගේම අපේ අයට ආයෝජනය කිරීමට පුළුවන්. අනෙක් කාරණාව රටේ නීතිය සම්පූර්ණයෙන්ම වරාය නගරය තුළ ක්‍රියාත්මක වෙනවා. එහි ක්‍රියාත්මක වෙන පොලිසිය, යුද හමුදාව, ගුවන් හමුදාව හා අනෙකුත් සේවා, අපේ රටේ උසාවි ඒ සියලු අංගයන් එතන බල පැවැත්වෙමින් තියෙනවා. කිසිම විටක ඒ කිසිවකට බාධාවක් ඇති වන්නේ නෑ.

5 රැකියාවල් 83000ක් විතර අපි බලාපොරොත්තු වෙනවා. 83000 ක් කියන්නේ පිටරටට යන්නේ නැතුව, වේතන අපේ ජනතාවට ලබා ගන්න පුළුවන් වෙන ආකාරයේ රැකියා අවස්ථාවලට අවකාශය ලැබෙනවා. දැන් අපේ රටේ ජනතාව සිංගප්පූරුවට, ඇමරිකාවට ඩුබායි, සයිප්‍රස් වලට යනවා.

මේ රටේම ඉතාමත් හොඳ වේතනයකට කටයුතු කරන්න පුළුවන් නම් ඒක ඉතාමත්ම හොඳයි.

ඒ නිසා අපේ අදහස වෙන්නේ මෙවැනි ව්‍යාපෘති තුළින් මේ රට ජනතාවටත් හොඳ වේතනයක් ලබා ගැනීම සඳහා අවකාශය ලබා දීමයි. අප රටේ බොහෝ ආයතනවල විවිධත්වය නිසා යම් විශේෂ වැඩ කටයුත්තක් රජයෙන් කර ගැනීමට සිදු වන විට ඉතා විශාල කාලයක් සහ රස්තියාදුවක් වීමට බොහෝ දෙනෙකුට සිදු වෙනවා.

ඒ හරහා ආයෝජකයන් අධෛර්යවත් වීම සහ ඔවුන්ට පාඩු විය හැකියි.

ඒ හරහා ආයෝජකයන් අපේ රටට පිවිසීම සෑහෙන දුරකට අඩු වීමට ඉඩ තියෙනවා. ඒ නිසා ඒ දුර්වලතාව මගහරවා ගැනීම සඳහා මේ පනතෙන් අපි බලාපොරොත්තු වෙන්නේ එක කවුළුවකින් සියලුම වැඩ කටයුතු කරගැනීමට හැකිවන ලෙස ආයතනයක් පිහිටුවීමයි. අපි මෙයින් බලාපොරොත්තුව වෙන්නේ ඉතා ඉක්මනින් ඉතා පුළුල් ලෙස ආයෝජකයන් මේ රට පිවිසෙයි කියලා. රටේ සංවර්ධනය උදෙසා වසරකට බිලියන 3ක් වත් මෙරටට ගලා ඒමට බොහෝ දුරට මේ වරාය නගරයෙන් රුකුලක් ලැබේවි කියලා. මේ වරාය නගරය ඉදිකිරීමේ අපේ අපේක්ෂාව සහ බලාපොරොත්තුව ද එයයි.

ජනතා විමුක්ති පෙරමුණ, දේශපාලන මණ්ඩල සහික හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති

1 චීන කොලනියක් තමයි මෙහි ගොඩනැගෙන්නේ. චීනය තමන්ගේ රටක් හදාගන්නවා. කෙනෙකුට ප්‍රතිතර්කයක් ගේන්න පුළුවන් මේ ලංකාවට අයිති නැති භූමියක් තමයි ගොඩ කළේ කියලා. එහෙම නෑ.

මේ අපේ මුහුද, භූමිය, අහස ගොඩ කළේ. ශ්‍රී ලංකාවට අයිති භූමි ප්‍රදේශය ගොඩ කළ පමණින් එය වෙන රටවල්වලට අයිති කරන්න බැහැ. ඒක අපේ රටේ කොටසක් නෙවෙයි කියලා කාටවත් කියන්න බැහැ.

පුදුම දේශප්‍රේමියෝ මේ ඉන්නේ. එයාලා විපක්ෂයේ ඉන්නකොට දේශප්‍රේමී; අද කියනවා ඒක වෙනම ගොඩ කරගත්ත එකක් කියලා. ඒක සම්පූර්ණයෙන් වැරදියි. මේ බිම් කොටස ලංකාවට අයිති මුහුදේ කොටසක්. අපි චීනයට විරුද්ධව කතා කරන්නේ ඇමරිකාවට හෝ ඉන්දියාවට පක්ෂ වෙලා කියලා කියන්න බැහැ.

ඇත්තටම චීනය කරේ තියාගෙන යාම විසින් අද ලෝකය ඇතුළේ ලංකාව හුදකලා කරලා තියෙන්නේ මේ ආණ්ඩුව; අපි නෙවෙයි; ජනතාව නෙවෙයි. මේක විවේචනය කරන අය නෙවෙයි ලෝකෙ ඉස්සරහ ලංකාව අසරණ කරලා තියෙන්නේ.

අද අධිරාජ්‍යවාදීන්ගේ දේශපාලන මැදිහත්වීම් වලට බරපතළ ප්‍රශ්නයක් බවට මෙය පත් කර තියෙනවා. මේ ජාත්‍යන්තර දේශපාලන බලපෑම්වලට අපි අනිවාර්යයෙන්ම හිරවෙනවා; එක රටකට විශේෂයක් කිරීම නිසා. ආණ්ඩුවේ ලොක්කොන්ට ලැබෙන කොමිස් වලට, වරප්‍රසාදවලට රට බිලිදීමක් තියෙන්නෙ.

2 ඇත්තටම මුලින්ම අපි තේරුම් ගන්න අවශ්‍යයි, අපේ රටේ මූලික නීතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බව. ඒ අනුව ගත්තොත් රටේ ඉඩම්, ඒ වගේම රටේ ආර්ථිකය ඕනෑම ස්ථානයක ශ්‍රී ලංකාවේ භූමි ප්‍රදේශය නම් තියෙන්නේ ඒක පාලනය කරන්නේ පාර්ලිමේන්තුව. පාර්ලිමේන්තුවටයි රාජ්‍ය මූල්‍ය පාලන බලය, අයිතිය තියෙන්නෙ. ශ්‍රී ලංකා රජයේ අයිතිය වෙනුවට වෙනමනීතිරීති, පරිපාලන ව්‍යුහයක් හදලා ,වෙනම මූල්‍ය බලතල සහිතව ලංකාවට අයිති නැති ස්වභාවයක් හා ආකෘතියක් නිර්මාණය කිරීම මේ තුළින් වෙන්නේ.

මේ හදන ව්‍යුහය ශ්‍රී ලංකාවේ රජයේ පාලනයෙන් එපිටට යන ස්වාධීනත්වයකින් හදලා තියෙන එකක්. අද වන විට අපේ රටේ ස්වෛරීභාවය සම්බන්ධයෙන් බරපතළ ප්‍රශ්නයක් පැන නැඟලා තියෙන්නේ.

මේ ආර්ථික කලාපයේ පාලනය සම්පූර්ණයෙන්ම ජනාධිපතිවරයා පත් කරන වරාය නගර කොමිෂන් සභාව යටතට ගේනවා.

ඒ කොමිෂන් සභාව රටේ මූලික නීතියෙන්, ව්‍යවස්ථාවෙන්, අණ පනත්වලින්, මුදල් පනතින්, රේගු ආඥා පනතින් ,දේශීය ආදායම් බදු පනතින් නිදහස් වෙනවා නම්, එවැනි බලපෑම් කිරීමට බැරි ආයතනයක් බවට පත් වෙනවා නම් මේ පාලනය ඇත්තේ කොමිෂන් සභාව යටතේ පමණයි.

එම කොමිෂන් සභාවේ සංයුතිය අනුවයි ඒක තීරණය වන්නේ. ඊළඟට කොමිෂන් සභාවේ බලතල අනුව ගත්තොත්, රටේ තිබෙන අනෙකුත් නීති රීති ඉක්මවා එන බලයක් කොමිෂන් සභාවෙන් හදලා තියෙනවා.

නමුත් ඇත්තටම මේක තියෙන්නේ චීනයට හෝ එම ආයෝජනය ගේන ආයතන හා සමාගම්වලට ස්වාධීනත්වය හදන වෙනම පාලනයක්. පාලන ඒකකයක් හැටියටත් මේ වෙනම රටක් ලෙස තමයි හඳුනා ගැනීමට තිබෙන්නේ. එයට හේතුව ලංකාවේ නීති රීති මෙයට අදාළ කරන්නේ නැති නිසා. ශ්‍රී ලංකාවේ පාලනය සහිත නම්, ලංකාවට අයිති දෙයක් නම් අණ පනත් වලින් නිදහස් කළ යුතු වන්නේ නැහැ. විශේෂයෙන්ම මෙහි තිබෙන්නේ මුදල් පනත රේගු ආඥා පනත ආදී පනත්. රේගු ආඥා පනතින් නිදහස් කළහම ඒකෙන් දිරිගැන්වීම් කෙරෙනවා කියන එකෙන් මොකක්ද වෙන්නේ? එයාලට කැමති දේවල් ගෙන්න පුළුවන් වෙනවා. එතකොට අවි ආයුධ ගෙන ආවත් අපිට මේක අහන්න බලන්න බැරි තත්ත්වයක් එනවා. ලංකාවේ අයට රැකියා අවස්ථා ලබා දෙනවා යැයි පැවසුවත් අවසානයේ ලංකාවේ අය සේවය කරන්න ඕන විදිය ගැන කොන්දේසි හදන්නේ එයාලා නම්, ඒවාට මැදිහත් වීමට ශ්‍රී ලංකාවේ රජයට බැරි නම්, එතන බරපතළ ප්‍රශ්නයක් පැන නගිනවා.

3 මීට පෙර සූදු ව්‍යාපාර සඳහා ආයෝජන කැඳවීමේදී ක්‍රමෝපාය සංවර්ධනය පනත සම්මත කළා. මෙවැනි කටයුතු කිරීමේදි හම්බන්තොට වරාය විකිණීම සඳහා බදු සහන දෙන විට ක්‍රමෝපාය සංවර්ධන පනත, ආයෝජන මණ්ඩල පනත වගේ පනත් අදාළයි. ඒවා රටේ පාර්ලිමේන්තුවට වග කියන ආයතන. ලංකාවේ විගණකාධිපතිවරයාට බලපෑමක් කිරීමට මෙහිදී හැකියාවක් නැහැ.

පාර්ලිමේන්තුවේ තිබෙන අනෙකුත් ආයතනවලට සම්බන්ධ වන්නේ නැහැ එහෙම ස්වාධීනත්වයක් හදන්න. ආණ්ඩුව මෙවැනි කොමිෂන් සභාවක් පිහිටු වන්නේම ආණ්ඩුව මුහුණපාලා තියෙන මූල්‍ය අර්බුදය නිසා. ආණ්ඩුවට ඕන රට ලිහල දාලා රටේ නීතිරීති සම්පූර්ණයෙන්ම විවෘත කරල දාලා, ආයෝජන ලෙස මෙම මූල්‍ය අර්බුදයට ඩොලර් කැඳවා ගැනීම. ගැටලුව වන්නේ එම විදේශ මුදල් ගෙන එන්නේ ලංකාවේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා නොවීමයි.

4 මෙහි රුපියල් වලින් ගනුදෙනු කරන්න පුළුවන් යම් සීමාවකට පමණයි. ඒ ඉතා පැහැදිලිව ම 35 වැනි වගන්තියේ සඳහන් කරලා තියෙනවා.

වැටුප් ගෙවීම සිද්ධ වන්නේ විදේශ ව්‍යවහාර මුදල් වලින්; රුපියල් හැර කියලා තියෙනවා. එතකොට අපි රටක් හැටියට කොහොමද අනන්‍යතාවක් ගොඩනගා ගන්නේ. අපේ රටේ අනන්‍යතාව රුපියල්වලින්නේ තියෙන්නෙ. ඔවුන් පඩි ගෙවන්නෙත් ඔවුන්ගේ විදේශ මුදල්වලින්. මෙතන තියන ගැටලුව එයයි. මේ ව්‍යාපාර සියල්ලම පවත්වාගෙන යන්නේ වෙනම රටක් හැටියට බවයි අපට පෙනෙන්නේ.

මෙය ශ්‍රී ලංකාවේ රුපියල් වලින් ගනුදෙනු කරන කලාපයක් නොවේ. ශ්‍රී ලංකාවේ රුපියල්වලින් වැඩ කරන අයට පඩි ගෙවන්නෙත් නැහැ. වැටුප් ගෙවීම පවා තීරණය වන්නේ විදේශ මුදල්වලින්. මෙතැනට පැමිණ යන අය බඩු මූට්ටු ගේනවා නම් තීරු ගාස්තුව ගෙවිය යුතුයි. එතකොට අපි වෙනම රටකට ගිහිල්ලා එනවා වගේ තමා. ඒකෙ වෙනසක් නෑ. මේවා අදාළ වන්නේ රටවල් දෙකක් අතර ගනුදෙනුවකටනේ. රටක් ඇතුළේ රටක් හදන ආර්ථික කලාපයක් මේ තියෙන්නෙ. එතකොට චීනය කැඳවපු එකට අපිට බලපෑමක් කරන්න බැහැනේ. වරාය නගරයේ විශාලම පංගුවක බලපෑම කිරීමේ හැකියාව තිබෙන්නේ චීනයට.

5 ආර්ථික ප්‍රවර්ධනයට මෙහි වන බලපෑම් වෙන්නේ අනික් පැත්තටයි. මෙහි ආර්ථික අයිතිය අපට නැහැ. ඉලක්කම්වලින් ගිණුම් වලට එකතු කරන්න පුළුවන්කමක් ලැබේවි. අපිට මෙන්න මෙච්චර ආදායමක් ලැබෙනවා කියලා. නමුත් ඒක අනිත් පැත්තට යනවා.

මෙහි ශ්‍රමය විකුණන කොටසත් අපිට නොලැබීමට ඉඩ තිබෙනවා. සංසන්දනාත්මකව ගතහොත් ආර්ථික වශයෙන් අපිට ලැබෙන වාසියට වඩා දේශපාලන වශයෙන් අපට ලැබෙන අවාසිය වැඩියි. දේශපාලන වශයෙන් අප ලොව ඉදිරියේ හුදෙකලා වීමේ ප්‍රවණතාව වැඩියි. ජාත්‍යන්තර බලපෑම් වලට නතු වීමේ ඉඩකඩ වැඩියි. ආර්ථික වශයෙන් කියලා ලැබෙන දෙයක් නෑ අපිට ඇත්තටම. එතකොට මෙය තනිකරම ජාත්‍යන්තර වෙළෙඳපොළක කොටසක් බවට පත් වෙනවා හැරෙන්නට මෙය වෙනම ආර්ථික කලාපයක්. මෙහිදි එම ආර්ථිකයේ මොඩලයට ගැළපෙන සංස්කෘතියක් නිර්මාණය කර ගන්නවා.



සමඟි ජනබලවේග, පාර්ලිමේන්තු මන්ත්‍රී එරාන් වික්‍රමරත්න

1 මේ වරාය නගරය චීනයේ කොලනියක් කියන කතාව ඇතිවෙන්න හේතුව යම් ගනුදෙනුවක් කරගෙන යනවිට ණය දෙන පිරිස, කොන්ත්‍රාත්කරුවන් ඒ අයගේම අයවීම; ඒ අයගේ සේවකයන් ඒ රටින් ම ගේනවා නම් එවැනි තැනක් කොලනියක් යැයි සිතිය හැකියි. දැන් වරාය නගර රාමුව තුළ කම්කරු සේවකයන් සියයට 25% ගේන්න පුළුවන් කියනවා. වෘත්තියවේදීන් 35% වැනි ප්‍රමාණයක් ගේන්න නීතියෙන්ම සැලසුමක් තියෙනවා.

2 මේ වරාය නගරය පාලනය කිරීම සඳහා කොමිසමක් පත් කරන අතර එහි බලතල සියල්ල මේ කොමිසමට පවරනවා. එහි පස්දෙනකු හෝ හත් දෙනෙකු පත්කරන අතර එහි නිර්ණායකයන් නැහැ. අපේ ආණ්ඩු කාලයේ මෙය හදනකොට අනිවාර්යෙන් දැමිය යුතු පිරිසක් වන මුදල් අමාත්‍යංශ ලේකම්, මහ බැංකු අධිපතිවරයා හා පරිසර අමාත්‍ය ලේකම් වැනි අය නිලතල අනුව පත් කරනු ලැබුවා. නමුත් මේ කොමිසම සම්බන්ධයෙන් එසේ කිසිවක් නැහැ. ඕනෑම කෙනෙක් පත්කරන්න පුළුවන්. විදෙස් පුරවැසියෙක් වුවත් මේ කොමිසමට දැමිය හැකියි. මෙය බොහොම භයානක වෙන්නේ ඒ නිසා. මේ සඳහා කොමිසන් සභාවක් පිහිටුවීම සම්බන්ධයෙන් ඒ අය ධනාත්මකව සහ සෘණාත්මක ව මේ සඳහා හේතු කියන්න පුළුවන්. ධන පැත්තෙන් බැලූවිට ඉක්මනින් තීරණය ගැනීමට කියලා කියන්න පුළුවන්. සෘණාත්මක ව බැලූවිට ලංකාවේ නීති රාමුවෙන් පිට නිසා මේ මඟින් මූල්‍යමය ඊළමක් හැදිය හැකියි; අයුතු ලාභ ප්‍රයෝජන ලබාගැනීමට ද විය හැකියි; කළු සල්ලි සුදුකිරීම කරන්න පුළුවන්. දැනට ඇති ආකාරයට අණපනත් විශාල සංඛ්‍යාවක් මෙහිදී වලංගු වෙන්නෙ නැහැ. මෙය රටේ ස්වෛරීත්වයට ප්‍රශ්නයක් විය හැකියි.

3 මෙහි ආයෝජනය කරන්න ඕනෑම කෙනෙකුට පුළුවන්. නමුත් සාමාන්‍ය නීතිරීති අනුගමනය කරන අය නොවෙයි, මෙහිදී ජාවාරම්කරුවන්ට වුවත් ආයෝජනය කරන්න පුළුවන්. ලෝකයේ මෙවැනි දේවල් වෙලා තියෙනවා. මින් පෙර ඉතිහාසයෙත්; වෙනත් රටවලත් එවැනි දේවල් අපි දන්නවා.

4 සම්මත මුදල් ඒකකය විදේශ ඒකක විය හැකියි. සමහර රටවල්වල මෙවැනි නගර ක්‍රියාත්මක වීමේදී ඒ බව දක්නට ලැබෙනවා. සමහර තැන්වල විශේෂ ඒකක හදලා තියෙනවා. මහ බැංකුවේ අධීක්ෂණය නැති නිසා අපිට තාම හිතාගන්න බැහැ; මුදල් ඒකක පිළිබඳව. එක් රටක වුණත් ක්‍රමවේද දෙකක් විය හැකියි. පැනමාව වැනි රටවල්වල මෙවැනි නගරවල ඇමරිකානු ඩොලරය පාවිච්චි කරනවා. අපේ රටේ අයට රැකියාව කළ හැකි කියලා මා හිතන්නේ. මේ වරාය නගරය හදන්නේ සේවාවලට; නිදහස් වෙළෙඳ කලාපයට වගේ නිෂ්පාදනයකට නොවෙයි. සේවාවන්ට හදන නිසා වැඩියෙන්ම පඩි ලබන්නේ වෘත්තියවේදීන්. රැකියා අවස්ථා අපේ අයටත් තියෙයි. වැඩියෙන් විදේශිකයන්ට අවස්ථාව හිමි වෙයි. සාමාන්‍ය ජනතාවට යන්න පුළුවන් ද යන කාරණාවත් කෙළින්ම සඳහන් කරන්නේ නැහැ.

5 මේ මඟින් මේ රටේ ආර්ථිකයට කුමන ආකාරයේ ප්‍රතිලාභයක් ලැබෙයිද කියන කාරණාවෙ දි; වසර විසිපහකින් මෙහි ආර්ථික ප්‍රතිලාභය හිමි වෙයි කියලා අපි හිතනවා. ප්‍රතිලාභ කෙසේ වෙතත් රටේ ස්වෛරීත්වයට මෙයින් විශාල බලපෑමක් ඇතිවෙලා තියනවා. අපි පොඩි රටක්. අපේ රටේ ආරක්ෂාව ලැබෙන්නේ; අපේ රටේ තියෙන විදෙස් ප්‍රතිපත්ති හරහායි. අපේ විදෙස් ප්‍රතිපත්තිය නොබැඳි ප්‍රතිපත්තියක්. මෙයින් අපිට එකපාර බැඳීම් ඇතිවෙනවා. මේවායින් භූ දේශපාලනික ප්‍රශ්නයක් මතුවෙන්න පුළුවන්. ඒ නිසා අපට ලොකු රටවල් සමඟ සටන් කරන්න බැහැ. අපි මුලින්ම මෙය තේරුම් අරගෙනයි මෙවැනි දේවල්වලදී නීති රාමුව සකස් කළ යුත්තේ. දැනට ඇති විදිහට අපි සම්පූර්ණයෙන් මේ ව්‍යාපෘතිය ප්‍රතික්ෂේප කරන්නේ ඒ නිසයි.

3 වන මාසය සැමරීම

දොස්තර එච්.ඩබ්. පෙරේරා
(ශ්‍රී ලංකා ක්ෂය රෝග මර්දන ව්‍යාපාරයේ හිටපු අධිකාරී)
උපත : 1922 ජූලි 26
විපත : 2021 ජනවාරි 15
අප අතරින් වෙන්වී නෙමසක් ගතවුවත් ඔබ සමග ගතකළ ඒ සුන්දර ජීවිතයේ මතක සටහන් සදකාලිකය . . . .
ආදරණීය බිරිඳ ඩොරිස් සහ දරුවන්
ටෙලි : 011-2852407, 0763551749

අප්‍රේල් 14 ඇරඹුණු රමසාන් සමය
මැයි 14 වැනිදා නිමවීමට නියමිතය.

නෝම්බි ඇල්ලූ මාධ්‍යවේදීන් කියන කතා

● **හර්ෂා සුගතදාස**

පසුගිය අප්‍රේල් 14 වැනිදා මෙරට සිටින සිංහල හා දෙමළ ජනතාවට සතුට සොම්නස රැගෙන ආ දවසක් වූයේ සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද එදිනට යෙදී තිබුණු නිසාය. මේ වසරේ අප්‍රේල් 14 වැනි දවස සිංහල හා දෙමළ ජනතාවට පමණක් නොව මුස්ලිම් ජනතාවට ද සුවිශේෂී දිනයක් විය. ඊට හේතු වූයේ මුස්ලිම් ජනතාවගේ රමසාන් මාසය අප්‍රේල් 14 වැනි දින උදා වීමයි.

"ඉස්ලාමීය දින දර්ශනයට අනුව නව වැනි මාසය රමසාන් මාසය ලෙස හැඳින්වෙනවා. ඊට පෙර මාසය හැඳින්වෙන්නේ සහබාන් මාසය කියලා. සහබාන් මාසය කලින් අවසන් වුණොත් රමසාන් මාසය කලින් ආරම්භ වෙනවා. මේ පාර සහබාන් මාසය අවසාන වුණේ දින 30 කින්. ඒ නිසා මෙවර රමසාන් මාසය අප්‍රේල් 14 වැනිදා ආරම්භ වුණා. රමසාන් මාසය උපවාසයෙහි යෙදෙන කාලය ලෙස හැඳින්වෙනවා. රමසාන් කියන අරාබි වචනයේ තේරුම පව් පුච්චා දැමීමයි. ඒ අරමුණින් තමයි අපි මේ මාසය ගත කරන්නේ. උපවාසය ආරම්භ වන්නේ දවසේ සඳ බැසයන වෙලාවටයි. ඒ කියන්නේ පාන්දර. උපවාසය අවසාන කරන්නේ දවසේ ඉර බැස යන වෙලාවට. ඒ කියන්නේ හවස. සාමාන්‍යයෙන් දවසේ පැය 24 න් පැය 14 ක් උපවාසයට වෙන් කරනවා. මෙය රටින් රටට වෙනස් වෙනවා " යනුවෙන් විස්තර කළේ ශ්‍රී ලංකා මුස්ලිම් ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ සභාපති, නවමනි පුවත්පතේ කර්තෘ එන්.එම්. අමීන්ය.

ඉස්ලාම් දහමට අනුව අනිවාර්ය 4 වැනි යුතුකම ලෙස සැලකෙන රමසාන් උපවාසය, වයස අවුරුදු 10 සම්පූර්ණ කළ සෑම ඉස්ලාම් අයෙකුම ඉටු කළ යුතු පිළිවෙතකි. වයස අවු. 10 ට අඩු කුඩා දරුවන්ට මෙන් ම වියපත් අයට ද රෝගීන්ට ද ගර්භණී හා කිරිදෙන මවුවරුන්ට ද උපවාසයේ නිරත නොවී සිටිය හැකි ය. එමෙන් ම කාන්තාවන්ට ඔසප් කාලයේදී උපවාසයෙන් බැහැර විය හැකි ය. රමසාන් උපවාසය ලෙස කවුරුත් හැඳින්වුවද කටවහරට අනුව මෙය හැඳින්වෙන්නේ නෝම්බි ඇල්ලීම යනුවෙනි.

පැය 14 ක පමණ කාලයක් නිරාහාරව සිටීම තුළින් දුප්පතුන්ගේ දුක හඳුනා ගැනීමට අවස්ථාව උදාවන බවත් දුප්පතුන්ට අසරණයන්ට උදව් උපකාර කිරීමේ මානසිකත්වය ඇති වන බවත් එන්. එම්. අමීන් වැඩිදුරටත් සඳහන් කළේ රමසාන් මාසය පින් කිරීම සඳහා යොමු වන මාසයක් බවට අවධාරණය කරමිනි. ශුද්ධ වූ අල් කුරාණය පහළ වූයේ ද රමසාන් මාසයේ බැවින් මෙම මාසය ඉස්ලාම් බැතිමතුන්ට සුවිශේෂී මාසයකි.

උපවාසයේ නිරත වෙමින් වත්පිළිවෙත් ඉටු කරන රමසාන් මාසයේදී පාසල් දරුවන්ට නම් නිවාඩු ලැබේ. එහෙත් කාර්යාලවල සේවය කරන ඉස්ලාම් බැතිමතුන්ට හෝ අන් කිසිවෙකුට උපවාස මාසයේ නිවාඩු ලැබෙන්නේ නැත. ඔවුහු සියලුදෙනාම සුපුරුදු පරිදි රාජකාරිවල නිරත වෙති. ඔවුන් අතරින් පුවත්පත් කලාවේ නිරත වී සිටින මුස්ලිම් ජනමාධ්‍යවේදීන් කීපදෙනෙකුගෙන් උපවාසයේ යෙදෙන ආකාරය පිළිබඳව විමසීමක් කළේ පුවත්පත් කලාව ඉතා අවිවේකී, කාර්ය බහුලත්වයෙන් පිරුණු ක්ෂේත්‍රයක් වන නිසා ය.

"ඉස්ලාම් දහම සෞඛ්‍ය පැත්තෙන් ඉතා වැදගත් පණිවිඩයක් දෙනවා. මාසයක් හෝ උපවාසයේ යෙදීමෙන් අපේ ශරීරයේ ආහාර ජීර්ණ පද්ධතියට පොඩි විවේකයක් ලැබෙනවා. ඒ වගේම ඉස්ලාම් බැතිමතුන්ටත් තමුන්ගේ හිත පාලනය කර ගැනීමට, සංවරවීමට මේ කාලය හොඳ අවස්ථාවක් ලබාදී තිබෙනවා. උපවාසය අවසාන කරන වෙලාවට මම කාර්යාලයේ හෝ වැඩකට ගිහින් එළියේ ඉන්න පුළුවන්. ඒ තැන කොහොම වුණත් වතුර ටිකක් බීලා උපවාසය අවසාන කරනවා. කෑම කන්න අවස්ථාවක් ලැබුණොත් කෑම කනවා."

වමේ සිට - දෙටු ප්‍රවීණ මාධ්‍යවේදී එන්. එම්. අමීන්, ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදින් වන හනා ඉබ්‍රහිම්, රමේස් උවයිස්, ෆවුස් මොහොමඩ් සහ මාධ්‍යවේදිනී සහිඩා අල්මා

රාජ්‍ය සහ පෞද්ගලික අංශවල සේවයේ යෙදී සිටින ඉස්ලාම් බැතිමතුන්ට උපවාස කාලයේදී සේවා ස්ථානයෙන් පිටවී යෑමට සහනයක් ලබා දීම නෛතිකව හිමි වුවත් ජනමාධ්‍යවේදීන්ට ඔවුන්ගේ වගකීම හා කාර්ය භාරය අනුව එවැන්නකට ඉඩක් හිමි නොවන බව පැවසුවේ දිනමිණ පුවත්පතේ නියෝජ්‍ය ක්‍රීඩා කර්තෘ ෆවුස් මොහොමඩ් ය.

යනුවෙන් පැවසුවේ දිනමිණ පුවත්පතේ නියෝජ්‍ය ක්‍රීඩා කර්තෘ ෆවුස් මොහොමඩ් ය.

ඩේලි එක්ස්ප්‍රස් සහ සන්ඩේ එක්ස්ප්‍රස් පුවත්පත්වල ප්‍රධාන කර්තෘ හනා ඉබ්‍රහිම් සඳහන් කරන්නේ උපවාසයේ යෙදී සිටින කාලය තුළ කාර්ය බහුලවීම ඉතා යහපත් දෙයක් බවයි.

"උපවාස කරන වේලාවට වැඩ කරන්න මම කැමතියි. මොකද අපි කාර්යබහුල වෙලා සිටින විට බඩගින්න ගැන හිතන්න වෙලාවක් නැහැනේ. අපිට උපවාසය අත් හරින්න තියෙන්නේ සවස 6.00 ට. ඒ කියන්නේ පත්තරේ වැඩ අධිකම වෙලාව. පත්තරේ ඉවර කරන වෙලාව. ඒ වෙලාවට මම නම් වතුර බීලා රටඉඳි කාලා උපවාසය අත් හරිනවා" යනුවෙන් ඩේලි එක්ස්ප්‍රස් සහ සන්ඩේ එක්ස්ප්‍රස් පුවත්පත්වල ප්‍රධාන කර්තෘ හනා ඉබ්‍රහිම් පැවසුවාය.

ශ්‍රී ලංකා මුස්ලිම් ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ සභාපති, ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී එන්.එම්. අමීන් සඳහන් කළේ රමසාන් උපවාසයේ නිරතවීම ජනමාධ්‍යවේදීන්ට පමණක් නොව නාට්ටාමිලාට ද පහසුවෙන් කළ හැකි දෙයක් බවය.

"මම නෝම්බි අල්ලලා හිටියාට මගේ රාජකාරිය අකුරටම ඉෂ්ට කරනවා. නෝම්බි අරින වෙලාවට ඉන්න තැන අනුව තමයි කෑම බීම තීරණය වෙන්නේ. උපවාසය අවසාන කරන වෙලාවට අඩුම ගණනේ වතුර ටිකක් බොනවා. මම පොඩි කාලේ නම් හරි ආසයි නෝම්බි අල්ලන්න. මොකද නෝම්බි අවසාන වුණාම රසවත් කෑම බීම ගොඩාක් ජාති ලැබෙන නිසා. ඒත් මම ලොකු වෙනකොට තේරුම් ගත්තා නෝම්බි ඇල්ලීමේ අරමුණ වෙනත් දෙයක් බව. තවත් කෙනෙකුගේ දුක හඳුනන, දුප්පතුන්ට පිහිටවන, අන්‍යයන්ට මෛත්‍රිය දක්වන මනුෂ්‍යත්වයෙන් පිරිපුන් මිනිසකු බිහි කිරීම තමයි මෙහි අරමුණ." යනුවෙන් සඳහන් කළේ ඩේලි මිරර් පුවත්පතේ නියෝජ්‍ය කර්තෘ රමේෂ් උවයිස් ය.

මෙහිදී ඔහු තවත් අපූරු කාරණාවක් මතු කළේය. ඒ අද වනවිට Intermittent Fasting යනුවෙන් ආහාර නොගෙන සිටීමේ ක්‍රමවේදයක් ලෝකයේ පවතින බවය. එය යහපත් ශරීර සෞඛ්‍යයකට හිතකර බවට නිර්දේශ කර ඇති බැවින් රමසාන් උපවාස මාසයට අමතරව තවත් මාස 4 ක් පමණ ඔහු Intermittent Fasting ක්‍රමවේදය අනුගමනය කරන බව ද පැවසීය.

"මමත් අවුරුදු 10 ඉඳලා නෝම්බි ඇල්ලුවා. දැනුත් උපවාසයේ යෙදී සිටිනවා. සාමාන්‍යයෙන් ඕනෑම කෙනකු තමුන් ගැන විතරයි හිතන්නේ. අනුන්ගේ බඩගින්න, අනුන්ගේ දුක දැනෙන්නේ නැහැ. උපවාස කාලයේදී අපිට අනුන්ගේ බඩගින්න දැනෙනවා. දුක වේදනාව දැනෙනවා. මිනිසුන්ට අනිත් අය ගැන හිතන්න මෙය හොඳ අවස්ථාවක් හැටියටයි මම දකින්නේ. මේ මාසය තුළ පුළුවන් තරම් දාන පින්කම්වල නිරත විය යුතුයි. පරිත්‍යාගශීලී විය යුතුයි; අසරණ අයට උදව් කළ යුතුයි" යනුවෙන් 'ද මෝනින්' පුවත්පතේ මාධ්‍යවේදිනියක වූ සහිඩා අල්මා සඳහන් කළාය.

රාජ්‍ය සහ පෞද්ගලික අංශවල සේවයේ යෙදී සිටින ඉස්ලාම් බැතිමතුන්ට උපවාස කාලයේදී සේවා ස්ථානයෙන් පිටවී යෑමට සහනයක් ලබා දීම නෛතිකව හිමි වුවත් ජනමාධ්‍යවේදීන්ට ඔවුන්ගේ වගකීම හා කාර්ය භාරය අනුව එවැන්නකට ඉඩක් හිමි නොවන බව පැවසුවේ දිනමිණ පුවත්පතේ නියෝජ්‍ය ක්‍රීඩා කර්තෘ ෆවුස් මොහොමඩ් ය.

කෙසේ නමුදු ලොකු පොඩි, උස් පහත්, දුප්පත් පොහොසත් භේදයකින් තොරව සෑම ඉස්ලාම් බැතිමතුන්ම උපවාස ශීලය ආරක්ෂා කරන බව නම් පැහැදිලිය.

NelFarms

කොන්ත්‍රාත්කරුවන් අවශ්‍යයි

කර්මාන්තශාලා ගොඩනැගිලි කුකුළු ගෘහ, සේවක නවාතැන් ස්ථාන හා වැට ඉදිකිරීම යන ඉදිකිරීම් කටයුතු සඳහා විශිෂ්ට සේවා වාර්තා සහ පළපුරුද්ද සතු කොන්ත්‍රාත්කරුවන් අවශ්‍යව ඇත.

කරුණාකර ඔබගේ විස්තර "ඉදිකිරීම්" යනුවෙන් සටහන් කොට යොමු කරන්න.

ප්‍රධාන විධායක නිලධාරී
නූරානි එස්ටේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 83, බියගම පාර, පෑලියගොඩ
හෝ ඊමේල් කරන්න. chamila@nelfarm.com
අදාළ විස්තර රාජකාරි දින 7 ක් ඇතුළත ලැබීමට සැලැස්විය යුතුය.

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය (SLITHM)

සංචාරක අමාත්‍යාංශය

සංචාරක හා ආගන්තුක සත්කාර කර්මාන්ත සඳහා මානව සම්පත් සංවර්ධනය සඳහා අධ්‍යාපනය හා පුහුණුව ලබා දෙන රජයේ ප්‍රමුඛ ආයතනය අපි වෙමු.

පාඨමාලාව	විෂය	ගාස්තුව	ප්‍රවේශය සඳහා සුදුසුකම්	අවසාන දිනය
ආගන්තුක සත්කාර කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව වසර 3 - පූර්ණ කාලීන (කොළඹ සහ මහනුවර විදුහල්වල පැවැත්වේ)	මෙම පාඨමාලාව මගින් වෘත්තීය සූපවේදය, ආහාර හා පාන මෙහෙයුම් පිවිසුම් කාර්යාල මෙහෙයුම් සහ හෝටල් ගෘහ පාලන මෙහෙයුම් ආවරණයවේ.	රු. 5750.00 (එක් මසකට)	• තුනකට නොවැඩි වාර ගණනකදී එක්වර සියලුම විෂයන්වලින් අ.පො.ස. උසස් පෙළ විභාගය සමත් වී තිබීම. • දෙකකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. සා.පෙළ විභාගයේ ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මානයක් ලබා තිබීම **හෝ** එම විෂයට අ.පො.ස. උ.පෙළ විභාගයේදී සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම. • දෙකකට නොවැඩි වාරගණනකදී අ.පො.ස. සා/පෙළ විභාගයේදී ගණිතය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම. • වයස් සීමාව අවු. 18-24	2021 මැයි 21 වෙනි දින දක්වා
සහතික මට්ටම මාස 05 - පූර්ණකාලීන (පාසිකුඩා විදුහල හැර සියලුම පළාත් විදුහල්වල පැවැත්වේ.)	වෘත්තීය සූපවේදය අවන්හල හා බාර් සේවාව හෝටල් පිළිගැනීමේ සේවාව හෝටල් ගෘහ පාලනය	රු. 5000.00 රු. 4500.00 රු. 3000.00 රු. 3000.00 (එක් මසකට)	• දෙකකට නොවැඩි වාර ගණනකදී සම්මාන සාමාර්ථ 3 ක් හා ඉංග්‍රීසි හා ගණිතය ඇතුළුව අ.පො.ස සා/පෙළ අවම වශයෙන් සමාර්ථයන් 06 ක් ලබා තිබීම **හෝ** • SLITHM හි ශිල්පීය මට්ටම සමත් වීම සමග අදාළ ක්ෂේත්‍රයේ වසරක පුහුණුව **හෝ** • අදාළ ක්ෂේත්‍රයේ වසර 2 ක පුහුණුව සහිත දැනටමත් හෝටල් කර්මාන්තයේ සේවයේ නියුතු අයවලුන්ට, • වයස අවු.18 හා ඉහළ	
අන්තර් මධ්‍යම මට්ටම මාස 6 යි - පූර්ණ කාලීන (කොළඹ විදුහලේ පැවැත්වේ)	වෘත්තීය සූපවේදය, ආහාර පාන මෙහෙයුම්, පිවිසුම් කාර්යාල මෙහෙයුම්, හෝටල් ගෘහ පාලන මෙහෙයුම්	රු. 4100.00 රු. 3500.00 රු. 3500.00 රු. 3500.00 (එක් මසකට)	• යමෙක් අපේක්ෂා කරන ක්ෂේත්‍රයට අදාළ මූලික මට්ටමේ පාඨමාලා 04 ක්, පාඨමාලා 03 ක්, පාඨමාලා 02 ක් හෝ පාඨමාලා 01 ක් සමඟ අදාළ ක්ෂේත්‍ර පුහුණුව **හෝ** • කර්මාන්තයේ සිට සෘජුව ප්‍රවේශ වන අයදුම්කරුවන් මෙම කර්මාන්තයේ කළමනාකාර/ අධීක්ෂක මට්ටමේ අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද ලබා තිබිය යුතුය.	
පේස්ට්‍රි හා බේකරි පාඨමාලාව මාස 03 - පූර්ණකාලීන (කොළඹ විදුහලේ පැවැත්වේ)		රු. 5,000.00 (එක් මසකට)	• අ.පො.ස සා/පෙළ දක්වා අධ්‍යාපනය ලබා තිබිය යුතුයි. • වයස අවු.17-25 අතර	
සිද්ධි කළමනාකරණය පිළිබඳ සහතික පාඨමාලාව මාස 6 යි (කොළඹ විදුහලේ පැවැත්වේ)		රු. 35,000.00	• ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් සමග අ.පො.ස. සා/පෙළ **හෝ** ඒ හා සමාන විභාගයක් සමත්වීම **හෝ** • ඉංග්‍රීසි භාෂාව හැසිරවීමේ හැකියාව සමග MICE සංචාරක අංශයේ/සිද්ධි කළමණාකරන සමාගමක වසර පහක පළපුරුද්ද.	2021 මැයි 13 වෙනි දින දක්වා
කඳු නැගීම් හා මංපෙත් සංචරණය මාර්ගෝපදේශකයන් සඳහා සහතික පාඨමාලාව මාස 4 යි (කොළඹ සහ මහනුවර විදුහලවල පැවැත්වේ)		රු. 40,000.00	• ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් සමග අ.පො.ස. සා/පෙළ **හෝ** ඒ හා සමාන විභාගයක් සමත්වීම **හෝ** • ඉංග්‍රීසි භාෂාව හැසිරවීමේ හැකියාව සමග වික්‍රමාන්විත සංචාරක අංශයේ වසර පහක පළපුරුද්ද.	

පළමු වාරිකයත් සමඟ ලියාපදිංචි ගාස්තු ලෙස රු. 500/- ක් අය කරනු ලැබේ.(පාඨමාලා සඳහා තෝරාගත් සිසුන්ගෙන් පමණි.)

පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.
අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට (සමෘද්ධි ප්‍රතිලාභී) ශිෂ්‍යත්ව සඳහා අයදුම් කළ හැකිය.
සියලුම පාඨමාලා සඳහා කාන්තාවන් අයදුම්කිරීම උනන්දු කෙරේ.

SLITHM විදුහල් : කොළඹ, අනුරාධපුරය, කුරුණෑගල, මහනුවර, කොග්ගල, රත්නපුරය, බණ්ඩාරවෙල, යාපනය, පාසිකුඩා.

විමසීම් :
ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය
අංක 78, ගාලු පාර, කොළඹ 03, වෙබ් අඩවිය : www.slithm.edu.lk දුරකථනය : 011 2208312/15/16

අන්තර්ජාලය මඟින් අයදුම්කරන්න (වෙබ් අඩවියට ප්‍රවේශ වන්න : www.slithm.edu.lk)

සිළුමිණ

35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස්, කොළඹ 10.
දුරකථන පොදු: 011-2429429, 011-2421181, 011-2331181
කර්තෘ: 011-2429261 ජ්‍යෙෂ්ඨ සම කර්තෘ: 011-2429263
කර්තෘ මණ්ඩලය: 011-2429262-3-4-5
ෆැක්ස්: 011-2429260 (සිළුමිණ)
ඊ-මේල්: edmediaunit@gmail.com
දැන්වීම් කළමනාකරු: 011-2429351
ලුහුඬු දැන්වීම් කළමනාකරු: 011-2429341-2

වෂී 2021ක් වූ අප්‍රේල් මස 25 වැනිදා ඉරිදා

කොරහේ කිඹුලන් දැකීම

අන්ධකාරයට බිය දරුවකුට පහසුවෙන් සමාව දීමට අපට හැකිය. නමුත් සැබෑ ජීවිතයේ බේදවාචකය නම් වැඩුණු මිනිසුන් ආලෝකයට බිය වීමය කියා ප්ලේටෝ පවසා තිබේ. බොහෝ මිනිසුන් ආලෝකයට දියුණුවට බිය වෙති. ඒ එහි උපයෝගීතාව පිළිබඳ නොදැනුම්වත්කමිනි. වරාය නගරය ගැන ද එසේ ම ය. සමහරු මේ කුමක්ද කියාවත් නොදනිති; එහෙත් විලාසිතාවට වාගේ විරුද්ධ වෙති.

ලෙනාඩ් වුල්ෆ් 1910 දී හරි අපූරු ප්‍රකාශයක් කර තිබේ. හම්බන්තොට දිස්ත්‍රික්කයේ 1908 සිට 1911 දක්වා උප දිසාපතිවරයාව සිටි ඔහු ලාංකිකයන් අතර බෙහෙවින්ම ප්‍රචලිතය. ඔහු කියා ඇත්තේ 'හම්බන්තොටට වරායක් හදනවා නම් ඒකම මේ රට දියුණු කරන්න ඇති කියා ය'. එසේ කියූ ඔහු 60 දශකයේදී ලංකාවේ සංචාරයකට පැමිණි අවස්ථාවේ අසා ඇත්තේ 'තවමත් හම්බන්තොට වරායක් හැදුවේ නැද්ද' කියා ය. ලෙනාඩ් වුල්ෆ් දුටු සිහිනය සැබෑ වෙන්නට ශතකයක් ගත විය. නානා ප්‍රකාර බේගල් කියුව ද එහි උපයෝගිතාව අද ප්‍රායෝගිකවම ඔප්පු වී හමාරය. වරාය නගරය ගැන අතේ පැළවෙන බොරු කියන බොහෝ දෙනා ද මේ වැනි ම ය. කුමක් හෝ සංවර්ධනයක් ගැන කියද්දී ඔවුන්ට ජීවිත කාලයේ ම නොතිබූ තරම් ජාති වාත්සල්‍යයක් ඇති වෙයි. ඉනික්බිති ඔවුහු පොදු ජනතාව කුපිත වන අන්දමේ ප්‍රකාශ නිකුත් කරති. අවසන සංවර්ධනයේ සැබෑ ප්‍රතිඵල භුක්ති විඳීමේදී නම් අර කිසිවක් මතක නැත. ගැසූ බෙරයකුත් නැත; බෙරේ පළුවකුත් නැත කියන්නේ මේවාට ය.

හුඹස් බිය නිසා වරාය නගරයේ ඉදිකිරීම් කටයුතු යහපාලන ආණ්ඩු සමයේ තාවකාලික ව වසර දෙකහමාරක් පමණ අත්හිටෙව්ව ද පරිසර වාර්තා කැඳවීමෙන් පසු නැවත ආරම්භ කළේ ය. එනිසා සිදු වූ පාඩුව බිලියන ගණනකි; මේ වන විට කෑගසන කාටවත් ඒ ගැන මතක නැති වීම බේදවාචකයකි. ඔවුහු කොරහේ කිඹුල්ලු දකිති. එහෙත් හූනෙක්වත් දැකගත නොහැකි වෙති. චීන කොලනි කතාවත්, ගණිකා මඩම් කතාවත්, රාත්‍රී සමාජ ශාලා කතාත් කියමින් නැති බියක් මවන්නට උත්සාහ ගනිති.

මේ සුරංගනා කතා කියමින් කල් මැරිය හැකි කාලයක් නොවේ. ශීඝ්‍රයෙන් ආර්ථික දියුණුවක් සාක්ෂාත් කරගත යුතු කාලයකි. වසංගතයක් ලොව ම ආක්‍රමණය කරමින් සිටියදී රටක් ආගාධයට යනතෙක් වගකිව යුතු පාලන තන්ත්‍රයකට බලා සිටිය නොහැකි ය. ව්‍යාපාර කිරීමේ පහසුව අතින් ආයෝජකයන්ට වඩාත් සුදුසු රටවල් අතර ලංකාව සිටින්නේ 165 වැනි ස්ථානයේ ය. එසේ බලන කල ලංකාව සිටින්නේ ආයෝජන තත්ත්ව අනුව පහළ ම ස්ථානයක ය. විදෙස් ආයෝජකයන් ලංකාවට ගෙන ඒමේ කඩිනම් සැලැස්මක්, ව්‍යාපෘතියක් සැකසීම අත්‍යවශ්‍ය කරුණක් ව පවතින මේ මොහොතේ කෙරෙන කඩිනම් සංවර්ධන ඉලක්ක වෙත අකුල් හෙළීම ශක්තිමත් විපක්ෂයක කාර්යය නොවිය යුතුය. පෘථිවියේ මහාද්වීපවලට වඩා සාගරය වැඩිය.

දිනෙන් දින වැඩිවන ජනගහනයට සුදුසු ගොඩබිම් හා ආර්ථික කලාප ඇතිකිරීම එනිසා අත්‍යවශ්‍ය කරුණකි. මේ අධික අවශ්‍යතාව වෙනුවෙන් සාගරය ගොඩකර ගොඩබිම් තනන්නට මිනිසා පෙලඹුණේ අද ඊයේ නොවේ ය. ලොව පුරා රටවල් රැසක ම සාගර කලාප ඉදිකර ඇත්තේ ඒනිසා ය. සාගර නගරවල ඇති ආකර්ෂණීය නිමැවුම ද සංචාරක පෙලඹවීම ඇති කරන්නේ ය. තායිලන්තයේ කෝ පෙන්සි නගරය, මෙක්සිකෝවේ වැනීසිය, ජපාන වරාය නගරය, ග්වාතමාලාවේ ෆ්ලෝරිස් නගරය, ඩුබායි පාම් නගරය මහ මුහුද ගොඩකර නව නගර ඉදිකරන ලද සාර්ථක අවස්ථා ය.

එමෙන්ම අප වරාය නගරය ඉදිකරන චයිනා කොමියුනිකේෂන් කන්ස්ට්‍රක්ෂන් සමාගම ලෝකයේ ප්‍රධාන ඉදිකිරීම් සමාගම් 225 ක් අතර දහවැනි ස්ථානයේ සිටියි. මෑත කාලය ඇතුළත මෙරට දක්ෂිණ අධිවේගී මාර්ගය, කොළඹ පිටරවුම් පාර, හම්බන්තොට වරාය සහ ගුවන් තොටුපොළ යනාදී වශයෙන් ඉදිකිරීම් ගණනාවකට මෙකී සමාගම සම්බන්ධ විය. එබැවින් සමාගමේ ක්‍රියාපටිපාටිය ගැන බිය විය යුතු නැත.

බොහෝදෙනෙක්ට ප්‍රශ්නයක් වී තිබුණේ වරාය නගර කොමිසම ගැන ය. යෝජිත කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාවේ බහුතරය ශ්‍රී ලාංකියන් බව ජනාධිපති නීතිඥ සංජීව ජයවර්ධන මුදල් අමාත්‍යාංශ ලේකම් හා කැබිනට් මණ්ඩල ලේකම් වෙනුවෙන් පෙනී සිටිමින් ශ්‍රේෂ්ඨාධිකරණයට දන්වා සිටියේ ඉකුත් 22 දා ය. කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනත් කෙටුම්පතට එරෙහිව ගොනු කර ඇති පෙත්සම් කැඳ වූ අවස්ථාවේදී අතරමැදි පෙත්සම් වෙනුවෙන් කරුණු දක්වමින් ජනාධිපති නීතිඥවරයා මේ බව ප්‍රකාශ කළේ ය. වරාය නගරය ශ්‍රී ලංකාවේ පාලනයෙන් නිදහස් ය කියමින් බොරු භීතිකා මවමින් වරාය නගරය ගැන හුඹස් බියක් ඇති කරමින් කතා කළ බොහෝ දෙනකුට ඒ පිළිතුර ප්‍රමාණවත් ය.

නව රැකියා අවස්ථා උදා වීම, සංචාරක පුරයක් සේ දෙස් විදෙස් ආකර්ෂණයට නතු වීම, සෘජු ආයෝජන කලාප වර්ධනය වීම, රටේ දේශීය නිෂ්පාදනවලට අසීමිත වටිනාකමක් ලැබීම වැනි සෘජු ප්‍රතිලාභ රැසක් මේ හරහා රටට ලැබීම වැළැක්වීමට නොහැකිය.

සර්ව අශුභවාදී වෙමින් දේශපාලන කෝණයෙන් මේ විසල් ලෝකය දෙස නොබලා සියල්ල විවේචනය කරමින් සිටීම එක් අතකින් බේදජනක ය. කොළඹ වරාය නගර පනත මේ වන විට අන්තර්ජාලයේ තිබේ. ඕනෑ ම කෙනෙකුට එය කියවා ගැනීමට හැකිය. එසේ නොකියවා හිතේ තියෙන තියෙන දේවල් තැන තැන කියන්නට යෑම අතාර්තික ය. වරාය නගරය හේතුවෙන් ඉදිරියේදී විවර වන විසල් ලෝකය ඉදිරියේ ඇති අවස්ථා ගැන සවිඥානික වීම වැදගත් ය.

ප්‍රකට විද්වතකු මේ වැනි අවස්ථා හා පටු චින්තනය ගැන හරි අපූරු කතාවක් කියා තිබේ. එනම් 'ඔබ හැඳි වැඩුණු කොටුවෙන් පිටතට නොගියහොත්, ලෝකය කොතරම් විශාලදැයි ඔබට වැටහෙන්නේ නැත'

'වරාය නගරය වැනි ආර්ථික මොඩල අනෙක් ප්‍රදේශවලටත් ආදේශ කළ හැකියි'

මහාචාර්ය සිරිමල් අබේරත්න

● සුභද්‍රා දේශප්‍රිය

අද වන විට ආසියානු කලාපවල ආර්ථික කලාප විශාල ලෙස දක්නට ලැබෙයි. මෙරට ඉදි කෙරෙන වරාය නගරය නම් කර ඇත්තේ විශේෂ ආර්ථික කලාපයක් ලෙසයි. විශේෂ ආර්ථික කලාප දකුණු කොරියාව, මැලේසියාව, සිංගප්පූරුව වැනි රටවලද, මැදපෙරදිග රටවලද, එක්සත් අරාබි එමිර් රාජ්‍යයේ ඩුබායි අබුඩාබිහි ද, අප්‍රිකාවේ ද දක්නට ලැබෙයි. විශේෂ වෙළෙඳ ආර්ථික කලාප සහ අන්තර්ජාතික මූල්‍ය මධ්‍යස්ථාන යන සංකල්පය විශේෂයෙන් ලංකාවට පමණක් අලුතින් හඳුන්වාදීමක් නොවෙයි. බටහිර සහ නැගෙනහිර රටවල් ගත්විට විශේෂ ආර්ථික කලාප දක්නට ලැබෙයි.

එසේම ලංකාව අනෙක් රටවලට වඩා මෙවැනි විශේෂිත ආර්ථික කලාපයක් ගොඩනැගීම සම්බන්ධයෙන් විශාල ප්‍රමාදයක් දක්නට ලැබෙයි. අපේ රට strategically located උපාය මාර්ගිකව ගත් විට හොඳ භූගෝලීය පිහිටීමක් ඇති රටක් ලෙස නිතර සඳහන් වන කරුණකි, එසේ නම් ආර්ථික උපාය මාර්ගික වශයෙන් ගත් විට හොඳ පිහිටීමක් අපේ රටේ පවතී. අපි මේ පිහිටීම ගැන කතා කරමින් සිටියද මෙතෙක් ප්‍රයෝජනයට නොගත් අතර, මෙය ප්‍රයෝජනය ගැනීමට නම් එයට වැදගත් වන ආර්ථික උපාය මාර්ග හඳුනාගත යුතුයි. චීනයේ විශේෂ ආර්ථික කලාප බොහොමයක් දක්නට ඇත. දැනට ක්‍රියාත්මක වන Hainan දූපත චීනයට අයිති දූපත එවැන්නකි. එය ලංකාවෙන් බාගයක ප්‍රමාණයේ භූමි ප්‍රදේශයක් වන අතර, ලංකාවේ ජනගහනයෙන් බාගයක් පමණ එහි වෙයි. මෙය දැනට විශේෂිත ආර්ථික කලාපයකි. එමෙන්ම සිංගප්පූරුව දෙස බැලූවිට විශේෂත්වයක් වන්නේ එය නගරයක් සහ රටක් වීමයි. මුළු රටම විශේෂ ආර්ථික කලාපයක් බවට පත්වී ඇත. එහි බදු ක්‍රමය, ආයාත නිදහස් කිරීම්, මේ සියල්ල සැලකිල්ලට ගත් විට සිංගප්පූරු ආණ්ඩුවේ ජාත්‍යන්තර වෙළඳාම මත අය කෙරෙන තිරු බදු ගත් විට සියයට බින්දුවකට ආසන්න වෙයි.

එමෙන්ම ව්‍යාපාරික කටයුතුවලට ඩුබායි ආදායම් බදුවලින් සම්පූර්ණයෙන් නිදහස් කර ඇත. විශේෂ ආර්ථික කලාපයක් වන මෙහි ආයාත බදු සියයට පහකට වඩා අඩුවෙයි. සමාගම් බදු නැත. එහෙත් මෙය ලංකාවේ ක්‍රියාත්මක කිරීමට නොහැකිය. ලංකාවේ ආණ්ඩුවේ ආදායමෙන් සියයට 18 බදු ආදායම එකතු වන්නේ ආයාත බදුවලිනි. එය ඉතා වැරදි ප්‍රතිපත්තියකි. අපේ ආසියාතික රටවල ආයාත බදු ප්‍රමාණය රටේ බදුවල ප්‍රතිශතයක් ගත්විට සියයට දෙකක් හෝ හතරක් අතර වෙයි. දේශපාලනික පරිසරය සහ නීතිරීති, මිනිසුන්ගේ ආකල්ප අනුව ඒ මට්ටමට යන්න අපට අපහසුය.

අපේ රටේ වාණිජමය ව්‍යාපාරයක් ආරම්භ කිරීමේදී වසර ගණනක් ගතවන සංකීර්ණ ක්‍රියාවලියක් එහි වෙයි. එහිදී විශේෂ ආර්ථික කලාපයක් තුළ එසේ නොවෙයි. මේ විශේෂිත ආර්ථික කලාපය තුළ ආර්ථික කටයුතුවලට වේගවත් ක්‍රමවේදයක් කඩිනමින් සැකසෙයි. ආර්ථික කටයුතු වලට අදාළ දේ නිමා කරගැනීමක්, සම්පූර්ණ කරගත හැකි ක්‍රමවේදයක් මෙහිදි සිදු කෙරෙයි. මේ විශේෂ ආර්ථික කලාප සඳහා රටේ නීති රීති වලට බාහිරව ආර්ථික කොමිසමක් වෙයි. ඒ ආර්ථික කොමිසමෙන් වහා තීරණ ගනු ලබයි. මෙය විශේෂ ආර්ථික කලාපයක වන සුවිශේෂ ලක්ෂණයකි. එකම කවුළුවක් තුළින් සියල්ල කරගැනීමේ හැකියාව ජාත්‍යන්තර ආයෝජන සඳහා වැදගත් වෙයි.

මෙවැනි කරුණුවලදී අපේ රටේ උපායශීලි භූගෝලීය පිහිටීම වාසියට හරවා ගැනීම ඉතා වැදගත් වෙයි. එමෙන්ම අපිටම ආවේණික TIME ZONE (කාල කලාප) පැවැතීමද ඉතා වැදගත් වෙයි.

ලෝකයේ වෙන්කර ඇති වේලා කලාප අනුව බැලීමේදී අපට ඇත පෙරදිග රටවල් සමග මෙන්ම ටොකියෝ සහ සෙන්හායි ව්‍යාපාරික නගර සමග ගනුදෙනු කළ හැකිය. විශේෂයෙන් (TIME ZONE)දැඩිව බලපෑම් නොවන තැනක අපේ රට පිහිටා තිබීම වාසියට හරවා ගත හැකිය. මේ අනුව හොඳ කාල කළමනාකරණයක් ඇතිව බටහිර රටවල් සමග සම්බන්ධ වෙමින් කටයුතු කිරීමට ද හැකියි. ඒ හැකියා ඇති නිසා නිසි කාලය කළමනාකරණය කරගනිමින් ඒ ව්‍යාපාරික රටවල් සමග සම්බන්ධ වෙමින් කටයුතු කළ හැකියි. මේ වේලා කලාප ඉක්මවා යමින් එය සැලසුම් කරගනිමින් කටයුතු කිරීමේ හැකියාව අපිට ඇත. එවැනි ආකාරයකින් ලෝකය සමග ගනුදෙනු සිදුවන, ලෝකයට විවෘත වීමක් මේ විශේෂ ආර්ථික කලාපය මගින් සිදු කරගත හැකියි.

> මේ විශේෂිත ආර්ථික කලාපයෙන් සමස්ත ආර්ථිකයට ඇතිවන පිබිදීම් අති විශාලයි. මේ වරාය නගරය ලංකාවේ භූමියේම කොටසක් වන අතර විශේෂිත ආර්ථික කලාපයක් වන මෙහි ලංකාවේ අනෙකුත් අංශ වන කෘෂිකාර්මික අංශ හා රටේ ආර්ථිකය කෙරෙහි ද බලපෑම් කරයි.

මේ රට ඉදිවන ආර්ථික කලාපයෙන් බලාපොරොත්තු වන තවත් කාරණාවක් නම් ලෝකයේ ඉහළ මට්ටමේ ආයෝජකයන්, ප්‍රධාන වශයෙන් සේවා අංශ සපයන්නන් මේ සඳහා සහභාගී කරවා ගැනීමයි. විශේෂයෙන් ආයෝජකයන් ලෙස මෙහි ආයෝජනය කරන්නේ විදෙස් බැංකු ක්ෂේත්‍රය, තොරතුරු තාක්ෂණ, කාර්යෝපාය ක්ෂේත්‍රය, වාණිජ, නැව්, අධ්‍යාපනය, සෞඛ්‍ය වැනි සේවාවල යෙදි ඇති සමාගම් විය හැකියි. ලෝකයේ ඇති සමාගම්වල ප්‍රධාන කාර්යාල හෝ ශාඛා මෙන්ම ඉහළම පෙළේ ආයෝජකයන් සහ ඒ සඳහා අවශ්‍ය කරන ජාත්‍යන්තර මට්ටමේ වෘත්තියකයන් ආකර්ෂණය කරගැනීම ප්‍රධාන අරමුණක් විය යුතුයි. අනෙක් සියලු ආර්ථික කාරණා පදනම් වන්නේ ඒ මතයි. ආසියාවේ ඇති ප්‍රධාන විශේෂිත ආර්ථික කලාපවල ආයෝජනය කර ඇත්තේ ද එවැනි ආයෝජකයන්ය. අපේ අරමුණ විය යුත්තේ ඒ අයගෙන් යම් කොටසක් මෙරටට ආකර්ෂණය කර ගැනීමටයි. එසේ කිරීමෙන් අපට සෘජුව හෝ වක්‍රව ආර්ථික වාසි ලැබෙයි. ජාතික ආදායම් වැඩි වෙයි; විදේශ විනිමය ඉපැයීම, සේවා නියුක්තිකයන්ගෙන් ලැබෙන ආදායම වැඩි වීම සිදු වෙයි.

ඊට අමතරව ව්‍යාපාර විශාල සංඛ්‍යාවක් ද්විතික වශයෙන් ලංකාවට ගලාගෙන ඒම මෙන්ම පවතින ශ්‍රමයට මෙන්ම ව්‍යාපාරවලට ද්විතික ප්‍රතිලාභ සහ දිගුකාලීන යහපත් ආර්ථික ප්‍රතිවිපාක මේ මගින් අත්වෙයි. මේ විශේෂිත ආර්ථික කලාපයෙන් සමස්ත ආර්ථිකයට ඇතිවන පිබිදීම් අති විශාලයි. මේ වරාය නගරය ලංකාවේ භූමියේම කොටසක් වන අතර විශේෂිත ආර්ථික කලාපයක් වන මෙහි ලංකාවේ අනෙකුත් අංශ වන කෘෂිකාර්මික අංශ රටේ ආර්ථිකය කෙරෙහි ද බලපෑම් කරයි. එසේම මෙහි ඇතිවන ව්‍යාපාරික අංශ මගිනුත් රටේ ආර්ථිකයට සුවිශේෂ බලපෑමක් ද ඇති කරනු ලබයි. මෙතුළ සිදුවන ඉපැයීම් නිෂ්පාදන අපේ ආර්ථිකයේම කොටසකි. එය මෙරටේ දළ දේශීය නිෂ්පාදිතයේම කොටසකි. එහිදී දළ දේශීය නිෂ්පාදිතය වැඩි වීමට, අපේ රටේ ඒක පුද්ගල ආදායම වැඩිවීමට, අපේ රටේ විදෙස් විනිමය වැඩිවීමට, සේවා නියුක්තිය, නව තාක්ෂණය අලුත් ව්‍යාපාරික කළමනාකරණ සම්ප්‍රදායෙන් ලංකාවට ගලා ගෙන ඒමට අනිවාර්ය හේතුවක්ද වෙයි. ලංකාවේ ඇති නීති රීති පද්ධතිය ගත් විට අපේ රටේ ඇති කුමන ජාත්‍යන්තර දත්ත වාර්තා අනුව ගත්තද Economic freedom index, innovation index, competitiveness index, logistic performance index මේ සෑම ජාත්‍යන්තර දර්ශකයකින් ලංකාව ඉතා දුර්වල මට්ටමක වන බවක් දක්නට ලැබෙයි.

මේ දුර්වල මට්ටමේ සිටීමට එක් හේතුවක් වන්නේ, අපේ රටේ ඇති නීති රීති රෙගුලාසි ක්‍රමයේ ඇති දුර්වලතාව බව ඉතා පැහැදිලිය. අපි රටක් ලෙස ඒ නීති රෙගුලාසි ප්‍රතිසංස්කරණය කර හෝ දියුණු කර නැත. ඒ අනුව ලෝකයේ අනෙක් රටවල් සමග සැසැඳීමේදී ආර්ථික දර්ශකවල ඉතා පහළ ස්ථරයක අපේ රට පිහිටීමට එක් හේතුවක් ලෙස මේ යල්පැන ගිය නීතිරීති පද්ධතිය එක් හේතුවකි. ව්‍යාපාරිකයෙක් හෝ ආයෝජකයෙක් ලංකාවේ ආයෝජනය කිරීමට පෙර මේ ජාත්‍යන්තර දර්ශකවල කුමන ස්ථානයක අපි සිටින්නේ යන කාරණාව පිළිබඳව විමසිලිමත් වෙයි. පසුගිය කාලවකවානුව පුරාම මේ රටේ විදේශ ආයෝජන ඉතා දුර්වල මට්ටමක පැවැතිණි. එසේනම් ඒ දුර්වල පරිපාලන හේතුවූ පරිපාලන ක්‍රමවේදයන්ගෙන් අපි පරිබාහිර විය යුතුයි.

ඩුබායි සහ සිංගප්පූරුව විශේෂයෙන් සැලකෙන විශේෂිත ආර්ථික කලාප දෙක වෙයි. ඊටත් වඩා හොඳ ආර්ථික මධ්‍යස්ථානයක් අපි මෙමගින් අපේක්ෂා කළ යුතුයි. එසේනම් අපි ඒ අභියෝගයට මුහුණ දිය යුතුයි. සිංගප්පූරුවටත්, ඩුබායිවලටත් වඩා හොඳ ආයෝජන මධ්‍යස්ථානයක් බවට මෙරට වරාය නගරය හරහා නිර්මාණය වන ආර්ථික කලාපය පත් කළ යුතුයි. මේ නිසා මෙයට සුවිශේෂවූ අණපනත් සහ පරිපාලන ක්‍රමයක් සැකසීමකට අපි යා යුතුයි. යල් පැන ගිය, තවදුරටත් ධාවනය නොවන අණපනත් මේ සඳහා අදාළ වන්නේ නැත. අපි ලෝක මට්ටමේ ව්‍යාපාරික ස්ථානයක් සකසා ගන්නවාද යන කාරණා අපි විසින්ම තීරණය කරගත යුතුයි.

මෙහි පරිපාලනය විශේෂ ආර්ථික කොමිසමක් මගින් සිදු කෙරෙයි. එය සුවිශේෂ ආර්ථික කොමිෂමකි. මෙහි පාලනය කිරීම සඳහා පත් කෙරෙන විශේෂ ආර්ථික කොමිසමට සාමාජිකයන් පහකට නොඅඩු හතකට නොවැඩි සාමාජිකයන් වන අතර එහි සභාපතිවරයෙක් ද වෙයි, මේ සියලුදෙනා පත් කරනු ලබන්නේ ජනාධිපතිවරයා විසිනි. මේ සියලු පරිපාලන කටයුතු පාලනය වන්නේ මේ කොමිසම මගිනි. රටේ සාමාන්‍ය නීති රීති පරිපාලන ව්‍යුහය මේ අවස්ථාවේ පැත්තකින් තැබිය යුතු හෙයින් මේ කොමිසම පත් කරනු ලබයි. වේගවත් සංවර්ධනයක් සිදුවන්නේ එවිටයි. මේ වරාය නගරය නිර්මාණය කරනු ලබන්නේ චීන සමාගමකි. එය ලංකාවේ ලියාපදිංචි වී ඇති සමාගමකි. ගාලු මුවදොර මුහුදු තීරයේ සිට හෙක්ටයාර් 269ක මුහුදු ප්‍රදේශයක් ගොඩ කෙරෙයි. මේ සඳහා ආයෝජනය කර ඇත්තේ චීන මුදල් වන අතර එය ඇමරිකානු ඩොලර් බිලියන එකහමාරක ආයෝජනයකි.

වරාය නගරය නිර්මාණය වීමෙන් පසුව ඒ සඳහා ආයෝජකයන් පැමිණෙනු ලබනුයේ ගොඩනැගිලි ඉදිකිරීම සඳහායි. එම චීන ආයෝජකයන් මෙහි ඇති ව්‍යාපාරික ඉඩම් ප්‍රමාණ බදු දීමෙන් ඒ සමාගමේ අපේක්ෂාව වන්නේ ඔවුන් විසින් ආයෝජනය කරන ලද ආයෝජන මුදල් යළි ආවරණය කරගැනීමටයි. ඒ බදු මුදල්වලින් මෙහි පාලනය සිදු කෙරෙන්නේ ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන ආර්ථික කොමිසම මගිනි. මෙය විශේෂ ආර්ථික කලාපයක් වන අතර මෙහි පරිපාලනය කිරීමට දැනුම මෙන්ම හැකියාව ද තිබිය යුතුයි. ඒ අනුව ආර්ථික අංශයේ හා පරිපාලන අංශයේ වඩා සුදුස්සන් ඒ සඳහා පත් විය යුතුයි.

විශේෂයෙන් අන්තර්ජාතිකව භාවිත වන මුදල් ඒකක කිහිපයක්ද ශ්‍රී ලංකා රුපියල් ද මෙහිදී භාවිත වෙයි.

මේ වරාය නගරය හරහා ඉදිවන ආර්ථික කලාපයේ ආරක්ෂක කටයුතු සිදුකෙරෙන්නේ අපේ හමුදාව හා පොලිසිය විසිනි. මේ ආර්ථික කොමිසම මෙන්ම මෙහි වගකීම ආර්ථික කටයුතු ඇමැතිවරයාට හිමි වෙයි. ඒ ඇමතිවරයා කැබිනට් ඇමැතිවරයකු විය යුතුයි. එමෙන්ම මේ කොටස රටින් ඉවත් කළ කොටසක් හො චීනයේ කොලනියක් හෝ නොවෙයි. එසේ වීමට නොහැකියි. චීනය මේ සඳහා ආයෝජනය කර ඇත. අපිට ඩොලර් බිලියන එකා හමාරක් වැය කර මුහුදු ගොඩකර මෙවැනි දෙයක් කිරීමේ ආර්ථික හැකියාව අපට නැත. අවුරුදු විසිපහක් වැනි කාලයක් යනවිට මෙහි ඉඩම් බදු දීමෙන් මේ ආයෝජනය කළ සමාගම විසින් උපායා ගැනීමට හැකියාව ඇත. අපිට මුදල්වැය කිරීමට හැකිනම් එය මුදල් දී ලබා මේ කොටස ලබා ගැනීමට වුවත් හැකියාව ඇත.

මේ තුළ ශ්‍රී ලාංකිකයන්ට නිදහසේ ගමන් කිරීමේ අයිතිය වෙන අතර කිසිදු විසා ලබාගැනීමකට අවශ්‍ය නොවෙයි. එමෙන්ම මෙරට ලාංකිකයන්ට ද ලෝක මට්ටමේ තරගකාරීවූ අන්තර් ජාතික මට්ටමේ කුසලතා දැනුම වේ නම් ඒ අයට ද එහි රැකියා සඳහා ඉල්ලුම් කිරීමේ හැකියාවක් වෙයි. එමෙන්ම ලාංකිකයන්ටද ඒ සඳහා අයදුම් කළ හැකියි. ලංකාවේ ව්‍යාපාරිකයන්ටත් විදේශ ආයෝජකයන් මෙන්ම එහි මෙරට පුරවැසියන්ටද ආයෝජනය කළ හැකියි.

විශේෂයෙන් යම් හොඳ ක්‍රියාවකින් රටට යහපතක් වේ නම් ඒ සඳහා සහය දිය යුතුයි. විරුද්ධ වීම මෝස්තරයක් බවට පත් කරගෙන ඇත. රජයක් කරනු ලබන සියල්ලටම විරුද්ධ වීම එතරම් සුදුසු නැත. අපි සියල්ලට විරුද්ධ වන ජාතියක් නොවිය යුතුයි. සිංගප්පූරුව ඩුබායි වැනි ව්‍යාපාරික මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය කර ගැනිමට අවශ්‍ය පසුතලය මේ රටේ ද සැකසීම මීට වසර පනහකට පෙර කළේ නම් අද අපි විශාල ලෙස දියුණු රටකි. අද ලෝකයේ බොහෝ රටවල් මෙවැනි කලාප ගොඩනගයි.

මෙය සාර්ථක කරගැනීමට නම් අපිට රට වටේ සිටින අනෙක් රටවලට වඩා හොඳින් මේ දේ කළ යුතුයි. අනෙක් කරුණ නම් ආයොජකයන්ගේ විශ්වාසය මත මෙය සිදුවන කරුණකි. ඒ අය තුළ විශ්වාසය ඇති කර ඒ අනුව ආයෝජකයන් ඇද ගැනීමට සුදුසු පරිසරයක් අපි නිර්මාණය කළ යුතුයි. එමෙන්ම මෙය සාර්ථක ව්‍යාපෘතියක් බවට පත්කර ගන්නේ නම් අපේ රටේ ප්‍රතිපත්ති සහ නීති රීති ප්‍රතිසංස්කරණය කිරීම අනිවාර්ය වේ. ඒ අනුව මේ වරාය නගරය අකෘතියක් ලෙස පාවිච්චි කරමින් ලංකාවම වරාය නගරයක් බවට පරිවර්තනය කර ගැනීමට හැකියාව ඇත්නම්; එනම් ලංකාවේ සෙසු සුදුසු ප්‍රදේශවලත් මේ වැනි ආර්ථික මොඩලයන් ආදේශ කළ හැකි නම් එය වඩා වැදගත් වෙයි. එසේ වන්නේ නම් ලංකාව ආසියාවේ ධනවත්ම රට බවට පරිවර්තනය කරගැනීමට හැකියාව ඇත.



පෝට් සිටියේ මංමුළා වූවෝ

"අයියෝ මේ හම්බන්තොට වරාය තාම හදලා නැද්ද? මං 1910 දීත් කිව්වා, හම්බන්තොටට වරායක් ඕන කියලා. මේ වරාය දැන්වත් කවුරුහරි හදනවානම් මේකම ඇති රටෙන් බාගයක්ම දියුණු කරන්න." යනුවෙන් 60 දශකයේ මුල දී පැවසුවේ 1908 සිට 1911 දක්වා හම්බන්තොට දිස්ත්‍රික්කයේ උප දිසාපතිවරයා වශයෙන් කටයුතු කළ ලෙනාඩ් වුල්ෆ්ය. 1910 වර්ෂයේ දී හම්බන්තොටට වරායක් අත්‍යවශ්‍ය බව ලෙනාඩ් වුල්ෆ් ප්‍රකාශ කරයි. ඉන්පසුව 1960 දශකයේ දී මෙරටට පැමිණෙන ලෙනාඩ් වුල්ෆ් තමන් රාජකාරි කළ ප්‍රදේශවල වසර 50 කට පමණ පසු තත්ත්වය ගැන සොයා බැලීමට ගමන් කරනුයේ මහත් උනන්දුවකිනි.

විශේෂයෙන්ම හම්බන්තොට දිස්ත්‍රික්කයට ඔහුගේ තිබුණේ විශේෂ ඇල්මකි. ලෙනාඩ් වුල්ෆ් 1913 වර්ෂයේ දී රචනා කරන ලද The Village in the Jungle (බැද්දේ-ගම) සඳහා පසුබිම වන්නේ ද හම්බ-න්තොට දිස්ත්‍රික්කයේ දුෂ්කර ප්‍රදේශවලදී ඔහු ලද අත්දැකීම්ය. 1960 දශකයේ මෙරටට පැමිණි ලෙනාඩ් වුල්ෆ් මහත් උනන්දුවෙන් හම්බන්තොට කච්චේරිය ඇතුළු වෙරළබඩ ප්‍රදේශය නිරීක්ෂ-ණය කළේය.

"අනේ මේ හම්බන්තොට වරාය තාමත් හදන්න බැරි වුණා ද" යනුවෙන් ලෙනාඩ් වුල්ෆ් තම ගමන් සගයාගෙන් විමසුවේය. 1910 දී ලෙනාඩ් වුල්ෆ් දැකපු හම්බන්තොට ජාත්‍යන්තර වරායේ සිහිනය ඊට වසර 100 කට පසුව 2010 වර්ෂයේ දී සැබෑ කරනුයේ එවකට ජනාධිපති, වර්තමාන අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂයන් විසිනි. හම්බන්තොට දිස්ත්‍රික්කයට පමණක් නොව රටෙන් භාගයක්ම දියුණු කිරීමට හම්බ-න්තොට වරාය මඟින් හැකි බව එදා ලෙනාඩ් වුල්ෆ් ප්‍රකාශ කරන විට ඊට වසර 100 කට පමණ පසුව හම්බන්තොට ජාත්‍යන්තර වරාය ඉදිකර ජනතා අයිතියට පත් කරනු ලබන්නේ හම්බන්තොටින්ම බිහි වූ ජනනායක මහින්ද රාජපක්ෂවීම තවත් විශේෂත්වයකි.

එම ජාත්‍යන්තර වරාය හදන විට ඇතැම් දේශපාලඥයන් ප්‍රකාශ කළේ හම්බන්තොට වරාය කවදාවත් මහින්ද රාජපක්ෂයන්ට ගොඩ-නැගීමට නොහැකි බවයි. කෙතරම් අභියෝග පැමිණිය ද වරාය ඉදිකළ විට කීවේ හම්බ-න්තොට වරායේ විශාල කළු ගලක් තිබෙන බවයි. කළු ගලේ කතාව ද බොරුවක් වූ විට ඊට පසුව කීවේ නැව් එන්නේ නැති ස්විමින් පූල් එකක් මහින්ද සාදා ඇති බවයි.

එම ස්විමින් පූල් කතාව අතේ පැළවන බොරුවක් බවට පත් කරමින් ලෝකයේ විශා-ලතම මගී නෞකාව සහ භාණ්ඩ ප්‍රවාහන නෞකාව හම්බන්තොට වරායට සේන්දු විය. හම්බන්තොට වරාය ස්විමින් පූල් එකක් නම් එය චීනයට ලබා ගැනීමට තරම් ඔවුන්ට පිස්සුවක් නැත. දැන් පිස්සු වැටී ඇත්තේ හම්බන්තොට වරාය ස්විමින් පූල් එකක් කියපු කට්ටියටම නොවේද? හම්බන්තොට වරාය චීනයට ලබා දුන් රනිල් වික්‍රමසිංහ චෙක් එක ලබා ගත්තේ හරියට ඉන්දියාවේ විරාත් කෝලි මැච් එක දිනා-ගෙන කප් එක ගන්නා අයුරෙනි.

කොරෝනා තියෙන කාලෙත් හම්බන්තොට වරායේ ආදායම් ශීඝ්‍රයෙන් ඉහළ යන බව වාර්තා වේ. මත්තල ජාත්‍යන්තර ගුවන් තොටු-පොළට ද කීවේ හම්බන්තොට වරායට නොදෙ-වෙනි කතාය. මොනරු පැමිණෙන එයාර්පෝට් එකක් මහින්ද හදලා යනුවෙන් එදා පැවසුවද මේ වන විට මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ වටිනාකම දිනෙන් දින වැඩි වන්නේ බලා සිටිද්දීය.

මත්තල වී ගබඩා කළේ ද රාජපක්ෂවරු-න්ගෙන් පළිගැනීමටය. නමුත් මත්තල ගුවන් තොටුපොළේ වටිනාකම දන්නා ඉන්දියාව යහපාලන ආණ්ඩුව කාලයේදී මත්තලට හොට දැම්මේය. ඉන්දියාවෙන් මත්තල යාන්තමට බේරා ගත්තේ මහින්ද රාජපක්ෂය. ඔහු පෞද්ග-ලිකවම ඉන්දියානු අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදිට කතා කරමින් කීවේ මත්තල ගුවන් තොටුපොළ කිසිසේත් ම ඉන්දියාවට ලබා නොදෙන බවකි. මේ වන විට කටුනායක ගුවන් තොටුපොළට ගොඩබෑමට නොහැකි අති විශාල ගුවන් යානා කිසිඳු අපහසුතාවයකින් තොරව මත්තල ගොඩ-බායි. හම්බන්තොට සූරියවැව ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය හැදීමට පෙර ද ඇතැම් දේශපාලඥ-යින් කීවේ සූරියවැවට මොන ග්‍රවුන්ඩ් ද කියාය. නමුත් සංවර්ධනයේ ඉදිරියේ දැක්ම හොඳින් ම දැන සිටි මහින්ද රාජපක්ෂ තම උත්සාහය අත් නොහැරියේය. 2011 වසරේ ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියට ඉදිකරන ලද සූරියවැව ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය ජාත්‍යන්තර ක්‍රිකට් විස්තර විචාරකයන්ගේ ද පැසසුමට ලක්විය.

හම්බන්තොට පමණක් නොව උතුරු නැගෙ-නහිර පළාත් ඇතුළු මුළු රටම වැඩ බිමක් බවට පත් වූයේ 2010 - 2015 වසර 5 ඇතුළත නමුත් 2015 ඉන්පසුව වැඩබිමක් ව තිබුණු මුළු රටම මුඩුබිමක් වූ බව අමුතුවෙන් කිව යුතු නොවේ.

කොළඹ වරාය නගරය (CLOMBO PORT CITY) සංවර්ධනයේ නවතම අංගයක් ගැන මුලින්ම අදහස් පළ කළේ ද එවකට ජනාධි-පති, වර්තමාන අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂය. කොළඹ වරාය නගරය ගැන මුලින්ම මහින්ද රාජපක්ෂ කියන විට හම්බන්තොට වරායට, මත්තල ගුවන් තොටුපොළට, සූරියවැව ජාත්‍ය-න්තර ක්‍රිකට් ක්‍රීඩාංගණයට විවිධ අවලාද නැගුවා සේ වරාය නගරයට ද දිගට හරහට පහර දෙන්නට විය. ඒ අපේ රටේ දේශපාලනයේ හැටිය.

වරාය නගරය හදන්න ලංකාවේ ම කළුගල් මදි බව කීවේ ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායකය.

කොළඹ වරාය නගරය හේතුවෙන් මෙරට කළුගල් හිඟතාවයක් ඇතිවෙයි යන බියක් අනුර කුමාර දිසානායක තුළ පහළ වී තිබුණි. නමුත් ඔහු කියන ආකාරයේ කළුගල් හිඟයක් ඇති වූයේ නැත. මේ ආකාරයෙන් කොළඹ වරාය නගර ඉදිරිකිරීම්වලට දිගට හරහට පහර දෙන්නට විය. එහෙත් කිසිදු විද්‍යාත්මක පදන-මක් නොමැතිව ඇතැම් දේශපාලඥයෝ පහර දුන්හ.

යහපාලන ආණ්ඩුව බලයට පත් වූ පසුව කොළඹ වරාය නගරයේ මුල්ගල ද ගලවාගෙන ගොස් මහ මුහුදට විසි කළේය. කොළඹ වරාය නගරය වසර 10 ක් තිස්සේ ඉදි වෙමින් පැවතිය ද දැන් එක්තරා පිරිසක් කොළඹ වරාය නගරය ගැන කටයුතු කරනුයේ නින්දෙන් ඇහැ ඇරුණු ආකාරයටය.

කොළඹ වරාය නගරයෙහි වටිනාකම දැනගත් යහපාලන ආණ්ඩුව යළි කොළඹ වරාය නගරය ඉදිකිරීමට තීරණය කළේය. රාජපක්ෂවරුන්ගෙන් පළිගැනීම සඳහා කොළඹ වරාය නගරයේ ඉදිකි-රීම් වසර 2 1/2 ක් පමණ ප්‍රමාද කිරීමට යහපා-ලන ආණ්ඩුවේ බලධාරීහු ක්‍රියා කළහ. මේ නිසා රටට සිදු වූ පාඩුව රුපියල් බිලියන ගණනකි.

යළිත් රාජපක්ෂ ආණ්ඩුවක් බලයට පත්වීමත් සමඟම කොළඹ වරාය නගරයේ වැඩ කට-යුතු ලහි ලහියේ ආරම්භ විය. වෙනදාටත් වඩා කාර්යක්ෂමතාවකින් කොළඹ වරාය නගරය ඉදි කෙරෙමින් පවතින අතර දැන් එහි අල්ලාගෙන ඇත්තේ කොළඹ වරාය නගරය ආර්ථික කොමි-ෂන් සභාවයි.

එදා හම්බන්තොට වරායට, මත්තල ගුවන් තොටුපොළට, සූරියවැව ක්‍රීඩාංගණයට විරුද්ධ වූ පිරිස් ම මෙදා කොළඹ වරාය නගරයට විරුද්ධ වී සිටීම එක් පැත්තකින් අරුමයක් ද නොවේ. කොළඹ වරාය මෙරට ආර්ථිකයේ හැරවුම් ලක්ෂ්‍යය වන බව අමුතුවෙන් කිව යුතු නොවේ. මෙරට විරැකියාවෙන් පෙළෙන තරුණ තරු-ණියන්ට එය හොඳ රැකියා අවස්ථා ලබාදෙන තෝතැන්නකි. එපමණක් ද නොව ලෝකයේ වාණිජ නගර සමඟ කරට කර තරගයක් ලබා දෙමින් විදෙස් ආයෝජන රැසක් ලබාගැනීමේ අවස්ථාව දැනටමත් මෙරටට උදාවී තිබේ. සිංග-ප්පූරුව, මැලේසියාව, තායිවානය, හොංකොං, තායිලන්තය ඇතුළු බොහෝ රටවල් දියුණුවීමට බලපෑවේ මෙම කොළඹ වරාය නගරය වැනි සංවර්ධන ව්‍යාපෘති බව අමුතුවෙන් කිවයුතු නොවේ.

ඒ ආකාරයෙන් දියුණු වූ රටවල් දෙස බලමින් අප හූල්ලමින් සිටියේ මෙරට පාලකයන්ට දෙස් දෙවොල් තබමින්ය. නමුත් සංවර්ධනයට අවශ්‍ය මාවත හෙළි පෙහෙළි කරදුන් විට අපේ ඇතැම් දේශපාලනඥයන් කරන්නේ කුමක්ද? කොළඹ වරාය නගරයෙන් රට දෙකඩවනවා කියන ඇතැම් දේශපාලනඥයන් රනිල් - ප්‍රභා ගිවිසු-මෙන් ඇත්තටම රට දෙකඩ වනවිට නිහඬව බලා සිටීම තරම් තවත් විහිළුවක් තිබෙනවාද?

එක එක සටන් පාඨ ඔස්සේ ගොස් හති වැටී තිබෙන විපක්ෂයේ ඇතැම් දේශපාලන පක්ෂ තම බංකොලොත්භාවයෙන් ගොඩ ඒම සඳහා අලුතෙන්ම තෝරාගත් මාතෘකාව කොළඹ වරාය නගර ව්‍යාපෘතියයි.

කොළඹ වරාය නගර සංවර්ධන පනත් කෙටු-ම්පත සම්බන්ධව මේ දිනවල මහත් ආන්දෝ-ලනයක් ඇතිව තිබේ. ශ්‍රේෂ්ඨාධිකරණය දක්වා මේ කාරණය දුරදිග ගොස් හමාරය. ඇමෙරිකානු ඩොලර් බිලියන 1.4 ක් වැයකර වරාය නගර-යට අදාළ භූමි ප්‍රදේශය ගොඩකර බාරදී ඇත්තේ 2019 වසරේදීය. මේ භූමි ප්‍රදේශය අපේ රටට අයිති කොටසක් වශයෙන් එවකට සිටි මෛත්‍රී-පාල සිරිසේන ජනධිපතිවරයා ප්‍රකාශයට පත් කළේය. ඒ 2019 ඔක්තෝම්බර් 29 වැනිදාය. එලෙස පවතින කොළඹ වරාය නගරය ආර්ථික කලාපයක් වශයෙන් සංවර්ධනය කිරීම අරමුණු කරගෙන ආයෝජකයන් ගෙන්වා ගැනීමට මේ පනත් කෙටුම්පත දැනට සකස් කර තිබේ.

මෙය දැනට කෙටුම්පතක් මිස පනතක් නොවේ. මේ සම්බන්ධයෙන් විවිධ යෝජනා ඉදිරිපත් වී නීති කෙටුම්පත් දෙපාර්තමේන්තු-වට ඒවා ඉදිරිපත් කර ඒ දෙපාර්තමේන්තුවෙන් සකස් කළ පනත නැවත වරක් ඇමති මණ්ඩ-ලයට යොමු වූ පසු පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයට ඇතුළත් කෙරේ. එසේ ඇතුළත් කර සතියක් ඇතුළත ලංකාවේ සිවිල් පුරවැසියෙකුට ශ්‍රේෂ්ඨාධිකරණයට ගොස් එය අභියෝගයට ලක් කරමින් තර්ක ඉදිරිපත් කිරීමට පුළුවන. මේ වන විට මෙම පනත් කෙටුම්පතට එරෙහිව පෙත්සම් 15 ක් පමණ ඉදිරිපත්ව ඇත්තේ ඒ අනුවය.

නීතිපතිවරයා මෙම පනත් කෙටුම්පත අධ්‍ය-යනය කර තිබේ. ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යව-ස්ථාවට පටහැනි කිසිවක් එහි නොමැති බව නීතිපතිවරයා ආණ්ඩුවට දැනුම් දී තිබේ. එහෙත් එය අවසානයම නොවේ. වරාය නගරයේ භූමි ප්‍රමාණය වෙනත් පාර්ශ්වයකට සින්නක්කරව විකිණීමක් සම්බන්ධව නොයෙක් තර්ක විතර්ක දැකගත හැකිය. එවන් දීමක් එලෙසම සිදුවෙ-නවා ද? දැනට ඉදිරිපත්ව ඇති පනත් කෙටු-ම්පතට අනුව එලෙස සින්නක්කර ලබාදීමක් පෙනෙන්නට නැත.

මෙම යෝජිත පනතෙන් ආවරණය වන භූමි ප්‍රමාණය අක්කර 1102 කි. මෙයින් අක්කර 224 ක් අයත් වන්නේ යටිතල පහසුකම් සම්බන්ධ-යෙනි. මෙම යටිතල පහසුකම් වැඩි දියුණු කිරී-මට අවශ්‍ය පියවර ලංකා රජය මේ වන විටත් ගනිමින් තිබේ. මෙහි තිබෙන අක්කර 286 ක් පමණ බදු දීමට දැනට එකඟ වී තිබේ. එය මුළු ප්‍රමාණයෙන් 25% ක් පමණය. මෙය සින්නක්කර ලබා දීමක් නොවේ. 99 අවුරුද්දකට බදු දීමකි. මෙය මෙම ව්‍යාපෘතියට පමණක් අදාළ වන්නක් නොවේ. මෙරට බොහෝ ව්‍යාපෘති අනුනව අවුරුදු බදු ගිවිසුම් යටතේ ක්‍රියාත්මක වන බව රහසක් නොවේ. ඒ වගේම මෙහි තවත් අක්කර 156 ක් පමණ තවත් ආයෝජකයන්ට ලබා දීමට ශ්‍රී ලංකා රජයට පුළුවන.

වරාය නගරය පාලනය කිරීමට වෙනම කොමිෂන් සභාවක් පිහිටුවීමට යෝජනා වී තිබේ. එම කොමිසම වෙත සාමාජිකයන් පස් දෙනෙකුට නොඅඩු සහ සත් දෙනෙකුට නොවැඩි වන ආකාරයට පත් කෙරෙන බව සඳහන්ය. මෙම කොමිසම පත් කරන්නේ ජනා-ධිපතිවරයාය. එසේ වුවත් මේ කොමිසමට පත් කරන්නේ ලාංකිකයන් ද විදේශිකයන් ද යන්න ගැටලුවකි. මෙම ව්‍යාපාර සම්බන්ධව දැනුමක් පළපුරුද්දක් ඇති අය පත්කළ යුතු යැයි සඳහන් වුවද ලාංකිකයන් පත් කරනවාද? වෙනත් රටක අය පත්කරනවාද? යන සඳහනක් නැත. මේ කවුරුන් පත් වුවද ඕනෑම අවස්ථාවක ඔවුන් ඉවත් කිරීමේ බලය ජනාධිපතිවරයාට තිබේ. කෙසේ වුවත් මේ අයට යම් මුක්තියක් ලබාදීම සම්බන්ධව දැඩි කතාබහක් සමාජයේ තිබේ. එසේ මුක්තිය ලබා දීමෙන් ඔවුන්ගේ සිතැඟි පරිදි කටයුතු කිරීමට අවස්ථාව උදාවෙනවා ද? යන සැකය සමාජයට කාන්දු වෙමින් තිබේ.

නගර සභාව ඇතුළු මේ සම්බන්ධව කටයුතු කරන වෙනත් ආයතනවලින් මෙම කලාපය බැහැර කර තිබීම යෝජිත පනතේ විශේෂ ලක්ෂණයකි. මෙහි හොඳ සහ නරක දෙකම සලකා බැලිය යුතුය. යෝජිත ආකාරය අනුව මේ කලාපයේ කිසිදු පාලනයක් නගර සභාවට හෝ පළාත් සභාවට අයිති නැත. ස්වාධීනව ක්‍රියාත්මක වීමට අවශ්‍ය පසුබිම සකසා තිබේ. එයට බලපෑ හේතු කාරණා තිබේ. සාමාන්‍ය-යෙන් මෙවැනි ආර්ථික කලාපයක් ඇති කරන විට ඔවුන්ට සහනදායි ක්‍රියා පිළිවෙතක් අනුග-මනය කිරීමට සිදුවනු ඇත. ලංකාවේ පමණක් නොව ලෝකයේ බොහෝ රටවල දක්නට ඇති තත්ත්වය එයයි. විශේෂ ආර්ථික කලාපයකට පැමිණෙන ආයෝජකයන්ට විවිධාකාර ආයත-නවලට ගොස් කාලය නාස්ති කරමින් අනුමැතිය ලබාගැනීම ආදී කටයුතුවලට යොමු වීමට සිදු වුවහොත් ඔවුන් අධෛර්යවත් විය හැකිය.

මෙවැනි තත්වයක් යටතේ මෙරට ආයෝ-ජකයන්ට, ව්‍යාපාරිකයන්ට මුහුණ දීමට සිදු-වන දුෂ්කරතා අමුතුවෙන් පැහැදිලි කළයුතු නැත. එවන් දුෂ්කරතාවලට මුහුණ දීමට විදෙස් ආයෝජකයන් කැමති නැත. ව්‍යාපාර කිරීමේ පහසුව පිළිබඳ දර්ශකයක් තිබේ. එම දර්ශ-කයේ ලංකාව සිටින්නේ 165 වැනි ස්ථානයේය. ලංකාව සිටින්නේ පහ-ළම අගයක බව මෙයින් පැහැදිලිය. ආයෝජන-යකට අනුමැතිය ගැනීමේ සිට අනෙක් කටයුතුවලට ගතවන කාලය සහ මුහුණ දීමට සිදුවන ගැටලු ආදිය නිසා විදෙස් ආයෝජකයන් ලංකාවට ඒමට එතරම් උනන්දුවක් නැත. මේ තත්ත්වය වෙනස් කර "එක් කවුළුවකින්" සියල්ල කරගත හැකි පසුබිමක් සකසා ආයෝජකයන්ට පහසු වාතාවරණයක් ඇති කිරීමට වරාය නගරයට අදාළ පනත් කෙටුම්පතෙන් යෝජනා වී තිබේ. වරාය නගරය පාලනයට පිහිටුවන විශේෂ කොමිෂන් සභාව හරහා සියල්ල කරගත හැකි පසුබිම ආයෝජක හිතකර වන්නට පුළුවන. මේ තත්ත්වය යටතේ වරාය නගරය ලංකාවේ පාලනයන් බැහැර වෙනවාද යන්න අවධානයට ගත යුතුය. ලංකාවේ භෞමික අඛණ්ඩතාවයට, ස්වාධීනත්වයට හානි නොවන ආකාරයට සහ ලංකාවේ පාලනයට යටත්ව මෙවන් ආයතන පාලනය කර ගැනීමට විවිධ ක්‍රමවේද යෝජිත කොමිෂන් සභාවට ලබාදී ඇත.

ප්‍රාදේශීය සභාවකින්, රජයේ ආයතනය-කින් පහසුවෙන් කාර්යයක් කරගත නොහැ-කිය. එකම කාරණයකට හත් අට පොළකට යන්නට සිදුවෙයි. විවිධ ලේඛන ඉල්ලා සිටී. ගාස්තුව අය කරයි. ඉඩම් ලේඛනයක්, විදු-ලිය සැපයුමක් හෝ ජල සම්බන්ධතාවයක් ලබාගැනීමට ජනතාව විඳින දුක පාලක-යන් නොදන්නවා නොවේ. කළ යුත්තේ ක්‍රමය වෙනස් කිරීමයි. ඒ සඳහා වර්තමාන ආණ්ඩුවට ජන වරමක් හිමි වී ඇත.

විශේෂ බලතල සහිත කොමිෂන් පිහිටුවීම අලුත් දෙයක් නොවේ. 1978 වසරේදී එවකට බලයේ සිටි ජේ.ආර්. ජයවර්ධන විධායක ජනාධිපතිවරයාගේ ආණ්ඩුව මහ කොළඹ ආර්ථික කොමිසම පිහිටුවා පූර්වාදර්ශයක් සපයා තිබේ.

මහ මුහුද ගොඩකර අලුත් ගොඩබිමක් තැනීම ගැන කිසිම අදහසක් වසර 2010 ට කලින් ආණ්ඩුවට තිබුණේ නැත. 2010 වසරේදී චයිනා කොමියුනිකේෂන් කන්ස්ට්‍ර-ක්ෂන් සමාගම එවකට පැවැති රාජපක්ෂ ආණ්ඩුවට යෝජනාවක් ඉදිරිපත් කළ අතර, කොළඹ වරායට දකුණින් මුහුදු ස්වකීය ආයෝ-ජනයක් වශයෙන් ගොඩකර හෙක්ටයාර් 233 ක භූමියක් තනන්නට හැකි බව දැන්වීය. මොරටුව විශ්වවිද්‍යාලය එහි හොඳ නරක සලකා බලා අනුමැතිය දී ඇති අතර පරිසර වාර්තා ද අනු-මත කර තිබේ. ව්‍යාපෘතිය පිළිගැනීමට පමණක් වසර හතරක් ගත වී ඇත. 2014 සැප්තැම්බර් 17 වැනිදා මහින්ද රාජපක්ෂ ජනාධිපතිව-රයා සහ එදින මෙරට සංචාරයක නිරතව සිටි චීන ජනාධිපති ෂී ජිංපිං මෙම ව්‍යාපෘතිය නිල වශයෙන් ආරම්භ කළේය. මුල් ඇස්තමේන්තුව අනුව ගොඩකරන භූමියෙන් හෙක්ටයාර් 115 ක් ශ්‍රී ලංකා රජයට අයත් වන අතර හෙක්ටයාර් 88 ක් චීන සමාගමට හිමි වෙයි.

2015 වසරේ බලයට පත් යහපාලන ආණ්ඩුව මෙම කොළඹ වරාය නගර ව්‍යාපෘතිය අත්හි-ටුවීය. එහෙත් නැවත කැඳවන ලද පරිසර වාර්තාවලින් පසු වැඩ ආරම්භ කරන්නට ඉඩ දී තිබේ. ප්‍රමාද වූ කාලය හා එහි අලාභ සලකා බලා ගිවිසුම අලුත් කර ඇත. අලුත් ගිවිසුම අනුව ගොඩකරන භූමි ප්‍රමාණය වැඩිකර තිබේ. අලාභය මුදලින් ලබානොගන්නට නම් හෙක්ට-යාර් දෙකක ඉඩමක් චයිනා කොමියුනිකේෂන් හා කන්ස්ට්‍රක්ෂන් ඉල්ලා සිටියේය. සාකච්ඡා අවසානයේ දී ශ්‍රී ලංකා රජයට හෙක්ටයාර් 62 ක් හා පොදු පහසුකම් වශයෙන් හෙක්ට-යාර් 28 ක් අයත් වූ අතර මෙම පොදු පහසුකම්වල තිබිය යුතු අංග රජයේ වියදමින් ඉදිකළ යුතු විය. ආයෝජකයාට අයිති වන ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 116 කි. එය අනුනව අවුරුදු බද්දකට ලැබේ. බදු නිදහස් තීරණය අනුව එම ඉඩම්ව-ලින් රටට බදු අය කර ගත නොහැකිය.

ආචාර්ය හර්ෂ ද සිල්වා වරාය නගරය ගැන කැමැත්තෙන්?

චීන සමාගම හා නාග-රික සංවර්ධන අධිකාරිය සමඟ අස්සන් කරන ලද ගිවිසුම අනුව මෙම සම්පූර්ණ දේපළ කොළඹ දිස්ත්‍රි-ක්කයට අයත්ය. මූල්‍ය නගරය නොඑසේනම් කොළඹ වරාය නගර ආර්ථික කලාපය රටට බලපාන ඒකකයකි. එය සංවර්ධනය කිරීම හෝ අනාගතය උදෙසා සැලසුම් සහගතව ක්‍රියා කිරීම ආණ්ඩුවේ වගකීමකි.

විරුද්ධ පක්ෂයේ අවස්ථාවාදී දේශපාලඥ-යන් කුමන හෝ දෙයක් අල්ලාගෙන ආණ්ඩු විරෝධයක් මතු කිරීමේ බංකොලොත් දේශපා-ලනයේ තවත් එක් පියවරක් වශයෙන් කොළඹ වරාය නගරයට එරෙහිව ගෙන යන විරෝධය හැඳින්විය හැකිය. කොළඹ වරාය නගරය රටට අවශ්‍ය බව සමගි ජන බලවේගයේ ආචාර්ය හර්ෂ ද සිල්වා දැඩි ලෙස ප්‍රකාශ කරද්දී ඔවුන්ගේ ම ඇතැමුන් මංමුලා වූ සේ කටයුතු කිරීම කෙතරම් විහිළුවක් ද?

විශේෂ දැන්වීමයි

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
External Degrees and Extension Courses Unit

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
UNIVERSITY OF SRI JAYEWARDENEPURA, SRI LANKA

බාහිර උපාධි පරීක්ෂණ

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මඟින් 2021 මැයි මස පැවැත්වීමට නියමිත පරීක්ෂණ පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

පරීක්ෂණය	පැවැත්වීමට නියමිත දින
වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි II පරීක්ෂණය - නව නිර්දේශය	2021-05-08 2021-05-15 2021-05-22
වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි III පරීක්ෂණය - නව නිර්දේශය	2021-05-09 2021-05-16 2021-05-23
ශාස්ත්‍රවේදී මානව ශාස්ත්‍ර හා සමාජීයවිද්‍ය (සාමාන්‍ය) බාහිර උපාධි III පරීක්ෂණය - නව නිර්දේශය (පුතර්)	2021-05-03 දින සිට 2021-05-15 දක්වා

ඉහත පරීක්ෂණයන්ට අදාළ කාලසටහන්, ඉදිරියේදී පැවැත්වීමට නියමිත අනෙකුත් පරීක්ෂණ පිළිබඳ තොරතුරු සහ දිවයිනේ පවතින විශේෂිත සෞඛ්‍ය තත්ත්වය මත විභාග පැවැත්වීම සම්බන්ධව වූ විශේෂ නිවේදන අපගේ නිල වෙබ් අඩවිය වන www.external.sjp.ac.lk මඟින් ලබා ගත හැක.

ලේඛකාධිකාරී,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.





ඩෙංගු වයිරසයට තිත තියන්න අපෙන් ජාන මදුරුවෙක්

වමේ සිට - කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපතිනී චන්ද්‍රිකා එන්. විජේරත්න, ප්‍රධාන පර්යේෂණ අධික්ෂක කොළඹ විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය රනිල් දසනායක සහ කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ අණුක වෛද්‍ය ඒකකයේ මහාචාර්ය නිල්මිණී ගුණවර්ධන

● **රසික කොටුදුරගේ**

ඩෙංගු ලොව රටවල් සියයකට අධික සංඛ්‍යාවකට බලපාන වසංගත රෝගී තත්ත්වයකි. වසරක් පාසා විශාල ජනතාවක් මෙම රෝගයට ගොදුරුව පීඩා විඳින අතර, ඉන් සමහරෙක් සිය ජීවිතයෙන්ද සමුගනිති. එනිසා ඩෙංගු රෝගය බරපතළ සෞඛ්‍ය ගැටලුවක් වන අතර, එය මෙරට සෑම දිස්ත්‍රික්කයකම පාහේ ව්‍යාප්තව පවතී. විශේෂයෙන් 2009, 2010 සහ 2013 වර්ෂවලදී මෙතෙක් සිදු වූ දරුණුතම ඩෙංගු වසංගත තත්ත්වයට මෙරට මුහුණ දුන්නේය. එනිසා මෙවැනි වසංගත තත්ත්වයක් සාර්ථකව පාලනය කළ හැකිනම් එය මෙරටට පමණක් නොව මුළුමහත් මානව ප්‍රජාවගේම යහපතට හේතුවන්නකි. මේ වන විට කොළඹ විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යා අධ්‍යයනාංශය හා කැලණිය විශ්වවිද්‍යාලයේ අණුක වෛද්‍ය ඒකකය එවැනි සත් කාර්යයකට උරදී සිටියි.

කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍යපීඨයේ පරපෝෂිත ජීව විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය නයන ගුණතිලකගේ අධ්‍යයන වාර්තාව අනුව 1901 සිට 2016 දක්වා මදුරු විශේෂ 159 ක් මෙරටින් වාර්තා වී ඇති අතර ඉන් විශේෂ 23 ක් මෙරටට ආවේණික විශේෂ ලෙස සැලකේ. මෙම විශේෂ අතරින් ඩෙංගු වයිරසය රැගෙන යන වාහකයන් ලෙස සැලකෙන්නේ ඊඩිස් ඊජිප්ටයි සහ ඊඩිස් ඇල්බොපික්ටස් යන විශේෂයන්ය. අනෙකුත් මදුරු වර්ග ඩෙංගු වයිරසය රැගෙන නොයන බව සනාථ වී ඇත. එනිසා ඩෙංගු වයිරසයේ වාහක මදුරුවන් පාලනය කළහොත් ඩෙංගු රෝගය මැඩ පැවැත්විය හැකි බව මේ සම්බන්ධයෙන් පවතින පිළිගත් මතය වේ. ඩෙංගු සඳහා ඖෂධයක් හෝ එලදායී එන්නත් මෙතෙක් නිෂ්පාදන කර නොමැති අතර ඩෙංගු මදුරු පාලනය, ඩෙංගු වයිරස් සම්ප්‍රේෂණය පාලනය කිරීම එකම විකල්පය ලෙස සැලකෙයි. මේ වනවිට ලොව පුරා මෙම රෝගී තත්ත්වය පාලනය කිරීම සඳහා සාම්ප්‍රදායික ක්‍රමවේද හා නූතන ක්‍රමවේද යනුවෙන් ක්‍රියාමාර්ග දෙකක් අනුගමනය කරයි. සාම්ප්‍රදායික ක්‍රම මගින් ළඟා කරගෙන ඇත්තේ සීමා සහිත සාර්ථකත්වයකි. එනිසා ඇමරිකාව බ්‍රිතාන්‍ය වැනි ලොව දියුණු රටවල් මේ සඳහා නූතන ක්‍රමවේදවලට අවතීර්ණ වී සිටියි.

ආචාර්ය උපාධි අපේක්ෂක කලිඳු රම්‍යසෝම

ශ්‍රී ලංකාවේ ජෛව විද්‍යාඥයෝ මීට සාර්ථකව මුහුණ දීම සඳහා නූතන ක්‍රමවේදවලට අවතීර්ණ වී සිටිති. කොළඹ විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය රනිල් දසනායකගේ නායකත්වයෙන් යුත් පර්යේෂණ කණ්ඩායම, කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ අණුක වෛද්‍ය ඒකකයේ මහාචාර්ය නිල්මිණී ගුණවර්ධන සමඟ එක්ව ඩෙංගු වයිරස් ප්‍රතිරෝධී ජාන සුසංහිත මදුරුවකු නිර්මාණය කිරීමේ විද්‍යාත්මක පරීක්ෂණයක් ආරම්භ කළහ. ඒ අනුව කලිඳු රම්‍යසෝම ශිෂ්‍යයාගේ ආචාර්ය උපාධි පර්යේෂණ ව්‍යාපෘතියේ කොටසක් ලෙස ආර්එන්ඒ (RNA)බිඳ දැමීමේ යාන්ත්‍රණය (ආර්එන්ඒඅයි) පදනම් කරගත් තාක්ෂණය භාවිත කරමින් ඩෙංගු ප්‍රතිරෝධී ජානයක් (multi-miRshRNA) ජෛව තොරතුරු ආධාරයෙන් නිර්මාණය කර ඩෙංගු මදුරු විශේෂයක් වන ඊඩිස් ඊජිප්ටි මදුරුවන්ගේ ජීනොමයට සම්ප්‍රේෂණය කිරීම සිදු විය.

අප්‍රිකානු මහද්වීපයේ ජන්මය ලබා මුළු ලෝකය පුරාම ව්‍යාප්තව වසර මිලියන 40 ක පමණ කාලයක පටන් ජීවත්ව ඇති මෙම මදුරු විශේෂ විලෝපිකයන්ගෙන් හා කටුක පරිසර සාධක විලින් බේරී පවතින පරිසර පද්ධතියට හොඳින් අනුවර්ථනය වී පරිනාමය වී ඇත. ළිඳක, ජල තටාකයක, පොකුණක, ගස් බෙනයක, අතුපතර ආදී වතුර එක්රැස්වන ඕනෑම ස්ථානයක බිත්තර දමා සිය දාහස් ගණන් බෝ කළ හැකිය. මෙනිසා මේ මදුරුවන්ගේ ව්‍යාප්තිය වැළැක්වීමට කටයුතු කිරීම ඉතාම අපහසුය. අප උත්සහ කළේ එම ස්ථානවලට පහසුවෙන් ළඟා වී ඩෙංගු සම්ප්‍රේෂණය නැවතිය හැකි විශේෂ හැකියාවැති මදුරුවකු නිර්මාණය කිරීම බව කොළඹ විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය රනිල් දසනායක පැවැසුවේය.

මෙම නූතන තාක්ෂණික ක්‍රමවේදය හඳුන්වන්නේ රයිබොනියුක්ලික් අම්ලය (RNA)බිඳ දැමීමේ යාන්ත්‍රණය ලෙසය. රයිබොනියුක්ලික් අම්ලය (RNA)යනු සියලුම ජීව සෛලවල ඇති වැදගත් ජීව විද්‍යාත්මක සාර්ව අණුවකි. සෑම සත්ත්වයකු තුළම මෙම ආර්එන්ඒ පවතින අතර, මේ තුළ ජීව සංවර්ධනය හා නඩත්තුව සඳහා අවශ්‍ය ජානමය උපදෙස් අඩංගු වේ. මෙකී යාන්ත්‍රණය බිඳදැමී ජාන සුසංහිත මදුරුවා විසින් සිදු කරයි.

ඒ අනුව මෙම නව මදුරු විශේෂය බිහි කිරීමට නව ඩීඑන්ඒ (DNA) අනුවක් නිර්මාණය කළ අතර, ඒවා වැඩි වශයෙන් නිපදවීම සඳහා ඇමරිකානු සමාගමක සහය ලබාගෙන ඇත. වෛරසය සහ ඩෙංගු වාහකයා පිළිබඳව ලොව පුරා ජීව බැංකුවල ඇති සියලුම ජීව දත්ත මෙම කාර්ය සඳහා යොදා ගැනුණි. ඒ අනුව නව ඩීඑන්ඒ (DNA) අනුවක් නිර්මාණය කළ අතර, එය ඩෙංගු ප්‍රතිරෝධී ජානය ලෙස හඳුන්වයි.

මේ නව ඩීඑන්ඒ (DNA)අනුව ඊඩිස් ඊජිප්ටි මදුරුවකුගේ බිත්තරවලට ඇතුළු කිරීම සඳහා රතු ෆ්ලෝරසෙන්ට් (red fluorescent) ප්‍රෝටීනයක් සහිත තවත් ජානයක් නිෂ්පාදනය කළේය. එය රතු දීප්තිමත් ජානයකි. මෙම ජාන විශේෂ දෙක එකට මුහුම් කර ඉතා කුඩා ප්‍රමාණයක් ඊඩිස් ඊජිප්ටි මදුරුවකුගේ බිත්තරවලට ඇතුළත් කෙරිණි. එවිට එම ජාන මදුරුවාගේ ජානවලට බද්ධ වී ක්‍රමානුකූලව වැඩෙන්නට පටන් ගනී. මෙලෙස මදුරු බිත්තර 12,500කට පමණ ක්ෂුද්‍ර විදිනය ආධාරයෙන් කලිඳු විසින් ඇතුළු කළේය. මෙලෙස බිත්තරවලට ජාන ඇතුළත් කිරීම පහසු කාර්යයක් නොවන අතර, විනාඩි 30ක් ඇතුළත ක්ෂුද්‍ර විදිනය කළ යුතු වේ. මදුරුවන් බෝකිරීම සිදු කරනු ලැබන්නේ කැලණිය විශ්වවිද්‍යාලයට අයත් අනුක වෛද්‍ය ඒකකය තුළය. මෙම නව ජානය බිත්තරවලට ඇතුළු කිරීමට අවශ්‍ය විශේෂිත ක්ෂුද්‍ර විදිනය (Micro Injector) රාගම වෛද්‍ය විද්‍යාලයේ අනුක වෛද්‍ය ඒකකය තුළ ස්ථාපිත කර ඇති අතර, මෙම උපකරණ ලංකාවටම ඇත්තේ එකක් පමණි. මේ සඳහා පුහුණුව ලත් එකම පුද්ගලයා වන්නේද කලිඳු රම්‍යසෝම විමද විශේෂය.

කොළඹ විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යා අංශයේ අනුක ජීවවිද්‍යා ඒකකය තුළ නිර්මාණ කළ මෙම නව ජානය කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ රාගම අනුක වෛද්‍ය ඒකකය තුළ දී මදුරු බිත්තර තුළට ඇතුළු කළේය. එලෙස නිමැවූ ජාන සුසංහිත මදුරුවා සහ සාමාන්‍ය මදුරුවා අතර බැලූ බැල්මට වෙනසක් නොපෙනුණද වඩ සූක්ෂමව බැලූ විට නව මදුරු විශේෂයේ ඇස් රතු පැහැයෙන් දිස්වේ. එය සිදු වන්නේ නව ඩීඑන්ඒ (DNA)අනුව සමඟ ඇතුළත් කළ රෙඩ්ෆ්ලොරසන් ප්‍රෝටීනයක් සහිත ජානය නිසාය. ඒ අනුව ජාන සුසංහිත මදුරුවා පහසුවෙන් හඳුනා ගැනීමට හැකියාව ලැබේ.

මෙලෙස ජාන ඇතුළත් කළ මදුරුවා ඩෙංගු පැතිරීම වැළැක්වීම සඳහා යොදාගන්නේ කෙසේද යන්න පැහැදිලි කරමින් කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ අණුක වෛද්‍ය ඒකකයේ මහාචාර්ය නිල්මිණී ගුණවර්ධන පවසා සිටියේ මදුරුවා විසින් ලේ උරා බීමේදී ඩෙංගු ප්‍රතිරෝධී ජානය ප්‍රකාශ වන ආකාරයට එය නිමවා ඇති බවයි. මෙම ජානය සෑම මොහොතකම ප්‍රකාශ නොවන අතර, වතාවක් දෙවතාවක් ඩෙංගු ආසාදිතයකුගේ රුධිරය උරා බිව් මදුරුවකු තුළට වයිරසය ඇතුළු වූ විට නව ජානය ක්‍රියාත්මක වීමට පටන් ගනී. එනම්, එය සක්‍රිය වන්නේ මදුරුවාගේ ශරීරය තුළට රුධිරය පැමිණි විටය.

මෙම ක්‍රියාවලිය ආරම්භ වන්නේ අලුතින් නිර්මාණය කළ ජාන සුසංහිත මඳුරුවන්ගෙන් පිරිමි මදුරුවන් වෙන්කර පරිසරයට මුදා හැරීම මඟිනි. මේ ජාන සුසංහිත මදුරුවන් පරිසරයට මුදාහල පසු පරිසරයේ සිටින ගැහැනු සතුන් හා සම්බන්ධ වී ප්‍රජනනය කරයි. එවිට ඒ පිරිමි මදුරුවා සතු ඩෙංගු ප්‍රතිරෝධී ජානය ඊළඟ පරම්පරාවට හිමි වේ. එවිට එම නව පරම්පරාව විසින් ඩෙංගු සම්ප්‍රේෂණය වීම නවතා දමයි. නව මදුරු විශේෂය යොදාගෙන කළ පර්යේෂණය අනුව ඩෙංගු රෝග වයිරස් සම්ප්‍රේෂණය කරන කාණ්ඩ 4න් කාණ්ඩ 2 සහ කාණ්ඩ 4 දෙකෙහිම සම්ප්‍රේෂණය නවතා දැමීමට මෙම නව විශේෂයට හැකි වී ඇත. දැනට වාර්තා වී ඇති බහු ඩෙංගු වයිරස් කාණ්ඩවලට ප්‍රතිරෝධී වන ජාන සුසංහිත මදුරුවන් අතරින් මෙකී ලක්ෂණය පිළිබිඹු කරන ප්‍රථම මදුරු විශේෂය මෙය වේ.

උපකුලපතිනී ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්ද්‍රිකා එන්.විජේරත්න පවසන පරිදි ජානමය රෝගී තත්ත්වයන් සහ ජානමය වගා සඳහා ජානමය ව්‍යුහය හඳුනාගෙන එහි ක්‍රියාකාරිත්වය හදාරා ප්‍රායෝගික විද්‍යාත්මක ක්‍රමවේදයන්ගෙන් නවෝත්පාදනයක් ශ්‍රී ලංකාව තුළ මේවනතෙක් සිදු කර නොමැති තත්ත්වයක් තුළ සිදු කළ මෙම පර්යේෂණය ඉතාම විශිෂ්ට වූවක් බවයි. එසේම මෙම පර්යේෂණය හරහා ශ්‍රී ලංකාවේ ජෛව තාක්ෂණය ලොව දියුණු රටවල ජෛව තාක්ෂණික සොයාගැනීම් සමඟ කරට කර පැමිණිය හැකි බව පෙන්නුම් කරන අවස්ථාවක් බවයි. මෙම සොයා ගැනීම මෙරටට පමණක් නොව මුළුමහත් මානව ප්‍රජාවටම තිළිණ කළ අපූර්ව තිළිණයක් බව ඇගේ අදහසය.

42 වැනි OBSERVER – SLT - MOBITEL

වසරේ පාසල් ක්‍රිකට් ක්‍රීඩක සම්මාන උළෙල

"ප්‍රතිභාව හඳුනාගනිමින් - ශ්‍රේෂ්ඨත්වය කරා..."

2021 අප්‍රේල් මස 20 වැනි දින කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී අති උත්කර්ෂවත් ලෙස පැවැත්වුණු 42 වැනි ඔබ්සවර් - එස්.එල්.ටී - මොබිටෙල් වසරේ පාසල් ක්‍රිකට් ක්‍රීඩක සම්මාන උළෙල 2021 අප්‍රේල් මස 25 වැනි දින ඉරිදා රාත්‍රී 10.15 ට ස්වාධීන රූපවාහිනී සේවයෙන් විකාශනය කෙරේ.

1979 වසරේ සිට සියලුම පසුගිය ජයග්‍රාහකයින් පිළිබඳ මතක සටහන් රැසක් සමඟ ඔප කඩදාසියේ මුද්‍රිත වර්ණ පිටු 16 ක සුවිශේෂ සැමරුම් අතිරේකය 42 වැනි ඔබ්සවර් - එස්.එල්.ටී - මොබිටෙල් වසරේ පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා සම්මාන උළෙලේ උත්කෘෂ්ඨ අවස්ථා සැමරුම් රැසක්ද සමඟින් 2021 අප්‍රේල් මස 25 වැනි දින සන්නේ ඔබ්සවර් පුවත්පත සමඟ නිකුත් වේ.
ඔබේ පිටපත දැන්ම වෙන් කරවා ගන්න!

LAKE HOUSE SUNDAY OBSERVER

SLTMOBITEL The Connection

ITN SriLanka

උසාවියෙන් නික්ම යන පුෂ්පිකා

විවාහක රූ රැජින කිරුළ ශ්‍රී ලංකාවෙන් අයර්ලන්තයට


2020 වසරේ නව ලෝක විවාහක රූ රැජින කේට්

උසාවියෙන් නික්ම යන කැරොලයින් ජූරි

විවාහක රූ රැජින පුෂ්පිකා සිය සමාජ සේවා කටයුතු අරඹමින්

● ටිරෝනි වෑවලගේ

විවාහක රූ රැජින තරගයේ ඔටුනු පැලඳූ, ඔටුණු ගැලවූ සිදුවීම් සියල්ල අවසාන වූයේ ලංකාවට හිමිවූ දෙවැනි විවාහක ලෝක රූ රැජින කිරුළ අහිමි වීමෙන් පසුවය. පසුගියදා 2020 ලෝක විවාහක රූ රැජින කිරුළ කැරොලයින් ජූරිගෙන් නිල වශයෙන් ඉවත් කළ බව එම තරගය සංවිධානය කරන මණ්ඩලය විසින් නිල වශයෙන් දැනුම් දුන් අතර, ඒ අනුව තරගයේ දෙවැනි ස්ථානය දිනාගත් අයර්ලන්තයේ කේට් ෂෙනෙයිඩර්ට පසුගියදා නිල වශයෙන් කිරුළ බාර දෙන ලදී.

මේ අතර තවමත් කිරුළු ගැලවීමේ අර්බුදය නිමාවක් වී නොමැති අතර, පුෂ්පිකා ද සිල්වාගේ පැමිණිල්ලට අනුව අත්අඩංගුවට ගත් කැරොලයින් ජූරිට සහ කිරුළ ගැලවීමට ඇයට සහය දුන් චූලා පත්මේන්ද්‍රාට ඇප ලබා දුන්නේ රුපියල් ලක්ෂය බැගින් ශරීර ඇප ලබා දීමෙන් පසුවය. මේ තීන්දුව ලබා දුන්නේ කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් බුද්ධික ශ්‍රී රාගල මහතා විසිනි.

වමේ සිට, කැරොලයින් ජූරි සහ චූලා පත්මේන්ද්‍රා

සිදුවීමෙන් පසුව පුෂ්පිකා ද සිල්වා විසින් ඇයට තුවාල සිදුකිරීම, නින්දා කිරීම, සාපරාදී බිය ගැන්වීම සහ දේපළ අනර්ථය සිදුකිරීම යන චෝදනා යටතේ වැලිසර, රාගම පදිංචි කැරොලයින් ජූරිට සහ කඩවත පාර දෙහිවල පදිංචි චූලා පද්මේන්ද්‍රාට එරෙහිව පැමිණිලි කර තිබිණි. පසුව ඔවුන් දෙදෙනා අත්අඩංගුවට පත්වූ අතර එදිනම පොලිස් ඇප මත මුදා හැරුණි.

මීට අමතරව පොදු දේපොළවලට අලාභහානි සිදුකිරීම සම්බන්ධයෙන්ද මේ පුද්ගලයන්ට එරෙහිව චෝදනා එල්ල වී තිබිණි. සිදුවීම සිදුවූ අවස්ථාවේදී නෙළුම් පොකුණ රගහලේ වීදුරු බිඳ දමමින් එයට රුපියල් ලක්ෂ හතක පමණ අලාභ හානි සිදු කළ බව පැමිණිල්ල චෝදනා කර තිබිණි. එහෙත් මේ සම්බන්ධව කැරොලයින් ජූරිගේ නීතිඥයන් පවසා තිබුණේ දේපළ හානි සිදුකිරීම සම්බන්ධව චෝදනා තමන් ප්‍රතික්ෂේප කරන බවයි. කෙසේ වුවද පැමිණිල්ල ඉදිරිපත් කළ කුරුඳුවත්ත පොලීසිය අධිකරණයට පවසා තිබුණේ රගහලේ සීසීටීවී දර්ශන ඔස්සේ ඉදිරියට පරීක්ෂණ පවත්වන බවයි.

මේ අතර කැරොලයින් ජූරි සහ චූලා පත්මේන්ද්‍රා තමන්ගෙන් සමාව ඉල්ලන්නේ නම් හැර ඔවුන් සමග සමාදාන වීමේ කිසිඳු අවශ්‍යතාවක් තමන්ට නැතැයි පුෂ්පිකා ද සිල්වා මාධ්‍ය හමුවේ පවසා ඇති අතර, ඔවුන් දෙදෙනා විදේශ ගත වීමේ සූදානමක් පවතින බැවින් ඒ සම්බන්ධව කටයුතු කරන මෙන් ඇය උසාවිය හමුවේද පවසා ඇතැයි වාර්තා වේ. කැරොලයින් ජූරි සහ චූලා පත්මේන්ද්‍රා ගේ නීතිඥයන් උසාවියේදී පවසා ඇත්තේද තම සේවාදායිකාවන් පුෂ්පිකා ද සිල්වාගෙන් සමාව අයැදීමට කටයුතු නොකරණු ඇති බවයි. ඒ අනුව ඉදිරියේදී කැඳවීමට නියමිත සාක්ෂි අනුව නඩුව ඉදිරියට පවත්වාගෙන යෑමට නියමිත වී තිබේ. කෙසේ වුවද කැරොලයින් කිරුළ අත්හරින බව පැවසීමෙන් පසු ඇයගේ කිරුළ නිල වශයෙන් ඉවත් කළ බවත්, එම කිරුළේ නව හිමිකාරිනිය 2020 ලෝක විවාහක රූ රැජින තරගයෙන් දෙවැනි ස්ථානය දිනාගත් අයර්ලන්තයේ කේට් ෂෙනෙයිඩර් බවත් ලෝක විවාහක රූ රැජින තරග සංවිධායක මණ්ඩලය පසුගියදා නිල වශයෙන් ප්‍රකාශ කළේය.

කේට් තම සැමියා සමඟ

කෙසේ වුවද මෙහිදී කමිටුව පැහැදිලිව දක්වා ඇත්තේ රූ රැජින කැරොලයින් තමා විසින් කිරුළ අත්හැරි බවයි. බොහෝවිට සිදුවන යම් යම් නීති කඩ කිරීම් මත රූ රැජිනන්ගේ කිරුළ නිල වශයෙන් ආපසු ගැනීමට එම තරග සංවිධායක කමිටු කටයුතු කරයි. එවැනි අවස්ථා කිහිපයක්ම ලෝක රූ රැජින තරග ඉතිහාසය විමසීමේදී හමුවේ. එහෙත් මෙවර සංවිධායක මණ්ඩලය පවසා ඇත්තේ කැරොලයින් ස්වකැමැත්තෙන් කිරුළ අත්හල බවයි.

ඒ අනුව 2020 ලෝක විවාහක රූ රැජින කිරුළ හිමි කරගත් කේට් එම වසරේ අයර්ලන්තයේ විවාහක රූ රැජින කිරුළද හිමි කර ගැනීමට සමත් වී තිබේ.

ඇය 29 හැවිරිදි වියේ පසුවන අතර ඇයගේ උස අඩි පහයි අඟල් නවයක් බව සඳහන්ය. ඇයගේ සැමියාගේ නම සඳහන් නොවන අතර ඔවුන් දෙදෙනා වසර දහයකට වැඩි කාලයක් පුරා යුග දිවිය ගෙවන බව සඳහන්ය. ඔවුන්ට දරුවන් නොමැති නමුත් ඔවුන් සුරතල් සුනඛයන් දෙදෙනෙකු ඇතිකරන බවද මාධ්‍ය වාර්තාවල සඳහන් වේ.

කෙසේ වුවද මෙතැන් සිට 2020 ලෝක විවාහක රූ රැජින වන්නේ ශ්‍රී ලංකාවේ කැරොලයින් ජූරි නොව අයර්ලන්තයේ කේට් ෂෙනෙයිඩර්ය.

මේ අතර පිටරටවල මේ සිදුවීම සම්බන්ධයෙන් පළවූ ඇතැම් මාධ්‍ය වාර්තා පවසා තිබුණේ පුෂ්පිකා ද සිල්වා සැමියාගෙන් වෙන්ව වාසය කළ නමුත් ඇය දික්කසාද වී නොමැති නිසා ඇයට විවාහක රූ රැජින කිරුළ හිමිවීමට බාධාවක් නොමැති බවයි.

ලොව ඉහළ ඉල්ලුමක් ඇති ඇඟලුම් ක්ෂේත්‍රයට මඟ කියන BRANDIX CORPORATE CAMPUS

● ඉනෝකා පෙරේරා බණ්ඩාර

මේ රට ඇඟලුම් කර්මාන්තයට අවශ්‍ය උසස් තාක්ෂණික සහ නවෝත්පාදන අධ්‍යාපනික දැනුම ලබා දීම අරමුණු කොට, Brandix Corporate Campus **ආරම්භ කරන ලද්දේ, 1996 වසරේදී ය.**

එදා මෙදා තුර, ශ්‍රී ලංකාවේ සහ ජාත්‍යන්තරයේ ඇඟලුම් ක්ෂේත්‍රයට අවශ්‍ය උසස් තනතුරුවල වෘත්තිකයන් විශාල සංඛ්‍යාවක් බිහි කළ **Brandix Corporate Campus,** අද වන විට ලෝකයේ ඇඟලුම් නිෂ්පාදන ක්‍රියාවලියට අවශ්‍ය සෑම ආකාරයකම දැනුම ලබා දෙන, ජාත්‍යන්තර සරසවියක කාර්යයභාර්ය ඉටු කරමින් සිටියි.

ලෝකයේ ඉතා ඉහළ වැටුප් තලවලට හිමිකම් කියන ඇඟලුම් ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා සඳහා සුදුසුකම් ලත් වෘත්තිකයන් ලෙස, ශ්‍රී ලාංකීය තරුණ ප්‍රජාව සූදානම් කරන මේ ආයතනයෙන් ලබා ගත හැකි සේවාව පිළිබඳ, එහි අංශ ප්‍රධානි - ඇඟලුම් තාක්ෂණය සහ ව්‍යාපාර විශිෂ්ටත්ව කේන්ද්‍රයේ චාමිකර ජයකොඩි සහ අංශ ප්‍රධානි - ඇඟලුම් තාක්ෂණය සහ කළමනාකරණ, නිලන්ති ගමගේ සමඟ කළ සාකච්ඡාවකි.

ඇඟලුම් තාක්ෂණය සහ ව්‍යාපාර විශිෂ්ටත්ව කේන්ද්‍රයේ අංශ ප්‍රධානි චාමිකර ජයකොඩි සහ ඇඟලුම් තාක්ෂණය, සහ කළමනාකරණ අංශයේ අංශ ප්‍රධානි නිලන්ති ගමගේ

එම සාකච්ඡාවට එක් වූ චාමිකර ජයකොඩි මෙසේ කියා සිටියේය.

● අද ඇඟලුම් ක්ෂේත්‍රය, ලෝකයේ අතිශය පිළිගැනීමට ලක්වූ කර්මාන්තයක් බවට පත්ව තිබෙනවා නේද...

ඔව්. මීට දශක දෙකකට පමණ පෙර තිබූ ඇඟලුම් ක්ෂේත්‍රය නෙවෙයි අද තිබෙන්නේ. එය දැවැන්ත වෙනසකට බඳුන් වී තිබෙනවා. අලුත් පැති කරා විහිදී තිබෙනවා. නවාංග එක් වී තිබෙනවා. අපගේ ගැනුම්කරුවන්ගේ වෙනස් වීම්, නිෂ්පාදන ක්‍රියාවලියේ වෙනස් වීම් හා ශ්‍රම බලකායේ වෙනස් වීම්, මේ සඳහා ප්‍රධාන බලපෑම් ඇති කර තිබෙනවා. ඒ අනුව, මේ ක්ෂේත්‍රය හුදෙක්ම ඇඟලුම් නිෂ්පාදනය පමණක් නෙවෙයි, **"Apparel Supply Chain Solution"** හෙවත් සම්පූර්ණ ඇඟලුම් අගය දාමයට අදාළ සේවා ලබා දෙන්නකු ලෙස පුළුල් වී තිබෙනවා.

● ඇඟලුම් ක්ෂේත්‍රයේ ඇති රැකියා අවස්ථා මොනවාද?

මෙහෙයුම් කළමනාකරණ **(Operations Management)** අංශය යටතේ **Textile Technology, Product Development, Garment Technology, Industrial Engineering, Quality Assurance, Textile Testing, Planning** හා **Production Management** යන උප අංශ තුළ රැකියා අවස්ථා වගේම, **Marketing & Merchandising** අංශය යටතේ **Marketing, Merchandising** හා **Supply Chain Management** යන උප අංශ තුළත් රැකියා අවස්ථා ලබා ගත හැකියි.

එමෙන්ම, කළමනාකරණ **(General Management),** මානව සම්පත් කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය හා **Logistics** යන අංශ තුළ ද රැකියා අවස්ථා තිබෙනවා. වර්තමානය වන විට **Innovation, Sustainability, Lean Management** හා **Business Analytics** යන නව අංශ ඔස්සේ රැකියා අවස්ථා නිර්මාණය වී තිබෙනවා.

● මේ උසස් අධ්‍යාපන ආයතනය Brandix සමූහයේ පූර්ණ අනුබද්ධ ආයතනයක් වීම සිසුන්ට ඇති වාසි මොනවාද ...

Brandix කියන්නේ, ශ්‍රී ලාංකික ගෝලීය සමාගමක්. **Brandix** සමාගමේ කොටසක් වීම හේතුවෙන් **Brandix Corporate Campus**හි විෂය නිර්දේශ ගෝලීය දැනුම සමඟින් නිරතුරු යාවත්කාලීන වෙනවා. ඒ වගේම, සිසුන්ගේ ප්‍රයෝගික දැනුම වැඩි දියුණු කර ගැනීමට **Brandix** සමාගමේ ඇඟලුම් කර්මාන්තශාලා මඟින් ලැබෙන නිරාවරණය ඉතාම වැදගත්. **Brandix Corporate Campus** හා අනුබද්ධ, වාණිජමය වශයෙන් ක්‍රියාත්මක වන රෙදිපිළි හා රෙදි පරීක්ෂා කිරීමේ **B-Labs** විද්‍යාගාරය මඟින්, සිසුන්ගේ රෙදිපිළි හා රෙදි පරීක්ෂා කිරීමේ දැනුම අලුත් කර ගැනීමට හැකි වනවා.

● ඔබ ආයතනයේ උපාධි පාඨමාලා හැඳෑරිය හැකි ආකාරය පැහැදිලි කළොත්

Bachelor of Applied Science (Textile Technology) උපාධි පාඨමාලාව සඳහා ඊළඟ කණ්ඩායම සඳහා අධ්‍යයන කටයුතු මැයි මස 17 වැනි දින සිට ආරම්භ වෙනවා. අපගේ පාඨමාලා පිළිබඳ, **Inspired Studentships** ශිෂ්‍යත්ව හෝ ආයෝජන අවස්ථා පිළිබඳ වැඩිදුර විස්තර 0770 444401 හෝ 011 4742111 දුරකථන අංක ඔස්සේ ලබා ගත හැකියි. එමෙන්ම, **Brandix Corporate Campus** හි නිල සමාජ මාධ්‍ය ජාලා ගිණුම් **Facebook, Instagram, LinkedIn** හා **YouTube** පරිශීලනය කිරීමෙන් ද ලබා ගත හැකියි. එසේම, 157, ගාලු පාර, රත්මලාන යන ස්ථානයේ පිහිටි **Brandix Corporate Campus** පරිශ්‍රයට පැමිණ වැඩි විස්තර ලබා ගැනීමටත් හැකියි.

● Brandix Corporate Campus හි සෙසු පාඨමාලා මොනවාද

උපාධි පාඨමාලාවට අමතරව පූර්ණ කාලීන පාඨමාලා යටතේ, **Diploma in Fashion Merchandising & Retailing** පාඨමාලාව පවත්වනවා.

ඒ වගේම, දැනට ඇඟලුම් ක්ෂේත්‍රයේ වැඩ කරන අයට, උසස් තනතුරුවලට යා හැකි ආකාරයේ, සති අන්ත අර්ධ කාලීන පාඨමාලා දෙකක් පවත්වනවා. ක්ෂේත්‍රයේ නියුතු අයගේ න්‍යායාත්මක දැනුමට මෙන්ම, ක්ෂේත්‍රයේ පිළිගත් සුදුසුකමක් ලබා ගැනීම පෙරදැරිව පවත්වනු ලබන එම පාඨමාලා වන්නේ, **College Diploma in Clothing Manufacturing Management** පාඨමාලාව සහ **Associate Diploma in Clothing Manufacturing** යන පාඨමාලා යි.

ඇඟලුම් අධ්‍යාපන ක්ෂේත්‍රයේ දීර්ඝකාලීන අත්දැකීම් ඇති නිලන්ති ගමගේ සාකච්ඡාවට එක් වූයේ මෙලෙසිනි.

● මෙම ක්ෂේත්‍රයේ විධායක ශ්‍රේණියේ රැකියාවකට උපාධියක් තිබීමේ වැදගත්කම කුමක්ද...

ඇඟලුම් කර්මාන්තය කියන්නේ ගෝලීය තරගකාරී ක්ෂේත්‍රවලින් එකක්. අපගේ ගැනුම්කරුවන් වන්නේ, ලෝකයේ ප්‍රධාන පෙළේ සන්නාම නාම .එසේම, තරගකරුවන් **(competitors)** වන්නේ, කලාපයේ මෙන්ම ගෝලීයව ඉදිරි පෙළේ සිටින ආයතන. එම නිසා දැනුමෙන් හා බුද්ධියෙන් යුතු විධායක ශ්‍රේණියේ ශ්‍රම බළකායක් සිටීම ඉතාම වැදගත්. එම නිසා උපාධිධාරීන්ගේ දායකත්වය මේ ක්ෂේත්‍රයට ඉතා ම වැදගත්.

● Brandix Corporate Campus ලබා දෙන උපාධි පාඨමාලාවේ විශේෂත්වය කුමක්ද ...

පුද්ගලික අංශයේ ඇඟලුම් ක්ෂේත්‍රය සම්බන්ධ අධ්‍යාපනික ආයතනවලින් පුරෝගාමියා වන්නේ, **Brandix Corporate Campus** ආයතනයයි. අප විසින් ලබා දෙන **Bachelor of Applied Science (Textile Technology)** යන තුන් අවුරුදු උපාධිය ලබා දෙන්නේ, ඕස්ට්‍රේලියාවේ, **Royal Melbourne Institute of Technology (RMIT)** විශ්වවිද්‍යාලය හා අනුබද්ධවයි. RMIT විශ්වවිද්‍යාලය, විලාසිතා සහ රෙදිපිළි **(Fashion and Textile)** සම්බන්ධයෙන් ලෝකයේ ඉතාම ඉහළ පිළිගැනීමකට ලක් වූ උසස් ආයතනයක්. ඒ අනුව, අපගේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ලැබෙන්නේ ජාත්‍යන්තරව පිළිගත් උපාධි සහතිකයක්.

● මොකක්ද මේ, "Inspired Studentships" වැඩසටහන ...

එය ආයතනය විසින් පිරිනමන සුවිශේෂී ශිෂ්‍යත්ව වැඩසටහනක්.ඒ තුළින් අප උත්සාහ කරන්නේ, අපට සම්බන්ධ වන සෑම සිසුවකුගේම අපොස උසස් පෙළ කාලය තුළ, ඔවුන්ගේ අධ්‍යාපනික හා විෂය බාහිර දක්ෂතා ඇගැයීමට ලක් කිරීමටයි. එහිදී මෙම ශිෂ්‍යත්වය සම්පූර්ණ උපාධියේ වටිනාකමින් 12% ප්‍රමාණයක් වන, රුපියල් 200,000 උපරිමයක් දක්වා ලබා දෙනවා. මෙම **Inspired Studentships** යටතේ සිසුන්ගේ අපොස උසස් පෙළ ප්‍රතිඵල පදනම් කරගෙන ශිෂ්‍යත්ව ප්‍රදානය කරන අතර, කිසියම් මොහොතක ශ්‍රී ලංකාව නියෝජනය කර තිබීම හෝ සමස්ත ලංකා, පළාත්, දිස්ත්‍රික්ක හෝ කොට්ඨාස තරගවලදී පාසල නියෝජනය කරමින් ජයග්‍රහණ ලබා තිබීමත්, ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේදී බලපාන සාධකයක්.

පාසලේ විවිධ සමිති සමාගම්වල සාමාජිකයකු වීම හා නිලතල දැරීමත්, බාලදක්ෂයකු හෝ බාලදක්ෂිකාවක් වීම හා ශිෂ්‍යභට කාණ්ඩයේ සාමාජිකයකු වීමත් මෙම ශිෂ්‍යත්වය ලබා දීමේදී සලකා බලන සෙසු විෂය බාහිර කාරණා. පාසල් වර්ණ ලාභියකු වීම, පාසලේ හෝ දහම් පාසලේ ශිෂ්‍ය නායකයකු වීම හා වෙනත් නායකත්ව කුසලතාත් මෙම **Inspired Studentships** ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේදී සලකා බලනවා.

● උපාධි පාඨමාලාවේ අවසන් වසරේ ලබා දෙන "Work whilst Learning" පහසුකම ගැනත් කියන්න ...

උපාධි වැඩසටහනේ අවසන් අධ්‍යයන වසරට අදාළ දේශන පැවැත්වෙන්නේ සති අන්තයේ දිනවලදීයි. එමෙන්ම, ක්ෂේත්‍රයට ඉතාම සමීපව කටයුතු කරන අධ්‍යාපනික ආයතනයක් ලෙස ඉතුරු සතියේ දිනවලදී, අප සෑම විටම ඔවුන්ට ක්ෂේත්‍රයට අදාළ රැකියාවක නිරත වීමට දිරිමත් කරනවා වගේම, ඔවුන්ට රැකියා ලබා ගැනීමට අපගේ පූර්ණ සහයෝගය හා මඟ පෙන්වීම ලබා දෙනවා. මෙලෙස එක් වසරක පූර්ණ කාලීන සේවා පළපුරුද්දක් ඇතිව උපාධිධාරියකු වන පසුබිමක් තුළ, මොවුන්ගේ ශ්‍රම වෙළෙඳපොළ මඟින් ලබා දෙන වටිනාකම, වෙනත් උපාධිධාරීන්ට සාපේක්ෂව ඉහළ මට්ටමක පවතිනවා.

● බ්‍රැන්ඩික්ස් සිසුන් ප්‍රායෝගික දැනුමෙන් සන්නද්ධ කරන්නේ කෙසේද?

අපගේ සිසුන්ගේ ප්‍රයෝගික දැනුම වර්ධනය කිරීම උදෙසා, **Brandix Corporate Campus** ඉතා ඉහළ අවධානයක් යොමු කරනවා. එහිදී ඔවුන්ව ශ්‍රී ලංකාව තුළ ඇති සීමිත රෙදි මෝල් **(textile mills)** වෙත ක්ෂේත්‍ර චාරිකා ලබා දෙනවා. ක්ෂේත්‍රය තුළ රැකියාවේ නිරත වන ප්‍රවීණයන්ගෙන් යුතු දේශක මඬුල්ලක් විසින් සිසුන්ට අවශ්‍ය ප්‍රයෝගික දැනුම පන්ති කාමර තුළ ලබාදීමට කටයුතු කරනවා. එමෙන්ම, සිසුන්ට ලබා දෙන මාස තුනක සීමාවාසික පුහුණුව **(three months internship)** මඟින් ඔවුන්ගේ ප්‍රයෝගික දැනුම වඩාත් ඔප නංවනවා.

● Brandix Corporate Campus හා සම්බන්ධ වීමෙන් සිසුන්ට ලැබෙන අමතර වාසි මොනවාද ...

ක්ෂේත්‍රයට අදාළ වන **Industry Application Systems, Pattern Making Room, Sewing Room** හා පුස්තකාලය, අපගේ සිසුන්ගේ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම වර්ධනය කිරීමට ඉතාමත් ඉවහල් වනවා. **Brandix Corporate Campus** හා අනුබද්ධ වාණිජමය වශයෙන් ක්‍රියාත්මක වන රෙදිපිළි හා රෙදි පරීක්ෂා කිරීමේ **B-Labs** විද්‍යාගාරය විසින් **Brandix** ආයතනයේ රෙදිපිළි පරීක්ෂා කිරීමේ අවශ්‍යතාවලින් 50%කටත් වඩා ඉටු කරනු ලබනවා. සිසුන්ට තම අධ්‍යයන කටයුතු සඳහා මෙම රෙදිපිළි පරීක්ෂණ විද්‍යාගාරය භාවිත කිරීමේ ඇති හැකියාවයි. යම් සිසුවකුට අවශ්‍ය නම් මෙම උපාධි පාඨමාලාවේ ගෙවීම්, වාරික මගින් සිදු කිරීමට, ඒ සඳහා ද හැකියාව තිබෙනවා. එමෙන්ම, කිසියම් අයකුට මූල්‍ය අපහසුකම් ඇත්නම්, ඒ සඳහා පිටිවහලක් ලෙස, රාජ්‍ය හා පුද්ගලික බැංකු ඔස්සේ, ණය පහසුකම් ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියා මාර්ග **Brandix Corporate Campus** මගින් ගෙන තිබෙනවා. අපට අවශ්‍ය, මේ රටේ ඇත ගමක නගරයක, ඔබ කොතැනක ජීවත් වුවත්, ලෝකයේ ඉහළ වැටුප් ලැබිය හැකි, ඇඟලුම් ක්ෂේත්‍රයේ ඉහළම රැකියා සඳහා ඔබට මඟහසර කියා දීමටයි.

ඡායාරූප - තුෂාර ප්‍රනාන්දු

රාජකීය හැල්ල

රුවන් පතිරණ කියයි... edmediaunit@gmail.com

විපක්ෂයේ ප්‍රභූවරයා බිරියගේ උපන් දින තෑග්ග පොළොවේ ගසයි



පසුගිය අප්‍රේල් 17 වැනිදා රාත්‍රියේ දකුණේ ජාතික උද්‍යානයකට යාබද වෙරළ ආසන්නයේ පිහිටි තරු පහේ හෝටලයක සාදයක් පැවැත්විණ. මෙම රාත්‍රි භෝජන සංග්‍රහය සහිත සාදය සූදානම් කර තිබුණේ විරුද්ධ පක්ෂයේ ප්‍රබලයකුගේ ආදරණීය බිරිඳගේ උපන් දිනය වෙනුවෙනි. එදින සවස් කාලයේදී හම්බන්තොට ප්‍රදේශයේ පැවැති උත්සවයකට ද මෙම විපක්ෂයේ ප්‍රබලයා සහභාගි වූ අතර ඔහුත් සමඟ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු කිහිප දෙනෙක් ද ඊට එක්ව සිටියහ.

එම උත්සවයෙන් අනතුරුව බොහෝ දෙනෙකු පැමිණියේ එම ප්‍රදේශයේ පිහිටි මෙම තරු පහේ හෝටලයටයි.

විපක්ෂයේ මෙම ප්‍රබලයා ජාතික වනෝද්‍යානයවලට සහ එහි ජීවත්වෙන සතුන්ට වැඩි ඇල්මක් දැක්වීම නිසා සිය බිරිඳගේ උපන් දින සාදය සඳහා මෙම හෝටලය තෝරාගෙන තිබුණි.

අවුරුදු කාලය නිසා නිවාඩුව ගත කිරීම සඳහා කිහිපදෙනෙක් ද මෙම හෝටලයට පැමිණ නවාතැන්ගෙන සිටි අතර ඔවුන්ගේ ද අවධානය ප්‍රභූවරයාගේ බිරිඳගේ මෙම උපන් දින සාදය සඳහා යොමුවී තිබුණි.

උපන් දින කේක් ගෙඩිය කපා කේක් කැවීමෙන් අනතුරුව සාදයේ කටයුතු ආරම්භ විය.

මධුවිත ද යහමින් තිබූ අතර වයින් වර්ග ඇතුළු විවිධ බීම වර්ග ද විය.

ප්‍රභූවරයාගේ බිරිඳ ද වයින් වර්ග ඇතුළු බීම වර්ග පානය කළ අතර පැමිණ සිටි පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ඇතුළු බොහෝ දෙනෙක් අල්ලාප සල්ලාපයේ යෙදෙමින් මධුවිත පානය කළහ. සංගීත රාවයක් ද පැවතුණු අතර ප්‍රභූවරයාගේ බිරිඳ සමඟ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් කිහිප දෙනෙකු ද කතා බස් කරමින් සිටිනු දක්නට ලැබුණි.

මේ අතර තෑගි බෝග රැසක් ද විපක්ෂයේ ප්‍රභූවරයාට ලැබුණේ උපන් දිනයට සුබපැතුම් ද එක් කරමිනි.

උපන් දින සාදයේ සිනා මනා

රාත්‍රි ආහාරය ගැනීමේ කටයුතු ද ආරම්භ වූ අතර පිරිසක් ආහාර ගන්නා අතර තවත් පිරිසක් මධුවිත පානය කරමින් කතාබස් කරමින් විහිළු කරමින් තවදුරටත් සිටියහ.

මේ අතර උපන් දිනයට ලැබුණු ත්‍යාග විවෘත කර බැලීමේ වැඩසටහනක් ද තවත් පැත්තකින් ආරම්භ වී තිබුණි.

මිල අධික සුවඳ විලවුන්, සාරි, ඔරලෝසු ඇතුළු ත්‍යාග ලැබී තිබුණු අතර එහි තිබූ තවත් ත්‍යාගයක් ගැන ද බොහෝ දෙනෙකුගේ අවධානය යොමු වී තිබුණි.

අමුතුම ආකාරයේ ත්‍යාගයක් වූ මෙය කුමක්දැයි බොහෝ දෙනෙකු කල්පනා කරන්නට වූ අතර හොඳින් බලන විට පෙනී ගියේ මෙය පුරුෂයෙකුගේ අවයවයකට සමාන ආකාරයෙන් ප්ලාස්ටික්වලින් හැදූ අවයවයක් බවයි.

මෙම අපූරු උපන් දින තෑග්ග දුටු බොහෝ දෙනෙකු බඩවල් අල්ලාගෙන සිනාසුණු අතර මෙයින් දැඩි ලෙස කෝපයට පත්වූ විපක්ෂයේ ප්‍රභූවරයා මෙම උපන් දින තෑග්ග පොළොවේ ගසා කඩා දැමුවේය.

මෙම අසික්කිත වැඩේ සිදු කළේ කවුරුන්ද කියා සොයමින් ප්‍රභූවරයා බැණ වදිමින් හෝටලයේ ඔබ මොබ ගිය අතර ඔහු සන්සුන් කරගැනීම සඳහා දැඩි ප්‍රයත්නයක් දැරීමට ඇතැම් මන්ත්‍රීවරුන්ට සහ ආරක්ෂක අංශවලට සිදුවිය. නොසිතූ ලෙස උපන් දින සාදය තුළ ඇතිවූ මෙම තත්ත්වය හේතුවෙන් සාදය එවේලේම අවසන් වූ අතර සමහරුන් හෝටලයෙන් පිටතට ආවේ රාත්‍රි ආහාරයවත් නොගෙනයි.

විපක්ෂයේ ප්‍රභූවරයාට කෙතරම් කේන්ති ගොස් තිබුණේ ද කියනවා නම් එදින රාත්‍රි ගත කිරීමට හෝටල් කාමර වෙන්කර තිබූ ඇතැම් මන්ත්‍රීවරුන් ද හෝටලයෙන් පිටත්වූයේ පැදුරටත් නොකියාය.

තමාගේ ආදරණීය බිරිඳට මෙවැනි ත්‍යාගයක් දුන්නේ ඇත්තටම විහිළුවට ද නැත්නම් වෙනත් අරමුණකින් ද කියා දැනගැනීම සඳහා විපක්ෂයේ ප්‍රභූවරයා මේ දිනවල වැඩි අවධානයක් යොමු කර තිබේ.

පාර්ලිමේන්තුවේ ගුටි කෙළියේ මුල මැද අග

මේ අතර පාර්ලිමේන්තුවේ දැඩි උණුසුම්කාරී තත්ත්වයක් ඇතිවූයේ පසුගිය 21 වැනිදා ය.

අප්‍රේල් 21 පාස්කු ප්‍රහාරයට වර්ෂ 2 ක් පිරුණු එදින ඒ ගැන මැතිසබය තුළ කතා කිරීමට ගොස් මෙම උණුසුම්කාරී තත්ත්වය ඇති විය.

සාමාන්‍යයෙන් කළුපටි Black belt පලඳින්නේ කරාටේ ශූරයන් ය. කරාටේ ක්‍රීඩාවේ බ්ලැක් බෙල්ට් එකක් ලබාගැනීම එම ක්‍රීඩාවේ ජයග්‍රහණයකි.

පාර්ලිමේන්තුවේ බ්ලැක් බෙල්ට් තිබෙන ජනතා නියෝජිතයන් නැත්තේම නොවේ.

නමුත් විරෝධතාවකට අත්වල ගැටගසන කළුපටිවලට අමතරව ඇත්තටම කළුපටි ශූරයන් පාර්ලිමේන්තුවේ සිටිනවාද?

මෙවර පාර්ලිමේන්තුවට ආණ්ඩු පක්ෂයෙන් මෙන් ම විරුද්ධ පක්ෂයෙන් ද නවක තරුණ මන්ත්‍රීවරුන් රැසක් තේරීපත්වීම නිසා ඔවුන් අතර කරාටේ බ්ලැක් බෙල්ට් ශූරයන් සිටීමට පුළුවන.

නමුත් පාර්ලිමේන්තුවේ සිටින සැබෑම කළුපටි කරාටේ ශූරයෙකු වන්නේ ඊ.පී.ඩී.පී. නායක වර්තමාන ධීවර අමාත්‍ය ඩග්ලස් දේවානන්දයි. කරාටේ ක්‍රීඩාව කොළඹදී ඔහු හොඳින් පුහුණු කර ඇති අතර ඩග්ලස් දේවානන්දගේ කරාටේ ගුරුවරයා වන්නේ දක්ෂ කරාටේ ශූරයෙක් වන ජේ.ඒ.ටී. ලිවේරායි.

ඊ.පී.ආර්.එල්.එෆ්. සංවිධානයේ සිටින විට ඩග්ලස් දේවානන්දා කරාටේ ශූරයකු පමණක් නොව ගිනි අවි හරඹ ද ඉතා හොඳින් දන්නා හොඳ සටන් කරුවෙකි.

පසුගිය (21) දින පාර්ලිමේන්තුවේ ඇතිවූ උණුසුම්කාරී අවස්ථාවන්ට හා ගුටිබැට හුවමාරුවලට කෙතරම් දක්ෂ සටන්කාමියකු වුවත් ඩග්ලස් දේවානන්දා ඊට සහභාගි වූයේ නැත.

එම උණුසුම්කාරී තත්ත්වය සහ ගුටිබැට හුවමාරුව ඇතිවූයේ ආණ්ඩු පක්ෂයේ හා විරුද්ධ පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දෙදෙනෙකු අතරය.

බදුල්ලේ මන්ත්‍රීවරු දෙදෙනාගේ හුටපටේ

ආණ්ඩු පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ බදුල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ජානක තිස්සකුට්ටිආරච්චි ය. විරුද්ධ පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා වූයේ සමගි ජනබලවේගයේ ජාතික ලැයිස්තු පාර්ලිමේන්තු මන්ත්‍රී හරින් ප්‍රනාන්දු ය.

දෙදෙනාම මීට පෙර එක්සත් ජාතික පක්ෂය නියෝජනය කළේ බදුල්ල දිස්ත්‍රික්කයෙන් වීම තවත් විශේෂත්වයකි.

කෙසේ නමුත් තිස්සකුට්ටිආරච්චි සහ හරින් ප්‍රනාන්දු අතර ගැටුමට පාර කැපුණේ එම ගැටුම ඇතිවූ අවස්ථාවේදී නොවේ.

එම ගැටුමට පාර කැපුණේ පාර්ලිමේන්තුවේ මැතිසබය තුළදීය.

21 වැනිදා මැතිසබයේ දී විවාදයට ගැනීමට නියමිතව තිබුණේ තරුණ හා ක්‍රීඩා අමාත්‍ය නාමල් රාජපක්ෂ විසින් ඉදිරිපත් කරන ලද ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යටතේ නියෝගයක්ය.

නමුත් ඊට පෙර මැතිසබය තුළ උණුසුම්කාරී තත්ත්වයක් ඇති වූයේ 22 වැනිදා පාර්ලිමේන්තුවේදී විවාදයට ගනු ලබන යෝජනාවක් සම්බන්ධයෙනි.

දේශපාලන පළිගැනීම් පිළිබඳ ජනාධිපති විමර්ශන කොමිසන් සභා වාර්තාවට අදාළ පාර්ලිමේන්තුවේ කල්තැබීමේ අවස්ථාවේ විවාදය සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට විපක්ෂයට අවස්ථාව ලබාදෙන ලෙස විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ලක්ෂ්මන් කිරිඇල්ල විසින් ඉල්ලීමක් සිදු කරන ලදී.

"දේශපාලන පළිගැනීම් පිළිබඳ ජනාධිපති හා විමර්ශන කොමිසමේ වාර්තාව ගැන විවාදය ආරම්භ කරන්න අපට අවස්ථාව ලබාදිය යුතුයි. අපියි මේ විවාදය ඉල්ලා සිටියේ. ඒක නිසා මේ විවාදය ආරම්භ කිරීම අපිට අවශ්‍යයයි" යනුවෙන් කිරිඇල්ල දිගින් දිගටම කියා සිටියේය.

දිනේෂ් "බොරලුගොඩ සිංහයා වගේ"

ඊට පිළිතුරු ලබාදුන්නේ පාර්ලිමේන්තුවේ සභානායක දිනේෂ් ගුණවර්ධන අමාත්‍යවරයාය.

"පක්ෂ නායක රැස්වීමේදී මේ ගැන තීන්දුවක් ගත්තා. කිරිඇල්ල මන්ත්‍රීතුමා මෙතනට ඇවිල්ලා දැන් වෙන දෙයක් කරනවා." යනුවෙන් දිනේෂ් ගුණවර්ධන කියා සිටියේය.

"එහෙම නැහැ. එහෙම නැහැ." යනුවෙන් කිරිඇල්ල ඊට වහාම ප්‍රතිචාර දැක්වීය.

පක්ෂ නායක රැස්වීමේදී එකඟවූ ආකාරයට මෙම විවාදය පැවැත්විය යුතුයි" යනුවෙන් දිනේෂ් ගුණවර්ධන දිගින් දිගටම ප්‍රකාශ කළේය.

ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ නායක සමගි ජනබලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී රවුෆ් හකීම් ද මේ අවස්ථාවේ නැඟී සිටියේය.

"මේක කල්තැබීමේ විවාදයක්. මේක ඉදිරිපත් කරන්න විපක්ෂයට ලබාදිය යුතුයි. විපක්ෂයේ යෝජනාව ආණ්ඩුව හයිජැක් කරන්න හදනවා!" යනුවෙන් රවුෆ් හකීම් කියා සිටියේය. හකීම්ගේ මේ කතාවට දිනේෂ්ට තරමක් කේන්ති ගියේය. උස් හඬින් දිනේෂ් සභාව ඇමතුවේ බොරලුගොඩ සිංහයා වන තම පියා වන පිලිප් ගුණවර්ධන සිහිපත් වන ආකාරයටයි.

"මේ පක්ෂ නායක රැස්වීමේදී එකඟවූ කරුණක් ගැන දැන් මෙහෙම වෙනස් කරන එක වැරැදියි. මේ දේශපාලන පළිගැනීම් නිසා වැඩියෙන් ම පීඩා වින්දේ මේ අපියි. එදා ඒකාබද්ධ විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සිදු කරන ලද දේශපාලන පළිගැනීම් කොච්චර ද? මේ දේශපාලන පළිගැනීම්වලින් රිදුණේ බැට කෑවේ ගුටි කෑවේ අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්මයි.

එමනිසා මේක ඉදිරිපත් කරන්න ඕන, ඒකෙන් විඳවපු අපේ මන්ත්‍රීවරුන්. ඒක නිසා මේක රජය විසින් ඉදිරිපත් කළ යුතුයි. අපේ අය තමයි 100%ක්ම දේශපාලන පළිගැනීම්වලට ලක්වුණේ.

බොරු නඩුදාලා අපේ මන්ත්‍රීවරුන් කීදෙනෙක් සිරගත කළාද? රාජ්‍ය සේවකයන් කීදෙනෙකුට නඩු දැම්මාද? ලැජ්ජයි. එහෙම දේශපාලන පළිගැනීම් සිදුකරලා දැන් කියනවා, ඒ යෝජනාව ඉදිරිපත් කරන්න ඕන ඒගොල්ලන්ට කියලා." යනුවෙන් දිනේෂ් ගුණවර්ධන අමාත්‍යවරයා උස් හඬින් ඉතා වේගවත්ව අදහස් දැක්විය.

"මේකේ නඩුදාලා තියෙන්නේ අපි නොවෙයි. දැන් ඉන්න අගවිනිසුරුතුමා නීතිපති වශයෙන් ඉන්නකොටයි මේ නඩුදාලා තියෙන්නේ. ඒක නිසා මේක දේශපාලන පළිගැනීමක් කියලා කියන්න බැහැ." යනුවෙන් විපක්ෂයේ ප්‍රධාන සංවිධායක, පාර්ලිමේන්තු මන්ත්‍රී ලක්ෂ්මන් කිරිඇල්ල කියා සිටියේය.

මේ සමඟම විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ආණ්ඩුවට එරෙහිව විවිධ සටන් පාඨ ඉදිරිපත් කරමින් විරෝධතා දක්වන්නට වූ අතර ඒ සමඟම නැගී සිටි ආණ්ඩු පක්ෂයේ ජනතා නියෝජිතයෝ ද විරෝධතා සටන් පාඨ කීමත් සමඟම මුළු සවස තුළ ඇති වූයේ දැඩි උණුසුම්කාරි තත්ත්වයකි.

ආණ්ඩු පක්ෂයේ ජනතා නියෝජිතයන්ට විරුද්ධ පක්ෂයේ ජනතා නියෝජිතයන් සිදුකිරීමට යන විරෝධතාවය ආරංචි වී තිබුණි.

සජබ මන්ත්‍රීවරු කළු ඇඳගෙන ඇවිදින්

සමගි ජනබලවේගයේ සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කළු ඇඳුමින් සැරසී ඊයේ දින පාර්ලිමේන්තුවට පැමිණිය යුතු බවට තීරණය කළේ හරින් ප්‍රනාන්දු මන්ත්‍රීවරයාය.

පාස්කු ප්‍රහාරයේ වගකිව යුත්තන් තවම නීතිය ඉදිරියට පමුණුවා නොමැති නිසා ආණ්ඩුවට එරෙහිව විරෝධතාව දැක්වීමටත් පාස්කු ප්‍රහාරයෙන් මියගිය සා විපතට පත්වූ පවුල්වලට ශෝකය පළකිරීම සඳහාත් මෙසේ කළුපාට ඇඳුමින් සැරසී පාර්ලිමේන්තුවට පැමිණීමට සමගි ජනබලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු තීරණය කළහ.

ඊයේ මැති සබය ආරම්භ කිරීමට පෙර පාර්ලිමේන්තුවේ කමිටු ශාලා අංක 2ට රැස්වූ සමගි ජනබලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු පාස්කු ප්‍රහාරය සිදුවීම සිහිපත් කරන්නට වූයේ එම ප්‍රහාරයෙන් මියගිය හා තුවාල සිදුවූ සියලුදෙනා සිහිපත් කරමිනි.

මෙවැනි ශෝකය පළකිරීමක් සිදුකළ යුතු බවට විපක්ෂ නායක සජිත් ප්‍රේමදාසට යෝජනා කළේ සමගි ජනබලවේගයේ පුත්තලම දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී නිරෝෂන් පෙරේරා විසිනි. සමගි ජනබලවේගයේ සියලුමදෙනා කළු ඇඳුමින් සැරසී පැමිණි අතර දෙදෙනකු එක හා සමාන කළු පැහැති යුරෝපීය ඇඳුමින් සැරසී සිටීම ද විශේෂත්වයකි.

සමගි ජනබලවේගයේ බදුල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී චමින්ද විජේසිරි සහ රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී හේෂා විතානගේ එම මන්ත්‍රීවරුන් දෙදෙනායි.

කළු ඇඳුමින් සැරසි පැමිණිය යුතු බවට සිදුකරන ලද දැනුම්දීමක් අනුව චමින්ද හා හේෂා කොළඹ රෙදි සාප්පුවකට ගොස් එකම වර්ගයේ යුරෝපීය ඇඳුම් 2ක් මිලදී ගැනීමට කටයුතු කර තිබුණි.

පරුෂ වචන කියමින් ගුටි කෙළිය ඇරැඹෙයි

විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සටන් පාඨ පුවරු අතට ගැන්මට පෙර ආණ්ඩු පක්ෂයේ ජනතා නියෝජිතයෝ පාස්කු ප්‍රහාරය ගැන විපක්ෂයට චෝදනා එල්ල කරමින් සකස් කරන ලද සටන් පාඨ පුවරු ප්‍රදර්ශනය කිරීමට පටන් ගත්හ.

මේ අවස්ථාවේදී මැති සබය එකම ගාලගෝට්ටියක් බවට පත්ව තිබුණේ දෙපාර්ශ්වයෙන්ම සටන් පාඨ කියමින් කෑගසමින් එකිනෙකාට චෝදනා එල්ල කරගැන්ම නිසාය.

මේ අවස්ථාවේදී හරින් ප්‍රනාන්දු තමාගේ ළඟ තිබූ සටන් පාඨ දැන්වීම් ටිකත් එළියට ගැන්මට සූදානම් වූයේ ඒවා විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතර බෙදීමටය.

ඒ බව නලින් බණ්ඩාර විසින් විපක්ෂ නායක සජිත් ප්‍රේමදාසගෙන් විමසා සිටියද සජිත්ගෙන් ඊට යහපත් ප්‍රතිචාරයක් ලැබුණේ නැත.

ඉන්පසුව හරින් කළේ මැතිසබය මැද සිට සභාගර්භයට පැමිණීමයි.

ආණ්ඩු පක්ෂයේ ජනතා නියෝජිතයන් සටන්පාඨ පුවරු රැගෙන සිටගෙන විරෝධතාව දැක්වීම තම ජංගම දුරකථනයෙන් රූගත කර ෆේස් බුක් වෙත සජීවීව ලබාදීමට හරින් ප්‍රනාන්දු කටයුතු කළේය.

ඊට ආණ්ඩු පක්ෂයේ ජනතා නියෝජිතයන්ගෙන් දැඩි විරෝධයක් එල්ල වුවද එය නොතකමින් හරින් දිගටම තම ජංගම දුරකථනයෙන් වීඩියෝ කරගෙන ගියේය.

මේ අවස්ථාවේදි සටන් පාඨ පුවරුවක් සමඟ මැතිසබය මැදට පැමිණි ජානක තිස්සකුට්ටිආරච්චි හරින්ගෙන් මෙම වීඩියෝ කිරීම ගැන විමසා සිටියේය.

හරින්ගේ මෙම ක්‍රියාව නවතන ලෙසට තිස්සකුට්ටිආරච්චි කෑගසමින් කථානායක මහින්ද යාපා අබේවර්ධනගෙන් ද ඉල්ලීමක් කළේය.

ඉන් අනතුරුව "මොකක්ද ..... පුතා කියන්නේ" යනුවෙන් හරින් පරුෂ වචනයෙන් බණිමින් කෑගැසුවේය.

"මොකද උඹ කියන්නේ මාත් ඔට්ටුයි" යනුවෙන් ඊට ප්‍රතිචාර දැක්වූයේ ජානක තිස්සකුට්ටිආරච්චිය.

දෙදෙනා එකිනෙකාට ළංවූ අතර එම අවස්ථාවේදී ගැටුම එළිදැක්වීමට මැදිවූයේ මහින්දානන්ද අලුත්ගමගේ අමාත්‍යවරයා සහ දිලිප් වෙදආරච්චි මන්ත්‍රීවරයාය.

ඉන්පසුව දෙපාර්ශ්වයේම තවත් ජනතා නියෝජිතයෝ පැමිණ ගැටුම සමථයකට පත්කිරීමට කටයුතු කළහ.

සමගි ජනබලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පිරිසක් හරින්ව ඇදගෙන යන්නට වූ අතර හරින් "කෑ.....යා, පො..... යා යනුවෙන් මහ හයියෙන් කියමින් කෑගැසිය.

මෙම උණුසුම්කාරී තත්ත්වය නිසා මැතිසබය විනාඩි 10කට කල්තැබීමට කථානායකවරයාට සිදුවිය.

දහවල් දිවා ආහාරය වේලාවේදි ජානක තිස්සකුට්ටිආරච්චි පැමිණියේ පාර්ලිමේන්තු සංකීර්ණයේ බිම් මහලේ තිබෙන මන්ත්‍රීවරුන්ගේ පැලඳුම් කාමරයටය.

එහි සිට ඔහු පිටතට පැමිණෙන විට හරින් ප්‍රනාන්දු ඔහුට ඉදිරියෙන් ගමන් කළේ පාර්ලිමේන්තුවෙන් පිටතට යාම සඳහායි.

හරින් තම උරයේ කළු පැහැති බෑගයක් ද එල්ලාගෙන සිටියේය. ජානක තිස්සකුට්ටිආරච්චි දුටු හරින්ට තරමක් කේන්ති ගියේය. හරින් - තිස්සකුට්ටිආරච්චි සමඟ ඇවිළුනේය.

"උඹ වරෙන් එළියට. මට තියෙනවා උඹත් එක්ක ප්‍රශ්නයක් විසඳගන්න." යනුවෙන් හරින් කීවේය.

"උඹත් එක්ක එළියේ විසඳගන්න දෙයක් නැහැ. මෙතනම විසඳගමු" යනුවෙන් ජානක තිස්සකුට්ටිආරච්චි ප්‍රකාශ කිරීමත් සමගම දෙදෙනාම ළංවූ අතර 'චට' 'පට' හඬින් පාරවල් කිහිපයක්ම දෙදෙනා අතර හුවමාරු විය.

පළාත් සභා ඡන්දය ඉක්මන් කරන්න ප්‍රසන්නගෙන් ඉල්ලීමක්

යළිත් දෙදෙනා අතර ගැටුම පටන්ගත් අතර එය වැළැක්වීමට එම ස්ථානයේ සිටි පොලිස් නිලධාරීහු සහ මන්ත්‍රීවරු දැඩි උත්සාහයක් ගත්හ. ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන්, මධුර විතානගේ, කාවින්ද ජයවර්ධන ඇතුළු පිරිසක් මෙම ගැටුම සමතයකට පත්කිරීමට දැඩි උත්සාහයක් ගත්හ.

පිරිසක් තිස්සකුට්ටිආරච්චි රැගෙන පාර්ලිමේන්තුව ඇතුළට යන්න වූ අතර හරින් පාර්ලිමේන්තුවෙන් එළියට යාමට සූදානම් විය. තිස්සකුට්ටිආරච්චි යළිත් වරක් හරින්ට කියන ලද ප්‍රකාශයකට හරින්ට කේන්ති ගොස් යළිත් තිස්සකුට්ටිආරච්චි දෙසට දිවගියේ පහර දීමටය. නමුත් පිරිස සිටි නිසා එය ව්‍යර්ථ විය. ඉන්පසුව කෑගසා, පො..... යා කියමින් කෑමොර දෙමින් හරින් ප්‍රනාන්දු පාර්ලිමේන්තුවෙන් පිටතට ගියේය.

ඉකුත් සඳුදා හවස අගමැති මහින්ද රාජපක්ෂයන්ගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායම් රැස්වීම අරලියගහ මන්දිරයේ දී පැවැත්විණි. එහිදී පළමුව සාකච්ඡා වූයේ පාර්ලිමේන්තුවේ දෛනික කටයුතු සම්බන්ධයෙනි. පසුව පළාත් සභා මැතිවරණය සම්බන්ධයෙන් සාකච්ඡා විය. ඒ සම්බන්ධයෙන් අදහස් දක්වමින් පාර්ලිමේන්තු මන්ත්‍රී මිලාන් ජයතිලක "පළාත් සභා මැතිවරණය ඉක්මනින් පැවැත්වීමට කටයුතු කරන්න ඕනේ. නමුත්, දැනට තිබෙන ක්‍රමයට වඩා යෝජනා වෙලා තිබෙන 70% - 30% ක්‍රමයත්, එක කොට්ඨාසයකට අපේක්ෂකයන් තුන්දෙනෙක් දැමීමේ ක්‍රමය වඩා සුදුසුයි" කියලා යෝජනා කරනවා.

"ඒ කාරණය මම ස්ථිර කරනවා. ඒ වගේම පළාත් සභා මැතිවරණය හැකි ඉක්මනින් පවත්වන්නත් ඕනේ" පාර්ලිමේන්තු මන්ත්‍රී සම්පත් අතුකෝරාල ද සඳහන් කළේය.

වරාය නගරය ගැන දැනුම්වත් කරන්න රජය පෙරමුණ ගනී

"මේ කාරණය මමත් අනුමත කරනවා අගමැතිතුමනි, මේ වෙලාවේ විරුද්ධ පක්ෂය ආණ්ඩුවට එරෙහිව චෝදනා රැසක් ඉදිරිපත් කරමින් තිබෙනවා. ඒ වුණත් අපි මැතිවරණ කල් දැමීමට විරුද්ධව පෙනී සිටිය කණ්ඩායමක් විදියට මැතිවරණය ඉක්මනින් පවත්වන්න ඕන" යි ප්‍රසන්න රණතුංග අමාත්‍යවරයා පැවසීය.

අමාත්‍යවරුන්ගේ අදහස් දැක්වීමට සාවධානව ඇහුම්කන් දුන් අග්‍රාමාත්‍යවරයා "ඔයාලා කියන කතාව සම්පූර්ණයෙන් ඇත්ත. මැතිවරණ කල් දාන්න හොඳ නැහැ. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් ගෙනයන ආණ්ඩුවක් විදිහට පුළුවන් ඉක්මනට මැතිවරණය පවත්වන්න ඕනෙ.

එක පාර්ශ්වයක් මේ වෙලාවේ පළාත් සභා මැතිවරණය පැවැත්වීම අනවශ්‍ය කාරණයක් කියලා කියනවා. හැම පාර්ශ්වයකගේම අදහස් වලට කන්දීලා සුදුසු පියවර ඉක්මනින් ගන්න එක තමයි අපි කරන්න ඕනේ." අග්‍රාමාත්‍යවරයා සඳහන් කළේය.

පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති කොළඹ වරාය නගර ආර්ථික කලාප කමිෂන් සභා පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ඉකුත් සතිය පුරා විවිධ චෝදනා රැසක් එල්ල විණි. විරුද්ධ පක්ෂයෙන් මෙන්ම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් පවා පනත් කෙටුම්පත සම්බන්ධව සෘණාත්මක අදහස් දැක්වීම පිළිබඳව සමාජයේ කතිකාවතක් ඇති වෙමින් තිබිණි. මෙම පනත් කෙටුම්පත රටේ ආර්ථිකය නගා සිටුවීම සම්බන්ධයෙන් කෙතරම් වැදගත්ද යන්න පිළිබඳ ජනතාව දැනුම්වත් කිරීමට ජනාධිපතිවරයා තීරණය කර තිබේ. එහි පළමු පියවර වශයෙන් මහා සංඝරත්නය ප්‍රමුඛ ආගමික නායකත්වය දැනුම්වත් කිරීමේ වැඩපිළිවෙළ ඉකුත් සතියේ ආරම්භ විය.

වරාය නගරයේ නීති කෙටුම්පත් ගැන රනිල්ගේ අවධානය

අලුත් අවුරුදු නිවාඩුවට කොළඹින් පිටතට ගොස් සිටියත් එක්සත් ජාතික පක්ෂ නායකයාට එය නිවාඩුවක් නොවූවේ වරාය නගර පනත් කෙටුම්පතට අදාළව ගැනීමට නියමිත නීති කටයුතු පිළිබඳව වෙහෙසීමට වූ නිසාය. කොළඹ පැමිණි විගස නායකයා නැවත සිය නීතිඥයන් හමුවී ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ මතු කළ යුතු නීති තර්ක ගැන සාකච්ඡා කළේය.

එක්සත් ජාතික පක්ෂ පාලන කාලයේදී සකස් කළ පනත් කෙටුම්පත ගැන ද පෙන්වා දෙමින් ඔහු කරුණු දීර්ඝ ලෙස විස්තර කළේය. එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් පෙත්සම් ගොනු කරනු ලැබුවේ නීතිඥ ඉරාජ් ද සිල්වා ය. ඔහු ජනාධිපති නීතිඥ රොමේෂ් ද සිල්වාගේ පුතණුවන්ය. එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් නීතිඥ ඉරාජ් ද සිල්වා පෙනී සිටියදී ඔහුගේ පියා වන ජනාධිපති නීතිඥ රොමේෂ් ද සිල්වා පෙනී සිටියේ ජනාධිපති ලේකම් පී.බී. ජයසුන්දර වෙනුවෙනි.

එකම නඩුවක පිය පුතු දෙපළ ප්‍රතිවාදීන් දෙදෙනෙකු වී සිටීම දෛවෝපගත සිද්ධියකි. නීතිඥවරු හමුවී වරාය නගර පනත සම්බන්ධයෙන් සාකච්ඡා කළ නායකයා අඟහරුවාදා සිරිකොතට ගියේ සුපුරුදු පරිදි පැවැත්වෙන පක්ෂ නිලධාරි මණ්ඩල හමුවටය. එහිදී මැයි දිනය සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් සාකච්ඡා කෙරුණි. ඊට නියෝජ්‍ය නායක රුවන්, සභාපති වජිර, මහලේකම් රංගේ, උපනායක අකිල, සමන් රත්නප්‍රිය සහ ෂමල් සෙනෙරත් ඇතුළු මැයි දින කමිටුවේ සාමාජිකයන් සහභාගීව සිටියහ.

අවුරුදු සමයේදී විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස හා ඔහුගේ බිරිඳ ජලනි ප්‍රේමදාස සමාජ සේවා කටයුතු කිහිපයකටම සහාය වූහ.

හම්බන්තොට, කතරගම, තිස්සමහාරාම ඇතුළු ප්‍රදේශ කිහිපයකම සමාජ සේවා කටයුතු මෙම යුවළගේ ප්‍රධානත්වයෙන් සිදුවිය.

මේ අතර යාල ජාතික උද්‍යානයේ සුබසාධක සමිතියට පුටු බෙදාදීම ද සිදුවූයේ සජිත් - ජලනි අතිනි.

මොන බලතල තිබුණත් පාර්ලිමේන්තුවේ ඉන්න කළුපටි සූරයා නිහඬයි

දිනේෂ් - කිරිඇල්ල පක්ෂ නායක රැස්වීම ගැන මත දෙකක

වරාය නගරයේ නඩුවට දෙපැත්තෙන් පිය පුතු දෙපළක්

විදුලිබල සේවකයන්ට එරෙහිව

පාර මැද්දේ මාර යුද්දේ

පවුල් 402කට පැය 24ක් තිස්සේ විදුලිය විසන්ධි වෙලා

පාසල් සිසු සිසුවියන් 1200කගේ ඔන්ලයින් අධ්‍යාපනය කඩා වැටේ

● අසේල කුරුළුවංශ

මහනුවර ඉහළ කටුකැලේ ග්‍රාම සේවා වසමට අයත් ටැංකිය වත්ත ග්‍රාමයේ නිවසක වහලය මතට විදුලි කණුවක් කඩා වැටුණේ පසුගිය 19 දින පස්වරුවේය. පෙර පිනකට මෙන් නිවැසියන් කිසිවකුටත් මෙම සිදුවීමෙන් අනතුරක් සිදු නොවූවත් මෙය මුල්කර ගනිමින් ඇතිවූ ගැටුමේ උණුසුම තවමත් පහව ගොස් නොමැත. කඩා වැටුණු කණුව නිවෙස් වහලය මතින් ඉවත්කර වෙනත් ස්ථානයක සිටුවීමට ගිය විදුලි බල මණ්ඩලයේ විදුලි අධිකාරිවරුන් දෙදෙනෙකුට හා නඩත්තු අංශයේ සේවකයකුට පිරිසක් පහරදීමේ ප්‍රතිඵලය වූයේ බහිරවකන්ද, පුෂ්පදාන මාවත හා කටුකැලේ ප්‍රදේශ විදුලිය නොමැතිව අඳුරේ ගිලීමය. මෙම ප්‍රදේශය තුළ බහිරවකන්ද ශ්‍රී මහ බෝධි විහාරය,මහනුවර දිසාපති නිල නිවස,මධ්‍යම පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිල නිවස පිහිටා තිබීම නිසා බිඳ වැටී තිබුණු විදුලි සැපයුම යළි ලබා ගැනීම සඳහා අධිකරණ නියෝගයක් ලබා ගැනීමටද පොලීසියට සිදුවිය.

පහරදීම සිදු කළ පුද්ගලයන් කඩිනමින් අත්අඩංගුවට ගන්නා ලෙස බල කරමින් විදුලි සේවකයන් මහනුවර පොලීසිය ඉදිරිපිට උද්ඝෝෂණයක නිරත වෙත්දී අනෙක් පසින් බහිවරකන්ද, කටුකැලේ හා පුෂ්පදාන මාවතේ පදිංචි ජනතාව පොලීසියට බලපෑම් කළේ විදුලි සේවකයන්ගේ හිතුවක්කාරී ක්‍රියාව නතර කර කඩිනමින් තමන්ට විදුලි සැපයුම ලබා දෙන ලෙස ඉල්ලීමෙනි. මේ නිසා සිද්ධියට සම්බන්ධ සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට මහනුවර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී චමිල් රත්නායක පොලිස් කණ්ඩායම් තුනක් යෙදවූයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ උපදෙස් අනුවය. ඒ වනවිටත් සැකකරුවන් ප්‍රදේශයෙන් පලාගොස් සිටි නිසා ඔවුන් ඉන්නා ඉසව්ව සොයා ගැනීමට ජංගම දුරකතන සංඥා ඔස්සේ පරීක්ෂණ පැවැත්වීමට පොලීසිය පියවර ගෙන තිබිණි.කෙසේ වුවත් සිද්ධියෙන් පැය 24 කට පසු සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට පොලීසිය සමත් විය.ඒ අතර හතළිස් හය හැවිරිදි පුද්ගලයකුද ඔහුගේ පහළොස් වියැති පුතා හා බෑණාද වූහ.

මහනුවර ඉහළ තනතුරු හොබවන රජයේ නිලධාරීන් රැසක් ජීවත්වන ප්‍රදේශ කිහිපයක් පැය 24 කට වැඩි කාලයක් අඳුරේ ගිල්වන්නට සමත්වූ මෙම සිදුවීමේ සුලමුල සොයා යෑමේදී අප මුලින්ම කතා කළේ මහනුවර ටැංකිය වත්තේ පදිංචි තනූෂා නාගලිංගම්ටය. ඇය විදුලි කණුව කඩා වැටුණු නිවසේ හිමිකාරියයි.

'සිද්ධිය වෙන වෙලාවේ මම විතරයි ගෙදර හිටියේ. මේ කඩා වැටුණු ලයිට් කණුව එතන හිටවලා මාස දෙකක්වත් නැහැ. මම ගෙදරින් එළියට ඇවිත් විනාඩි දෙකක් ගියේ නැහැ කණුව අපේ ගේ උඩට වැටුණා. වහලේ තහඩුවත් කඩාගෙන පහළට වැටුණා. ඇඳත් කැඩිලා තියෙන්නේ. මේ වගේ තවත් කණුවක් එහා පැත්තේ තියෙනවා. මණ්ඩලේ අය බාගෙට මේවා හිටවලා යනවා. ටිකක් ගැඹුරට වළක් හාරලා හිටවනවා නම් මෙහෙම ගෙවල් වලට කණු කඩාගෙන වැටෙන්නේ නැහැ. කොන්ත්‍රාත් දෙනවා නම් ඒ අය හරියට වැඩේ කරනවාද කියලා විදුලි බල මණ්ඩලය හොයා බලන්න ඕන. මේ සිද්ධියෙන් පස්සේ ලයිට් කණුව වෙන තැනක හිටවන්න ගිය වෙලාවේ තමයි ගැටුමක් ඇති වෙලා තියෙන්නේ. ඒකට අපේ කවුරුවත් සම්බන්ධ වුණේ නැහැ'

කඩා වැටුණු විදුලි කණුව ඉවත්කර නව කණුවක් ස්ථාපිත කිරීමට ගිය අවස්ථාවේ පහර කෑමට ලක්වූ ගාමිණී ජයලාල් අතුකෝරාළ වෘත්තියෙන් විදුලි අධිකාරිවරයෙකි. තාක්ෂණ ඉංජිනේරු හා අධිකාරි සංගමයේ ප්‍රධාන ලේකම්වරයාද වන ඔහු සිද්ධිය පිළිබඳව මෙසේ අදහස් දැක්වූවේය.

'මම බාස්ලා දෙන්නෙකුත් එක්ක දොඩම්වල ප්‍රදේශයේ රාජකාරි කටයුත්තකට ගොස් ආපහු වාහනයෙන් එමින් සිටියදී මිනිස්සු වගයක් පාරේ රැස්වෙලා ඉන්නවා දැක්කා. විදුලි බල මණ්ඩලයේ වාහනය දැක්කම කට්ටිය කිව්වා විදුලි කණුවක් වහලයක් උඩට වැටිලා කියලා. මම අහම්බයෙන් ඒ ස්ථානයට යනවිට අපේ නඩත්තු අංශයටවත් සිද්ධිය වාර්තා වෙලා තිබුණේ නැහැ. මම බාස්ලා දෙන්නගෙන් එක්කෙනෙක්ව යැව්වා කණුව ඉවත් කරන්න අවශ්‍ය ආයුධ ගේන්න කියලා. නඩත්තු අංශය බාර විදුලි අධිකාරී ඉන්දිකටත් දුරතතන ඇමැතුමක් ලබාදී එතන්ට ගෙන්වා ගත්තා. විදුලි කණුවක් මීටර 8.3 ක් උසයි. ඒ උසින් පහෙන් එකක් වලන්න ඕන. ඒ කියන්නේ ආසන්න වශයෙන් අඩි හතරක් විතර. කඩා වැටුණු කණුවත් ඒ විදිහට වළලලා තිබුණේ. මොකද මේවා වැළලුවට පස්සේ අපි කම්බි අදින්න ඒක උඩට ඉණිමගක් හේත්තු කරලා නගිනවා. අඩියක් දෙකක් යටකරලා අපිට ඒක උඩට නගින්න පුළුවන්ද? මහනුවරට පසුගිය දිනවල අධික වර්ෂාවත් ඇද හැළුණා. මේ වැස්සට පස් සෝදගෙන ගිහින් ගමයි කණුව බුරුල් වෙලා තියෙන්නේ. මේ ළඟ ටෙලිෆෝන් කණුවක් තියෙනවා. ඒක හිටවලා තියෙන තැන තමයි මේ ලයිට් කණුව හිටවන්න අපේ නිලධාරීන් ප්ලෑන් කරලා තිබුණේ. නමුත් ඒ අසල නිවසක අය ඒකට විරුද්ධ වෙලා. මොකද ඒ අයගේ වාහනයක් එතන පාක් කරනවලු. ඒ විරෝධතාව සැලකිල්ලට අරන් මේ නිලධාරීන් වෙනත් තැනක කණුව හිටවලා. ඒක තමයි කඩා වැටිලා තියෙන්නේ. නැවත අද ටෙලිෆෝන් කණුව හිටවලා තියෙන තැන කණුව හිටවන්න ගියාම තමයි කිහිප දෙනෙක් ඇවිත් අපට පහර දුන්නේ.ඒ වෙලාවේ පොලිස් රථවාහන අංශයේ නිලධාරීන් දෙන්නෙක් එතන්ට ආවා. ඒ අය බලාගෙන හිටියා. අපි කිව්වා පහරදීපු අය අත්අඩංගුවට ගන්න කියලා. පොලීසියට ගිහින් පැමිණිල්ලක් දාන්න කියලා ඒ නිලධාරීන් කිව්වා. ඒ නිසා තමයි මේ සිද්ධිය මෙතරම් දුරදිග ගියේ.

වමේ සිට - ධම්මානන්ද නාහිමි, මහනුවර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී චමිල් රත්නායක, තනූෂා නාගලිංගම් සහ ජයලාල්

අදාළ සිදුවීමෙන් පසු ප්‍රදේශ කිහිපයකට ම යළි විදුලිය ලබා නොදීම සම්බන්ධව ජනතාවගේ දෝෂාරෝපණය විදුලි බල මණ්ඩලයට එල්ල විය. මේ පිළිබඳව ජයලාල් මෙසේ කීවේය. විදුලි කණුව කඩා වැටිලා තියෙත්දී අපි මුලින්ම කරන්නේ අනතුරක් වීම වළක්වා ගැනීමට ප්‍රදේශයේ විදුලිය විසන්ධි කිරීමයි. ඒ අනුව අදාළ ට්‍රාන්ෆෝමරයේ බ්රෙකර් එක ඔෆ් කළා. ඉතා ඉක්මනින් යළි සම්බන්ධතාව දීමේ බලාපොරොත්තුව ඇතිව මේක කළේ. නමුත් නොසිතූ ලෙස සිදුකළ පහර දීම නිසා ක්ෂේත්‍ර නිලධාරීන් ඒ ප්‍රදේශයේ වැඩට යන්න අකමැති වුණා. අපි කිව්වේ සැකකරුවන් අත්අඩංගුවට අරගෙන අපිට වැඩ කරන්න පොලිස් ආරක්ෂාව දෙන්න කියලා. අපි හිතාමතා ජනතාව පීඩාවට පත්කළේ නැහැ. ඒ මොහොත් ඇතිවූ තත්ත්වය මත සිදුවූ දෙයක් ඒක.

මහනුවර බහිරවකන්ද ශ්‍රී මහා බෝධි විහාරාධිපති, ශාස්ත්‍රපති යටවත්තේ ධම්මානන්ද නාහිමියෝ මෙසේ පැවසූහ. කොවිඩ් තත්ත්වයත් එක්ක අද ළමුන් බොහෝ පිරිසක් අධ්‍යාපන කටයුතු වල නිරත වෙන්නේ ඔන් ලයින් ක්‍රමයට. සෑම ගෙදරකම වගේ උයන්නේ පිහන්නේ, රෙදි සෝදගන්නේ විදුලි බලයෙන්. අලුත් අවුරුද්දට ගෙනාපු ගොඩක් ආහාර ද්‍රව්‍ය ශීතරකරණ වල ගබඩා කරලා තියෙනවා. මේ නිසා යම් දෙතුන් දෙනෙක් කළ සිදුවීමක් මුල්කරගෙන විශාල පිරිසක් පීඩාවට පත්කිරීම අනුමත කරන්න බැහැ. අනිත් පැත්තෙන් ඕනෑම නිලධාරියකුට බාධාවකින් තොරව නිදහසේ රාජකාරිය කරන්න හැකියාව තියෙන්න ඕන. මිනිස්සු අමනුෂ්‍යයෝ වගේ හැසිරෙන්න ගියාම නැති ප්‍රශ්න ඇති වෙනවා. සාකච්ඡා කරලා ප්‍රශ්න විසඳගන්න ඕන තරම් හැකියාව තියෙත්දී ගහ මරා ගන්න ගියාම නැති ප්‍රශ්න ඇති වෙනවා. දැන් මේ සිද්ධියට අවුරුදු 15 ක දරුවකුත් පැටලිලා. ඉක්මන් කෝපය හොඳ නැහැ.

මහනුවර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී චමිල් රත්නායක මහතා මේ සම්බන්ධව දැක්වූයේ මෙවන් අදහසකි. පහරදීම සිදුවෙලා පැය 24 ක් වගේ කාලයකදී සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට අපට හැකියාව ලැබුණා. විදුලි සේවකයන් මෙම පහරදීමට සම්බන්ධ අය අත්අඩංගුවට ගන්නා ලෙස බලකරමින් විරෝධයක් පළ කළා. අපි කිව්වේ ජනතාව පීඩාවට පත් නොකර විදුලිය විසන්ධි වී ඇති ප්‍රදේශ වලට විදුලිය ලබා දෙන්න කියලයි. අවසානයේ පොලීසිය මේ සම්බන්ධව අධිකරණ නියෝගයක් ලබා ගත්තා. අයුතු ජන රාශිය හා සාපරාධී පහරදීම යන චෝදනා යටතේ සැකකරුවන්ට එරෙහිව නඩු පවරන්න පොලීසිය පියවර ගත්තා. ක්ෂේත්‍ර රාජකාරිවලට යන විදුලි සේවකයන්ට පොලිස් ආරක්ෂාව අවශ්‍යය නම් අපි ඒක ලබා දෙන්න සූදානම්. අනාරක්ෂිත තත්ත්වයේ තිබෙන විදුලි කණු නිසා තමන්ගේ ජීවිත වලට තර්ජනයක් තිබෙන බවට ජනතාව චෝදනා කරනවා.මේ ගැන අපි අධිකරණයට කරුණු වාර්තා කළා. ඒ අනුව එවැනි විදුලි කණු ඇත්නම් ඒවා ගැන සොයා බලා අවශ්‍ය පියවර ගන්නා ලෙස මණ්ඩලයට දැනුම් දී තිබෙනවා.

සිද්ධිය සම්බන්ධයෙන් පොලීසිය විසින් අත්අඩංගුවට ගනු ලැබූ තිදෙනා අතරින් පාසැල් සිසුවා රුපියල් 15000.00 ක මුදල් හා රුපියල් ලක්ෂ බැගින් වූ ශරීර ඇප මත මුදා හරිනු ලැබූ මහනුවර මහේස්ත්‍රාත්වරයා සෙසු සැකකරුවන් දෙදෙනා මේ මස 28 දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කරනු ලැබීය.

කානුවක් පිළිසකර කරන්න කෙස්වලු පටලවා ගත් මහරගම නාගරික මන්ත්‍රීවරියෝ

● අමිල මලවිසූරිය

මහරගම නගර සභාව, පසුගිය කාලයේ බොහෝ අවස්ථාවලදී කතාබහට ලක්වූ නගර සභාවකි. විශේෂයෙන්ම 2018 වසරේ පැවැති පළාත් පාලන මැතිවරණයේදී එහි පාලක පක්ෂය පත්වීමේ සිටම කරළියට ආ මහරගම නගර සභාව පිළිබඳව මෑතකදී ද දැඩි සේ කතාබහක් වූයේ මහරගම නගර මධ්‍යයේ වූ වෙළෙඳසල් කීපයක් ඉවත් කිරීමේදී වූ නොසන්සුන්තාවක් නිසාවෙනි. මෙවර අලුත් අවුරුදු උදාවෙන් පසුව නැවතත් මහරගම නගර සභාව පිළිබඳව කතාබහක් කරළියට එන්නෙ එහි නාගරික මන්ත්‍රීවරියන් දෙපළකගේ කෙස්වලු පටලවා ගැනීමේ හුටපටයක් හේතුවෙනි.

ඒ, පාලක පක්ෂයේ මන්ත්‍රිනි 35 හැවිරිදි පස්මස් ගැබිනියක වන රසිකා ගුණසිංහ සහ එක්සත් ජාතික පක්ෂයේ නාගරික මන්ත්‍රීවරියක වන 47 හැවිරිදි ඉනෝජා මුණසිංහ අතර වූ ගැටුමකි. එම ගැටුම නිසාවෙන් යැයි සඳහන් කරමින් රසිකා මන්ත්‍රීවරිය ජයවර්ධනපුර රෝහලට ඇතුළත්ව ප්‍රතිකාර ගත්තාය. ඇයට බැණ වැදී තර්ජනය කරමින් පහර දුන්නා යැයි මහරගම පොලිසියට කළ පැමිණිල්ල අනුව ඉනෝජා මන්ත්‍රීවරිය පසුගිය 19 වැනිදා පෙරවරුවේ මහරගම පොලිසියට කැඳවනු ලැබුවාය.

ඒ අනුව මහරගම පොලිසියේ අත්අඩංගුවට පත් ඉනෝජා එදිනම නුගේගොඩ, ගංගොඩවිල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසුව ගංගොඩවිල මහේස්ත්‍රාත් ප්‍රසන්න අල්විස් විසින් තරයේ අවවාද කොට රුපියල් ලක්ෂ දෙකක ශරීර ඇප දෙකක් මත මුදා හැරීමට නියෝග කළේය. ඊට අමතරව නැවතත් අධිකරණ කටයුතු සඳහා ලබන ජූලි මස දහනව වැනි දින අධිකරණයට කැඳවන ලෙසත් මහේස්ත්‍රාත්වරයා නියෝග කෙරිණි.

එලෙස රසිකා මන්ත්‍රීවරිය සහ ඉනෝජා මන්ත්‍රීවරිය අතර ගැටුමේ ආරම්භය සිදුවී ඇත්තෙ පසුගිය 15 වැනිදායි. එදින මහරගම නගර සභාවේ උප නගරාධිපතිවරයකුව සිටි කරෝලිස් රාජපක්ෂ මියයෑමෙන් පසු ඔහුගේ දේහය මහරගම නගර සභා ගොඩනැඟිල්ලට ගෙනැවිත් තිබුණේය. ඒ, මන්ත්‍රීවරුන්ට සහ එහි සේවකයන්ට අවසන් ගෞරව දක්වමින් උත්සව සභාවෙන් අනතුරුව දේහය ගොඩිගමුව භූමදානයට රැගෙන යෑමටයි.

එම අවමංගල උත්සවයට රසිකා ගුණසිංහ සහ ඉනෝජා මුණසිංහ මන්ත්‍රීවරියන් ඇතුළු බොහෝ මන්ත්‍රීවරු මෙන්ම නගර සභා සේවකයෝද එක්ව සිටියහ. ඒ අතර ඒ අවමංගල උත්සවයට සහභාගිවූ රසිකා සහ ඉනෝකා අතර බහින්බස්වීමක් සිදුවී තිබුණේ මහරගම නගර සභාවට අයත් පොල්වත්ත ග්‍රාම නිලධාරි වසමේ, ග්‍රාම සංවර්ධන පාර, 1 වන පටුමගේ ජලය බැස යාමට තිබෙන කානුවක් කලෙක සිටම වල්බිහි වී අවහිර වීම නිසාවෙන් සිදුකරන සංවර්ධන කටයුත්තක් නිසාවෙනි.

එම අවමංගල උත්සව සභාව අවසන පිරිස නගර සභා ගොඩනැඟිල්ලේ ඉහළ මහලේ සිට තරජ්පු පෙළ බසිමින් එන අතර දෙදෙනා අතර බහින්බස් වීම උත්සන්න විණි. කෙසේ හෝ ඒ අවමංගල උත්සව සභාවෙන් අනතුරුව නිවෙසට ගිය රසිකා මන්ත්‍රීවරිය රාත්‍රියේ ජයවර්ධනපුර රෝහලට ඇතුළත් වූවාය. ඒ නගර සභා ගොඩනැඟිල්ලේ පඩිපෙළ බසිමින් සිටියදී ඉනෝජා මන්ත්‍රීවරිය පහර දී තල්ලු කළ බවත් එම නිසා උදරයේ වේදනාවක් හටගත් බව සඳහන් කරමිනි. එම පහරදීම පිළිබඳව ජයවර්ධනපුර රෝහල් පොලිසියට ලැබුණු පැමිණිල්ල අනතුරුව යොමුකර තිබුණේ එම සිදුවීමට අදාළ පොලිස් වසම වන මහරගම පොලිසියටයි.

ඒ අනුව මහරගම පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක එච්. එච්. ජනකාන්තගේ මෙහෙයවීමෙන් එහි විවිධ පැමිණිලි අංශයේ ස්ථානාධිපති උපපොලිස් පරීක්ෂක පියරත්න ඇතුළු කණ්ඩායමක් විමර්ශනයක් ආරම්භ කළහ. එහිදී විමර්ශන නිලධාරිහු පසුදින එනම් 16 වැනිදා මහරගම නගර සභාවටද ගොස් විමර්ශන සිදුකරද්දී දැනගන්නට ලැබී ඇත්තෙ පහර දීමේ චෝදනාව එල්ල වූ ඉනෝජා මන්ත්‍රීවරිය සිය පවුලේ අයවලුන් සමඟ විනෝද චාරිකාවක් සඳහා ගොස් ඇති බවයි.

එදින සවස ඇයව ඇමැතු මහරගම පොලිසිය ඉනෝජාට දන්වා ඇත්තේ හැකි ඉක්මනින් මහරගම පොලිසියට පැමිණෙන ලෙසටයි. ඒ අනුව විනෝද චාරිකාව නිම කරමින් පැමිණි ඉනෝජා 19 වැනිදා පෙරවරුවේ මහරගම පොලිසියට පැමිණීමෙන් පසු නුගේගොඩ අධිකරණයට ඉදිරිපත් කෙරිණි.

කෙසේ හෝ මහරගම නගර සභාවට අයත් මාර්ගයක සංවර්ධන කටයුත්තක් නිසාවෙන් වූ ගැටුම බහින්බස් වීමක් පමණක් බවත් කිසි විටෙක ගැබිනියකට හෝ කිසිවෙකුට තමා පහර නොදෙන බව ඉනෝජා මන්ත්‍රීවරිය මේ පිළිබඳව අප කළ විමසීමකදී පවසන්නට වූවාය. ඇය වැඩිදුරටත් පවසන්නෙ,

"ඇත්තටම මං කිසිම පහරදීමක් කළේ නෑ. විශේෂයෙන්ම ගැබිනි කාන්තාවකට පහර දීමට තරම් මම අමානුෂික නෑ. මහරගම නගර සභාවට අයත් පොල්වත්ත කොට්ඨාසයේ කානුවක ප්‍රශ්නයක් වුණේ. ඒ කානුව අවහිරතාව ඉවත් කරලා දෙන්න කියලා මේ මස 05 වැනිදා පොල්වත්ත ජනතාව මගෙන් ඉල්ලීමක් කළා. ඒ ජනයා ඔය මන්ත්‍රීවරියටත් වසර දෙක තුනක් තිස්සෙ ඒ දේ කියලා තියෙනවා. ඒත් ඒ දේ වෙලා නෑ. පස්සෙ මට ලැබුණු ඒ පැමිණිල්ල මම නගරාධිපතිතුමාට ඉදිරිපත් කළා.

වමේ සිට - පහරකෑමට ලක් වූවායැයි කියන රසිකා ගුණසිංහ සහ පහරදුන් චෝදනාවට ලක්වූ ඉනෝජා මුණසිංහ මන්ත්‍රීවරියන්

නගරාධිපතිතුමා පහුවදාම නගර සභාවේ ටීඕ මහත්තයා සහ ඉංජිනේරුවා සමඟ ඒ ස්ථානයට ගොස් සොයා බැලුවා. එදා ම අපි ඇස්තමේන්තුවකුත් හැදුවා. නුදුරේදීම නගර සභාවේ මහජන මුදල්වලින් ඒ කානුව පිළිසකර කරන්නයි නියමිත. ඔනෙ කෙනකුට බලාගන්න පුළුවන් ඒ කානුව වල්බිහිවෙලා විශාල ගස් පවා පැළවෙලා තිබුණේ. ඊට අමතරව ප්‍රදේශවාසීන් පවසන්නෙ ඒ ස්ථානය ඩෙංගු මදුරුවන්ගෙ රජදහනක් කියලා.

එහෙම තියෙද්දියි පසුගිය 15 වැනිදා හිටපු උපනගරාධිපතිවරයාගේ දේහය නගර සභාවට රැගෙන ආවේ. ඒ මොහොතේ එහි අවමංගල්‍ය සභාව අවසන් වෙලා සියලු දෙනා තරජ්පු පෙළ බසිමින් හිටියේ. වෙලාව පහට විතර ඇති. නගර සභාවේ මන්ත්‍රීවරු හත්අට දෙනෙක් වගේම සේවකයෝත් විස්සක් තිහක් විතර හිටියා.

ඒ මොහොතේ ඔය කානුව පිළිසකර කිරීමේ සංවර්ධන කටයුත්ත නිසා රසිකා මන්ත්‍රීවරිය මගේ වැඩවලට ඇඟිලි ගහන්න එපා කියලා මට බැන්නා... මං ඇහුවා, ඔයාගේ වැඩක් වෙන්නෙ කොහොමද? මහජන පැමිණිල්ලටනේ අපි වැඩ කරන්නෙ කියා. ඒ වගේම මං කිව්වා, ඔයාට දරුවෙක් හම්බ වෙන්න ඉන්න කෙනෙක්නෙ. ඔයාගේ පාඩුවේ ඔයා ඉන්න මං වැඩේ කරන්නම් කියලා.

නෑ... ඒක කොහොමත් කරන්න දෙන්නෙ නෑ. පිනට පාත්වෙච්ච පින් මන්ත්‍රීවරු කියමින් මට බැන්නා... තව වැඩේ කළොත් බලාගන්නම් කියමින් ගියේ... මම නගරාධිපතිතුමා ඇතුළු පිරිස සමඟ කනත්තට ගිහින් ගෙදර ගියා. ඕක තමයි වුණේ... පහුවදා පවුලේ අය සමඟ මම විනෝද චාරිකාවක් යන්න යොදාගෙන තිබුණේ. අපි ඒ ගමන 16 වැනිදා පාන්දර පහට විතර ගියා.

ඒ ගමන ගිහින් නුවර ඉද්දි තමයි දවල් 12.30ට විතර මන්ත්‍රීවරයෙක් මට කතා කරලා කීවේ මම පහර දුන්නා යැයි කියා ඒ මන්ත්‍රීවරිය රෝහල්ගත වෙලා... පොලිසිය මාව සොයාගෙන නගර සභාවට පැමිණියා කියා. මට එදා සවස 4.30ට විතර මහරගම පොලිසියෙන් කතා කළා. මං කිව්වා, මම ට්‍රිප් එකක් ගිහින් ඉන්නෙ. සඳුදා පොලිසියට එන්නම්... ඉතින් මම සඳුදා උදේ 8.30 වෙනකොට පොලිසියට ගියා. මට කියන්න තියෙන්නෙ ඔය කතාව තමයි... ඕක තමයි ඇත්ත. මං කරන්න ගියේ ජනතාවට සේවයක්... ඒ වගේම මං කිසි විටෙකත් ඒ මන්ත්‍රීවරියට පහර දුන්නෙ නෑ... ඒක එතැන හිටිය ඔන කෙනෙක්ගෙන් අහන්න..."

ඇය එසේ සඳහන් කරද්දී රසිකා මන්ත්‍රීවරියගේ පාර්ශ්වයෙන් සිදුවූයේ කුමක්ද යන්න නිශ්චිත ලෙසටම දැනගැනීමේ අටියෙන් පහර කෑමකට ලක්වූවායැයි සඳහන් කරමින් රෝහල්ගතවූ රසිකා මන්ත්‍රීවරියගේ ජංගම දුරකථනයට ඇමැතුවත් ඇය ඊට ප්‍රතිචාරයක් නොදැක්වූවාය.

එසේම මෙකී මන්ත්‍රීවරියන් දෙදෙනාගේ ගැටුමට මූල්වූ පොල්වත්ත ග්‍රාම නිලධාරි වසමේ කානු පද්ධතිය අවහිර වීම නිසාවෙන් පීඩාවට පත්ව සිටින ජනයාගෙන්ද අප විමසීමක් කළේය. එහිදී වසර ගණනාවක් පුරා ඉන් පීඩා විඳින ගම්වැසියෙක් වන පාලිත වික්‍රමසිංහ අපට කීවේ මෙවන් කතාවකි.

"මෙහෙමයි, පොල්වත්ත ගමේ වතුර කානුවක් තියෙනවා. දැන් ඒ කානුවේ අඩි 75ක් පමණ වල්බිහිවෙලා විශාල ගසුත් වැවිලා. දැඩි සේ ඩෙංගු මදුරුවෝ බෝවන ස්ථානයක් වෙලා. වර්ෂාව කාලෙට වතුර බහින්නෙ නෑ... ගෙවලුත් යටවෙනවා. එය ප්‍රදේශයට විශාල පරිසර ප්‍රශ්නයක් වෙලා තියෙන ස්ථානයක්. ඒ ප්‍රශ්නය අපේ අවට බොහෝ දෙනෙක් වසර දෙක තුනක් තිස්සෙ රසිකා මන්ත්‍රීතුමියට කිව්වා. කානුව පිළිසකර කරලා දෙන්න කියලා. නමුත් එතුමියගෙන් එය සිදුවුණේ නෑ.

ගැටුමට මුල් වූ පන්නිපිටිය පොල්වත්ත ප්‍රදේශයේ පිහිටි කුණු කානුව

පහරකෑමට ලක්වූවා යැයි කී ගැබිනි මන්ත්‍රීවරිය ජ'පුර රෝහලෙන්ද ප්‍රතිකාර ලබලා

පස්සෙ මම ගිහින් ඉනෝජා මන්ත්‍රීතුමියට මේ ප්‍රශ්නෙ කිව්වා. පුළුවන් නම් අපට මේ කානුව පිළිසකර කරලා දෙන්න ලොකු දෙයක් කියලා. මොකද අපට පක්ෂ, පාට බේදයක් නෑ. ඊට පස්සෙ ගමේ තිස්හතළිස් දෙනෙක් අස්සන් කරලා මේ මස පස්වැනිදා ලිපියකුත් බාර දුන්නා. ඒ ඉනෝජා මන්ත්‍රීවරියගේ මැදිහත් වීමෙන් නගරාධිපතිතුමාට. ඇත්තටම අපි ගිහින් කියපු නිසයි එතුමිය මැදිහත් වුණේ. මෙය රණ්ඩු විය යුතු දෙයක් නොවේ. රසිකා මන්ත්‍රීතුමිය කියන්නෙත් අපි හොඳින් දන්න ගමේම කෙනෙක්. මේ ප්‍රශ්න නැතුවට ඇති කරගන්නා ප්‍රශ්න... ඉතින් අපට කියන්න තියෙන්නෙ අපේ ඡන්දයෙන් පත්වන හැමෝම එකතුවෙලා රටට වැඩ කරන්න... එච්චරයි..."

පක්ෂ, පාට බේදයකින් තොරව මතභේද, ගැටුම් දුරලා ජනතාවට සේවය කිරීම සෑම මහජන නියෝජිතයකුගේම පරම යුතුකම මෙන්ම වගකීම බව අපද දිගින් දිගටම පසක් කර සිටින්නෙමු. එසේ නොමැතිව කුඩා දරුවන් මෙන් අඩදබරවල පැටලීම මොනතරම් විහිළුවක් වන්නේ ද?

ඡායාරූප - සමීර අබේසිංහ, නුගේගොඩ සමූහ

පාස්කු ප්‍රහාරයේ කඳුළු

● **සුරේකා නිල්මිණි ඉලංකෝන්**

දිනය 2019 අප්‍රේල් 21 වැනි ඉරිදා ය. ලොව පුරා කිතුනු බැතිමතුන්ට එදින විශේෂ වූයේ ඔවුහු මහත් බැතියෙන් සහ උද්දාමයෙන් සිහිකරන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් නැඟිටීම සමරන පාස්කු ඉරිදාව එදිනට යෙදී තිබීම නිසාය. කිතුනුවන් ඒ දිනය සමරනු ලබන්නේ දින 40කට අධික කාලයක් උපවාසයෙන් සහ දොම්නසින් ගත කළ කාලයට විරාම තබමිනි. එහෙත් වෙනදා මෙන් ඒ දවසේ ප්‍රීතිය සිත් පුරා විඳ ගන්නට 2019 වසරේ උදා වූ පාස්කුවේදී කිතුනුවන්ට පමණක් නොව කිසිදු ශ්‍රී ලාංකිකයකුට හැකිවූයේ නැත. ක්‍රිස්තුස් වහන්සේ මළවුන් පරාද කළ විජයග්‍රහණය සැමරීමට දේවස්ථාන තුළට රැස්වී සිටි බැතිමතුන්ට ලැබුණේ මරණයේ උරුමයයි. මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ සාහසික වියරුවකට ඔවුහු සිය ජීවිතවලින් වන්දි ගෙවූහ.

ඉකුත් අප්‍රේල් 21 වැනිදාට ඒ ත්‍රස්ත ප්‍රහාරය සිදුවී දෙවසරක් සම්පූර්ණ විය. අන්තවාදීන්ගේ ඒ නින්දිත ප්‍රහාරයට වසරක් පිරුණු ඉකුත් වසරේ අප්‍රේල් 21 වැනිදා සුසානයේ නිදන තම ආදරණීයන් වෙත ගොස් ඒ වේදනාව මඳක් හෝ සමනය කරගන්නට පවා අවකාශ නොවූයේ ඒ වන විට කොවිඩ් වසංගතය හේතුවෙන් රටම ලොක්ඩවුන් කර තිබූ නිසාය. ඒ අනුව 2020 ඒ සැමරුම අප්‍රේල් 21 වැනිදා පෙරවරු 8.40ට කතෝලික දේවස්ථානවල මෙන්ම අන්‍යාගමික සිද්ධස්ථානවලින් ඇසුණු සීනු හා ඝණ්ටා හඬට, නිහඬ යැදුම්වලට හා පහන් දැල්වීම්වලටත් පමණක් සීමා විය.

මෙම වසරේ කොවිඩ් තරමක් දුරට මර්දනය වී තිබීම නිසා කොවිඩ් වැළැක්වීමේ සෞඛ්‍ය උපදෙස් අතර වුවද පාස්කු ත්‍රස්ත ප්‍රහාරයේ දෙවැනි වසර සැමරුමට අවකාශ සැලසිණි. ඒ ප්‍රහාරයේ වින්දිතයන්ට යුක්තිය හා සාධාරණත්වය පතා ඉකුත් 18 වැනි ඉරිදා සිට 20 අඟහරුවාදා දක්වා රට පුරා පිහිටි කතෝලික සිද්ධස්ථාන හා දේවස්ථාන ආශ්‍රිතව විශේෂ තුන්දින සර්ව රාත්‍රික යැදුම් මෙහෙයක් පැවැත්වීමට කතෝලික සභාව විසින් පියවර ගෙන තිබිණි.

පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරයට වසර දෙකක් සපිරීම සිහිපත් කරමින් විශේෂ දේව මෙහෙයන් සහ වෙනත් ආගමික උත්සව පැවැත්වූ දේවස්ථාන සඳහා අවශ්‍ය උපරිම ආරක්ෂාව ලබාදීමට පොලිසිය කටයුතු කර තිබුණි. පාස්කු ප්‍රහාරයේ දෙවැනි වර්ෂ පූර්ණය යෙදෙන 21 වැනි බදාදා දිවයිනේ සියලුම කතෝලික පාසල්වලට අති විශේෂ නිවාඩු දිනයක් විය. පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරයෙන් මියගිය පුද්ගලයන් සිහිකිරීම සඳහා බොරැල්ල පොදු සුසාන භූමියේ සහ මාදම්පිටිය සුසාන භූමියේ ඉදිකළ ස්මාර දෙකක් ආසිරි ගැන්වීම ඉකුත් 18 වැනිදා අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් සිදුවිය.

අප්‍රේල් 21 වැනිදා දිවයිනේ සියලුම කතෝලික දේවස්ථානවල පෙරවරු 8.45ට මළවුන්ගේ සීනුව නාද කර ප්‍රහාරයෙන් මියගිය වූවන් සිහිකර විනාඩි 2ක නිශ්ශබ්දතාවක් පවත්වා පහන් දල්වා පුෂ්පෝපහාර දැක්වීම සිදු කෙරුණි. ඊට සමගාමීව බෞද්ධ විහාරස්ථාන ඇතුළු අන්‍යාගමික සිද්ධස්ථාන තුළද විශේෂ සැමරුම් සිදුකිරීම විශේෂත්වයකි. අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ යෝජනාවක් අනුව ප්‍රහාරයෙන් මියගිය අය සිහිකරමින් එදින පාර්ලිමේන්තුවේ විනාඩි 2ක නිශ්ශබ්දතාවක් පවත්වනු ලැබිණ. විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස ඇතුළු සමගි ජන බලවේගයේ මන්ත්‍රී කණ්ඩායම කළු ඇඳුමින් සැරසී පාර්ලිමේන්තුවේ කමිටු ශාලාවකදී පාස්කු ප්‍රහාරයන් විපතට පත් වවූවන් සිහිකර විනාඩි දෙකක නිශ්ශබ්දතාවක් පැවැත්වූහ.

කොළඹ කොච්චිකඩේ සිද්ධස්ථානයේ පැවති ප්‍රධාන සැමරුම සිදු කෙරුණේ අගරදගුරු හිමියන්ගේ ප්‍රධානත්වයෙන් සහ ඕමල්පේ සෝභිත හිමි ප්‍රමුඛ අන්‍යාගමික නායකයන්ගේ සහභාගීත්වයෙනි. එහිදී පාස්කු ප්‍රහාරය පිළිබඳ විශාරද නන්දා මාලිනියන් විසින් ගැයූ ගීතයක්ද ජනගත කෙරුණි.

එදින පස්වරුවේ පූජාප්‍රසාදිවරුන් හා කන්‍යා සොහොයුරියන් මීගමුව මාරිස්ටෙලා විද්‍යාලය අසල සිට යැදුම්ශීලී පෙරහැරකින් කටුවාපිටිය දක්වා ගමන් කළේ පාස්කු ප්‍රහාරයේදී මියගිය 269 දෙනාගේ ඡායාරූප ද ඇතැතිවය. කටුවාපිටිය දේවස්ථානයට එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරයේදී ලේවලින් නැහැවුණු උත්ථානයේ ජේසු සමිඳුන්ගේ ප්‍රතිමාව රැගත් රථයක් ඒ පෙරහරට පෙරටුව ගමන් කළ අතර එම පෙරහරට මහා සංඝරත්න ඇතුළු සර්ව ආගමික නියෝජිතයන් එක්වී සිටීම විශේෂත්වයකි. අගරදගුරු හිමිපාණන් ප්‍රමුඛ කතෝලික රදගුරු මණ්ඩලය කටුවාපිටිය මීසම්වාසීන් හමුවීමට යෑමද එහිදී සිදුවූ අතර කටුවාපිටිය, කදිරානේ ඩේවිඩ් මාවතේ සමූහ සුසාන භූමියේ ඉදි කළ දෙව්මැදුර කාදිනල් හිමිපාණන් ප්‍රමුඛ රදගුරු මණ්ඩලය විසින් ආසිරි ගන්වා විවෘත කිරීම අනතුරුව සිදුවිය.

ඒ අවස්ථාව ඉතා හැඟීම්බර අවස්ථාවක් වූයේ ඒ සුසාන භූමියේ මළවුන් අතර සැතපී සිටින සියලු දෙනා ඊට දෙවසරකට පෙර කටුවාපිටිය දේවස්ථානයේදී ත්‍රස්ත ප්‍රහාරයට ලක්ව ජීවිතයෙන් සමුගත් අය වීමය. සුසාන භූමියේ හැම සොහොන් කොතක් මතම අලුත් මල්ය, දැල්වූ ඉටිපහන්ය. සොහොන් කොත් අබියස හඬා වැටෙන සහ නිහඬවම සුසුම්ලන මවුපියන් මෙන්ම දූ දරුවන්ගේ දසුන්ය.

"මගේ පුංචි පුතාව බලන්න මම ආවෙ අද විතරක් නෙවෙයි දෙයියනේ. හැමදාම දවසකට දෙසැරයක් මම මෙතනට එනවා. මගෙ අහිංසක දරු පැටියා මෙතන නිදාගෙන ඉද්දි මම කොහොමද ගෙදරට වෙලා ඉන්නෙ."

තරුණ මවක් සොහොන් කොතක් බදාගෙන එසේ කියමින් වැලපෙනු පෙනුණි. ඒ සොහොන යට නිදන්නේ වසරක් ගෙවීමටත් පෙර මරුවා කැටිව ගිය සුරතල් පුතෙකි.

"අපේ දරුවො නැතිවුණ වේදනාව අපි මැරෙනකම්ම තියෙයි. ඒත් අපේ අහිංසක දරුවො නිරපරාදෙ මරලා දාපු ඒ අපරාධකාරයන් කවුද කියලවත් අපි තාම දන්නෙ නැහැ. අපි රජයෙන් ඉල්ලන්නේ අපේ දරුවන්ගේ මරණවලට සාධාරණයක් ඉෂ්ට කරන්න. ඒ අපරාධකාරයො හොයලා උන්ට දඬුවම් දෙන්න."

ඒ, පාස්කු ප්‍රහාරයෙන් සිය පුතු අහිමි වූ වේදනාවෙන් තැවෙන පියෙකුගේ වැලපිල්ලකි. ඔහුගේ පමණක් නොව එම ප්‍රහාරයේ වින්දිතයන් බවට පත් සියලු දෙනාගේ ආයාචනය එයයි.

කාලය යනු බොහෝ සිත්තැවුල් වේදනා නිවන ඔසුවක් යැයි කීවාට ගතවූ දෙවසරක කාලය තුළ ඒ ප්‍රහාරයේ වින්දිතයන්ට සැබෑ සැනසුමක් ලැබුණේද යන්න ගැටලුවකි. කොළඹ කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානය, මීගමුව කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානය සහ මඩකලපුව සියොන් දේවස්ථානය ඇතුළු දේවස්ථාන තුනකදීත් කොළඹ ප්‍රධානපෙළේ හෝටල් කිහිපයකදීත් පුපුරා ගිය ත්‍රස්ත්‍රවාදී බෝම්බ ප්‍රහාර හේතුවෙන් අහිමි වූ ජීවිත ගණන 269කට අධිකය. තුවාල ලැබූවන්ගේ ගණන 500ට අධිකය. අයිතිකරුවන් නැතිව හඳුනාගත නොහැකිව රෝහල් මෘත ශරීරාගාරවල පුද්ගල ශරීර කොටස් මාස ගණන් තිබූ බව ද වාර්තා විය. අනුවේදනීය ලෙස ත්‍රස්ත ප්‍රහාරයෙන් මියගිය වූවන් අතර විදේශිකයෝ 45ක් වූහ. ඒ අතර සුප්‍රකට පුද්ගලයෝ හා මහා ධනකුවේරයන් පවුල්වල සාමාජියෝ ද වූහ. දරුවන් 56කට දිවි අහිමි වූ අතර තවත් දරුවන් 30කට ආසන්න සංඛ්‍යාවකට පියා හෝ මව හෝ ඇතැම්විට දෙදෙනාම අහිමි විය. ඒ මහා ඛේදවාදකය යළි යළිත් සිහිකිරීම වේදනාවක් වුවද එහි ගිනි පුපුරු තවමත් බොහෝ සිත් දවා හළු කරමින් ඇත.

මතකයට දෙවසරයි

පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරයට දෙවසරක් පිරීම දක්වා ගතවූ කාලය තුළ ඒ සම්බන්ධයෙන් සිදුවූ දේවල් බොහෝය. එම ත්‍රස්ත ප්‍රහාරය පිළිබඳ විමර්ශනය කිරීමට එවකට පැවති යහපාලන රජයේ ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් සහ ජනාධිපති කොමිෂන් සභාවක් පත්කරනු ලැබුවද ඒවායේ ක්‍රියාකාරීත්වය පිළිබඳ ජනතාව තුළ සතුටුදායක බවක් පෙනේනට නොවීය. එම කොමිෂන් සභාවල කාර්යක්ෂතාව සම්බන්ධයෙන් පාර්ශ්ව රැසකින් විවේචන එල්ල විය.

2019 බලයට පැමිණි වත්මන් රජයේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් එම කොමිසමේ කටයුතු කඩිනමින් සහ විධිමත්ම පවත්වාගෙන යන ලෙස උපදෙස් දුන් අතර එහි කටයුතුවල ද ප්‍රමාදයක් තිබෙන බවට ඇතැමුන් චෝදනා කළහ. කෙසේවෙතත් කොවිඩ් වසංගතය තත්ත්වය අතරතුර එහි කටයුතු වසරකුත් මාස තුනක පමණ කාලයකින් නිමාවට පත්වූ අතර පසුගිය පෙබරවාරි මස 1 වැනිදා එහි අවසන් වාර්තාව ජනාධිපතිවරයාට බාරදෙනු ලැබුණි.

කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් ප්‍රමුඛ කතෝලික රදගුරු මණ්ඩලය දැඩිව අවධාරණය කරන්නේ ත්‍රස්ත ප්‍රහාරයට සම්බන්ධ වරදකරුවන්ට දඬුවම් ලබාදීම කඩිනම් කරන ලෙසය. ඉකුත් මාර්තු මස 8 වැනිදා කොළඹ අගරදගුරු පදවියට අයත් සියලු කතෝලික බැතිමතුන්ට සහ දේවස්ථානවලට 'කළු ඉරිදා'වක් වූයේ ත්‍රස්ත ප්‍රහාරයට වසර 2ක් ගතවීමට පෙර ඒ පිළිබඳ විධිමත් යුක්තිය ඉටුකර දෙන ලෙස ඉල්ලමිනි.

මේ අතර පාස්කු ප්‍රහාරයෙන් විපතට පත් ජනතාව නගා සිටුවීම වෙනුවෙන් අගරදගුරු හිමිපාණන් ප්‍රමුඛ කතෝලික සභාව බොහෝ කටයුතු සිදුකර ඇත. අගදරගුරු පදවියේ සමාජ සේවා ආයතනය වන සෙත්සරණ ආයතනය සහ සෙඩෙක් ආයතනය කාදිනල් හිමිපාණන්ගේ මඟපෙන්වීම යටතේ වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කළ අතර මේ වන විටද ඒවා ක්‍රියාත්ක වෙමින් පවතී. ඒ අනුව පාස්කු ප්‍රහාරයෙන් විපතට පත් ජනතාව ආධ්‍යාත්මික, මානසික සහ සමාජීය යන අංශ 3 තුළින් නගා සිටුවීමටත් ඉදිරි අනාගතයට මුහුණ දීම සඳහා ජනතාව සමාජීය වශයෙන් සවිමත් කිරීමේ අභියෝගයත් සෙත්සරණ අධ්‍යක්ෂ ගරු ලෝරන්ස් රාමනායක පියතුමා ඇතුළු කණ්ඩායමක් විසින් ක්‍රියාත්මක කරනු ලැබූ අතර එහිදී ප්‍රමුඛතාව දී ඇත්තේ ප්‍රහාරයෙන් තුවාල ලැබූවන් සුවපත් කර ගැනීමටයි.

ත්‍රස්ත ප්‍රහාරයෙන් වින්දිතයන් වූ කුලී නිවාසවල ජීවත්වන පවුල් 32 ක් සඳහා නිවාස ලබාදීමට අවශ්‍යව තිබෙන අතර ඒ අතරින් අතරින් 24 දෙනකු සඳහා කාදිනල් හිමිපාණන් විසින් අරමුදලින් ලබාගත් මුදල්වලින් ඉඩම් මිලදී ගෙන තිබේ. ඒ ඉඩම්වල නිවෙස් ඉදිකර ගැනීමට රජයේ ප්‍රතිපාදන කඩිනමින් ලැබෙන්නේ නම් එය ඔවුන්ගේ බිඳුණු හදවත්වලට සැනසීමකි.

පාස්කු ප්‍රහාරයෙන් විපතට පත් කටුවාපිටිය සහ කොච්චිකඩේ දේවස්ථානවලට අයත් ජනතාවගේ ජීවිත කායික, මානසික සහ සමාජීය වශයෙන් නැංවීමේ වගකීමට උරදී සිටින්නේ කොළඹ අගදරගුරු පදවියේ සමාජ සේවා ආයතනය වන සෙත්සරණ ආයතනයේ අධ්‍යක්ෂ ගරු ලෝරන්ස් රාමනායක පියතුමාය. කාදිනල් හිමිපාණන්ගේ උපදෙස් මත ක්‍රියාත්මක කරන වැඩසටහන් රාශියක් තුළින් ඒ ජනතාවට මේ වන විටත් විශාල සේවයක් ඉටුවී තිබේ.

" මේ සාහසික ප්‍රහාරය සිදුකළේ කවුද යන්න හෙළි කිරීම හා ඔවුන්ට දඬුවම් කිරීම වින්දිතයන්ට සාධාරණය ඉටු කිරීමක්. ඔබේ සිරුරේ තවම ඒ ප්‍රහාරයෙන් සිදුවූ තුවාල සහ සලකුණු ඇති. ඒවා වෛරයේ සලකුණු නොව ආදරයේ සලකුණු කරගනිමු. මේ ප්‍රහාරය නිසා පියා අහිමි වුණ පුංචි දුවක් මට මෙහෙම කිව්වා" මගේ අතේ මේ තුවාලෙ වුණේ තාත්තා එක්ක ඉන්නකොට. ඒ, අපි දෙන්න එකට හිටපු අන්තිම මොහොත. තාත්තා මියගියත් මේ තුවාලෙ මට මැරෙනකම්ම මගෙ තාත්තව මතක් කරනවා. ඒ නිසා මම මේ තුවාලෙට ආදරෙයි" ඒ දුව වගේ අපිත් අපේ වේදනාව ආශීර්වාදයක් කරගෙන සුබවාදීව මේ ගමන යමු" ගරු ලෝරන්ස් රාමනායක පියතුමා වරක් එලෙස පැවසුවේ එතුමා අත්විඳි සත්‍යයකි.

පාස්කු ඉරිදා ව්‍යසනයෙන් පසු රටේ විශේෂ ආගමික සහජීවනයක් ඇතිවූ බව නොරහසකි. ප්‍රහාරයෙන් විනාශ වූ කටුවාපිටිය දේවස්ථානය පිරිසුදු කිරීමට බෞද්ධ භික්ෂූන් වහන්සේලා ඉදිරිපත් වූයේත් දේව මෙහෙයන් පැවැත්වීමට විහාරස්ථානවල බණ මඩු වෙන් වූයේත් ඒ සහජීවනය නිසාය. පාස්කු ප්‍රහාරයෙන් කැඩුණු බිඳුණු හිත් සුවපත් වීමටත් එවැනි ව්‍යසන යළිත් සිදු නොවීමටත් ඒ ආගමික, ජාතික සහජීවනය ඉදිරියටත් අවශ්‍ය බව යළි යළිත් සනාථ වෙමින් ඇත. ඒ වගකීමට උරදීම සියලු ශ්‍රී ලාංකිකයන්ගේ යුතුකමයි.

ඡායාරූප-
සුලෝචන ගමගේ

පාස්කු කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක වන හැටි

කොමිෂමේ අවසන් වාර්තාව ජනාධිපති කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල් (නීති) නීතිඥ හරිගුප්ත රෝහණදීර විසින් කාදිනල්තුමාට පිළිගන්වමින්...

පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට පත්කළ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව හා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ වාර්තාව අධ්‍යයනය කර ඒ පිළිබඳ ගත යුතු ක්‍රියාමාර්ග

හිටපු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන සාක්ෂිදීමට කොමිසමට පැමිණි අවස්ථාවක්

නිර්දේශ කිරීම සඳහා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් විසින් පත්කළ අමාත්‍ය මණ්ඩල අනු කමිටුවේ අවසන් වාර්තාව මඟින් නිර්දේශ 78ක් යෝජනා කර ඇති බව මේ වන විට බොහෝ දෙනකු දන්නා කරුණකි. දැන් රටම බලාගෙන සිටින්නේ එම නිර්දේශ ක්‍රියාත්මක වන තෙක්ය.

එම අමාත්‍ය මණ්ඩල අනු කමිටුව විසින් ඉදිරිපත් කර ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ඒවා ඊට අදාළ අමාත්‍යාංශ සහ ආයතන වෙත යොමු කිරීමේ කටයුතු දැනටමත් ආරම්භ වී ඇති බව එම කමිටුවේ ලේකම්, ජනාධිපති කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල් (නීති) නීතිඥ හරිගුප්ත රෝහණදීර පැවසීය.

අමාත්‍ය අනුකමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු යුතු යැයි යෝජනා කර ඇති ආයතන සංඛ්‍යාව පනහකට ආසන්න වන අතර ඊට ආරක්ෂක, මුදල්, අධිකරණ හා අධ්‍යාපන ඇතුළු අමාත්‍යාශ රැසක් ඇතුළත් බව ද හෙතෙම සඳහන් කළේය. මේ වන විට ඇතැම් නිර්දේශ ක්‍රියාත්මක මට්ටම කරා ළඟා වෙමින් තිබේ.

ඒ අතරින් පාස්කු ඉරිද ත්‍රස්ත ප්‍රහාරයේ වින්දිතයන්ට වන්දි ලබාදීම සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කර ඇත. අමාත්‍ය අනු කමිටුව නිර්දේශ කර ඇත්තේ රජය විසින් මියගිය එක් අයකු සඳහා රුපියල් මිලියන 2 සහ තුවාල වූවන්ගේ සැබෑ වියදම් සලකා රුපියල් 5,00,00ක වන්දි මුදලක් ප්‍රදානය කිරීමටය. එමෙන්ම මෙතෙක් වන්දි ගෙවා නැති මරණ 51ක් සඳහා කඩිනමින් වන්දි ප්‍රදානය කිරීමට ද කමිටුව නිර්දේශ කර ඇත. එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම මුදල් අමාත්‍යාංශය, හානි පූර්ණ කාර්යාලය සහ සමාජ සේවා දෙපාර්තමේන්තුව හරහා සිදු වේ. එමෙන්ම අවුරුදු 18ට අඩු මවුපියන් දෙදෙනාම අහිමි වූ දරුවන් සඳහා සුභසාධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමටත් නිර්දේශ කර ඇත.

ත්‍රස්තවාදී කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම හා ඒ වෙනුවෙන් පමණක් ක්‍රියාත්මක වන ඒකකයක් ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩල අනු කමිටුව නිර්දේශ කර ඇත්තේ නීතිපති දෙපාර්තමේන්තුවේ සියලුම අංශවල කාර්යයන් සමාලෝචන ක්‍රමයක් ද ක්‍රියාත්මක කරමිනි. ඒ අනුව විශේෂයෙන් ත්‍රස්ත විමර්ශන අංශය සහ අතෙකුත් ආයතනවල ඒ වෙනුවෙන් කටයුතු කරන කණ්ඩායම් සහ නිලධාරීන් විසින් කරුණු සමාලෝචනයේ යෙදෙන රැස්වීමක් මාසිකව ක්‍රියාත්මක කළ යුතුය.

මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ සියලු දේපළ රාජසන්තක කිරීමට නීති සම්පාදනය කර එහි අරමුදල් ත්‍රස්ත ක්‍රියා හේතුවෙන් විපතට පත් අය සඳහා වන්දි අරමුදලකට බැර කෙරේ.

ආගමික ස්ථාන ලෙස භාවිත කිරීමට ගොඩනැගිලි ඉදිකිරීම සම්බන්ධයෙන් නීති සම්පාදනය කිරීමට අමාත්‍ය මණ්ඩල අනු කමිටුව යෝජනා කර ඇත. ඒ අනුව මින් ඉදිරියට විදේශ මුදල්වලින් ඉදිවන රාජ්‍ය නොවන සංවර්ධන ලේකම් කාර්යාලයෙන් සහ අදාළ ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ නිසි මූල්‍ය විනයකට හා පාරදෘශ්‍ය විගනනයකට ලක් කෙරේ.

ත්‍රස්තවාදයට එරෙහිව නව නීතියක් පැනවිය යුතුය යන පාස්කු කොමිසමේ නිර්දේශය අමාත්‍ය මණ්ඩල අනු කමිටුව විසින් ද අනුමත කර ඇත. ඒ අනුව ත්‍රස්තවාදයේ නව ප්‍රවණතා හා ත්‍රස්ත මර්දනයට තවිත තාක්ෂණය යොදා ගැනීමට නීති ඇතුළත් කිරීමටත් ත්‍රස්තවාදී මූල්‍යකරණ මර්දනය කිරීමට ඒ සම්බන්ධයෙන් විභාග වෙමින් පවතින පරීක්ෂක කඩිනම් කිරීමටත් නිර්දේශ කර ඇත. ඒ යටතේ පාස්කු ප්‍රහාරයට සම්බන්ධ සහරාන් සහ ඔහුගේ කණ්ඩායම සමඟ මොහොමඩ් නෆීස් මොහොමඩ් සහ මොහොමඩ් නෆීස් පැවැත්වූ සබඳතා පිළිබඳ පුළුල් පරීක්ෂණයක් පැවැත්වීමට ආරක්ෂක අමාත්‍යාංශයට උපදෙස් ලබා දී ඇත. ශ්‍රී ලංකාවේ ඉස්ලාමීය රාජ්‍යයක් පිහිටුවීමට කුමන්ත්‍රණය කිරීම සම්බන්ධයෙන් ඔවුන්ට එරෙහිව අපරාධ නඩු පැවරීම පිළිබඳ ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ නිසි මූල්‍ය විනයකට හා පාරදෘශ්‍ය විගනනයකට ලක් කෙරේ.

ත්‍රස්තවාදයට එරෙහිව නව නීතියක් පැනවිය යුතුය යන පාස්කු කොමිසමේ නිර්දේශය අමාත්‍ය මණ්ඩල අනු කමිටුව විසින් ද අනුමත කර ඇත. ඒ අනුව ත්‍රස්තවාදයේ නව ප්‍රවණතා හා ත්‍රස්ත මර්දනයට තවිත තාක්ෂණය යොදා ගැනීමට නීති ඇතුළත් කිරීමටත් ත්‍රස්තවාදී මූල්‍යකරණ මර්දනය කිරීමට ඒ සම්බන්ධයෙන් විභාග වෙමින් පවතින පරීක්ෂක කඩිනම් කිරීමටත් නිර්දේශ කර ඇත. ඒ යටතේ පාස්කු ප්‍රහාරයට සම්බන්ධ සහරාන් සහ ඔහුගේ කණ්ඩායම සමඟ මොහොමඩ් නෆීස් මොහොමඩ් සහ මොහොමඩ් නෆීස් පැවැත්වූ සබඳතා පිළිබඳ පුළුල් පරීක්ෂණයක් පැවැත්වීමට ආරක්ෂක අමාත්‍යාංශයට උපදෙස් ලබා දී ඇත. ශ්‍රී ලංකාවේ ඉස්ලාමීය රාජ්‍යයක් පිහිටුවීමට කුමන්ත්‍රණය කිරීම සම්බන්ධයෙන් ඔවුන්ට එරෙහිව අපරාධ නඩු පැවරීම පිළිබඳ

සාක්ෂිදීම සඳහා හිටපු පොලිස්පති පූජිත ජයසුන්දර සහ හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු කොමිසමට පැමිණි අවස්ථාවක්

ජනතාව අතර ආගමික ප්‍රතිරෝදය ඇතිකිරීම, ප්‍රචණ්ඩත්වය ඇතිකිරීම, ප්‍රචණ්ඩත්වයට කුමන්ත්‍රණය කිරීම යන චෝදනාවලට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ තවුෆීක් මවුලවි,ඊබ්‍රහිම් මවුලවි, මොහොමඩ් සහිඩ්, සාදික් අබ්දුල්ලා ඇතුළු නවදෙනකුට විරුද්ධව නීතිපතිවරයා විසින් ඉකුත් 20 වැනිද කෑගල්ල මහාධිකරණයේ අධිචෝදනා ගොනු කරනු ලැබිය. එම චෝදනා විභාග කිරීමට විශේෂ ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ලක් පත්කරන ලෙස ද නීතිපතිවරයා විසින් අගවිනිසුරුවරයාගෙන් ඉල්ලීමක් කරනු ලැබිණි.

මේ ආකාරයට ඉතා හිතකර සහ සාධනීය ක්‍රියාමාර්ග රැසක් ක්‍රියාත්මක වීමේ මූලික කටයුතු මේ වන විටත් සිදුවමින් තිබෙන අතර අමාත්‍ය අනුකමිටු වාර්තාවේ නිර්දේශ අදාළ ආයතන වෙත භාර දීමෙන් පසු ඒවා ක්‍රියාත්මක කෙරෙන ආකාරය පිළිබඳ පසු විපරම් කිරීමට ද කමිටුව බලාපොරොත්තු වන බව කමිටු ලේකම් නීතිඥ හරිගුප්ත රෝහණදීර පැවසීය.

සලකා බැලීමටත් යෝජනා කර ඇත.

පාස්කු ඉරිද ත්‍රස්ත ප්‍රහාරය සිදුකිරීමට සහරාන් ඇතුළු කණ්ඩායම සයිබර් අවකාශය සහ නවීන තාක්ෂණය භාවිත කර ඇති බව විමර්ශනවලදී අනාවරණය වී ඇති බැවින් ඉදිරියේදී එවැනි අපරාධ සිදුවීම වැළැක්වීමට ද අනුකමිටුව විසින් නිර්දේශ රැසක් යෝජනා කර ඇත. ඒ අනුව සයිබර් අවකාශය තුළ අන්තවාදී ආගමික වෙබ් අඩවි සහ බ්ලොග් අඩවි ක්‍රියාත්මක කරන්නන්ට එරෙහි නීතිමය පියවර ගැනීම, සයිබර් ත්‍රස්තවාදයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග අනුමතය කිරීම, සයිබර් අපරාධ පනත සංශෝධනය කිරීමට නියමිතය. එපමණක් නොව ජගංම දුරකතන සබඳතා නිකුත් කිරීමේදී දැඩි පාලනයකට ලක්කළ යුතු බවට නිර්දේශ කර ඇති අතර එහි වගකීම පවරා ඇත්තේ විදුලි සන්දේශන නියාමන කොමිසමටය.

පුපුරණ ද්‍රව්‍ය සඳහා භාවිත කළ හැකි ද්‍රව්‍ය විකිණීම දැඩි ලෙස නියාමනය කිරීමටත් පුපුරණ ද්‍රව්‍ය සහ ආයුධ ජාවාරම වැළැක්වීමට මෙරට සාගර සහ ගුවන්තොටුපළ සම්පූර්ණයෙන්ම සුරක්ෂිත කිරීමටත් ආරක්ෂක අමාත්‍යාංශයට නිර්දේශ ඉදිරිපත් කර ඇත. එමෙන්ම සමාජය තුළ දැඩි කතාබහට ලක්වූ මදුසා පාසල් නියාමනය කිරීමේ වගකීම ආගමික කටයුතු අමාත්‍යාංශයට සහ අධ්‍යාපන අමාත්‍යාංශයට පවරා ඇත.

ශ්‍රී ලංකා ජමාත්- ඊ- ඉස්ලාමීය සංවිධානය සහ ජවාහත්- ඊ ඉස්ලාමි ශිෂ්‍ය ව්‍යාපාරය ඇතුළු අන්තවාදී ආගමික කණ්ඩායම් තහනම් කිරීමට නීති හා රෙගුලාසි නිර්මාණය කිරීමට පාස්කු කොමිසමේ යෝජනාවට අමාත්‍ය අනු කමිටුවේ නිර්දේශ මඟින් අනුමැතිය ලබාදී ඇති අතර ඉකුත් 11 වැනිද ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ මුස්ලිම් අන්තවාදී සංවිධාන 11ක් තහනම් කරමින් අති විශේෂ ගැසට් නිවේදනය නිකුත් කරනු ලැබුවේද එහි පියවරක් ලෙසටය. මෙම ගැසට් නිවේදනයට අනුව තහනම් සංවිධාන තහනම නොතකා ක්‍රියාකරන පුද්ගලයකු වරදකරු වුවහොත් වසර 20කට නොඅඩු කාලයක් බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයකට යටත් විය යුතුය. එමෙන්ම තහනම් සංවිධානවල ක්‍රියාකාරකම්වලට අනුබල දීමේ වරදකට වරදකරුවන් වන පුද්ගලයකු වසර 10ක් බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයකට යටත් කළ හැකි බවද එම ගැසට් නිවේදනයේ සඳහන් වේ.

මාවනැල්ලේ බුදු පිළිම කැඩීම වැනි සිදුවීම් යළි ඇති නොවීම සඳහා සියලුම නිකායන්ට අයත් පුරාණ ආගමික ස්මාරක ආරක්ෂා කිරීම සඳහා කමිටු නිර් දේශය අනුව පුරාවිද්‍ය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ත්‍රිවිධ හමුදාව යෙදවීමට නියමිතය. එමෙන්ම මාවනැල්ලේ බුදුපිළිමවලට හානි කරමින්

ශ්‍රී ලංකා ආර්ථිකයේ හැරවුම් ලක්ෂ්‍යය කොළඹ වරාය නගරයයි

කොළඹ වරාය නගරය

- ආරම්භ කළ දිනය - **2014 සැප්තැම්බර් 17**
- පරම අයිතිකරු - **ශ්‍රී ලංකා රජය**
- නීතිය ක්‍රියාත්මක කරන ආයතනය - **ශ්‍රී ලංකා පොලිසිය හා අධිකරණය**
- වර්ග ප්‍රමාණය - **හෙක්ටයාර් 269 යි**
- ඉදිකිරීම් වියදම - **රු. බිලියන 3000 යි**
- ඉදිකිරීම සඳහා පුරවන ලද වැලි ප්‍රමාණය **කියුබික් මීටර් ලක්ෂ 65 යි**
- චීන සමාගමට 99 අවුරුදු බදු යටතේ ලබාදෙන ඉඩම් ප්‍රමාණය - **හෙක්ටයාර 116 යි**
- තිරසර මහජන හරිත උද්‍යානවල විශාලත්වය - **අක්කර 111 යි** (ගාලුමුවදොර පිටිය මෙන් 9 ගුණයකි)
- ඉදිකිරීම් - **නිවාස ඒකක 40000**
  තට්ටු ගෙඩනැගිලි 6000
- අලුත් වෙරළේ දිග **කිලෝමීටර් 1.5 යි;**
- පළල **මීටර් 200**
- ලැබෙන රැකියා ගණන **82,000 යි**
- අපට ලැබෙන ආදායම වසරකට **රුපියල් කෝටි 230,000ක්**
- වරාය නගරයට ඇතුළු වෙන්න **කිසිම මුදල් අයකිරීමක් නැහැ**

● **නිහාල් පී. අබේසිංහ**

අපේ රටේ ඉදිරි ගමනට මෙරට ඉතිහාසයේ ලැබෙන සුවිශේෂම අවස්ථාව වරාය නගරය ඉක්මනින් ක්‍රියාත්මක කිරීමයි. අපේ රටට වසරකට රුපියල් කෝටි 230,000ක් ප්‍රතිලාභ ලබන අලුත් රැකියා ලක්ෂයකට ආසන්න ගණනක් එකතු කරවන අපේ රටට පරම අයිතිය ඇති අපේ අධිකරණ බලය සහිත අපේ පොලිසිය පාලනය කරන මේ වරාය නගරයට එතෙර මෙතෙර ආයෝජකයන් අද්දවා ගැනීමට නිසි බල සහිත ආර්ථික කොමිසමක් අත්‍යවශ්‍ය බව ආර්ථික ක්ෂේත්‍රයේ විද්වත්හු පවසති. අපේ ආර්ථිකයේ හැරවුම් ලක්ෂ්‍යය වන වරාය නගරය අපේ රටට ලැබුණු සුවිශේෂී සම්පතකි. රටේ ජීවන ගැටලුවලට ආර්ථික ගැටලුවලට කදිම විසඳුමකි.

වරාය නගරය ඉදිකර ඇත්තේ ශ්‍රී ලාංකික වෙරළ කලාපයේ හෙක්ටයාර 269 ක් වැලි පුරවා සකස් කිරීමෙනි. ඉන් ගොඩනැගිලි ඉදිකිරීමට ලබා දෙන්නේ හෙක්යාර් 178 ක් පමණි. ඒ ප්‍රදේශයේ මනරම් වාණිජ කලාප ලෙස කොටස් 74කට කඩා දෙස් විදෙස් ව්‍යාපාර සඳහා බදු දීමට දැන් සූදානම්ය. කෙසේ වුවත් කොළඹ වරාය නගර ගිවිසුමට අනුව මේ ප්‍රමාණයෙන් 99 අවුරුදු මත චීන සමාගමට බදු දෙනු ලබන්නේ හෙක්ටයාර 116ක් පමණි. ඔවුන්ට එය ප්‍රති බදු දීම කළ හැකිය. නමුත් අයිතිය අප රට සතුය.

දැන් ඉදිකිරීම් අවසන් වෙමින් පවතින වරාය නගරය වර්ග කිලෝමීටර් 2.6ක භෞමික අවකාශයක් නිර්මාණය වුණු ලොව උසස්ම මට්ටමේ A ශ්‍රේණියේ කාර්යාල සංකීර්ණ සහිත භූමියකි. එය සාප්පු සංකීර්ණ මෙන්ම අති නවීන සෞඛ්‍ය සේවා, ප්‍රමිතිගත අධ්‍යාපන සේවා පහසුකම්, බහුවිධ සේවා පහසුකම්, සැහැල්ලු මුහුදු යාත්‍රාංගණ, සුපිරි සාප්පු සංකීර්ණ, අධි ශ්‍රේණියේ හෝටල් මෙන්ම විනෝද ආශ්වාදය සඳහා විශේෂ පහසුකම්වලින් ද යුක්ත වේ.

මේ භූමියේ හැම බිම් අඟලක්ම අපේ. චීනයට බදු දුන් කොටසේ ආයෝජනයටත් නාගරික සංවර්ධන අධිකාරියේ අවසරය ඕනෑ

- ආචාර්ය ප්‍රියත් බන්දු වික්‍රම

මේ පිළිබඳව කරුණු දක්වන මෙම වරාය නරගය ඉදිකළ CHEC සමාගමේ මහජන සම්බන්ධතා ප්‍රධානී කස්සප සෙනරත් පවසන පරිදි මෙම බහුකාර්ය ව්‍යාපෘතිය අවසන් වූ විට මෙතෙක් මෙරට වැසියන් නුදුටු සුවිශේෂී හා නව තාක්ෂණයෙන් හෙබි හා සෞන්දර්යයෙන් හෙබි ස්ථාන ගණනාවක් බලාගත හැකිය.

කොළඹ වරාය නගරය අපේ රටේ ඉදිරි ගමනට අත්‍යවශ්‍ය බව ආර්ථික විශේෂඥයෝ පවසති.

"අද අපේ රටේ ව්‍යාපාරයක්, ආයෝජනයක් අනුමත කිරීමට රජයේ කාර්යාල 18 කට පමණ දින ගණනාවක් යාමට ඒමට සිදුවෙනවා. ඊට අමතරව සමහර ඉහළ නිලධාරින්ගෙන් ද ඊට අනුමැතිය ලබාගත යුතුයි. එවිට පිටරට ආයෝජකයන්ට තම ආයෝජනය එපාවී ආපසු තම මවු රටට යාමට ද ඉඩ තිබෙනවා. නමුත් විශේෂ ආර්ථික කලාප පිහිටුවීම මගින් මේ ආයෝජනයට අවසර ගැනීමට අවශ්‍ය සියලු දේ පැය කිහිපයකින් අනුමත කර ගැනීමට හැකියි." මැලේසියාවේ ක්වාලාලම්පූර් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය සමිත හෙට්ටිගේ පවසයි.

විශේෂ ආර්ථික කොමිසමක මනා පාලනය ලැබුණහොත් අපේ වරාය නගරය ලොව ප්‍රමුඛ පෙළේ ආයෝජන නගරයක් ලෙස 2025 වන විට ලොව පුරා ජනප්‍රිය වීමට ඉඩ තිබෙනවා.

එමෙන්ම අපේ වරාය නගරය ආසියා, අප්‍රිකා, යුරෝපා පිවිසුම් මග ඔස්සේ පිහිටීම හේතුවීම නිසා විශේෂයෙන් මෙයට සේද මාවතේ වාණිජ කේන්ද්‍රස්ථානය යන සන්නාමය ද ලැබෙනු ඇතැයි ප්‍රකාශ කරන්න පුළුවන්.

මේ පිළිබඳව තවදුරටත් කරුණු දක්වන මහාචාර්ය සමිත හෙට්ටිගේ පෙන්වා දෙන්නේ කොතරම් ශක්තිමත් හා මූල්‍යමය අතින් ඉහළ මට්ටමේ සිටින රාජ්‍යයක් වුවත් චීනය කිසි දිනෙක යම් රටක කොටසක් අල්ලාගෙන කොලනි සෑදීමක් සිදුකළේ නැති බවයි.

ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමා පිහිටුවනු ලැබූ මහ කොළඹ විශේෂ ආර්ථික කලාපය අනුව තමයි චීනය මුලින්ම නිදහස් ආර්ථික කලාප බිහි කර ඇත්තේ. මෙරට කොළඹ හා කටුනායක තිබූ නිදහස් ආර්ථික වෙළෙඳ කලාප දුටු එවකට ෂැංහයි නගරාධිපති හා පසුව චීනයේම ජනාධිපති වූ යැංග් ෂිං චීනයේ නිදහස් ආර්ථික කලාප පිහිටුවීම ආරම්භ කළා. දැනට එහි ආර්ථික කලාප 10ක් 15ක් පමණ තිබෙනවා.

එවැනි එක් කලාපයක් වන චීන හයිනාන් කලාපයට පසුගිය වසර 3 ඇතුළත රටවල් 82කින් ඇමරිකන් ඩොලර් 5ක ආයෝජන ඇදගෙන තිබෙනවා. ඒ අනුව මම කියන්නේ අපේ රටටත් නිදහස් ආර්ථික කලාපයක් අවශ්‍ය බවයි. එය පිහිටු වූ පමණින් අපේ රට චීන කොලනියක් වන්නේ නැහැ. එමගින් රටේ තරුණ තරුණියන් ලක්ෂයකට විතර සෘජු හා වක්‍ර රැකියා ලැබෙනවා. අපේ රටට සංචාරකයන් වැඩිපුර එනවා. විශේෂයෙන් ලෝක පූජිත සමාගම්වල ප්‍රධාන කාර්යාල පවා වරාය නගරයේ ඉදිකරන්න සූදානමින් සිටිනවා. නව විද්‍යා තාක්ෂණ දැනුම හා මූල්‍ය කටයුතු පිළිබඳ දැනුම සහිත විද්වතුන් මෙහි පැමිණීම නිසා ඒ පිළිබඳ දැනුමක් අපේ තරුණ තරුණියන්ටත් ලබා ගැනීමට මෙමගින් අවස්ථාව ලැබෙනවා.

මෙරට කටුනායක, බියගම වෙළෙඳ කලාප ආරම්භ කරන කාලයේදී පිටරටවල්වල ආයෝජන අද්දා ගැනීමට ලොව රටවල් අතර වර්තමානයේ තරම් තරගයක් තිබුණේ නැහැ. නමුත් අද සිංගප්පූරුව, ඩුබායි, එක්සත් අරාබි එමීර් රාජ්‍යයක වැනි ආර්ථික කලාප මගින් ආයෝජකයන්ට ආයෝජන ආකර්ෂණය සඳහා විශේෂ වාසි ලබාදී තිබෙනවා. මේ නිසා ඒ තරගයට අපත් මුහුණ දීමට ආයෝජකයන්ට වාසි හා පහසුකම් ලබා දුන්නොත් අපේ වරාය නගර ආර්ථික කලාපයටත් ලොව අනෙක් ආර්ථික කලාප සමග තරග කරන්න පුළුවන්.

සිංගප්පූරුව, කොරියාව, ඉන්දියාව, ඩුබායි රාජ්‍යය හා චීනය වැනි රටවල් මෑතක කාලයේදී වැඩිපුර දියුණුවක් ලැබුවේ මේ ආර්ථික කලාප නිසා. අපේ තරුණ තරුණියන්ටත් මෙහි රැකියා කරලා ඩොලර් වලින් දැනට වඩා පඩියක් ගන්න පුළුවන්.

සිංගප්පූරුව, කොරියාව, ඉන්දියාව ඩුබායි රාජ්‍ය හා චීනය වැනි රටවල් මෑතකදී දියුණු වුණේ විශේෂ ආර්ථික කලාප නිසා

- මහාචාර්ය සමිත හෙට්ටිගේ

ලෝකයේ ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීමට හැකි උපරිම පහසුකම් අපි ලබා දිය යුතුයි.

ඒ නිසාම එය ස්ථාවර නිදහස් වෙළෙඳ ආර්ථික කොමිසමක් මගින් පාලනය කළ යුතුයි. මට හිතෙන විදිහට මේ විශේෂ ආර්ථික කොමිසමට තනිකරම පත්විය යුත්තේ ශ්‍රී ලාංකික විද්වතුන් පමණයි.

මේක අපේ ආර්ථිකයේ ප්‍රධාන හැරවුම් ලක්ෂ්‍යය බව අවධාරණයෙන් කියන්න පුළුවන්. මහාචාර්ය සමිත හෙට්ටිගේ පවසයි.

මේ පිළිබඳව විශේෂයෙන් කරුණු දක්වන මුදල් රාජ්‍ය අමාත්‍ය අජිත් නිවාඩ් කබ්රාල් පවසන්නේ මේ වරාය නගරය නිසා අපේ රටේ ආර්ථික වර්ධනය ලබන වසර 5 ඇතුළත 7%ක් පමණ වනු ඇති බවයි. මේක අපේ ආර්ථිකයේ හැරවුම් ලක්ෂ්‍යයයි.

අපේ රට දුප්පත්කමින් ඉදිරියට යන්නට නම් රටේ අනාගත පරපුරට හොඳ රටක් ලබා දෙන්නට නම් වරාය නගරය මෙන්ම එය පාලනය කරන ආර්ථික කොමිසම ද පිහිටුවීම අත්‍යවශ්‍යයි.

මේ පිළිබඳව කරුණු දක්වන වරාය හා සමුද්‍ර ක්ෂේත්‍රයේ ප්‍රවීණයකු වන ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ ලේකම් හා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ හිටපු සභාපති ආචාර්ය ප්‍රියත් බන්දු වික්‍රම පවසන්නේ මෙම වරාය නගරයේ ඇති චීනයට 99 අවුරුදු බදු දී ඇති ඉඩම්වල පවා අලුතින් ආයෝජනයක් ක්‍රියාත්මක කළහොත් ඒ සඳහා අපේ නාගරික සංවර්ධන අධිකාරියේ අවසර ගත යුතු බවයි.

"වරාය නගරයට අදාළ විශේෂ ආර්ථික කොමිසම පිළිබඳ වත්මන් රජය ඉදිරිපත් කළ පනතත් පසුගිය රජය ඉදිරිපත් කළ පනතත් බොහෝ දුරට සමානයි. මේ වරාය නගරයේ හෙක්ටයාර 269 න් චීන සමාගමට 99 අවුරුදු බද්දට ලබාදී ඇත්තේ 43%ක් පමණයි. නමුත් එහි කිසිම සින්නක්කර අයිතියක් ඒ සමාගමට නැහැ. ඒ අයට තිබෙන්නේ ඔවුන්ට බදු දී ඇති ඒ ඉඩම් යළි ප්‍රතිබදු දීමේ බලය පමණයි. එසේ වුවත් ඒ ඉඩම් තවත් අයෙකුට ආයෝජනය කිරීමට බාර දුනහොත් ඒ ආයෝජකයා බදු ගිවිසුම අත්සන් කළ යුත්තේ අපේ නාගරික සංවර්ධන අධිකාරිය සමගයි. ඒ අනුව විපක්ෂය ගෙන යන චීන කොලනිය පිළිබඳ කතාව සම්පූර්ණ අසත්‍ය බව පැහැදිලි වනවා. තවත් අවධාරණය කළහොත් මේ මුළු වරාය නගරයේම නිල පරම අයිතිකරු ශ්‍රී ලංකා රජය පමණයි.

මේ වරාය නගරයේ විශේෂ ආර්ථික කොමිසම සඳහා 2019 සැප්තැම්බර් 19 ඉදිරිපත් කළ පනත අනුවම තමයි මේ කොමිසම් සභාව පිළිබඳව යෝජනා කර තිබෙන්නේ. එසේ වුවත් සමහර අය අලුත් පනතට විරුද්ධයි.

නමුත් පරණ පනත අලුත් පනතට වඩා ශ්‍රී ලංකාවේ ස්වෛරීත්වයට විරුද්ධයි. පරණ පනත අනුව මේ භූමිය තුළ විශේෂ උසාවියක් ස්ථාපනය කළ යුතුයි. නමුත් අලුත් පනතේ ඒ උසාවිය පිළිබඳව නැහැ. අලුත් පනත අනුව වාණිජ අධිකරණයක් යටතේ වරාය නගරයට අදාළව නඩුවක් ඉදිරිපත් කළහොත් ඒ නඩුව සීමිත කාලයක් තුළ විභාග කර අවසන් කළ යුතුය.

වරාය නගරයට හා එම කොමිසමට සියලුදෙනා සහයෝගය දුන්නොත් සෞභාග්‍යවත් දේශයක් ඇතිවෙනවා

- ආචාර්ය සූරතිස්ස දිසානායක

කොළඹ වරාය නගරය වෙළෙඳ මධ්‍යස්ථානයක්, මූල්‍ය මධ්‍යස්ථානයක් පමණක් නොවෙයි හරිත උද්‍යානයක් සහිත පාරිසරික මධ්‍යස්ථානයක් ලෙස හඳුන්වන්නත් පුළුවන්. එහි අක්කර 111ක භූමි ප්‍රදේශයක් තුළ හරිත උද්‍යාන, රුවල් නැව් යාත්‍රාංගණ, නාගරික උද්‍යාන සමග විශාල වෙරළක් තිබෙනවා. මේක කොළඹට තිබුණු විශාල අඩුවක් පිරිමැසීමක්.

ගෝල්ෆේස් පිටිය මෙන් 9 ගුණයක් විශාල මේ ප්‍රදේශයට පමණක් නොව මුළු වරාය නගරයටම රටේ ඕනෑම පුරවැසියකුටම කිසිම බාධාවක් නැතිව ඇතුළු වෙන්න පුළුවන්. දැන් පොදු ජනතාව ගෝල්ෆේස් පිටියට යන්නේ කෙසේද ඒ ආකරයටම වරාය නගරයට කිසිම අයකිරීමක්, කිසිම පාස්පෝට් ඉල්ලීමක් නැතුව නිදහසේ ඇවිද යන්න අවස්ථාව තිබෙනවා.

මේ ආර්ථික කොමිසමේ මූල්‍ය පාලනය සිදුවන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කර ඇති විදේශ ගිණුම් පවත්වාගෙන යෑම පිළිබඳ අණපනත් යටතේයි.

මෙයට අදාළව යම් අලුත් රෙගුලාසියක් ප්‍රකාශයට පත්කරනවා නම් එය ගැසට් කර ප්‍රකාශයට පත්කර පාර්ලිමේන්තු මගින් අනුමත කර ගත යුතුයි. මෙම කොමිසම සඳහා ජනාධිපතිතුමා සාමාජිකයන් පත්කරන්නේ අදාළ සුදුසුකම් මත පමණයි. ඒ අය යම් වරදක් කළහොත් ඉවත් කරන්නත් එතුමාට අවස්ථාව තිබෙනවා.

වරාය නගරය තුළ පිටරටින් එන ආයෝජකයන් අපේ ඉඩම්වල මහතට්ටු බිල්ඩිම් ඉදිකරාවි. නමුත් බද්ද අවසන් වෙලා ඒ අය යනවිට ඒවා අරන් යන්නේ නැහැ. සිදුවන්නේ අපේ වත්කම වැඩිවීමයි. ඉන් රටේ ආර්ථිකය දියුණු වෙනවා පමණක් නොව රටේ පොදු ජනතාවට ද ආර්ථික හා සාමාජික වාසි රැසක් ලැබෙනවා.

ඒ අනුව නගරයේ සල්ලිකාරයන්ට වගේම ගමේ ගොඩේ අයටත් වක්‍රව ඒ වාසි ලැබීම වළක්වන්න බැහැ. ඉන් රටේ දේශපාලන ස්ථාවරත්වයත් රැකෙනවා. විරුද්ධ පක්ෂය මේ වැඩේට විරුද්ධ වන්නේ රටේ සැමටම මේ අයුරින් වැඩි වාසි ලැබෙන නිසාදැයි මම ප්‍රශ්න කරනවා. ආචාර්ය ප්‍රියත් බන්දු වික්‍රම පවසයි.

මේ ගැන කරුණු දක්වන කොළඹ විශ්ව විද්‍යාලයේ පරිසර විද්‍යා හා සත්ව විද්‍යා අංශයේ ආචාර්ය සූරතිස්ස දිසානායක පවසන්නේ මෙවැනි වරාය නගර මගින් පරිසර දූෂණය අවම කළ හැකි බවයි.

නව වරාය නගර සංකල්පය අනුව වැඩියෙන් යොදා ගන්නේ පුනර්ජනනීය බලසම්පත්. ඒ නිසා වායු දූෂණය, ජල දූෂණය අවම වෙනවා. එමෙන්ම මෙවැනි නගර තුළ අනිවාර්යයෙන්ම හරිත උද්‍යාන, හරිත නගර ඉදිවෙනවා. එවිට එම රටවල අනෙක් නාගරික ප්‍රදේශවලට වඩා මෙහි පරිසර දූෂණය අවම වීමක් සිදුවෙනවා.

මේ නව නගර සංකල්පය අපට පමණක් සීමාවුණු දෙයක් නොවේ. සමහර රටවල වෙළෙඳ කලාප ප්‍රදේශ තිබෙනවා.

අරාබි මුහුදේ ගොඩනගා ඇති ඩොලර් බිලියන 10.7ක් වැයවන සයින්බෝ ඕමාන් ඉන්ඩස්ට්‍රියල් සිටි කලාපය වර්ග කිලෝමීටර් 11ක භූමි භාගයකින් යුක්තවූවක්. මේ අයුරින් සලකා බලන විට මැලේසියාව, නයිජීරියාව, සවුදි අරාබිය, ඉක්වදෝරය, ඕමානය, කසකස්ථානය, කෙන්යාව වැනි රටවල් 40ක මෙවැනි නව නගර ඉදිවෙමින් පවතිනවා.

ඒ අනුව මෙවැනි නගරයක් ඉදිකිරීම වාණිජ මට්ටමින් දියුණු වීමේ තවත් සන්ධිස්ථානයක් ලෙස පෙන්වා දෙන්න පුළුවන්.

මේ වරාය නගරය ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථිකමය තත්ත්වය නගාසිටුවීම සඳහා ඉතා වැදගත් වන මර්මස්ථානයක් ලෙස හඳුන්වන්න පුළුවන්. මේ මගින් අපේ රට සංචාරක පාරාදීසයක් වනවා පමණක් නොව මූල්‍ය හා වාණිජ්‍ය මධ්‍යස්ථානයක් ද වනවා.

මේ අනුව මෙම කාර්ය සිදුකිරීම සඳහා අවශ්‍ය වන සියලුම කටයුතු සඳහා පූර්ණ සහයෝගය ලබාදීම මගින් අපේ රටේ ජනතාවට සෞභාග්‍යයේ දේශයක් උදාවනු ඇතැයි ආචාර්ය සූරතිස්ස දිසානායක පවසයි.

සිළුමිණ
තරංග

වර්ෂ 2021ක් වූ අප්‍රේල් මස
25 වැනිදා ඉරිදා

නිවැරැදිව ප්‍රහේලිකාව පුරවා අතක් බරට තෑගි දිනාගන්න සිළුමිණෙන් තරග 3 ක් — පිටුව 20

අවුරුදු 95 පයිලට් සීයා — පිටුව 21

සමාජවාදයේ සිහිනයත් රැගෙන නික්මගිය රත්නායක වනසිංහ — පිටුව 22

පැසිෆික් සාගරයේ පෙන්ග් නා බොක්ක ආශ්‍රිතව තායිලන්ත මුහුදු සීමාවේ නිර්මාණය කර ඇති කෝ පන්යි නගරය.

අත්ලාන්තික් සාගරයේ මෙක්සිකානු මුහුදු සීමාවේ නිර්මාණය කර ඇති මෙක්සිකානු වැනීසය හෙවත් මෙක්සිකැල්ටිනන් නගරය

ඉන්දියානු සාගරයේ නිර්මාණය කරන සිංගප්පූරු වරාය නගරය

පැසිෆික් සාගරයේ නිර්මාණය කිරීමට නියමිත ජපාන සාගර නගරය

රටින් රට හැඩකරමින් ඉදිවන ‘සාගර නගර’

පෘථිවි ගෝලයේ මහාද්වීප හෙවත් ගොඩබිමට වඩා සාගරය වැඩි බව කවුරුත් දන්නා කාරණයකි. දිනෙන් දින මිලියන ගණනින් වැඩිවන ජනගහණයට සුදුසු වාසභූමි ලෙස සෑම ගොඩබිම් ප්‍රදේශයක්ම සැලකිය නොහැකිය. මිනිසා තාක්ෂණය යොදා ගනිමින් සාගරය ආශ්‍රිතව වාස භූමි ඉදි කිරීම ආරම්භ කළේ මීට සියවසකටත් ඉහතදීය. මේ වන විට මෙවැනි ‘සාගර නගර’ ලෝකයේ සාගර ප්‍රදේශයකට හිමිකම් කියන රටවල් රැසක්ම ඉදි කර තිබේ. මෙවැනි ‘සාගර නගර’ සැබවින්ම සංචාරක ආකර්ෂණයද සහිත බැවින් ඒව ඉදි කිරීමේ වාසි බොහොමයකි. මේ වාසි ලබා ගැනීම අරමුණු කර ගනිමින් ලොව පුරා ඉදි කර ඇති ‘සාගර නගර’ කිහිපයක් මෙසේය.

අත්ලාන්තික් සාගරයේ ගෝතමාලානු මුහුදු සීමාවේ නිර්මාණය කර ඇති ෆ්ලොරිස් නගරය

ඉන්දියානු සාගරයේ නිර්මාණය කිරීමට නියමිත ඉන්දුනීසියානු අගනුවර

තායිලන්තයේ කෝ පන්යි නගරය

තායිලන්තය යනු සංචාරක පුරවරයකි. එරට ප්‍රධාන ආදායම් මාර්ගයක් වන්නේ සංචාරක කර්මාන්තයයි.

එරට ඉදි කිරීම් බොහොමයක්ද සංචාරක කර්මාන්තය පදනම් කර ගනිමින් සිදු කෙරේ. සාගරය මත ඉදි කර ඇති ‘කෝ පන්යි’ නගරයද අයත් වන්නේ එකී සංචාරක ආකර්ෂණ සහිත ඉදිකිරීම් අතරටය. මේ නගරය පිහිටා ඇති දූපත ආශ්‍රිතව දහ අටවන සියවස දක්වා විහිද යන අතීතයක් පැවතියේ ධීවර ගම්මානයක් වශයෙනි.

එහෙත් විසිඑක්වැනි සියවස එළඹුණු පසුව සංචාරක කර්මාන්තයේ වැදගත්කම වටහා ගත් පසු මෙය නගරයක් ලෙස විධිමත් ඉදිකිරීම් යටතේ සංවර්ධනය කරනු ලැබීය.

අද වන විට පූකට් දූපතට පැමිණෙන සංචාරකයන් විශාල වශයෙන් කෝ පන්යි නගරයට ද පැමිණෙන අතර ඔවුන්ගේ දිවා ආහාරය ඇතුළු අවශ්‍යතා රැසක් මේ දූපතේදී සම්පූර්ණ කෙරේ.

මෙක්සිකෝවේ වැනීසිය

සංචාරකයන් ආකර්ෂණය කර ගැනීමේ අරමුණින් ඉදි කළ මෙක්සිකෝවේ මෙක්සිකැල්ටිනන් නගරය අද හැඳින්වෙන්නේ මෙක්සිකෝවේ වැනීසිය යනුවෙනි.

කුඩා ස්වභාවික දූපතක් පදනම් කර ගනිමින් ඉදි කළ මේ නගරය දිනෙන් දින එහි භූමි ප්‍රමාණය වැඩි කර ගනිමින් සිටී. වියළි කාලයට මේ නගරය අනෙකුත් සෑම දූපතක් සේම දිස් වුවද වර්ෂා කාලයට එහි පාරවල් මුහුදු ජලයෙන් වැසී යන බැවින් මහත් සංචාරක ආකර්ෂණයට ලක් වේ.

මේ වන විට දූපතේ ස්ථිර පදිංචිකරුවන් 800ක් පමණ වෙසෙන අතර ඔවුන්ගේ ප්‍රධාන ආදායම් මාර්ගයද වන්නේ සංචාරක කර්මාන්තයයි.

සිංගප්පූරුවේ වරාය නගරය

ස්වභාවික සම්පත් කිසිත් නොමැති වුවද තම භූමියෙන් උපරිම ප්‍රයෝජන ගත් රටක් ලෙස සිංගප්පූරුව දැක්විය හැකිය.

සිංගප්පූරුව තම රටට ආදායම් ඉපදවීමේදී සෙසු රටවල් කිසිත් සැලකිල්ලක් නොදැක්වූ බොහෝ දේ ඉතා ප්‍රයෝජනවත් ලෙස යොදාගත්හ. ඔවුන් තම රට සතු වරාය ඉතා වැඩදායී ලෙස යොදාගත්තේ ඒවායේ කටයුතු මඟින් මහත් ධනයක් රටතුළට ගෙන එමිනි. දැන් ඔවුන් විසි එක්වැනි සියවසේදී ලොවට හඳුන්වාදීමට කටයුතු කළ පුදුමය ලෙස ඔවුන්ගේ ‘වරාය නගරය’ දැක්විය හැකිය. සිංගප්පූරුව සතු ආදායම් උපදවන ප්‍රධාන මාර්ගයක් වූ වරාය කේන්ද්‍ර කර ගනිමින් ඉතා විධිමත් සේවා සැපයීමේ මධ්‍යස්ථානයක්, පරිපාලන නගරයක් සහ සන්නිවේදන මධ්‍යස්ථානයක්, ජනතා මෙන්ම සංචාරක ආකර්ෂණය දිනා ගන්නා ප්‍රදේශයක් ලෙස මෙම වරාය නගරය ඉදි කිරීම සහ දියුණු කිරීම සිංගප්පූරුවේ අභිප්‍රාය විය. මෙය සමස්ත ආසියාවේ බිහිදොර ලෙස සිංගප්පූරු විශ්ලේෂකයන්ගේ අදහස විය. එපමණක් නොව මුළු ලෝකය එකට බැඳ තබන මධ්‍යස්ථානයක් ලෙසද සිංගප්පූරුව තම වරාය නගරය හඳුන්වා තිබේ.

ජපාන වරාය නගරය

ජපානය වඩාත් විශාල ආර්ථික අරමුණු පදනම් කර ගනිමින් පාවෙන නගරයක් මුහුද මත ඉදිකිරීමේ අභිප්‍රායෙන් පසුවේ. ඔවුන් මෙහි වැඩ නිම කිරීමට බලාපොරොත්තු වන්නේ 2025 වසරේදීය.

දූපත් රාජ්‍යයක් ලෙස කොයි පැත්තෙන් බැලුවත් මුහුද හමුවන ජපානය මුහුද මත නගර ඉදි කිරීම පුදුමයක් නොවේ. සැබවින්ම මේ නගරය ඉදි කිරීමේ ප්‍රධාන අරමුණ ජනතාවට වඩාත් සුවපහසු පදිංචි ස්ථාන ලබා දීම බව පැවසෙන අතර ඒ අතරට මැදි වූ ආර්ථික අරමුණුද රාශියක් තිබේ. මේ නගරය ඉදි කිරීමෙන් පසු දහස් ගණනක් ජනතාවට නිවාස ද අහස උසට උසැති ගොඩනැගිලිවල ඉදිකෙරෙනු ඇති අතර, ජපානය සෑම අවස්ථාවකදීම මුල් තැන දුන් අන්දමට මේ නගරය ආශ්‍රිතව වනාන්තර ඇති කිරීමටද නියමිත බව පැවසේ.

ගුවාතමාලාවේ ෆ්ලොරිස් නගරය

අතීතයේදී ඉතා කුඩා ජනාවාසයක්ව පැවති පසුකාලීනව දැවැන්ත ඉදිකිරීමක් බවට පත්වූ ගුවාතමාලාවේ ෆ්ලොරිස් නගරය මුළුමනින්ම සංචාරක ආකර්ෂණය මත පවතින්නකි. නගරය ඉතා විධිමත් ලෙස ඉදි කර ඇත්තේ සංචාරකයන් ආකර්ෂණය කර ගැනීම අරමුණු කර ගනිමිනි. අහසට ඉතා සුන්දර ලෙස දිස්වන අන්දමින් මේ නගරයේ සියලු ගොඩනැගිලිවල වහල රතු පැහැ ගත් සෙවිලි උළු වලින් ආවරණය කර තිබේ. එයද මේ නගරයේ සුවිශේෂීත්වයකි.

2003 වසර වන විට මේ නගරයේ ස්ථිර පදිංචිකරුවන්ගේ සංඛ්‍යාව 13,000 ඉක්මවා තිබිණි.

ඉතා පටු ගොඩබිම් තීරුවකින් ගොඩබිම සමඟ සම්බන්ධව වන මේ නගරය ඒ හැර සම්පූර්ණයෙන්ම සාගරයෙන් වටවී තිබේ.

ඩුබායි හි සාගරය මත ඉදිකළ දූපත්

නව සියවසට කල් තබා සැලසුම් කළ නගරයක් ලෙස ඩුබායි දැක්විය හැකිය. ඩුබායි හි පාලකයෝ අනාගතය වෙනුවෙන් සැලසුම් සකස් කර සිටියේ වසර ගණනක ඉදිරිය සැලසුම් කරමිනි.

ඒ අනුව සාගරය ගොඩ කරමින් ඒ මත සංචාරක ආකර්ෂණය දිනා ගන්නා කෘත්‍රිම දූපත් ඉදි කිරීමට ඔවුන් කටයුතු කළේ අදට දශක කිහිපයකට පෙර සිටමය. මේ වන විට ඩුබායි නගරය සතුව එවැනි කෘත්‍රිම දූපත් රාශියක් තිබේ. මේවා සංචාරක ආකර්ෂණය සහිත හෝටල් සහ නිවාස මෙන්ම බහුකාර්ය මධ්‍යස්ථාන වශයෙන්ද ක්‍රියාත්මක වේ. ඒ අතරින්ද ඉතාම ප්‍රසිද්ධ නිර්මාණය වන්නේ ‘පාම් ජුමේරා’ කෘත්‍රිම දූපත් සමූහයයි.

එය ඩුබායි කාන්තාරයේ වැවෙන ප්‍රධානම ශාකයක් වන ‘පාම්’ ගසේ අත්තක හැඩයට ඉතා සුන්දර ලෙස නිර්මාණය කර තිබේ.

. අරාබි මුහුදේ නිර්මාණය කර ඇති ඩුබායි නගරයට අයත් දූපත්

එමෙන්ම මේ සුන්දර නිර්මාණය දැනට ලෝකයේ මිනිසා විසින් ගොඩනගා ඇති විශාලතම දූපත ලෙසින්ද ඉතිහාසයට එක්ව තිබේ.

මේ දූපත වටා කිලෝමීටර් 5.4ක් දුරක ගමන් ගන්නා මොනෝ රේල් මාර්ගය මෙහි තවත් එක් විශේෂත්වයක් බවද පැවසිය යුතුය. මේ හැරුණු විට තවත් මිනිසා විසින් නිෂ්පාදිත කෘත්‍රිම දූපත් රාශියක්ම ඩුබායි නගරය ආශ්‍රිතව මහ මුහුද මත ඉදි කර තිබේ.

ඉන්දුනීසියාව

මේ වන විට ඉන්දුනීසියාවේ අගනුවර ලෙස පවතින්නේ ජාකර්තා නගරයයි. අනාගතයේදී එම නගරය ජලයෙන් යටවිය හැකි බවට අනාවැකි ප්‍රකාශ වී ඇති බැවින් නුදුරේදීම නව අගනුවරක් ඉදිකිරීම සම්බන්ධව ඉන්දුනීසියානු බලධාරීන්ගේ අවධානය යොමු වී තිබේ.

බෝර්නියෝ දූපතේ ඉදිකිරීමට නියමිත මේ නගරයද ජලාශ්‍රිතව ඉදිවනු ඇති බවට අනාවැකි පළවී තිබේ.

ඉන්දුනීසියාව යනු දූපත් රාශියක එකතුවකි. එබැවින් සාගර ජලය මත ජීවිතය එරට වැසියන්ට අමුතු දෙයක් නොවේ. ඉදිරියේදී ඉදි කෙරෙනු ඇති මේ අගනුවර ඉතා විධිමත් ලෙස. සැලසුම් සහගතව ඉදිකිරීමටත් ජාත්‍යන්තරය සමඟ සම්බන්ධ වන මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක කිරීමටත් එරට බලධාරීහු මේ වන විට කටයුතු කරමින් සිටිති.

මේ උදාහරණවලට අමතරව තවත් රටවල් රාශියක් තමන්ට හිමි සාගරය මත නගර ඉදි කිරීමේ බලාපොරොත්තු මත මේ වන විටත් ක්‍රියාත්මක වෙමින් සිටිති.

ඔවුන්ගේ බලාපොරොත්තුව වී ඇත්තේ වර්ධනය වන ජනගහණයට සාපේක්ෂව ගොඩබිමද වර්ධනය කර ගැනීම මෙන්ම විධිමත් නගර ගොඩනගා ගැනීමයි.

පවතින බිමේ නගර ඉදිකිරීමට වඩා විධිමත් ලෙස සාගරය ආශ්‍රිතව නගර ඉදි කළ හැකි වීම මේ සම්බන්ධව වඩාත් අවධානය යොමු වීමට හේතුවක් වී තිබේ.

නෙදර්ලන්තයද තවත් ස්කැන්ඩිනේවියානු රටවල්ද ප්‍රංශය මෙන්ම ජර්මනියද මෙවැනි සාගර නගර ඉදිකිරීම කෙරෙහි අවධානය යොමු කර ඇතැයි වාර්තා වේ.

සක්වළගල

● ටිරෝනි වෑවලගේ

සිළුමිණ වාණිජ මණ්ඩලී මෙම පිටු එකතුව ව්‍යාපාරික ඔබ වෙනුවෙන්ම සැකසෙන විශේෂ අතිරේකයකි. ඔබේ දේශීය-විදේශීය ව්‍යාපාර පුවත්, ප්‍රවෘත්ති නිවේදන, ඡායාරූප සහ නවතම පුවත් අප වෙත යොමු කරන්න. සුළු, මධ්‍ය සහ මහා පරිමාණ ව්‍යාපාරික තොරතුරු සමාජයට විවර කිරීමට ඔබ පවත්වන මාධ්‍ය සාකච්ඡා සහ ගවේෂණ චාරිකාද යොමු කරන්නේ නම් මැනවි. සියලු ලිපි පහත ලිපිනයට පමණක් එවිය යුතු වේ. සිළුමිණ වාණිජ මණ්ඩලී, ලේක්හවුස් - කොළඹ 10.

හෙට ලොවට මඟ කියන ව්‍යාපාරික අත්වැල

දුරකථන : කර්තෘ - 011 2429261
දැන්වීම් කළමණාකරු - 011 2429429 දිගුව 351
විද්‍යුත් ලිපිනය : edmediaunit@gmail.com

වාණිජ මණ්ඩලී

ක්‍රිස්බ්‍රෝ කාන්තා ශ්‍රම බළකාය ශක්තිමත් කරයි

ශ්‍රී ලංකීය ශ්‍රම බළකායෙහි කාන්තා නියෝජනය පුරුෂයන්ට සාපේක්ෂව අඩු අගයක් ගන්නා අතර 35ක අගයකින් පැවති කාන්තා දායකත්වය කෝවිඩ් 19 වසංගතයේ බලපෑමත් සමගම තවදුරටත් අයහපත් අතට පත් විය. වර්තමාන තත්වය මෙලෙස පැවතියද මෙරට විශාලතම කුකුළු මස් නිෂ්පාදන සමාගම වන ක්‍රිස්බ්‍රෝ ග්‍රාමීය කාන්තාවන් මූල්‍යමය හා සාමාජීය ලෙස සවිබල ගන්වමින් මෙරට ආර්ථිකය නැංවීම සඳහා කාන්තා ශ්‍රම දායකත්වය ඉහළ නැංවීම සඳහා පියවර ගෙන ඇත.

පසුගිය වසර කිහිපය මුළුල්ලේම රැකියා විරහිත කාන්තාවන් ආර්ථික හා සාමාජීය වශයෙන් සවිබල ගැන්වීම සඳහා ක්‍රිස්බ්‍රෝ සමාගම විසින් විවිධ පළාත්වල පවත්වාගෙන යනු ලබන කර්මාන්තශාලා සහ ගොවිපළ ආශ්‍රිතව රැකියා දහස් ගණනක් ග්‍රාමීය කාන්තාවන් වෙත ලබා දී ඇත. ක්‍රිස්බ්‍රෝ සමාගම විසින් පවත්වාගෙන යන කුකුළු ගොවිපළ ආශ්‍රිතව රැකියා 350ක් සහ කුඩා පරිමාණ කුකුළු ගොවිපළ හිමිකරුවන් 250 දෙනෙකු ආශ්‍රිතව ජීවනෝපාය මාර්ග ලබා දීමට ද ක්‍රිස්බ්‍රෝ සමාගම පියවර ගෙන ඇති අතර මින් බහුතරය කාන්තාවන් වේ. එමෙන්ම ක්‍රිස්බ්‍රෝ සමූහය සමඟ සම්බන්ධ වීම නිසාම මෙම කාන්තාවන්ගේ ජීවන තත්වය සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ අධ්‍යාපන, සෞඛ්‍ය, අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා මෙම ආදායම් මාර්ග සැලකිය යුතු දායකත්වයක් ලබා දෙයි.

වාහන එකලස් කිරීම වෙනුවෙන් රජයට CMTA ප්‍රශංසා

ශ්‍රී ලංකාවේ වාණිජ මණ්ඩලයට අනුබද්ධිත දශක 10ක ඉතිහාසයක් හිමි සිලෝන් මෝටර් ට්‍රේඩර්ස් සංගමය (CMTA), රථ වාහනවල දේශීය එකලස් කිරීමේ හා දේශීය අගය එකතු කිරීමේ කර්මාන්ත අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද, නව ප්‍රමිති මෙහෙයුම් ක්‍රියා පටිපාටියෙහි (SOP) ප්‍රායෝගික භාවිතාව පිළිබඳව අදහස් දක්වයි. මාර්තු 15 දින නිකුත් වූ මෙම ක්‍රියා පටිපාටියෙ හි ප්‍රධාන කාරණා පිළිබඳව CMTA අවධානය යොමු කරයි. ඉන් පළමුවැන්න නම්, මෙම ප්‍රතිපත්ති කර්මාන්ත අමාත්‍යාංශය විසින් ගෝලීය රථ වාහන නිෂ්පාදකයන්ගේ අන්තර්ගතයන්ගෙන් තොරව නිර්මාණය කරනු ලැබීමයි. ඔවුන්ගේ අත්දැකීම් හා තීක්ෂණ බුද්ධිය වඩාත් ක්‍රමවත් ප්‍රමිති මෙහෙයුම් ක්‍රියා පටිපාටියක් (SOP) නිර්මාණය කිරීමට දායක වන අතර ඉන් වාහන එකලස් කිරීමේ කර්මාන්තයේ තිරසර සාර්ථකත්වය ගොඩ නැගෙනු ඇත.

සිලෝන් මෝටර් ට්‍රේඩර්ස් සංගමයේ සභාපති යසේන්ද්‍ර අමරසිංහ 'ශ්‍රී ලංකාවේ දේශීය වාහන එකලස් කිරීම ප්‍රවර්ධනය වෙනුවෙන් රජය ගෙන ඇති පියවර අපි ප්‍රශංසා කරනවා. එසේම මේ වෙනුවෙන් අපගේ සියලු සහයෝගයන් තවදුරටත් ලබා දෙනවා. කෙසේ වෙතත්, මෝටර් රථ කර්මාන්තයට මෙන්ම මූල්‍ය හා රක්ෂණ වැනි ආධාරක කර්මාන්තවලට සැළකිය යුතු බලපෑමක් ඇති කරන එවැනි ප්‍රධාන ප්‍රතිපත්තියක් සඳහා, ප්‍රතිපත්ති රාමුව නිර්මාණය කිරීමේ දී කර්මාන්තයේ පොදුවේ සැලකිය හැකි නියැදියකින් අන්තර්ගතය ලබා ගැනීම අත්‍යවශ්‍ය බව අපි විශ්වාස කරනවා. අවාසනාවකට, අන්තර්ගතය ලබා දීම සඳහා ආරාධනා කර තිබුණේ දැනටමත් රථ වාහන එකලස් කිරීම සිදු කරන සමාගම්වලට පමණක් වීම පිළිබඳව අපි කණගාටු වෙනවා. CMTA සාමාජිකයන් හට කර්මාන්ත අන්තර්ගතය සැපයීමට හා සහභාගී වීමට ආරාධනා කර තිබුණේ නම්, එකලස් කිරීමට උනන්දුවක් දක්වන වෙළඳ නාමයන්ගෙන් සහ දැනටමත් එහි නියැළී සිටින අයගෙන් රජයට වඩා පුළුල් අවබෝධයක් ලබා ගත හැකිව තිබුණා.

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ 114 වැනි වාර්ෂික සැසිවාරය

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ 2020/2021 වසර සඳහා සභාපති ලෙස ඉංජිනේරු කේ. පී. අයි. යූ. ධර්මපාල නිල වශයෙන් හඳුන්වාදීම සිදු වූ 114 වැනි වාර්ෂික සැසිවාරය බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණි. ප්‍රධාන ආරාධිතයා වශයෙන් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කලා පීඨයේ හිටපු පීඨාධිපති සේවාර්ජිත මහාචාර්ය කේ. එන්. ඕ ධර්මදාස සහභාගී වූහ. එහිදී සම්මාන පිරිනමන අයුරු මෙහි දැක්වේ

JF&I පැකේජින් NCE අපනයන විශිෂ්ටතා 2020 සම්මාන දිනයි

දකුණු ආසියාවේ විශාලතම ඇසුරුම් සමාගමක් වන සී/ස ජේ. එෆ්. ඇන්ඩ් අයි. පැකේජින් NCE අපනයන විශිෂ්ටතා සම්මාන උළෙලේ ඇසුරුම් කර්මාන්ත අංශයේ මහා පරිමාණ කාණ්ඩයේ එකම සම්මානලාභියා වෙමින් ලෝකඩ සම්මානය දිනා ගත්තේය. ජාතික අපනයන මණ්ඩලය සංවිධානය කළ සම්මාන රාත්‍රිය කොළඹදී උත්කර්ෂවත් ලෙස පැවැත්විණි. වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු 1978දී ඇරඹූ ජේ. එෆ්. ඇන්ඩ් අයි. පැකේජින් සමාගම ඕෆ්සෙට්, ෆ්ලෙක්සිබල්, පූර්ව මුද්‍රිත, ඩිජිටල් හා ප්ලාස්ටික් යනාදී ඇසුරුම් කර්මාන්තයේ සියලු අංශ ආවරණය කරමින් පූර්ණ විසඳුම් සපයන, ඩොලර් මිලියන ගණනක වත්කම්ඇති, කෙන්යාවේ හා ඩුබායිහි ශාඛා පිහිටි,බංග්ලාදේශයේ හා වියට්නාමයේ ශාඛා පිහිටුවීමට නියමිත දකුණු ආසියාවේ දැවැන්තම ඇසුරුම් සමාගමකි.

OPPO වෙතින් අලුත් අවුරුදු සතුට වෙනුවෙන් අලුත්ම ගීතයක්

ශ්‍රී ලංකාවේ ජනප්‍රියම ජංගම දුරකථන හා උපාංග සන්නාමය වන OPPO මෙවර සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද වෙනුවෙන් නවතම ගීතයක් හඳුන්වා දී තිබේ. මෙය ගායනා කරනු ලබන්නේ OPPO සන්නාම තානාපතිනියක සහ The Voice වැඩසටහනේ පුහුණුකාරිනියක වන ජනප්‍රිය ගායිකා උමාරියා සිංහවංශ විසිනි. මීට අමතරව ජනප්‍රිය රංගන ශිල්පී හා ගායක ගයාන් ගුණවර්ධන සහ නර්තන ශිල්පී රමෝද් මාලක ප්‍රමුඛ Cool Steps නර්තන කණ්ඩායමද මෙම ගීතයට දායක වී ඇත.

සුන්දර ගැමි පරිසරයක රූපගත කර ඇති මෙම ගීතයේ රූප රචනය තුළ සාම්ප්‍රදායික අවුරුදු චාරිත්‍ර නිරූපණය කෙරේ. මෑතකදී වෙළඳපොළට හඳුන්වා දීමෙන් අනතුරුව පාරිභෝගිකයන් අතර ඉක්මනින් ජනප්‍රිය වූ, අලුත් අවුරුදු කාලයේදී විශේෂ දීමනාවන්ද සමඟ මිලදීගත හැකි OPPO F19 Pro දුරකථන මාදිලියද මෙම රූප රචනය තුළදී දැකගත හැක. OPPO F19 Pro දුරකථන මාදිලියේ ප්‍රථම දින අලෙවිය, ඊට පෙර හඳුන්වා දුන් OPPO F17 Pro මාදිලියට සාපේක්ෂව 200% ක වැඩිවීමක් පෙන්නුම් කිරීම විශේෂත්වයකි.

නුගේගොඩ මහජන බැංකුවට ස්වයං බැංකුකරණ ඒකකයක්

බැංකු ඉතිහාසයේ සිය අභිමානවත් 60 වන සංවත්සරය සමරන මහජන බැංකුව සිය ගනුදෙනු කරුවන් හට වඩාත් පහසුකම් සහිත කඩිනම් බැංකු සේවාවක් ලබා දෙමින් 251 වන ස්වයං බැංකුකරණ ඒකකය මහජන බැංකුව නුගේගොඩ ප්‍රධාන ශාඛාවේදී මහජන බැංකුවේ සහකාර සාමාන්‍යාධිකාරී (ශාඛා කළමනාකරණ) ටී. එම්. ඩබ්ලිව්. චන්ද්‍රකුමාර අතින් පසුගියදා විවෘත කරන ලදී. මෙම ස්වයං බැංකුකරණ ඒකකය ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර දෙකකින් හා මුදල් තැන්පතු යන්ත්‍රයකින් සමන්විතය. මේ තුළින් සතියේ සෑම දිනකම දිනපතා පැය විසිහතර පුරාම නොකඩවා මුදල් ආපසු ගැනීම, මුදල් තැන්පත් කිරීම ආදී වඩාත් පහසුකම් සහිත කාර්යක්ෂම බැංකු සේවාවක් ලබා ගැනීමේ අවස්ථාව ගනුදෙනු කරුවන්හට හිමිවේ.

Colombo Expats Cultural වෙතින් චිත්‍ර තරඟයක්

ඉන්දියාව, බංග්ලාදේශය සහ නේපාලය යන රට වලින් පැමිණි 160 කට ආසන්න පිරිසකගෙන් සැදුම් ලත් ශ්‍රී ලංකාව තුළ පවතින විචිත්‍රවත් ප්‍ර ජාවකින් සමන්විත Colombo Expats Cultural Association විසින් දෙවන වරටත් ළමා ආරක්ෂණ නිවාස වල වෙසෙන දරුවන් රැසක් සඳහා මෙහයවනු ලබන චිත්‍ර තරඟය සාර්ථක අන්දමින් සිදු කරන ලදී. මෙම අවස්ථාව අධ්‍යාපන අමාත්‍යාංශය, කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා අමාත්‍යාංශය, පරිවාස හා ළමා ආරක්ෂණ සේවා දෙපාර්තමේන්තුව,ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය ඇතුළු අනෙකුත් සහයෝගිතාවය දක්වන ආයතන රැසකගේ දායකත්වය යුතුව පැවැත් විය.මෙම අවස්ථාව පසුගිය 10 වන දින කොළඹ ටාජ් සමුද්‍රා හෝටල් පරිශ්‍රයේදී පැවැත්වුන අතර ඊට සමගාමීව ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් ද ඊට අමතරව ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බග්ලේ හා කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන අමාත්‍ය, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා අමාත්‍ය පියල් නිශාන්ත ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසක් සහිතව රමණීය සංස්කෘතික අංගයක්ද පැවැත්වුණි.

VIVO, නැවතත් IPL තරගාවලියට අනුග්‍රාහකත්වය ලබා දෙයි

නව්‍ය ගෝලීය ස්මාර්ට් ජංගම දුරකථන සන්නාමයක් වන vivo, 2021 ඉන්දිය ප්‍රිමියර් ලීග් (IPL) තරගාවලිය සඳහා නැවතත් අනුග්‍රාහකත්වය ලබා දෙයි. පසුගිය වසරේ තරගාවලියට ලැබුණු විවේකයෙන් අනතුරුව පෙර පරිදිම vivo මෙවර IPL තරගාවලිය සඳහා අනුග්‍රහය දැක්වීමට සූදානමින් සිටී. මේ හරහා vivo සිය ගනුදෙනුකරුවන්ට සන්නාමය හා බැඳුනු අන්තර් ක්‍රියාකාරී අත්දැකීම් ලබා දීමට කැපවී සිටින බවට සාක්ෂි ලබා දෙයි.

vivo ශ්‍රී ලංකා ප්‍රධාන විධායක නිලධාරී කෙවින් ජියැන්ග් මෙවරද vivo ලබා දෙන අනුග්‍රාහකත්වය පිළිබඳව මෙසේ අදහස් දැක්වීය "IPL තරගාවලිය ඉන්දියාවේ පමණක් නොවෙයි ශ්‍රී ලංකාවෙත් ඉතා ජනප්‍රිය තරගාවලියක්. මෙම තරගාවලිය සඳහා vivo ලබාදෙන අනුග්‍රාහකත්වය නැවත වරක් ලබා දීමට හැකි වීම පිළිබඳව අප ඉමහත් සතුටට පත්වනවා. තාරුණ්‍ය කේන්ද්‍ර කරගත් සන්නාමයක් ලෙස vivo සිය පාරිභෝගිකයන් කේන්ද්‍රකරගත් සේවා සැපයීම කෙරෙහි අවධානය යොමු කර තිබෙනවා. IPL තරගාවලිය ශ්‍රී ලාංකික තරුණ තරුණියන්ගේ වැඩි ආකර්ෂණයක් දිනාගත් තරගාවලියක් වන අතර වසර ගණනාවක් තිස්සේ තරගාවලිය සඳහා vivo හී හවුල්කාරීත්වය පාරිභෝගිකයන් සම්බන්ධතාවය ශක්තිමත් කිරීමට සහ ඔවුන්ට ප්‍රීතිය ගෙන දීමට ඉවහල් වී තිබෙනවා."

පීපල්ස් ලීසිං කුටියක් මාලඹේ Family Cars දී විවෘතයි

ශ්‍රී ලංකාවේ බැංකු නොවන ප්‍රමුඛතම මූල්‍ය සමාගම වන පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් සමාගමේ Family Cars මාලඹේ පරිශ්‍රයේ තම ගනුදෙනුකරුවන්ගේ පහසුව වෙනුවෙන් අලෙවි කුටියක් විවෘත කෙරුණි. කඩුවෙල-මාලඹේ මාර්ගයට මුහුණලා පිහිටි මෙම Family Cars ආයතනයෙහි මෝටර්රථ අලෙවි පරිශ්‍රයට අමතරව නව අලෙවි පරිශ්‍රයක් එහි ඉදිරිපිට පසුගියදා විවෘත කළ අතර එම පරිශ්‍රයෙන් වාහන 125කට වැඩි සංඛ්‍යාවකට ඉඩකඩ පවතින දැවැන්ත මෝටර්රථ ප්‍රදර්ශන පරිශ්‍රයකි. පීපල්ස් ලීසිං සමාගම එහි අලෙවි සම්බන්ධීකරණ කුටියක් ඇරඹීමත් සමගම වාහන මිලදීගන්නා පාරිභෝගිකයන්ට අපහසුවකින් තොරව එම සමාගමේ සුවිශේෂී මූල්‍ය පහසුකම් දැන් ලබාගත හැක.

ලංකා හොස්පිටල්ස් හා ප්‍රීමා එක්වී 'ප්‍රීමාරන් පියවර' හඳුන්වා දෙයි

ජාත්‍යන්තර කීර්තියට පත් සම්මාන ලාභී සෞඛ්‍ය සත්කාරක සේවා සපයන්නකු වන ලංකා හොස්පිටල්ස් සීමාසහිත ප්‍රීමා සිලෝන් සමාගමේ ප්‍රමුඛතම විශ්වසනීය පාරිභෝගිකයන් වෙනුවෙන් ක්‍රියාත්මක 'ප්‍රීමාරන් පියවර'වැඩසටහනේ නිල සෞඛ්‍ය සත්කාර හවුල්කරු බවට පත් වෙයි. 'ප්‍රීමාරන් පියවර' වැඩසටහන යටතේ ප්‍රීමා සමාගමේ ප්‍රමුඛතම පාරිභෝගියන්ට VISA Debit කාඩ් මඟින් රෝහලට ඇතුළත්වීම් හා කාමර ගාස්තු, තෝරාගත් සැත්කම්, භෞත චිකිත්සා, දන්ත හා අක්ෂි සෞඛ්‍යසේවා, රූපලාවණ්‍ය, සෞඛ්‍ය පරීක්ෂණ, කාන්තා සුවතා සහ දියවැඩියා සත්කාර ආදී සේවා රැසක් වට්ටම් සහිතව ලබාගත හැකිය.

'ප්‍රීමාරන් පියවර' වැඩසටහන යටතේ අපේ සේවාවන් ජනතාවට වඩාත් සමීප කරවීමටත් පසුගිය දශක දෙක පුරා අප කෙරෙහි විශ්වාසය තැබූ ප්‍රධාන ආයතනවලට ප්‍රතිලාභ සැපයීමටත් අවස්ථාව ලැබෙනවා. ප්‍රීමා සමාගම අසහාය ව්‍යාපාරික හවුල්කරුවකු වශයෙන් හඳුනා ගන්නා අතර ම ඔවුන්ගේ අඛණ්ඩව වැඩි වන පාරිභෝගිකයන්ට ඉදිරියේදී මීටත් වඩා සහන දායී සේවා සැපයීමට බලාපොරොත්තු ව බව ලංකා රෝහලේ ප්‍රධාන අලෙවිකරණ නිලධාරි නිමල් රත්නායක පැවසීය.

සෙලාන් බැංකුව සහ ටොයෝටා සහයෝගීතාවයක

සුහද හදක් ඇති දේශීය බැංකුව, සෙලාන් බැංකුව සිය ගනුදෙනුකරුවන්ට නවතම ටොයෝටා හා Hino මෝටර් රථ මිලදී ගැනීම වඩාත් පහසුකරමින් වටිනා ලීසිං ප්‍රතිලාභ පිරිනැමීමට කටයුතු කර තිබේ. ශ්‍රී ලංකාවට ටොයෝටා හා Hino සන්නාමයන් යටතේ රථ වාහන ගෙන්වීමේ හා අලෙවිකිරීමේ බලය ලත් අලෙවිනියෝජිතයා වන ටොයෝටා ලංකා (පුද්ගලික)සමාගම වෙතින් සෙලාන් ලීසිං පාරිභෝගිකයන් මිලදී ගන්නා වාහන සඳහා මෙම වටිනා ප්‍රතිලාභ හිමිවනු ඇත.

සෙලාන් බැංකුව සහ ටොයෝටා ලංකා (පුද්ගලික)සමාගම අතර ඇති කරගන්නා ලද මෙම සහයෝගීතාවය නිසා ලීසිං පහසුකම් ලබාගැනීමට සුදුසුකම් ලබන සෙලාන් ගනුදෙනුකරුවන් වෙත නම්‍යශීලී නැවත ගෙවීමේ යෝජනාක්‍රම, විශේෂිත පොලීඅනුපාත, වාහන ලියාපදිංචිය නොමිලේ සිදුකර දීම, මාසෙකට හෝ කිලෝමීටර් 10,000 දක්වා වගකීම් කාලයක්, තමන් කැමති රක්ෂණ සමාගමක් හරහා වට්ටම් සහිත රක්ෂණ වාරික ගෙවීමේ හැකියාව මෙන්ම ටයර්, අමතර කොටස් හා ලිහිසි තෙල්සඳහා වටිනා වට්ටම් යනාදී සුවිශේෂී ප්‍රතිලාභ කිහිපයක්ම හිමි වේ.

සෙලින්කෝ ලයිෆ් ජනප්‍රියම ජීවිත රක්ෂණ සමාගම වෙයි

SLIM ජනතා සම්මාන ප්‍රදානෝත්සවය ආරම්භවූ දා පටන් පිට පිටම වසර 15 ක් මෙරට වඩාත්ම ජනප්‍රිය ජීවිත රක්ෂණ සමාගම බවට පත්වූ එකම ජීවිත රක්ෂණ සමාගම බවට පත්වෙමින් සෙලින්කෝ ලයිෆ් ශ්‍රී ලංකාවේ 'වසරේ ජනතා ජීවිත රක්ෂණ සේවා සම්පාදකයා' ලෙස සම්මානයට පාත්‍ර වූ අතර සමාගම විසින් සිදුකරන අග්‍රගණ්‍ය සේවාව යළි යළිත් ජනතාව විසින් තහවුරු කිරීමක් ලෙසින් මෙම ජයග්‍රහණය පෙන්වා දිය හැකිය. සමාගම විසින් මූල්‍ය වාර්තා එළිදක්වා පිට පිටම 17 වැනි වතාවටත් ශ්‍රී ලංකාවේ ජීවිත රක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා බව තහවුරු කිරීමෙන් මාසයක් ඉක්ම යනවිට සමාගමේ ජනප්‍රියතාවය සැලකිල්ලට ගනිමින් 2021 සම්මාන උලෙළහිදී මෙම සම්මානය ජයග්‍රහණය කිරීම කැපී පෙනේ.

ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය (SLIM) විසින් සිදුකරන ප්‍රධානතම සම්මාන ප්‍රදානෝත්සවය වන SLIM ජනතා සම්මාන මඟින් මෙරට විවිධ අංශවල ආධිපත්‍ය පතුරුවා තිබෙන ප්‍රමුඛතම සම්මාන බුහුමනට ලක් කරයි.

රෙවෝ ඇඩ්වර්ටයිසින් වෙත ව්‍යවසායකත්ව රන් සම්මාන

අලෙවිකරණ සන්නිවේදන හා වෙළෙඳ ප්‍රචාරණ සේවා ආයතනයක් වන රෙවෝ රෙවලූෂන් ඇඩ්වර්ටයිසින් ඒජන්සි ආයතනය බස්නාහිර පළාත් ව්‍යවසායකත්ව 2020 සම්මාන උලෙළේදී කුඩා පරිමාණ අංශයේ සේවා කාණ්ඩයේ විශිෂ්ටතම ව්‍යවසායකයා වශයෙන් සම්මාන දිනාගත්තේය. ජාතික වාණිජ මණ්ඩලය සහ ව්‍යවසායකත්ව සංවර්ධන අධිකාරිය එකව සංවිධානය කළ උළෙල පසුගියදා බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණි. ශ්‍රී ලංකා වේ වරලත් වෙළෙඳ ප්‍රචාරණ ආයතනයක් වශයෙන් පරිපූර්ණ-වෙළෙඳ ප්‍රචාරණ සේවාවන් ලබාදෙන රෙවෝ ඇඩ්වර්ටයිසින් ඕනෑම ව්‍යාපාරයකට අවශ්‍ය අලෙවිකරණය, සන්නාමකරණය ආදී සංකල්ප මූලික කරගත් ප්‍රචාරණ සේවාවන් පිළිබඳ උපදේශනයේ සිට සියලුම සේවාවන් ලබාදෙන ආයතනයකි.

ලිට්‍රෝ ගෑස් වෙතින් LPG ප්‍රිමියම් හයිබ්‍රිඩ් සිලින්ඩරයක්

LPG ක්ෂේත්‍රයේ නව නැම්මක් ඇති කරන ලිට්‍රෝ ගෑස්ලීටර් 18 ප්‍රිමියම් හයිබ්‍රිඩ් සිලින්ඩරයක් ලිට්‍රෝ ගෑස් සමාගම හඳුන්වා දෙයි.

ජාතික LPG සැපයුම්කරු ලෙස වසර 150කට වැඩි උරුමයක් සතු ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම පාරිභෝගික අවශ්‍යතා සඳහා නව්‍ය විසඳුම් ලබාදීමට සැමවිටම ක්‍රියා කරන බව එම සමාගමේ සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි අනිල් කොස්වත්ත පවසයි.

වැඩිවෙමින් පවතින පාරිභෝගික ඉල්ලුමට ප්‍රමුඛතාව දෙමින් LPGසඳහා සුවිශේෂී විසඳුමක් ලෙස ලීටර 18කින් සමන්විත ප්‍රිමියම් හයිබ්‍රිඩ් සිලින්ඩරය ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන බවත් මෙම සිලින්ඩරය ගෝලීය පිවිතරයන්ට අනුකූල වන අතර විශිෂ්ට ආර්ථික ප්‍රතිලාභ ලබාදෙමින් ශ්‍රී ලංකාවේ LPG ක්ෂේත්‍රයේ නවතම වෙනසක් සිදුකිරීමට බලාපොරොත්තු වන බවත් ඔහුගේ අදහසයි.

රුපියල් 1,395.00ක මිලකට ලබාදෙන ලීටර් 18 ලිට්‍රෝ ප්‍රිමියම් හයිබ්‍රිඩ් සිලින්ඩරය සිවුදෙනෙකුගෙන් යුත් පවුලක මාසික LPGඅවශ්‍යතාවට සරිලන බව ආයතනය පවසයි.

ගෝඨාභය රාජපක්ෂයන්ගේ මඟ පෙන්වීම හා "සෞභාග්‍යයේ දැක්ම"රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව LPG මිල ගණන් වසරකට වැඩිකාලයක් ස්ථාවරව පවත්වා ගෙන යෑමෙන් අපගේ පාරිභෝගිකයන්ට විශාල ආර්ථික ප්‍රතිලාභ ලබා දීමට අපට හැකිවූ අතර අපගේ මේ නව නිෂ්පාදනය එම පොරොන්දුවට ඉමහත් වටිනාකමක් එක්කරනු ඇතැයි අපි විශ්වාස කරන්නෙමු යැයි ආයතනය පවසයි.

75% කට වැඩි වෙළඳපොළ කොටසක් හිමිකර ගනිමින් LPG ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා ලෙස ලිට්‍රෝ ගෑස් සමාගම සිය පාරිභෝගිකයන්ගේ විශ්වාසය අඛණ්ඩව තහවුරු කර තිබේ.

කර්මාන්ත අමාත්‍ය විමල් වීරවංශයන්ට උපහාර

දේශීය ලෝහ වාත්තු කර්මාන්තය නගා සිටුවමින් ජාතික කර්මාන්තකරණයට ඉටු කරන ලද අනුපමේය මෙහෙය වෙනුවෙන් කර්මාන්ත අමාත්‍ය විමල් වීරවංශට උපහාර පිදීම 08 රාත්‍රී බත්තරමුල්ල චෝටර්ස් එජ් හෝටලයේ දී 'කිණිහිරයේ පිපුන මල' නම් වූ විශේෂ ප්‍රණාම උළෙළකදී සිදු කෙරිණි.

වසර 20ක් තිස්සේ නොවිසඳී තිබුණු දේශීය ලෝහ වාත්තුකරුවන්ට අවශ්‍ය අමුද්‍රව්‍ය හිඟයට මග පාදමින් ලෝහ සුන්බුන් අපනයනය ඇතුළු එම කර්මාන්ත ක්ෂේත්‍රයේ ගැටලු රැසක් අමාත්‍ය මණ්ඩලයේ ද අනුමැතිය සහිතව විසඳීමට කර්මාන්ත අමාත්‍යවරයා ඉතා කෙටි කලක් තුළ කටයුතු කිරීම හේතුවෙන් මෙවැනි ප්‍රණාම උළෙලක් සංවිධානය කළ බව දේශීය ලෝහ වාත්තුකරුවන්ගේ සංගම් එකමුතුව පවසයි.

ඇලුමිනියම් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත සංවර්ධන සමුපකාර සමිතිය, සී/ස සුළු හා මධ්‍ය පරිමාණ චීන-ටිචටිටි වාත්තු කර්මාන්තකරුවන්ගේ සංගමය, සමස්ත ලංකා ලෝහ වාත්තුකරුවන්ගේ සංගමය යන ප්‍රමුඛතම දේශීය ලෝහ වාත්තුකරුවන්ගේ සංගම් ඇතුළු සෙසු සංගම් මෙම ප්‍රණාම උළෙල සංවිධානය කොට තිබිණි.

මෙම ප්‍රණාම උළෙලට බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍ය දයාසිරි ජයසේකර, වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය ප්‍රසන්න රණවීර, රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගාමිණී වලේබොඩ, කඩුවෙල නගරාධිපති බුද්ධික ජයවිලාල්, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති උපසේන දිසානායක ද එක්ව සිටියහ.

රෝයල් පෝර්සිලේන් හීට් ඉන්සියුලේටරයක් නිෂ්පාදනය කරයි

ඉතාමත් අනර්ඝ තත්ත්වයේ සුදු හා සැරසිලි සහිත පෝසිලේන් නිෂ්පාදන මහා පරිමාණයෙන් සිදුකරන රෝයල් ෆර්න්වුඩ් පෝර්සිලේන් ලිමිටඩ් සමාගම විසින් පසුගියදා ඉතාමත් හුරුබුහුටි සහ වැදගත් ඉංජිනේරුමය උපාංගයක් ලෙස නවසීලන්තයේ රැකෝන් ලිමිටඩ් සමාගම සඳහා හීටර් ඉන්සියුලේටරයක් නිෂ්පාදනය කරන ලදී. රැකෝන් ලිමිටඩ් යනු ලෝකයේ ප්‍රමුඛතම සංඛ්‍යාත පාලන විසඳුම් නිර්මාණය සහ නිෂ්පාදනය කරමින් සබඳතා සහ සන්නිවේදන ක්ෂේත්‍රයේ ඉහළින්ම වැජඹෙන ගෝලීය ඉහළ තාක්ෂණික ආයතනයක් වේ. රෝයල් ෆර්න්වුඩ් විසින් නිෂ්පාදනය කර තිබෙන මෙම හීටර් ඉන්සියුලේටරය උෂ්ණත්ව කුහර තුළ සෙල්සියස් අංශක සෘණ 60 සිට සෙල්සියස් අංශක 120 ක් දක්වා භාවිතා කළ හැකි අතර එය රත්කරනු ලබන්නේ තෙකලා විදුලි බලය මඟිනි. ඉතාමත් තදින් රත්වීම සිදුවන උපකරණවල හීටර් කොයිල් එක රැඳවීම සඳහා මෙම හීටර් ඉන්සියුලේටරය භාවිතා කරයි.

රෝයල් ෆර්න්වුඩ් පෝර්සිලේන් ලිමිටඩ් සමාගම මෙම හීටර් ඉන්සියුලේටරය හඳුන්වාදීමත් සමඟ පෝර්සිලේන් පිඟන් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ සිට පෝර්සිලේන් ආශ්‍රිත සියලුම නිෂ්පාදන සිදුකරන සමාගමක් බවට මෙය පරිවර්තනය වී තිබේ. සමාගමේ නිෂ්පාදන ධාරිතාවය වර්ධනය කරගැනීමට තිබෙන හැකියාව තුළින් මෙම පරිවර්තනයට මග පෑදී තිබෙන අතර ඕනෑම පෝසිලේන් නිෂ්පාදනයක සිට පෝර්සිලේන් අමුද්‍රව්‍යය නිෂ්පාදනය කිරීම දක්වා මේ තුළින් සමාගමේ ධාරිතාවය වර්ධනය වී තිබීම කැපී පෙනේ.

ගොවියා කැටුව පෙරට යන DPGV

දේශීය කෘෂිකර්මාන්තය නගා සිටුවමින් මෙරට කෘෂි අස්වැන්න සහ එය පාදකකරගත් නිෂ්පාදන ලොව පුරා ප්‍රචලිත කිරීමේ අරමුණින් ආරම්භ කෙරුණු ඩී පී ග්ලෝබල් වෙන්චර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (DPGV) අදවනවිට මෙරට ගොවියා තුළ මෙන්ම පාරිභෝගිකයන් තුළ ද විශ්වසනීය නමක් හිමිකරගෙන ඇත.

ඩේවිඩ් පීරිස් සමූහ ව්‍යාපාරයේ සාමාජිකයෙකු ලෙසින් මෙරට සෑම මට්ටමකම ජනතාවට සමීප වෙමින් දිවයින පුරා විහිදුණු ගොවි නියෝජිත ජාලයක් පිහිටුවා ගැනීමට ඩී පී ග්ලෝබල් වෙන්චර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමට මේ වන විට හැකියාව ලැබී ඇත.

කාබනික කෘෂිකර්මාන්තය පෙරටු කොට ගත් මෙම ගමනේදී ගොවිතැන සඳහා යොමු වී සිටින ගොවි ජනතාවට තම වගා කටයුතු සඳහා අවශ්‍ය දැනුම මෙන්ම ඔවුන්ගේ අස්වැන්න ද හොඳ මිලකට මිලදී ගැනීම හරහා කෘෂිකර්මාන්තයට නව ගැම්මක් ලබාදීමට ද ගොවි ජනතාවගේ ඉදිරි පරම්පරාව ද දියුණු තාක්ෂණ ක්‍රම ඔස්සේ ගොවිතැනට දිරිගැන්වීම ද සිදු කර තිබේ.

ගොවීන්ගේ අතිරික්ත නිෂ්පාදන මිලදී ගෙන ගබඩා කරමින් අගය එකතු කළ ආහාර නිෂ්පාදන රැසක් ද මේ වන විට DPGV වෙතින් වෙළෙඳ පොළට නිකුත් කර ඇත. එපමණක් නොව දිවයින පුරා පිහිටි ඩේවිඩ් පීරිස් මෝටර් කම්පැනි ප්‍රදර්ශනාගාරවල මෙන්ම ඇසටලයින් ලීසිං ශාඛා වල පිහිටුවා ඇති DPG Agri & Farm Shop වෙතින් ද මෙම නිෂ්පාදන මිලට ගැනීමේ අවස්ථාව දිවයින පුරා පාරිභෝගිකයන්ට උදාකර දී ඇත.

රාජකීය දිවිපෙවෙතකට 'The Palace Gampaha'

ශ්‍රී ලාංකීය නිවාස හා දේපොළ වෙළෙඳ ක්ෂේත්‍ර යේ වෙළෙඳපොළ නායකත්වය උසුලන සහ සුඛෝපභෝගී නිවාස ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර සම්මානයෙන් පිදුම් ලද ප්‍රයිම් සමූහය සිය සුපිරි නිවාස ව්‍යාපෘතීන් අතරින් නවමු සංකල්පයක් සමග 'The Palace Gampaha' පසුගියදා ආරම්භ කරන ලදි. පුළුල් පරාසයක විහිද සිටින විවිධත්වයෙන් යුතු සිය ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා ප්‍රශස්ත ලෙස සපුරාලීමට, ප්‍රයිම් ලියිම් සමූහය සුඛෝපභෝගී නාගරික ජීවිතය සඳහා අවශ්‍ය සියලු පහසුකම්වලින් සමන්විතව ගම්පහ නගරයට සමීපව මෙම සහාධිපත්‍යය

නිවාස ව්‍යාපෘතිය ඉදිකරනු ඇත. 'The Palace Gampaha'සුඛෝපභෝගී සහාධිපත්‍ය (Condominium) නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම් පරිශ්‍රය අක්කර 13කට වැඩි වපසරියක් පුරාවට දිවයන අතර නුවර කොළඹ ප්‍රධාන මාර්ගයට මීටර් 100ක් තරම් ආසන්නයෙහි මෙම නිවාස සංකීර්ණය ඉදිවනු ඇත. ගම්පහ නගරයට කිලෝමීටර් 2ක් තරම් සමීපයෙහි පිහිටි බැවින් ගම්පහ නගරයෙහි පිහිටි සියලු ප්‍රධාන පෙළේ පාසල්, රෝහල්, සාප්පු සංකීර්ණ, අධ්‍යාපන ආයතන, සිනමාශාලා සහ විනෝද මධ්‍යස්ථානයන්, වැනි පොදු ස්ථානයන් වෙත පහසුවෙන් පිවිසීමේ හැකියාව ඇත.

අධිවේගී මාර්ගයෙහි එක් පිවිසුමක් ආසන්නයෙහි මෙම නිවාස සංකීර්ණය පිහිටා ඇති බැවින් විනාඩි 5ක් තුළ කොළඹ මහනුවර අධිවේගී මාර්ගය වෙත ප්‍රවේශ වීමේ අවස්ථාව පවතී

COMMERCIAL BANK

නිව් හොලන්ඩ් ට්‍රැක්ටර් සඳහා අඩුම ලීසිං වාරික

කොමර්ෂල් බැංකුව යළිත් ඇසෝසියේටඩ් මෝටර්වේස් ප්‍රයිවට් ලිමිටඩ් (AMW) සමාගම සමඟ එක්ව තවත් ඇග්‍රිලීස් ප්‍රවර්ධන වැඩසටහනක් ආරම්භ කර තිබෙන හෙයින් ගොවීන් නිව් හොලන්ඩ් ට්‍රැක්ටර් මිලදීගන්නා විට යළිත් අඩුම මාසික ලීසිං වාරික මුදල් සහ අනිකුත් ප්‍රතිලාභ ලබාගැනීමේ අවස්ථාව උදාවී ඇත.

කෘෂිකාර්මික කටයුතුවලින් ජීවනෝපාය සලසා ගන්නා කොමර්ෂල් බැංකුවේ ගනුදෙනුකරුවන්ට සහයෝගය දැක්වීම සඳහා මෙම ප්‍රවර්ධන වැඩසටහන ආරම්භ කර තිබෙන අතර එය 2021 ජූනි 30 වැනිදා දක්වා බල පැවැත්වේ. බැංකුව සඳහන් කරන්නේ මෙම යෝජනා ක්‍රමය යටතේ ට්‍රැක්ටර් මිලදී ගන්නා ගනුදෙනුකරුවන්ට අඩුම ලීසිං වාරික මුදල් වලට අමතරව ඇග්‍රිලීස් ලීසිං' වෙතින් තවත් අගය එකතු කිරීම් සහ ප්‍රතිලාභ ලබාදෙන බවයි.

ලීසිං ගැනුම්කරුවන්ගේ ආදායම් වැඩි වන අවස්ථාවල වැඩි වටිනාකමක වාරික ගෙවීමටත් ආදායම් අඩුවන විට අඩු වටිනාකමක වාරික ගෙවීමටත් අවස්ථාව ලබාදීම මෙම ප්‍රවර්ධන වැඩසටහන යටතේ ලබාදෙන තවත් ප්‍රතිලාභයක් වේ. ඕනෑම කොමර්ෂල් බැංකු ශාඛාවක් වෙත හෝ AMW ප්‍රදර්ශනාගාරයක් වෙත ගොස් ගොවීන්ට මෙම ප්‍රතිලාභය ලබාගත හැකිබව බැංකුව සඳහන් කරයි.

ලංකා රෝහල් හෙද විදුහල තවත් හෙද කණ්ඩායමක් බිහිකරයි

ශ්‍රී ලංකාවේ සෞඛ්‍යසේවා සැපයීමේ පුරෝගාමියකු වන ලංකා හොස්පිටල්ස්හි හෙද විද්‍යාලයේ 2019 කණ්ඩායමේ හිස්වැසුම් පැලැඳවීමේ උත්සවය පසුගියදා පැවැත්විණ. 2001 වර්ෂයේදී ඇරැඹි ලංකා හොස්පිටල් හෙදපුහුණු විද්‍යාලය වාර්ෂිකව හෙදියන් 60ක් පමණ පුහුණු කරන අතර 2019 කණ්ඩායමට හෙදියෝ 52ක් ඇතුළත් වූහ. අලුතින් හඳුන්වා දෙන ලද ජාතික වෘත්තීය සුදුසුකම් 6 වැනි මට්ටම (NVQ Level 06, Higher National Diploma) යොදා ගන්නා මෙරට ප්‍රථම හෙද විදුහල වන ලංකා හොස්පිටල්ස් හෙද විදුහල පුහුණු හෙදියන් බිහිකිරීමේ 100%ක සාර්ථකත්වයක් පෙන්වයි. සියලු දේශන ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වමින් උසස් ප්‍රමිතියක පුහුණුවක් සපයන අතර එමඟින් සිසුන්ට රැකියා අවස්ථාද විවෘත කරයි. ශ්‍රී ලංකාවේ පෞද්ගලික රෝහල් අතරින් ලංකා හොස්පිටල්ස් හෙද පාඨමාලාව ඉහළම මට්ටමක පවතින බව බොහෝ දෙනාගේ විශ්වාසයයි.

හෙද විදුහලේ සාමාන්‍ය පුහුණු පාඨමාලාව සාර්ථකව නිමකරන සිසුහු ලංකා රෝහලේ හෙද අංශයට බඳවා ගැනීමට සුදුසුකම් ලබති.

රුපියල් 50,000ක් තෑගි ගෙනෙන සිළුමිණ දැනුම මිනුම පැන විසඳුම : 2021 අප්‍රේල්

කොන්දේසි

1. ඩේන්ටි පැන විසඳුම සඳහා මසකට රුපියල් 50,000ක මුදලක් ජයග්‍රාහකයන් 10 දෙනකු අතර බෙදී යයි.

2. තෝරාගන්නා නිවැරැදි පිළිතුරු පත් 10කට රුපියල් 5,000 බැගින් මුදල් තෑගි පිරිනැමේ.

3. තරගකරුවකුට සිළුමිණ පුවත්පතේ පළවන මෙම කූපනය පමණක් පුරවා ඕනෑම විසඳුම්පත් ප්‍රමාණයක් එවිය හැකිය.

4. මෙහි ඇති පැන විසඳුම් කූපනය පුරවා ලියුම් කවරයක බහා, සිළුමිණ දැනුම මිනුම, ඩේන්ටි පැන විසඳුම් - 2021 අප්‍රේල්, සිළුමිණ, ලේක්හවුස්, කොළඹ 10. යන ලිපිනයට 2021 මැයි 15 දිනට පෙර එවිය යුතුය.

5. ජයග්‍රාහකයන් තෝරා ගනු ලබන්නේ කූසපත් ඇඳීමෙනි. ජයග්‍රාහකයන්ගේ ප්‍රතිඵල පුවත්පතේ පළ වී තෙමසක් ඇතුළත ත්‍යාග මුදල් පිරිනැමේ. අදාළ ත්‍යාග මුදල නොලැබුණහොත් පමණක් සිළුමිණ කර්තෘ මණ්ඩලය දුරකතන 011-2429265 මඟින් ඇමතිය හැකිය.

6. ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ සේවකයන්ට හෝ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට තරගය සඳහා ඉදිරිපත් විය නොහැකිය.

සම්බන්ධීකරණය - ගාමිණී රූපානන්ද අනුරූ මාධ්‍ය සේවා

සිළුමිණ දැනුම මිනුම
පැන විසඳුම - 2021 අප්‍රේල්

නම - _____

_____

ලිපිනය - _____

_____

_____

දුරකථන අංකය - _____

අත්සන - _____

දිනය - 2021 _____

1. ශ්‍රී ලංකාවේ ජාතික ගීයේ නිර්මාතෘවරයා කවුද?
_____

2. ශ්‍රී ලංකාවේ ජාතික වෘක්ෂය කුමක්ද?
_____

3. ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය කුමක්ද?
_____

4. ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා නම් කරන්න.
_____

5. ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩාව කුමක්ද?
_____

ඩේන්ටි ප්‍රහේලිකා -120 ජයග්‍රාහකයෝ
රුපියල් 5,000 බැගින් හිමිවූ ජයග්‍රාහකයෝ

- **අප්සරා ගුණරත්න**
  100, සිරිබෝපුර,
  හම්බන්තොට.
- **එන්. ඩී. එන්. කේ. පීරිස්**
  කනදූල්ල,
  කුලියාපිටිය.

සයුරි චරින්දි යාපා
බ/ වැලිමඩ විජය විදුහල,
වැලිමඩ.

- **විජයසේකර හරිශ්චන්ද්‍ර**
  මොරගොල්ල,
  ඉඹුල්ගස්දෙණිය.
- **යූ. ඩබ්. ඒ. ඩී. විජේතුංග**
  දිගම්පතහ,
  කිඹිස්ස.
- **එම්.ඒ. කරුණාතිලක**
  සංවර්ධන ගම්මානය,
  ගා/ නාගොඩ.
- **ටී.ජී.ජී. ජයවීර**
  නැෂනල්වත්ත,
  ගොකරැල්ල.
- **ඒ.එච්. චන්ද්‍රා මාලිනී රත්නසීලී ද සිල්වා**
  පෝරඹ,
  අම්බලන්ගොඩ.
- **වජ්‍රා ලිලානි පළිහවඩන**
  හීනටිගල,
  තල්පේ.
- **දුලරාණි එම්. වික්‍රමසිංහ**
  ගොරොක්ගහ වත්ත
  කඹුරුපිටිය

Uswatte 66 රස මිනුරු

Uswatte මොටාගෙදරගේ **ගුරු ගෝල වෙනස - 79**

උස්වත්ත කන්ෆෙක්ෂනරි වර්ක්ස් සමාගමේ අනුග්‍රහයෙනි

සිළුමිණ

රුපියල් 2,500 බැගින් ත්‍යාග ලැබූ ජයග්‍රාහකයෝ මෙසේය

රුපියල් විසිපන්දහසක තෑගි

- **එම්. එම්. එම්. රිස්වාන්**
  මල්ලවපිටිය, කුරුණෑගල.
- **ඩී. බී. එස්. කලයාණි**
  ශ්‍රීමාලි ස්ටූඩියෝ,
  බුත්තල.
- **එහංසි කවිත්මා පුංචිහේවා**
  3 වන පියවර,
  අනුරාධපුරය.
- **ඩී. එම්. ධර්මරත්න**
  කිරිබමුණ,
  ඉබ්බාගමුව.
- **පියසේන වර්ණසූරිය**
  තිබිරිවැව, මගුලාගම.
- **එච්. සිරිසේන**
  වේරගම, උඩනිරිඇල්ල.
- **ජේ. ඒ. ඩිංගිරි මැණිකේ**
  පාතකඩ,
  පැල්මඩුල්ල.
- **ඩබ්. එම්. කාංචනමාලි විජේරාජ**
  අරංගල, නාඋල.
- **ඩී. එස්. එස්. දසනායක**
  අඹගස්තැන්න,
  රත්තොට.

නිවැරැදිව ප්‍රහේලිකාව පුරවා

වටිනා මුදල් ත්‍යාග දිනන්න

- පළමු ත්‍යාගය - මුදලින් රුපියල් 25,000ක්
- දෙවැනි ත්‍යාගය - මුදලින් රුපියල් 15,000ක්
- තෙවන ත්‍යාගය - මුදලින් රුපියල් 10,000ක්

සිළුමිණ ප්‍රහේලිකා - අංක 121

1	2	3			4	■	5		6
7			■	■	8			■	
9			10	11		■	12	13	
	■	■	14		■	15			■
16		■	17		18		■	19	20
	■	21				■	22		
■	23		■	24		25			■
26		■	27				■	28	29
30		31		■	■	32	33		
34			■	35					

හරහට

1. අවසන් අවුරුදු චාරිත්‍රය.
5. ප්‍රකෘති
7. ඇතුන්ගේ පාමුලට අනින අවිය
8. දත්
9. සීගිරිය හා බැඳුණු ප්‍රකට පුරාවිද්‍යාඥයෙකි.
12 අවුරුදු කෑම මේසයට නැතුව බැරි පලතුරකි.
14. චක්‍රකාර රේඛාව
15. දියර වර්ග අසුරා තබන ප්ලාස්ටික්/ වීදුරු බඳුන් වර්ගයකි.
16 සෙනසුරු
17 රට රටවල තොරතුරු දැක්වෙන සිත්තම
19. ලංකාව
21.පළඟැටි
22. නොමියෙමි/ තුංමංහන්දිය ලියූ ප්‍රබුද්ධ කවියා
23.වෘෂභ
24. සැමදාම කොළ පැහැ ගැන්වුණු
26. ගෙමුල්ල/ කෙළවර/ දිශාව
27. ජල දහර
28. ආරක්ෂාවට කියන තවත් නමකි.
30. අවුරුදු සමයේ බෙහෙවින් දැකිය හැකි කුඩා මැසි විශේෂයකි.
32. වත්තල, හැඳල ප්‍රදේශයේ පිහිටි ග්‍රාම නාමයකි.
34. දිය ඉසින බඳුන
35. මධ්‍යම පළාතේ නිල පුෂ්පය

පහළට

1.සංස්කෘත උපදේශාත්මක කාව්‍ය සංග්‍රහයකි
2.අනංගයා, රාගය, යුද්ධය
3. ස්ථවිර, උපසම්පදාවෙන් දසවස් පිරුණු භික්ෂු නම
4. තරුණ ස්ත්‍රීන්ට විත කරතැයි කියන යක්ෂයා
5. පුණ්‍ය ක්ෂේත්‍රය
6. විශාල
10 පිපිණු
11 සදෙව්ලොවින් එකකි
13 වල්ලි අම්මාගේ වාස භවන.
15 බොහොම
18. පුරාණ හෙළ ආයුධයකි
20 උරහිස/ බෙල්ල
21 පාපය
22. ස්වෙරි, ස්ව කැමැත්තට වැඩ කරන
23. දැඩි අඳුර
25 සාර ගර්භ
26. චොකලට් නිපදවීමට යොදා ගන්නා ඇට වර්ගයකි
27. දහවල්
29. මඩ
31 ගස/ වෘක්ෂය
33. ලද්දා වූ යන අර්ථය දේ

විසඳන ලද ප්‍රහේලිකාව ලියුම් කවරයක බහා එවන්න

ඔබේ නිවැරැදි විසඳුම්පත් ප්‍රහේලිකා අංක - 121, සිළුමිණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස්,කොළඹ 10. යන ලිපිනයට ජූනි 14 වැනිදාට පෙර එවිය යුතුය.

නම : .....

ලිපිනය : .....

.....

දුරකථන අංක : .....

අත්සන : .....

දිනය : 2021, ...

කොන්දේසි:

(1) කූසපත් ඇඳීමෙන් තෝරාගන්නා නිවැරැදි පිළිතුරු 3ට මෙහි සඳහන් පරිදි රුපියල් 50,000 තෑගි මුදල හිමි වේ.

(2) තරඟකරුවකුට විසඳුම් පත් ඕනෑම සංඛ්‍යාවක් යොමු කළ හැකි අතර ඒ සඳහා සිළුමිණ පුවත්පත්වල පළවන මෙම කූපනය පමණක් එවිය යුතුය.

(3) සිළුමිණ පුවත්පතේ පළවන මෙම ප්‍රහේලිකාව විසඳා කූපනය පුරවා එය ලියුම් කවරයක බහා, ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ප්‍රහේලිකා අංක 121 යනුවෙන් සඳහන් කර සිළුමිණ ප්‍රහේලිකාව 121, ලේක්හවුස්, කොළඹ 10. යන ලිපිනයට 2021 ජූනි 14 ට පෙර එවිය යුතුය. නිවැරදි ලිපිනය, දුරකතන අංකය සහ ඊමේල් අංකයක් ඇත්නම් එයද ලියා එවන්න.

(4) ජයග්‍රාහකයන් තෝරා ගනු ලබන්නේ කූසපත් ඇඳීමෙනි. විස්තර අවශ්‍යය වන්නේ නම් පමණක් සිළුමිණ කර්තෘ මණ්ඩලය ඇමතිය හැකිය. (දුරකතන අංකය 011-2429265)

(5) ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ සේවකයන්ට හෝ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට තරගය සඳහා ඉදිරිපත් විය නොහැකිය. තරගයේ අවසන් තීරණය ලේක්හවුස් ආයතනය සතුය.

ඈ පුණ්ණා නම් වූවාය

ඇගේ නම පුණ්ණා ය. ඇය උපන්නේ සැවැත් නුවර අනේපිඬු සිටුවරයා ගේ නිවසේ ය. පුණ්ණා ගේ මව ඒ සිටු මැදුරේ දාසියකි. තරුණ වියේදී ම පුණ්ණා බුදුරජාණන් වහන්සේගෙන් සීහනාද සූත්‍රය අසා සෝවාන් වූවා ය.

සිටු මැදුරට දිය ගෙන එන්නට ඇය දිනපතා ගඟට ගියා ය. සුද්ධ වූ තොටුපළක නෑමෙන් පව් සේදේ යයි විශ්වාස කළ බමුණකු සමඟ ඇය වාද කළා ය. බමුණා සිය පවු සේදීමේ ක්‍රමය වැරදි බව වටහා ගත් පසු බුදු සසුනට ඇතුළුව නිවන් සුවය ලැබූයේය.

මේ පිළිබඳව ඇසූ අනේපිඬු සිටුතුමා ඇය දාස භාවයෙන් නිදහස් කළේ ය. ඇය පැවිදි වූවා ය. විදසුන් වඩා රහත් බව ලැබුවා ය.

පුණ්ණා රහත් මෙහෙණින් වහන්සේ ගේ උදාන ගීතය වූයේ අර බමුණා සමඟ වූ සංවාදය යි.

පුණ්ණා :- සීත කාලයෙත් මේ වතුරට බැස්සා
වතුර බඳුන් සිටු මැදුරට අරන් ගියා
මා ඒ ලෙස දුක් වින්දේ හාම් පුතා
මට දඬුවම් දෙයි කියනා බිය හින්දා
හැම උදයක, සවසක ගිලෙමින් වතුරේ වෙවුල වෙවුල දැඩි සීතල විඳ ගනිමින්
බමුණාණනි, ඔබ සිරුරට දුක් දෙන්නේ
කවුරුන් හට බියෙන්දැ යි පවසනු මැනවි

බමුණා:- පුණ්ණා ඔබ දැන දැන ඇයි විමසන්නේ
මා කරනුයේ වතුරේ පව් සේදීම යි
පවු රැස් කොට තිබේ නම් කා හට වුවද
එය සෝදා නිදහස් විය හැකිය මෙයින්

පුණ්ණා:- කර්ම විපාකය ගැන කිසි දෙයක් නො දත්
බමුණාණනි, පවු සේදෙන වග නැමෙන්
ඔබට කියා දුන්නේ කවුදැ යි කියනු
කවුරු වුව ද ඔහු කර්මය ගැන නො දනී
ඔබ කියනුයේ ඇත්තක් නම් වෙසෙන දියේ
ගෙම්බන්, කැස්බෑවන් හා කිඹුලන් ද
මිය ගිය පසු ස්වර්ගය වෙත යනු නියතයි
සතුන් මරන්නන්, සොරකම් කරන්නන්
රැස් කළ සියලු පවු නැමෙන් පසු ඉවරයි!

ඔබ කළ පවු සේදෙන විට මේ වතුරෙන්
ඔබ කළ පින් ඇත්නම් ඒවත් සේදෙයි
උදේ සහ සවස ඔබ බසිනුයෙ දිය ට
බිය ඇති නිසා නේදැ යි කිව මැන පවට
එසේ නම් නොදී දුක් පීඩා සමට
පවෙන් මිදී ජීවත්වනු මැන සොඳට

බමුණා:- පින්වත් පුණ්ණා මා මෙතුවක්
සිටියේ
නොමඟය, ඔබයි මා වතුරෙන් ගොඩ ගත්තේ
ආරිය මඟ ට මා යොමු කළ ඔබට මගේ
මේ සළුපට පුද දෙමි පිළිගනු සතොසේ

පුණ්ණා :- එපා ඔබේ සළු පට මට එපා එපා
අකැමති නම් දුකට, ඔබ බිය නම් දුකට
රහසිගතව හෝ එළිපිට කිසිදු පවක්
නොකරනු පවු විපාකය නිසැකව ම ලැබේ
පවු විපාක පල දෙන විට පලා යන
ඉඩක් ලැබෙන්නේ නම් නැත කිසිවකුට
බිය නම් පවට තෙරුවන් සරණ යනු මැන
එය පිහිටක් වේවි ඔබ ගේ යහපතට

බමුණා :- පින්වත් පුණ්ණාව මා ඒ අකම්පිත
සිත් ඇති බුදුන්, සදහම්, සඟ රුවන් තුන
සරණ යමි උතුම් සිල් රඳවමින් සිතේ
උදා වේය යහපත මට සැක නැතිව
බමුණු කුලේ මා ඉපදුණු නිසා එදා
බ්‍රහ්ම බන්ධුයන නම මා හට ලැබුණා
එහෙත් මා සැබෑ බමුණකු වුණේ අදයි
ත්‍රි විද්‍යාව මට ලැබුණා
නිවන් සුවය උරුම වුණා
කෙලෙස් සෝදලා දැම්මා

කපිතාන් ගුණවර්ධන තරුණ වියේ දී

ශ්‍රී ලංකාවේ භාවිත කරන ලද Tiger Moth ගුවන් යානාවක්

පයිලට් සීයාට 95යි

● නිලන්ත තෙන්නකෝන්

පැලවත්ත උක්යායට ගුවනින් කෘමිනාශක ඉස්සා

ඔහුට ජීවිතයේ ලොකු බලාපොරොත්තුවක් නොතිබිණි. පාසල් වියේ පටන්ම සිතේ තිබූ ලොකුම බලාපොරොත්තුව වූයේ ගුවන් නියමුවෙකු වීමය. උත්සාහයෙන් ඒ සිහිනය සැබෑ කරගත් ඔහු අදද ඒ අතීතය සිහිපත් කර තුටුවන්නේය. අනූපස් වැනි වියේ පසුවන කපිතාන් ෂෙල්ටන් ටෙරන්ස් ගුණවර්ධන හෙවත් 'පයිලට් සීයා' ගේ කතාවයි. ඔහුගේ මේ යටගියාව ගැන දැන ගන්නට ලැබුණේ ඔහු සතුව තිබූ වටිනා අතීත තොරතුරු, ලියකියවිලි රැසක් ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියට බාර දුන් දිනය.

අපි ඔහුගේ කතාව ගැන සවන් යොමු කෙළෙමු.

"මම ෂෙල්ටන් ටෙරන්ස් ගුණවර්ධන. උපන්නෙ 1927 වසරේ අගෝස්තු 17 වැනිදාය. ඒ කටුනායක ආඩිඅම්බලම ගමේ. පාසල් අධ්‍යාපනය ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලයේ. පාසල් කාලෙ ඉදල ගුවන් නියමුවෙක් වෙන්න ඕන කියන සිතුවිල්ල ආවා. අපේ පාසලේ මට වඩා පන්ති දෙකක් විතර ඉහළ පන්තියක ශිෂ්‍යයෙක් හිටියා පිලිප් රේවත විජයවර්ධන කියල. රේවත අයියා ඉස්කෝලෙ බැල්කනියට ඇවිත් කඩදහි කොළ නවල එක එක හැඩවල ප්ලේන් මොඩල් හදලා එළිමහනට විසිකරනවා. අපි ඉතින් පොඩි උන් නිසා ඒ ටික අහුලාගෙන ඇවිත් දුන්නහම ටොපි චොකලට් වගේ දේවල් තෑගි හැටියට ලැබෙනවා. මේ විදිහට රේවත අයියා අපේ හිත්වල ප්ලේන් ගැන ලොකු ආසාවක් ඇති කළා.

ඒ වගේම අපේ ඉස්කෝලෙ හිටිය ළමයි දෙන්නෙකුගෙ තාත්තා කෙනෙක් 'කලම්බු ප්ලයින් ක්ලබ්' එකේ ලොක්ක වෙලා හිටියා. එයාගෙ නම හෙලින්ස් එල්ලාවල. නිවාඩුවට එයා දරුවන් බලන්න එනවා. ඒ ආවාම ඔහු ප්ලේන්වලට කැමති අපි වගේ අය රත්මලානට චාරිකාවක් එක්ක යනවා.

මම මේ කියන 1932 විතර කාලෙ රත්මලාන ගුවන්තොටුපොළක් වෙලා තිබුණේ නෑ. එහෙම තමයි මගේ හිතේ ගුවන් යානා පදවන්න ආසාවක් ඇති වුණේ. ඔය ආසාව තමයි පාසල් කාලයෙන් පසුව ගුවන් නියමුවෙක් වෙන්න මාව උනන්දු කළේ ෂෙල්ටන් ගුණවර්ධන සිය අතීත මතකයන් අවදි කරමින් පවසන්නේය.

"මට කලම්බු ප්ලයින් ක්ලබ් එකෙන් පෞද්ගලික ගුවන් නියමු බලපත්‍රය ලබාගන්න ශිෂ්‍යත්වයක් ලැබුණා. ඒකත් රස කථාවක්. මේකෙ තෝරගන්න පරීක්ෂණයට තිබුණේ කොහෙ හරි තැනකට ප්ලේන් එක අරන් ගිහින් දුන්නහම ඒක නිවැරදිව රත්මලානට පදවගෙන එන කෙනාට ශිෂ්‍යත්වය ලැබෙන විදියට. ඉතින් මාවත් ප්ලේන් එකේ ගෙනිහින් කිව දැන් රත්මලානට යන්න කියල. උඩ ඉදං වටපිට බලපුහම කොළඹ වරාය. ටිකක් වෙලා කල්පනා කරපු මට මතක් වුණා වැල්ල දිගේ ගියොත් රත්මලානට යන්න පුළුවන් නේද කියල. ඉතින් මම එහෙම කළා. ඒකෙන් මට ප්ලේන් පදවන්න ඉගෙන ගන්න ශිෂ්‍යත්වයක් ලැබුණා." ඔහු සිනාසෙමින් පවසන්නේ ජයග්‍රාහී ලීලාවෙනි.

එසේ වුවත් ගුවන් නියමුවෙකු වෙන්නට පාසල් කාලයේ සිටම හීන මැවූ ගුණවර්ධන බැංකුවක සේවයට ගියේය. එහෙත් ගුවන් නියමුවෙකු වීමේ සිහිනය සිතෙහි පැලපදියම් වී තිබුණේය.

"මම ඉස්කෝලෙන් අයින් වෙලා බැංකුවක රැකියාවක් කළා. එහෙම කළේ රස්සාවක් ඕනෑ නිසා මිසක් හිතේ කැමැත්තෙන් නෙවේ. මගේ හිතේ තිබුණෙ කවද හරි ගුවන් නියමුවෙක් වෙන්න ඕනෑ කියන බලාපොරොත්තුවයි. ඔය කාලෙ දෙවෙනි ලෝක යුද්දෙ ලංකාවටත් ආව. ඉංග්‍රීසි සුදු මහත්තුරු ටිකක් එකතුවෙලා ඒරෝ ක්ලබ් එකක් පටන් ගත්තා. ඒකෙන් ලැබුණ අවුරුදු තුනක ශිෂ්‍යත්වයකින් තමයි මම වාණිජ ගුවන් ගමන් වලට ගැළපෙන විදියට ප්ලේන් එළවන්න ඉගෙනගත්තෙ. ඒ පාඨමාලාව අවසන් වුණ ගමන් මම 1947 දී එයාර් සිලෝන් එකට බැඳුණා. 1959 වගේ වෙනකන් සේවය කරල පස්සේ එයාර් සිලෝන් එකෙන් ඉවත්වෙලා එංගලන්තෙට ගියා. එංගලන්තයේ ගුවන් සමාගම් කිහිපයකම වැඩකරල 1985 අවුරුද්දෙ මම විශ්‍රාම ගත්තා.

වසර ගණනක් තුළ ගුවන් නියමුවෙකු ලෙස සමාගම් කිහිපයක සේවය කළ ඔහු අතීත තොරතුරු සිහිපත් කරන්නේ දැඩි ආඩම්බරයෙනි. ඔහුට ඇත්තේ බී ශ්‍රේණියේ ගුවන් බලපත්‍රයකි.


කපිතාන් ගුණවර්ධන සිය බලපත්‍ර සිවිල් ගුවන්සේවා අධිකාරිය වෙත බාරදෙමින්

"50 දශකයේ ලංකාවෙ තිබුණ හැම යානාවක්ම වගේ පදවන්න පුළුවන් විදියට මට ගුවන් නියමු බලපත්‍රයක් තිබුණා. ඒක නිකුත් කළේ 1949 ඔක්තෝබර් 29 වෙනිදා. සිවිල් ගුවන්සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ කෙනෙක් වෙලා හිටිය ඩේවිඩ් පීරිස් මහත්තයාගේ අත්සනින් ඒකෙ Aero 45, Sokol MID, Tiger Moth 82A, Auster MK. V, Auster J. I, Pushpak MK1 වගේ යානා මාදිලි සටහන් කරලා තිබුණා. පස්සෙ මම වාණිජ නියමු බලපත්‍රයත් ලබාගන්න කටයුතු කළා. මගෙ ලයිසන් එක "බී" ගණයේ එකක්. ඒ කාලේ නියමු බලපත්‍ර වර්ග තුනක් තිබුණා. A, A 1, B විදියට තමයි නම් නම් කරලා තිබුණේ. ලයිසන් එකක් තියෙන කෙනෙකුට අයිති වෙන්නේ පෞද්ගලික නියමුවෙක් විදියට වැඩකරන්න විතරයි. ඒ කියන්නෙ තමන්ට තනියම යානාවක් පැදවිය හැකියි. ලයිසන් එකක් තියෙන කෙනෙකුට මෘත දේහ වගේ දේවල් ගෙනියන්න හැකියාව තිබුණා. වැදගත්ම A ලයිසන් එක. ඒක තියෙන කෙනෙකුට විතරයි ගුවන් බඩු අරගෙන වාණිජ ගුවන් ගමන් යන්න අවසර තිබුණේ.' 1 ලයිසන් එකක් තියෙන කෙනෙක්ට පුළුවන් මෘතදේහ වගේ දේවල් අරගෙන යන්න.වැදගත්ම ලයිසන් එක තමයි ා ලයිසන් එක. ා ලයිසන් තියෙන කෙනෙකුට පුළුවන් මිනිස්සු, ගුවන් බඩු ආදිය අරගෙන වාණිජ ගමන් යන්න අවසර තියෙනවා.

ඉස්සර ප්ලේන් එක හසුරවන්න බොත්තම් කියල මහා ගොඩක් තිබුණේ නෑ. අතින් ඇන්ජිම කරකවල පණගන්වල තමයි අපි වැඩ කළේ. ටයර්වලට හුළං ගහන්නෙ තෙල් දමන්නේ, දුවිලි පිහිදාන්නෙ, නියමුවා විසින්මයි. ප්ලේන් එක අහසට ගත්තහම වේගය පාලනය කරගන්න, මුහුණට වදින හුළං ධාරාව හුගක් වැදගත් වුණා. ඒ වගේම කනට ඇගෙන ශබ්දය. ඒ කාලෙ ගුවන් යානා පදවන්න හුගක් මොළේ වෙහෙසන්න වුණා. අද තාක්ෂණය දියුණු නිසා නියමුවාට පහසුවෙන් යානාව එහා මෙහා ගෙනියන්න පුළුවන්. ඒ කාලෙ හැමතිස්සෙම පාලක මැදිරි එක්ක කථා කරන්න පහසුකම් තිබුණේ නෑ. ගස්, ගල්, කඳුවැටි, ජලාශ වගේ දේවල් මඟ සලකුණු විදියට තියාගෙන තමයි ගමනාන්තයේ ගුවන්තොටුපොළවල් හොයා ගත්තෙ.

ඒ වගේම ධාවන පථයේ භූමිතෙල් ලාම්පු කුප්පි පත්තු කරල තියල තමයි අඳුරු වෙලාවට යානාව ගොඩබැස්වීම සිදුකළේ. හදිස්සියේ හරි ගොඩබස්සවන්න එපා නම් රතුපාට ටෝච් එළියක් දල්වනවා. එහෙම නැත්නම් කොළපාට එළියක් දැල්වුණොත් ගොඩබහින්න පුළුවන්. අපිට හැමතිස්සෙම අවධානයෙන් ඉන්න වුණා වගේම මොළේ පාවිච්චි කරල වැඩ කරන්නත් වුණා.

නියමු ජීවිතයේ අමතක නොවන සිදුවීම් එහෙම බොහොමයක් ඇති.

අනන්තවත් සිදුවීම් තියෙනව, ඒ වගේම පැලවත්ත සීනි කර්මාන්ත ශාලාවට අයිති රජයේ උක් වගා බිමකට තෙල් හා දියර පොහොර ඉසින්න ගුවන් යානාවක් යොදාගන්න ඕන කියල යෝජනාවක් ඒ කාලෙ ආව. ඒකට වෙන කෙනෙක් හිටියෙ නෑ, මම තමයි ඉදිරිපත් වුණේ. Tiger Moth කියන වර්ගයේ යානාවක් යොදාගෙන එක වතාවකට ගැලුන් 35 ක් විතර වගේ කෘමිනාශක තෙල් ඒ යානාවෙන් උඩට ගෙනිහිං කිහිපවතාවක්ම උක් වගාවට යෙදුවා. එදා ඒ වගේ දෙයක් සිදුවුණේ ලංකාවෙ පළවෙනි වතාවටයි. අහල පහල තිබුණ ගස්වලින් යානාව පරෙස්සම් කරගෙන හොඳින් වැඩේ අහවර කළා"

යොවුන් වියේදි කළ දස්කම් ගැන ඔහු පවසන්නේ මහත්ම වූ ආඩම්බරයෙනි. මේ වනවිට අනූපස්වැනි වියෙහි පසුවන කපිතාන් ෂෙල්ටන් ගුණවර්ධනයන් බොහෝ දෙනෙකු හඳුන්වන්නේ 'පයිලට් සීයා' යන අන්වර්ථ නාමයෙනි.

තම ජීවිතයේ බොහෝ සුන්දර වූ ගුවන් සේවාවේ සන්ධිස්ථාන පිළිබඳව සිය මතකය ආවර්ජනය කරන කපිතාන් ගුණවර්ධන සිය ගුවන් නියමු බලපත්‍ර සහ ඔහු විසින් සිදුකළ පියසැරීන් පිළිබඳ සියලු සටහන් තැබූ ලොග් සටහන් පොත් ද සංරක්ෂණ කටයුතු සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියට භාරදීම පසුගියදා සිදු කරන ලදී. එම අවස්ථාවට ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් පී. ඒ. ජයකාන්ත මහතා එක් විය.

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් ගුවන්සේවා ක්ෂේත්‍රයේ ඉතිහාසගත තොරතුරු ඉදිරි පරම්පරාව වෙත දායාද කිරීමේ අරමුණින් එම තොරතුරු සංරක්ෂණය කිරීමේ වැඩපිළිවෙළක් එහි අතිරේක අධ්‍යක්ෂ ජනරාල් පී. ඒ. ජයකාන්ත මූලිකත්වයෙන් ක්‍රියාත්මක කර ඇත්තේ එම අධිකාරියේ සභාපති උපුල් ධර්මදාස, සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් කපිතාන් තේමිය අබේවික්‍රම යන මහත්වරුන්ගේ උපදේශකත්වය සහ මඟපෙන්වීම යටතේ ය.

(B) NOTE THIS CERTIFICATE OF COMPETE
DUPLICATE FLYING OF ALL TYPES
CERTIFICATE OF COMPETENCY
Photograph of Holder
Signature of Holder :
This Pilot's Certificate of Competency for passenger, mail or goods flying machines (public transport) or flying machines used for industrial purposes, No. 53
dated 29th October, 1949.
has been issued to Mr. T.S.Goonewardena
for the following types of flying machines. (See page 3.)
Given at Colombo, this Twenty-ninth day
of October, 1949.
Intld. D.C.de.S.P. 31.10.49.
Sgd. D.C.de.S.Peiris.
for Director of Civil Aviation, Ceylon.
ඉපැරණි නියමු බලපත්‍රය

බලපත්‍රයේ පැදවිය හැකි ගුවන් යානා සටහන්ව තිබූ ආකාරය

50 දශකයේ යානාවන් සියල්ල පැදෙව්වා

සමාජවාදයේ සිහිනයත් සමඟ එලොව ගිය රත්නායක වනසිංහ

● දෙනගම සිරිවර්ධන

"උඩරට සන්දේශය" සතිපතා තීරු ලිපිය මඟින් කන්ද උඩරට පමණක් නොව මේ දිවයිනේ සිව් දිගෙහිම ජනතාව ආකර්ෂණය කැර ගත් නිලමේ පසුගිය දා මහනුවර මහයියාවේ දී අවසන් ගමන් ගියේය.

රත්නායක වනසිංහ නමින් රටම හඳුනාගත් මේ තීරු ලිපි රචකයා ලේඛකයකු, පරිවර්තකයකු, දේශකයකු, කවියකු, වෘත්තීය සමිති නායකයකු, කොමියුනිස් පක්ෂ ප්‍රාදේශීය නායකයකු, ජන සාහිත්‍ය පර්යේෂකයකු, වේදිකා නාට්‍ය ශිල්පියකු ආදි විවිධ ක්ෂේත්‍රයන්හි පතළ අත්දැකීම් ලැබූවකු මෙන්ම ඒ සෑම තැනකටම පොදු වූ සැබෑ ජනතා හිතවාදියෙක් ද වූයේය.

1935 අප්‍රේල් 10 වැනිදා පස්සර දී උපන් අපේ මේ ලේඛකයා 2021 අප්‍රේල් 11 වැනිදා මහනුවර දී අවසන් හුස්ම හෙළුවේය.

බදුල්ල පස්සර මධ්‍යම විද්‍යාලයේ අධ්‍යාපනය ලැබූ ඔහුට වයස අවුරුදු විස්සේ දී බදුල්ල කච්චේරියේ සැලසුම් ශිල්පි තනතුරක් ලැබිණ.



පාසල් විසේ සිටම ඔහුට තිබුණේ සමාජවාදී අදහස්ය. පාසල් පුස්තකාලයේ සැලසුම් ශිල්පියකු වශයෙන් අකුරටම සේවයේ යෙදෙන අතර විවේක කාලයේදී සමාජවාදී සමාජයක් පිළිබඳ සැලසුම් සිය මනෝ ලෝකයේ ඇන්දේය.

රත්නායක වනසිංහ පාසලේ විවාද කණ්ඩායමේ ප්‍රධානියාය. දක්ෂම කථිකයාය. මේ ගැන ඇසූ බදුල්ල කොමියුනිස්ට් පක්ෂ නායකයෝ පක්ෂයේ තරුණ සමිති ඇමතීමට ඔහු යොදා ගත්තේය. නිවාඩු දිනවල ඈත ගම්වල කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රචාරක කටයුතුවලට ඔහු සහභාගි විය.

1965 දී එ.ජා.ප. රජය බලයට පත්වීමත් සමඟ බදුල්ලේ සමාජවාදීන්ට දඬුවම් ලැබිණ. ඇතැමකුට රැකියා ද අහිමි විය. රත්නේ අම්පාර කච්චේරියට මාරුකැරිණ.

"එන්න සහෝදරයා අපි ඔබ පිළිගන්නවා"

අම්පාර කච්චේරියේ සමාජවාදියෝ ඔහු සාදරයෙන් පිළිගත්හ. ඒ පිරිස අතර ජනපද ගොවියකුගේ පුතකු හා ගුරු නායකයකු වූ ලේඛක පියසේන කහඳගමගේ ද විය.

රත්නේට අමුත්තක් නොදැනිණ. ගංගානිමින සංවර්ධන මණ්ඩලයේ කුරිරු අණසකට යටත් වූ ජනපද ගොවීන්ගේ පීඩනය ඔහු මුලදීම හඳුනා ගත්තේය. 'අම්පාර යනු අරගලවලින් පිරුණු හා පිරෙන තැනක්' ඔහු සිතුවේය.

එස්.ජී. පුංචිහේවා, අයි. සුවඳරත්න, සේන ජයකොඩි වැනි ගුරු නායකයන් හා කම්කරු නායකයන් සමඟ එක්ව ඔහු වෘත්තීය අරගලවලදී සිය සටන්කාමී සහාය පළ කෙළේය. හැම විරෝධතා පෙළපාළියකම ඔහු ඉදිරියෙන්ම ගමන් කෙළේය." ඔහුගේ හඬ සියලු හඬ අබිබවා නැඟිණ.

ඔහුගේ කට බස සිනා රසයෙන් පිරී තිබිණ. ඒ නිසාම ඔහුගේ දෙසුම් ශ්‍රාවකයන්ගේ මන බඳනා සුලුවිය.

ඔහු සේවය කළ යුගය අම්පාරට තාමත් මතකය. අම්පාරේ සෑම ගමකම, කැලෑබද ගම්වල පවා කොමියුනිස්ට් පක්ෂයේ ශාඛා පිහිටුවා තිබිණ. කච්චේරියේ සේවයෙන් පසු හැන්දෑවේ පියසේන කහඳගමගේ ද සමඟ ගම්වදින රත්නේ රෑ මැදියම වනතුරු මාක්ස්වාදයේ මූලධර්ම ජනතාවට පැහැදිලිකොට දුන්නේය.

භෞතිකවාදය, අතිරික්ත ශ්‍රමය, මනෝ මූලික, විෂය මූලික, කම්කරුපන්ති ආඥා දායකත්වය වැනි වචනවලින් තොරව එහෙත් ඒ අදහස් සිත් තුළ ගැඹුරට කාවදින සේ ඔහු ජනතාවට ඉදිරිපත් කෙළේය.

'රාජ්‍යය' පිළිබඳ දේශනය පැවැත්වූ ඔහු එය අවසන් කොට සවන්දෙන්නන් දෙස මඳ වේලාවක් බලා සිටියේය. හීන් හඬක් ඔහුට ඇසිණ.

"ඔව්, සහෝදරයා මේ රාජ්‍යය වෙනුවට අපේ ම එකක් අපට ඕනෑ. අපි එහෙම එකක් හදා ගන්න ඕනෑ."

රත්නේගේ මුහුණ මහත් සතුටකින් පිරිණ.

එදා මම ද ඒ දේශනයට සවන් දුනිමි. ඒ යුගයේ මම අම්පාරේ වලිගම්පුර පාසලේ පියසේන කහඳගමගේ සමඟ එකට සේවය කළෙමි.

සිය දෙසුම සරු වී දැයි රත්නේ බැලුවේ සවන් දෙන්නන්ගේ මුහුණුවලිනි.

ඔහු පසුපස රහස් පොලිසිය ද ඇවිද්දේය.

"ඉතින් කොහොමද සහෝදරයා?"

ඔහු ඔවුන්ගේ පිටට තට්ටු කරමින් ඇසීය.

රජයේ සේවය සඳහා පැය අටක් ගත කළ රත්නේ ඉන්පසු වැඩිම කාලයක් දේශපාලන හා වෘත්තීය අරගල සඳහා කැප කළේය. ඔහු ලිවීමට හා කියවීමට කෙසේ හෝ පැය දෙකක් ඉතිරි කැර ගත්තේය.

රත්නේ ඉංග්‍රීසි, සිංහල දෙබසම මැනවින් දැන සිටියේය. ඉංග්‍රීසි බසින් ලියැවුණු ලිපි රාශියක් ඔහු ඇත්ත පුවත්පතේ පළකළේය. 'ඇත්ත' ට කවි ලීවේය.

විශිෂ්ට සාහිත්‍යධරයකු හා ප්‍රවීණ පරිවර්තකයකු වූ එස්.ජී. පුංචිහේවා මහතා අම්පාරේදී හමුවීම ඔහුගේ ලේඛන කලාව දියුණුවීමට හේතුවක් විය. බලීල් ජිබ්රාන්, ලුශුන් වැනි එදා ලංකාවට නුහුරු විදෙස් කවීන් හඳුන්වා දුන් පුංචි හේවා මහතාගේ ඇසුර ඔහුට ධෛර්යයක් විය. ඔහු පුංචිහේවා මහතා සමඟ සාහිත්‍ය හා දේශපාලනය ගැන දීර්ඝ සාකච්ඡාවල යෙදුණේය.

1970 මහ මැතිවරණයෙන් එ.ජා.ප. ය පැරදීමත් සමඟම රත්නේට මහනුවරට ස්ථාන මාරුවක් ලැබිණ. ගොවීන්, කම්කරුවන්, ලිපිකරුවන් හඬා වැදෙද්දී ඔහු අම්පාරෙන් සමුගත්තේය.

මහනුවර නිවාස දෙපාර්තමේන්තුවේ බලය ලත් නිලධාරියා ලෙස විශ්‍රාම ලබන තුරු ඔහු සේවය කළේය.

එහිදී ඔහුට කෑගල්ල දිස්ත්‍රික්කයේ සංගීත අධ්‍යාපන අධ්‍යක්ෂ වීරසේන ගුණතිලක මහතාගේ ඇසුර ලැබිණ. එතුමා ජන සංගීතය පිළිබඳ පර්යේෂණ කටයුතුවල යෙදුණේය.

"අපේ සංගීතය ගොඩනැඟිය යුත්තේ දේශීය ජන සංගීතය පදනම් කරගෙනයි." යන මතයේ පිහිටි රත්නේ වීරසේන ට එකතුවිය. ඔහු දන්නා ගම්මානවල පරපුරෙන් පරපුරට ආ සංගීතය ගුණතිලක මහතාට සමීප කෙළේය. ඒ ගමන් රසමුසු විය.

වේදිකා නාට්‍ය ශිල්පියකු වශයෙන් ද රත්නේ සතු කුසලතා අවස්ථා රැසකදී මතු වූවේය.

මධ්‍යම පළාත් ලේඛක සංවිධානය බිහිවීමට ඔහු ද මුල් විය. දස වසරක්ව ඔහු එහි සභාපති ධුරය දැරුවේය.

ඉංගිරිසියෙහි ආ උසස් නවකතා රැසක් ඔහුගෙන් සිංහලයට නැඟිණ. චීන ජනකතා නමින් ඔහු ලියූ පොත පාසල් දරුවෝ සතුටින් පිළිගත්හ.

දිවයින ඉරිදා සංග්‍රහය ආරම්භ කරන විට එහි සංස්කාරක දයාසේන ගුණසිංහ මහතා එක් එක් ප්‍රදේශ නියෝජනයට සුදුසු ලේඛකයන් තේරුවේය. උඩරට ජනතාව නියෝජනයට සුදුස්සා ලෙස ඔහුට පෙනුණේ රත්නායක වනසිංහය.

ඔහු 'උඩරට සන්දේශය' නමින් සතිපතා තීරු ලිපියක් දිවයින ඉරිදා සංග්‍රහයට ලීවේය. ඒ තීරු ලිපිය උඩරට ජනතාවගේ හඬ විය. ගුණසිංහ මහතාගේ බලාපොරොත්තු ඉන් ඉටුවිය.

"කොන්ද පණ නැති, මන්දගාමී, කන්ද උඩරට ලොකු උන්දැලාගේ අන්ධ භාවයට බෙත් දෙන්නට කාලය ඇවිත්" ඔහු ලීවේය.

කන්දඋඩරට දිසා ඇමතිවරුන්ට, ඇමතිවරුන්ට, නගරාධිපතිවරුන්ට, රත්නේ දෙන පහරින්, කන්ද පහළ පහතරට සිටින දිසා ඇමතිවරුන්ට ද ඇමතිවරුන්ට ද නගරාධිපතිවරුන්ට ද රිදිණ. උන්ගෙන් මේ පරුෂ බස් නැඟිණ.

"මං ගැහුවේ මුන්ට. උන්ටත් වැදිලා තියෙනවා. ඒකට මං මක් කරන්නටද ආයිබෝං"

රත්නේ දිනක් සංස්කාරකවරයාගෙන් ඇසුවේය.

ඔහු ලියූ හැම තීරු ලිපියක්ම ජනප්‍රිය විය. සිය දයාබර බිරිඳ වන කමලා වනසිංහ මහත්මියගේ සාදර සත්කාර මැද ලෙඩ ඇඳට වැටී දිගුකලක් ගෙවූ, රත්නේට තමා බැලීමට එන සටන් සගයකු, ලේඛක මිත්‍රයකු වන මාතලේ පියදාස වැලිකන්නගේ දකින විට ඔහුගෙන් මෙසේ කියැවෙයි.

"වැලි, උඹ කාලද ඉන්නේ? කාල නැත්නම් කුස්සියට ගිහින් පිඟානක් අරගෙන කෑම ටිකක් බෙදාගෙන කාල වරෙන්."

"මං කාල ආවෙ රත්නේ," වැලිට කියැවෙයි.

ඉන්පසු කතාව ඇරැඹෙයි. ඒ එකම කතාවකි.

"වැලි, අපි හිතලු දේවල් කර ගන්න බැරි වුණා. මේ බිමේ සමාජවාදය ගොඩනඟන්නනේ හිටියේ. ඒක අපට බැරිවුණා. උඹ කියන්නෙ ඒක හරියන වැඩක් නොවේද?

"එහෙම කියන්න එපා රත්නේ, උඹ කොමියුනිස්ට් පක්ෂෙ ඉදන් එහෙම හිතුව. මම සමසමාජෙ ඉදන් එහෙම හිතුව. අපි දෙන්නම පක්ෂයක් නැතුවත් එහෙම හිතුව. මේ ලෝකෙ තිබෙන ප්‍රශ්න විසඳන්න මොන වාදයකටවත් බැහැ. බල අරගල මෝරල මෝරල යුද්ධ වලින් මහා විනාශයක් එනව. විසඳුම් නැහැ. ප්‍රශ්න විසඳන්න තියෙන්නෙ සමාජවාදයෙන් බව මිනිසුන්ට එතකොට තේරුම් යාවි. කවදහරි ලෝකයම සමාජවාදී වෙනවා."

"ඒ කාලය වෙන කොට මම නැහැ"

"මමත් නැහැ" පසුගිය කාලයේ ඒ දෙදෙනා හමුවූ බොහෝ දිනවල සංවාදය කෙළවර වූයේ එසේය.

මේ අප්‍රේල් 11 වැනිදා වැලි රත්නේ හමුවීමට පැමිණි විට "උඹ කාලද ආවේ" යි ඇසීමටවත්, සමාජවාදය මේ රටේ ගොඩනැඟෙන දවසක් ගැන කතා කරන්නටවත් රත්නේ කෙනෙක් සිටියේ නැත.

වර්ගභේදවාදයට එරෙහිවූ මාටින් ලූතර් කිං

● ආචාර්ය යූ. අයි. මුතුකුමාරණ

"හැ ම දිනකම මම මරණ තර්ජනයන් යටතේ ජීවත් වෙමි. මිනිස්සු ලස්සන දේවල් කීම මිට කදිම ප්‍රතිලෝචනයකි. මට කන්ද උඩ නැඟී සිටිය හැකිවේ යැයි මම සිතමි. එහෙත් මිටියාවත මට අඬගසයි. 'මිසිසිපි' හි බලාපොරොත්තු භංගත්වයේ මිටියාවතේ බලාපොරොත්තුව අවශ්‍ය ජනයා සිටිති. මා මිටියාවත වෙත යා යුතුව ඇත."

1929 ජනවාරි 15 වැනි දා ජෝර්ජියාවේ 'ඇටිලන්ටා' හි උපත ලද මාටින් ලූතර් කිං (කනිෂ්ඨ) ගේ පියා එකල එබ්නෙසර් බැප්ටිස්ට් දේවස්ථානයේ සහකාර දේවගැතිවරයා විය. පවුලේ මුල වහල් භාවයෙන් ආරම්භ වූවකි. මාටින් ලූතර් කිං (කනිෂ්ඨ) ගේ මවගේ පියාවූ 'ඇඩම්ස් විලියම්ස්' 1863 දී වහල් දෙමාපියනට දාව උපත ලද්දෙකි.

එම වසරේදීම එවකට අමෙරිකානු ජනාධිපතිව සිටි 'ඒබ්‍රහම් ලින්කන්' විසින් වහල් භාවයෙන් නිදහස් කිරීමේ පනත ප්‍රකාශයට පත් කරන ලදි.

1894 දී ඔහු එබ්නෙසර් දේවස්ථානයේ දේවගැති තනතුරට පත් කරන ලදි. මෝර්හවුස් විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලද තරුණ මාටින් ලූතර් කිං, පෙන්සිල්වේනියාවේ 'චෙස්පර්' අසළ දේවධර්ම පාසලේ වැඩිදුර අධ්‍යාපනය ලබා 'දේවධර්ම ගාස්ත්‍රවේදී උපාධිය හිමිකර ගති.

මෙහිදී 'මහත්මා ගාන්ධි' තුමා පැවැත්වූ දේශන ඇසීමෙන් පැහැදුනු ඔහු, සමේ පාට නිසා කළු මිනිසුනට විඳින්නට සිදුවූ සියලු ආකාරයේ වෙනස්කම් හා මදි පුංචිකම්වලට එරෙහි තම සටනද, අවිහිංසා මාවතට අවතීර්ණ කිරීමට අදිටන් කරගති. ආචාර්ය කිං පසු කලෙක පවසා ඇත්තේ අවිහිංසා සංග්‍රාමය තමා උගත්තේ මහත්මා ගාන්ධිතුමා ගෙන් බවය.

1955 දී බොස්ටන් සරසවියෙන් දර්ශනවාදය පිළිබඳ ගෞරව උපාධිය ලබාගෙන, එම සරසවියේම සංගීතය හැදෑරූ කොරේටා ස්කොට් සමඟ විවාහ විය.

කුඩා කිං, ලොකු මහත් වනවිට සුදු ජාතිකයන්ගෙන්, කළු සම නිසා විඳින්නට වූ කෙණෙහිලි කම් හා මදිපුංචිකම් පිළිබඳ වේදනාකාරී අත්දැකීම් රැසක්ම විඳ තිබුණි.

එයින් ප්‍රබලවම ඔහුගේ හද සසල කළේ, තම පියා සමඟ සපත්තු සාප්පුවකට ගොස්, සුදු මිනිසුන්ට වෙන්කර තිබූ අසුනක වාඩිවී සිටින විට සාප්පු හිමියා එතැනට පැමිණ එතනින් ඉවත්ව කළු මිනිසුන්ට වෙන්ව ඇති ආසනවල වාඩිවන ලෙසට අවවාද කිරීමයි. "එක්කෝ අප මෙතැනම හිඳ සපත්තු ගන්නව, නැතිනම් කොහෙත්ම ඒවා ගන්නෙ නැතැ" යි පියා කියූ විට, සාප්පු හිමියා කීවේ වහාම ඔවුන් ඉවත්ව යා යුතු බවයි.

තම පුතා ඉදිරියේ පියෙකු ලැජ්ජාවට පත්වූ විට, පිය-පුතු දෙදෙනාටම හද දවන වේදනාවක් ඇති වේ. "මේ ක්‍රමය තව කොතෙක් කල් පැවතුනත් මා එම ක්‍රමය තවදුරටත් නිවැරදි යයි පිළිගන්නේ නැහැ යයි" සාප්පුවෙන් පිටවෙමින් තම පියා කී වදන් කුඩා කිං ගේ හදවතට තදින්ම කා වැදුනි.

අමෙරිකානු කළු ජාතිකයින් තුළ පැවති දැඩි සටන්කාමී බව, සාමකාමී විරෝධතාවයකට පරිවර්තනය කිරීමට ආචාර්ය කිං මහත් වෙහෙසක් දැරිය.

උදෑසන 6.30 පමණ වනවිට අවදිවීමට පුරුදු වී සිටි ඔහු නින්දට ගියේ අලුයම 2 ට පමණය. ඔහු තම සාම දූත මෙහෙවරේ යෙදෙමින් කැපවීමෙන් කටයුතු කළේද යත්, ඔහු 1963 වර්ෂයේ දී පමණක් සැතපුම් 275000 ක දුරක් ගෙවා තිබූ අතර, ප්‍රසිද්ධ දේශන 400 ක් පමණද පවත්වා ඇත.

අවිහිංසාවාදයේ පියා ලෙස සැලකෙන මහත්මා ගාන්ධි මෙන්ම, මාටින් ලූතර් කිං ද සාම පා ගමන් නිසා අනේකවිධ දුක් පීඩා විඳි අයෙකි. ලිපි මඟින් හා නිර්ණාමික දුරකථන ඇමතුම් මඟින් ඔහුට නිරතුරුවම මරණීය තර්ජන එල්ල විය.

සිවිල් නීති කඩ කිරීමේ චෝදනාව මත ඔහුට 14 වරක්ම බන්ධනාගාර ගතවීමට සිදු වූවත්, අදිසි හස්තයක් ඉදිරිපත්ව දඩ මුදල් ගෙවීම නිසා කෙටි කාලසීමාවක් තුළ නිදහස් වීමට ඔහුට හැකි විය. ඔහු සිවුවරක්ම පහර දීම්වලට ලක් වූ අතර, පිහි ඇණුම් කෑමට පමණක් නොව ඔහුගේ නිවසට එල්ලවූ බෝම්බ ප්‍රහාරයන්ට ලක්වීමට ද සිදුවිය.

මෙහිදී ක්ලු - ක්ලස් - ක්ලෑන් නමැති අමෙරිකානු සුදු අන්තවාදී සංවිධානයේ ප්‍රහාරයනට ද ගොදුරු විය. බර්මිංහැම්' නගරයේ හෝටලයකට එල්ල වූ ප්‍රහාරයෙන් දෛවෝපගතව ගැලවීමට හැකි විය. කිසි විටකත් තම භාර්යාව සමඟ එකට ගමන් නොගියේ දරුවන් සිවුදෙනා අනාථ භාවයට පත්වීමේ අවදානම මඟහැරවීමටය.

මොහුගේ අවිහිංසාවාදී ක්‍රියාමාර්ග නිසා 1964 වර්ෂයේදී ආචාර්ය කිං ට නෝබල් සාම ත්‍යාගය ද පිරිනැමිණ. මෙම ත්‍යාගයේ මූල්‍යමය වටිනාකම වූ ඇ. ඩො. 54000 මුදල ඔහුට සැපවත් ජීවිතයක් ගත කිරීමට ප්‍රමාණවත් වුවද, කළු ජාතිකයන්ගේ ජීවත් වීමේ අයිතිය වෙනුවෙන් වූ 'ප්‍රජා උරුමයන් දිනා ගැනීමේ ව්‍යාපාරය' සඳහා එම මුදල යොදවන ලදි.

මෙම අවිහිංසා සටන්වලින් ජයග්‍රහණ රැසක් හිමි විය. 1955 දෙසැ: 01 දා 'රෝසා පාර්ක්' සිදුවීමට අදාළව බස්රථ තුළ කළු මිනිසාට සිදුවන වෙනස්කම්වලට එරෙහිව කළ වර්ජනයෙන් දින 381 කට පසුව, අමෙරිකානු ශ්‍රේෂ්ඨාධිකරණය 'බස්රථ වල කලු ජාතිකයන්ට කැමති තැනක වාඩිවී යාමේ අයිතිය' තහවුරු කරන තීන්දුවක් ප්‍රකාශයට පත්විය.

1963 දී 'බර්මිංහැම්' හි ආපනශාලා ප්‍රභේදකරණයට එරෙහිව කළ වර්ජන හා පාගමන් නිසා, 'කිං' ඇතුළු කළු ජාතිකයන් 2500 කට බන්ධනාගාර ගතවීමට ද සිදුවිය.

මෙහි අවසන් ප්‍රතිඵලය වූයේ, 'මානව හිමිකම් සඳහා වූ ප්‍රභේදකරණය අහෝසි කිරීමේ පනත් කෙටුම්පත' අමෙරිකානු රජය සම්මත කිරීමය. කළු ජාතිකයන්ගේ මානව හිමිකම් වෙනුවෙන් 'වොෂින්ටන්' හි 'ලින්කන් ස්මාරකය' වෙත කළු ජාතිකයන් 250000 ක් සහභාගී වූ පා ගමන ඓතිහාසික එකක් විය. "මගේ දරුවන් සිවු දෙනාට යම් දිනක මිනිසාගේ සමේ පාට අනුව නොව, චරිත ලක්ෂණ අනුව සලකන රටක ජාතියක වෙසෙන්නට හැකි විය යුතුය" යන්න ආචාර්ය කිං වරක් පවසා ඇත. මෙය බුදුන් වහන්සේ ගේ "නජච්චා වසලො හොති" බුදු වදන සිහිපත් කරවන්නකි. මෙම ජයග්‍රහණ අතර මුල් තැනක් ගන්නේ "ප්‍රජා අයිතිවාසිකම් පිළිබඳ නීතිය අමෙරිකානු පාලන ප්‍රඥප්තියට ඇතුළත් කිරීමේ" ඓතිහාසික සිදුවීමයි.

'මාටින් ලූතර් කිං' දේවගැතිවරයකු මෙන්ම දේශපාලන යථාර්ථවාදියකු ද වශයෙන් ජාතිවාදය ප්‍රතික්ෂේප කළේය. ඔහු තම ජීවිත කාලයේදීම සුදු - කළු සහෝදරත්වයේ සිහිනය සැබෑවනු අපේක්ෂා කළේය.

ඔහු හිංසාව දැඩි ලෙස ප්‍රතික්ෂේප කළ කෙනෙකි. වරක් 'ටෙනිසි ප්‍රාන්තයේ' මෙම්පිස් හි නගර සභා සේවක වර්ජනයට සහාය දැක්වීමට පැවැති පාගමනේදී අනවශ්‍යතාව සිදුවූ ප්‍රචණ්ඩ ක්‍රියා ගැන කලකිරුණු 'කිං' කීවේ, "ඊයේ හිංසාකාරී ක්‍රියා සිදුවීමට හැකියාවක් තිබුණේ යැයි මා දැන සිටියා නම්, තමා ඊට සහභාගී නොවන" බවයි.

1964 අප්‍රේල් 03 දා, 'මෙම්පිස්' හි කළු පල්ලියක පැවැති දේශනයේදී ද, ඔහුගේ ජීවිත අවදානම ගැන ඉඟියක් පළ වී ඇත. "අනෙක් හැම කෙනෙකු සේම, මම ද දිගු කලක් ජීවත් වීමට කැමැත්තෙමි.

එහෙත් මා දැන් ඒ ගැන නොතකමි. එහෙයින් අද රාත්‍රියේ මම ප්‍රීති වෙමි. මට කිසිදෙයක් ගැන බියක් නැත. මම කිසිදු පුද්ගලයකුට බිය නොවෙමි."

මෙම දේශනයෙන් පසු ඔහු පැමිණියේ 'මෙම්පීස්' හි ලොරේන් හෝටලයේ 306 කාමරයටය. සවස 6 ට ගමනක් යාමට බැල්කනියට පිවිසි ආචාර්ය මාටින් ලූතර් කිං, අසළ මාලයක සිටි 'ජේම්ස් අර්ල් රේ' නමැති සාහසිකයා එල්ල කළ වෙඩි ප්‍රහාරයකට ගොදුරු විය. ('කිං' ගේ සිරුරේ තිබූ උන්ඩ රේ ගේ රයිපලයෙන් නිකුත් වූවක් නොවන බව පසුව අනාවරණය වී ඇත.)

ඔහු රෝහල් ගත කර, පැයක දී දෙකෝටි පනස් ලක්ෂයක් වූ කළු ජාතිකයන්ගෙන් පමණක් නොව, සමස්ත අමෙරිකානු ජනතාවගෙන් ද සමුගෙන තිබිණ. ඔහු මිය යන විට 39 වියේ පසු විය.

ඔහු ඝාතනය කරන ලද්දේ වියට්නාම් යුද්ධයට හා දිළිඳු බවට එරෙහිව ගෙනයන ලද සටන, රජයට අභියෝගයක් වූ නිසායැයි' ජෙසී ජැක්සන් පවසා ඇත.

අමෙරිකානු සම්ප්‍රදාය බිඳ දමමින්, රාජ්‍ය තාන්ත්‍රිකයකු නොවූ ආචාර්ය මාටින් ලූතර් කිං නමැති මේ මානව හිතවාදියා වෙනුවෙන්, එවකට අමෙරිකානු ජනාධිපති ව සිටි ලින්ඩන් බී. ජොන්සන් විසින් 1964.04.07 දින ජාතික ශෝක දිනයක් ලෙස ප්‍රකාශයට පත් කර, සියලුම රාජ්‍ය ආයතනවල හා විදේශීය අමෙරිකානු තානාපති කාර්යාලවල අමෙරිකානු ජාතික කොඩිය අඩකුඹු කරන ලදි.

එහෙත්, මෙම ඝාතනයෙන් කෝපයට පත් කළු ජාතිකයන් වොෂින්ටනය ඇතුලු නගර කිහිපයක විශාල දේපළ හානියක් කළ අතර, අමෙරිකානු හමුදාවට රටේ හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කර, එය මැඩ පැවැත්වීමට අතිමහත් ප්‍රයත්නයක් දැරීමට ද සිදුවිය. ඔහුගේ දේහයට ගෞරව කිරීමට පෙළගැසුණු ජනයාගේ පෝලිම කි.මී. 1½ ක් දිගු විය. එය දිවා රෑ ඉදිරියට ඇදුනත් කිසිවිටකත් කෙටි එකක් නොවීය.

අවිහිංසාවාදයේ පියා ලෙස සැලකෙන මහත්මා ගාන්ධි මෙන්ම, මාටින් ලූතර් කිං ද සාම පා ගමන් නිසා අනේකවිධ දුක් පීඩා විඳි අයෙකි. ලිපි මඟින් හා නිර්ණාමික දුරකථන ඇමතුම් මඟින් ඔහුට නිරතුරුවම මරණීය තර්ජන එල්ල විය.

කළු ජනතාව පමණක් නොව සුදු ජාතිකයන් ද එහි එකට ගමන් කළහ.

ආචාර්ය මාටින් ලූතර් කිං මිය වන විට ඔහු ලෝකයේ සුවිශේෂී ශ්‍රේෂ්ඨ පුද්ගලයකු ව සිටියේය. ශෝකය පල කිරීමට ඔහුගේ නිවසට ගිය සියලුම දෙනාට "ඔහු තම කතාවට ඔබින පරිදි චාම්ව, සරලව දිවි ගෙවූ අයකු බව" පැහැදිලි විය. ඔහුගේ වචනය හා ක්‍රියාව එකක්ම විය. ලොව ඇති වූ දාසිට කෝටි - ප්‍රකෝටි ගණන් මිනිසුන් ජීවත්ව මියැදුනත්, මිනිසත් බව ඉක්මවූ දේවත්වයට ළං වූ පුද්ගලයන් බිහිවන්නේ කලාතුරකිනි. අන්‍යයන්ගේ යහපත තකා, පරිත්‍යාගශීලීව, පරාර්ථකාමීව කැපවීමෙන් ක්‍රියා කළ මිනිසුන් සමු ගන්නේ, අවට සිටින්නවුන් ගේ දැසට කඳුළක් ද එක් කරමිනි,

ආචාර්ය කිං ඔහු උපන් ජාතියටත්, රටටත් අභිමානවත් පුද්ගලයකු වූවාසේම, මානව ඉතිහාසයේ උදාර මිනිසකු බවද සනිටුහන් කර ඇත. ඔහුගේ අවමංගලෝත්සවය සුවිශේෂී එකක්ම විය. ඔහුගේ සමු ගැනීමෙන් දින 04 කට පසුව පැවැති අනුස්මරණ උත්සවයක් අමතමින්, සැලෙන හදින් යුතුව දයාබර භාර්යාව 'කොරේටා කිං' මැතිනිය පැවැසුයේ "ඔහු ලෝකයේ දුප්පතුන් වෙනුවෙන් ද, මෙම්පීස් හි කසළ ශෝධක කම්කරුවන් හා වියට්නාමයේ ගොවීන් වෙනුවෙන්" ද තම ජීවිතය පූජා කළ බවයි. ඔහු මිහිදන් කළ සදර්න් විශ්වවිද්‍යාල සුසාන භූමියේ ශිලා පුවරුවක ඔහුගේම වදන් ලෙස මෙසේ සඳහන් වෙයි.

'අන්තිමේදී නිදහස්, අන්තිමේදී නිදහස්, සර්වබලධාරී දෙවියනි ඔබට පින් සිදු වෙයි මා අන්තිමේදී නිදහස්.'

(මාටින් ලූතර් කිං - ජීවිතය හා මරණය - ස්තනිස්ලාව් කොන්ද්‍රෂොව් පරිවර්තනය : පියසේන මානිල්ගම කෘතිය ඇසුරෙනි)

බඹරු ඇවිත් චිත්‍රපටයේ මාලනි ෆොන්සේකා සමඟ

වෙස්ගත්තෝ චිත්‍රපටයේ සෝමසිරි දෙනිපිටිය හා නාමෙල් වීරමුනි සමඟ

සත්සමුදුර චිත්‍රපට ය දර්ශන තලයේ මහාචාර්ය සිරි ගුණසිංහ හා දෙනවක හාමිනේ සමඟ

චරිතාංග නළුවන්ට පාර කියා දුන් සිරිල් වික්‍රමගේ

ඔහු හැටේ දශකයේ නිර්මාණය කළ විශිෂ්ට සිනමා කෘති කිහිපයක චරිතාංග රඟපෑවේය. "වල්මත්වූවෝ, වෙස් ගත්තෝ, නිම්වළල්ල, බඹරු ඇවිත්, මොකද වුණේ, කරුමක්කාරයෝ, සුද්දිලාගේ කතාව, සිරි මැදුර, පාලම යට, සෙයිලම, පොඩි විජේ ඒ අතර වෙයි. පුදුමය නම් සිරිල්ට මේ අසාමාන්‍ය විශිෂ්ට චරිතාංග සඳහා නිසි ලෙස ඇගැයුමක් සිදු නොවීමය. එය කනගාටුවට කරුණකි.

● ඒ. ඩී. රන්ජිත් කුමාර

සිරිල් වික්‍රමගේ නම් විශිෂ්ට රංගවේදියාගේ ප්‍රථම රංගාවතරණය වූයේ 1965 වසරේ තිරගත වූ කිංස්ලි රාජපක්ෂ අධ්‍යක්ෂණය කළ "හඳපාන" චිත්‍රපටයේ ගැහැනු හොරාගේ චරිතයයි. එය ඩබ්ලියු. ඒ. සිල්වා සූරින්ගේ නවකතාවක් ඇසුරින් සිනමාවට නැඟුණු චිත්‍රපටයකි.

"මම හඳපාන චිත්‍රපටයේ රඟපාන කොට මෙරට වේදිකාගත වූ විශිෂ්ට නාට්‍ය වූ "මූදු පුත්තු, දේවතා එළි, කුවේණි, තවත් උදෑසනක්, පබාවතී, කඳා වළලු, එලොව ගිහින් මෙලොව ආවා, නැට්ටුක්කාරි, ලියතඹරා, වෙස් මුහුණු නාට්‍යවල රඟපාල තිබුණා. මට මුලින්ම චිත්‍රපටයක රඟපාන්න කියලා ආරාධනයක් ලැබුණේ මා තේගිරිස්ගේ චරිතය රඟ පෑ "මූදු පුත්තු" නාට්‍ය බලන්න ආව සිසිර සේනාරත්න හා හර්බට් එම්. සෙනවිරත්න නාට්‍ය අවසනේ මාව හමුවීමෙන්.

"සිරිල්.... උඹ අපි කරන 'හඳපානේ' පොඩි චරිතයක් කරන්න ඕනෙ. ඔන්න බැහැ කියන්න බැහැ..." සිසිර කීවා.

"මම මීට ඉස්සර රඟපාල නෑ...." මම අකමැත්තෙන් කීවා.

"මේක පොඩි චරිතයක් වුණාට චිත්‍රපටයේ කැපී පෙනෙන චරිතයක්. සිරිල්ට තියෙන්නේ පොඩි රාලහාමිට රඟපාන පියදාස ගුණසේකර එක්ක ඒ චරිතය රඟපාන්න."

"මොකක්ද? චරිතෙ. ඉස්සර නං 'හඳපාන' නවකතාව කියවල තිබුණා."

"මේක හරමා කියන, ගෑනියෙක් හොරකම් කර ගෙන යන චරිතයක්. විජිත මල්ලිකාව උස්සගෙන යන්න තියෙන්නෙ. සිරිල් හොඳ 'බොඩි බිල්ඩර්' කෙනෙක්නේ, වැඩේ ලේසියි." හර්බට් එල්. සෙනෙවිරත්න කිව්වා.

සිරිල්ගේ දෙවැනි චිත්‍රපටය වූයේ "සත් සමුදුර" ය. එය ද සිදු වූයේ නාට්‍යයක ඔහු රඟ පෑ නාට්‍යයක් අවසන් වීමෙන් පසු ලැබුණු ආරාධනයකිනි. එදා සිරිල් රඟපෑවේ සරච්චන්ද්‍රයන්ගේ "පබාවතී" නාට්‍යයේ ඔක්කාක රජු හැටියට ය.

"අපි ගුණසේන ගලප්පත්ති ගේ "මූදු පුත්තු" නාට්‍යයෙන් චිත්‍රපටයක් හදන්න හිතාගෙන ඉන්නවා. සිරිලුත් ඒකට සම්බන්ධ කර ගන්න අපි කැමතියි." දොස්තර ලීනස් දිසානායක කිව්වා.

ගුණසේන ගලප්පත්ති අධ්‍යක්ෂණය කිරීමට සිටි ඒ චිත්‍රපටය අතරමග ඇණ හිටියේ "මූදු පුත්තු" නාට්‍යයේ පිටපත මහරගම සමන් මුද්‍රණාලයට පවරා එය මුද්‍රණය කිරීමට අවසර දී තිබීම ය. කෙසේ වෙතත් ගලප්පත්ති මේ චිත්‍රපටයේ තිර නාටකය ලිවීමට මිස අධ්‍යක්ෂණය කිරීමට සිරි ගුණසිංහ ගේ නම යෝජනා කර තිබුණු බවත් ඉන්පසු සිරි ගුණසිංහ අලුත් තිර නාටකයක් තම ශිෂ්‍ය වසන්ත ඔබේසේකර සමඟ ලියා සත් සමුදුර නමින් අධ්‍යක්ෂණය කළ බව පැවසේ.

"මම චිත්‍රපටයේ රඟපෑවේ ධීවර ගමක ජීවත් වන මාළු අල්ලන තරුණයෙකු වූ ගුණදාස හැටියට. මගේ යාළුවෝ හැටියට සෝමසිරි දෙනිපිටිය, ජෝර්ජ් සිල්වා, සුමිත් රාජසිංහ, ගබරියෙල්, ස්ටැන්ලි රෝසා රඟපෑවා. මගේ අයියා සිරිසේනට රඟපෑවේ 'මනමේ' වැදි රජු එඩ්මන් විජේසිංහ. අපේ අම්මාට රඟපෑවේ දෙනවක හාමිනේ. අයියාගේ බිරිඳ ලෙස ස්වර්ණා මල්ලවාරච්චි, මගේ පෙම්වතී ලෙස ලීනා ප්‍රනාන්දු රඟපෑව. අපි ඔක්කොම අලුත් නළු නිළියෝ. කිසිම දිලිසෙන තරුවක් නැහැ. මේ චිත්‍රපටයේ දර්ශන වලින් 90% රූගත වුණේ මීගමුවේ පිටිපන කියන ගමේ මුහුද අසල මම මේ චිත්‍රපටයේ අවසාන දර්ශනයේ තනිව ජීවත් වූ අම්මාටත් මටත් තිබූ අගහිඟකම් නිසා හිතුවක්කාර ලෙස වාරකන් කාලයේ මුහුදු යන දර්ශනය මට කිසිදා අමතක වන්නේ නෑ. කොටින්ම මම ඇත්තටම මැරෙන්න ගියා." සිරිල් කීවේය.

මේ දර්ශනය රූගත වන අවස්ථාවේ සිටි අධ්‍යක්ෂක ආචාර්ය සිරිත්, කැමරා ශිල්පී නිහාල්සිංහත්, නිෂ්පාදක දොස්තර ලීනස් අද ජීවතුන් අතර නැත. චිත්‍රපටයේ නිෂ්පාදකගේ පුත්‍ර ප්‍රවීණ චිත්‍රපට අධ්‍යක්ෂ, සංස්කරණ ශිල්පී ලාල් දිසානායක එදා පාසල් සිසුවකු ලෙස දුටු සිරිල් මැරෙන්නම ගිය අවස්ථාව අපට විස්තර කළේ මෙසේය.

"එදා ඒ දර්ශනය රූපගත කළේ ත්‍රිකුණාමලයට ඇතින් තිබූ නිලාවැලි, කුච්චවේලි මුහුදේ. එදා තිබුණේ ධාරාණිපාත වරුසාවක් සහිත දර්ශනයක් ගන්න. කෝකටත් අපි ගිනි නිවන හමුදාවේ තියෙන විශාල වතුර පොම්පයක් ගෙනල්ලා සූදානමින් හිටියෙ. උදේ 8 ට පමණ රූගත කිරීම ආරම්භ කරල අවසන් වුණේ අඳුරත් ඇවිදින් මුහුදෙ තරමක ඈත බෝට්ටුවකට වෙලා හුළං පහරට ගොදුරුවන සිරිල්ගේ දර්ශනයක්. තව පැත්තකින් හුළං පහරට ගොදුරු වෙන සිරිල් ගිනි නිවන හමුදාව මැවූ කෘත්‍රිම වැස්සට තෙම්ලා හෙම්බත් වෙලා. නිහාල්සිංහ මේ දර්ශනය ගත්තේ කලින් සූදානම් කර තිබූ මියගිය විශාල කොප්පරා මාළුවෙක් සිරිල්ගේ ඇඟට වේගයෙන් වීසි කරන්න. මාළුවා සිරිල්ගේ ඇඟට වීසි කරද්දී උගේ හොට එල්ල වුණේ ඇඟට. මාළුවා කෙළින්ම වැදුණා නම් අද අපිට සිරිල් වික්‍රමගේ කෙනෙක් නෑ."

සිරිල් කියන්නේ මේ කතාවය.

"එදා මගේ ඇඟට දාපු ලොකු කොප්පරා මාළුවා එක්ක සටන් කරන අවස්ථාව මට ජීවිතේට අමතක වෙන්නේ නෑ. ගිනි නිවන හමුදාවේ පොම්පෙන් ඝන සැරේට මැවූ කෘත්‍රිම වැස්සෙන් එක පැත්තකින් හෙම්බත් වෙලා. ආපහු එන්නත් බෑ. මුහුද යකා නටනවා. හුළං පාරට මාව වැනෙනවා. මගේ කාය ශක්තිය නිසා සමබරතාව තියා ගන්න පුළුවන් වුණා. තව පොඩ්ඩෙන් මුහුදේ මැදම මැරෙනවා. මාළුවගේ හොට වැදිලා හොට ඇනිලා පපුව තුවාල වෙලා. මම දන්න ශිල්ප දාලා මාළුවාගේ හොට අනිත් පැත්තට හැරෙව්වා. චිත්‍රපටයේ මේ අන්තිම දර්ශනය තිරයෙන් දැක්කම සතුටක් වගෙම ලොකු බයකුත් ඇති වුණා. ඒ දර්ශන තුළ තිබූ ත්‍රාසය, භීතිය, කුතුහලය මතු වුණේ සෝමදාස ඇල්විටිගලගේ සංගීත සංධ්වනියක් වැනි පසුබිම් සංගීතයෙනුත්, නිහාල්සිංහගේ කැමරාවෙනුත් තීව්‍ර වුණා. දර්ශනය ඉවර වුණාම මාව ගැහෙන්න පටන් ගත්තා. ඩොක්ටර් ලීනස් මාව තම මෝටර් රථයේ නංවාගෙන තමාට අයත් මීගමුවේ පුද්ගලික රෝහලේ සාත්තු නිවාසයට ගෙන ගිහින් ප්‍රථමාධාර දුන්නා." සිරිල් ඒ මොහොත අපට විස්තර කළේය.

සිරිල් වික්‍රමගේ යනු සිංහල සිනමාවේ චරිතාංග නළුවන්ට පාර කියා දුන් තරු සංකල්පනයෙන් බැහැර වූ රංගන ශිල්පියෙකි. 'සාරවිට' චිත්‍රපටයෙන් ජෝ අබේවික්‍රමගෙන් ඇරඹි ඒ චරිතාංග රංගනය හැටේ දශකයේ සිට ඉදිරියට ගෙන ගියේ සිරිල්ය.

1932 ජනවාරි 26 වෙනිදා කුරුණෑගල කොහිලගෙදර ගමේ උපන් සිරිල් වික්‍රමගේ තම පියාගෙන් කලා ආභාසය ලැබීය.

"මගේ තාත්තා චාල්ස් වික්‍රමගේ ගොවියෙක්. රැකියාව ගොවිකම. අම්මගේ නම ලීඩියා. වෙල් විදාන කෙනෙකුගේ දුවක්. අපේ පවුලේ සහෝදර සහෝදරියෝ අට දෙනයි. මම පස්වැනියා. අද ජීවතුන් අතර ඉන්නේ අක්කයි මල්ලි කෙනෙකු විතරයි. අපේ ගමට වාහනයක් එන්න පාරක් තිබුණේ නෑ. මම මුලින්ම ඉගෙන ගන්න සැතැප්ම 9ක් පයින් ගියේ ගැලව්මේ හමුදාවේ ආධාර ලබන පාසලකට. ඒ කාලේ ලෝක යුද්ධය තදේට තිබුණ කාලයක්. මට පුංචි කාලේ මතකයි කාපිරි සොල්දාදුවෝ අපේ ගමේ සැරිසරනවා. තාත්තාට කලාව පිහිටලා තිබුණා. දක්ෂ නැටුම් ශිල්පියකු වූ තාත්තාට බෙර ගහන්නත් දක්ෂතාවයක් තිබුණා. තාත්තා මේව කාගෙන් ඉගෙන ගත්තා ද කියලා කිව්වේ නැහැ. ගමේ නාඩගම් මඬුවේ තාත්තා 'බැලසන්ත' නාඩගමේ අපූරුවට රඟ පෑ හැටි වැඩිහිටියන් කියන කතාවලින් මට දැනගන්න ලැබුණා.

සත්සමුදුර චිත්‍රපටයෙන්

"සිරිල් උඹලගේ තාත්තා ගොවිතැන් බත් කරනනියම කලාකාරයෙක්. ඒ වගේ නටන්න, බෙර ගහන්න, නාඩගම් නටන්න කෙනෙක් වයඹ පළාතේම හිටියේ නෑ." වැඩිහිටියෙක් මට කිව්වේ කුඹුරු වැඩවලට පැමිණ ඇඹුල කන අතරවාරේ. ඒත් තාත්තා දරුවන්ට කිව්වේ මෙහෙම.

"හැබැයි පුතෝ, මම වගේ බෙර ගහනවා නටනවා නෙවෙයි උඹලා. හොඳට ඉගෙන ගන්න ඕනෑ. මේව මම ගොවිතැන් කරලා නිකං ඉන්න බැරිවට කරන ඒවා."

"අපේ ගමට ඇවිත් "අම්මා", "සීදේවී" කියන විමලවීර මාස්ටර්ගේ ටීටර් පෙන්නපු දවසේ එඩී ජුනියර් හා පර්ල් වාසුදේවි රඟපානව දැකලා මට රඟපාන්න හිතුණා. ඊට පස්සේ කුරුණෑගල රොක්සි සිනමාහලේ "කඩවුණු පොරොන්දුව" චිත්‍රපටය පෙන්වන විට මම බලන් හිටියේ තිරය රූප වැටෙන්නේ කොහොමද කියලා. මට මේක මැජික් එකක්."

සිරිල් අපට කී ආකාරයට, තමා වයලීන් හා තබ්ලා වාදනයට දක්ෂයෙක්ව සිටි බව ය. ගමේ මඟුල්වල 'බජව් පාටි' වල සින්දුත් කියලා වාදනයත් කළාලු. ඒ කතා සිරිල් කියන විට අපට එකවරම මතකයට ආවේ "සත් සමුදුරේ' ඔහු මිතුරන් සමඟ එක්වී ගැයූ "දැක්කොත් පද්මාවතී ආලේ නොකරා බැරි" ගීතය මැන්ඩලීනයක් වයමින් ගැයූ දර්ශනයයි. (චිත්‍රපටයේ පසුබිම් ගායනය එම්.ඩී. චන්ද්‍රපාලගෙනි.) සිරිල්ට උපතින්ම හිමි වූ අර ලස්සන හිනාව, ජවය, තාරුණ්‍යය කැටි කළ දර්ශනයකි මේ. මහනුවර සිරිල් පෙරේරා කලායතනයේ අධිපතිගෙන් (ප්‍රවීණ සංගීතඥ ආනන්ද පෙරේරා ගේ පියා) වයලීන වාදනය ඉගෙන ගත් සිරිල් ගාන්ධර්ව විභාගයෙන් සමත්ව කොළඹ ගොස් සංගීතඥ සදානන්ද පට්ටිආරච්චිගෙන් ද වැඩි දුර සංගීතය ඉගෙන ගත්තේය.

"මම ගමේ පාසලින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සමත් වී ජේරාදෙණිය ගුරු අභ්‍යාස විද්‍යාලයෙන් පුහුණුව ලබා විද්‍යෝදය විශ්වවිද්‍යාලයෙන් (අද ජ'පුර) උපාධිය ලැබූ මගේ මුල්ම ගුරු පත්වීම මට ලැබුණේ රත්මලාන අඳ, ගොළු, බිහිරි විද්‍යාලයට. අහිංසක දරුවන් සමඟ ගත කළ ඒ කාලය මගේ ඉදිරි රංගන ජීවිතයට අත්පොතක් වුණා. එතැනින් කොළඹ වෙස්ලි විද්‍යාලයේ ගුරුවරයෙක් වීමෙන් මගේ කලා ලෝකයට දොරටුව විවෘත වුණා. එහි ම ගුරුවරයකුව සිටි ෆීලික්ස් ප්‍රේමවර්ධන ගේ "මිනිස් ගතිය" නම් වේදිකා නාට්‍යයේ රඟපෑමෙන් මම ප්‍රසිද්ධ වේදිකාවට ආව. විද්‍යාලයේ නැටුම් ගුරුවරයා වූ ශ්‍රී ජයනා ගේ "රණතිසර" නාට්‍යයේ මම රඟන විටයි සුප්‍රකට ගායක, ගීත රචක ආනන්ද සමරකෝන් මාව ඔහුගේ "රන් එතනා" නාට්‍යයට තෝරා ගත්තේ. ඒ නාට්‍ය යේ රඟ පෑ ධම්ම ජාගොඩ සහ ෂෙල්ටන් සිල්වා හඳුනා ගැනීමෙන් මගේ කලා ජීවිතයට රුකුලක් ලැබුණා." සිරිල් තම අතීත කතාවක් සිහිපත් කළේය.

මේ කාලයේ සිරිල් නවාතැන් ගෙන සිටියේ බොරැල්ලේ "ඩි රොයි" රෙස්ටුරන්ට් එකේ උඩු මහලේ කාමරයකය. ධම්ම හා සමරකෝන් එහි නවාතැන් ගත්හ. මේ අතර ධම්ම හා කාය වර්ධනය ව්‍යායාම් කළේ. මිතුරෝ ඔවුන්ට කීවේ "හොඳ බොඩි බිල්ඩර්ස්ලා" කියාය. හැටේ දශකයේ නිර්මාණය කළ හොඳම විශිෂ්ට සිනමා කෘති කිහිපයක චරිතාංග රඟ පෑවේය. "වල්මත්වූවෝ, වෙස් ගත්තෝ, නිම්වළල්ල, බඹරු ඇවිත්, මොකද වුණේ, කරුමක්කාරයෝ, සුද්දිලාගේ කතාව, සිරි මැදුර, පාලම යට, සෙයිලම, පොඩි විජේ ඒ අතර වෙයි. පුදුමය නම් සිරිල්ට මේ අසාමාන්‍ය විශිෂ්ට චරිතාංග සඳහා නිසි ලෙස ඇගැයුමක් සිදු නොවීමය. එය කනගාටුවට කරුණකි.

සිරිල්ගේ සිනමා ජීවිතයේ අමතක නොවන අවස්ථා දෙකක් විස්තර කළේය.

"මම හාපුරා කියලා අධ්‍යක්ෂණය කළ "සිහින ලොවක්" චිත්‍රපටයට ගීතයක් ලියා ගන්න මහගම සේකරව සොයාගෙන ගම්පහ ඔහුගේ ගෙදරට ගියා.

"සේකර, මචං මට සින්දුවක් ඕනෑ. ඉක්මනට ඕනෑ."

"කලබලේ සින්දුවක් ලියන්න බැහැ. උඹට හදිසි නම් මගේ මේ දිනපොතේ මම කුරුටු ගාපු ගීත කීපයක් ඇති. චිත්‍රපටයට ගැළපෙන ගීතයක් උඹ තෝරා ගනින්."

මම දිනපොත පෙරළලා බැලුවම ගැළපෙනම ගීතය හමුවුණා. "මා මළ පසු සොහොන් කොතේ දුක් ගීයක් ලියනු මැනවි." ලියපු කඩදාසිය කඩා ගත්තා.

"මේ තියෙන්නේ මට ඕනෑ සින්දුව" මම කෑගහල සේකරට කිව්වා.

මම සින්දුවත් අරං සංගීත අධ්‍යක්ෂ සෝමදාස ඇල්විටිගල සොයා ගෙන ගිහින් දුන්නා.

"මේකට මම හොඳ තනුවක් දාන්නම්. අපි අමරේ ලවා රහට මේක කියවමු." ඇල්විටිගල අමරදේවගේ නම යෝජනා කළා.

අද සේකරත්, අමරදේවත්, ඇල්විටිගලත් ජීවතුන් අතර නැහැ. ඒත්, "මේ ලොව යම් කිසිවකු මා හට පෙම් කළ බව එතකොට ඒ ගී රාවය හීන් හඬින්" මට තවමත් ඇහෙනවා.

සිරිල් වික්‍රමගේ නම් මේ විශිෂ්ට රංගවේදියා 89 වැනි විය පසු කරමින් ගල්කිස්සේ ටෙම්පලර් පාරේ කලාපුර නිවාසයේ පදිංචිව සිටී. සිරිල්ගේ බිරිඳ විනිෂ්‍රීඩා පෙරේරාය. ඇය සංගීත අධ්‍යක්ෂ, චිත්‍රපට නළු චින්සන්ට් ප්‍රේමසිරිගේ සහෝදරියකි. චන්දන, චත්සලා, දිසාලා, ලක්ෂිත ඔවුන්ගේ දූ දරුවන්ය.

හරි වහර

● ශ්‍රීනාත් ගණේවත්ත

නිවැරැදි ල - ළ යෙදුම තව දුරටත් විමසමු

හරි වහර විමැසුම් නුවණින් යුතුව කියවා එහි හරි වැරැදි දක්වන්නට පෙලැඹෙන්නන් වැඩි වීම මහත් සතුටට කරුණෙකි. ගිය වර ලිපියෙහි දැක්වුණු 'පලඳ' ධාතුවෙන් ඇති වන පදවල (මූර්ධජ) 'ළ' නොව, (දන්තජ) 'ල'ම යෙදෙන බව පිළිබඳ වැ වියත් කෙනෙක් විමැසීමක් කෙරෙති. සිංහලය ගැන මනා දැනුමක් ඇති කෙනකුන් සේ පෙනීයන ඔවුන්ගේ අදහස වනුයේ එහි ලා මූර්ධජ, දන්තජ දෙක ම යෙදීම නිවැරැදි බව යි. එහි ලා නිදසුනුදු දක්වන ඔහු කුමාරතුංග මුනිදාසයන් පවා 'ළ' යොදා 'පළඳ' යන ක්‍රියා මූලය ලියා ඇති සැටි පෙන්වාලති.

ඒ සැබෑවෙකි. කුමාරතුංගයන් 'ක්‍රියා විවරණය' නම් ග්‍රන්ථයෙහි ඒ දක්වා ඇත්තේ 'ළ' සහිත වැ 'පළඳ' යනුවෙනි. වෙනත් තන්හි ද එසේ 'ළ' යොදා ඇති අයුරු පෙනේ. මහ වියතුනුත් මෙහි ලා 'ළ' යොදන බව මුලින් ම කියන ලදුයේ මෙබඳු තැන් ඇති නිසා යි.

ඡේක ව්‍යවහාරයෙන් ම නිවැරැදි යෙදුම සොයා ගත නොහැකි කල්හි වචනයෙහි නිෂ්පත්තිය (නිපැදී ඇති අයුරු) විමසන්නට සිදු වෙයි. 'පලඳ' යන්න හා අනුරූපව පාලියේ යෙදෙනුයේ 'පිලන්ධ' යනු බව කලින් ලිපියේ දැක්විණ. ඒ 'පිලන්ධ' යන්න හා අනුරූප වැ සංස්කෘතයේ යෙදෙනුයේ 'අපිනන්ධ' යන්න බව කියැවේ. එහි යෙදෙන (දන්තජ) න පාලියේ දී (දන්තජ) 'ල' බවට හැරෙති යි සිතිය හැකිය. දන්තජ අක්ෂරයන් මූර්ධජ බවට නොහැරුණ හෙයින් මෙහි (දන්තජ) 'ල' යනු ම යෙදෙන බව ස්ථිරව කිය හැකිය. එනයින් සිංහලයෙහි දු 'පලඳ' යන්නෙහි 'ල' විනා 'ළ' නො යෙදෙන බව නිසැක ය.

'අළුයම' යනු ද නිතර ම වහරෙහි යෙදෙන වදනෙකි. මෙහි ද 'ළ' යන මූර්ධජාක්ෂරය යෙදීම වරදෙකි. 'අලුයම' යනුවෙන් (දන්තජ) 'ලු' සහිතව ලිවීම නිවැරැදි වේ.

'අලුයම' යනු සමාසයෙකි. එ නම් වදන් දෙකෙක එකතුවෙන් අති වූවෙකි. එහි 'අලු' යනු එළිය යන අරුත දෙයි. යම යනු යාමය හෙවත් දවසෙකින් එක්තරා කොටසක් වෙයි. 'අලු' යන වදන හා අනුරූප වැ පාලියෙහි ද සංස්කෘතයෙහි ද නොවෙනස් ව යෙදෙනුයේ 'ආලෝක' යනු යි. එහි යෙදෙනුයේ (දන්තජ) 'ල' (ලෝ) යනු ම ය. එනයින් සිංහලයෙහි ද 'අලු' යන්නෙහි 'ල' (ලු) විනා 'ළ' (ළු) නොයෙදේ. එහෙයින් 'අලුයම' යනු ම ය නිවැරැදි. 'ළු' ඇති වැ 'අළු' යැ යි ලියුවහොත් හස්ම හෙවත් ගිනි ගෙන දැවී ඉතිරිය අදහස් කැරේ.

'අළුත්' යනු ද එසේ ම බෙහෙවින් යෙදෙන වැරැදි යෙදුමෙකි. එහි නිවැරැදි වනුයේ 'අලුත්' යන (දන්තජ) 'ල' යුත් වදන ය. මූර්ධජ 'ළ' (ළ) සහිත 'අළුත්' යන්නේ අරුත නම් 'හස්ම ද' යනුයි. 'නව' අරුත එ වදනෙහි නොවේ. එහෙයින් අලුත් අවුරුද්ද, අලුත් පොත ඈ තන්හි දී (නව යන අරුතින්) යෙදිය යුතු 'අලුත්' යනු ම ය. මේ වදන නිපැදුණු අයුරු පැහැදිලිව කිය නොහැකිය. ඇතැම්හු ආලෝකය, එළිය යන අරුතෙහි (යට කී) 'අලු' යන්නට 'අත්' ප්‍රත්‍යය එක් ව නිපන් තද්ධිතයක් සේ මෙය දක්වති. නව දෙයෙහි එළියක් ඇති හෙයින් 'අලුත්' යනු නව, නවීන අරුතෙහි යෙදෙති යි යනු ඔවුන්ගේ මතයයි. මේ තවද විමැසිල්ලට ලක් කළ යුතු බව හැඟේ.

නිතර වරදවන තව ද වදනක් නම් 'දැළි' යනු යි. 'දැළි වළන්', 'දැළි ගෑවුණා' වැනි යෙදුම් බෙහෙවින් දැකිය හැකිය. මෙහි (මූර්ධජ) 'ළ' (ළි) යෙදීම ඉඳුරාම වැරැදියි. 'දැලි' යන (දන්තජ) 'ල' (ලි) සහිත වදන ම ය. නිවැරැදි දැලි යනුවෙන් ගැනෙන්නේ ගින්නෙන් නිකුත් වන අංගාරක (කාබන්) අංශු යි. ගිනි සිළුව ද දැලි නමින් ගැනේ. ගිනි දැල්ල යනු එයයි. දැල්ල යනුවෙන් ඒක වචනයෙහිදී මෙහි 'ලි' යනු ද්විත්ව වන බැවින් (දන්තජ) 'ල' ම මෙහි නිවැරැදි බව වඩාත් තහවුරු වෙයි. සංස්කෘතයෙහි, ජ්වාල පාලියෙහි ජාලා ආදිය මේ හා අනුරූප ව යෙදෙන බව පෙනේ.

'දැළි' යන (මූර්ධජ) 'ළ' යුතු වදන ද වැරැදි නොවෙයි. එහෙත් එයින් ලැබෙන්නේ වෙනත් අරුතෙකි. එනම් 'රවුළ' යනුයි. 'දැළි රවුළු' යන තන්හි එය පැහැදිලි වැ පෙනේ. පාලියෙහි දාඨිත යන්න ඒ හා අනුරූප වෙයි. මහාදාඨික මහානාග (මාදැළිමානා) යන රාජ නාමයෙහි එවදන යෙදී ඇත්තේය.

'දැලි' යන (දන්තජ) 'ල' සහිත වදන එක්තරා සමුදු ජීවි විශේෂයකට ද යෙදේ. ඒ උන්ගේ සිරුර තුළ දැලි පැහැති ස්‍රාවයක් ඇති නිසා ද යනු විමැසිය යුතුය.

කපිතාන් ෆුචිඩා

කොළඹට සහ ත්‍රිකුණාමලයට ජපනුන් එල්ල කළ ප්‍රහාර වලට මෙම වර්ගයේ යානාද යොදා ගැනින.

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විශ්‍රාමික විං කමාන්ඩර් රංජිත් රත්නපාල 2018 දී චීන වරායේ සහ මොරවැව ගුවන් හමුදා ඉතිහාසය පිළිබඳ කළ පර්යේෂණාත්මක ග්‍රන්ථයකට අනුව ජපන් ගුවන් යානය සහ තෙල් ටැංකිය ගිනිගෙන දැවුණු සුන්බුන් අතර තිබී හමුවුයේ එක් මිනිස් හිස් කබලක් පමණි

සතුරාගෙන් බේරීමට මෙරටදී මහන්ෂ වූ ගුවන් නැවියෝ



ගිනිගෙන දැවෙන හර්මිස් නෞකාව

● ජානක පෙරේරා

මෙම කතාවේ පටන්ගැන්ම මීට වසර හැත්තෑ අටකට පෙර, මෙරට බ්‍රිතාන්‍ය යටත් විජිතයක්ව පැවති සමයේ සිදු වුවද ඒ පිළිබඳ සැබෑ පුවත හෙළිවුයේ මීට තුන්වසරකට පෙරය. මීට පසුබිම් වුයේ දෙවන ලෝක යුද සමයේ 1942 අප්‍රේල් නවවැනිදා පාන්දර ත්‍රිකුණාමලයේ බ්‍රිතාන්‍ය නාවික හමුදා කඳවුරට සහ චීන වරායට ජපනුන් ගුවනින් බෝම්බ හෙළීමයි. ඒ ගුවන් ප්‍රහාර එල්ල වූයේ ඔවුන් කොළඹට සහ ඒ අවට පෙදෙස් වලට පහර දී සිවු දිනකට පසුවය.

ත්‍රිකුණාමල ප්‍රහාරයට සම්බන්ධ වූ ජපන් ගුවන් යානා සමූහයට යානා එකසිය විසි පහක් ඇතුළත් විය. ඒ පහර දීමේදී නැගෙනහිර මුහුදේ දෙස සිට ගුවන් යානා වාහක නැව් මතින් අහසට නැග සිය ඉලක්ක දෙසට පියාසර කල යානා සමූහයේ එන්ජින් වල ශබ්දය සැතපුම් ගණනාවකට දුරින්ද ඇසුණු බව එවකට රත්මලාන සහ චීන වරාය ගුවන් තොටුපළවල බුද්ධි අංශ ස්ථාන භාර නිලධාරියෙකු (Station Intelligence Officer) ලෙස කටයුතු කළ බ්‍රිතාන්‍ය රාජකීය ගුවන් හමුදාවේ මයිකල් ටොම්ලින්සන් පවසයි. ඔහු එය සඳහන් කරන්නේ ජපන් ගුවන් ප්‍රහාර පිළිබඳව ලියූ THE MOST DANGEROUS MOMENT (ඉතා අවදානම් මොහොත) නම් පොතේය.

ඒවාට මුහුණ දීමට බ්‍රිතාන්‍ය ගුවන් හමුදා යානා විසි එකක් චීන වරාය ගුවන් තොටුපළෙන් ගුවන් ගතවිය. පොළොවේ සිට අඩි විසි දෙදහසක සිට අඩි අටදහසක උසක් අතරතුර අහසේ සිදුවූ ඒ සටන සම ශක්තියෙන් සිදුවූවක් නොවින. ඒ ජපන් යානා ගණන බ්‍රිතාන්‍යයයන්ට ඒ අවස්ථාවේ සතුව තිබූ යානා ගණනට වඩා වැඩි වීමය. ඒ සටනින් බ්‍රිතාන්‍ය යානා එකොළහක් විනාශ වූ අතර චීන වරායේ බිම නවතා තිබූ තවත් යානා රැසකටද ඒ ඉරණම අත්විය.

ත්‍රිකුණාමලයේ බ්‍රිතාන්‍යය නාවික හමුදා මධ්‍යස්ථානයටද බෝම්බ හෙළීමෙන් එක් වෙඩි උණ්ඩ ගබඩාවක් ගිනිකෙළි සංදර්ශනයක් විලසින් පුපුරා යනු ඉහළ සිට දුටු බව ප්‍රහාර මෙහෙය වූ ජපන් නාවික-ගුවන් හමුදා කපිතාන් මිට්සුඕ ෆුචිඩා පවසයි (Midway: The Battle that doomed Japan in five fateful minutes).

එදා ජපනුන් හෙළු එක් බෝම්බයක බර කිලෝ ග්‍රෑම් අටසියයකි.

ජපන් ගුවන් යානා ත්‍රිකුණාමල නාවික කඳවුරට ඉහළින් පියාසර කරද්දී ලංකා ගැරිසන් කාලතුවක්කු හමුදාවේ භටයෝ බිම සිට ඒ දෙසට වෙඩි තැබූහ. එහෙත් ප්‍රහාරය නතර කරන්නට ඔවුන්ට නොහැකි විය.

රාජකීය නාවික හමුදාවේ හර්මිස් (Hermes) නම් ගුවන් යානා වාහක නෞකාවද වැම්පය (Vampire) නම් යුද නැවක්ද ගිල්වා දැමීමට ජපන්නු සමත්වූහ. ඔවුන් ත්‍රිකුණාමලයේ බ්‍රිතාන්‍ය යුද කඳවුරු වලට සහ වරායට එල්ල කළ ගුවන් ප්‍රහාරයේදී හත්සියයක පමණ පිරිසක් මියගිය අතර ඉන් වැඩිදෙනා බ්‍රිතාන්‍ය රාජකීය ගුවන් හමුදාවේ අය වූහ. ඉතිරි පිරිස වරාය සේවකයන්ය. ජපන් ගුවන් නැවියන් කිහිප දෙනෙක්ද මිය ගියහ. දේපළට සහ යුධෝපකරණ වලට සිදුවූ අලාභ හානිද විශාල විය.

නැවියන් දෙදෙනා තමන් කවුදැයි විහාරාධිපතීන් වහන්සේට පැවසූ විට උන්වහන්සේ ඔවුන් පිළිගෙන හොඳින් සංග්‍රහ කළහ. (ඒ කාලයේ බ්‍රිතාන්‍ය විරෝධී බොහෝ සිංහල බෞද්ධයන් තුළ ජපනුන්ට යම් පක්ෂපාතිත්වයක් තිබිණි). නැවියන් දෙදෙනා බෞද්ධයන් බව දැනගත් විට ඔවුන් පැවිදි කිරීමට විහාරාධිපති හිමියෝ කැමැත්ත පළ කළහ. බ්‍රිතාන්‍යයන්ගෙන් ආරක්ෂා වීමටද එය අවස්ථාවක් බව වටහාගත් ජපනුන් දෙදෙනාද ඊට එකඟ වූහ

ගුවන් ප්‍රහාරයෙන් වසර හැත්තෑ පහකට පසු එනම් වසර 2017 මැයි මාසයේ දිනෙක එවකට ලංකාවේ ජපන් තානාපතිව සිටි කෙනිචි සුගනුමා මහතා ත්‍රිකුණාමලයේ කළ සංචාරයකදී එහි තෙල් ටැංකි පරිශ්‍රයේ අංක 91 දරන තෙල් ටැංකිය වෙත ගොස් එහිදී මළවුන් වෙත පිදෙන මල් වඩමක් තැන්පත්කොට කොට හිස නමා ආචාර කළේය. ඒ 1942 දී ජපන් ගුවන් ප්‍රහාරයේදී එම තෙල් ටැංකියේ වැදී ගිනිගත් ජපන් ප්‍රහාරක යානයක සිටි ජපන් නැවියන් තිදෙනෙකු සිහිකිරීම පිණිසය. ඔවුන්ගෙන් කෙනෙක් තානාපති සුගනුමාගේ සීයා කෙනෙකි.

ෂිගෙනොරි වටනබේ, ටොකියා ගොටෝ සහ සුටොමු ටොෂිරා යන ඒ තිදෙනා සිහිවීම පිණිස සිංහලෙන් සහ ඉංග්‍රීසියෙන් දැන්වීම් පුවරුවක් එම තෙල් ටැංකියේ සුන්බුන් අසල සවිකර ඇත. ඔවුන් ගමන් කළ යානයේ එන්ජිමේ ඉතිරිවූ කොටස් ද අදත් එහි දක්නට ඇත.

ප්‍රහාරක යානය කඩා වැදීමත් සමඟ ලීටර් මිලියන 1.2 ක ධාරිතාවකින් යුත් එම ටැංකියට (පරිශ්‍රයේ අනෙක් ටැංකි මෙන්) ඇවිළුණු ගින්න සහමුලින්ම නිවීයාමට දින කිහිපයක්ම ගතවී යයි මයිකල් ටොම්ලින්සන් පවසයි.

දශක හතකටත් වැඩි කලක් පුරා මේ ගැන පැතිරුණු කතාව වූයේ ලක් පොළොවට ඉහළින් සිදුවූ ගුවන් සටනකදී පළමු වරට සතුරා නැසීමට මරාගෙන මැරෙන අදිටනින් ජපන් ගුවන් නැවියන් තිදෙනා දිවි පිදූ බවය.

ටොම්ලින්සන් පවා සිය පොතේ සඳහන් කරන්නේ වටනබේ, ගොටෝ සහ ටොෂිරා රැගත් ප්‍රහාරක යානය තෙල් ටැංකියට ඉහළින් වටයක් ගසා එකවිටම ඒ මතට වේගයෙන් කඩා වැදී තිදෙනාම පණපිටින් දවමින් ඒ ටැංකිය ඔවුන්ගේ අවමඟුල් චිතකය බවට පත් කරගත් සැටිය. (ඇත්ත වශයෙන්ම ජපානය එවැනි මරාගෙන මැරෙන ගුවන් සේනාංකයක් පිහිටවුයේ ත්‍රිකුණාමල ප්‍රහාරයෙන් දෙවසරකට පසුවය).

මේ සිද්ධියේ සැබෑ තතු හෙළිවුයේ විශ්‍රාමික ශ්‍රී ලංකා ගුවන් හමුදා විං කමාන්ඩර් රංජිත් රත්නපාල 2018 දී චීන වරායේ සහ මොරවැව ගුවන් හමුදා ඉතිහාසය පිළිබඳ කළ පර්යේෂණාත්මක ග්‍රන්ථයක් නිසාය. ඔහු පවසන අන්දමට ජපන් ගුවන් යානය සහ තෙල් ටැංකිය ගිනිගෙන දැවුණු සුන්බුන් අතර හමුවුයේ එක් මිනිස් හිස් කබලක් පමණි. එසේ නම් මියගියා යැයි විශ්වාස කළ අනෙක් දෙදෙනාට වූයේ කුමක්ද?

මේ ගැන මෙතෙක් කිසිවෙකු නොදැන සිටි කරුණු රත්නපාල මහතාට පැවසුවේ විශ්‍රාමික නාවික හමුදා නිලධාරි ලුතිනන් කමාන්ඩ සෝමසිරි දේවේන්ද්‍ර මහතාය. ඔහු සිද්ධිය වූ ස්ථානයේ ඡායාරූප ගත් අතර ඔහුගේ සොහොයුරා ඔහු එකතු කරගත් කරුණු පදනම් කරගෙන ලිපියක් පළ කළේය. ගුවන් ප්‍රහාරයේදී මියගියේ යැයි විශ්වාස කරනු ලැබූ එක් ජපන් නැවියෙකුගේ ඥාතීන්ට එම ලිපිය කියවන්නට ලැබී ඔවුහු දේවේන්ද්‍ර හමුවන්නට මෙරටට පැමිණියහ.

එදා ත්‍රිකුණාමලයට පහර දීමේදී තෙල් ටැංකිය මතට කඩාවැදුණු ජපන් ගුවන් යානයේ නැවියන් මරාගෙන මැරෙන සේනාංකයක භටයන් නොවූ බව පැහැදිලි කළ ඥාතීහු දේවේන්ද්‍ර මහතා සමඟ චීන වරායේ එම සිද්ධිය වූ ස්ථානයට ගියහ.

ඔවුන් දෙවේන්ද්‍රට පැවසූ අන්දමට යුද්ධයෙන් පසු හෙළි වූ ඇත්ත කතාව මෙයයි.

ගුවන් ආක්‍රමණයේදී වටනබේ, ගොටෝ සහ ටොෂිරා ගමන් කළ යානයේ එන්ජිම ක්‍රියාවිරහිත වූයෙන් යානය තෙල් ටැංකිය මතට කඩාවැටෙන්නට යන බව දැනගත් නියමුවා අනෙක් දෙදෙනාට පැරවූට ආධාරයෙන් ඉවතට පැන දිවි බේරාගන්නා ලෙස කියා ඇත. එසේ දිවි බේරාගත් නැවියන් දෙදෙනා පතිත වූයේ කැලයකටය.

විශාල වනගහනයක් එකල ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ තිබූ හෙයින් ඔවුන් දෙදෙනා රහසේම ඝන කැලය මැදින් චීන වරායට කිලෝ මීටර් පනහක් පමණ ඈතින් තිබූ පන්සලකට සේරුවාවිල රජමහ විහාරයට ළඟා වීමට සමත් වූහ.

ඔවුන්ට එම ප්‍රදේශය ගැන යම් අවබෝධයක් සහ අරමුණක් පැවති බව ඉන් පැහැදිලිවන බව දේවේන්ද්‍ර මහතා කියයි.

නැවියන් දෙදෙනා තමන් කවුදැයි යයි විහාරාධිපතීන් වහන්සේට පැවසූ විට උන්වහන්සේ ඔවුන් පිළිගෙන හොඳින් සංග්‍රහ කළහ. (ඒ කාලයේ බ්‍රිතාන්‍ය විරෝධී බොහෝ සිංහල බෞද්ධයන් තුළ ජපනුන්ට යම් පක්ෂපාතිත්වයක් තිබිණ). නැවියන් දෙදෙනා බෞද්ධයන් බව දැනගත් විට ඔවුන් පැවිදි කිරීමට විහාරාධිපති හිමියෝ කැමැත්ත පළ කළහ.

බ්‍රිතාන්‍යයන්ගෙන් ආරක්ෂා වීමටද එය අවස්ථාවක් බව වටහාගත් ජපනුන් දෙදෙනාද ඊට එකඟ වූහ.

නැවියන් දෙදෙනා තමන් කවුදැයි යයි විහාරාධිපතීන් වහන්සේට පැවසූ විට උන්වහන්සේ ඔවුන්ව පිළිගෙන හොඳින් සංග්‍රහ කළහ. (ඒ කාලයේ බ්‍රිතාන්‍ය-විරෝධී බොහෝ සිංහල බෞද්ධයන් තුළ ජපනුන්ට යම් පක්ෂපාතිත්වයක් තිබිණ). නැවියන් දෙදෙනා බෞද්ධයන් බව දැනගත් විට ඔවුන් පැවිදි කිරීමට විහාරාධිපති හිමියෝ කැමැත්ත පළ කළහ. බ්‍රිතාන්‍යයන්ගෙන් ආරක්ෂා වීමටද එය අවස්ථාවක් බව වටහාගත් ජපනුන් දෙදෙනාද ඊට එකඟ වූහ.

එබැවින් ඔවුන් දෙදෙනාගේ හිස් බූ ගා පැවිදි කරවන ලදී. සාමනණේර දෙනමක් ලෙස මාස කිහිපයක් එම පන්සලේ සිටීමෙන් පසු එවකට ජපන් පාලනය යටතේ පැවති බුරුමයට (අද මියන්මාරය) රහසේ පලායාමට ඔවුන්ට අවස්ථාව ලැබිණ. ඉන් පසු ලෝක යුද්ධය වසර 1945 සැප්තැම්බරයේදී අවසන් වන තුරුම බුරුමයේ සිටි ඒ භික්ෂූන් දෙදෙනාගෙන් කෙනෙක් යුද්ධය අවසානයේදී උපැවිදිව ආපසු ජපානයට ගොස් ඇත. තමන් පිළිබඳ සැබෑ කතාව සිය ඥාතීන්ට හෙළි කළේ ඔහුය. අනෙක් භික්ෂුව මහණදම් පුරමින් අපවත් වන තෙක්ම බුරුමයේ වාසය කළේය.

තෙල් ටැංකියේ සහ ඒ මත කඩා වැටුණු ගුවන් යානයේ සුන්බුන් අතර තිබී යුද්ධයෙන් පසු හමු වූ මියගිය නැවියාගේ හිස් කබල ඔහුගේ ඥාතීන්ට බාර දෙන ලදී.

අහන හැටි හා ප්‍රතිචාර ලැබෙන හැටි

● මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර

"ඔබ යම්කිසි කෙනකු හමුවී ඔහුගෙන් හෝ ඇයගෙන් නිසි ප්‍රතිචාර ලබාගැනීමට කැමැත්තක් දක්වනවා නම් ඒ සඳහා කල් ඇතිව සූදානමක් (Preparation) තිබිය යුතුයි. ඔබ අහන්නේ මොන වාගේ ප්‍රශ්නද? ඒ ප්‍රශ්න අහන්නේ මොන විදියේ තානයකින්ද (tone) යන්න පිළිබඳව ඔබට හොඳ අවබෝධයක් තිබිය යුතුයි." මේ විදියටය අපේ මාධ්‍යවේදී ගුරුතුමා වන ජෝර්ජ් ශෝට් (george short) තම අභ්‍යාසය පටන් ගත්තේ. අපේ ගුරුතුමා අප වෙනුවෙන් අපූරු පුංචි අත්පොතක් සූදානම් කළ බවක් අපට පෙනුනා. ඒ අත්පොත (Hand Book) ප්‍රශ්න, උත්තර, සංවාද හා කතාවලින් පිරුණු අපූරු වර්ගයේ පොතක්. හැම පිටුවක්ම අපට ඵලදායකයි. පටන්ගන්නා නිශ්චිත තැනක් හෝ අවසන්වන නිශ්චිත තැනක් දැකගත නොහැකියි. අපෙන් ප්‍රශ්න කෙරෙනවා. අපගෙන් ප්‍රතිචාර ලැබෙනවා.

අපට කොතැනදි වුනත් අහන්න වෙන්නේ මූලික ප්‍රශ්න කීයද?

කොයි කවුරුනුත් කිනම් සමාජයක වුනත් අහන්නේ ප්‍රශ්න කීයද?

කවුද? who?
කුමක්ද? what?
කොහේද? where?
කවුදාද? when?
කොහොමද? How?

තවත් ප්‍රශ්න කොතෙකුත් නැතැයි කීම අපහසුය. එහෙත් මේ තමයි සංවාදයකදි නැඟෙන මූලික ප්‍රශ්න.

"කුමක්ද මේ ප්‍රශ්නවල පවතින අපූරුව?"

ගුරුතුමා ඉතා කෙටියෙන් ප්‍රතිචාර දක්වන අයුරු දිගු දැක්මකට මුල පිරෙනවා.

"ප්‍රශ්න නොඅසා ජීවිත කාලය ගෙවිය හැකිද? ප්‍රශ්න අසන්නට අසන්නට ඒවාට කිසියම් ප්‍රතිචාරයක් ලැබෙනවා නොවේද? ඇතැම් ප්‍රශ්නයකට ප්‍රතිචාරය නිශ්ශබ්දතාව (Silence) වෙන්නට පුළුවන්.

නිශ්ශබ්දතාවෙන් ලැබෙන ප්‍රතිචාරය ශබ්දයකින් ලැබෙන ප්‍රතිචාරයකට වඩා ප්‍රබල බවත් හඳුනා ගැනීමට සිදුවෙනවා.

රංග කලාවේදි රංග ගුරුවරුන් භාවිතයට ගන්නා එක් යෙදුමක් අපට මතක් කර ගත හැකියි.

ඒ කුමක්ද?

ඒ තමයි ඵලදායක බලපෑමකින් යුත් නිශ්ශබ්දතාව (effective silence)

බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් (Bertolt Brecht) නම් වූ මහා රංගධරයා කීදෙයක් ඊළඟට සංවාදයක් ලෙස අප හමුවට එයි.

"මගෙන් ප්‍රේක්ෂකාගාරයේ හුන් එක්තරා උගතෙක් වතාවක් ප්‍රශ්නයක් නැඟුවා.

මොකක්ද ඒ ප්‍රශ්නේ?

ඔබේ නාට්‍යයේ රඟපෑ නළුනිළි කැල හිටිගමන් කතාවක් බහක් නැතිව හිටිපිළිම වාගේ නිශ්ශබ්ද වුණා.

ඇයි ඒ? ඒ ප්‍රශ්නය යොමු කළ උගතාගෙන් පෙරළා මමත් ඒ ප්‍රශ්නයම ඇහුවා.

ඒ ඇයි?

"නිශ්ශබ්දතාවක් එතනදි අවශ්‍යයි කියල දැනුණා"

"ඔබට එහෙම දැනුණාද?"

"ඔව්"

"මටත් එහෙම දැනුණා"

"මේ නිශ්ශබ්දතාවට වේලාවයි කියල අමුතුවෙන් කීමට අවශ්‍ය වෙන්නේ නැහැ. ඒ නිසා නිශ්ශබ්දතාව ප්‍රබල ප්‍රතිචාරයක්. 'උසාවිය නිශ්ශබ්ද වෙනු' කියල අපට හඬක් ඇහෙනවා.

නිශ්ශබ්දතාව මධ්‍යයේ මහවිනිසකරු උසාවි ගර්භයට ඇතුළුවෙන්නේ. නිශ්ශබ්දතාව වර්ග දෙකක්. තවත් සමහරු අහන ප්‍රශ්නයට වදනින් පිළිතුරු නොදී සිනහවෙන් පිළිතුරු දෙනවා.

(Respond with a smile) ඒ සිනහවෙන් බොහෝ දේ පැවසෙනවා. ඒ විතරක්ද? සිනහව වගේම තමයි, හැඬිල්ල (Cry) සිනහවෙවී ඉඳල හිටි ගමන් කෙනෙක් හඬන්නට පුළුවන්. ඒ දෙකම ප්‍රතිචාර - අහන දේකට ප්‍රතිචාර! වදනින් දක්වන ප්‍රතිචාර සටහන් කර ගැනීම තරම් අපහසු දෙයක් තවත් නැහැ.

අපි නැවතත් බ්‍රෙෂ්ට් කීදෙයකට හැරෙමු.

"මට නාට්‍යයකින් කියාගත නොහැකිවූ ඇතැම් ප්‍රශ්නවලට පිළිතුරු සපයා ගත්තේ - ප්‍රතිචාර ලබා ගත්තේ මගේ හිතේ පැන නැඟුණු කවි චින්තා මඟින්. (Poetic thoughts) ඒ නිසා මම කවි කලාව සලකන්නේ 'ප්‍රශ්න' හා 'ප්‍රතිචාර' සමුදායක් වශයෙන්.

"ඔබ මගෙන් අසන ප්‍රශ්නයට කන්දෙමි. එහෙත් මම මෙසේ කියමි."

නොඅසන්න මගෙන් ඒ ප්‍රශ්නය!

මට ප්‍රතිචාර දැක්විය නොහැකිය.

එයම නොවේද මගේ ප්‍රතිචාරය?

වෂී 2021ක් වූ අප්‍රේල් මස 25 වැනිදා ඉරිදා

සිළුමිණ

දිපානි

තහනම් මැයි දිනයක් ගැන මතකාවර්ජනයක් පිටුව 26

සිංහලෙන් ලියූ ජපන් ලේඛකයා සමුගනී පිටුව 28

ජයකොඩි සෙනෙවිරත්න, ප්‍රේමචන්ද්‍ර අල්විස් සමඟ කතාබහක් පිටුව 31

ඉතින් ආයුබෝවන් කැස්ත්‍රෝවරුනි ගරු...

● ටිරෝනි වෑවලගේ

කැස්ත්‍රෝලා නැති වුවද කියුබාව වැටෙන්නේ නැති බව දැන් ලෝකය දන්නේය. කැස්ත්‍රෝලා ඒ බව ලෝකයට ඔප්පු කර පෙන්වා අවසන් බැවිනි. තම කාලය අවසන් වන බව කල්තබා හඳුනාගත් මේ පරිණත මිනිස්සු ඉතා නිවැරැදිව මීළඟ නායකත්වයට රට බාර කළහ.

ෆිදෙල් තම විප්ලවීය සගයකු වූ කැමිලියෝ සමඟ 1959 ජනවාරි 8 හවානා වෙත ජයග්‍රාහීව ඇතුළු වෙමින්



චේ සහ ෆිදෙල් 1961දී

විප්ලවය අතරතුර රාවුල් සහ චේ

රාවුල් කැස්ත්‍රෝ සහ ෆිදෙල් කැස්ත්‍රෝ

ෆිදෙල් 1960 එක්සත් ජාතීන්ගේ මහා සමුළුවේදී

ෆිදෙල් තම සටන් සගයන් සමඟ 1060 ජයග්‍රාහී පා ගමනක නිරත වූ අන්දම. වමේ සිට තුන්වැනියට සිටින කඩවසම් තරුණයා චේ ගියුවේරාය.

වියපත් වූ ෆිදෙල් කැස්ත්‍රෝ

රාවුල් කැස්ත්‍රෝ තමාගෙන් පසු නායකත්වය කියුබානු ජනාධිපති මිගුවෙල් දියෙස් කැනැල්ට ලබා දුන් අවස්ථාව

ලෝක ඉතිහාසයේ විශේෂිතම පිටුවක් තම නමට වෙන් කර ගත් තවත් අසමසම යුගයක් පසුගියදා ඉතිහාස පොතේ අවසන් වාක්‍ය කිහිපය සටහන් කරමින් නැවතීමේ තිත තැබුවේය. ඒ අසමසම යුගය වෙන්වූයේ කියුබාවේ කැස්ත්‍රෝවරුන් වෙනුවෙනි. ලෝකය එසේය. එහි විවිධ රටවල නමින් බෙදී ඇති විවිධ භූ විෂමතා කලාපයන්හි වරින්වර විවිධ විශේෂතා සහිත මිනිස්සු බිහිවෙති. ඔවුහු නන් අයුරින් ලෝකය වෙනස් කරති. ඇතැම් අය සිදුකරන වෙනස්කම් 'හොඳ 'වශයෙනුත්, ඇතැම් අය සිදුකරන වෙනස්කම් 'නරක' වශයෙනුත් විවිධ නිර්වචනවලට ලක්වේ. මේ හොඳ සහ නරක නිර්වචන පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස්ය. ඇතැමුන්ට 'හොඳ' වන දේ ඇතැමුන්ට 'නරකය'.

කැස්ත්‍රෝවරුන්ද එසේමය. කියුබාව ලෝකයේ සුවිශේෂ රටක් බවට පත් කළ කැස්ත්‍රෝවරු ඇතැම් අයට 'හොඳ' ය. ඇතැමුන්ට 'නරක' ය. ඒ නරක නිසාම කැස්ත්‍රෝවරු මරා දැමීමට දැරෙන උත්සාහයන්ද රාශියකි. කැස්ත්‍රෝ පාලනය බිඳ දැමීමට දැරෙන උත්සාහයන්ද රාශියකි. එහෙත් ඒ කිනම් වෑයමක් වුවද සිනාවකින් දරා ගත් කැස්ත්‍රෝවරු තම පරම සතුරන් වූ ඇමරිකාවේ නහය යට සිටිමින් තම රට වෙනුවෙන් කිරීමට අදිටන් කරගත් උපරිම සේවය ඉටු කළහ. එහෙත් ඒ සියල්ලටම වඩා විශේෂී ලෙස නියමිත කාලයේදී ඉතා විධිමත් ලෙස බලය අත්හැරීමට තරම් කැස්ත්‍රෝවරු පරිණත වූහ.

පසුගියදා කියුබාවේ කැස්ත්‍රෝ යුගය අවසන් කරමින් මේ සුවිශේෂී මිනිස්සු ලොවට පෙන්වා සිටියේ තමන් ආරම්භ කළ දේශපාලන දර්ශනය තමන් අවසානය තෙක්ම එලෙසින්ම ක්‍රියාත්මක කළ බවයි.

අතීතයේ එක් යුගයක කියුබාව යනු වළපල්ලට යමින් තිබූ තවත් එක් රටක් පමණක් විය. එවකට එරට නායකත්වය උසුලමින් සිටි බැටිස්ටා ඉතා සාර්ථක ලෙස කියුබාව ධනවාදී කඳවුරේ රූකඩයක් බවට පත් කරමින් සිටියේය. උපන්නාට ජීවත් වී මිය යාම නොකළ යුතු බව විශ්වාස කළ තරුණයන් පිරිසක් තම මවු රටට අනාගතයේ උදාවන කටුක ඉරණම කල් තබා අවබෝධ කර ගැනීමට තරම් පරිණත වූහ.

ඔවුන් අතර එවකට ඉතා තරුණ වියේ පසු වූ ෆිදෙල් අලෙජන්ද්‍රෝ කැස්ත්‍රෝ රූස් ද වූයේය. ඔහු සමීපයේම ඔහුගේ සොහොයුරු රාවුල් මොඩෙස්ටෝ කැස්ත්‍රෝ රූස් ද වූයේය. මේ සහෝදරයෝ දෙපළ සතු වූයේ මනා අවබෝධයකි. වැඩිමලා වූ ෆිදෙල් සෑම අතින්ම දක්ෂයා විය. ඒ සම්බන්ධව ගැටලුවක් රාවුල් සතු නොවූ අතර තමා සෑම විටම ෆිදෙල් ගේ සමීපතම විශ්වාසවන්තයා වීම රාවුල්ට ප්‍රමාණවත් විය. මුල් කාලයේදී ෆිදෙල්ගේ සමීපතමයන් වූ අති ආකර්ෂණීය චේ ගියුවේරා ඇතුළු තවත් පිරිස ෆිදෙල් සමඟ කරටකර පසුවුවද රාවුල්ට තම සහෝදරයා මනාව වටහා ගැනීමේ හැකියාව තිබූ බැවින්ම වාමාංශික දේශපාලන ක්‍රියාධරයකු සතු විය යුතුම වන මනා ඉවසීමෙන් යුක්තව කල් යල් බැලූ රාවුල් අවසන කැස්ත්‍රෝ භූමිකාවේ අවසන් රංගනය දක්වාම තම කාර්යභාරය මැනවින් ඉටු කළේය.

ෆිදෙල් සහ රාවුල් දෙදෙනාම ධනවත් පවුලක හිතුවක්කාර සහෝදරයෝ වූහ. මේ තරුණයන් දෙදෙනාට යහමින් මුදල් හදල් දෙන්නට කියුබාවේ ඔරියන්ට් හි ධනවත් ඉඩම් හිමි වැවිලිකරුවකු වූ ඔවුන්ගේ පියාට හැකියාව තිබිණි. එහෙත් එවන් ජීවිතයක් මේ තරුණයන්ට අවශ්‍ය වූයේ නැත. ඔවුන් සතුව දැක්මක් විය, බලාපොරොත්තුවක් විය, අපේක්ෂාවක් විය. අභිප්‍රායක් විය. එමෙන්ම මේ සියල්ලටම ගැළපෙන ලෙස ඔවුන් සතුව අනුගාමිකයන් පිරිසක්ද වූහ.

කියුබානු සරසවියෙන් අධ්‍යාපනය ලැබූ අවදියේදී මනසට කා වැදුණු මාක්ස් - ලෙනින් දේශපාලනයෙන් අභ්ලාදයට පත් ෆිදෙල් වාමාංශික දේශපාලනය තරයේ ඇදහූවේය. එමෙන්ම සමකාලීනව අසල්වැසි ඩොමිනිකානු ජනරජයේ සහ කොලොම්බියාවේ ඇතිවූ වාමාංශික පාලනයෙන් උද්දාමයට පත්වූ ෆිදෙල් කියුබාවේද වාමාංශික පාලනයක් ස්ථාපිත කළ යුතු බව තරයේ විශ්වාස කළේය.

අසාර්ථක උත්සාහකින් වසරක් බන්ධනාගාරයේ ගත කළ ඔහු මෙක්සිකෝවට ස්වයංව පිටුවහල් වන්නේ තම අභිප්‍රාය ස්ථාපිත කර ගැනීමේ පදනම දමා ගැනීමේ අරමුණෙනි. එය එසේම වන්නේ ඒ වන විට ලතින් ඇමරිකානු කළාපයේ විප්ලවීය අදහස්වලින් පෝෂණය වී සිටි තරුණයන් රැසකගේ සහය ඔහුට හිමිවීම නිසාවෙනි.

1956 නොවැම්බර් මස එක් රැයක කුණාටු ගහන මුහුදේ කිලෝමීටර් 1900ක දුරක් 'යුනමා' නම් වූ කුඩා යාත්‍රාවේ නැගී ෆිදෙල් සහ රාවුල් ඇතුළු වාමාංශික දේශපාලන උණ සහිත තරුණයන් 81 දෙනෙකු යාත්‍රා කරන්නේ මුහුදු අසනිපයෙන් පෙළෙමින් දැඩි සේ වමනය දමමින් සිටි අර්නස්ටෝ චේ ගියුවේරා ද සමඟිනි.

එදා ඒ කුඩා යාත්‍රාවෙන් මහ මුහුද ජයගත් මේ තරුණ පිරිස ඉන්පසු ජයගත්තේ බැටිස්ටාගේ පාලනයට ඒ දක්වා නතුව තිබූ කියුබාවය. ලෝක ඉතිහාසයේ අලුත් පිටුවක් කියුබාව වෙනුවෙන් වෙන් වන්නේ එතැන් සිටය. එය ඇත්ත වශයෙන්ම හිතුවක්කාර තරුණයන් පිරිසකගේ අති දැවැන්ත පිම්මක් විය. එහෙත් සැබෑ සාර්ථකත්වය වූයේ රටේ බලය අල්ලා ගැනීම නොවීය. රට සාර්ථකව තම දේශපාලන දර්ශනය මත ඉදිරියට ගෙන යෑමය. එසේ කිරීමට හැකියාව ලැබීමය. කැස්ත්‍රෝලා සැබෑ දක්ෂයන් වන්නේ එහිදීය.

වසර ගණනාවක් පුරා පාලනය පෙරළා දැමීමේ සීඅයිඒ උත්සාහයන්ට මුහුණ දෙමින් එහෙත් නොවැටෙමින් කියුබාව පාලනය කළ ෆිදෙල්ට කාලයේ තාලයට අනුව පාලනය නම්‍යශීලී කිරීමේ හැකියාව විය. කියුබාවේ කැස්ත්‍රෝවරුන්ගේ සැබෑ සාර්ථකත්වය එයම විය. හණමිටිය වෙනුවට නව ලෝකයට ගැළපෙන ලෙස තම වාමාංශික පාලනය වරින්වර සංශෝධනයන්ට ලක් කළ කැස්ත්‍රෝවරු ඇමරිකාවට මිත්‍රත්වයේ හස්තය දිගු කළේ වරක් දෙවරක් නොවේය. එහෙත් නයි රෙද්ද අස්සේ දා ගැනීමේදී වඩාත් ආරක්ෂිත පියවර මත එසේ කිරීමට තරම් ඔවුහු නුවණැති වූහ.

වයස අවුරුදු 90 සම්පූර්ණ වී තමන් පැතූ ලොවක තම අනුප්‍රාප්තිකයන් තම පාලනය ඉදිරියට ගෙන යනු දකිමින් මියෙන්නට තරම් ෆිදෙල් කැස්ත්‍රෝ වාසනාවන්ත වූයේ ඔහු මරා දැමීමේ සීඅයිඒ උත්සාහයන් 800කට ආසන්න සංඛ්‍යාවක් පරාජය කරමිනි. එපමණක් ද නොව තමන් වියපත් බව වටහා ගත් ෆිදෙල් තමාගෙන් පසු බලය පැවරීමට තෝරා ගන්නේ තම සොහොයුරු රාවුල්ය. ලෝකය බලා සිටියේ ෆිදෙල් ගෙන් පසු කියුබාව අසාර්ථක වන තෙක්ය. එහෙත් රාවුල් ෆිදෙල්ගේ තේරීම නිවැරැදි බව සනාථ කරන්නේය. එපමණක්ද නොව තම ඉදිරි පරම්පරාවෙන් රට ඉදිරියට ගෙන යා හැකි නිවැරැදි නායකත්වය තෝරා ගැනීමට තරම් රාවුල් පරිණත වන්නේය. අර්ධ ශතකය ඉක්මවූ කැස්ත්‍රෝ පාලනය අවසන් වන්නේ එකී සහතිකය අතින් දරා ගනිමිනි.

සහෝදරවරු දෙදෙනෙක් රට පාලනය කළද ඔවුන් කිසිදා තම නමට කිසිවක් ගොඩගසා නොගත්තෝය. ඔවුහු කිසිදා බලය අයුතු ලෙස භාවිත නොකළෝය. තම පවුලේ කිසිවකු පාලනයට දායක කර නොගත්තහ. ඒ වෙනුවට ඉතා සූක්ෂ්ම ලෙස තෝරා ගත් දක්ෂයන් අතට රට බාර දුන්නේ තමන් දිවි කැප කරමින් දිනා ගත් රට තමන් සමඟම වැළලී නොයා යුතු බවට තරයේ විශ්වාස කළ බැවිනි.

පසුගියදා තමන්ගේ දේශපාලන භූමිකාව අවසන් බව රාවුල් කැස්ත්‍රෝ ප්‍රකාශ කරන්නේ එවන් වූ පසුබිමක් මත සිටිමිනි.

කැස්ත්‍රෝලා නැති වුවද කියුබාව වැටෙන්නේ නැති බව දැන් ලෝකය දන්නේය. ඒ කැස්ත්‍රෝලා ඒ බව ලෝකයට ඔප්පු කර පෙන්වා අවසන් බැවිනි. තම කාලය අවසන්වන බව කල්තබා හඳුනාගත් මේ පරිණත මිනිස්සු ඉතා නිවැරැදිව මීළඟ නායකත්වයට රට බාර කළහ. දැන් කැස්ත්‍රෝලා නැතත් රට පීල්ලේ යන්නේය. ඇතැම් විට දෙවියන් ලෙනින්ටත් නොදුන් අවස්ථාවක් ෆිදෙල්ට දුන්නා විය හැකිය.

රාවුල්ගේ මඟ පෙන්වීම යටතේ මේ වන විටත් වසර කිහිපයක් කියුබාව පාලනය කළ ජනාධිපති මිගුවෙල් දියෙස් කැනැල් ඒ මඟ ඉදිරියටත් ඒ ලෙසින්ම යනු ඇත. කෙසේ වුවද ලෝකයම නොහැකි නම් තම රට වෙනස් කිරීමට, තමන් විශ්වාස කළ සාධාරණත්වය තමන්ට පමණක් නොව තම රටේ ජනතාව වෙනුවෙන්ද එක ලෙස ලබා දීමට තම ජීවිතය කැප කළ කැස්ත්‍රෝලා වැනි අසාමාන්‍ය මිනිසුන් වෙනුවෙන් අකුරු කරන්නට ලැබීමද වාසනාවක් බව ලියා තැබිය යුතුමය.

නාරාහේන්පිට අභයාරාම පන්සලේදී 1987 මැයි 1 පැවැති මැයි දිනයේදී පොලිස් වෙඩි පහරින් මියගිය රණවක සරසවි සිසුවාගේ සිරුර පිරිසක් පිටතට ගෙන යන අයුරු. පසෙකින් පිස්තෝලය අතැතිව සිටින්නේ රහස් පොලිසියේ එවකට අධ්‍යක්ෂක බන්දුල වික්‍රමසිංහය.

පොලිස් වෙඩි පහරට ලක්ව මියගිය ලෙස්ලි ආනන්ද ලාල් කිරිබත්ගොඩගේ දේහය වැල්ලම්පිටියේ නිවෙසේ තැන්පත් කර තිබූ අයුරු.

1989 මැයි 1 වැනිදා ඝාතනය ලක්වූ ජ්පුර සරසවි සිසු කිත්සිරි මෙවන් රණවකගේ දේහය 1984 මැයි 4 පානදුර මිනුවන්පිටිය සුසාන භූමිය වෙත රැගෙන යන අයුරු

තහනම් මැයි දිනයක් ගැන මතකාවර්ජනයක්

කොරෝනා අවදානම හමුවේ මෙදා මැයි රැලි සහ පෙළපාළි අවලංගුයි

● ධර්මන් වික්‍රමරත්න

මෙවර මැයි රැළි සහ පෙළපාළි රට තුළ පවතින කොරෝනා අවදානම් කාරි තත්ත්වය නිසා අවලංගු කිරීමට අප්‍රේල් 20 වැනිදා රැස්වූ ප්‍රධාන දේශපාලන පක්ෂ ප්‍රධානීන් සාමූහික එකඟතාවකට පැමිණි බව ජාතික කොරෝනා ක්‍රියාන්විත මධ්‍යස්ථානය නිවේදනය කර තිබිණි. ලෝක කම්කරු දිනය හෙවත් මැයි දිනය 2021 මැයි දිනය සමරන්නේ 135 වැනි වරටය.

ඉකුත් 2020 මැයි 1වැනිදා ද ලොව පුරා අති බහුතරයක් රටවල් මැයි දින රැළි සහ උත්සව නොපැවැත්වූහ. ඒ කෝවිඩ් 19 වසංගතය ලොව පුරා ව්‍යාප්ත වීම හේතුව නිසාවෙනි. එහෙත් නව තාක්ෂණය ඔස්සේ ඔන්ලයින් ක්‍රමයට මැයි දින රැස්වීම් එතෙර මෙන්ම ලංකාවේ ද පැවැත්විණි. පාස්කු ප්‍රහාරය හේතු කොටගෙන 2019 මැයි දින පෙළපාළි සහ රැලි ද ශ්‍රී ලංකාවේ පැවැත්වූයේ ඉතා සුළු වශයෙනි.

''යහපාලන'' රාජ්‍ය සමයේ 2018 මැයි දිනය මැයි 7 වැනිදාට කල්දමන ලෙස එවකට ජනාධිපතිවරයා ඉල්ලීමක් කළේය. එයට හේතු වූයේ එම වසරේ මැයි මාසේ මුල් සතිය ලොවපුරා වෙසක් සතියක් ලෙස බෞද්ධයින් විසින් උත්සවාකාරයෙන් සැමරීමට කටයුතු යොදා තිබීම නිසාය. ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග රජය විසින් ද 1996 මැයි පෙළපාලි මැයි 1 වැනිදා පැවැත්වීම තහනම් කරන ලදී. ආරක්ෂක හේතු මත එම තීරණය ගත් බව නිවේදනය කෙරිණි. මෙවැනි මැයි දින තහනම් අවස්ථා කිහිපයක්ම ඉකුත් දශක කිහිපය තුළ අසන්නට ලැබිණි.

ලොව මැයි දින සැමරුම් 1890 සිටම සිදුවූවද ශ්‍රී ලංකාවේ ප්‍රථම මැයි දින සමරුව පවත්වන ලද්දේ 1927දී බව ලංකා කම්කරු සංගමයේ ඊ.ඒ. ගුණසිංහ පවසා තිබේ. එහෙත් දේශපාලන විද්වතුන් පවසන්නේ ශ්‍රී ලංකා පළමු මැයි රැලිය 1933 ගුණසිංහගේ නායකත්වයෙන් කොළඹ ගාලු මුවදොරින් ආරම්භවී වික්ටෝරියා (විහාර මහා දේවි) උයන දක්වා ගමන් කර එහිදී රැස්වීම පැවැත්වූ බවය. 1934දී කොළඹ තරුණ සංගමයේ මාක්ස්වාදීන්ද මැයි දින රැලියක් පැවැත් වූ අතර 1935දී සමාජවාදීන්ගේ මැයි දින රැලියක් කොළඹ ප්‍රයිස් පිටියේදී වෛද්‍ය එස්. ඒ. වික්‍රමසිංහගේ මූලසුනින් පවත්වන ලදී. සමසමාජයේ ප්‍රථම මැයි රැලිය 1936දී පැවැත්වූ අතර මැයි දිනය මෙරට රාජ්‍ය නිවාඩු දිනයක් බවට පත් කෙළේ 1956දී අගමැති බණ්ඩාරනායක ගේ නායකත්වයෙන් යුත් මහජන එක්සත් පෙරමුණ ආණ්ඩුව මඟිනි. එය කම්කරු අමාත්‍ය ටී. බී. ඉලංගරත්නගේ යෝජනාවකි.

එජාපය බලයට පත්වීමෙන් පසු 1978 සිට මැයි දින සැමරුම සිදුවූයේ ජාතික සංස්කෘතික උලෙළක් ලෙසිනි. ජනතා විමුක්ති පෙරමුණද 1978 සිට සිය මැයි දිනය 1983 දක්වා උත්කර්ෂවත් ලෙස පවත්වනු ලැබීය. 1983 වසරේ ජූලි මාසයේ ජවිපෙ තහනම් කිරීමෙන් පසු එහි අනුගාමී සංවිධානයක් වූ සමස්ත ලංකා වෘත්තීය සමිති සම්මේලනය මඟින් 1985 සහ 1986දී ජවිපෙ නිල නොවන මැයි රැලි නව නගර ශාලාවේදී පවත්වන ලදී. 1984 වසරේදී සමසමාජ, කොමියුනිස්ට්, මහජන පක්ෂය සහ මහජන එක්සත් පෙරමුණ එක් වී එක්සත් මැයි රැලියක්ද පවත්වන ලදී.

● කිතුල්උතුවේ ඝාතනය

දෙමළ බෙදුම්වාදී කොටි සංවිධානය මඟින් 1987 වසරේ අප්‍රේල් 17වැනිදා ත්‍රිකුණාමලය ප්‍රදේශයේ සිට කොළඹ බලා එමින් තිබූ බස් රථවලට හබරණට නුදුරු කිතුල්උතුවේදී වෙඩි තබා මඟින් 126 දෙනෙකු ඝාතනය කළ අතර ඉන් 75 දෙනෙකු නිවාඩුවට ගම්බලා එමින් සිටි හමුදා සෙබළුන් විය. දෙමළ බෙදුම්වාදීන් විසින් ඉන් දින 4කට පසු එනම් 1987 අප්‍රේල් 21වැනිදා පස්වරු 4.30ට පමණ කොළඹ ප්‍රධාන බස්නැවතුම්පොළේදී බෝම්බයක් පුපුරුවා හැරීමෙන් සාමාන්‍ය පුරවැසියන් 122ක් ඝාතනයට ලක් කරන ලදී.

බෝම්බය පිපිරී විනාඩි 10කට පසු එම ස්ථානයට ගිය පිරිස අතර ශ්‍රීලනිපයේ අනුරුද්ධ රත්වත්තේ සහ අලෙවි මවුලානා සමඟ ලේඛකයාද විය. එදිනම රාත්‍රී 8 සිට පසුදා පෙරවරු 5 දක්වාද අප්‍රේල් 22වැනිදා පෙරවරු 9 සිට යළිත් පසුදා අලුයම වන තෙක්ම ගම්පහ සහ කොළඹ දිස්ත්‍රික්ක වලට ඇදිරි නීතිය පනවන ලදී. රජයේ නිවාඩු දිනයක් වශයෙන්ද 1987 අප්‍රේල් 22වැනිදා ප්‍රකාශයට පත් කරනු ලැබිණි. පල්ලකැලේ හමුදා කඳවුරට 1987 අප්‍රේල් 15වැනිදා පහර දුන් ජවිපෙ විසින් අවි පැහැරගනු ලැබුවද මසක් පමණ යනතෙක් ඒ පිළිබඳව ආරක්ෂක අංශවල සැකයක් ජවිපෙ වෙත එල්ල වූයේ නැත.

දෙමළ බෙදුම්වාදීන් විසින් 1987 අප්‍රේල් 21 පිටකොටුවේදී ජීවිත 122ක් ඝාතනය කළ කාර්බෝම්බය පිපිරීමෙන් පසුව පිටකොටුව බස්නැවතුම්පල දිස්වූයේ මෙසේය.

ජනතාවට ආරක්ෂාව ඉල්ලමින් ඇඳිරි නීතිය ද නොතකා මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමියන්ගේ නායකත්වයෙන් 2,000ක පමණ පිරිසක් 1987 අප්‍රේල් 22 ජනාධිපති ජයවර්ධනගේ නිවෙස දෙසට පෙළපාළියෙන් පැමිණ විරෝධය පළකළ අයුරු.

1987 මැයි 1 වැනිදා පැවැති තහනම් මැයි රැළියට පැමිණි පිරිස විසුරුවා හැරීම සඳහා පොලිසියට නියෝග කළ අවස්ථාව.

● වීදි බට දහස් ගණනක පිරිස්

ඇඳිරි නීතියද නොතකා 1987 අප්‍රේල් 22වැනිදා ආරක්ෂාව ඉල්ලමින් මව්බිම සුරැකීමේ ව්‍යාපාරයේ නායකත්වයෙන් ජනාධිපති ජයවර්ධනගේ වෝඩ් පෙදෙස නිවස දෙසට පෙළපාළියෙන් පැමිණ උද්ඝෝෂණය කළහ. මෙයට නායකත්වය දුන්නේ මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමි, මාදුළුවාවේ සෝභිත හිමි, දිනේෂ් ගුණවර්ධන ඇතුළු ගිහි පැවිදි පිරිසකි. රජය මඟින් අප්‍රේල් 22වැනිදා 1987 මැයි දින රැස්වීම් සහ පෙළපාළි තහනම් කළ අතර එය 1987 මැයි 22වැනිදා පවත්වන මෙන් ඉල්ලා සිටින ලදී. ඒ අනුව සියලු මැයි දින රැලි සහ පෙළපාළි තහනම් කරන ලදී.

රජයේ එම මැයි දින තහනම බිඳගෙන මැයි රැලියක් සහ පෙළපාළියක් පැවැත්වීමට මව්බිම සුරැකීමේ ව්‍යාපාරය තීරණය කර තිබුණි. මව්බිම සුරැකීමේ ව්‍යාපාරය 1986 ජූලි 26වැනිදා කොළඹ දෙමටගොඩ පාඨානගාර විහාරයේදී ආරම්භ වූවකි. එහි අදිසි හස්තයවූ ජනතා විමුක්ති පෙරමුණ එය ගොඩනැගීමේදී අනුගමනය කළ උපක්‍රමික ප්‍රවේශය වූයේ දේශපාලනික වශයෙන් මව්බිම සුරකීම සඳහා ඒකාබද්ධ කළ යුතු බලවේග ඒකරාශී කිරීම සහ නිදාශීලිත්වයට මෙන්ම අක්‍රියකොට තිබූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පැනනැඟී ඇති තත්ත්වයට එරෙහිව අවදිකිරීමේ උත්සාහයක්ය.

මව්බිම සුරැකීමේ ව්‍යාපාරයේ මැයි දින රැස්වීම සංවිධානය කිරීම පිළිබඳ සාකච්ඡා 1987 අප්‍රේල් 22වැනිදා සිට දිනපතා නාරාහේන්පිට අභයාරාමයේදී පැවැත්විණි. සාකච්ඡා වාර 5ක් පැවති අතර අවසාන සාකච්ඡාව 1987 අප්‍රේල් 27 සවස 2ට පැවැත්විණි. ඉහත පිරිසට අමතරව ජවිපෙ මධ්‍යම කාරක සභික ආනන්ද ඉඩමෙගමද දේශවිමුක්ති ජනතා පක්ෂයේ නිහාල් පෙරේරාද දෙවරක් එක්විය. ලේඛකයා මේ සියලු රැස්වීම් ආවරණය කළේය.

ආණ්ඩුවේ 1987 මැයි දින තහනම නොසලකා හරිමින් සමසමාජ පක්ෂ කාර්යාලය ඉදිරිපිට මහ පාරේ මේසයක් දමා රැස්වීමක් පැවැත්වූ අතර එයට සමසමාජ, කොමියුනිස්ට්, මහජන සහ නව සමසමාජ පක්ෂද එක්විය. පොලිසිය කඳුළු ගෑස් දමා පිරිස විසුරුවා හැරි අතර සමසමාජ නායක ආචාර්ය කොල්වින් ආර්. සිල්වාද වයෝවෘද්ධභාවය හේතුකොට ගෙන කඳුළු ගෑස් ප්‍රහාරයෙන් රෝගාතුර විය. ශ්‍රීලනිප රැස්වීම ඩාර්ලි පාරේ පක්ෂ මූලස්ථානයේදී පැවැත්විණි. මහනුවර, ගාල්ල, අනුරාධපුරය යන නගරවලද මැයි දින සැමරුම් පැවැත්වුවද ඒවා පොලිසිය මඟින් විසුරුවා හරින ලදී.

වඩාත්ම සටන්කාමී සහ උණුසුම් මැයි දින සැමරුම පැවැත්වූයේ නාරාහේන්පිට අභයාරාමයේදීය. කොළඹ දකුණ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි අබ්දුල් කාදර් ගපූර්ගේ නායකත්වයෙන් 300කට ආසන්න කැරලි මර්දන පොලිස් කණ්ඩායමක් 1987 මැයි 1වැනිදා හිමිදිරියේ සිට අභයාරාමය ඉදිරිපිට සතර දෙසින් රඳවා තිබෙනු දක්නට ලැබිණි. ගපූර් එහිදී ලේඛකයාට කියා සිටියේ කිසිදු මැයි පෙළපාළියක් පැවැත්වීමට ඉඩ නොදෙන ලෙස ජනාධිපති ජයවර්ධන තමාට පෞද්ගලිකව උපදෙස් දුන් බවය. පස්වරු 2.05ට මැයි දින රැස්වීම ආරම්භ වන විට 2,000කට ආසන්න පිරිසක් එක්ව සිටි අතර පිරිස පන්සිල්හි පිහිටුවන ලද්දේ මුලසුන දැරූ හැඩිගල්ලේ පඤ්ඤාතිස්ස මහ නායක හිමිය. මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමියන් රැස්වීමේ අරමුණ පැහැදිලි කළ අතර සරසවි පද්ධතිය වෙනුවෙන් බලහරුවේ සෝභිත හිමිද, භික්ෂු පරපුර වෙනුවෙන් මාදුළුවාවේ සෝභිත හිමිද අදහස් ප්‍රකාශ කළහ. විපක්ෂ මන්ත්‍රී දිනේෂ් ගුණවර්ධන සහාව ඇමතීමෙන් පසු දසවිධ කරුණු සහිත මැයි දින යෝජනාවක් සභා සම්මත කරන ලදී.

● බැටන් ප්‍රහාරයේ ආරම්භය

රැස්වීම නිමාවෙන් පසු පිරිස මැයි දින තහනමට විරෝධය පළ කරමින් සටන් පාඨ සහිත පුවරු සහ බැනර් අතැතිව මහා මාර්ගයට පිවිසීමට ගමන් කළහ. එවිට ප්‍රතිචාරය වූයේ බැටන් ප්‍රහාරයකි. පසුව කඳුළු ගෑස්ය. රබර් උණ්ඩය. අවසානයේ වෙඩි තැබීම සිදුවිය. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ගපූර්ගේ උපදෙස් පරිදි වෙඩි තැබීමට නියෝග කළේ කැරලි මර්දන කණ්ඩායමේ නායකයාවූ උප පොලිස් පරීක්ෂක වෙලේගෙදර ප්‍රේමදාසය. ගපූර්ගේ දෙවැනියා වූයේ සහකාර පොලිස් අධිකාරි බන්දුල පරාක්‍රම වික්‍රමසිංහය. විනාඩි ගණනාවක්ම වෙඩි ප්‍රහාරය පැවතිණි. ආනන්ද හිමියන් සහ දිනේෂ් ගුණවර්ධන වෙඩි තැබීම නතර කරන්නැයි ඉල්ලා සිටියද එය නතර නොවීය. වෙඩි ප්‍රහාරයෙන් දෙදෙනෙකු මියගිය අතර නාරාහේන්පිට සමන්ත රත්නායක, රත්නපුරේ ආර්. ප්‍රේමසිරි සහ නුවර මහින්ද රණතුංග යන අය තුවාල ලබා රෝහල් ගත කෙරිණි.

වෙඩි වැදී මියගිය දෙදෙනා වූයේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සපුගස්කන්ද තෙල් පිරිපහදුවේ ක්‍රියාකැරවුම් අංශයේ යාන්ත්‍රික ක්‍රියාකරු වැල්ලම්පිටියේ බ්‍රැන්ඩියවත්තේ පදිංචි ලෙස්ලි ආනන්දලාල් කිරිබත්ගොඩ සහ ශ්‍රී ජයවර්ධනපුර සරසවියේ ව්‍යාහාරික විද්‍යා පීඨයේ 84/85 කණ්ඩායමේ සිසු පානදුර කුරුප්පුමුල්ලේ පදිංචි කිත්සිරි මෙවන් රණවකය. ලෙස්ලි ආනන්දලාල් වෙඩි වැදීමෙන් මියගියේ අභයාරාමය තුළදීමය. කිත්සිරි මෙවන් මියගියේ කොළඹ මහ රෝහලේ දැඩි සත්කාර ඒකකයට ඇතුළත් කිරීමෙන් අනතුරුවය. වෙඩි වැදුණු කිත්සිරි මෙවන් රෝහලට ගෙන යෑමට පොලිසිය විනාඩි 30ක පමණ කාලයක් ඉඩ ලබාදුන්නේද නැත. මෙම ඝාතන සිද්ධීන්වලට එරෙහිව රටපුරා සරසවිවල සහ පාසැල් බොහෝමයක විරෝධතා ව්‍යාපාර පැන නැඟිණි.

● ආනන්දලාල්ගේ නිවස

වැල්ලම්පිටිය බ්‍රැන්ඩ්‍රියාවත්තේ ලෙස්ලි ආනන්දලාල් ගේ නිවසට ලේඛකයා එදිනම රාත්‍රියේ යනවිට එහි සිටියේ සොහොයුරෙකු වන ගාමිණී, සොහොයුරියකවූ කුමාරි සහ මව කල්‍යාණි පෙරේරාය. ලෙස්ලි ආනන්දලාල් රත්තොටදී උපන්නේ 1953 සැප්තැම්බර් මස 15 වැනිදාය. ඔහු මියයන විට 33 හැවිරිදි අවිවාහකයෙකි. ලෙස්ලිගේ පියා වෘත්තියෙන් විදුහල්පතිවරයෙකි. තෙල්දෙණියේ හෙණගැහුවෙල මහ විද්‍යාලයේ විදුහල්පති වශයෙන් කටයුතු කළ ලෙස්ලිගේ පියා 1965දී දිවියෙන් සමුගෙන තිබිණි. ඔහු ශ්‍රීලනිපයට ළැදිවීම නිසා අනේකවිධ දේශපාලන පළිගැනීමේ මාරුවීම් වලට ලක්වූ අයෙකි. ලෙස්ලිගේ මව කල්‍යාණි පුහුණු උප ගුරුවරියක් වූ අතර ඇය වැල්ලම්පිටිය සේදවත්ත මහා විද්‍යාලයේ සේවය කළාය. හත් දෙනෙකුගෙන් යුත් පවුලේ 6වැනියා වූ ලෙස්ලි ආනන්දලාල්ට සොහොයුරන් සහ සොහොයුරියන් 3 බැගින් සිටියේය.

කටුගස්තොට ශාන්ත අන්තෝනි, තෙල්දෙණිය මධ්‍ය මහා සහ සේදවත්ත සිද්ධාර්ථ විදුහලේ අධ්‍යාපනය ලත් ලෙස්ලි 1973 ආරම්භ වූ වැල්ලම්පිටිය මිත්‍ර වොලිබෝල් ක්‍රීඩා සමාජයේ කාරක සභිකයෙකි. ලෙස්ලි ආනන්ද මරදාන කාර්මික විද්‍යාලයේ පාඨමාලාවක් හැදෑරීමෙන් පසු කැලණි කේබල් සමාගමේද, ලංකා පොහොර සංස්ථාවේ යන්ත්‍ර සහාය ක්‍රියාකරුවෙක් වශයෙන් කෙටිකලක් සේවය කළ අතර මියයන විට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සපුගස්කන්ද තෙල් පිරිපහදුවේ ක්‍රියාකැරවුම් අංශයේ යාන්ත්‍රික ක්‍රියාකරු විය. එදින මැයි දින රැස්වීමට සහභාගිවීම සඳහා නිවසේ සිට කැලණිය පන්සල අසල බස්නැවතුම්පොළට ලෙස්ලිව පාපැදියෙන් ගෙන ආවේ පසුව රත්නපුර දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරියෙකු වූ ඩබ්ලිව්. එස්. සුනිල් විජේසිංහය.

ලෙස්ලි ජවිපෙට එක්වූයේ 1982දීය. ලෙස්ලිගේ අවමඟුල් කටයුතු සිදුවූයේ 1987 මැයි 3වැනිදා පස්වරු 6.30ට කොහිලවත්ත සුසාන භූමියේය. බ්‍රිතාන්‍යයේ සිටින ලෙස්ලිගේ සොහොයුරිය තිලකා විවියන්ද අවමඟුලට එක්වීමට පැමිණ සිටියාය. එදින මුළු දවසම වාගේ ලෙස්ලිගේ නිවසේ ගත කළ ලේඛකයාට දැකගන්නට හැකිවූයේ පොලිස් නියෝග මත කොඩිවැල් හෝ සැරසිලි පවා තහනම් නමුත් දහසකට අධික පිරිසක් රැස්වූ අවමඟුලකි. දේහය නිවසේ තැන්පත් කිරීමට පොලිස් අවසරය ලැබුණේ පැය 5කි. මුරුත්තෙට්ටුවේ හිමියෝ එකම පැවිදි අනුශාසනාව සිදු කළහ. ලෙස්ලිගේ මවද 1997 දිවියෙන් සමුගත්තාය.

සරසවි ශිෂ්‍ය කිත්සිරි මෙවන් රණවකගේ අවමඟුල් කටයුතු යෙදී තිබුණේ 1987 මැයි 4වැනිදාය. පානදුර කුරුප්පුමුල්ලේ පදිංචි කිත්සිරි මෙවන්ගේ පියා නීතිඥයෙකු මෙන්ම මහජන එක්සත් පෙරමුණේ උප සභාපතිවරයෙකි. පස්දෙනෙකුගෙන් යුත් පවුලක වැඩිමලා වූ 1963 දෙසැම්බර් 2වැනිදා උපන් කිත්සිරිගේ සොහොයුරු සොහොයුරියන් වූයේ කිත්මිණි, සඳරුවන්, නිල්මිණී සහ සුගන්ධය. කිත්සිරි මියයන විට ඔහු මෙන්ම ඔහුගේ නැඟණියවූ කිත්මිණිද ජයවර්ධනපුර සරසවියේ සිසුවියකි. වර්තමානයේ ඇය රජයේ ආයතනයක කළමනාකරණවරියකි. කිත්සිරිගේ කනිටු සොහොයුරා වූ සුගන්ධ වර්තමානයේ පෞද්ගලික අංශයේ විධායකයෙකි. සඳරුවන් ව්‍යාපාරිකයකු වන අතර නිල්මිණිද රජයේ ආයතනයක සේවය කරනු ලබයි. කිත්සිරි මෙවන් මියයන විටද සිය පියා මෙන් මහජන එක්සත් පෙරමුණේ ක්‍රියාකාරිකයෙකි. කිත්සිරිගේ අවසන් කටයුතු සිදුකෙරුණේ සිසුන්, භික්ෂූන් සහ කම්කරුවන් 2,000කට අධික පිරිසකගේ සහභාගිත්වයෙන් සටන්කාමී අයුරෙනි. සියලු පොලිස් බාධක සහ තහංචි බිඳ දමමින් දේහයේ අවසන් කටයුතු පානදුර මිනුවන්පිටිය සුසාන භූමියේ සිදු කිරීමෙන් පසුව රැස්වූ දහසකට අධික පිරිස පානදුර නගරය පුරා පෙළපාළි පවත්වා පසුව රැස්වීමක්ද තබා විසිර ගියහ. කිත්සිරිගේ පියාද 2012 දෙසැම්බර් 12 දිවියෙන් සමුගත්තේය.

● දිනේෂ්ගේ අරගලය

එජාප ආණ්ඩුවේ 1987 මැයි දින තහනම කඩමින් ජීවිත 2ක් බිලිගත් මැයි දින ද්විත්ව ඝාතන පිළිබඳ පරීක්ෂණය පැවැත්වීමට ආණ්ඩුවට සිදුවූයේ මහජන එක්සත් පෙරමුණේ නායක දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීවරයා පාර්ලිමේන්තුවේ සහ ඉන් පිටත කළ අඛණ්ඩ අරගලයේ ප්‍රතිඵලයක් වශයෙනි. ලෙස්ලි ආනන්දලාල් සහ කිත්සිරි මෙවන්ගේ මරණ පරීක්ෂණ 1987 මැයි මස 3දා කොළඹ අධිකරණ වෛද්‍ය නිලධාරි එම්.එස්.එල්. සල්ගාදු විසින් පවත්වනු ලැබූ අතර එම ඝාතනවලට බලපෑ වෛද්‍ය හේතු ඇතුළත් පර්යේෂණ වාර්තාව 1987 මැයි 4වැනිදා අධිකරණයට ඉදිරිපත් කරන ලදී. මැයි දින ද්විත්ව ඝාතන පරීක්ෂණ 1987 මැයි 14වැනිදා කොළඹ මහාධිකරණයේදී මහාධිකරණ විනිසුරු ජී.එල්.එම්.ද සිල්වා ඉදිරියේ විභාග විය. මෙහිදී පොලිස්පතිවරයා වෙනුවෙන් සහකාර පොලිස් අධිකාරි ලෝරන්ස් අමරසේන පෙනී සිටි අතර මියගිය ලෙස්ලි ආනන්දලාල් කිරිබත්ගොඩ වෙනුවෙන් බාල තම්පෝ, සරත් විජේසිංහ සහ පියසේන දිසානායක යන නීතිඥවරුන් පෙනී සිටියහ. මියගිය සරසවි සිසු කිත්සිරි මෙවන් රණවක වෙනුවෙන් ජනාධිපති නීතිඥ රංජිත් අබේසූරිය, සරත් විජේසිංහ, ලසන්ත වික්‍රමතුංග සහ ජනප්‍රිය පේදුරුහේවා යන නීතිඥවරු පෙනී සිටියහ. එම මැයි දින සිද්ධිය සියැසින් දුටු සහ අනතුරුව පැන නැඟුණු සියලු සිද්ධි මාලාවන් වාර්තා කළ එකම ජනමාධ්‍යවේදියා වූයේද මේ ලේඛකයාය.

අදාළ පරීක්ෂණ කොමිසම දින 30කට ආසන්න කාලයක් රැස්වී මැයි දින මරණ පරීක්ෂණ සාක්ෂි විභාගය පවත්වන ලදී. එම මරණ පරීක්ෂණයන්හි සාක්කි විභාගයන්ගේ අවසානය වූයේ 1988 මාර්තු 28වැනිදාය. පරීක්ෂණ මාස 9ක් තිස්සේ විභාගයට ගත්තේය. සාක්ෂි සටහන් පොත පිටු 1,800කි. පරීක්ෂණය අවසන් වූයේ 1988 අගෝස්තු 2වැනිදාය. මෙහි තවත් එක් තීරණාත්මක අවස්ථාවක් වූයේ සාක්ෂි උපුටා දක්වමින් නීතිඥ දේශන පැවැත්වීමට විරෝධය දැක්වීමය.

මැයි දින ඝාතන 2 පිළිබඳව මහාධිකරණ සාක්ෂි විභාගය අවසානයේදී මහාධිකරණ විනිසුරු සිල්වා කියා සිටියේ පොලිසිය වෙනුවෙන් සාක්ෂි දුන් දහදෙනාගේම සාක්කි පිළිගත නොහැකි බවය. එයට හේතුවක් ලෙස මහාධිකරණ විනිසුරු දැක්වූයේ පොලිසිය කලබල අවස්ථාවේදී කිසිම විටක නාරහේන්පිට අභයාරාමයට ඇතුළු වූයේ නැතැයි ප්‍රකාශ කළද රජයේ සහකාර රස පරීක්ෂකගේ වාර්තා අනුව වෙඩි තබා ඇත්තේ අඩි 10ක පමණ දුරකින් බව තහවුරු වී ඇති බවය. හදිසි නීති රෙගුලාසි අංක 55 වගන්තිය යටතේ මෙම මරණ පරීක්ෂණයේ අවසන් නිගමන සහ පරීක්ෂණ වාර්තා නීතිපතිවරයාට ඉදිරිපත් කරන ලදී

වාර නැකැත්

අප්‍රේල් 25 ඉරිදා උදේ 09.16 - 9.28 දක්වා දකුණ බලා
අප්‍රේල් 26 සඳුදා උදේ 08.22 - 08.27 දක්වා දකුණ බලා
අප්‍රේල් 29 බ්‍රහස්පතින්දා උදේ 08.57 - 09.09 දක්වා උතුර බලා
අප්‍රේල් 30 සිකුරාදා උදේ 06.59 - 07.01 දක්වා උතුර බලා
මැයි 14 සිකුරාදා උදේ 06.02 - 06.36 දක්වා උතුර බලා
2021. 04. 25 සිට 2021. 05. 01 දක්වා

දිවාමය සුභ මුහූර්ත

25 ඉරිදා උදේ 07. 36 සිට 08.04 දක්වා දකුණ බලා
26 සඳුදා උදේ 10.07 සිට 10.37 දක්වා දකුණ බලා
27 අඟහරුවාදා උදේ 09.12 සිට 09.37 දක්වා නැඟෙනහිර බලා
28 බදාදා උදේ 07.02 සිට 07.12 දක්වා උතුර බලා
29 බ්‍රහස්පතින්දා උදේ 7.36 සිට 08.04 දක්වා උතුර බලා
30 සිකුරාදා උදේ 08.35 සිට 08.48 දක්වා උතුර බලා
01 සෙනසුරාදා උදේ 06.06 සිට 06.31 දක්වා නැඟෙනහිර බලා

දිනය රාහු කාලය

අප්‍රේල් 25 ඉරිදා - සවස 04.45 - 06.18 අලුයම 04.30 - 05.58
අප්‍රේල් 26 සඳුදා - උදේ 07.30 - 09.03 - රාත්‍රී 07.45 - 09.13
අප්‍රේල් 27 අඟහරුවාදා - සවස 03.13 - 04.46 -අලුයම 03.03 - 04.31
අප්‍රේල් 28 බදාදා - දහවල් 12.08 - 01.41 - රාත්‍රී 12.07 - 01.35
අප්‍රේල් 29 බ්‍රහස්පතින්දා - දහවල් 01.40 - 03.14 - අලුයම 01.35 - 03.03
අප්‍රේල් 30 සිකුරාදා - උදේ 10.36 - 12.09 - රාත්‍රී 10.40 - 12.09
මැයි 01 සෙනසුරාදා - උදේ 09.03 - 10.36 - රාත්‍රී 09.13 - 10.4

මැයි මස ග්‍රහ බලය

ග්‍රහලොව සුකුමළිය සිකුරු තම වාස භවනට

මේෂ - වෘෂභ - කටක - සිංහ - කන්‍යා වෘශ්චික - මකර - කුම්භ - මීන - ලග්නවලට ඉතා සුබ පල

මිථුන - තුලා - ධනු - ලග්නවලට මධ්‍ය පල

ප්‍රබල සහ දුබල ග්‍රහයන් සතර දෙනකු චතුර්යෝගව එකම රාශියේ

සතුට මෙන් ම සැලකිල්ල ද දැක්විය යුතු කාලයක්

● අජිත් ධර්මසිරි

ග්‍රහලොව සුකුමළිය - සුරතලිය හෙවත් රූමතිය සිය ස්වක්ෂේත්‍ර රාශිය වන වෘෂභ රාශියට පැමිණෙන්නීය. ඒ 2121 මැයි මස 04 වැනිදා දහවල් 01.27 ට පමණය. මෙතෙක් මේෂ රාශිගතව සිටි සිකුරු තම බලය තේජස පතුරවමින් සිය වාස භවනට පැමිණෙමින් රටට ජනතාවට ගෙන එන සුබවාදී ආකල්පමය වෙනස සතුටුදායක වෙයි. වීනස් දෙවිදුව වශයෙන් ද විටෙක ලක්ෂ්මිය වශයෙන් ද හඳුන්වා තිබෙන සිකුරු මෙසේ බලවත් වීම විශේෂයෙන් කලාවට සෞන්දර්යයට නිර්මාණකරණයට මෙන් ම කාන්තා පරපුරට ද සුබවාදී වෙයි.

මේ අතරම මැයි මස 01 දින සිට අලුයම 05.42 ට බුධ ග්‍රහයා ද සිය සුබ රාශියක් වන වෘෂභයට පැමිණීම තව තවත් සතුටු විය හැක්කේ රන් රස හා සමානව බුධ සිකුරුගේ සංයෝගය කේන්ද්‍රවල දක්නා ලැබෙන නිසා ය. බුධ ඥානකාරක ග්‍රහයාය. සිකුරු සෞන්දර්යවාදී ග්‍රහයා සමග සුහද සංයෝගවීම අප රටට ජනතාව ගෙන එන සතුට බුද්ධිගෝචර වනු ඇත.

මේ තත්ත්වයට පෙර නිමිත්තක් ලෙස පසුගිය සිංහල අලුත් අවුරුදු සමයේ අප රටේ ජනතාව පක්ෂ පාට භේද නොතකා විවිධ විහාරස්ථාන විවිධ සෞන්දර්යාත්මක ස්ථාන කේන්ද්‍රකොට ගනිමින් සතුටු වුව වෙන කිසිදු අවුරුදු සමයක නොතිබූ තරම් සතුටක් නිදහසක් භුක්ති විඳින අයුරු අපි දුටුවෙමු. ඒ සඳහා කදිම නිදසුනක් ලෙස දක්ෂිණ අධිවේගී මාර්ගයේ ආදායම් ඉහළ යෑම නුවරඑළිය හා එබඳු සෞන්දර්යාත්මක පොදු ස්ථාන ජනතාවගෙන් පිරී ඉතිරී යෑම අනුරාධපුරය - කැලණිය කතරගම - ශ්‍රීපාදස්ථානය ආදී පුණ්‍ය භූමි ද අතුරු සිදුරු නැති තරමටම ජනතාවගෙන් පිරී ඉතිරී යනු මාධ්‍ය මඟින් අපි දුටුවෙමු.

ඒ තත්ත්වය මේ සතුට නිදහස ජනතා සංසරණය මේ ග්‍රහ සංයෝගයත් සමගම වැඩිවන බවක් අපිට ඉදිරියේදීද දකින්නට පුළුවන. සිකුරු - බුධ - ගුරු ආදී සුබ ග්‍රහයන් පීඩිතව නීචව හා අසුබව හැසිරුණු අවදිය පිළිබඳ එනම් පසුගිය සිංහල අලුත් අවුරුදු සමය පිළිබඳව හා ඒ අපූරු කාල පරිච්ඡේදය පිළිබඳව අපට අමුතුවෙන් සිහිපත් කළ යුතු නොවේ. විවිධ බල සහිත ග්‍රහ සමූහයක් සංයෝගව එකම දෙසට පැමිණෙන මෙම මැයි මාසය පිළිබඳ අප සතුටු විය යුතුවා මෙන් ම ඉතා සැලකිලිමත් විය යුතු ය. ඊට හේතුවක් තිබේ.

එනම්, මේ ග්‍රහ සංයෝගය අතරට රවි ග්‍රහයා ද 2021 මැයි 14 දින සතුරු වෙසින් වෘෂභ රාශිගත වන අතර රාහු ග්‍රහයා ද ඒ සංයෝගයේ විරාජමාන වන නිසා ය. එවිට බුධ - සිකුරු සොඳුරු සුකොමළ ග්‍රහයන් අතර නීච රවි හා දුෂ්ට රාහු ද සිටින නිසාය. මේ ග්‍රහ සංයෝගය සුබ මෙන් ම අසුබ ද ගෙන දීමට සමත් වෙයි.

ඒ අනුව සතුට නිදහස වුව ද නොසැලකිලිමත්ව අත්විඳීම සුබ නොවන බවයි. අප මේ වසංගත කාල සීමාවේ ලබන නිදහස සතුට වුව ද සුපරීක්ෂාකාරීව සෞඛ්‍ය නීති රීති අනුගමනය නොකර හැසිරෙනවා නම් යළි අපට අප රටට ජනතාවට රෝගයේ අනිටු විපාක භුක්ති විඳීමට සිදුවන බව නම් කිව යුතු ය. ඒ නිසා කොයිදෙත් සීමාවකට යටත්ව බුද්ධිමත්ව අන්‍යයන්ට අවහිරයක් අතවරයක් නොවන්නට මේ සතුට නිදහස භුක්ති විඳිතොත් ඉදිරිය පැහැබර බව කිව යුතුව තිබේ.

ලෝකයම අඳුරින් වෙළාගෙන තිබෙන මොහොතක අප රටට පමණක් සහන් එළියක් දැල්වී තිබෙන අවස්ථාවක ඔබ අප කවුරුත් සැලකිලිමත් වෙමු. උනන්දු වෙමු. සෞඛ්‍ය නීති රීතිවලට අනුගත වෙමු. එළඹෙන වෙසක් සමයේ ඒ බව අපට අමතකවන්නට ඉඩ තිබෙන නිසාය.

මා එසේ කීවේ එදා සිංහල අලුත් අවුරුද්දේ හැසිරුණු ආකාරයටම එකට රොක්වී එකට එක්වී දන්සල් දෙමින් විහාරස්ථානවලට යමින් වෙසක් සැරසිලි නැරඹීමට යමින් නොසැලකිලි ලෙස ක්‍රියා කළොත් සතුට සමග අසතුට ද අපට භුක්ති විඳීමට සිදුවන බව නම් අමතක නොකරමු. කෙසේ හෝ මේ ඓතිහාසික වෙසක් මාසය ඔබ අපට ග්‍රහ තත්ත්වය අනුව කෙසේ වේ දැයි සලකා බලමු. ඒ අනුව මේෂ - වෘෂභ - කටක - සිංහ - කන්‍යා - වෘශ්චික - මකර - කුම්භ - මීන යන ලග්නවලට ඉතා සුබ පල ද මිථුන - තුලා - ධනු ලග්නවලට මධ්‍ය පල ද උදාවන බව පෙනේ.

මේෂ - හදිසි ධන ලාභ

මේෂ ලග්නයට අනුව මෙම වකවානුව ඔබට ධන සම්පත් අතින් ඉතා සුබවෙයි. හදිසි ධන ලාභ ලොතරැයි ජය, තරග ක්‍රීඩා ජය පෙනෙන්නට තිබේ. රැකියා ස්ථානගත ගැටලු ඒමට පුළුවන. උපරිම සතුට භුක්ති විඳීමට යෑමේදී රැකියා කටයුතුවලට බාධා ඒම සුබවාදී නොවේ. නව ගෘහ ජීවිතය කාර්ය බහුල වන අතර දුර ගමන් බිමන් යෙදේ. තම අනාගත අභිවෘද්ධිය උදෙසා ක්‍රියාමාර්ග රැසක් ගන්නවා ඇත. ශරීර සෞඛ්‍ය අතින් තුනටියේ ආපදා දණ හිසේ ආපදා පෙන්වන නිසා බොහෝ කල්පනාකාරී වන්න.

වෘෂභ - ආගමික කටයුතුවලට නැඹුරුවක්

වෘෂභ ලග්නයට අනුව ඔබට ඉදිරි කාලය ඉතාම සුබයි. නව අදහස් ක්‍රියාවට නැංවීම නිර්මාණශීලී බව මතුවීම ආගමික කටයුතු කෙරේ වැඩි නැඹුරුවක් ඇතිවීම දක්නට ලැබේ. සිතේ තදබල වේදනාවක් ඒමට පුළුවන. ඒ තම කාලය කාර්යය බහුලවීම නිසාවෙනි. කෙසේ නමුදු රැකියා යහපත අභිවෘද්ධිය උදාවේ තම රැකියාගත උසස්වීම් පෙන්වනු ඇත. අධ්‍යාපනය හදාරන දූ පුතුනට සිය අභිමථාර්ථ ඉටුවේ. ගෘහ ජීවිතයේ විවිධ ජයග්‍රහණ උදාවන අතර ශරීර සෞඛ්‍ය අතින් සැලකිලිමත් විය යුතු වන්නේ ශරීරයේ වියළි ගති මතු කරන නිසා ය.

මිථුන - රැකියා ස්ථානගත අභිවෘද්ධිය

මිථුන ලග්නයට අනුව මෙම වකවානුව ඔබට පිටරටකට යෑමට හැකිවන ලකුණු පෙනේ. වියදම් මට්ටම ඉහළ යයි. වාහන ලාභ හා නිවාස ඉඩම් ලාභ පෙන්වුව ද නීති ගැටලු මතු කිරීම තුළ ඒ හා ආශ්‍රිත කාර්යය බහුල බව හා ඉතා වෙහෙසකාරී බව දැනේ. රැකියා ස්ථානගත අභිවෘද්ධිය උදාවේ. අධ්‍යාපනය හදාරන දූ පුතුන්ට ඉතා බුද්ධිමත් ලෙස එම කටයුතු නිමාකර ගැනීමට හැකිවේ. ගෘහ ජීවිතය තුළ යම් යම් බාධක කම්කටොලු එළඹෙනු ඇත. ශරීර සෞඛ්‍යය අතින් සැලකිලිමත් විය යුතුය. වකුගඩු ආශ්‍රිත ආබාධ පවතින අය සුපරීක්ෂාකාරී විය යුතුය.

කටක - ආර්ථික ප්‍රතිලාභ රැසක්

කටක ලග්නයට අනුව ඉදිරි කාලය ඔබට ඉතා යහපත් ආර්ථික ප්‍රතිලාභ හිමිවේ. වියදම සීමාකර ගතහොත් ලැබෙන දෙයින් උපරිම ඵල උදාකරගත හැක.

රැකියාවේ ස්ථාන මාරු හා සතුරු කරදර උදාවිය හැකි නමුත් බුද්ධිමත්ව ඒවාට මුහුණදීමට හැකිවේ. ගෘහ ජීවිතයේ තමාට ලැබිය යුතු ප්‍රතිලාභ අතර ගෘහ අලංකාරය නව නිවසක පදිංචිය තහවුරු වෙයි.

විවාහ සහකරු හෝ සහකාරිය කිසියම් බාහිර කටයුත්තක් නිසා අඹු සැමියන් අතර ගැටලු මතු කෙරේ. කුස උෂ්ණගති මතු කෙරේ. සැර උෂ්ණ ආහාරපාන අවම කරන්න.

සිංහ - ප්‍රධානීන්ගේ ප්‍රසාදය

සිංහ ලග්නයට අනුව ඔබට ඉදිරි කාලය ඉතා සුබයි. රැකියා ස්ථානයේ යහපත ආර්ථික ප්‍රතිලාභ වැඩි වන බවක් දක්නට ලැබේ. තම අනාගත සැලසුම් කිපයක් ප්‍රධානීන්ගේ සැලකිල්ලට භාජනය වීම තුළ සතුටුදායක ප්‍රතිලාභ ලැබේ. එබඳු පුද්ගලයන්ගේ ප්‍රසාදයට ලක්වේ. ගෘහ ජීවිතය එතරම් ගැටලු සහගත නොවන අතර තමා ඉල්ලුම්කර තිබූ ණය මුදලක් හිමිවන ලකුණු පෙනේ. අධ්‍යාපනය හදාරන දරුවන්ට කටයුතු බහුලවේ. ශරීර සෞඛ්‍යය අතින් ද එතරම් බිය විය යුතු නැතත් පපුවේ වියළි ගති මතු වීමට පුළුවන. රාත්‍රී, කාලයේ ගමන් අවම කරන්න.

කන්‍යා - මවු පාර්ශ්වයෙන් ලැබීම්

කන්‍යා ලග්නයට අනුව ඔබගේ ඉදිරි කාලය ඉතා සුබයි. මවු පාර්ශ්වයෙන් ලැබීම් ඇත. පිටරටක සිට පැමිණි අයකුගෙන් මූල්‍යමය ආධාර ලැබේ. පෙර පින් මහිමය මතු කෙරෙනු ඇත. තම දූ දරුවන්ගේ කටයුතු නිසා කාලය කාර්ය බහුල වෙයි. රැකියා ස්ථානයේ උසස්වීම්, ස්ථාන මාරු ඇති කෙරේ. කලක් බලාපොරොත්තුව සිටි දේපළ හා හිමිකම් උදාකෙරේ. යුග දිවියේ පැවැති බාධක ඉවත්වේ. පිය පාර්ශ්වයේ ඥාතියකුට සිදුවන කනගාටුදායක තත්ත්වයන් නිසා මුදල් හා ශ්‍රමය කැප කිරීමට සිදුවේ. උරහිසට අගුණයි. සමබර නොවන අයුරින් බර ඉසිලීම් සුබ නැත.

තුලා - වියදම් අධික වේ

තුලා ලග්නයට අනුව මෙම වකවානුව ඔබට යම් යම් ගැටලු කිපයකට මුහුණදීමට සිදුවෙයි. ආර්ථික ලැබීම් අවම කරන අතර වියදම් අධික වෙයි. තමාගේ නොසැලකිල්ල නිසා තම ආර්ථික ප්‍රතිලාභයක් මග හැරෙනු ඇත. ව්‍යාපාර අංශයේ කටයුතු කරන අයට සුබයි. නිතරම සිතට වද දෙන කරුණක් උද්ගතවීමට පුළුවන. ආදරය, ආලය වැනි කටයුතු කෙරෙන් පරාජයට පත්වනු ඇත. තම දේපළවලට නීති ගැටලු මතුකෙරේ. ඉගෙන ගන්නා දූ පුතුන්ට බාධක පැමිණේ. නමුත් ශරීර සෞඛ්‍යය අතින් එතරම් අසුබ නොවුව ද සැර උෂ්ණ ආහාර පාන අවම කළ යුතු වෙයි.

වෘශ්චික - යුග දිවියේ අරුණලු නැඟේ

වෘශ්චික ලග්නයට අනුව ඉදිරි කාලය ඔබට ඉතා සුබයි. ආර්ථික ලැබීම් මෙන් ම තම ජීවිතයේ සතුට සොම්නස මතු කෙරේ. අවිවාහක අයට මංගල යෝග ද විවාහක අයට තිබූ යුග දිවි ගැටලු අවම වන ලකුණු පළ කෙරේ. රැකියා ස්ථානගත යහපත, ප්‍රධානීන්ගේ පිළිගැනීමට ලක්වීම පැවැති සතුරු බාධක ඉවත්වීම මෙහිදී දක්නට ලැබේ. තම කාර්ය බහුල බාවය නිසා කටයුතුවල අක්‍රමිකතාවක් පෙනෙන්නට තිබුණ ද සෙසු අයගේ සහයෝගයෙන් එම අවහිරතා මග හරවා ගැනීමට හැකිවේ. යටි බඩ ආශ්‍රිත ආපදා අක්මා ගත උවදුරු පෙනෙන්නට

ධනු - රැකියාගත ගැටලුවලට විසඳුම්

ධනු ලග්නයට අනුව මෙම වකවානුව ඔබට ඔබ ජීවිතයේ කිසියම් සිත් තැවුලකට ලක්වේ. තම සමීපතමයන් තමාගෙන් දුරස්වන ලකුණු පෙනේ. ආර්ථික ලාභ අවම වන අතර වියදම ද ශීඝ්‍රයෙන් ඉහළ යයි. රැකියාගත ගැටලු කිපයකට විසඳුම් ලැබෙන අතර වගකීම් බහුල වීම තුළ කිසියම් සිත් තැවුලක් ද ඇති විය හැක. තම මවු පාර්ශ්වයේ කෙනකු නිසා ගැටලු රැසකට පිළිතුරු ලැබේ. ගෘහ ජීවිතය තුළ තම එදිනෙදා කටයුතු කිපයක් මග හැරෙනු ඇත.

මකර - නව ආයෝජනයකට ඉඩ

මකර ලග්නයට අනුව ඉදිරි කාලය ඔබට ඉතා සුබයි. ආර්ථික ප්‍රතිලාභ උසස් ය. නව ආයෝජකයනට ඉඩ සැලසේ. කලක සිට නැවතී තිබූ ව්‍යාපාරයක් යළි ඇරඹීමට හැකිවේ. ඒ සඳහා බොහෝ හිතවතුන්ගේ ඇප උපකාර ලැබේ. තම රැකියා අභිවෘද්ධිය අවම වුව ද බාහිර මුදල් උපයන ක්‍රම මතු කිරීම තුළ කාලය පිළිබඳ කාර්ය බහුලතාවක් පෙන්වයි. ගෘහ ජීවිතය සතුටුදායක තත්ත්වයකි. නිවසේ පුණ්‍යමය කටයුත්තක් සිදු කිරීමට කැපවනු ඇත. ශරීර සෞඛ්‍යය පිළිබඳ සිතනවා නම් හිසේ ආපදා ඇතිවේ. සෙම් රෝග බහුල කෙරේ. රාත්‍රී කාලයේ ස්නානය සීතල ජලය පරිහරණය අවම කරන්න.

කුම්භ - සොඳුරු කාල පරිච්ඡේදයක්

කුම්භ ලග්නයට අනුව ඉදිරි කාලය ඔබගේ ජීවිතයේ සුබවාදී වෙනස්කම් රැසක් සිදුවේ. ඒ අතර නව නිවෙසක පදිංචියට යෑම, වාහන ප්‍රතිලාභයක් හිමිවීම හා රැකියාවේ උසස්වීමක් හිමිවීම පෙනෙන්නට තිබේ. ගෘහ ජීවිතයේ සතුට, අභිවෘද්ධිය සහිත වේ. එදිනෙදා කටයුතු අතර ප්‍රිය සම්භාෂණ ආදියට නිතර යෑමට සිදුවීම පෙන්වයි. ව්‍යාපාරික ක්ෂේත්‍රයේ ඉහළටම යෑමට වාසනාව පෑදේ. මවට අපල ගෙන දෙන කාලයකි. තමාට දියණියක් සිටී නම් දියණියකට සිදුවන ගැටලුවකින් තමාට පීඩා විඳීමට සිදුවේ. තම දිවියේ නව බලාපොරොත්තු රැසක් ඉටුවේ. එහෙත් තුනටියට දණ හිසට ආපදා විය හැක.

මීන - අරමුණු රැසක් මල්පල ගැන්වේ

මීන ලග්නයට අනුව ඉදිරි කාලය ඔබට වටිනා දේපළක හිමිකමක් ලැබේ. එය පිළිබඳව උනන්දුව තබා ගත යුතු ය. නීතිමය ගැටලුවකට සාධාරණ විසඳුම් ලැබේ. විවාහක අයගේ යුග දිවියේ නව අරමුණු රැසක් මල්පල ගැන්වේ. දූ පුතුන් ඇති අයට ඒ අය නිසා ජීවිතයේ ප්‍රශංසා හිමි වනු ඇත. ඒ අයගේ ජයග්‍රහණ නිසා මූල්‍යමය ප්‍රතිලාභ ද හිමිවේ. දුර ගමන් බිමන් යෙදේ. උගුරේ ආසාදනයක් නිසා ප්‍රතිකාර ගැනීමට පවා සිදුවේ. තම ඉඩමක් නිවසක් සුරක්ෂිත කර ගැනීම සඳහා සීමා මාඉම් සකසා ගැනීමට උනන්දු වේ. පිය පාර්ශ්වයේ භුක්තියක් හිමිවනු ඇත

බිලිඳු නමට අකුරු

● සමන්ති අහුබුදු

(අප්‍රේල් මස 25 සිට මැයි 01 දක්වා උපදින අය සඳහා)

25 ඉරිදා

04.23 තෙක් උත්‍රපල් නැකැතයි. සුදුසු අකුරු "ටෙ, ටො, ප, පි"

26 සඳුදා

25 ඉරිදා 04.23 සිට 26 සඳුදා 01.54 තෙක් හත නැකැතයි. සුදුසු අකුර "පු". ඉන්පසු 01.54 සිට 23.05 දක්වා සිත නැකැතයි. සුදුසු අකුරු "පෙ, පො, ර, රි"

27 අඟහරුවාදා

26 සඳුද 23.05 සිට 27 අඟහරුවාදා 20.08 තෙක් සා නැකැතයි. සුදුසු අකුරු "රු, රෙ, රො, ත"

28 බදාදා

27 අඟහරුවාදා 20.08 සිට 28 බදාදා 17.12 තෙක් විසා නැකැතයි. සුදුසු අකුරු "ති, තු, තෙ, තො"

29 බ්‍රහස්පතින්දා

28 බදාදා 17.12 සිට 29 බ්‍රහස්පතින්දා 14.29 තෙක් අනුර නැකැතයි. සුදුසු අකුරු "න, නි, නු, නෙ"

30 සිකුරාදා

29 බ්‍රහස්පතින්දා 14.29 සිට 30 සිකුරාදා 12.07 දක්වා දෙට නැකැතයි. සුදුසු අකුරු "නො, ය, යි, යු"

01 සෙනසුරාදා

30 සිකුරාදා 12.07 සිට මැයි 01 සෙනසුරාදා 10.15 තෙක් මුල නැකැතයි. සුදුසු අකුරු "යෙ, යො, බ, බි" ඉන්පසු ඉරිදා 08.58 තෙක් පුවසල නැකැතයි. සුදුසු අකුර "බු"

මෙහි වේලාව දක්වා ඇත්තේ පැය 24 ඔරලෝසුව අනුවයි.

පොත් පුවත්

● සුරේකා හිල්මිණි ඉලංගසෝන්

අලුතින් ජනගත වන පොත් පිළිබඳව පාඨකයන් දැනුම්වත් කිරීමේ අරමුණින් මෙම 'පොත් පුවත්' පිටුව සැකසේ. ඒ සඳහා 2020/21 වර්ෂ තුළ පළ කළ කෘතිවල මුද්‍රිත පිටපතක් සිළුමිණ පොත් පුවත්, ලේක්හවුස්, කොළඹ 10 ලිපිනයට යොමුකළ හැකිය.

කෘතිය- අම්මයි තාත්තයි
කර්තෘ- තිලකරත්න ඕබඩගේ
කර්තෘ ප්‍රකාශනයකි
මිල- 200/ පිටු ගණන- 55
විමසීම්- 075 7613319

ලේඛකයකු, සමාජ ක්‍රියාකාරිකයකු, විදුහල්පතිපතිවරයකු සහ වසර 40කට අධික කාලයක් දහම් පාසල් ගුරුවරයකු ලෙස කටයුතු කරන තිලකරත්න ඕබඩගේ විසින් රචිත මෙම කෘතිය මවුපිය ගුණය ඉස්මතු කරන කාව්‍ය සංග්‍රහයකි. නිසඳැස මෙන්ම සඳැස ද මැනවින් හැසිරවීමට සමත් කතුවරයා අපූරු සංයමයකින් යුතුව බස හසුරුවා ඇති බව මැනවින් පැහැදිලි වේ. සාම්ප්‍රදායික හා ජන කවි රීතිය සංකලනය කර ගනිමින් ඕනෑම මට්ටමක පාඨකයකුට එකසේ රසවිඳිය හැකි අයුරින් මෙම කාව්‍ය සංග්‍රහය රචනා කර ඇත.

කෘතිය- සෙව්වන්දි
කර්තෘ- සුසන්ත රත්නායක
ප්‍රකාශක- නිශාන්ත ප්‍රකාශක
මිල- 300/ පිටු ගණන- 52
විමසීම්- 071 8024074



වෘත්තියෙන් ළමා රෝග විශේෂඥ වෛද්‍යවරයකු වන වෛද්‍ය සුසන්ත රත්නායක විසින් රචිත මෙම කෘතිය ඔහුගේ පළමු කාව්‍ය සංග්‍රහයයි. සාම්ප්‍රදායික කවි රීතිවලින් බැහැරව යමින් නිදහස් ශෛලියකින් රචනා කර ඇති මෙම කවි සංග්‍රහය තුළ සැබෑ ජීවිතයේදී මුහුණ දෙන සිදුවීම් සහ හමුවන පුද්ගලයන් පිළිබඳ අත්දැකීම් පිළිබඳ විවරණයක් වැනිය. 'අකල් පිනි' කෙටි නවකතාව, 'සසල පෙම' නවකතාව සහ 'වැඩවැරුම අහවරයි' කෙටිකතා සංග්‍රහය වෛද්‍ය සුසන්ත රත්නායක විසින් රචිත සෙසු කෘති ය.

කෘතිය- දේදුනු පාලම
කර්තෘ- ගුණපාල කරුණාතිලක
ප්‍රකාශක- කර්තෘ ප්‍රකාශනයකි
මිල- 100/ පිටු ගණන- 40
විමසීම්- 035 2258682



අරණායක ගුණපාල කරුණාතිලක විසින් රචිත මෙම කාව්‍ය සංග්‍රහය එකිනෙකට වෙනස් තේමාවන් යටතේ ලියැවුණු පද්‍ය 31කින් සමන්විත වේ. විශ්වවිද්‍යාල සිසුවකු, ගුරුවරයකු ලෙස කතුවරයා ලැබූ අත්දැකීම් මෙන්ම කතුවරයාගේ සමාජ අත්දැකීම් ද මෙම කාව්‍ය සංග්‍රහය රචනා කිරීමේදී උපයෝගී කර ගෙන ඇති බව පෙනේ.

කෘතිය- හද විල පිපි මල්
කර්තෘ- සුනිල් ඩී. මාරසිංහ
කර්තෘ ප්‍රකාශනයකි
මිල- 275/ පිටු ගණන- 132
විමසීම්- 071 7771381

කලාභූෂණ, මාධ්‍යවේදී හපුගහතැන්නේ සුනිල් ඩී. මාරසිංහ විසින් රචිත මෙම ප්‍රථම සඳැස් කාව්‍ය සංග්‍රහයට ඇතුළත් කර ඇත්තේ ඔහු විසින් ජාතික තලයේ පුවත්පත්,සඟරා සහ තරගවලට ඉදිරිපත් කරන ලද පද්‍ය පන්ති අතරින් තෝරා ගත් කවි පන්ති 61කි. බුදු බැතිය,දේශානුරාගය, මාපිය හා දූදරු සෙනෙහස, කාලීන සමාජ ප්‍රශ්න, දේශීය සංස්කෘතියේ රසමුසු තැන් සහ විවිධාකාර මනෝභාව යන විෂයයන් වස්තු බීජ කරගනිමින් එම පද්‍ය රචනා කර ඇත.

කෘතිය- සිහිනයක ඉම
කර්තෘ- ගයාදාස පරණවිතාන
ප්‍රකාශක-කර්තෘ ප්‍රකාශනයකි
මිල- රුපියල් 475 / පිටු ගණන- 206
විමසීම්- 071 6436520

පශ්චාත් උපාධිධාරි ගුරුවරයකු ලෙස වසර 35ක් සේවය කර දැනට විශ්‍රාම සුවයෙන් පසුවන කතුවරයාගේ පළමු නවකතාව වන මෙම කෘතිය තුළ අන්තර්ගතව ඇත්තේ යථාර්ථය පසුබිම් කරගත් කතාවකි. තමා සතු ගැඹුරු සමාජ අත්දැකීම් විචක්ෂණශීලීව ඉදිරිපත් කිරීමට ඉතා සූක්ෂම ලෙස සිය ලේඛන ශක්තිය උපයෝගී කරගෙන ඇති කතුවරයාගේ රමණීය භාෂා ශෛලිය මෙහිදී කැපී පෙනේ.

කෘතිය- දෙබරයට ගලක් 1 සහ 2
කර්තෘ- නන්දසේන විතාරණ
විමසීම්- 071 3401883

කොරෝනා වසංගතය ඉදිරියේ අපගේ ඉපැරණි සෞඛ්‍ය ප්‍රතිපත්තිය හා ආහාර ප්‍රතිපත්තිය සමාජය තුළ ස්ථාපිත කිරීම යුගයේ අවශ්‍යතාව බවට පත්වෙමින් තිබෙන බව කතුවරයා මෙම කෘතියේ පූර්විකාව තුළින් පවසයි. දෙබරයට ගලක් නමින් කෘති ද්විත්වයක් පළකොට ඇති අතර එයින් ටෙලි සිත්තම් දෙකක් ජනගත කරන්නේ එම යුගයේ අවශ්‍යතාව සපුරාලීමේ එක් පියවරක් ලෙසටය. එහි පළමුවැන්න 'අක්මුල් ඇත්තෝ සහ නැත්තෝ'ටෙලි සිත්තමයි. දෙවැන්න 'ආයු වඩන හැටි' ටෙලි සිත්තමයි. දේශීය වෛද්‍ය ක්‍රම නගා සිටුවීම නමැති යුගයේ කාර්යභාරය ඉටු කිරීමට සකලවිද සාහිත්‍යධරයන්, විදූත්, මුද්‍රිත මාධ්‍ය ක්‍රියාකාරීන්, රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික ව්‍යවසායක ප්‍රජාවන්ට ඇති වගකීම පිළිබඳවද මෙහිදී කතුවරයා සිහිපත් කරයි.

බහුවිධ කලාවන්ම ස්පර්ශ කරන ඉංජිනේරුවා



අජන්ත සෙනෙවිරත්න

මුළු මහත් ජීවිතය ම අත්දැකීමකි. ජීවිතයේ සෑම කාල පරිච්ඡේදයක්මත්, සෑම චලනයක්මත් අත්දැකීමක් ය. ජීවිතයේ සමහර කාලපරිච්ඡේද වෛවර්ණිත ය; සමහර කාල අඳුරු ය; සමහර කාල අහස වැනි ය, නිරන්තර වෙනස් වන සුලු ය. මේ ඕනෑම වර්ණයකින් ගොඩනැඟෙන්නේ අත්දැකීමක් ය.

අත්දැකීම් ග්‍රහණය වන්නේ විවිධ අයුරිනි. ඔබට, මට අත්දැකීම් ලැබුණ ද ඒවා යොදා ගන්නේ හෝ ඒවායෙන් පැනෙන නව අර්ථ ග්‍රහණය කර ගන්නේ කෙසේදැයි නොතේරෙන්නට ඉඩ තිබේ. එහෙත් කවියන්, දාර්ශනිකයන්, නවකතාකරුවන්, කෙටිකතාකරුවන් අපට වඩා බෙහෙවින් වෙනස් ය. ඔවුහු සෑම අත්දැකීමක් ම පිට නොපිට පෙරළා ඒවායෙහි සියුම් තැන් ග්‍රහණය කර ගැනීමේ ලා සමත් ය. අත්දැකීම පිටුපස හෝ අත්දැකීම ඉක්මවා පවතින යමක් ආවරණය කිරීමේ ලා ඔවුහු සමත්කම් පාති. දාර්ශනිකයන්, කවියන් අතර මේවා සැමවිට ම විවිධ හැඩතල ගන්නේ ය.

අත්දැකීම තීව්‍ර කිරීම හෝ මොට කිරීම නිර්මාණකරුවාගේ ප්‍රතිභාව මත රඳා පවතින්නකි. කුරිරු, අඳුරු අත්දැකීමකින් අර්ථවත්, සජීවී අර්ථකථනයක් මතු වීමේ ප්‍රතිභාව කලාකරුවාගේ නිපුණතාව මත තීරණය වේ. කලාව කියන්නේ ම ඒකට ය. ජීවිතය එහි කොන්දේසි සමඟ ම තේරුම් ගෙන, ඒවා රසවත් සහ උත්කෘෂ්ට සංරචන බවට පෙරළීමට දෙනු ලබන නාමය කලාව යැයි අප යෝජනා කරන්නේ ඒ නිසා ය. මේවා අඩුවැඩි වශයෙන් නිර්මාණකරුවන් භාවිත කරන්නේ ඒ සත්‍යය ගැන ඔවුන්ට වෙන දැනීම හේතුවෙනි. කලාව, ආදරය හා සම්බන්ධ වන්නේ මේ වැනි තැන්හිදී ය. ආදරය සියලු අඩුලුහුඬුකම් අඳුනන බවත්; ඒ අඩුලුහුඬුකම් සියල්ලත් සමඟින් ආදරය කරනා බවත් 'කොලරා කාලේ ආලේ' ලියමින් කියන්නේ ගබ්රියෙල් ගාර්සියා මාර්කේස් ය. ආදරය, කලාව එක්තැන් වන්නේ මේ වැනි තැන්වලදී ය.

වත්මන් නිර්මාණකරුවන්ට ඩිජිටල් ලෝකය විසල් අත්දැකීමකි. ඒ ලෝකයේ සීමා මායිම් නැත. මුලින් සිතෙන්නේ ඒ ලෝකය ඒ අයගේ විතරක් ම ය කියා ය. සීමා මායිම් නැති වන්නේ ඒ සිතිවිල්ල සිතට ආ සැණිනි. බැඳීම්වලට ප්‍රවාහය වැදගත් වන්නේ නැති බව සත්‍යයකි; ඒවාට අර්ථකථන දිය නොහැකි බව ද සත්‍යයකි. තනි ලෝකවල සැරිසරද්දී; පොදු හැඟීමට මමත්වය එක්වෙද්දී අවට නොපෙනී යෑම ද සාමාන්‍යය ය. එහෙත් වර්චුවල් ජාලගත ලෝකයේ බැඳීම්වලට තිත තැබෙන්නට ඩේටා විසන්ධි වීම පමණක් ප්‍රමාණවත් බව සිතෙද්දී උත්ප්‍රාසයක් සිතට නැඟීම වැළැක්විය නොහැකිය. ඒ කට කොනට නැගෙන සිනාවට ද සමාව ඉල්ලිය යුතුව තිබේ. හේතුව අප දන්නා බැඳීම හා ඩිජිටල් බැඳීම දෙකක් ම වන බැවිනි. නිර්මාණකරුවාගෙන් මේ ඉසව්ව මඟ හැරෙන්නේ නැත. අජන්ත සෙනෙවිරත්න ලේඛකයා ස්පර්ශ කරන්නේ වත්මන් වර්චුවල් ලෝකයේ එක්තරා ඉසව්වකි. ඒ ඉසව්වට අර්ථකථන නොදීමට ඔහු පරෙස්සම් වන්නේ ලේඛකයාගේ සීමාව පිළිබඳ ව සවිඥානික ව ය.

"ඩිජිටල් පෙම්වතිය" වෙනත් ආකෘතියකින් ඉදිරිපත් කරනු ලැබූවක්. එහි එන සියලු කතා එක පුද්ගලයකුගේ ජීවන් අත්දැකීම් ලෙස දිග හැරුණත් වෙන වෙනම ගත කළ ඒවා එකිනෙකට ස්වායත්ත කතාන්දර. ඒ පුද්ගලයා විටක බෙදා ගන්නේ මගේ ම අත්දැකීම්; සමහර විට ඔබේ අත්දැකීම්. සමහර කතාන්දර ඇතුළෙ අප දෙගොල්ලන්ගේ ම ඒවා මුහු වෙලා. කටේ කතා සියල්ලේ තිබෙන්නේ ඔබෙත්, මගෙත් ජීවන අත්දැකීම් සහ සිතුම් පැතුම්. මා මෙන්ම ඔබද මේ නිර්මාණකරණය සඳහා ඍජු ව හෝ වක්‍ර ව දායක වී තියෙනවා කියලා මට හිතෙන්නේ ඒ නිසායි.

"ඩිජිටල් පෙම්වතිය" කෙටිකතාව එහි ඇති කේන්ද්‍රීය කතාන්දරයයි. ඉංජිනේරු උපාධිධාරියෙක් හැටියට නවීන යුගයේ තාක්ෂණික දියුණුව සාහිත්‍ය සමඟ බද්ධ කරන්න මා කැමතියි. විද්‍යා ප්‍රබන්ධ සහ සෙසු සාහිත්‍ය ප්‍රබන්ධ වර්ග අනාගතයේදී එක තැනකට අභිසාරී වන බව මා පවසන්නේ මේ බද්ධ වීම කොහොමටත් ස්වාභාවිකවම සිදුවෙන නිසා. පුද්ගල සන්නිවේදනය සඳහා විද්‍යුත් ආම්පන්න භාවිතය බහුල වීමෙන් ආදර අන්දර දෙස බැලිය යුතු පැතිකඩද වෙනස් වෙමින් පවතින බව ඔබ දන්නවා. ප්‍රේමයක සම්මත අසම්මත බව තීරණය කළ නොහැකි පරිද්දෙන් සංකීර්ණ වන ඩිජිටල් ආදරය නව මාන ඔස්සේ විහිදෙනවා. වෙනස් ආකාරයේ අධ්‍යාත්මික බැඳීම්, එමගින් නිර්මාණය වීමට පටන් ගෙන තියෙනවා. ඩිජිටල් මාධ්‍ය හරහා ඇතිවෙන සමහර ප්‍රේම සබඳතා අසම්මත ලෙස ගෙන වීසි කිරීමට බැරිතරම් අපූරු බැඳීම්. "ඩිජිටල් පෙම්වතිය" එවැනි කතාවක්. සැබෑ ජීවිතයේදී තමාට ළඟා කරගත නොහැකි වූ ප්‍රේමයක් ඩිජිටල් ආදරයකට පෙරළා ගැනීමට තැත් කිරීමට එක්තරා කාන්තාවක් ගන්න උත්සාහය මෙයින් හෙළි වෙනවා. මෙය මට බොහෝ සමීප අත්දැකීමක්. ආදරය, අනුකම්පාව, ඊර්ෂ්‍යාව, වෛරය මේවා සියල්ලම ඩිජිටල් ආදරයක ඇතුළෙ එකවිට මුසුවීම සාම්ප්‍රදායික ආදරයට වඩා ඒවා වෙනම මානයකට ඔසවා තබනවා. මේ කතාවේ අවසානයක් හෝ ඉලක්කයක් ගැබ් කර නැත්තේ ඩිජිටල් ආදරයක සංකීර්ණත්වය වටහා දීමටයි.

'ඔබට, මට අප සැමට ම ප්‍රාර්ථනා ලෝකයක් තිබේ.අප ගත කරන ජීවිතය ඇතුළත ප්‍රාර්ථනා දුරස්ථ වන තරමට ම නිර්මාණකරුවාගේ පරිකල්පන ලෝකයේ ඒවා වඩ වඩාත් වර්ධනය වේ. මේ කරුණ තේරුම් ගන්නට ලේඛනයේ යෙදීම හෝ නිර්මාණකරණයේ යෙදීම අවශ්‍ය වන්නේ නැත. අපගේ ජීවිතයේ ඇතුළත ද මෙය සත්‍යයකි. මායාවේ යථාර්ථයට වඩා සුන්දර පරිකල්පනය විසින් ඔබ මෙහෙයවන්නට පටන් ගන්නා විට ඔබ ජීවත් වන්නේ වෙන ම ලෝකයක ය. ඒ ලෝකයේ දුක්කම්කටුලු, පශ්චාත්තාප, කඳුළු බිඳු නැත; ඇත්තේ සිනහමල් පොකුරු පමණි; ඒ මල්පොකුරු පර වන්නේ ද නැත. පරිකල්පනය අප සෑම දෙනෙකුගේ ම හදවත්හි ඇත. ඒත් ඒ පරිකල්පනයේ නිර්මාණයක් වී එළිදකින්නේ ලක්ෂ සංඛ්‍යාත වූවන්ගෙන් එකකුගෙන් ම පමණි.



අජන්ත සෙනෙවිරත්න කවියාගේ; එතැනින් ඔබ්බට යන ආයතනික විධායක ප්‍රධානියකුගේ ප්‍රවේශයේ සිට බලන කල මේ කවියේ අරුත අප බොහෝ ඇතට රැගෙන යයි. සිඳෙද්දී පවා මෛත්‍රිය පාන මහා කරුණාවේ සිසිලස ඒ පද අතර දැනී නොදැනී යයි. 'පතා අවුත් මිනිසුන් මගෙ ගෙල සින්දා' කාව්‍යයේ එන මහා කරුණාව පරිසරය අබිබවා අප ගත දැවෙටෙන්නේ සිතට නිවීමක් එක් කරමිනි.

'අහස පොළොව නුහුලන මේ දුක රන්දා
කම්පා නොවනු මැන ගුගුරා වෙර රන්දා
සිය ගෙල සිඳින සතහට නිසි සිහි කැන්දා
නොවන් මනු සතට මටවන් දුක කිසිදා...'

'සර්වකාලීන මාතෘකාවක් බවට පත්ව ඇති පරිසර විනාශය ගැන කියැවෙන "පතා අවුත් මිනිසුන් මගෙ ගෙල සින්දා" කවි පන්තිය බොහෝ අයගේ ප්‍රසංශාවට භාජනය වූවක්. වනස්පති කේන්ද්‍ර කරගත් බොහෝ කවි ලියැවී ඇතත් මේ කවි පන්තිය ඉදිරිපත් කර ඇති ආකාරය වෙනස්. කවියක අගය වැඩි කරන බහු අර්ථ ගැබ්වීම මෙහි විශේෂත්වයයි. ආයතනික ප්‍රධානියෙක් ලෙස ගසක් උපමා කර ගත්විට ගසෙන් අවට සෙසු කුඩා ගස සහ පොදුවේ පරිසරය රැකෙන අයුරු මෙහිදී විතර කරනවා.

ස්වභාවික අන්තරාවලින් සහ වන ජීවීන්ගෙන් එය බේරෙන අයුරුත් විස්තර වෙනවා. එහෙත් අවසානයේදී කෘත්‍රිම හේතු මත සිදුවන අභාග්‍යය හුවා දැක්වීම වර්තමාන සමාජයටත් පාඩමක්. එහෙත් ගස වින කටින්නන්ට වෛර නොකරන ගුණය අවසානයේදී ඉස්මතු කරනවා'

අජන්ත සෙනෙවිරත්න කවියා සිය ප්‍රතිභාව පරිසරය ඇසුරේ වැඩෙන්නට හැරීම ඔහුට පමණක් නොව පොදුවේ පාඨක සහෘදය ප්‍රජාවට ද නිවීම සාක්ෂාත් කරයි.

ප්‍රබන්ධ චරිත හා අත්දැකීම් ස්වකීය ඒවා බැව් බොහෝ දෙනා නොසිතති. ජීවිතයට ආකෘතියක් ඇත්තේ යම්තාක් ද, ඒ තරමට එය කලාවක් වන්නේ ය. ශිෂ්ටාචාරයේ අවුල හෝ චින්තනමය පීඩාව වැඩි වන්නට, වන්නට එය කලාවක් වේ. කලා කෘතිවලදී ගැඹුරු ලෙස ද, පොහොසත් ලෙස ද සන්වේදනා පැහැදිලි කරන්නේ සවිඥානික හා සැමට පෙනෙන ප්‍රකට රටා ඔස්සේය. කලාවේදී සියලු අත්දැකීම් හා වස්තුවලට පැහැදිලි ස්ථානයක් ලබා දෙයි. ප්‍රිය උපදවන, ලාලසාව වර්ධනය කරන සිහිනමය දෑ පවා කලාවේදී එක්තරා හික්මීමකට ලක්කරයි. එසේත් නැතිනම් තාර්කික රටාවකට යටත් කරයි.

අප හදවත්හි අර්ධ වශයෙන් ප්‍රකාශිත ජීවිතයේ වියවුල, අවකාශය නැවත නැවත අප හදවත්හි සිදු වුව ද එහි සැබෑ ස්වරූපය හඳුනා ගැනීමට අප බොහෝ දෙනා අසමත් ය. එහෙත් කවියකදී, නවකතාවකදී හෝ නාට්‍යයකදී ඒවා සඳහට ම පැහැදිලි කෙරේ. යාන්තමට අවබෝධ වුණු හැඟීමක්, සිතිවිල්ලක්, සාහිත්‍යයේ හෝ සංස්කෘතියේ පැහැදිලි කිරීමකට සමපාත වන්නට ඒ අනුව අපට හැකි වේ.

අජන්ත සෙනෙවිරත්න නවකතාකරුවා අපට හමුවෙන්නේ මේ ආස්ථානයේ සිට බලද්දී ය. අපෙන් මගහැරෙන බොහෝ දෑ පිළිබඳ හේ බෙහෙවින් සවිඥානික ය. ඒ සවිඥානිකත්වය විසින් ජීවිතාවබෝධය පිණිස බොහෝ දෑ පාඨකයන්ට ඔහු තිළිණ කරයි. 'දැක නොදුටු පෙරනිමිති' මෙහි කූටප්‍රාප්තියයි.

'මා කුඩා කල පදිංචිව සිටි රජයේ නිල නිවෙස ආසන්නයේ වූ විහාරස්ථානයේ වයස අවුරුදු 12ක් පමණ වෙන සාමණේර භික්ෂූන් වහන්සේ තුන් නමක් වැඩ වාසය කළා. මේ තිදෙනාගෙන් ස්වාමීන් වහන්සේලා දෙනමක් අවුරුදු 20 පිරෙන්නටත් කලින් උපැවිදි වුණා. මේ සිද්ධිය අපි හැමෝගෙ ම සිත් සසල කළා. ඉතිරි වූයේ සංඝරතන හිමි පමණයි. පැවිදි ජීවිතය වෙනුවෙන් ම දිවි කැප කළ උන්වහන්සේ අවුරුදු පනහ ලබන්නටත් පෙර ජීවිතයෙන් සමුගැනීම මට බෙහෙවින් බලපෑවා.

කලක් එඩ්වින් ආරියදාසයන් හා මා එක්ව නීති විද්‍යාල ප්‍රවේශය සඳහා උපකාරක දේශන පැවැත්වූ කාලයේ සිංහල භාෂාව උගැන්ම සඳහා සම්මාදන් වූයේ තරුණ භික්ෂුවක්. විද්‍යාර්ථියකු වූ උන් වහන්සේ නැණවත් හා ගුණවත් බවෙන් යුතු වූවෙක්. උන්වහන්සේට නීතිඥයකු වීමේ දැඩි ආශාවක් තිබුණා. ඒ නිසාම උන්වහන්සේ සුරේෂ් නමින් උපැවිදි වුණා. ටික කාලෙකින් ආදරවන්තියකුත් සොයා ගත් සුරේෂ් මෝටර් සයිකලයක් පදිමින් සිටියදී සිය ආදරවන්තිය ඉදිරියේදී ම ලොරියකට යට වෙලා මියැදුණා. මේ අකල් වියෝවත් මට තදින් බලපෑවා. දහම් පාසලේ උගැන්මේ යෙදී සිටින විට ඇසුරු කිරීමට ලැබුණු බොහෝ ස්වාමීන් වහන්සේලාගේ සමහර ක්‍රියා හා කතා මගේ නොසතුටට හේතු වුණා. මේ වගේ කතා බොහොමයක් මට 'දැක නොදුටු පෙරනිමිති' පොත ලියන්නට ඉවහල් වුණා'

ඕනෑ ම නිර්මාණකරුවකුට පාදක වන්නේ අත්දැකීම් ය. අත්දැකීම් ග්‍රහණය වන්නේ විවිධ අයුරිනි. ඔබට, මට අත්දැකීම් ලැබුණ ද ඒවා යොදා ගන්නේ හෝ ඒවායෙන් පැනෙන නව අර්ථ ග්‍රහණය කර ගන්නේ කෙසේදැයි නොතේරෙන්නට ඉඩ තිබේ. එහෙත් කවියන්, දාර්ශනිකයන්, නවකතාකරුවන් අපට වඩා බෙහෙවින් වෙනස් ය.

ඔවුහු සෑම අත්දැකීමක් ම පිට නොපිට පෙරළා ඒවායෙහි සියුම් තැන් ග්‍රහණය කර ගැනීමේ ලා සමත් ය. අත්දැකීම පිටුපස හෝ අත්දැකීම ඉක්මවා පවතින යමක් ආවරණය කිරීමේ ලා ඔවුහු සමත්කම් පාති.

අජන්ත සෙනෙවිරත්න නිර්මාණකරුවා ද තමන් අත්විඳින අත්දැකීම් හා සංවේදනා පොදු සමාජය හා බෙදා ගන්නේ ආනන්දයක් ජනිත කරමිනි. ඔහු පොදු සමාජයේ අත්දැකීම් ස්වකීය නිර්මාණ සඳහා බෙහෙවින් උපයුක්ත කරගැනීම ම ඒවා පාඨක රසික සහෘදයන් අතර ආදරයට පාත්‍ර වීම සඳහා බලපෑම් කරන්නේය. බහුවිධ කලාවන්ගේ සුරුව සරන අජන්ත සෙනෙවිරත්න ලේඛකයා ඊට කිසිසේත් අදාළ නොවන වෘත්තීය ක්ෂේත්‍රයක සුරැකම් පෑම ද ඊට වෙස්වලා ගත් ආශීර්වාදයක් විණි දෝ යැයි සිතෙන්නේ ඒ පසුබිමේ ය.

තදෂි නොගුචි

සිංහලෙන් ග්‍රන්ථ ලියූ ජපන් ලේඛකයා දිවිමඬලෙන් බැස යයි

● සුමුදු චතුරාණී ජයවර්ධන

සිංහල සාහිත්‍ය භාෂාව ජපන් සාහිත්‍යය පරිශීලනය කරන්නන් අතර ජනප්‍රිය කරවීමේ ලා කැපවූ සාහිත්‍යවේදියකු වූ තදෂි නොගුචි නිර්මාණකරුවා පසුගිය 13 වැනිදා දිවි රඟමඬලෙන් බැස ගියේ ය.

දිවියෙන් සමුගන්නා විට 76 වැනි වියේ පසුවූ ඔහු උපත ලබන්නේ 1944 නොවැම්බර් 14 දා ය. දිවිමඬලෙන් සමුගන්නා විට නොගුචි ජපානයේ තෝකියෝහි විබා ප්‍රාන්තයේ වාසය කරමින් සිට ඇත. නොගුචිගේ පියා සිතුවම් ශිල්පියෙකි. සිංහලුන්ටත් වඩා හොඳින් සිංහල බස හැසිරවූ ඔහු නිරන්තරයෙන් අමිශ්‍ර සිංහල භාවිත කිරීමට පරෙස්සම් වූයේ ය.

සිංහල සාහිත්‍යය ගැන ඔහුගේ ඇල්ම හා ආශාව වර්ධනය වී ඇත්තේ ඔහු කුඩා අවදියේදී ම ය; එනම් වයස අවුරුදු අටේදී ය. ඔහුට වයස අවුරුදු 8 දී ජේරාදෙණිය සරසවිය නැරඹීමේ අවස්ථාව ලැබෙයි. ඒ ඇතිවූ ඇල්ම නිසා ඔහු සිංහල භාෂාව හා සාහිත්‍ය සම්බන්ධයෙන් හැදෑරීම සඳහා 1964 දී ලංකාවට පැමිණෙයි. එහිදී ඔහුගේ ශාස්ත්‍රාභිලාෂය සඳහා මහාචාර්ය ඩී. ඊ. හෙට්ටිආරච්චි, මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර හා මහාචාර්ය ආරිය රාජකරුණා වැනි විද්වතුන් බෙහෙවින් සහය ලබා දී තිබේ. ඔහු එහි උගන්නා කාලයේ සිය පළමු සිංහල නවකතාව වූ 'අනිත්‍ය ජීවිතයක්' ලියයි.

1999 වර්ෂයේ සැප්තැම්බර් 8 දා සිංහල හා ජපන් සාහිත්‍යය වෙනුවෙන් ඔහු කරන ලද සේවාව අගයනු වස් ලංකා ලේඛක සංවිධානය විසින් ඔහුට සම්මානයක් පිරිනමනු ලැබූ අතර, ශ්‍රී ලංකා රජය විසින් ද 'ශ්‍රී ලංකා රංජන' ගෞරව නාමයද පුද කරනු ලැබීය. ජපන් ශ්‍රී ලංකා මිත්‍රත්වය වර්ධනය කිරීම උදෙසා සිය ජීවිත කාලය පුරා ඔහු සිදු කළ සේවාව අගයමින් 2017 දී ජපාන රජය විසින් ඔහුට 'THE ORDER OF THE RISING SUN, GOLD AND SILVER RAYS' සම්මානය ප්‍රදානය කරන ලදී.

සිංහල පාඨකයන් අතර ඔහු බෙහෙවින් ආදර ගෞරවයට පාත්‍ර වූයේ නක්සුමේ සොසෙකිගේ මනෝවිද්‍යාත්මක විග්‍රහාත්මක නවකතාවක් වන 'කොකොරො' සිංහලට නැඟීම නිසා ය. එහි පළමු මුද්‍රණය 1979දී ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට් සමාගම මඟින් ප්‍රකාශයට පත්කරන ලද අතර, එහි මිල ලෙස සඳහන් වී ඇත්තේ රුපියල් 20කි.

එහි දෙවැනි මුද්‍රණය ඉහත කී ලේඛක සංවිධානයේ සම්මාන උලෙළේදී ගොඩගේ ප්‍රකාශකයන් විසින් ප්‍රකාශයට පත් කරන ලදී. ඔහු විසින් රචිත සෑම නවකතාවක් ම ඉංග්‍රීසි හා ප්‍රංශ භාෂාවලට පරිවර්තනය වී තිබේ.

මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ මළගිය ඇත්තෝ, මළවුන්ගේ අවුරුදු දා කෘති ද්විත්වය එක් කෘතියක් සේ 'නකිහිතෝ' නමින් ජපන් බසට නැඟුවේ ඔහු විසිනි. ජපන් පරිසරය කේන්ද්‍ර කරගනිමින් ලියැවුණු මේ නවකතා ද්විත්වය ජපන් බසට නැඟීම අත්‍යවශ්‍යයෙන්ම සිදු විය යුත්තකි. ඒ සංස්කෘතික පාලම ගොඩනැංවීමේ ලා තදෂි නොගුචි නිර්මාණකරුවා කළ මෙහෙය අද්විතීය ය. මාර්ටින් වික්‍රමසිංහයන්ගේ විරාගය, ගම්පෙරලිය, යුගාන්තය, කලියුගය හා මඩොල්දූව කෘති ජපන් බසට නැඟන ලද්දේ ද තදෂි නොගුචි විසිනි.

සිබිල් වෙත්තසිංහ ලේඛිකාවගේ ළමා කෘති බොහොමයක් ජපන් බසට නඟන ලද්දේ ද ඔහු විසිනි. ෆුකෝකා චිත්‍රපට උලෙළ නියෝජනය කළ විරාගය චිත්‍රපටය සඳහා ජපන් උපසිරැසි සම්පාදනය කරන ලද්දේ ද තදෂි නොගුචි ය. ඔහු කළ මහඟු සේවාවක් ලෙස නොමඳ ගෞරවයට හා ආදරයට පාත්‍ර වෙන ලද්දේ සිංහල- ජපන්, ජපන්- සිංහල ශබ්දකෝෂ ද්විත්වය සම්පාදනය කිරීමයි. වසර විස්සක පමණ කාලයක් ගත කරමින් කළ එය අද්විතීය ශාස්ත්‍රීය සේවාවක් සේ ශාස්ත්‍රාභිලාෂීන්ගේ නොමඳ ගෞරවයට පාත්‍ර වෙයි.

සිය දෙවැනි මවු ශ්‍රී ලංකාව බැව් ඔහු සඳහන් කරන්නේ අභිමානයෙනි. සිංහල බස කතා කිරීමට දැඩි රුචිකත්වයක් දැක්වූ ඔහු විවාහ වූයේ ද සිංහල කතක් වූ ඉන්ද්‍රානි සමඟ ය. සිංහල හා ජපන් මිත්‍රත්වයේ නොමැකෙන සලකුණක් වූ තදෂි නොගුචි කලාකරුවා සිංහල ලේඛක හා පාඨක ප්‍රජාව සමඟ පැවැති සහෘදය සම්බන්ධතාව නිසාම ඒ ද්වීපාර්ශ්වයම අතර නොමඳ ආදරයට පාත්‍ර වූවෙකි.

කෙටිකතාව

මේ හීනෙන් ඇහැරවන්න

● හංසමාලා රිටිගහපොළ

මෙවර කෙටිකතාව ඉදිරිපත් කරන්නේ ප්‍රවීණ ලේඛිකාවක වන හංසමාලා රිටිගහපොළයි. ඇගේ පළමු කෙටි කතා සංග්‍රය වන්නේ නිල්තැලි දිගැස් මල'. ඇගේ පළමු නවකතාව වන්නේ දීනාරිය.

මීට අමතරව ඇය විසින් පර්යේෂණ කෘති ගණනාවක් ම පළකර ඇත. හංසමාලා විසින් රචනා කරන ලද නවතම කෘතිය වන්නේ නූතන සිංහල ළමා කවි පිළිබඳ කරන ලද 'ළපටි පෙළට කවි විමසුම්' කෘතියයි. ඇය දැනට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියක ලෙස කටයුතු කරන්නීය.

'ඔයාට කවදාවත් ම මාව අන්දවන්න බෑ. එහෙම එකක් කරන්න හිතන්නවත් එපා'

'ඇයි ඒ ?'

'ඇයි ඒ කියන්නේ, මට ඔයාට වැඩිය ජීවිතේ ගැන අත්දැකීම් තියෙන හින්දා'

ඇගේ ගෑනු හිත හිනාවෙන්න ගත්තා. ඒත් ඇගේ ඇස්වලට කඳුළු පිරුණා. ඒ එක්කම ඇගේ ගෑනු හිත කථා කරන්න පටන් ගත්තා.

'ඒ කියන්නේ දැනටමත් ඔයා මාව අන්දවලා ඉවරයි. ඔයා ඔයාට වුවමනා කරන හැමදේම කරනවා මට නො තේරෙන්න.

ඒ අතර ඔයා හිතනවා මාත් එහෙම කරාවිද කියලා ඔයාට. ඒ නිසා දැන්ම ම ඔයාට ඕන වුණා ඒ ටික කියලා දාන්න. එතකොට මං ඔයාට ඒ දේවල් නොකර ඉඳියි කියලා ඔයා හිතන හින්දා.'

පිරිමි හිතක දැඩි බව, ආධිපත්‍යයට වඩා එහි ඇති අසරණ කම, තමන් කරන දේ තමන්ටම පඩිසන් දෙයි එහෙම නැත්නම් තමන්ට ම අත් විඳින්න වෙයි කියන පසුතැවිල්ල ඇය දුටුවා.

ඇයට දුක සිතුණා. ඒත් ඇගේ ගෑනු හිත ඇයට වැඩි වේලාවක් ඒ දුකෙහි කිමිදෙන්න ඉඩ දුන්නේ නෑ.

පරිසරය සිහිල් වෙමින් පැවතුණේ. කාමරයේ මහ හඬින් කැරකෙන විදුලි පංකාව නිසා නිහඬ බව දෙදරුම් කමින් තිබුණා.

කුටිය පුරා විහිදුණු මලානික ආලෝකය පරයමින් අඳුර ටිකෙන් ටික සිය ආධිපත්‍යය පතුරවමින් තිබුණා.

ඈ දිගු සුසුමක් හෙළලා අනෙක් අතට හැරුණා. ඇට ඉකි ගැසුණේ ඇය හීනෙකින්වත් නො හිතපු දෙයක් කරන්න ඇගේ හිත ඇයට බල කරමින් හිටිය හින්දා.

'ඔබ, ඔබ තුළ රෝපණය කර ගත් දෑ ඔස්සේ මා තුළ ගසක් වැඩේ.' සිහින් ගෙරවිල්ලක් සමගින් ඔහු තදින් නිදන හඬ ඇයට ඇසුණා. ඈ සිටියේ අවදියෙන්.

ජීවිතයේ පළමු වතාවට ඈ අවදි වූයේ මේ මොහොතේ දී යි. තමාට පිටු පා නිදන මේ මිනිසාත් තමාත් අතර පවතින්නේ කිනම් සබැඳියාවක් ද ? ඇය යළි යළිත් ඇගෙන් ප්‍රශ්න කරන්න ගත්තා.

කාර්යාලයේ ඔහු හා නිතර ගැවසෙන තරුණිය පිළිබඳ බොහෝ සිද්ධි කතාන්තර ගැන කනින් කොනින් ඇයට ආරංචි වූණත් ඇය ඒ පිළිබඳ ව ඒ තරම් තැකීමක් කළේ නැහැ. ඇයට ඊට වඩා හිතන්න කරන්න බොහෝ දෑ ඇගේ කුටුම්භය තුළ රොක් වී තිබුණා.

අනෙක් අතට ඈ ඔහු පිළිබඳ ව දැන හිටියේ අදක ඊයෙක සිට නො වේ. මේ සම්බන්ධය අවුරුදු ගණනාවක් පුරා නොකඩවා පැවතෙන්නක්. ඈ දැන සිටියා, ඔහුගේ ප්‍රේමයට ඇගේ පෙමට වඩා බරක් තිබෙන බව. ඔහුයි ඈ සොයා ආවේ. ඔහුටයි ඇගේ සෙනෙහස ඇවැසි වූයේ.

බොහෝ තරුණියන් ඔහුගේ රූපයට, කතාබහට, හිනාවට ලොල් බව ඈ අත්දැකීමෙන් ම දන්නවා. මේ තරුණියත් ඔහුගේ සමාගම ප්‍රියකරනු ඇතැයි ඈ සිතුවා.

ඔහුගේ සංලාපයට රුචි වී ඇතැයි ඈ අනුමාන කළා. ඊටත් එහා ඒ පිළිබඳ ව විපරම් කිරීමේ අනිසි සැකයකට ඇගේ හිතට එබෙන්න ඈ ඉඩ හැරියේ නෑ. ඈ ඔහු ව විශ්වාස කළා.

ඔවුනොවුන් අතර වූ ප්‍රේමයේ බැම්ම ඊට වඩා සවි ශක්තිමත් වග ඈ සිතුවා. මල් පත්තරයක ප්‍රේම කතාවකට වඩා බරක් ඇති ඔවුනොවුන්ගේ ප්‍රේමයට අභියෝග කරන්නට ඒ තරුණියගේ දාංගලේට හැකියාවක් නැතැයි ඈ විශ්වාස කළා.

'හැමදාම හැන්දෑවට ඒ කෙල්ල එක්කර ගෙනනේ යන්නේ.'

'කෙල්ල නම් කියන්නේ එයා නැතිව වතුර උගුරක්වත් ගිලෙන්නෙ නෑ කියලා'

'ඉතින් ?'

'මිනිහා කියන්නේ නම් අසරණ කෙල්ලෙක් හරියට දක්සකම් තියෙනවා. උත්සාහවන්තයි. මං එයාට උදව් කරනවා කියලා විතරයි. එයත් මගේ වැඩවලට උදව් කරනවා කියලා.'

'එතකොට වෙන කිසිම සම්බන්ධයක් නැද්ද?'

'කවුරු දන්නවද බං. යන එන මං නැතිව වේළි වේළි හිටපු කෙල්ලව උඩට උස්සන්න ගිහින් අපරාදේ නිකං සවුත්තු වෙනවා. ඔය එන්නේ ඩබලම මට නං හිරිකිතයි මචං'

ඔහු එනතුරු කාර්යාලයේ කොනක කල් මරමින් සිටි ඇයට මේ සංවාදය ඇසුණේ අහම්බෙන්. ඔහුත් ඒ තරුණිය පිළිබඳවත් ඔවුන් කළ කතාබහ ඈ අසා සිටියා. ඈ කවරෙක්දැයි ඔවුන් දැන සිටියේ නැහැ.

තමා කවුරුන්දැයි ඔවුන්ට අඟවන්නට ඈ උත්සාහ කළෙත් නෑ. ඈ කිසි දිනක ඔහු හමුවීමට ඔහුගේ කාර්යාලයට හෝ ගිහින් තිබුණේ නෑ.

ඒ ඔහුගේ රාජකාරියට තමාගේ පෞද්ගලික හමුව බාධාවක් යැයි ඈ සිතූ නිසා. මේ ගමන එන්නට ඈට සිදු වූණේ නොහිතපු විදියට. එය කිසිසේත් ම පූර්ව සූදානමකින් සිදු වූ දෙයක් නො වේ.

දින දෙකක් සඳහා යොදා ගත් ගමන එක් දිනකින් අවසන් වීම නිසා ඇයට සිදු වූණේ යළිත් නිවසට පැමිණීමට යි.

එහෙත් නිවසෙහි අමතර යතුර ඇයට අමතක වී තිබුණා. තමාගේ පැමිණීම ගැන සඳහන් කිරීමට කිහිප වාරයක් ඔහුගේ ජංගම දුරකථනය අමතන්නට ඈ උත්සාහ කළත් ඒ උත්සාහයන් සියල්ල ද ව්‍යර්ථ වී තිබුණා. කාර්යාලයට ඇමතූ මොහොතේ දී ද ඔහු කාර්ය බහුල වී ඇති බව දැනගත් හෙයින් නො දන්වා ම ඔහු හමුවීමට පැමිණ රාජකාරි අවසන් වන තෙක් රැඳී සිටින්නට ඈ තීරණය කළා.

ඒ තීරණය මේ සියල්ල කෙරෙහි යොමු කරනු ඇතැයි ඈ එක තත්පරයකට හෝ බලාපොරොත්තු වූණේ නැහැ.

ඔහු පැමිණියා. මුව අග රොද බඳින දඟකාර අකීකරු හිනාව ඈ හොඳහැටි ම අඳුනනවා. හදවත කිති කවන සතුටකට ඔහු හිමිකම් කී බවට ඒ හිනාව හොඳ ම සාක්ෂියක්.

ඔහු සමග වෙළී පැටලී එන තරුණිය ඈ මීට පෙර දැක තිබුණේ නෑ. ඈ බලා සිටියා. ජීවිතේ පළමු වතාවට එකිනෙකා හා සිතින්, කයින්, වචනයෙන් බැඳුණු ප්‍රේමවන්තයන් දෙදෙනෙක් දෙස බලා සිටින්නා සේ ඈ ඔවුන් දෙස බලා සිටියා.

සාම්ප්‍රදායික නාට්‍යයක පොතේ ගුරාගේ භූමිකාව රඟ පෑ තරුණයන් දෙදෙනා ඒ වනවිටත් එතැනින් නික්ම ගොස් තිබුණේ නෑ. ඒත් ඈ ඔහුත් තරුණියත් දෙස බලා උන්නේ ඔවුන්ගේ ඇසින් නෙමේ.

තමන්ගේ ම ඇසින්. ඒ හින්දාම ඒ බැඳීමේ දිග, පළල ඇයට තේරුම් ගන්න අමාරු වුණේ නෑ. තරුණිය ඔහුත් සමග තරුණයන් දෙදෙනා අතරින් ඇවිද ගියේ යටැසින් ඔවුන් දෙස බලමින් මහත් ආඩම්බරයෙන්. ඔවුන් තරුණියගේ බැල්ම මග ඇරියා. ඔහු මේ කිසිවක් දුටුවේ නෑ.

ඇත්තට ම කියනවා නම් ඔහුට මේ කිසිවක් දකින්නට වුවමනා වුණේ නෑ. ඔවුන් දෙදෙනා තමා අසලින් නික්ම යද්දී කුමක් කරන්නේදැයි එක තත්පරයකට ඇයට සිතා ගන්නට නොහැකි වුණා.

ඇය ඔවුන් අතරේ මහා බාධකයක් වෙමින් සිට ගත්තේ කලින් වූ සූදානමකින් නෙමේ. පුංචි කුරුලු කුඩුවට ආගන්තුකයෙක් ඇවිත්. කිරිල්ලි හිටියේ තවමත් පහව නො ගිය දැසේ කාන්තියෙන්, කිරිල්ලි අමුත්තව අඳුනන්නේ නැති හින්දා. කුරුල්ලට නං උතුර දකුණ මාරු වුණා. හුළං කෝඩෙට ප්‍රාර්ථනා මල් යාය ම ගහගෙන ගියා.

"ඔයා ?"

කිරිල්ලිගේ දැසේ හුරතලයට ඈ ආසා වුණා. ඒ හින්දා ඈ බලං හිටියේ ඒ දිහාමයි.

"ඇයි මොකද වුණේ ? ආපහු ආවේ ඇයි?"

ඒකපාර්ශ්වීය ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක්. ඈ මී පැටියෙක් පයින් පාග ගත්ත පූසෙක් වගේ. එක ගොදුරක් අතේ තියෙද්දීත් කුරුමානම් ඇල්ලුවේ අනිකට.

"මොකද මේ?"

ඔහුට ඇගේ මේ අමුතු හිනාවයි, බැල්මයි, නිහඬ බවයි ඔරොත්තු දුන්නෙ නෑ. කොහොමත් ඈ ඒ වගේමයි.

රණ්ඩු කෙක්කක්, කටු අත්තක් එක පාරට ම සාන්ත දාන්ත තීන්ත කුප්පියක් වෙලා. ඒක හොඳකට නං නෙමෙයි. ඔහු වටපිට බැලුවේ තමං ඉන්න තැන මතක් වෙච්ච හින්දා.

පොතේ ගුරාලා තාමත් ඉන්නවා. ඔහු ඔවුන් ගැන හරියට දන්නේ නෑ. කොහොමත් වැඩිය පොඩි කට්ටියත් එක්ක ආශ්‍රයක් නැනේ. කොහොමින් කොහොම හරි උඩට යන්න හදන අය එක්ක මිසක්.

තාමත් කිරිල්ලි හිටියෙ තොදොලින් "අනේ අපි ඉක්මනට යං" කියන්න වගේ කට උල් කර කර, ඇස් කරකව කරකව, පාට කරපු කොණ්ඩෙ හද හදා.

ඇත් මුකුත් ම කියන්නෙ නැතිව ඒ අංගචලන, අංග විපර්යාස නරඹමින් හිටියෙ අලුත් ම අලුත් ටෙලි නාට්‍යයක් බලනවා වගේ කුතුහලෙන්. ඔහුට තරහ ගියේ ඇගේ ඒ බැලිල්ලට. ඒක එච්චර ඇඟට ගුණ එකක් නෙමේ. කොයිතරං සීතල කරලා තිබ්බත් දාඩිය දාන්න අරන්.

"අපි යං" කියලා ඈ එකපාරට ම ඔහුගෙ අතින් අල්ල ගත්තා. කිරිල්ලිට හිතාගන්නවත් බැරි වුණා. තමන්ගේ මී අඹ ගෙඩියට ම තවත් එකියක් හොට දාලා. කොහොම ඉවසන්නද? කිරිල්ලි ප්‍රශ්න අහන්න කලිං ඔහු උත්තර දුන්නා.

"ඔයා යන්න අරෝෂා. අපි මේ වැඩ ටික හෙට ම කරමු."

"අ රෝ ෂා. ලස්සන නම අනේ" ඈ ඇදලා පැදලා තාලෙට කීවා.

කිරිල්ලි කට උල් කළත් ඔහුගේ ඇස් දෙකේ තර්ජනේට බය වුණා. පොතේ ගුරාලා හීනියට ඇස් කොණින් හිනා වෙලා බලං හිටියා. කිරිල්ලිට වැඩියෙන් ම තරහ ඒ අය ඉස්සරහ සවුත්තු වෙන්න සිද්ද වෙච්ච එකට. 'මේකි කවද්ද මගේ මී අඹේට හොට දාන්න පටන් ගත්තෙ මං දන්නෙවත් නැති ව.' කිරිල්ලිගේ හිතේ වැල නොකැඩී පෙම් කරමින් ප්‍රශ්න ගොඩ ගැහෙන්න ගත්තා.

"ඇයි ආපහු ආවේ මාලතී" ඔහුටත් ඇගේ නම කියන්න ඕන වුණේ ඒ වෙලේ. ඇගේ නම ඇහුණු ගමන් ම අරෝෂාගේ කටේ කෙළ හිඳුණා. ඇස් රතු වුණා. ඈ හිනා වුණේ බය පක්ෂපාතකමින්. මුලින් තිබ්බ්ච කෝල කොමල මුහුණ වෙස් මුහුණක් වෙලා.

"යන්නං සර්" ඈ ගොත ගගහ යන්න ගියා.

ඔහුත් ඉස්සර වුණා. එතැන රොක් වෙලා හිටපු අයගේ වචන අමුනගෙන ආපු හී සැරයක් ඔහුගේ හිත පසාරු කළා.

"පව් අප්පා ගැනිට මාට්ටු වෙලා වගේ."

ඔහු ගියේ කේන්තියෙන්. ඈ හිටියේ කසාදෙ දවසේ ඔහුගේ අතින් අල්ලන් රතු පලසේ ඇවිදලා යනවා වගේ බැල්මක් ඇස් කොනේ රන්දගෙන අභිමානයෙන්.

ඔහුට ඕන වුණේ ඇයට හොඳටම බැන වදින්න. ඒත් බනින්න හේතුවෙන දෙයක් හොයා ගන්න පුළුවන් වුණේ නෑ. මොනව කියන්නද? ඇයි ආවේ අහන්නද? ඔයා බොරුවට සැක කරා කියන්නද? හැසිරුණු විදිය වැරදියි කියන්නද? මගේ ආත්ම ගෞරවේ කෑවා කියන්නද? කියන්න කිසිම දෙයක් නෑ.

ඒත් කේන්තිය ඔහුගේ හිත පුරා විදුලි කෙටුවේ පුංචි දේටත් වචනවලින් මේස ගර්ජනා කරමින්.

ඈ නම් හිටියේ සම්පූර්ණයෙන් ම වෙනස් වෙලා. ඈ කතා කරන හැම වචනෙකදි ම අරෝෂා වගේ කට උල් කරන්න ගත්තා. කොණ්ඩෙ හදන්න ගත්තා. ඇස් කරකවන්න ගත්තා. තොදොල් වෙන්න ගත්තා. හුරතල් වෙන්න ගත්තා. ඇගේ දැවටෙන්න ගත්තා. ඒත් ඒ එකක්වත් ඔහුට රිස්සුවේ නෑ.

"මේ මොන කෝලමක් ද මාලතී? ඔයා පොඩි කෙල්ලෙක් නෙමෙයිනේ. කසාද බැන්ද ගැනියෙක් නේ. මිනිස්සුත් බලනවා නේ"

ඈ වචන පාවිච්චි කළේ පරෙස්සමට. කිරලා මැනලා ගැනලා බලලා.

"මං හිතුවෙ ඔයා මේ විදියට ආස ඇති කියලා." ඔහුට ඕන වුණේ කොහොමින් කොහොම හරි වැරැද්ද ඇගේ පිටින් තියලා හොඳ මිනිහා වෙන්න.

"ඇයි කවද්ද මං කිව්වෙ මං ඔය විකාරවලට ආසයි කියලා" බළලා මල්ලෙන් පනින කං ඔහුට ඉවසීමක් නෑ. ඈ මල්ලෙ කට තදින් වැහුවා.

"ඔයා කියන්නේ ඒවා විකාර කියලද? මං නං ඒවාට ආසයි. ඔයා කිව්ව වගේ මටත් මං කසාද බැන්ද කියලා අමතක වෙනවා. මිනිස්සු බලන්නේ එයාලටත් ඒක අමතක වෙන හින්දා වෙන්නැති."

ආයෙම සැරයක් ඔහුගේ හිත පුපුරු ගහන්න ගත්තා.

"මේ, මට නං දැන් ඔයත් එක්ක පාරේ බැහැලා යන්නත් ලැජ්ජයි. හැම දේකම සීමාවක් තියෙනවා''

"මට තේරෙනවා අසන්ත මං ඔයාට ලැජ්ජ වෙන දෙයක් කරන්නේ නෑ."

එහෙම කිව්ව ඈ ඊට පස්සේ අරෝෂා වගේ අඳින්න පලඳින්න ගත්තා. හැමෝම පුදුම වුණා.

ඔහු නම් දැනගෙන හිටියා රහස් පොලීසිය වට කරලා ඉවරයි කියලා. අහන අහන හැමෝටම ඈ කිව්වේ "කසාද බැන්දට පස්සේ එක ම විදිහට දකින කොට ගෙදර මිනිහට වුණත් තමන්ව එපා වෙනවා" කියලා. හැබැයි ඒක එයාගේ අදහසක් නෙමේ. ටීවී එකේ මොකක්ද වැඩසටහනක ප්‍රසිද්ධ නිළියෙකුයි රූපලාවණ්‍ය ශිල්පියෙකුයි දෙන්නෙක් ම එහෙම කියලා තියෙන නිසා ඈ ඒ විදිහට වැඩ කරන්න හිතාගත්ත" කියලත් ඈ කිව්වා. ඒකට දෙන්න ඔහුට උත්තරයක් තිබ්බෙ නෑ.

ඒත් ඇගේ මේ වෙනස්වීමට ඔරොත්තු දෙන්න නම් ඔහුට ටිකක් අමාරු වුණා. ඇගේ වියදම දැන් එන්න එන්නම වැඩියි. ඒවට ඇටත් තියෙනවා එක එක හේතු. ජිම් කියයි, සැලොන් කියයි, ෂොපින් කියයි නානප්‍රකාර ගමන් බිමන්.

ඒවට මදි පාඩු වෙන සල්ලි ගන්න ඔහුගෙ කාර්යාලයටත් නිතර නිතර යන්න එන්න ඇට සිද්ද වුණා. ඉස්සර ඔය මොකක්හරි ඇඳගෙන පාඩුවෙ වැඩක් කරගෙන හිටිය ඈ දිහා නො බලපු මිනිස්සුත් දැන් බලන්න අරන්.

"අසන්ත උඹේ වයිෆ් දැන් හරි වෙනස්නෙ"

"වෙනස් කියන්නේ"

"නෑ දැන් හරි පොෂ් වෙලා නේ. හොඳයි හොඳයි."

වෙනදට කිරිල්ලි වෙනුවෙන් කරපු වියදම් එක එක කපා දාන්න වෙලා ඔහුට. මාලතීගේ විදිහ තේරුම් ගන්නත් බෑ. ඊළඟට අල්ලන අඩව්ව මොකක්ද කියලා නැටුම නටනකම්ම දන්නේ නෑ.

කිරිල්ලි හිටියෙත් බයෙන්. විශේෂයෙන් ඈ කාර්යාලයට ඇවිත් යන හැම වෙලේ ම අරෝෂා දිහා බලන බැලිල්ල තේරුම් ගන්න ඔවුන් දෙන්නටම බැරි වුණා.

ඇත්තටම ඔහු හිටියේ අමාරුවෙන් දැක්ක හීනෙට තුරුලු වෙන්නේ කොහොමද කියලා බල බල. ඈ හිටියේ ඒ හීනෙන් ඇහැරෙන්නේ කොහොමද කියලා හිත හිත. කිරිල්ලිට අයිතිකාරයෙක් ඉන්න විත්තිය ඈ දැනගත්තේ අහම්බෙන්.

අරෝෂා දෙන්නව ම එක නැටිටෙ දෙහි ගානට තියං හිටියෙ. අයිතිකාරයා අසන්ත ගැන දැනගෙන හිටියෙ නෑ. ඈ ගානට, නූලට ඒ කතාව අයිතිකාරයාගෙන් වැහුවා.

අසන්ත දැනගෙන හිටියෙ මේ අහිංසක හුරතල් කෙල්ලට එයාගේ අයිතිකාරයා දුක් දෙනවා, සලකන්නේ නෑ කියලා විතරයි. අරෝෂා නං හිටියේ දෙන්නගෙන් ම වැඩි කොටස එයාගේ පංගුවට බෙදාගෙන.

හදිසියේ ම අරෝෂාට ඔස්ට්‍රේලියාවට යන්න ශිෂ්‍යත්වයක් හම්බ වුණා. හැමෝම දැනන් හිටියා ඒ ශිෂ්‍යත්වෙ ප්‍රදානය කරපු තැනැත්තාගේ වංශං. එතින් ගමං නවසීලන්තෙන් කිරිත් අරගෙන එනවා කියලා අරෝෂා කාර්යාලේ හැමෝටම කිව්වා.

කිරිල්ලි නැති දුක වාවගන්න පුළුවන් කමක් ඔහුට තිබුණෙ නෑ.

හැමදාම රෑට මාලතීට හොරෙන් ලෝක සිතියම දිග ඇරගෙන ලංකාවෙ ඉඳන් ඔස්ට්‍රේලියාවට තියෙන දුර ඔහු අඩිකෝදුවෙන් මැන්නා. ඔහුගේ ලොක්කෝ ටික ඔහුට ඔස්ට්‍රේලියාවයි, නවසීලන්තෙයි වැඳ පුදාගන්න සංචාරයක් ලෑස්ති කරලා දීලා කියලා ඔහු කිව්වත් ඒ වැඩේ දුර මැනිල්ලේ දුක වැඩිවෙලා ඔහු ම හදාගත්ත එකක් බව ඈ දැන ගත්තා.

ඈ හිටියේ යන යකාට කොරහත් බිඳගෙන යන්න දෙනවද කොරහ අරන් යන්න දෙනවද කියලා හිත හිතා. ඒ තරමට ම ඔහු සිල්පද පහෙන් තුනයි, හතරයි, පහයි බිඳගෙන තිබුණේ.

අන්තිමට ඈ ඔහුට යන්න දුන්නා. කොහොමටත් මේ කාලේ සාන්තුවරයෝ හිඟ හින්දා තමන් ව දාලා ගියත් දන්න යකා එක්ක ම ඉන්නවා කියලයි ඈ මුලින් හිතුවේ.

යකාටත් සිද්ද වෙන්නේ ඒ සන්තෑසිය ම බව ඈ දන්නවා. ඒත් කොයිතරම් හොඳින් දැනගෙන හිටියත් යකෙක් එක්ක මොන ජීවිතයක් ද?

තමන්ගෙ ම ජීවිතේ කිතු කිතු කර ගන්නේ මොකට ද කියලා කල්පනා කරපු ඈ ඔහු ගියාට පස්සේ හොඳට අගුලු දාලා ගෙයි දොර වැහුවා.

දින දෙකක් සඳහා යොදා ගත් ගමන එක් දිනකින් අවසන් වීම නිසා ඇයට සිදු වුණේ යළිත් නිවසට පැමිණීමට යි. එහෙත් නිවසෙහි අමතර යතුර ඇයට අමතක වී තිබුණා. තමාගේ පැමිණීම ගැන සඳහන් කිරීමට කිහිප වාරයක් ඔහුගේ ජංගම දුරකථනය අමතන්නට ඈ උත්සාහ කළත් ඒ උත්සාහයන් සියල්ල ද ව්‍යර්ථ වී තිබුණා. කාර්යාලයට ඇමතූ මොහොතේ දී ද ඔහු කාර්ය බහුල වී ඇති බව දැනගත් හෙයින් නො දන්වා ම ඔහු හමුවීමට පැමිණ රාජකාරී අවසන් වන තෙක් රැඳී සිටින්නට ඈ තීරණය කළා.

පිරිමි හිතක දැඩි බව, ආධිපත්‍යයට වඩා එහි ඇති අසරණ කම, තමන් කරන දේ තමන්ටම පඩිසන් දෙයි එහෙම නැත්නම් තමන්ට ම අත් විඳින්න වෙයි කියන පසුතැවිල්ල ඇය දුටුවා. ඇයට දුක සිතුණා. ඒත් ඇගේ ගෑනු හිත ඇයට වැඩි වේලාවක් ඒ දුකෙහි කිමිදෙන්න ඉඩ දුන්නේ නෑ. පරිසරය සිහිල් වෙමින් පැවතුණේ. කාමරයේ මහ හඬින් කැරකෙන විදුලි පංකාව නිසා නිහඬ බව දෙදරුම් කමින් තිබුණා. කුටිය පුරා විහිදුණු මලානික ආලෝකය පරයමින් අඳුර ටිකෙන් ටික සිය ආධිපත්‍යය පතුරවමින් තිබුණා.

ඔහු ගියේ කේන්තියෙන්. ඈ හිටියේ කසාදෙ දවසේ ඔහුගේ අතින් අල්ලන් රතු පලසේ ඇවිදලා යනවා වගේ බැල්මක් ඇස් කොනේ රන්දගෙන අභිමානයෙන්. ඔහුට ඕන වුණේ ඇයට හොඳටම බැණ වදින්න. ඒත් බණින්න හේතුවෙන දෙයක් හොයා ගන්න පුළුවන් වුණේ නෑ. මොනව කියන්නද? ඇයි ආවේ අහන්නද? ඔයා බොරුවට සැක කරා කියන්නද? හැසිරුණු විදිය වැරදියි කියන්නද? මගේ ආත්ම ගෞරවේ කෑවා කියන්නද?

පරපුටුවෝ

නොපැතූ නොසිතූ අයුරින්
සුළං කෝඩයට අසුවුණ
පරපුටු කුලයේ උපන්න
අවිහිංසක කුමරුවාන
සතර දිගන්තය බැලුවට

පිහිටක් සරණක් සොයාන
කවුරුන් නම් ඒද සබඳ
සත් සමුදුර පසුකරාන
පරපුටු මව නොදැන නොදැක
කපුටු කැදැල්ලක බිජුලා
බීජු බර නිදහස් කරාන

කොයි අත ඉගිළී ගියාද
සොහොයුරු බැම්මෙන් බැඳිලා
කපුටු රැලේ හැදුණු වැඩුණු
පරපුටුවා කෙමෙන් කෙමෙන්
බහ තෝරන්නට වුණාය
තමාද කපුටෙකැයි සිතා

කපුටු නාද දෙන අටියෙන්
නැගූ හඬින් පසක් වීය
කෙනෙකුන් බව කෝකිලාන
පෙරදා සෙනෙහසින් බැඳී
එක රැනේ හැදුණු වැඩුණු

කපුටු රැන අද වෙර බැඳ
නුඹ නසන්ට ලුහු බඳින්නෙ
මනසින් සිරුරින් සිරකර
දස වද දෙන මර බිය ශෝකය
තනිකම වැනි යගදා වලින් මිදී

නුඹ සැනසුම ලැබ ගනිවි
නුඹව රැනෙන් පන්නාලා
නුඹ නහන්ට තැත් කෙරුවේ
වෙනත් රැහැක උපන් හින්දා
පුදුම වෙන්ඩ දෙයක් නැතේ

● **ගුණසිරි කොඩිතුවක්කු**

සඳ නාපු දවසක

සඳ අයිති අහසට
කීවා නුඹ හුගක් ඉස්සර
ඒක මට අද දැනුනේ නැතිවද
පෙම් කළේ මං සඳට එච්චර...

සඳ නාපු දවසක
තැවුණා මං පුදුම විදියට
ඒ නපුරු හීනය ට
ආස නැ මං සඳේ දෙවුදුව...

පෙම් කඳුළු ඇස් ඉවුරේ
තවත් මං හඬන්න ද
මං කඳුළු පුරන කොට
සඳත් අහස ට අහිමි වේවිද...

● **නිශාන්ත දසනායක**

තාත්තා..

තුම් පොදි
එකින් එක ඉටු කර ගන්නට
ඔබ වින්ද දුක් ගැහැට
ළා දලු තුරු පත්

වැඩුණු තුරු හිස්
බවට පත් කරන්නට
ඔබ ඇදි දර දිය
ලේ කිරි කර නොදුන්නාට

සියලු සැප සම්පත් ලබාදෙන්නට
ඔබ හෙළු ඩා බිඳු
අමතක නොවේ සදහටම

● **නයන්ත ජගත් පුංචිහේවා**

පුන්සඳ හා රාත්‍රිය

නිලඹර හැඩ කරමින
වලාරොදට නෙක සේල දෙමින
අඳුර දුරලා ගංදිය මතින
හිනහේ පුන්සඳ හද තුටින...

ගංදැල තුරු පෙළ අවදිව
මිං රල ගංතෙර දියකෙළින
සඳරැස් රන්කෙඳි සේ දිලෙන
ගංදිය සතුටින රැය නිදිවරන...

මඳ පවන සීතල පිනිබිඳුගෙන
කෙකටිය කැකුළු මත තෙමන
තිත්ත පැටවු නෙලුම්පත් යට සැඟව
ගුවනේ සැඟවුණ තරු සොයන...

සඳකිරණ ගංදිය කිමිද
ගංපතුලේ අසිරිය දැක තුටින
කැදලි මත සියොත් පැටවුන් හා නිදන
පුන්සඳ නැළවිලි ගයමින් නළලත සිඹින...

● **සමන් අතුල කුමාර**

අපට ජීවිතය දුන් අම්මෙ ඔබ බුදුවන්න!

දුක දැනුන හැම මොහොතෙ - මම ආවෙ ඔබ ළඟට
ඉකිගසන හදවතට - ඔබෙන් ලැබුණා සිසිල
මවු සෙනේ මේ තරම් - ගැඹුරුයිද කියා මට
කියල දුන්නේ නුඹයි - ආදරෙයි මං තාම

ලෝකයම සෙලවුණත් - නොසෙල් වී සිටි අම්ම
අපව අල්ලා තදින් - වැලඳ ගත්තා සෙමින්
මොන තරම් හිත් රිදුම් - ළය පසුරු කර ගියත්
අත හැරියෙ නැහැ අපව - රන් වැටක් වූ ලෙසින්

දුක සතුට හැමදාම - එක ලෙසම දරාගෙන
කඳුළු බිඳු හොර රහසෙ - අතින් පිස දමා ඔබ
මහ මෙරක් තරමටම - දරු සෙනේ පුරෝගෙන
ලෝකයක් දකින්නට - හිරු එළිය වුණා නුඹ

අතීතය පෙම්බරයි - ඔබේ සෙනෙහස ගාව
පුදසුනයි බුදු පුදට - මල් තියා නමදින්න
දෙවිවරුන් කොතෙක් නම් - සිටියි ලොව පහළ වුණ
අපෙ අම්ම වගෙ කෙනෙක් - හමුවුණෙ නැහැ තාම

එක මලක් නොවෙයි නුඹ - සුවඳ වූ මල් විලෙක
පෙති හැලී මියෙන්නැති - හද පතුලෙ ගොමුවකී
ජීවිතය පුරාවට - එන සුවඳ මිහිරකී
ඒ සුවඳ දැනෙන විට - ඔබේ වත මා දකී

අම්මගේ සෙනෙහසේ - දිග පළල සොයන්නට
දරුවන්ට හැකිවෙයිද - එහි මිම්ම මනින්නට
ඉමක් නැති කොනක් නැති - සිතිජයක් වගෙයි එය
අපට ජීවිතය දුන් - අම්මෙ ඔබ බුදුවන්න!

● **රමණී ප්‍රේමතිලක බෝගොඩ**

නිහඬ වලප

උසාවිය හැමදාම නිහඬය
තරාදිය පැත්තකට බර විය
මලානික සුදු මැළි පොරොගෙන
මැයි ගසක් විය පාර කෙළවර

ළමුන් අතැතිව රජුන් හැර ගිය
බිසොවරු බන්කුවක් මත හිද
ඉඩකඩම් මිල මුදල් ගැන තව
නඩු අසයි පණ හෙමින් ඇද ඇද

ලේ විලක් මැද හුස්ම අදිනා
අබිරහස් එක දෙක හොයන කල
බුදුන් දෙසු දම් සුලගෙ ගුලිකර
පා කරයි දෙව්දත්තලා අද

කොළපාට රෙද්දක් පොරොගෙන
රතු පාට මැයි මල් වඩාගෙන
නඩු අසන්නැති තවත් ලොවකට
යන්න මැයි ගස හිතයි හැම දින

● **නජිලා අධිකාරී**

පසුවදන...

ඉර නම් ගියා මේෂ රාශියට
අරඹන්න පුරුදු මගෙහිම
අලුත් ගමනක්...
දාගෙන අපිට සැලියුට.

ඒත් අපි...?
පුරුදු විදිහට සැමරුම..
පසුව හෙම්හිට විඳවුම
තැන තැන ණය පොලී ගෙවුම...

දැන දැනම වී අසමත්.
අලුත් ඇසකින් බැලුවොත්
දැකිය හැකි අලුත් මාවත්
කොවුලිදු නොගැයූ ගී පද...

ගයනු හැකිය ඉදින් ඔබටත්.
දොස් නොකිය කොවුලන්ට
තනා දෙමු කූඩු උන්ටත්
එරබදු දකින්නට. පොතකින්
පොඩිවුන්ට නොතියා ඉඩක්...

● **ඒ.ඒ. බදුර්නිශා**

මුහුණු පොතෙන් කවියක්

මට මා

එක්තරා හැන්දැවක
හදිසියේම මට
මා හමුවිය
ඒ හරියටම ඔබ
මා අත්හල දාට පසුදිනය

● **චම්පා කුමාරි දිසානායක**

හැකි නම්, ඔබ මිනිසෙකි

හද පිරිමැදි වදන් සුළඟේ යවා
දෙකොපුල් විඳි පහස් පිසදා දමා
පිටු පෑ පෙම්වතියට, පෙම්වතාට
කවියකින්, ගීතයකින්
සුබ පතනු හැකි නම් ඔබට...

දෙකනින් අසා, දෙනෙතින් දැක
පසක් කළ පසු රහස් බැඳුමක්
බිරිඳගේ හෝ සැමියාගේ සුරත
තබා ඒ තෙවැනි සුරත මත
හිනැහෙනු හැකි නම් ඔබ...

ඔබ පියඹ හෝ සැමි මතු නොව
ලෝ නොදත් කිරිදරුවන් වුව
හැඹුවද ක්ෂුධාගිනි උසුලනු බැරිව
සොරකමින් එගිනි නිවන සිත
දමනය කරනු හැකි නම් ඔබට...

සියල් ගත සවි, සුව වියැකී
ප්‍රියයන්ට, ලොවට බර ගිලනකු වී
පැවරී ඇතොත් යන්ත්‍රයකට ඔබේ ප්‍රාණය
මුදවන ලෙස එයින් ඔබේ ආත්මය
ඉල්ලනු හැකි නම් ඔබට...

● **දේ . වි . ගාල්ලගේ**

අභිනික්මන් කළ පුතණුවනේ

ගෝර සසර දුක නුවණින් පිරිසිඳ
අභිනික්මන් කළ පුතණුවනේ
කුසෙන් නොවැදුවත් ටික කලකට හෝ
අපේම පුතුවූ පුතණුවනේ...

පෙර කළ පවකට මෙදා වැරදුණත්
නිවන් දකින තුරු එසේ නොවනු ඇත
ගිනිගෙන දැවෙනා මේ බව කතරේ
සිදුහත් කුමරුන් ගිය මඟ ගත් පුත...

ගෞතම බුදු සසුනට පායා ආ
පහන් තරුව වී මතු දිනයකදී
සදහම් සිසිලෙන් තෙමා තෙමා
ලොව සනසනු මැන බෝසත් පුතුනේ...

නිවනෙහි දොර හැර නිවන් දකින දා
ඒ දම් සිසිලෙන් ලොව සනසන දා
නකුල පිතා මවමෙන් අපි එන්නම්
ඔබෙන් බණ අසා නිවන් දකින්නට...

එතෙක් පුතේ ඔබ යන මග සුවඳ සඳුන් මල් පිපෙන්න
ඒ මල්වල පියලි මතින් සාධු හඬින් වඩම වන්න
හිතේ දුකට ලීවත් කවි නොපතමි බව දුක විඳින්න
ගෞතම බුදු සසුනෙදීම පතමු සසර බැමි සිඳින්න

● **කුසුමි ඒකනායක**

කාලයක දුර

තිබුණු දිය මතුපිට
ළා කොළපාට
පොහොට්ටුවක්
හිත ගියා ඇතට...
ඇතට...

ආපසු බලන විට
සුදුම සුදු නෙළුමකි
මම තවමත් එතැනමයි

● **ආනන්ද විජේතිලක**

කවි මිණි සිළු දිලෙන දිනය

සඳු - රිවි බලය ගෙන දෙවියන් මවන පද
මුදු ගති ළයට දෙන කවියකි ලබන පුද
බිඳු - බිඳු පෙරෙන වීරු කුලෙක මිහිර ඇද
පුදුමද කිවිහු බැබැළෙනු කවි දිනයෙ අද

සහ පිරිවරින් දියතෙහි කිවිරැඳුනු බිම
වහරති කවක රුවගුණ එය හැඳුණු කම
දහ අත කෙහෙළි නැගෙතත් රස පිරුණ ලැම
මහ කිවිඳාය බුදු හිමි ලොව අසම සම

රුව ගුණ කවක ගැඹරෙහි රැඳි මිනිසාට
පව පින අතැ'ඹුලෙකි එය පවසනු කාට!
අවසන් මිනිස් පුළුටක වියැකී පාට
ලොව අළු ගොඩක් වෙයි කිවිරස නැති දාට

දිවිමත එළිය දෙන පහනකි අඳුරු කලේ
කිවි බස අකාලික දහමෙකි ගඳ'ඹ කුලේ
පිවිතිරි පැතුම සුවියත් පද වැලක ඇලේ
කවියක තිබේ මවුකිරි කළහතක බලේ

● **ධර්ම ශ්‍රී මද්දුමගේ**

සමාවන්න

මවුපස කරට ගෙන පියපස ඉවත හෙළා
මා මගෙ හිතට එදවස සිට පුරුදු කළා
පරතෙර දකින මොහොතක අද සකල කළා
කඳුළැලි පිස ගනිමි ගේ මුල්ලකට වෙලා

එදවස නොදුටු පියතුම සතු මහ ගුණය
අද මම දකිමි එහි ගුණ කඳ අපමණ ය
ඇති නොවුණි නම් ඔබ හදවත තෙත මන ය
එහෙනම් තාත්තෙ මා ලොව අරසණ ය

පීරා වනය ඔසු සපයාගෙන පැලට
කට යුතු කළා ඔබ පියතුම නිසි කලට
අද ඒ ගුණය අරගෙන හදවත තුළට
කවි මල් පුදමි ඔබ සැඟවී ඇති වළට

ඔබ ඉදිරියේ මා කෙරුවත් පසු බැම
මට දොස් කියනවා ඉල් මස සඳ තාම
අපටත් උරුම නම් අවසන් නිදි යැම
සඳහම තමා මේ සසරේ සැනසීම

සැපගෙන දුන්න මට මගෙ දුක ඇත්කොට
නිරතුරු සිහි කරමි එය හිස පාත්කොට
පහනක් දල්වමින් පියපස ආත්මෙට
ඉල්ලමි සමා වැඳ මගෙ බුදු තාත්තට

● **සූරිය මැදගෙදර**

විදෙස් කවිය

නීග්‍රෝ යුවතියක්

පරණ කඩදාසියකින් ඔතන
මෙරිගෝල්ඩ් මල් පොකුරක්
නග්න වූ හිසට ඉහළින්
කෙළින් ඔසවා ගෙන
යන්නීය ඇය ඉදිරියට
තරබාරු කලවා යුග්මය
මන්දගාමී කරවයි ඇගේ ගමන
මඟ දෙපස පිහිටි
නෙක විසිතුරෙන් පිරුණු
සල්පිල් පසු කරමින්
යන්නීය ඇය ...

කවුද ඇය
පැහැයන් දෙකකින් පිපුණු
සොඳුරු මෙරිගෝල්ඩ් මල් අතුල
වෙනත් ලොවකින් පැමිණි
තානාපතිනියකි ඇය
හිමිදිරි උදෑසන
මෙරිගෝල්ඩ් මල් පොකුරක්
ඉහළට ඔසවා ගෙන
වීදිය දිගේ පා නගයි ඇය
දන්වමින් වර්ණ වල වෙනස

William Carlos William විසින් රචිත
A Negro Woman පද්‍යයේ ඡායානුවාදය

William Carlos William (1883 - 1963)

වර්ෂ 1883 සැප්තැම්බර් 17 දින ඇමෙරිකාවේ නිව් ජර්සි ප්‍රාන්තයේ රදර්ෆර්ඩ් වල උපත ලැබූ විලියම් කාලෝස් විලියම් මවු පාර්ශ්වයෙන් කැරිබියානු සංස්කෘතියකට උරුම කම් කීවේය.
ඔහුගේ පළමු භාෂාව වූයේ ස්පාඤ්ඤ භාෂාවයි. ඉංග්‍රීසි බසින් ලේඛන කටයුතු ආරම්භ කළ ඔහු කල්පිතවාදී නූතන ඇමෙරිකානු කවියෙකු ලෙස සැලකේ.
කාව්‍ය රචනයට අමතරව කෙටිකතා, නවකතා, නාට්‍ය ආදියද ඔහු විසින් රචනා කර ඇත.
වෘත්තියෙන් වෛද්‍යවරයෙකු වූ ඔහු A Negro Woman නම් වූ මෙම පද්‍ය පන්තිය හරහා ඇමෙරිකානු සමාජයේ පැවතුණු වර්ණභේදවාදය සහ දරිද්‍රතාවය පිළිබඳව මතවාදී අරගලයක් ඉදිරිපත් කරයි.

● **සුසන්ත ජයනාල් පෙරේරා**

සතියේ කවිපොත

කෘතියේ නම -
සකද මලයි බබළු වැලයි
කර්තෘ -
පියුමි ජයකලණි වික්‍රම ආරච්චි
මිල රුපියල් 250 පිටු 76
piyumijayakalani@gmail.com
සදීපා ප්‍රකාශනයකි

පියුමි ජයකලණි වික්‍රම ආරච්චි විසින් ලියන ලද සකද මලයි බබළු වැලයි කාව්‍ය සංග්‍රහයයි. මෙය ඇගේ පළමු කාව්‍ය සංග්‍රහයයි.

පුවත්පත් කවි පිටු අතරින් ඇගේ කවි රචනා බොහොමයක් රසවිඳීමට අපට හැකියාව ලැබුණු අතර දැන් දැන් ඇගේ නව නිර්මාණ මුහුණු පොත හරහා ද රසවිඳීමට ලැබේ. සමාජය තුළ විවිධ සංස්කෘතීන් ඇත. ඒ අනුව ඒ සමාජය තුළ භාවිතා වන භාෂාව ද විටෙක වෙනස් වේ. ඇතැම් විට අතීතයේ අප භාවිතා කළ වචන දැන් පරම්පරාව භාවිතා කරන්නේ වෙනත් අරුතකි. ඇතැම් විට ඒ වචන එකිනෙකාට අපහාසයක් උපහාසදයක් හෝ උසුළු විසුළුවලට ලක්කරන්නේ දැයි යන කුකුසක් ද සිත උපදී. අද සමාජය තුළ ගැහැනිය හඳුන්වන්නට බොහෝ වචන ඇත. ඇය හඳුන්වා දීමට ගෞරවාන්විත වචන ද ඇත . ඒ අතර ඇතැමුන් කැල්ල, බඩුව, ආදි ලෙස ද ඇය හඳුන්වයි. එහෙත් අද සමාජයේ "බඩුව" යන වචනය කියූ විට හිතේ විවිධ ගැහැනු චරිත හිතේ මැවේ. එහෙත් "බඩුව " යන වචනයට ඊට වඩා ගෞරවාන්විත තැනක් ඇත. කිවිඳිය මේ පැහැදිලි කරන්නේ එයයි.

පියුමි ජයකලණි

මාතෘකාව බඩුව
නිමිත්ත: අංගම් ශිල්පය ප්‍රශස්ත ලෙස ප්‍රගුණ කිරීමෙන් අනතුරුව එම ශිල්පයේ කෙළ පැමිණ පෙළහර පානා ස්ත්‍රීන් වෙත පුද කරනු ලැබූ ගෞරව නාමය 'බඩුව' නම් වේ.

උකුසු ඇස් සහ මොනර කන් ඇති
වඳුරු පිමි සහ කොටි ගමන් ඇති
වළ ගැහෙන කම්මුල් දෙකක් ඇති
ඈ තමයි ගමේ බඩුව 'චින්තනී'...

ඇල්ල ළඟ ඇති පාළු ගල උඩ
යෝග වඩනා ඇයව සොයමින
කොළඹ දේසෙන් මත්තුරු විත්
ඇසුවා මාගෙන ඇයගෙ සංසිඩි...

සියලු විස්තර අසන් සිටි අය
ඇයව නොදැකම යන්න යන විට
ආ පයින් ඇයි යන්න හැරුණේ
ඇසුවා හේතුව කරන් සෝදිසි...

බඩුව නම් ඇය අපට නොහොබියි
කියද්දි උන් සිනා බිඳගෙන
ඇගේ ගෞරව නාමෙ අංගම්
'බඩුව' බව මම කීවෙ සන්සුනි...

මහත්තුරු ටික හැරි ආයෙත්
සමාවත් ගෙන අනේ මාගෙන්
ගියේ ඇළ ගල් පොත්තේ හිඳිනා
දැක ගන්න අපෙ'බඩුව ' චින්තනි...

පියුමිගේ භාෂාව අපූරුය. ඇය කවියෙන් කවිය කවි නිමිත්තට ගැළපෙන අයුරින් භාෂාව භාවිතා කර ගනී. ඇය සමාජය දෙස බලන්නේ සානුකම්පිතවය.

කිවිඳිය විසින් ලියූ මේ කවිය අවසානයේ හිත නැගෙන්නේ සංවේගයකි. මරදානේ ජීවත් වන ගැහැනියක වන 'ඩොටියා' කිසිසේත්ම අහිංසක ගැහැනියක නොවේ. ඇය ජීවත් වන්නේ මත්ද්‍රව්‍ය විකිණිමෙනි. ඇය පොලිසියට හසුවේ. කුදලාගෙන ගෙන යන්නට හදන විට ඇය විමසන්නේ ඇගේ ආබාධිත දරුවා බලාගන්නේ කවුද කියා ය.

සමාජය දකින ඩොටි නොව සමාජය නොදකින ජොටී අපට හමුවන්නේ එතැනදීය. මිනිසුන්ගේ ජීවිත වල තිබෙන කටුක දුෂ්කර බවද නිල ඇඳුමට වැසුන මනුස්සකමද මතුවන ලෙස කිවිඳිය " මරදානේ ඩොටියා" ලියන්නට උත්සාහ දරා ඇත. මාතෘකව මරදානේ ඩොටියා.

කංසා ඔසුවෙන් මත් වෙලා සට
පටස් ගාමින් ඇදෙන කඩියා
ඇඹිලිපිටියෙන් ගෙනත් දෙන මල්
අල්ල මැද තබා ඔතන ඩොටියා...

මරදානේ කුණු කානු වට කොට
බැරල් බංකර බැඳන් සිටියා
මාරු වී ගල් අක්කුවකට
ලක්ෂයට කොඩි දැමූ ඩොටියා...

මල් ගෙනෙන්නටදුර ගිහින් ආ
මුණ කළු කර ගත්ත කඩියා
එක්ක සැපැමිණි අමුත්තෙක් ඇත
ඒ තමයි මහ පොලිස් තඩියා...

මාව ඈරගෙන යන්න කම් නෑ
ඇඳේ සිටිනා මගේ කොලුවා
කවුද දැන් ඔහු බලා ගන්නේ
කියා ඔහු හොඳටෝම ඇඬුවා..

කටුකම්බි ලෑ අමෘත්තය බිම
හලා කුදලා ගත්ත කඩියා
ජීප් රථයට නංව ගත්තේ
රාලහාමි කිසිත් නොදඩා...
පුදුම වී මඟ බැලුවා ඩොටියා...

පියුමි වෙසෙන්නේ යුරෝපයේය. එහෙත් ඇය හදවතින් වෙසෙන්නේ මවුබිමේ යැයි ඇගේ කවි නිර්මාණ කියැවිමේදී සිතේ.

ඇය තව තවත් කවිය ඇසුරු කරන්නේ නම් ඇගේ නිර්මාණ තව තවත් ඔපවෙනු ඇත.

බෝගොඩ පාලම අබියස

මවු පියන් දකිනු වස්
මවු බිම පා තැබූ මොහොතක
අහඹු ලෙද යෙදිණි ගමනක්
බෝ දුර
බෝ ගොඩ

ඉපැරණි දාරුමය පාලම බලන්නට
නෑ - සියන් සමඟින
ගිරි දුර්ග පසු කොට
වෙහෙසින් ද පීඩිතව
ගිනි ගහන මද්දහන් යම
බෝගොඩ වෙහෙර බිම
පා තැබූ සැණ

ළදැරියක වඩා ගත්
යුවතියක දිවැවිත්
වැටිණ පාමුල
දොහොත් මුඳුනත් නගා බැතියෙන
අන්දමන්දය ම සිත
විනිවිදිමි ඇ වත

"ගුරුතුමා, හැඳිනිය නොහැකිද මා
තෙවසරක් ඔබ ඉගැන් වූ....."
අසිරියකි
ඒ මගේ සිසුවියකි
සතුටු ගංගා ගලා හැළුණා
ගුරු බවෙහි පින් මහිම දැනුණා

● **ටියුඩර් අමරසේන**

ඔබේ කවි නිර්මාණ
පහත ලිපිනයට එවන්න
කවි සිළුමිණ,
ලේක්හවුස්, කොළඹ 10.
විද්‍යුත් තැපෑල -
edmediaunit@gmail.com

‘මම නවමත් ගැමිකමට ආදරෙයි’

– ජයකොඩි සෙනෙවිරත්න

ජයකොඩි සෙනෙවිරත්නගේ අලුත්ම නවකතාව වන “රන් සරණි” දයාවංශ ජයකොඩි සමාගමේ ප්‍රකාශනයක් ලෙසින් අප්‍රේල් 20 වැනිදා එළි දක්වන්නට යෙදුණි. මේ ඔහුගේ ලේඛන කලාව පිළිබඳ සිදු කළ සාකච්ඡාවකි.

“රන් සරණී” ඔබේ අලුත් ම නවකතාව වර්තමානයත් සමඟ ගැළපෙන්නේ කොහොම ද?

“ මේ සමාජයේ අපත් සමඟ සිටින කාන්තාව කියන චරිතයේ ඉරණම පිළිබඳ කතාවක්. සාම්ප්‍රදායිකව වගේ ම අදත් අපේ සමාජයේ පුරුෂාධිපත්‍යය යන්න සමාජගත වෙලා තියෙනවා. ඒක ප්‍රතික්ෂේප කරන තත්වයක් අදත් දකින්න නැහැ. පවුලක් වශයෙන් ගත්තත් එතන තියෙන්නේ පීතෘ බලය. ඒ සඳහා පියා වැර වෑයමින් පවුලේ ආර්ථිකය වෙනුවෙන් කටයුතු කිරීම හේතු වෙනවා වෙන්න පුළුවන්. නමුත් ඒ නිසා ම මවක් දරුවන් කුස දරාගෙන සිටින තැන ඉඳලා ලොකු මහත් කොට සමාජගත කරන තැන දක්වා ඒ දරුවන්ගේත්, පවුලේ සියලු කටයුතු නොපිරිහෙලා ඉටු කරන තත්වය මව දෙවෙනි තැනට දාන්න පුළුවන් ද? පවුලක තියෙන්නේ මාතෘ ආදිපත්‍යය. මේ නවකතාව ලියවෙන්නේ ඒ පදනම මත මවුවරු තිදෙනෙකුගේ චරිත හරහා යි. ඒ අනුව ගැහැනියක් සිය ජීවිතයේ විවිධ අවස්ථාවල දී විවිධාකාරයෙන් මුහුණපාන අත්දැකීම් වලින් ලියවුණ කතාවක්



හැටියට මෙය හඳුන්වන්න පුළුවන්.“

මීට පෙර ඔබ ලියූ නවකතාවලත් වෙනස් වෙනස් අත්දැකීම් අපට හමුවෙනවා. ඒ සම්බන්ධයෙන් අද ඔබ පවසන්නේ කුමක් ද?“

“කුඩා වියේ සිටම මම හැදී වැඩුණේ ගැමි සමාජ අත්දැකීම් ඇති සංස්කෘතියකයි. ඒත් “කුමාරිහාමි” නවකතාව ලියන්නේ මම පානදුර ප්‍රදේශයේ සේවය කරමින් සිටි කාලයේ දී ලබපු සමාජ අත්දැකීම් බොහොමයි. ඒ කාලේ මම නිතරම වාගේ වැල්ලට යනවා මාළු අරගන්න. ඒ පරිසරයේ වෙසෙන ධීවර මිනිසුන්ගේ සමාජයේ වෙනස තුළ මම වෙනම කතාවක් දැක්කා. මං එහෙම කිව්වේ අපි කුමන සමාජ පරිසරයකින් ආවත් අපේ වෙනස් වෙනස් සමාජ අත්දැකීම් අපව වෙනස් වෙනස්මාන වලට යොමු කරනවා කියන කාරණය මතක් කරන්න යි. උදාහරණයක් විදිහට මම මුලින් ම ලිව්වේ ප්‍රේමය මුල් කරගත්ත කතා. ඒ වුණාට පසුව මම කැමති වෙන්නේ සමාජය ඇතුළෙන් අපි උකහා ගන්නා අත්දැකීම් ඊට අදාල විග්‍රහයක් ඇතුළෙ ලියන්න යි. මගේ “නොමැරෙන මිනිස්සු” නවකතාවට වස්තු වෙන්නේ ක්ෂය රෝගියෙක් මුල් කරගත්ත තත්වයක්. ඒ ක්ෂය රෝගියා නිසා සෙසු සමාජ කොටස් කටයුතු කරන්නේ හරියට නොමැරෙන මිනස්සු වගේ. අපි බොහෝ විට අනිකාගේ වේදනාව හඳුනාගන්නෙ නෑ. එහෙම තැන්වලින් ඈත් වෙන්න හදන ස්වභාවයක් තමයි දකින්න ලැබෙන්නෙ.



“කැලේ ගස” කියන්නේත් අපි නොදන්න අත්දැකීමක් නෙවෙ යි.ගෙදරින් දරුවෙක් පන්සලේ මහණ වෙන එක අපේ සමාජ සංස්කෘතියට ආගන්තුක දෙයක් නෙවෙයි. අපේ ආගමේ හැටියට මහණ දම් පුරන අයෙකුට ගිහි ජීවිතේ දේපළ වැදගත් වෙන්නෙ නැනෙ. නමුත් අර දරුවා මහණ වූ ගිහි නිවසේ දේපළ බෙදී යාමේ දී ප්‍රශ්නයක් ඇති වෙනවා. මෙවැනි ප්‍රස්තුථයකින් තමයි ඒ කතාව ලියවෙන්නෙ. ඒ වගේ ම කාලයක් තිස්සේ අපේ ආගම අදහන අයව වෙනත් ආගම්වලට හරවා ගැනීම සම්බන්ධයෙන් විවාදාත්මක තත්වයක් තිබුණනෙ. මම“පොඩි හාමුදුරුවො” ලියුවෙ ඒ සංසිද්ධියට අදාළව මෙරට භික්ෂු සංස්ථාව හා පොදු ප්‍රජාව ඊට මුහුණ දුන් ආකාරය ගැන විස්තර කිරීමට යි. නමුත් “උඩු මහල” තුළින් කියවෙන්නේ ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලනයත් සමඟ බැඳුණු මේ රටේ උඩු මහල් වල සිටින දේශපාලනඥයන්ගේ ගනුදෙනු හා හැසිරීම් දක්වන කතාවක්.“

අපේ වර්තමාන නවකතාව ගැන ඔබේ අදහස

මෙහෙමයි ස්වතන්ත්‍ර නවකතා නමින් අපි මොන විදිහට ලිව්වත්, අපේ නවකතාවට විදේශීය බලපෑම් ලැබුණා. රුසියානු, ප්‍රංශ, ඉංග්‍රීසි යන නවකතාවල ඇසුර අපි මුල සිට ම ලැබුවා. විශේෂයෙන් ම සරච්චන්ද්‍රයන්ගෙ මැදිහත් වීමෙන් ජපන් නවකතා ආභාෂයත් අපි නොලැබුවා නොවෙයි. අද අපි අධි යථාර්ථවාදී සාහිත්‍යයක් ගැනත් කතා කරනවනෙ. එවැනි ලෝක මට්ටමේ සාහිත්‍ය ධාරාවල් මග ඇරලා අපිට අපේ ම හුදෙකලාවක් නිර්මාණය කරගන්න බැහැ. ඒක ඇත්ත.

නමුත් අපේ මේ ලිවීම් අපි ඉලක්ක කරගන්නේ එක් උගත් එහෙම නැත්නම් තෝරාගත්ත කොටසකට නම් එතන අපිට හිතන්න දෙයක් තියෙනවා නේද? අර කිව්ව විදිහේ සාහිත්‍ය ධාරා වලින් ලියවෙන ඒ කෘති සමහර විට අපටත් වැටහෙන්නෙ නෑ. අපි කාවද මේ අත් හරින්නෙ, පොදු පාඨකයාව නේද? අපටවත් හරි හැටි නොවැටහෙන මේ සංකීර්ණත්වය පොදු පාඨකයාව අපෙන් ඉවත් කරනවා නම් අපි ඒ ගැන සතුටු විය යුතු ද? මාර්ටින් වික්‍රමසිංහ, සරච්චන්ද්‍ර, ජී. බී. සේනානායක එවැනි උගත් ලේඛකයන් මේ රටේ සාහිත්‍ය සම්ප්‍රදායක් ඇති කළ බව අපි පිළිගන්න ඕනෙ. ඒත් ඒනිසාම මේ රටේ සාමාන්‍ය මිනිස්සුන්ට කියවීම හුරු කරපු ඩීමන් ආනන්ද, ඒ වගේ ම ඊට වෙනස් සමාජ පන්තියකට කියවීමේ රසිකත්වයක් ඇති කරපු කරුණාසේන ජයලත් වැන්නවුන් අමතක කළ යුතු ද?

අද ලියැවෙන බොහෝ නවකතාවල ලියන්නේ මොනවාද? ලිංගිකත්වයෙන් සාහසිකත්වයෙන් තොරව අපට සමාජය විග්‍රහ කරන්න බැරි ද? නිදන කාමරය කියන්නේ ගෙදරක තියෙන මූලික තැනක් තමයි. ඒත් ගෘහ පරිසරයක් ගැන කතා කරනකොට එතන අපට හමුවන ලොකුම ප්‍රශ්නය නිදන කාමරයේ ප්‍රශ්නය ද? මගේ පුද්ගලික මතය නම් නිදන කාමරයේ ප්‍රශ්න නවකතාවක පොදු විග්‍රහයට ඇතුළත් නොවිය යුතු බව යි. ඒ දේ සිදු වෙන්නේ බොහෝ විට වෙනත් අරමුණු නිසා බව යි.

ජ්‍යෙෂ්ඨ ලේඛකයෙකු හැටියට වර්තමාන සාහිත්‍යයික කියවීම පිළිබඳව ඔබේ අදහස කුමක් ද?

“සාම්ප්‍රදායික ලිඛිත සාහිත්‍යය සමඟ නව තාක්ෂණය එක්ව ගමන් කරන කාලයකයි අද අපි ඉන්නෙ. එක පැත්තකින් කියවන සමාජයේ වර්ධනයක් දකින්න බැරි තත්වයක් තියෙනව. අනිත් අතින් ඩබ්. ඒ. සිල්වාගේ, මාර්ටින් වික්‍රමසිංහගේ, කරුණාසේන ජයලත් වැන්නවුන්ගේ කෘති තවමත් හොඳින් අලෙවි වන තත්වයක්ද දකින්න ලැබෙනවා. කොහොම නමුත් මෙතනදීත් මම කියන්නේ අපි අපේ පොදු පාඨකයාව අමතක නොකළ යුතුයි කියන එක යි. අනිත්තෙක ප්‍රකාශනයේදීත් ආර්ථික ප්‍රශ්න තියෙනවානෙ. කඩදාසිවල මිල ගණන් ගැන මම අමුතුවෙන් කියන්න ඕනෙ නැනෙ. ඒත් මම මෙහෙම කියන්නම්. මගේ මුල්ම පොත පිටු හාරසිය ගණනක පොතක්. ඒත් මිල රුපියල් හතර යි. විශ්වාස කරනව ද? අද මගේ අලුත් පොතේ මිල රුපියල් හාරසිය ගණනක්. මේක සංවර්ධනයක් ද එහෙම නැත්නම් අර්බුදයක් ද කියල විසඳගන්න ඕනෙ. ඒ මොක ද වර්තමාන සාහිත්‍යය පවතින්නෙ මේ හැම දෙයක් ම එක්ක යි.

අපේ අත්වල තියෙන ජංගම දුරකථනයට අපි කොච්චර මිලක් ගෙවනව ද? ඒ වෙනුවෙන් මාසිකව අපි වැය කරන ෆෝන් කාඩ් බිල කීයද කියලා. අද කාලෙ තරුණ පෙම්වතෙක් තමන්ගේ පෙම්වතියත් එක්ක හැන්ඩ් ෆෝන් එකෙන් සම්බන්ධ වෙන්න වැය කරන මිල ගැන අපි හිතලා තියනෙව ද? වර්තමාන සාහිත්‍යය පවතින්නේ මේ හැම දෙයක් ම එක්ක යි. සමාජයක් සංවර්ධනය වෙනකොට විවිධ තාක්ෂණ මෙවලම් නිර්මාණය වෙනවා තම යි. ඒත් සාහිත්‍යය කියවීම ඒ නිසා ම අමතක වෙන්න අරින්න හොඳ නැහැ.

පරිවර්තන සාහිත්‍යය අපේ සාහිත්‍යයට ආලෝකයක්

– ප්‍රේමචන්ද්‍ර අල්විස්

වෘත්තියෙන් පාර්ලිමේන්තු හැන්සාඩ් වාර්තාකරුවකු වූ ප්‍රේමචන්ද්‍ර අල්විස් පාඨකයාට බොහෝ සෙයින් සමීප වන්නේ පරිවර්තක ලේඛකයකු ලෙසය. සුදු ජාතික ආර්. එල් ස්පිටල්, රොබඩ් නොක්ස් ආදි ලේඛකයන් විසින් ලියන ලද පොත් ඔහු විසින් සිංහල භාෂාවට පරිවර්තනය කර ඇත. අදටත් ඔහු විසින් පරිවර්තනය කරන ලද ලිපි ආදිය අපට පුවත්පත් වලින් කියවිය හැකිය

ඔබ ලේඛනයට පිවිසියේ කොහොම ද?

“අපේ අම්මා තාත්තා ගැන කියනවා නම් ඒ අය මහ උගත්තු නෙවෙයි. ඒත් පොතපත කියවීමේ පුරුද්දක් ඔවුන්ට තිබුණා. එනිසා ගෙදරදී ම පොත් කියවීමේ හුරුවක් මට ලැබුණා. මම ළමා කාලයේ දී කවි ලියලා ළමා පත්තරවලට යවලත් තියෙනවා. ඒ විදිහට මගේ සාහිත්‍ය උනන්දුව වැඩුණා. පසුව මම රජයේ සේවයට පිවිසෙනවා ලඝු ලේඛකයෙක් විදිහට. ඒ වෘත්තිය තුළ ම පාර්ලිමේන්තු හැන්සාඩ් වාර්තාකරුවෙක් වෙන මම ඒ අත්දැකීම් පාදක කරගනිමින් “පාර්ලිමේන්තු ක්‍රියාදාමය” නමින් පොතක් ලියන්නත් උනන්දු වුණා. ඒ වගේම ලඝු ලේඛනයට අදාළව භාෂාවේ පොදු මෙන් ම නියත යෙදුම් සංග්‍රහ කරමින්, අවශ්‍ය කෙටි සටහන් ද සහිතව පද ලේඛනයක් ද සකස් කළා. මං හිතනවා මේ විදිහට තමයි මම සාහිත්‍යයට පිවිසෙන්නෙ. ඒ විදිහට එක අතකින් මගේ ගෙදර ජීවිතයත්, අනිත් අතින් මගේ වෘත්තීය ජීවිතයත් මගේ සාහිත්‍ය කටයුතුවලට පදනමක් දැම්මා.

ඒ කොහොම වුණත් දේශපාලන පක්ෂ සමඟ සම්බන්ධයක් මට තිබුණෙ නැහැයි කිව්වොත් මං හිතනවා එය නිවැරැදියි කියලා. එහෙම දේශපාලන පසුබිමක්, දේශපාලන පක්ෂ සමඟ සබඳතාවක් මට තිබුණෙ නෑ. දේශපාලන ජයග්‍රහණයක වැදගත්ම දේ තමයි මහජන අයිතිය ජය ගැනීම. එහෙම මිසක් දේශපාලන පක්ෂයක් පමණක් ජය ගැනීම ගැන නෙවෙයි අපි අවධානය යොමු කරන්න ඕනෙ. වැදගත්ම දේ මහජන අයිතිය ජය ගැනීමයි. ඒ කාරණය තමයි වැදගත්. මං දේශපාලනික වශයෙන් ක්‍රියාකාරිකයෙක් නොවුණාට දේශපාලනය සම්බන්ධයෙන් හැදෑරීමක් මට තියෙනවා. පොදුවේ දේශපාලනය සම්බන්ධයෙන් විවේචනයක් වගේ ම ඒ ගැන කතා කරන තැනකත් මම ඉන්නවා.

ඔබේ පරිවර්තන කටයුතු වලට පිවිසුණේ කෙලෙසින්ද කටයුතු සිදුවුණේ කොහොම ද?

“වේල්සයේ ඉඳලා ආව සුදු ජාතිකයෙක් ලංකාවේ ගාල්ල ප්‍රදේශයේ අත් ඇරලා දාලා තිබුණ තේ වත්තක් බද්දට අර ගන්නවා. එමෙ අරගෙන කාබනික ගොවිතැන් ක්‍රමයට ඒ වගාව පවත්වාගෙන යනවා. මම “හරිත තේ උයන මැද” නමින් සිංහලට පරිවර්තනය කරන්නේ ඒ කතාවයි. අද අපි නිතරම කතා කරනවනෙ වස විස නැති ආහාර නිෂ්පාදනයක් ගැන. නමුත් ඒ වෙනුවෙන් උත්සාහ කළ සුදු ජාතිකයාට ඒ කටයුත්ත කරගෙන යන්න බැරි විදිහට ඔහුට එරෙහිව අවහිරතා රට ඇතුළෙන්ම මතු වෙනවා. ඒ වන විට පැවතුණ බහු ජාතික සමාගම් ජාත්‍යයන්තර නීතියට ද පිටු පාමින් මානව පැවැත්මට එරෙහිව ගෙන යන දූෂ්ට ක්‍රියා ගැන ඔහු ලොකු හෙළිදරව්වක් කරනවා. ඒ අනුව රට තුළ ආර්ථික හා පරිසර ඝාතන ක්‍රියාවලියක් සිදුවන බව හෙළිවෙනවා. එක තැනක දී ඔහු කියනවා මුදල ආහාරයට ගත නොහැකි බව මිනිසා තේරුම් ගන්නේ ලෝකයේ අවසාන ගසටත් වස යොදා අවසානම ගසත් කපා අවසාන මත්ස්‍යයාත් ආහාරයට ගත් දාටය කියලා.

ඒ වගේ ම ජර්මන් මහා යුද සංහාරය, ලෝක යුද කාමය, නාසීන්ගේ කුප්‍රකට යුද මෙහෙයුම් මේ හැම දෙයක් ම නියුරම්බර්ග් හීදී (ලෝක යුද්ධය අවසානයේ) අනාවරණය වෙනවා. ඒත් ඒ ඛේදවාචකයේ කර්තෘවරු අර තරම් සංහාරයක් සිදු කළ ඝාතකයෝ අවසානයේ දී තමන්ගේ ජීවිතය බේරා දෙන්නය කියලා හඬා වැටෙනවා. ඒ වෙනුවෙන් එකිනෙකාව පාවා දෙනවා. තමන්ගේ නායකයා ඇඩොල්ෆ් හිට්ලර්වත් පාවා දෙනවා. “නියුරම්බරග් අවසාන ජවනිකාව” කෘතියෙන් හෙළිවෙන්නේ ඒ කතාව යි.

මීට කලිනුත් සිංහලට පරිවර්තනය වූ ද ප්‍රින්ස් කියන ඓතිහාසික කෘතිය මමත් සිංහලට පරිවර්තනය කළා. ඒක ඇත්තටම එදා ඒ කාලයට සාපේක්ෂව ප්‍රබල බල තරගයක් තුළ දේශපාලන පැවැත්ම තමන් වෙනුවෙන් පවත්වා ගන්නේ කෙසේද කියන කරුණ සාකච්ඡා කරනවා.

රොබට් නොක්ස්ගේ ලංකාගමනය මීට පෙරත් සිංහලට නැගිලා තියෙනවා. ඒත් එහි ලංකාවේ ඇතැම් දුර්දාන්ත අත්දැකීම් අත් ඇරලා තමයි පරිවර්තනය වෙලා තියෙන්නෙ. මට අවශ්‍ය වුණේ නෑ එවැනි අත්හැරීම් කරන්න. උදාහරණයක් විදිහට නොක්ස්ගේ පියා මිය යන්නෙ ලංකාවේ දි. එහිදී ඒ අවට ගැමි මිනිසුන්ගෙන් සහාය ඉල්ලූ විට ඔහු ලබන අත්දැකීම හරිම කනගාටුදායක යි. මිය යන්න පෙර නොක්ස්ගේ පියා ඔහුට කියනවා නුඹ කෙසේ හෝ එංගලන්තයට ගොස් එහෙ සිටින සහෝදරිය ගැන සොයා බලන්නය කියලා. එහෙම කියලා පියා මිය යනවා. රොබට් නොක්ස් පියාව වළ දාන්න ස්වදේශිකයන්ගෙන් උදව් ඉල්ලනවා. එක් ස්වදේශිකයෙක් එතනදී ඔහුට කියනවා බෙල්ලට ලණුවක් දාලා මිනිය ඇදගෙන ගිහිං වළ දාන්නම්, හැබැයි එහෙම කරන්නෙත් මුදල් ගෙව්වොත් විතරයි කියලා. මෙරට ස්වදේශිකයන් ගැන පැහැදීමක් නොක්සට නොතිබුණා නෙවෙයි. ඒත් පසුව ම්ලේච්ඡයො කියන වචනෙත් ඔහු මේ රටේ ස්වදේශිකයන්ට යොදලා තියෙනවා.

අපේ සිංහල අතීතය ගැන මම විශේෂ සැලකිල්ලක් දැක්වුවා. මම මහනුවර වැඩ කරපු කාලයේ දී එක් ස්වාමීන් වහන්සේ නමක් ගන්නොරුව ප්‍රදේශයේ වූ එක් අඹ ගසක් පෙන්නුවා. ඒකට කිව්වේ පරංගියා රැඳුණ අඹ ගහ කියල යි. ඒ ස්වාමීන් වහන්සේ කියපු විදිහට එදා පරංගීන් තමන්ගේ තෙත් කාපු වෙඩි බෙහෙත් පිට්ටනියේ අව්වේ ලා වේළද්දි ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා ගිනි හුලක් බැඳපු ඊයකින් එතනට විදලා තියෙනවා. ඒත් එක්කම මහා පිපිරුමක් ඇතිවෙලා පරංගියෙකුගේ හිසක් ඔය කියන අඹ ගහේ රැඳිලා තියෙනවා. මේ විදිහට අපේ ජනප්‍රවාදවලට තිබුණ ආසාව තමයි ආර්. ඇල් ස්පිටල්ගේ වගේ ම ලෙනාඩ් වුල්ෆ්ගේ කෘති ගැන උනන්දු වෙන්නත් මාව යොමු කළේ. ඒත් ලෙනාඩ් වුල්ෆ් අපේ රටේ ජනප්‍රිය චරිතයක් වුණාට ඉංග්‍රීසි සාහිත්‍යයේ ජනප්‍රිය චරිතයක් නෙවෙ යි. මෙවැනි පරිවර්තන ඇසුරෙන් තමයි අපේ සාහිත්‍යයට අලුත් ආලෝකයක් ලැබෙන්නෙ. ඒ නිසා අපි ඒ ගැන විශේෂයෙන් හිතන්න ඕනෙ.



වෂී 2021ක් වූ අප්‍රේල් මස 25 වැනිදා ඉරිදා සිළුමිණ

නැගෙනහිර වැව් වැනසූ සිරිසර පිවිසුමේ තිත්ත ඇත්ත

සිරිසර පිවිසුම මගින් වැවක් ප්‍රතිසංස්කරණය කරන අයුරු

● මංගලනාත් ලියනආරච්චි
- ත්‍රිකුණාමලය.

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණින් යහ පාලන රජය විසින් ක්‍රියාත්මක කරන ලද" සිරිසර පිවිසුම" වැව් ප්‍රතිසංස්කරණ වැඩසටහන ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැර දේශපාලන අරමුණු ඉලක්ක කරගනිමින් මහජන මුදල් කාබාසිනියා කළ ව්‍යාපෘතියක් බව ගොවීහු චෝදනා කරති.

ජායාරූප වමේ සිට, සිට හිටපු ජනාධිපති ලේකම් ඔස්ටින් ප්‍රනාන්දු , ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් සමන් දර්ශන පාඩි කෝරාල, නැගෙනහිර පළාත් සභාවේ හිටපු මන්ත්‍රී ප්‍රියන්ත ප්‍රේමකුමාර, ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ගොවි සංවිධාන බල මණ්ඩලයේ සභාපති එච්.එම්. සුගත් රාමනායක, ගෝමරන්කඩවල නෙළුම් ගොවි සංවිධානයේ සභාපති පී.ජී.අමරදාස සහ කිතුල්උතුව ගොවි සංවිධානයේ භාණ්ඩාගාරික ලක්ෂිත ප්‍රදීප්.

ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ 2017-2021පස් අවුරුදු විශේෂ වැඩසටහනක් ලෙස දියත් කළ මෙම සිරිසර පිවිසුම ව්‍යාපෘතිය ජනාධිපති ලේකම් කාර්යාලයේ මෙහෙයවීමෙන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සෘජු අධීක්ෂණය යටතේ, ශ්‍රී ලංකා යුද හමුදා ව්‍යාපෘති කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද්දකි.

ව්‍යාපෘතිය ආරම්භයේ සිට 2018 වසරේ අවසානය දක්වා මෙම ව්‍යාපෘතියේ අධ්‍යක්ෂවරයෙකු ලෙස හිටපු නැගෙනහිර පළාත් සභා මන්ත්‍රීවරයෙකු මෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සේරුවිල ආසන සංවිධායකවරයෙකු වන ප්‍රියන්ත ප්‍රේමකුමාර කටයුතු කරඇති අතර,පසුව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු මෙන්ම ශ්‍රී.ල.නි.ප. සේරුවිල ආසන සංවිධායකවරයෙකු වූ ජයන්ත විජේසේකර ජනාධිපති ලේකම් කාර්යාලය විසින් පත් කර ලදි. සමස්ත ව්‍යාපෘතියේ අධ්‍යක්ෂ වශයෙන් යුද හමුදා ඉදි කිරීම් ඒකකයේ බ්‍රිගේඩියර් ඊ. එන්. රාමනායක කටයුතු කර ඇති බව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කියා සිටි.

● වැව් 26 ට මුදල් වෙන් කරලා

සිරිසර පිවිසුම වැඩසටහන යටතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හතකට අයත්, වැව් විසි හයක් ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනාවී තිබූ අතර ඒ සඳහා වෙන් කරන ලද මුදල රුපියල් කෝටි 33ක් බව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තහවුරු කරයි. අදාළ ව්‍යාපෘතිය සඳහා 2018 සැත්තැම්බර් මාසයේ දී ඇතැම් ඇස්තමේන්තුවල ඇතැම් අයිතමයන් ප්‍රසම්පාදනය කිරීමේ වගකීම දිස්ත්‍රික් ලේකම් වෙත පවරා තිබේ.

ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තොරතුරු වලට අනුව 2018/2019 කාල සීමාවේදී එම කාර්යාලය විසින් ප්‍රසම්පාදන කටයුතු සිදුකර යන්ත්‍ර හා අමු ද්‍රව්‍ය සැපයූ වාරි ව්‍යාපෘති සංඛ්‍යාව 26 කි.ඉන් 23 ක ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රියාත්මක කර ඇති අතර, අයහපත් කාලගුණික තත්ත්වය මත ඉන් වැව් 03 ක ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීම අත්හිටුවීමට සිදුවී තිබේ. 2019-12-31 දින වන විට වැව් 09 ක ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර ඇති බව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හිටපු පරිපාලන නිලධාරි එස්. කේ. ඩී. නෙරංජන් 2020-02-17 දිනැති GAT/EST/sirisara/Gen දරන ලිපිය මගින් තහවුරු කර සිටි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය එසේ කියා සිටියද, ගොවිජන සේවා සංවර්ධන දෙපාර්මේන්තුව කියා සිටින්නේ, සිරිසර පිවිසුම හරහා ප්‍රතිසංස්කරණය කළ කිසිදු වැවක් යුද හමුදාව විසින් මෙතෙක් භාරදී නොමැති බවයි.

වැවේ ප්‍රතිසංස්කරණ කටයුතු නිසි ආකාරයෙන් සිදුවී ඇද්ද යන්න නිර්දේශ කරනු ලබන්නේ, ඉදි කිරීම් ඒකකයේ යුද හමුදා ඉංජිනේරුවන් සහ වැව අදාළ ගොවිජන සේවා සංවර්ධන දෙපාර්මේන්තුවේ ඉංජිනේරුවන් විසිනි.

● කිතුල්උතුව අසාර්ථක ව්‍යාපෘතිය

සිරිසර පිවිසුම යටතේ ප්‍රතිසංස්කරණය කළ කිතුල්උතුව වැවේ පිටත වාන වසරක් ගතවීමටත් පෙර මුළුමනින්ම බිඳී ගොස් ඇත. සිරිසර පිවිසුම යටතේ කිතුල්උතුව වැවේ සිදුකළ බව කියන ප්‍රතිසංස්කරණ කටයුතු මගින් අපේක්ෂිත අරමුණු කිසිවක් ඉටුවී නොමැති බව කිතුල්උතුව ගොවි සංවිධානයේ භාණ්ඩාගාරික ලක්ෂිත ප්‍රදීප් පෙන්වා දෙයි.

"වැවේ රොන්මඩ අයින් කරලා, ඇළ මාර්ගය කිලෝ මීටරයක් කොන්ක්‍රීට් කරලා තව සොරොව්වත් හදලා පිටත වානත් අලුත් වැඩියාකරලා බේසම හදනවා කියලා තමා අපිට වැඩේ පටන් ගනිද්දී කිව්වේ. නමුත්මේ බේසම කඩලම අවුරුද්දක් විතර ගියා. නැවත හදනවා කියල කිව්වත් ඒක කියපු හැටියට සිද්ධ වුණේ නැහැ. මේ ගැන ගොවිජන සේවා එකට පැමිණිලි කළා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දැනුම් දුන්නා. නමුත් කිසිම කෙනෙක් ඒ ගැන උනන්දුවක් දැක්වූයේ නැහැ."

ව්‍යාපෘතිය අධීක්ෂණය කිරීම ගොවිජන සේවා දෙපාර්මේන්තුව සතු වුවත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අවස්ථාවේ හා ව්‍යාපෘතියේ අවසාන ගෙවීම් සිදු කිරීමේදී සිය නිර්දේශ ලබාදිය යුතු බවත්, එම නිර්දේශ වලට අනුකූලව යුද හමුදාව වෙත ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා ගෙවීම් සිදු කළ බවත් ත්‍රිකුණාමලය හිටපු දිස්ත්‍රික් ලේකම් එන්. ඒ. ඒ. පුෂ්පකුමාර පවසයි.

කිතුල් උතුව වැව සඳහා සිරිසර ව්‍යාපෘතිය යටතේ,වෙන්කර තිබූ මුදල රුපියල් එක්කෝටි හත් ලක්ෂ විසිදහස් පන්සිය පනස් හයකි. එහෙත්, වැවේ රොන්මඩ යම් ප්‍රමාණයක් ඉවත් කිරීම සහ වැව් බැම්මට අගලක පමණ පස් තට්ටුවක් දමා තැළීම හැරීම වෙනත් කිසිවක් සිදු කර නොමැති බවත්, එයද නිසි ප්‍රමිතියකින් ඉටු නොකළ බවත් කිතුල් උතුවේ දමයන්ති දිසානායක සහතික කර සිටි.

● වැව් භාර දී නැහැ

සිරිසර පිවිසුම වැඩ සටහන යටතේ මොරවැව දහය කණුව කිතුල් උතුව වැව ප්‍රතිසංස්කරණය කිරීමේදී අඩුම තරමින් රුපියල් කෝටි යක් පමණ අවභාවිතා ඇති බවට තොරතුරු අනාවරණය වී ඇති නමුදු, ඒ සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීමට හෝ පරීක්ෂණයක් සිදු කිරීමට හැකියාවක් නැති බව ගොවිජන සේවා දෙපාර්මේන්තුවේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික් සහකාර කොමසාරිස් එස්. වරුණිගේ අදහස් දැක්වීමෙන් පැහැදිලිය.

"තවම මේ වැව් ටික අපිට භාරදීලත් නැහැ. වැව් ටික ඇස්තමේන්තු කළේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව. වැඩ කළේ යුද හමුදාව. අපිට මැදිහත් වෙන්න ඉඩක් ලැබුණෙ නැති නිසා අදහසක් දක්වන්න බැහැ. නමුත් අපිත් මේ වෙන කොට විශාල ගැටලුවකට මුහුණ දීලා ඉන්නේ මේ ඉදි කිරීම් අසාර්ථකවීම නිසා. "

ගොවිජන සංවර්ධන දෙපාර්මේන්තුවට මේ සඳහා මැදිහත් වීමට අවස්ථාවක් නොලැබුණු බව දිස්ත්‍රික් සහකාර කොමසාරිස්වරිය පැවසුවද ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කියා සිටින්නේ, 2019.05.13 දිනැති GAT/EST/SP/Ma3/2019/T/Gen ලිපිය මගින් වැව් අධීක්ෂණ කටයුතු සිදු කරන ලෙස ගොවිජන සේවා දෙපාර්මේන්තුවට දන්වා ඇති බවයි. ඊට අමතරව මෙම ව්‍යාපෘති අධීක්ෂණය සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය විසින් සහකාර අධ්‍යක්ෂ අයි.යු. කේ. සෙනෙවිරත්න සිරිසර පිවිසුම ව්‍යාපෘති අධීක්ෂණ කටයුතු සඳහා සෘජුවම පත්කර තිබූ බවයි.

කිතුල් උතුව වැව ගොවිජන සේවා සංවර්ධන දෙපාර්මේන්තුව වෙත භාරදී නැති බව එස්. වරුණි පවසා සිටියද, නව රජය විසින් ක්‍රියාත්මක කර ඇති වාරි සෞභාග්‍ය වැඩසටහන යටතේ කිතුල් උතුව වැවේ ප්‍රතිසංස්කරණ කටයුතු නැවත ආරම්භ කර තිබේ.

ගෝමරන්කඩවල කන්දමලාව වැවද යුද හමුදා ඉදිකිරීම් ඒකකයේ තවත් මතභේදයට තුඩුදුන් ව්‍යාපෘතියකි. කන්දමලාව වැවේ පිටතවාන වාරිමාර්ග දෙපාර්මේන්තුවේ හෝ ගොවිජන සංවර්ධන දෙපාර්මේන්තුවේ අනුමැතියකින් තොරව අඩියක් ඉස්සීම හේතුවෙන් මොරවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රලපනාව, බෙල්ලක්කඩවල වැව් යටතේ පෝෂණය වන කුඹුරු අක්කර 40 ක් පමණ යටවීමේ අවදානමට ලක්වූ බව ගෝමරන්කඩවල නෙළුම් ගොවි සංවිධානයේ සභාපති පී. ජී. අමරදාස කියා සිටි.

ගෝමරන්කඩවල කොට්ඨාසයටම අයත් කුරුඳුගම සහ ඔට්ටිච්චාකුලම් වැව් දෙක සඳහා සිරිසර පිවිසුම වැඩ සටහන යටතේ, රුපියල් කෝටි හයහමාරකට අධික සුවිශාල මුදල් ප්‍රමාණයක් වැය කර ඇතත්, අපේක්ෂිත ප්‍රතිලාභ කිසිවක් ඒ තුළින් ඉටුවී නැති බව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ගොවි සංවිධාන බල මණ්ඩලයේ සභාපති එච්. එම්. සුගත් රාමනායක පෙන්වා දෙයි.

"කුරුඳුගම වැවේ සොරොව් දෙක හදලා නැහැ. බන්ට් එකට පස් දාලා තළනවා කියලා කිව්වට ඒක කරලත් නැහැ. වාන උස්සලා ජල ධාරිතාව වැඩි කරලා තව අක්කර 150 වගා කරන්න හදලා දෙනවා කිව්වට තවමත් අර කලින් කරපු කුඹුරු ටිකම තමා කරන්නේ. මේ ව්‍යාපෘතිය සම්පූර්ණම අසාර්ථකයි කියන එක.

● වැව විනාශ කරලා

සිරිසර පිවිසුම යටතේ ප්‍රතිසංස්කරණය කරන ලද තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ඉදි වැව සම්බන්ධයෙන්ද ගොවීන්ට ඇත්තේ, බරපතළ ගැටලු රාශියකි. ත්‍රිකුණාමලය දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීමකදී අදහස් දැක්වූ ඉදි වැව ගොවි සංවිධානයේ සභාපති එස්.ඩී.දීපානි යුද හමුදා ඉදි කිරීම් ඒකකයට චෝදනා කරමින් කියා සිටියේ වැව ප්‍රතිසංස්කරණය කළා නොව තිබුණ වැවත් විනාශ කර ඇති බවයි.

සිරිසර පිවිසුම හරහා ප්‍රතිසංස්කරණය කරන ලද වැව් දහයකින් කිසිදු ප්‍රයෝජනයක් ගත නොහැකි තත්වයක් උදාවී ඇති බවත්, මොනයම් හෝ ව්‍යාපෘතියක් හරහා එම වැව් කඩිනමින් ප්‍රතිසංස්කරණය කර ගොවි ජනතාවට සහන සැලසීම තම අරමුණ බවත් වත්මන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් සමන් දර්ශන පාඩිකෝරාල කියා සිටි. ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කිරීමට කාලයක් ගත වන බව පෙන්වා දෙන දිස්ත්‍රික් ලේකම්වරයා කියා සිටින්නේ, පරීක්ෂණ සිදුකර කාලය වැය කිරීමට වඩා මෙම වැව් ටික වෙනත් ව්‍යාපෘතියක මුදල් යොදවා හෝ කඩිනමින් ප්‍රතිසංස්කරණය කළ යුතු බවයි.

සිරිසර ව්‍යාපෘතියේ අසාර්ථකභාවය සහ ඒ තුළින් සිදුව ඇති බවට පෙනී යන බරපතළ මූල්‍ය වංචාව සම්බන්ධයෙන් එම ව්‍යාපෘතියේ ජනාධිපති විශේෂ ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කළ ප්‍රියන්ත ප්‍රේමකුමාරගෙන් කළ විමසීමේදී ඔහු කියා සිටියේ, පටු දේශපාලන හා මතවාදී අරමුණු ඉලක්ක කර ගනිමින් මෙම ව්‍යාපෘතිය අඩාළ කිරීමට කටයුතු කළේ,නැගෙනහිර ආණ්ඩුකාරවරයා ලෙස කටයුතු කළ පසුව ජනාධිපති ලේකම් ලෙස ද කටයුතු කළ ඔස්ටින් ප්‍රනාන්දු බවයි.

මේ සඳහා එවකට ජනාධිපති ලේකම් ලෙස කටයුතු කළ පී.බී.අබේකෝන් සහ හිටපු යුද හමුදාපති ජෙනරාල් ක්‍රිෂාන්ත ද සිල්වාත් ආරක්ෂක ලේකම් ලෙස කටයුතු කළ කරුණාසේන කොඩිතුවක්කු ද විශාල දායකත්වයක් ලබා දුන් නමුදු, එවකට නැගෙනහිර ආණ්ඩුකාරවරයා ලෙස කටයුතු කළ ඔස්ටින් ප්‍රනාන්දු ව්‍යාපෘතියට අකුල් හෙළූ බව ප්‍රියන්ත පවසයි.

● ව්‍යාපෘතිය අඩාළ කිරීම

අනතුරුව ජනාධිපති ලේකම්වරයා ලෙස පත්වූ ඔස්ටින් ප්‍රනාන්දු එක්සත් ජාතික පක්ෂයේ න්‍යාය පත්‍ර ක්‍රියාත්මක කරමින් මෙම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම අඩාළ කොට එම මුදල් උතුරට ලබාදීමට රහසිගත වැඩ සටහනක් දියත් කළ බවත්, එතකින් නොනැවතී සිරිසර පිවිසුම හරහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වැව් ප්‍රතිසංස්කරණය සඳහා ඉතිහාසයේ ලැබුණු විශාලතම මුදල වූ රුපියල් බිලියන පහක් ගෙන ආ තමාට එරෙහිව බරපතළ මූල්‍ය වංචා චෝදනා ඉදිරිපත් කරමින් මෙම ව්‍යාපෘතියෙන් තමා ඉවත් කර, ඒ සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයේ ඔහුට හිතවත් රවින්ද්‍රනාත් නැමැති අයෙකු 2018 වසරේ මැද භාගයේදී පත් කර එවීමට ජනාධිපති ලේකම් ඔස්ටින් ප්‍රනාන්දු කටයුතු කල බව ප්‍රියන්ත ප්‍රේමකුමාර අවධාරණය කර සිටි.

මෙම සිරිසර ව්‍යාපෘතිය හරහා වැව් ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියේ වත්මන් තත්වය කවරේද යන්න දැන ගැනීමට යුධ හමුදා ඉදි කිරීම් ඒකකයේ බ්‍රිගේඩියර් ඊ. එන්. රාමනායක සම්බන්ධ කරගැනීමට කිහිප අවස්ථාවකදීම උත්සහ කළද එය අසාර්ථක විය.

යුද හමුදාව කෙරෙහි අප තුළ ඇත්තේ, ගෞරව සම්ප්‍රයුක්ත භක්තියාදරයකි. තිස් අවුරුදු යුද්ධය නිමා කිරීමට ජීවිත මෙන්ම අත් පාද අහිමි කර ගනිමින් ඔවුන් දැක්වූ කැප කිරීම අතිමහත්ය. එවන් මුර දේවතාවුන්ගේ අභිමානය සහ ඔවුන් පිළිබඳව ඇති විශ්වාසය අප අතරින් හීනවී යාමට කවර හෝ පාර්ශ්වයක් කටයුතු කරන්නේ නම් එය අභාග්‍යකි.

යුද හමුදාවේ කීර්ති නාමය උපයෝගී කරගෙන කිසියම් පාර්ශ්වයක් විසින් මේ අවභාවිතා සිදු කරන ලද්දේදැයි යන සැකය බොහෝ දෙනා තුළ පවතී. එය සිදු කළ හැක්කේ විමර්ශනයකින්ම පමණි.

මියන්මාරයට එක්සත් ජාතීන්ගේ මැදිහත්වීමක්

● ටිරෝනි වෑවලගේ

මේ වන විට මියන්මාරයේ හමුදා පාලනයට එරෙහි ජනතා විරෝධතා එරට අභ්‍යන්තරයේ සිවිල් යුද්ධයක් දක්වා දිග් ගැස්සෙමින් තිබේ. දිනෙන් දින හමුදා වෙඩි පහරට ලක්ව ජනතාව මිය ගියද මේ වන විටත් දහස් ගණනින් ජනතාව මරණ බිය යටපත් කරමින් විරෝධතාවලට එක්වෙමින් සිටිති. මියන්මාරයේ හමුදා පාලනයට විරෝධය දක්වන ජනතාවට තම රටේ ප්‍රජාතන්ත්‍රවාදය ඇති කිරීමට සහය දෙන මෙන් විදේශයන්ගෙන් විශේෂයෙන්ම එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් කළ ඉල්ලීම්වලට යම් යම් ප්‍රතිචාර මේ වන විට ලැබෙමින් තිබේ.

එහෙත් එම ප්‍රතිචාර ජනතාව බලාපොරොත්තු වෙමින් සිටින තරමේ සාධනීය නොවන බව නම් කිව යුතුය.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ හිටපු මහ ලේකම්වරයකු වන බැන් කී මූන් මියන්මාරය සම්බන්ධව මැදිහත් වන ලෙස පසුගියදා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ වර්තමාන මහලේකම්වරයා වන අන්තෝනියෝ ගුයිටරේස්ගෙන් සෘජුවම ඉල්ලා සිටියේය.

මේ වන විටත් අන්තෝනියෝ ගුයිටරේස් විසින් මියන්මාරය සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විශේෂ නියෝජිතයකු ලෙස ක්‍රිස්ටීන් ස්ක්‍රේනර් බග්නර්ව පත් කළ නමුත් ඇයට මියන්මාරයට ඇතුළු වීමට හමුදා පාලනය ඉඩ ලබා දුන්නේ නැත.

මේ සම්බන්ධව තම අදහස් ප්‍රකාශ කරමින් එක්සත් ජාතීන්ගේ හිටපු මහ ලේකම් බැන් කී මූන් පවසා ඇත්තේ මේ වන විට මහ ලේකම් ලෙස තමන් සතු බලතල පාලනය කරමින් මියන්මාරය තුළ සිදුවන මනුෂ්‍ය ඝාතන වැළැක්වීමට කටයුතු කිරීමට මහලේකම්වරයා කටයුතු කළ යුතු බව තමන් විශ්වාස කරන බවයි.

බැන් කී මූන් 2007 සිට 2016 දක්වා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම් තනතුර හෙබවූයේය. වර්තමාන එක්සත් ජාතීන්ගේ මහලේකම් අන්තෝනියෝ

ගුයිටරේස් මියන්මාරයේ තත්ත්වය සම්බන්ධව පසුගියදා ආරක්ෂක කවුන්සිලය සමඟ විශේෂ සාකච්ඡාවක්ද පැවැත්වූ බව වාර්තා වී තිබේ.

මේ අතර සාමාජිකයන් 10 දෙනෙකුගෙන් යුක්ත ගිනිකොන දිග ආසියා සංවිධානයේ (ආසියාන්) රටවල් මියන්මාරයේ අභ්‍යන්තර සිදුවීම්වලට මැදිහත් විය යුතු ක්‍රමවේදයක් සම්බන්ධව සාකච්ඡා පවත්වමින් සිටින බවද ප්‍රකාශිතය.

මේ සම්බන්ධව මේ රටවල සාමාජිකයන්ගේ විශේෂ හමුවක් අප්‍රේල් 24වැනිදා ඉන්දුනීසියාවේදී පැවැත්විණි.

මේ සම්බන්ධව තම මතය දක්වමින් බැන් කී මූන් වැඩිදුරටත් පවසා ඇත්තේ ආසියාන් සංවිධානය තවදුරටත් මියන්මාර අර්බුදය එරට අභ්‍යන්තර අර්බුදයක් වශයෙන් දැකිය යුතු නොවන බවයි.

මේ වන විට මියන්මාරයෙන් ලැබෙන වාර්තා අනුව විරෝධතාවලට සහභාගී වීම නිසා මියන්මාර හමුදාව විසින් මරා දමා ඇති සංඛ්‍යාව 737කි. සිර ගත කර ඇති සංඛ්‍යාව 3,229කි.

මියන්මාරය සම්බන්ධව එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ අවධානය යොමු කිරීමට එහි ප්‍රධානීන් කොතරම් උත්සාහ දැරුවද චීනය සහ රුසියාව එම අදහස්වලට එරෙහිව දැඩි මතයක සිටින බවද වාර්තා වී තිබේ.

කෙසේ වුවද මියන්මාර ජනතාව තවදුරටත් හමුදා පාලනයට එරෙහිව අඛණ්ඩ විරෝධතාවන්හි නිරත වෙමින් සිටින අතර මීට පෙර 1970 දශකයේදී මියන්මාරයේ හමුදා පාලනයට එරෙහිව ඇතිවූ ජනතා උද්ඝෝෂණ පාලනය කළ අන්දමින්ම මේ ජනතා උද්ඝෝෂණද පාලනය කර ගනිමින් දිගටම හමුදා පාලනය ඉදිරියට ගෙන යෑමට ජුන්ටාවේ නායකයන්ට හැකියාව ලැබෙනු ඇති බවට අනුමාන පළ කළ හැකිය.

වෂී 2021ක් වූ අප්‍රේල් මස 25 වැනි ඉරිදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

සිළුමිණ JOBS

සිළුමින The Silumina

රැකියා අතිරේකය

ලොරි රථ උවමනායි

සැහැල්ලු නිමි භාණ්ඩ දිවයින පුරා බෙදාහැරීමට
දිගුකාලීන බදු පදනම මත
ෆුල්බොඩි ලොරි රථ රියදුරන් සමග වුවමනායි.

වහාම විමසන්න : දු.ක. 0771359482

මුද්‍රණ ඇබෑර්තු

SM 74 / SM 72 පළපුරුදු මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන් අවශ්‍යයි.

L.N.D. **ග්‍රැෆික්ස් පුද්ගලික සමාගම**

නො. 150F, පීතර සෙනවිරත්න මාවත, රද්දොළුව, කොටුගොඩ.

දු.ක. 0777-313318

ආපනශාලා සේවක ඇබෑර්තු

පැලියගොඩ මැතිං මාර්කට් නව වෙළඳ සංකීර්ණයේ ආපනශාලාවට පහත සඳහන් සේවකයන් බඳවා ගැනීම. දේශීය ආහාර, ඉන්දියන්, චීන, රයිස්, කොත්තු ෂෝට්ස්, ෆේස්ට්, පිළියෙල කිරීම සඳහා පුහුණු පළපුරුදු බාස්වරුන් සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සතියේ දිනවල. මධ්‍යම බස්නැවතුම්පල මේධා ගොඩනැගිල්ලේ පළමු මහලේ අංක 101 කාමරය

විමසීම් : 077-7971196 සහ 0777-958149

ස්ථිර ඇබෑර්තු ඇත

යුරෝපීය තත්ව සහතික වලට අනුකූලව පෙර සැකසූ නිවාස ඉදිකිරීමේ නිරතව සිටින දිවයිනේ ප්‍රධාන පෙලේ ඉදිකිරීම් ආයතනයක පහත පුරප්පාඩු සඳහා පුහුණු සහ නුපුහුණු කම්කරුවන් බඳවා ගනුලැබේ.

වඩු කාර්මික	- 30
මේසන්	- 10
බාර් බෙන්ඩර්	- 4
හෙඩ් බාස්	- 8
විදුලි කාර්මික	- 4
ජල නල කාර්මික	- 4

නවාතැන් සපයනු ලැබේ.

අමතන්න - 076 360 3850 (ජීවන්)

ඇබෑර්තු

මහරගමේ පිහිටි අපගේ චිත්‍රවළු සහ පලතුරු අපනයන සමාගමේ ඇසුරුම් අංශය සඳහා ඇසුරුම් සහායකයින් බඳවා ගනු ලැබේ.

- ★ අ.පො.ස (සා පෙළ) සමත් වී තිබිය යුතුය.
- ★ පිරිමි, වයස අවු: 20 - 35 ක් අතර.
- ★ පිට පලාත් වල පදිංචිකරුවන්වද ඉල්ලුම් කළ හැක. (නවාතැන් පහසුකම් සපයනු ලැබේ)

කළමනාකරු - මානව සම්පත්,
සදාහරිත ඇග්‍රි ෆාර්මිස් ඇන්ඩ් එක්ස්පෝටර්ස් ප්‍රයිවට් ලිමිටඩ්
නො. 6 ඒ, ඇග්‍රිබිස් පොදෙස, කොළඹ 03.

මට්ටක්කුලියේ මූලික පෙළේ පොලිතින් නිෂ්පාදන ආයතනයක පහත සඳහන් පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු කෙරේ.

- **පුහුණු / නුපුහුණු අත් උදව්කරුවන් (පිරිමි)**
  HELPERS

සම්බන්ධ කිරීම :

THREE STAR PACKAGING SOLUTIONS
NO. 50C, KELANIGANGA MILL ROAD,
MATTAKULIYA, COLOMBO - 15

දුරකථන අංක : 0115230052 (8.30 a.m. - 5.30 p.m.)

රැකියා ඇබෑර්තු

දක්ෂ රියදුරු මෙහෙයුම් වාහන අවශ්‍යය කර තිබේ. වයස අවුරුදු 18ත් 50ත් අතර බර වාහන බලපත්‍ර ඇති දක්ෂ රියදුරු මෙහෙයුම් වරිත සහතික, ක්‍රමවේදක සහතික සමත අප්‍රේල් මස 28 හා 29 දිනවලදී සවස 2.00 ත් 4.00 ත් අතර පහත සඳහන් ලිපිනයට පැමිණෙන්න.

මිලෙනියා රෝ සමාගම
නො: 410, කොළඹ පාර, පැලියාගොඩ.

පුහුණු / නුපුහුණු දන්ත ශල්‍ය සහයිකාවක් සඳහා ඇබෑර්තු ඇත

වැටුප් රු. 35,000/- දක්වා.

27/1, කින්රොස් පාර, කොළඹ 04.
දුරකථනය: 077 1109061

ආධුනික වෙල්ඩින්කරු තනතුර

වෙල්ඩින් වැඩ පුහුණුකර සේවයට බඳවා ගැනීමට අවුරුදු 18ත් 35ත් අතර අයකු අවශ්‍යව ඇත.

පහත සඳහන් ලිපිනයෙන් විමසන්න.

නො: 410, පිළියන්දල පාර, පැලියාගොඩ.

ප්‍රධාන පෙළේ ප්‍රවාහන ආයතනයකට බර වාහන (රෝද 10) සහ ප්‍රයිම් මුවර් රියදුරන් සහ සහායකයින් සඳහා ඇබෑර්තු

1. **හොඳ වැටුප්**
2. **කොමිෂන්**
3. **නවාතැන් පහසුකම්**

සම්මුඛ පරීක්ෂණ සඳහා සඳුද සිට සිකුරාද දක්වා වැඩ කරන දිනයන්හි පෙ.ව. 9.00 සිට 12.00 දක්වා පොලිස් හා ග්‍රාම සේවක වාර්තා සමග සියලු සහතික රැගෙන එන්න.

නො. 95, ඥාණවිමල පාර, කොළඹ 09.
දෙමටගොඩ.

ඇබෑර්තු ඇත

SUNPOWER

1. JCB Machine Operator (JCB **යන්ත්‍ර ක්‍රියාකරු**)
2. Mechanics (**කාර්මිකයන්**)
3. Senior Mechanics (**ජ්‍යෙෂ්ඨ කාර්මිකයන්**)
4. Auto Electricians (**වාහන විදුලි කාර්මිකයන්**)
   ☎ Contact Mr. Samantha (Transport Manager) 0727587583
5. Electricians (**විදුලි කාර්මිකයන්**)
6. Stores Helper (**ගබඩා සහායක**) - **අ.පො.ස. සා. පෙළ**
7. Store Keeper (**ගබඩා පාලක**) - **අ.පො.ස. උ. පෙළ සමත්**
8. Procurement Clerk (**ප්‍රසම්පාදන ලිපිකරු**) - **අ.පො.ස. උ. පෙළ සමත්**
9. Imports/ Wharf Clerk - **අ.පො.ස උ. පෙළ සමත්**
   ☎ Contact Mr. Indunil 0772258138

ඉතා ඉක්මණින් අවශ්‍යයි

අප ආයතනය ඉදිකිරීම් හා යටිතල පහසුකම් සංවර්ධනය අතින් ඉදිරියෙන් සිටින සමාගමකි. ඉහත සඳහන් තනතුරු සඳහා අප සතුව ඉක්මණ් පුරප්පාඩු තිබේ.

සුදුසුකම් සහ පළපුරුද්ද

- NVQ 02 මට්ටම හෝ සමාන සුදුසුකමක් සමග අවුරුදු 02 - 03 ක පිළිගත් ආයතනයක පළපුරුද්ද.
- වැටුප සාකච්ඡා කළ හැක.
- ඔබේ අයදුම්පත නොපමාව පහත ලිපිනයට යොමු කරන්න.

කළමනාකරු - මානව සම්පත්

සන්පවර් කන්ස්ට්‍රක්ෂන්ස් (පුද්ගලික) සමාගම

03 වන මහල, ෆෝබ්ස් සහ වෝකර් ගොඩනැගිල්ල,
46/38, නවම් මාවත, කොළඹ 02.
careers@sunpower.lk

Pucan Pucan

අපගේ කණ්ඩායමට එකතු වී විශිෂ්ඨ බේකරි නිෂ්පාදන සාදන්න. අප නවීන බේකරියක් සහ ඉහළ මට්ටමේ අලෙවිසැල් හතරක් සහිත වේගයෙන් වර්ධනය වන බම්බලපිටියේ පිහිටි ආහාර සමාගමකි.

දැනට පවතින පුරප්පාඩු පහත දැක්වේ.

කොමිස් I (පේස්ට්‍රි / බේකරි)
බේකරි අංශයේ අවම අවුරුදු 2ක පළපුරුද්ද අවශ්‍ය වේ.

කොමිස් II (පේස්ට්‍රි / බේකරි)
බේකරි අංශයේ අවම අවුරුදු 1ක පළපුරුද්ද අවශ්‍ය වේ.

කරුණාකර ඔබගේ CV එක hr@lpf.lk හෝ පහත ලිපිනයට තැපැල් කරන්න.

ලංකා ප්‍රිමියර් ෆුඩ්ස් (පුද්ග) සමාගම
84, ලෝරන්ස් පාර, කොළඹ 04.
දුරකථන - 0773 834 479 (සූපවේදී ජගත්)

1950 සිට දිනපතා සහ සතිපතා පත්‍රවල පළවූ හා පළනොව ඡායාරූපවල දළ සේයාපට පුස්තකාලයේ තැන්පත් කර ඇත. ඔබටත් ඡායාරූප ලබාගැනීමට අවශ්‍ය නම් පුවත්පතේ නම, දිනය සහ ඡායාරූපයේ විස්තර සඳහන් කොට ලියා හෝ පැමිණ විමසන්න.

පුස්තකාලයාධිපති
දුරකථන
(011) 2 242 9491

LAKE HOUSE

සංචාරක අමාත්‍යාංශය

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය

සංචාරක හා ආගන්තුක සත්කාරක කර්මාන්තයේ මානව සම්පත් සංවර්ධනය උදෙසා අධ්‍යාපනය ලබාදෙනු ලබන ප්‍රමුඛතම රාජ්‍ය ජාතික පුහුණු ආයතනය ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයයි

කොළඹ - ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ ඇබෑර්තු

සහකාර අධ්‍යක්ෂ - ප්‍රසම්පාදන
(MM 1-2 කාණ්ඩය)

සුදුසුකම් සහ පළපුරුද්ද
(1 හෝ 2)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් පිළිගත, මූල්‍ය / ගණකාධිකරණය / වාණිජ / මූල්‍ය කළමනාකරණය පිළිබඳ උපාධියක්

සහ

පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු වෙන්ඩර් / ප්‍රසම්පාදන කටයුතු සැසිරවීම පිළිබඳ එක් වසරක අවම පළපුරුද්ද.

2. ස්වේච්ඡාවට අදාළ වූ පිළිගත වරලත වෘත්තීය ආයතනයක අන්තර් මාධ්‍ය පාඨමාලාව සමත් වීම

සහ

රාජ්‍ය සේවාවේ, වගවකරවීම සිදුබල, රාජ්‍ය ආයතන හෝ පිළිගත පෞද්ගලික ආයතනයක වෙන්ඩර් / ප්‍රසම්පාදන කටයුතු සැසිරවීම පිළිබඳ අවම වශයෙන් එක් වසරක සේවා පළපුරුද්ද.

වයස:
අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

වැටුප් පරාස:
MM 1-2 - රු.54,550/= - 10 x රු.1,375/= - 15 x රු.1,910/=- රු.96,950/= + කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛන අංක 2016/02 අනුකූලව පිළිබඳ රජය අනුමත කළ දීමනා. රට අමතරව ප්‍රවාහන දීමනාව රු. 4,000/-, මාසිකව වෘත්තීමය දීමනාව රු.3,000/-, සහ දුරකථන දීමනාව මසකට රු. 2,500/- ගෙවනු ලැබේ.

සහකාර කථිකාචාර්ය - මූල්‍ය
(MM 1-2 කාණ්ඩය)

සුදුසුකම් සහ පළපුරුද්ද
(1 හෝ 2 හෝ 03)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් පිළිගත් මූල්‍ය උපාධියක් / ගණකාධිකරණය / වාණිජය / මූල්‍ය කළමනාකරණය සහ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක්

සහ

පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු ගණකාධිකරණය පිළිබඳ එක් වසරක අවම පළපුරුද්ද.

2. පිළිගත වරලත වෘත්තීය ආයතනයක (ICASL/ CIMA / ACCA) අන්තර් මාධ්‍ය පාඨමාලාව සමත් වීම හෝ වෙනත් පිළිගත් අදාළ වෘත්තීය ආයතනයක එවා සමාන සුදුසුකම් සමග සහ රාජ්‍ය සේවයේ ගණකාධිකරණය පිළිබඳ අවම වශයෙන් එක් වසරක සේවා පළපුරුද්ද.

3. ගණකාධිකරණය පිළිබඳ උසස් රාජකීය ඩිප්ලෝමා සහතිකයක ලබා ගැනීම (HNDA)

සහ

රාජ්‍ය සේවාවේ, වගවකරවීම සිදුබල, රාජ්‍ය ආයතන හෝ පිළිගත පෞද්ගලික ආයතනයක ගණකාධිකරණය පිළිබඳ අවම වශයෙන් එක් වසරක සේවා පළපුරුද්ද.

වයස:
අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

වැටුප් පරාස
MM 1-2 - රු.54,550/= - 10 x රු.1,375/= - 15 x රු.1,910/= - රු.96,950/= + කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛන අංක 2016/02 අනුකූලව පිළිබඳ රජය අනුමත කළ දීමනා. රට අමතරව ප්‍රවාහන දීමනාව රු. 4,000/-, මාසිකව වෘත්තීමය දීමනාව රු.3,000/-, සහ දුරකථන දීමනාව මසකට රු. 2,500/- ගෙවනු ලැබේ.

ලොන්ඩරි මෙහෙයුම් නිළධාරි
(JM 1-2 කාණ්ඩය)

සුදුසුකම් සහ පළපුරුද්ද
(1 හෝ 2)

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් සංචාරක / ආගන්තුක සත්කාර කළමනාකරණය / ආශ්‍රිත සමාජ විද්‍යාව පිළිබඳ අදාළ උපාධියක්

හෝ

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ හෝටල් සෙවා පාඨමාලා පිළිබඳ විශේෂ ප්‍රවීණ උපාධියක් සහ අදාළ කාණ්ඩයේ වසර 02 ක අවම සේවා පළපුරුද්ද.

වයස:
අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

වැටුප් පරාස :
JM 1-2 - රු.43,355/= - 10 x රු.755/= - 18 x රු.1,135/= - රු.71,335/= + කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛන අංක 2016/02 අනුකූලව පිළිබඳ රජය අනුමත කළ දීමනා. රට අමතරව ප්‍රවාහන දීමනාව රු. 4,000/-, මාසිකව වෙන්වීමය දීමනාව රු. 2,500/- ගෙවනු ලැබේ.

පොදු කරුණු

- **අර්ථසාධක ගෙවීම් : සේවකයා මාසික වේතනයෙන් 10% ක්ද සේව්‍යයා 15% ක්ද අරමුදලට බැර කරනු ලැබේ.**
- **සේවක භාරකාර අරමුදල : සේව්‍යයා විසින් 3% ක ප්‍රමාණයක් අරමුදලට බැර කරනු ලැබේ.**

සේවකයාට සහ ඔහුගේ / ඇයගේ පවුලේ සාමාජිකයින්ට ආකර්ෂණීය සෞඛ්‍යාරක්ෂණාවරණයකට හිමිකම් ලබනු ඇත.

ඉල්ලුම් කරන තනතුර කවරක් ඉහළ වම් කොළවරේ සඳහන්කොට ඉල්ලුම්පත සමග අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව සහතික පත්‍රවල සහ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ඇසුරුව දොළොස් නොවන නිර්දේශකයන් දෙදෙනකුගේ නම් සහිතව සකස් කළ අයදුම්පත 2021 මැයි මස 13 වැනි දිනට හෝ රට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමු කරන්න.

අධ්‍යක්ෂ ජෙනරාල්
ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය
නො. 78, ගාලු පාර, කොළඹ 03.

විමසීම් : 0112 208360

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය

(අධිකරණ අමාත්‍යාංශය)

2015 අංක 05 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත බලාත්මක කිරීම සඳහා පිහිටුවන ලද අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ අධ්‍යක්ෂ (රැකවරණ) තනතුර සඳහා බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අධ්‍යක්ෂ (රැකවරණ) HM 1-3 (තනතුරු 01)

රැකියා සාරාංශය :

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය පිහිටුවන ලද 2015 අංක 04 දරන පනතේ (VI) වන කොටස ප්‍රකාරව, අපරාධයක වින්දිතයෙකුට සහ සාක්ෂිකරුවෙකුට ආරක්ෂාව සැපයීමට අදාළ රාජකාරී පැවරෙන අතර රැකවරණ අංශයේ ප්‍රධානියා ලෙස රාජකාරී වගකීම් හා කාර්යයන් ඉටු කිරීම මෙම තනතුරේ වගකීම් අතරට ගැනේ.

සුදුසුකම් හා පළපුරුද්ද :

බාහිර අයදුම්කරුවන්:

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිය, අපරාධවේදය (Criminology) හෝ සමාජ විද්‍යාව යන විෂයය ක්ෂේත්‍රයන්හි විශේෂ උපාධියක් ලබා තිබීම

සමඟ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තනතුරට අදාළ විෂයය ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධියක් ලබා තිබීම

සහ

ප්‍රථම උපාධි සුදුසුකම් ලබාගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ අදාළ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක "විධායක / මධ්‍යම කළමනාකරණ මට්ටමේ" විෂයය ක්ෂේත්‍රයට අදාළ තනතුරු වල අවම වශයෙන් වසර 15 ක පළපුරුද්දක් තිබීම

හෝ

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම

සමඟ

ශ්‍රී ලංකා පොලිස් සේවයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි තනතුරට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධාරියෙකු වීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් : (පහත සඳහන් 01 හෝ 02)

01. මෙම තනතුර සඳහා වන ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

02. කළමනාකාර සේවා (MM) ගණයෙහි 1 ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර 05 ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වැටුප් පරිමාණය : HM 1-3 රු. 86,865-15x2,270 – 120,915

කොන්දේසි

01. වයස් සීමාව :

අවු : 35ට නොඅඩු හා අවු: 55ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

02. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

පත්වීම් බලධාරියා විසින් නියම කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. සුදුසුකම් ලැබූවන් අතුරින් අවම වශයෙන් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වන සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ඇත. ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙළ අනුව තෝරා ගැනීම් සිදු කෙරේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීම පහත පරිදි වේ :

අදාළ පළපුරුද්ද	-	ලකුණු 30
අදාළ අතිරේක අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම්	-	ලකුණු 30
අනෙකුත් අදාළ කාර්යය සාධනයන් හා කුසලතා	-	ලකුණු 15
සම්මුඛ පරීක්ෂණයේ දී කාර්ය සාධනය	-	ලකුණු 25
මුළු ලකුණු ගණන	-	**ලකුණු 100**

03. සෑම ඉල්ලුම්කරුවෙක්ම

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

III. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

04. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම් කළ යුතු අතර, ඔහු හෝ ඇය තනතුර සඳහා තෝරා ගතහොත් නිදහස් කරන බවට ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

05. දැන්වීමට අනුව මූලික සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

06. ඉහත සුදුසුකම් හා තනතුරට අදාළ පළපුරුද්ද සනාථ කෙරෙන සහතික පත්වල අයදුම්කරු විසින් සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත සමග එවිය යුතුය.

07. සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා ඔබ දායක වනු ඇත.

08. මෙම තනතුර සඳහා රජයේ අනුමත දීමනා සහ තනතුරට හිමි වරප්‍රසාද හිමිවේ.

09. අයදුම්කරුවන් විසින් අනිසි බලපෑම් කිරීම හෝ විමසීම් සිදු කිරීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වනු ඇත.

10. අයදුම්පත් කැඳවීම අවසන් දිනට නොලැබෙන සියලු අයදුම්පත් සහ සහතික පත්වල පිටපත් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද හා සියලු තොරතුරු ඇතුළත් ජීව දත්ත සටහනක් හා සහතික පත්‍රවල ඡායා පිටපත් සමඟ, "**අධ්‍යක්ෂ ජනරාල්, අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය, 428/11 ඒ, පළමු මහල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල**" යන ලිපිනයට 2021.05.10 දින හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්
අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය,
428/11 ඒ, පළමු මහල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
දු. අංක. 0112879539
දිනය : 2021.04.25

සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම

රැකියා අවස්ථා

සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම යනු කාර්ය මණ්ඩලය 1500 සේවය කරන හා මීගමුව සිට ගාල්ල දක්වා දිවයිනේ වෙරළ තීරයේ මෙහෙයුම් කටයුතු සිදුකරමින් පාරිභෝගිකයන් 500,000 ට වඩා වැඩි ප්‍රමාණයකට ශාඛා හතක් මගින් සේවය සලස්වන්නා වූ බෙදාහැරීමේ උපයෝගිතා ආයතනයක් වේ.

අප ආයතනයේ පවත්නා පහත සඳහන් තනතුර පිරවීම සඳහා සුදුසුකම්ලත් අයවලුන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. ජාල පරිපාලක

අධ්‍යාපනික සුදුසුකම්	■ පරිගණක විද්‍යා හෝ සමාන විෂයයක ප්‍රථම උපාධියක්
පළපුරුද්ද	■ සමාන කාර්යයක වසර 03 කට වැඩි පළපුරුද්ද. ■ ඉන්ටෙල් පාදක සර්වර්, මෙහෙයුම් පද්ධති, TCP/IP ෆයර්වෝල් හා එතර්නෙට් ස්විච් රීති හා විධි චර්යා හා අවශ්‍ය ප්‍රමිතීන් වින්‍යාසය, පරිපාලනය හා අධීක්ෂණය පිළිබඳ පළපුරුද. ■ විදුලි සංදේශ පද්ධති කළමනාකරණය හා පරිපාලනය පිළිබඳ පළපුරුද්ද අවශ්‍ය වේ. ■ MSCE, MSITP, CCNA හෝ වෙනත් තාක්ෂණ සහතික තිබීම සඳහා ප්‍රමුඛතාව.

මෙම තනතුර සඳහා වයස් සීමාව, 2021 මැයි 04 වන දින වන විට අවුරුදු 40 ට අඩු විය යුතුය.

තෝරාගත් අයදුම්කරුහට පුළුල් පරාසයක වූ ආන්තික ප්‍රතිලාභ සහිතව ආකර්ෂණීය වැටුපක් හිමි වේ.

කරුණාකර, ඔබගේ සම්පූර්ණ ජීවදත්ත, සහිතකවල පිටපත් හා ඥාති නොවන තිර්දේශකයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා ඇමතුම් දුරකථන අංකයන් සමග පහත සඳහන් අය වෙත 2021 මැයි 04 වන දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

අදාළ අයදුම්පත බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

මානව සම්පත් හා පරිපාලන ප්‍රධානී,
සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම,
01 වන මහල, ඊ. එච්. කුරේ ගොඩනැගිල්ල, 411, ගාලුපාර,
කොළඹ 03.

සිළුමිණ JOBS

සිළුමිණ The Silumina රැකියා අතිරේකය

පුරප්පාඩු

යන්ත්‍ර ක්‍රියාකරු

ඒකල පිහිටි අප කර්මාන්ත ශාලාවේ සේවය සඳහා යන්ත්‍ර ක්‍රියාකරවන්නන් අවශ්‍යය. ඔබ වයස අවුරුදු 45 – 53 අතර, අ.පො.ස. (සා. පෙළ) සමත් අයෙක් නම් දින 10 ක් ඇතුළත පහත ලිපිනයට අයදුම් කරන්න.

ගම්පහ, මිනුවන්ගොඩ, ජාඇල අවට විශේෂයි.

UCL

කර්මාන්තශාලා කළමනාකරු
යුනියන් කෙමිකල්ස් ලංකා පී.එල්.සී.
4 වන මහල, සාරතී ගොඩනැගිල්ල,
නො. 50, හයිඩ් පාර්ක් කෝනර්,
කොළඹ 02.

හදිසි පුරප්පාඩු

හොරණ අපනයන සැකසුම් කලාපයේ පිහිටි මහා පරිමාණ කර්මාන්ත ශාලාවක් පහත පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

1. ජ්‍යෙෂ්ඨ නිෂ්පාදන සුපරීක්ෂක

සුදුසුකම්
- අවම වශයෙන් අවු. 10 පළපුරුද්දක් සහිත
- අපො.ස උසස් පෙළ සමත් සහ වසර 10 ක ආයතන පළපුරුද්ද තිබිය යුතුය.
- වයස අවු. 35 ට වැඩි
- නිපුණතාවය හ අත්දැකීම් අනුව වැටුප් සාකච්ඡා කරගත හැකිය.

2. පුහුණුවන යන්ත්‍ර ක්‍රියාකරු

සුදුසුකම්
- අපොස උසස් පෙළ සමත්
- වයස අවු. 23 ට අඩු
- පුහුණු කාලය මාස 03
- තාක්ෂණික දැනුම ඇත්නම් ප්‍රමුඛතාවයක් ලබාදෙනු ලැබේ.
- සාර්ථක ලෙස පුහුණු කාලය සම්පූර්ණ කිරීමෙන් පසු සේවය ස්ථිර කරනු ලැබේ.
- වැටුප් සාකච්ඡා කරගත හැක.

3. බර වාහන රියදුරු

සුදුසුකම්
- බර වාහන රියදුරු බලපත්‍රය තිබිය යුතුය.
- වයස අවු. 30 ට වැඩි විය යුතුය.
- වැටුප සාකච්ඡා කරගත හැක.

කරුණාකර පහත විද්‍යුත් තැපෑල මගින් අයදුම්පත් යොමුකරන්න.
nithyapaperlankahr@gmail.com

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

පුරප්පාඩු දැන්වීම සංශෝධනය කිරීම

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින

- ලිපිකරු යන්ත්‍ර ක්‍රියාකරු (පහළ ශ්‍රේණිය)
- ලිපිකරු විතු ශිල්පී

තනතුරු සඳහා අයදුම්පත් කැඳවමින් 2021.04.18 දින පිළිබඳ පුවත්පතෙහි පළ කරන ලද දැන්වීමට පහත සඳහන් සංශෝධන සිදු කෙරේ.

1. ලිපිකරු යන්ත්‍ර ක්‍රියාකරු (පහළ ශ්‍රේණිය) තනතුර සඳහා රු.42,590–18X615-53,660 [U-MN 3 (II)] වැටුප් පරිමාණය සහිත වන අතර බඳවා ගැනීමේ දී රු.42,590/- වැටුප් පියවරෙහි පිහිටුවනු ලැබේ.
2. මෙම තනතුරු සඳහා 2021.05.07 දින දැන්වා විවෘත විශ්වවිද්‍යාලයෙන් අයදුම්පත් ඉල්ලා යන හෙයි අදාර සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2021.05.13 දින හෝ එදිනට පෙර ලැබෙන සේ එවිය යුතුය.

2021.04.18 දින පළ කරන ලද දැන්වීමෙහි සඳහන් අනෙකුත් තොරතුරු හා කොන්දේසි නොවෙනස් ව පවතී.

අයදුම්පත් සහ විස්තර http://www.ou.ac.lk/vacancies/ වෙතින් ඉල්ලා ගත හැක.

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
නාවල, නුගේගොඩ

2021.04.25

University Web Site : www.ou.ac.lk

ඔබටත් රැකියා අවස්ථාවක් හා ආකර්ශනීය වැටුපක්

Sen-Saal

අප සොයන්නේ ඔබයි....
එන්න අප හා එක්වන්න....

පිරිසිදු කරන්නන් - රු 40,000 සිට ඉහලට
මුළුතැන්ගෙයි සහායක - රු 35,000 සිට ඉහලට
බේකරි ඩ්‍රේස්ට් සහායක - රු 35,000 සිට ඉහලට
බසින් - රු 40,000 සිට ඉහලට
වෙළඳ සහායක - රු 32,000 සිට රු 35,000
බුවර් - රු 40,000 සිට රු 45,000
ඉන්දියන් කෝකිවරු - රු 40,000 සිට ඉහලට
ආරක්ෂක භිළුධාරීන් - රු 35,000

කෑම, නවාතැන් පහසුකම් නොමිලේ.
පැමිණ විමසන්න. නැතිනම් අයදුම් පත්‍රය පහත ලිපිනයට අප වෙත එවන්න.
නො 267, කඩුවෙල පාර, බත්තරමුල්ල.
Email lrkak.hr.sensaal@gmail.com
TEL-011-2871497/0764-343031



21 වැනි සියවසට එළඹෙන යෞවනයට

නිරවුල් ගමන් මග

ඉදු-සරණ

පුරප්පාඩු

කැලණිය විශ්වවිද්‍යාලය

ලේඛකාධිකාරී තනතුර

කැලණිය විශ්වවිද්‍යාලය විසින් 2021 මැයි 17 දින දක්වා විශ්වවිද්‍යාලයීය ලේඛකාධිකාරී තනතුර සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලබයි.

සුදුසුකම් :

අ) ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු, වසර දහයකට (10) නොඅඩු පරිපාලන පළපුරුද්දක් ඇති, පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් පළමු හෝ දෙවන පන්ති සාමාර්ථයක් සමග පරිපාලනය හෝ කළමනාකරණය පිළිබඳ ආචාර්ය උපාධි මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබිය යුතුය.

හෝ

ආ) ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු වසර දෙළහකට (12) නොඅඩු පරිපාලන පළපුරුද්දක් ඇති, පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් පළමු හෝ දෙවන පන්ති සාමාර්ථයක් සමග පරිපාලනය හෝ කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති මට්ටමේ පශ්චාත් උපාධියක් (අවුරුදු 02කට නොඅඩු) ලබා තිබිය යුතුය.

හෝ

ඇ) කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක නියෝජ්‍ය ලේකම් / නියෝජ්‍ය ලේඛකාධිකාරී තනතුරේ වසර තුනක (03) සේවය සම්පූර්ණ කර, ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු වසර දහතරකට (14) නොඅඩු පරිපාලන පළපුරුද්දක් සමඟ, පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් පරිපාලනය හෝ කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් (වසර 1 කට නොඅඩු) තිබිය යුතුය. කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක U-EX2 (II) ශ්‍රේණියේ නියෝජ්‍ය ලේකම් / නියෝජ්‍ය ලේඛකාධිකාරී සහ / හෝ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී ලෙස ඉහත සඳහන් පළපුරුදු කාලයෙන් අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්දක් තිබිය යුතුය.

හෝ

ඈ) කොමිෂන් සභාවේ/උසස් අධ්‍යාපන ආයතනයක නියෝජ්‍ය ලේකම්/ නියෝජ්‍ය ලේඛකාධිකාරී තනතුරේ වසර තුනක (03) සේවය සම්පූර්ණ කර, ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු වසර පහළොවකට (15) නොඅඩු පරිපාලන පළපුරුද්දක් සමග, පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් පරිපාලනය හෝ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් (වසර 1 කට නොඅඩු) තිබිය යුතුය. කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක U-EX 2 (II) ශ්‍රේණියේ නියෝජ්‍ය ලේකම් / නියෝජ්‍ය ලේඛකාධිකාරී සහ / හෝ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී ලෙස ඉහත සඳහන් පළපුරුදු කාලයෙන් අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්දක් තිබිය යුතුය.

හෝ

ඉ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් උපාධියක් ලැබූ, කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක වසර තුනක (03) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු වසර පහළොවක (15) පරිපාලන පළපුරුද්ද ඇති නීතිඥයකු වීම. එයින් අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්ද කොමිෂන් සභාවේ/උසස් අධ්‍යාපන ආයතනයක නියෝජ්‍ය ලේකම්/ නියෝජ්‍ය ලේඛකාධිකාරී සහ/හෝ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්/ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී ස්ථරයේ U-EX 2 (II) ශ්‍රේණියේ ලබා තිබිය යුතුය.

හෝ

ඊ) පිළිගත් විශ්වවිද්‍යාලයකින්/උසස් අධ්‍යාපන ආයතනයකින් උපාධියක් ලැබූ, කොමිෂන් සභාවේ/උසස් අධ්‍යාපන ආයතනයක වසර දහ අටක (18) පරිපාලන පළපුරුද්ද ඇති (එයින් අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්ද නියෝජ්‍ය ලේකම්/නියෝජ්‍ය ලේඛකාධිකාරී ධුරයක ලැබ, සේවයෙහි ස්ථිර කරනු ලැබූ) නියෝජ්‍ය ලේකම්/නියෝජ්‍ය ලේඛකාධිකාරී ධුරයක සේවයේ නිරත වූවකු වීම.

සටහන "පරිපාලන පළපුරුද්ද" යන්නෙන් අදහස් වන්නේ පිළිගත් විශ්වවිද්‍යාලයකින්/උසස් අධ්‍යාපන ආයතනයකින් ප්‍රථම උපාධිය ලැබූ පසු, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරක හෝ රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ සංවිධානයක එයට සමාන තනතුරක මානව සම්පත් කළමනාකරණයෙහි හෝ සාමාන්‍ය පාලනයෙහි හෝ සමස්ත කළමනාකරණයෙහි ලැබූ පළපුරුද්ද වේ. මූල්‍ය/ඉංජිනේරු හෝ වෙනත් තාක්ෂණික ක්ෂේත්‍රයන්හි ලැබූ පළපුරුද්ද මේ සඳහා සලකා බලනු නොලැබේ.

වයස : අවුරුදු 45ට නොඅඩු විය යුතු ය. (රජයේ දෙපාර්තමේන්තු/රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල/ උසස් අධ්‍යාපන ආයතනයන්හි සේවයේ නියුතු වූවන්ට වයස් සීමාව අදාළ නොවේ.)

වැටුප් පරිමාණය : U-EX 3 (I) - Rs.104,000 - 3 X 2,170; 11 X 2,700 - මාසික 140,210/- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද දීමනා ද මෙයට අමතරව ගෙවනු ලැබේ.

වෙනත් ප්‍රතිලාභ

අ) පදිංචි ස්ථානයේ සිට රැකියා ස්ථානය දක්වා ප්‍රවාහන පහසුකම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා රෙගුලාසිවලට අනුකූලව සපයනු ලැබේ.

ආ) වසර හතක සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් පසු පූර්ණ වැටුපක් සහිතව වසරක කාලයක් සඳහා සප්ත වාර්ෂික නිවාඩු සඳහා හිමිකම් ලැබේ. සප්ත වාර්ෂික නිවාඩු සඳහා විදේශගත වන නිලධාරියකුට තමන් සඳහා මෙන් ම තම සහකරු හෝ සහකාරිය සඳහා ද ගමන් බලපත්‍ර හිමි වේ.

ඇ) 1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ ගෙවීමේ විධිවිධානවලට අනුකූලව පාරිතෝෂික ගෙවීම් සිදු කෙරේ.

ඈ) අර්ථසාධක අරමුදල සඳහා 10%ක දායකත්වයක් සේවකයා විසින් ද, විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල සඳහා 7%ක දායකත්වයක් සේවායෝජකයා විසින් ද දරනු ලැබේ.

ඉ) විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදලට 8%ක දායකත්වයක් සේවායෝජකයා විසින් දරනු ලැබේ.

ඊ) සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා 3%ක දායකත්වයක් සේවායෝජකයා විසින් දරනු ලැබේ.

අයදුම්පත සහ වැඩිදුර තොරතුරු විශ්වවිද්‍යාල වෙබ් අඩවිය වන www.kln.ac.lk වෙතින් බාගත කළ හැකිය. මෙම අයදුම්පත සමග සවිස්තරාත්මක ජීවදත්ත පත්‍රිකාව සහ වචන 1000කට නොඅඩු පෞද්ගලික ප්‍රකාශයක් ඇතුළත් විය යුතු අතර, වර්තමාන සේවා ස්ථානයේ දී අයදුම්කරුගේ කැපවීම සහ ආයතනික සංවර්ධනය සඳහා දක්වන දායකත්වය මෙන්ම ඔහු/ඇය ලේඛකාධිකාරී තනතුර දරමින් කැලණිය විශ්වවිද්‍යාලයේ ප්‍රගමනකාරී සංවර්ධනය සඳහා දායක වීමට අදහස් කරන ආකාරය ද එහි සඳහන් විය යුතුය.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ තනතුර සඳහන් කොට, අවසන් දිනට පෙර "උපකුලපති, කැලණිය විශ්වවිද්‍යාලය, දළුගම, කැලණිය" ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය / නැතහොත් පැමිණ භාරදිය යුතුය.

අයදුම්කරුවන් වරණ ලැයිස්තුගත කිරීමේ හිමිකම විශ්වවිද්‍යාලය සතු වේ. අවශ්‍යතාවන්ට අනුකූල නොවන, අසම්පූර්ණ හෝ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොර ව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

උපකුලපති,
කැලණිය විශ්වවිද්‍යාලය
දළුගම, කැලණිය.

2021.04.20

ශ්‍රී ලංකා ගුවන් හමුදාව

ගුවන් භට / ගුවන් කාන්තා පුරප්පාඩු

SRI LANKA AIR FORCE
GUARDIANS OF THE SKIES

නිත්‍ය / ස්වේච්ඡා ගුවන් භටයකු / ගුවන් කාන්තාවක ලෙසින් සෞභාග්‍යමත් දේශයක් ගොඩනැගීමට දායක වන්න...

මූලික සුදුසුකම්

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි
- අවිවාහක (ඉඳුරාම බඳවාගැනීම් විවාහක හෝ අවිවාහක)
- වයස පිරිමි : 18 - 24 අතර (ඉඳුරාම බඳවාගැනීම් 18 - 28 අතර)
  කාන්තා : 18 - 23 අතර (ඉඳුරාම බඳවාගැනීම් 18 - 26 අතර)
- පළුව : අඟල 32" නොඅඩු (පිරිමි)
- උස පිරිමි : 165.0cm (අඩි 05 අඟල 05) නොඅඩු
  කාන්තා : 162.2cm (අඩි 05 අඟල 03) නොඅඩු)
- බර පිරිමි : 17 < BMI < 26
  කාන්තා : 17 < BMI < 25
- දෘෂ්ටි තීක්ෂ්ණතාවය : එම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් සහ කාච රහිත)
- වර්ණ දෘෂ්ටිය : CP2

නිත්‍ය බඳවාගැනීම් සඳහා මූලික අධ්‍යාපන සුදුසුකම්

ගුවන්යානා සැකිලි ශිල්පී / යන්ත්‍ර ශිල්පී / විදුලි සහ මෙවලම් ශිල්පී / ආරක්ෂක උපකරණ ශිල්පී — පිරිමි / කාන්තා

සිංහල / දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක්ද, ගණිතය සහ විද්‍යාව යන විෂයන් සමඟ ඉන් ගණිතය හෝ විද්‍යාව යන විෂයන්ගෙන් එක් විෂයකට සමාන සාමාර්ථයක්ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

අවි ආයුධ ශිල්පී / මතුපිට කාර්මික ශිල්පී / ලෝහ නහඩු කාර්මික ශිල්පී / රථවාහන කාර්මික ශිල්පී / සාමාන්‍ය යාන්ත්‍රික ශිල්පී / ලියවන පට්ටල් ශිල්පී / යාන්ත්‍රික වඩු කාර්මික ශිල්පී / ගුවන් ජායාරූප ශිල්පී / ගුවන්යානා ගිනියම් පෑස්සුම් ශිල්පී — පිරිමි

සිංහල / දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සහිතව ගණිතය, විද්‍යාව යන විෂයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. ගණිතය හෝ විද්‍යාව විෂයන්ගෙන් එක් විෂයක් සඳහා සමාන සාමාර්ථයක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

ගඟන ගුවන් විදුලි කාර්මික ශිල්පී — පිරිමි / කාන්තා
විදුලි සංනිවේදන කාර්මික ශිල්පී — පිරිමි

සිංහල / දෙමළ, ඉංග්‍රීසි, ගණිතය සහ විද්‍යාව යන විෂයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක්ද ඉන් ගණිතය හෝ විද්‍යාව යන විෂයන්ගෙන් එක් විෂයකට සමාන සාමාර්ථයක්ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

ගුවන් විදුලි සංනිවේදක / දුරකථන ක්‍රියාකරු / භෝජනාගාර සහයක — පිරිමි / කාන්තා
ගිනි නිවන්නා / සලාක සහයක / ශාරීරික අභ්‍යාස පුහුණුකරු — පිරිමි

සිංහල / දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයකින් (06) අ.පො.ස (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

පරිපාලන සහයක / පොලිස් — පිරිමි / කාන්තා

සිංහල / දෙමළ, ඉංග්‍රීසි සහ ගණිතය යන විෂයයන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. පොලිස් වෘත්තිය සඳහා උස අඩි 5 අඟල 8ට නොඅඩු පිරිමි හා අඩි 5 අඟල 6ට නොඅඩු කාන්තා අයවළුන් භට බඳවා ගැනීමේ දී ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.

හෙදි සහයක / දන්ත සහයක — පිරිමි / කාන්තා

සිංහල / දෙමළ, ගණිතය, විද්‍යාව සහ වෙනත් එක් විෂයකට සමාන සාමාර්ථයක් සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයකද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

මෙහෙයුම් භූමි / මෙහෙයුම් තෑම් — පිරිමි

සිංහල / දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

මෙහෙයුම් ගුවන් — පිරිමි

සිංහල / දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් සහ ඉංග්‍රීසි භාෂාව සඳහා සමාන සාමාර්ථයකද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

යාන්ත්‍රික කාර්මික ශිල්පී / ඉදිකිරීම් උපකරණ කාර්මික ශිල්පී / විදුලි කාර්මික ශිල්පී / වායු සමීකරණ සහ ශීතකරණ කාර්මික ශිල්පී — පිරිමි

සිංහල / දෙමළ, ඉංග්‍රීසි භාෂාවන්ට සහ ගණිතය / විද්‍යාව යන විෂයයන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයකින් (06) අ.පො.ස (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

සැපයුම් සහයක

ගුවන්යානා ඉන්ධන සැපයුම්කරු — පිරිමි / කාන්තා
පිරිමි

සිංහල / දෙමළ සහ ඉංග්‍රීසි විෂයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක්ද, ගණිතය / විද්‍යාව / ව්‍යාපාර හා ගිණුම්කරණය යන විෂයයන්ගෙන් එක් විෂයක් සඳහා සමාන සාමාර්ථයක්ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

ගිණුම් සහයක — පිරිමි / කාන්තා

සිංහල / දෙමළ සහ ඉංග්‍රීසි විෂයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක්ද, ගණිතය / ව්‍යාපාර හා ගිණුම්කරණය යන විෂයයන්ගෙන් එක් විෂයක් සඳහා සමාන සාමාර්ථයක්ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

නර්තන ශිල්පී — කාන්තා

සිංහල / දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයකින් (06) අ.පො.ස (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

ඉඳුරාම බඳවාගැනීම් සඳහා මූලික අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම්

ගඟන ගුවන් විදුලි කාර්මික ශිල්පී / විදුලි සංනිවේදන කාර්මික ශිල්පී — පිරිමි

සිංහල / දෙමළ, ඉංග්‍රීසි, ගණිතය සහ විද්‍යාව යන විෂයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක්ද ඉන් ගණිතය හෝ විද්‍යාව යන විෂයන්ගෙන් එක් විෂයකට සමාන සාමාර්ථයක්ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය විසින් පිළිගත කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද පුරාණකාලීන දෑ අවුරුදු ඉංජිනේරු ශිල්පීය ජාතික සහතිකය (විදුලි සංදේශ / ඉලෙක්ට්‍රොනික) හෝ වෙනත් පිළිගත කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද පුරාණකාලීන දෑ අවුරුදු (විදුලි සංදේශ / ඉලෙක්ට්‍රොනික) පාඨමාලා සහතිකයක් තිබිය යුතුය. ජාතික වෘත්තීය සුදුසුකම් අදියර IV (NVQ Level-IV) සහතිකයක තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

විගණන සහයක — පිරිමි

සිංහල / දෙමළ, ඉංග්‍රීසි, යන භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක්ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. තවද අපොස (උ.පෙළ) විභාගය වාණිජ විෂය ධාරාවන් තුළින් සමත්ව තිබිය යුතුය.

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ (SLIATE) උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව (HNDA) දෙවන වසර සම්පූර්ණ කර තිබීම හෝ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ (SLIATE) උසස් ජාතික ව්‍යාපාර මූල්‍ය ඩිප්ලෝමාව සම්පූර්ණ කර තබීම (HNDBF) සහ විගණනය පිළිබඳ රජයේ හෝ පෞද්ගලික අංශයේ පළපුරුද්ද ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

සැලසුම් ශිල්පී — පිරිමි

සිංහල / දෙමළ, ඉංග්‍රීසි, යන භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක්ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. පාසල් තාක්ෂණික සහතිකය ඉංජිනේරු සැලසුම් ශිල්පී පූර්ණ කාලීන එක් අවුරුදු පාඨමාලාව සමත්ව තිබීම සහ වෘත්තීයය වසර දෙකක (02) සේවා පළපුරුද්ද තිබීම.

වැඩ මූලික (සිවිල් / විදුලි / යාන්ත්‍රික) — පිරිමි

සිංහල / දෙමළ, ඉංග්‍රීසි, යන භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක්ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. පාසල් තාක්ෂණික සහතිකය අර්ධ කාලීන තුන් අවුරුදු පාඨමාලාව හෝ රජයේ වෙනත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද රට සමාන සුදුසුකම් ඇති පාඨමාලාවක් සමත්ව තිබීම සහ වෘත්තීය වසර දෙකක (02) සේවා පළපුරුද්ද තිබීම.

රථවාහන කාර්මික ශිල්පී - ස්වේච්ඡා — පිරිමි

සිංහල / දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සහිතව ගණිතය, විද්‍යාව යන විෂයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම සහ ගණිතය හෝ විද්‍යාව යන විෂයන්ගෙන් එක් විෂයකට සමාන සාමාර්ථයක් ලබා තිබිය යුතුය. තවද අපොස (උ.පෙළ) විභාගය ජීව විද්‍යාව / භෞතික විද්‍යාව හෝ තාක්ෂණ විෂය ධාරාවන්ගෙන් තුළින් තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

රජයේ හෝ රජයේ ලියාපදිංචි පෞද්ගලික ආයතනයක මෝටර් රථ කාර්මික ශිල්පී, මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී, මෝටර් රථ වායුසමීකරණ කාර්මික ශිල්පී, මෝටර් සයිකල් හා ත්‍රිරෝද රථ කාර්මික ශිල්පී යන එක් පාඨමාලාවක් තුළින් එ පිළිබඳව පිළිගත ආයතනයක පළපුරුද්ද තිබිය යුතුය.

අධ්‍යාපන සහයිකා (පෙරපාසල්) - ස්වේච්ඡා — කාන්තා

සිංහල / දෙමළ, ඉංග්‍රීසි, යන භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක්ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

රජයේ පිළිගත් ආයතනයකින් වසරකට නොඅඩු පෙරපාසල් ඩිප්ලෝමා පාඨමාලාවක් තුළින් පෙරපාසල් ගුරු වෘත්තියේ අවම වශයෙන් වසරක සේවා පළපුරුද්ද ලබා තිබිය යුතුය. ඉංග්‍රීසි භාෂා නිපුණතාවය (කථන හැකියාව) සහ ප්‍රායෝගික කලා හැකියාව (ගායනය, වාදනය, සහ නර්තනය) අමතර සුදුසුකම් ලෙස සැලකේ.

වැටුප් හා දීමනා

- දීමනා සමඟ මාසික වැටුප රු. 57,870/- (උසස්වීම් අනුව වැටුප වැඩිවීම්)
- විවාහකයින් සඳහා රු. 23,350/- ක ආහාර සහ ගෙවල්කුලී දීමනා
- ආහාර සහ නවාතැන්
- නිදි ඇඳුම්
- වෛද්‍ය පහසුකම්
- ගුවන් සහ ගොඩබිම් ප්‍රවාහන
- වෘත්තීය පාඨමාලා
- දේශීය සහ විදේශීය පුහුණු
- රක්ෂණාවරණ
- නිවාඩු නිකේතන
- විශ්‍රාම වැටුප් රක්ෂණ
- සුභසාධන සහ ක්‍රීඩා පහසුකම්

වැඩි විස්තර සඳහා 2021 අප්‍රේල් මස 30 වන දිනැති රජයේ ගැසට් පත්‍රය සහ www.documents.gov.lk වෙබ් අඩවිය බලන්න.

2021 මැයි 15 දිනට පෙර අයදුම් කරන්න

විමසීම්
011 2 495 900
www.airforce.lk

විධායක ආධුනිකයින් බඳවා ගැනීමේ නිලධාරී
ශ්‍රී ලංකා ගුවන් හමුදාව
කොටුගොඩ

facebook
Sri Lanka Air Force Recruiting

අන්තර්ජාලය හරහා අයදුම් කිරීමට
www.airforce.lk හෝ http://airforce.observerjobs.lk

සිළුමිණ JOBS

සිළුමිණ The Silumina

රැකියා අතිරේකය

MAG — Vacancies – Senior Mechanic & 02 X Mechanics

(Position based in Northern/Eastern Province)
(Fixed Term Contract Position)

The Mines Advisory Group (MAG) is a British non-governmental organization registered as a Charity undertaking humanitarian mine action around the world. MAG is working to save lives and build futures in Sri Lanka by reducing the risk presented by remnants of conflict. As part of MAG's commitment to safeguarding, this post is subject to background checks before an offer is confirmed.

MAG Sri Lanka is seeking applications from suitable candidates to fill 1 **vacancy** for post of Senior Mechanic & 02 **vacancies** for post of mechanics.

Senior Mechanic (Northern/Eastern Province)

Qualifications and Experience

- Minimum certificate level qualification in Light and Heavy vehicle/Construction Equipment repairs and maintenance from a recognized Institution.
- Experience in mechanical, electrical, hydraulic repairs and maintenance.
- 4 - 5 years' experience in a similar position.

Other Requirements

- Ability to work in field on a roster with 21-24 days' work cycle in a month.
- Flexible to work long hours when required.
- Performs maintenance tasks in Light vehicles and Heavy Equipment with advanced mechanical repairs such as engine, transmission, power train, hydraulic/undercarriage systems and their components.
- Ensure to diagnose of mechanical, electrical, computerized problems in heavy equipment and carry out repairs promptly in line with safety protocols and procedures.
- Monitor/perform fabrication and electric welding required.
- Management of 5 – 8 mechanics.
- Provide required mechanical/electrical/other training required for other team members' relevant methods, materials, tools, and techniques used in commercial and heavy equipment/vehicles repairs and maintenance.

Areas of experience

- Painting and body work.
- Mechanical designing and fabrication.
- Repairs and maintenance on electrical systems.
- Computerized induction/ignition systems.
- Mobile air conditioning systems.
- Maintenance of Records & prepare Reports.
- Air and hydraulic systems .
- Overhead and mobile crane operation.
- Tie-down, rigging, and lifting operation.
- Two-way and wireless communication.
- Procurement of tools and measuring devices.
- Support workplace safety through following safety protocols.

Mechanic (Northern/Eastern Province)

Essential Skills & Requirements

- Should have at least a certificate level qualification in Heavy vehicle/Construction Equipment repairs and maintenance from a recognized Institution.
- Minimum 1-2 years' experience on mechanical, electrical, hydraulic repairs and maintenance.
- Preference will be given to heavy equipment machanics and automobile mechanics.
- Preferable given for Mechanics with welding skills.
- MAG operates on a 21-day rotational 3 weeks continuous work cycle and be prepared work away from home.
- Accommodation Allowance will be provided to find accommodation.

Salary will be based upon the MAG Salary Scale on a fixed term contract.

Please submit a CV to: Human Resources Coordinator: recruitment.lk@maginternational.org (Include position applied in the subject line) or postal applications to Human Resources Officer, MAG Central Operating Base,242 Mannar Road, Nelukkulam, Vavuniya. **Deadline: 4:00pm Sunday 2nd May 2021**

www.maginternational.org

MAG is an equal opportunity employer. Women are highly encouraged to apply the above post

ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම

පුරප්පාඩු

ලේක්හවුස් නමින් ප්‍රචලිත ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම ශ්‍රී ලංකාවේ මුද්‍රිත මාධ්‍යයේ මහගෙදර සහ හදවතයි.

වසර 100 කට අධික ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකාවේ පුරෝගාමී මුද්‍රිත මාධ්‍ය ආයතනය මාර්ගගත ප්‍රකාශනයේ වසර 25 ක් තිරත වී ඇති අතර, මුද්‍රිත මාධ්‍ය කර්මාන්තයේ තවදුරටත් අංක එක ස්ථානය දරයි.

පහත සඳහන් තනතුරු සඳහා මතු දැක්වෙන සුදුසුකම් හා පළපුරුද්ද සතු තරුණ හා ක්‍රියාශීලී අයවළුන් හට අපි විසින් ආරාධනය කරනු ලැබේ.

ග්‍රැෆික් නිර්මාණකරු (තනතුරු 01)		
අධ්‍යාපනික සුදුසුකම්	★	සම්මාන සාමාර්ථ 03 ක් සහිතව විෂයන් හයකින් (06) අ.පො.ස. සා.පෙළ සමත් විය යුතුය.
වෘත්තීය සුදුසුකම්	★	ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ හෝ වෙනත් රජය පිළිගත් ආයතනයක ග්‍රැෆික් නිර්මාණකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සාර්ථකව නිම කිරීම.
සේවා පළපුරුද්ද	★	පිළිගත් මුද්‍රණ ආයතනයක ග්‍රැෆික් නිර්මාණකරුවකු ලෙස වසර 03 ක පළපුරුද්ද.
පොත් බැඳුම්කරු (තනතුරු 02)		
අධ්‍යාපනික සුදුසුකම්	★	සම්මාන සාමාර්ථ 03 ක් සහිතව විෂයයන් හයකින් (06) අ.පො.ස. සා/පෙළ සමත්විය යුතුය.
වෘත්තීය සුදුසුකම්	★	ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ හෝ වෙනත් රජය පිළිගත් ආයතනයක පොත් බැඳීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සාර්ථකව නිමා කිරීම
සේවා පළපුරුද්ද	★	පිළිගත් මුද්‍රණ ආයතනයක පොත් බැඳුම්කරුවකු ලෙස වසර 03 ක පළපුරුද්ද.
CTP ක්‍රියාකරු (තනතුරු 01)		
අධ්‍යාපනික සුදුසුකම්	★	සම්මාන සාමාර්ථ 03 ක් සහිතව විෂයයන් හයකින් (06) අ.පො.ස. සා. පෙළ සමත්විය යුතුය.
වෘත්තීය සුදුසුකම්	★	ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ හෝ වෙනත් රජය පිළිගත් ආයතනයක CTP ක්‍රියා කිරීම සම්බන්ධයෙන් සහතික පත්‍ර පාඨමාලාවක් සාර්ථකව නිමා කිරීම
සේවා පළපුරුද්ද	★	පිළිගත් මුද්‍රණ ආයතනයක CTP ක්‍රියාකරුවෙකු ලෙස වසර 03 ක පළපුරුද්ද.
ගිලටින් කටර් (තනතුරු 01)		
අධ්‍යාපනික සුදුසුකම්	★	සම්මාන සාමාර්ථ 03 ක් සහිතව විෂයයන් හයකින් (06) අ.පො.ස. සා. පෙළ සමත්විය යුතුය.
සේවා පළපුරුද්ද	★	පිළිගත් මුද්‍රණ ආයතනයක ගිලටින් කටර් ලෙස වසර 03 ක පළපුරුද්ද.
ලෙටර් ප්‍රෙස් මැෂින් මයින්ඩර් (තනතුරු 01)		
අධ්‍යාපනික සුදුසුකම්	★	සම්මාන සාමාර්ථ 03 ක් සහිතව විෂයයන් හයකින් (06) අ.පො.ස. සා/පෙළ සමත්විය යුතුය.
සේවා පළපුරුද්ද	★	පිළිගත් මුද්‍රණ ආයතනයක ලෙටර් ප්‍රෙස් මැෂින් මයින්ඩර්වරයෙකු ලෙස වසර 03 ක පළපුරුද්ද තිබිය යුතුය.

වයස : අවුරුදු 35 ට අඩු විය යුතුය.

වැටුප : සාකච්ඡා කරගත හැකිය

කරුණාකර ඔබගේ ජීවදත්ත ඥතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් හා විමසීම් විස්තර සමග මෙම දැන්වීම පළවී වැඩකරන දින 7 ක් ඇතුළත පහත ලිපිනයට හෝ විද්‍යුත් ලිපිනයට යොමු කරන්න. ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතු අතර, විද්‍යුත් තැපැලේ විෂයය යන තීරයේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

LAKE HOUSE

ප්‍රධානී / මානව ප්‍රාග්ධන,
ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම,
නො. 35, ඩී.ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.
dgm.hc@lakehouse.lk

රාජගිරිය (Car Wash) කාන්තාවන් සඳහා පමණයි

රාජගිරියේ Service Center (Car Wash) එකක සේවය කිරීම සඳහා වයස අවු. 20 ට වැඩි (පුහුණු / නුපුහුණු) කාන්තාවන් අවශ්‍යයි.

(ඉන්ටීරිය ක්ලිනින්, වැක්ෂින්, ෆිනිහින්) මෙම කටයුතු සඳහා පමණයි. පුහුණුව අප ආයතනය විසින් ලබාදෙනු ලැබේ. නවාතැන් පහසුකම්, ආහාර පාන සමග ඉහළ වැටුප්.

075-4047777

මැණික් කපන්නන් සහ කැලිබ්‍රේටින් කරන්නන් සඳහා ඇබෑර්තු

ජනාධිපති සම්මානලත් අතගෙන ජාතික ප්‍රසිද්ධියක් දරන කොළඹපිටියේ අප අප ආයතනය අවුරුදු 3 කට වැඩි පළපුරුද්දක් හා ඉහළ කුසලතා සහිත දක්ෂ මැණික් කපන්නන් සහ කැලිබ්‍රේටින් කිරීමේ හැකියාව ඉන් අයදුම්කරුවන් අවශ්‍යයි.

- වයස අවුරුදු 35ට අඩු විය යුතුයි.
- ඇදහිලිවන්තයි සමත් මැණික් කැපීමේ විධාන පදනම්වද මැණික් වර්ගය සඳහන් කරන්න

සියළුම පෙර සේවා විස්තරද ඇතුලත් ඔබගේ අයදුම්පත

නො, 14, කාල්විල් පෙදෙස, කොළඹ
හෝ
eclpvt@gmail.com ලිපිනයට යොමු කරන්න

සවුදි රැකියා ඇබෑර්තු

තනතුර	වැටුප
ට්‍රක් රියදුරත්	SR 1200 - SR 1300
කම්කරු	SR 950
බර යන්ත්‍ර ක්‍රියාකරුවන් (Loader/ Dozer/ Motor Grader/ Asphalt Plant Paver Operator)	SR 1300 - SR 1600

නවාතැන්, වෛද්‍ය පහසුකම්, ආපසු පැමිණීමේ ගුවන් ටිකට්පත් නොමිලේ.

ආහාර සඳහා SR 200 ක දීමනා.
කොන්ත්‍රාත් කාලය අවුරුදු 02 යි.

සම්මුඛ පරීක්ෂණ දිනපතා පවත්වනු ලැබේ.

සොනැක් ලංකා විදේශ රැකියා ආයතනය
නො.57 (දෙවන මහල), ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10.
දුරකථන : 0115-684143 / 0714-803816/ 0716-790488
ඊමේල් : sonaklanka@gmail.com / info@sonaklanka.com
Web : www.sonaklanka.com / License No. 1455

AL/**1455/11/19**
AL/**1455/03/21**, AL/**1455/04/21**

ටෙක්නිෂියන්වරු අවශ්‍යයි

ඉලෙක්ට්‍රොනික්ස් ටෙක්නිෂියන්වරු බඳවා ගනු ලැබේ.

අප්‍රේල් 27, 28, 29, 30 දිනයන් හි ඔබගේ අයදුම්පත සමග උදේ 8.00 සිට 12.00 දක්වා පහත ලිපිනයට පැමිණෙන්න.

නැතිනම් අයදුම්පත් පහත ඊ-මේල් ලිපිනයට යොමු කරන්න.

maruchi@sltnet.lk

දුරකතනඃ 0112855571

නිපෝන් මිරුවේ ලංකා ඉලෙක්ට්‍රොනික්ස් (පුද්ගලික) සමාගම
133, UDA කර්මාන්ත පුරය, කටුවාන පාර, හෝමාගම.

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

රැකියා ඇබෑර්තු

තාක්ෂණ නිලධාරී (ICT), III ශ්‍රේණිය

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය විසින් ඉහත තනතුර සඳහා සුදුසුකම්ලත් පුද්ගලයින්ගෙන් 25.05.2021 දක්වා අයදුම්පත් ලබා ගැනේ.

සුදුසුකම් :

1. ඕනෑම විෂය ධාරාවකින් එකවරකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ විෂයන් තුනකින් (3) සමත්වී තිබිය යුතුය

   සහ

2. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව හෝ පිළිගත් ආයතනයක් විසින් අනුමත තොරතුරු සන්නිවේදන හා බහුමාධ්‍ය තාක්ෂණය/තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය/තොරතුරු හෝ සමාන ක්ෂේත්‍රයක NVQ මට්ටම 5 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා ගෙන තිබීම.

- තොරතුරු සහ සන්නිවේදන ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද ඇති අයවලුන් සඳහා වැඩි ප්‍රමුඛතාවයක් හිමිවනු ඇත.

වැටුප් පරිමාණ : U-MT 1(IIIA) - Rs. 31,625 – 7X300; 10X355 –37,275 p.m.

තෝරාගැනීමේ ක්‍රමවේදය : ලිඛිත සහ/හෝ ප්‍රායෝගික පරීක්ෂණයකින් සහ සම්මුඛ පරීක්ෂණයකින්.

වයස : වයස අවුරුදු18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

සටහන : රජයේ දෙපාර්තමේන්තු/රජය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ තියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

ප්‍රතිලාභ

➢ තෝරාගත් අයදුම්කරුවන්ගේ මාසික වැටුපෙන් 10% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට බැර කරන අතර, විශ්වවිද්‍යාලය විසින් 15% ක දායකත්වයක්, වැටුපෙන් 8% ක කොටසක් විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදලට සහ 7% ක කොටසක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට ලෙස දායකත්වය කරනු ලැබේ. තවද ඔවුන් සේවක භාරකාර අරමුදලේ සාමාජිකත්වය දරණ අතර, ඒ සඳහා විශ්වවිද්‍යාලය විසින් මාසික වැටුපෙන් 3% ක කොටසක් සේවක භාරකාර අරමුදල වෙනුවෙන් දායකත්වයක් දරනු ලැබේ.

අයදුම්පත් සහ විස්තර

අයදුම්පත් , අවශ්‍ය සුදුසුකම් සහ අනෙකුත් විස්තර www.seu.ac.lk යන විශවවිද්‍යාල වෙබ් අඩවියෙන් ලබා ගත හැක. උනන්දුවක් දක්වන අයදුම්කරුවන් අයදුම්පතක් සඳහා රු 200 මුදලක් ගෙවීමෙන් විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් බාගත කරගත හැක.

අයදුම්පත් ගාස්තු මහජන බැංකුවේ ඕනෑම ශාඛාවක් මඟින් ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ නමට මහජන බැංකුවේ අඩ්ඩාලච්චේන ශාඛාවේ 228-1001-9000-1704 දරණ ගිණුම් අංකයට බැර වෙන පරිදි ගෙවීම් සිදු කළ යුතුය.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් සහ සහතිකවල පිටපත් ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාල උද්‍යානය, ඕලුවිල් # 32360 යන ලිපිනයට 25.05.2021 දිනට හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය. ඉල්ලුම් කරන ලද තනතුරේ නම ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය.

රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනවල සේවකයින් වන අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානීන් හරහා තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.නමුත් අයදුම්පතේ ප්‍රගමණ පිටපතක් (Advance Copy) අයදුම් කරුවන්ට මූලිකව එවීමේ හැකියාව ඇත. කෙසේ වෙතත්, අදළ ආයතනයේ ප්‍රධානියා හරහා අයදුම්පත් ඉදිරිපත්කර නොමැති නම්, එවැනි අයදුම්කරුවෙකු පත්වීම සඳහා සලකා බලනු නොලැබේ.

අසම්පූර්ණ සහ සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් හෝ අයදුම්පත් බාරගන්නා අවසාන දිනට පසු ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අපේක්ෂකයින් තෝරා ගැනීමේ අවසන් කෙටි ලේඛනය සකස් කිරීමේ අයිතිය ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය සතු වන අතර, සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලබන්නේ කෙටි ලේඛනයේ ලැයිස්තුගත අයදුම්කරුවන් පමණි..

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය
විශ්වවිද්‍යාල උද්‍යානය, ඕලුවිල් # 32360

20.04.2021

www.adz.lk
it's what you want

මුදල් අමාත්‍යාංශය
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

දැන්වීමයි

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාල හා අවට කාර්යාලයන් නව ස්ථානයක ස්ථාපනය කිරීම පිළිබඳ දැනුම් දීම

නාරාහේන්පිට සමිතරු මහ ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යාලය හා අවට ගොඩනැගිලි කිහිපයක පවත්වාගෙන යනු ලැබූ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ කාර්යාලයන් මේ වනවිට නාරාහේන්පිට මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ දකුණට වන මහල, වසවන මහල, වසවක්වන මහල, වසදෙවන මහල හා වසතුන්වන මහල්වල ස්ථාපනය කර ඇති බව දැනුම් දෙමු. ඒ අනුව නව කාර්යාලයන්හි තොරතුරු පහත පරිදි වේ.

ලිපිනය - සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
හැ.පෙ 807 (මහල් 19-23), මෙහෙවර පියෙස, නාරාහේන්පිට, කොළඹ 05

පොදු දුරකථන අංක -

011 - 774 7200	011 - 258 1704	011 - 236 9116	011 - 236 9038	011 - 236 9106	011 236 8542	011 - 236 8163
011 - 774 7800	011 - 236 9897	011 - 236 9056	011 - 236 9057	011 - 236 8162	011 236 9120	

සෙසු දුරකථන අංක -

01.	සභාපති / ප්‍රධාන විධායක නිලධාරි		011 - 774 7201
02.	සාමාජිකාරී		011 - 774 7204
03.	නියෝජ්‍ය සාමාජිකාධිකාරී	(රැස්කිරීම් හා සේවායෝජක සම්බන්ධතා)	011 - 774 7244
04.	නියෝජ්‍ය සාමාජිකාධිකාරී	(අභ්‍යන්තර විගණන)	011 - 774 7283
05.	නියෝජ්‍ය සාමාජිකාධිකාරී	(ආයෝජන)	011 - 774 7298
06.	නියෝජ්‍ය සාමාජිකාධිකාරී	(මූල්‍ය)	011 - 774 7250
07.	නියෝජ්‍ය සාමාජිකාධිකාරී	(සාමාජික සේවා)	011 - 774 7225
08.	නියෝජ්‍ය සාමාජිකාධිකාරී	(පරිපාලන හා මානව සම්පත්)	011 - 774 7240
09.	සහකාර සාමාජිකාධිකාරී	(මුද්‍රණ)	011 - 774 7814
10.	සහකාර සාමාජිකාධිකාරී	(දායක මුදල් රැස්කිරීම්)	011 - 774 7265
11.	සහකාර සාමාජිකාධිකාරී	(කළමනා 01)	011 - 774 7297
12.	සහකාර සාමාජිකාධිකාරී	(සිසි)	011 - 774 7268
13.	වැඩබලන සහකාර සාමාජිකාධිකාරී	(සාමාජික සේවා)	011 - 774 7259
14.	කළමනාකරු	(අභ්‍යන්තර විගණන)	011 - 774 7284
15.	කළමනාකරු	(ප්‍රතිලාභ පරිපාලන)	011 - 774 7234
16.	කළමනාකරු	(ප්‍රතිලාභ)	011 - 774 7230
17.	කළමනාකරු	(ප්‍රතිලාභ තීරණය කිරීම)	011 - 774 7226
18.	කළමනාකරු	(සාමාජික ගිණුම් ඉබා සාණ්ඩය)	011 - 774 7254
19.	මූල්‍ය කළමනාකරු	(ප්‍රතිලාභ ගෙවීම්)	011 - 774 7224
20.	කළමනාකරු	(සාමාජික ගිණුම් විශාල සාණ්ඩය)	011 - 774 7216
21.	විදුලි බංකුකරණය අංශය		011 - 774 7215
22.	කළමනාකරු	(සිසි)	011 - 774 7269 / 011 - 74 7270
23.	කළමනාකරු	(නිවාස රැකියා)	011 - 774 7249
24.	කළමනාකරු	(දිස්ත්‍රික් කාර්යාලය - කොළඹ)	011 - 774 7288
25.	කළමනාකරු	(දිස්ත්‍රික් කාර්යාලය 1-7)	011 - 774 7295
26.	කළමනාකරු	(දිස්ත්‍රික් කාර්යාලය 8-15)	011 - 774 7279
27.	කළමනාකරු	(දායක මුදල් රැස්කිරීම්)	011 - 774 7260 / 011 -774 7263
28.	කළමනාකරු	(අධිකාර)	011 - 774 7266
29.	කළමනාකරු	(පරිපාලන හා මානව සම්පත්)	011 - 774 7237 / 011 - 774 7238 / 011 - 774 7239
30.	කළමනාකරු	(මූල්‍ය)	011 - 774 7251
31.	කළමනාකරු	(ගිණුදායිතා)	011 - 774 7222
32.	කළමනාකරු	(ප්‍රසම්පාදන)	011 - 774 7236
33.	කළමනාකරු	(තොරතුරු තාක්ෂණ)	011 - 774 7805 / 011 - 774 7807
34.	කළමනාකරු	(ආයෝජන)	011 - 774 7299 / 011 - 774 7815 / 011 - 774 7816

සභාපති/ප්‍රධාන විධායක නිලධාරි
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
හැ.පෙ 807 (මහල් 19-23), මෙහෙවර පියෙස, නාරාහේන්පිට, කොළඹ 05

ලංසු කැඳවීමයි

වාණිජ පුපුරණ ද්‍රව්‍ය ගිනි අවි සහ පතරොම් මිලදී ගැනීමේ ඒකකය වැලිසර, රාගම වෙත පුපුරණ ද්‍රව්‍ය ප්‍රසම්පාදනය කිරීම

01. දේශීය සහ විදේශීය සැපයුම්කරුවන් වෙතින් වාණිජ පුපුරණ ද්‍රව්‍ය, ගිනි අවි සහ පතරොම් මිලදී ගැනීමේ ඒකකය (CEFAP Unit) වෙත පහත සඳහන් පුපුරණ ද්‍රව්‍ය ප්‍රසම්පාදනය කිරීම සඳහා ලංසු ආරාධනා පත්‍රයේ තුන්වන කොටසේ (Section III) හි සඳහන් සුදුසුකම් සපුරාලිය හැකි සැපයුම්කරුවන්ගෙන් පමණක් මුද්‍ර තැබූ ලංසු කැඳවනු ලැබේ.

කොන්ත්‍රාත් අංක CEFAP/PRT/06/2020 (VOL 1) - විදුලි ඩෙටොනේටර් **(4 Mtr)** අංක 1,500,000

02. ලංසු කැඳවීම ජාත්‍යන්තර තරගකාරී ලංසු කාර්යය පටිපාටිය අනුකූලව සිදු කරනු ලැබේ.

03. මේ සඳහා උනන්දුවක් දක්වන දේශීය හා විදේශීය සැපයුම්කරුවන් හට අවශ්‍ය වැඩිදුර තොරතුරු වැලිසර, රාගම පිහිටි වාණිජ පුපුරණ ද්‍රව්‍ය, ගිනි අවි සහ පතරොම් මිලදී ගැනීමේ ඒකකයේ මිලදී ගැනීමේ නිලධාරීගෙන් **දුරකථන අංක** 0112958227 හෝ අධ්‍යක්ෂ වාණිජ පුපුරණ ද්‍රව්‍ය , ගිනි අවි සහ පතරොම් මිලදී ගැනීමේ ඒකකය (**දුරකථන අංක** 0112 955514) වෙතින් ලබාගත හැකිවේ.

04. එක් එක් කොන්ත්‍රාත්තුව සඳහා වෙන වෙනම ලංසු ලේඛන මිලදී ගත යුතුය.

05. අධ්‍යක්ෂ, වාණිජ පුපුරණ ද්‍රව්‍ය , ගිනි අවි සහ පතරොම් මිලදී ගැනීමේ ඒකකය, වැලිසර, රාගම වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර ආපසු නොගෙවන **රු. 4,500.00 ක** ගාස්තුවක් මුදලින් ගෙවා 2021 **අප්‍රේල් මස 26 වන දින සිට 2021 ජූනි මස 07 දක්වා** සතියේ වැඩ කරන දිනයන්හිදී 0900 **පැයේ සිට** 1600 **පැය** දක්වා ලංසු ලේඛණ මිලදී ගත හැක. (විදේශීය සැපයුම්කරුවන් විසින් දේශීය නියෝජිතයකු මේ සඳහා පත්කළ යුතුය)

06. ලංසු විවෘත කරන දින සිට **දින 120 ක** කාල සීමාවක් සඳහා ලංසු වලංගුතාවය පැවතිය යුතු අතර, සියලු ලංසු සඳහා කොන්දේසි විරහිත ලංසු සුරක්ෂණයක් (Bid Bond) ඉදිරිපත් කළ යුතුය. අදළ ලංසු සුරක්ෂණය ලංසු විවෘත කිරීමේ දින සිට **දින 148 ක** කාල සීමාවක් සඳහා වලංගු විය යුතුය. (එම ලබා ගන්නා ලද ලංසු සුරක්ෂණය දේශීය වාණිජ බැංකුවක් මගින් ලබා දීමට කටයුතු කළ යුතුය)

07. ඇණවුම්පත පිරිනැමීමත් සමග අදළ සැපයුම්කරු විසින් බදු රහිත ලංසු වටිනාකමින් 10% වටිනාකමට සමාන කොන්දේසි විරහිත කාර්යය සාධන සුරක්ෂණයක් (Performance Bond) ලබාදිය යුතුය.

08. 2021 **ජූනි මස 08 වන දින** 1400 **පැය** දක්වා කොළඹ 01, කොඩිගහ වීදියේ ශ්‍රී ලංකා නාවික හමුද මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩල සභාපතිවරයා වෙත දෙපිටපතකින් යුතු මුද්‍ර, තබන ලද ලංසු භාරදීම හෝ එම ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ නාවික හමුද මූලස්ථානයේ ස්ථාපිත කර ඇති ටෙන්ඩර්පත් බහාලුම වෙත බහාලීම සිදු කළ හැකි අතර, ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී වන ලංසු නියෝජිතයින් ඉදිරිපිට දී ඒවා විවෘත කරනු ලැබේ.

09. මෙම ලංසු කැඳවීම පිළිබඳ වැඩිදුර විස්තර නාවික හමුද වෙබ් අඩවිය www.navy.lk මගින් ලබා ගත හැක.

අධ්‍යක්ෂ,
වාණිජ පුපුරණ ද්‍රව්‍ය,
ගිනි අවි සහ පතරොම් මිලදී ගැනීමේ ඒකකය,
රජයේ වෙඩි බෙහෙත් ගබඩාව,
වැලිසර, රාගම.

SriLankan Airlines

ශ්‍රීලංකන් ගුවන් සමාගම
ටෙන්ඩර් දැන්වීම

ටෙන්ඩර් අංකඃ 202031082
දේපල හා පහසුකම් අංශයේ මෙහෙයුම් සඳහා ආධාරක සේවා සැපයීම

2021 අප්‍රේල් මස 27 වන දින සිට ටෙන්ඩර් අයදුම්පත් පහත සඳහන් ලිපිනයෙන් සෘජුවම බාගත කළ හැකිය.

https://www.srilankan.com/en_uk/coporate/tender-notices

ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේ අවසන් දිනය : 2021 මැයි 19

ශ්‍රීලංකන් ගුවන් සේවය වෙනුවෙන්
ව්‍යවසාය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති
ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධනය පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය

ආරක්ෂක අමාත්‍යාංශය
ජනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය

ලංසු කැඳවීමයි

රන්මිලාන ජනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයීය ශ්‍රවණාගාරය සඳහා වායු සමීකරණ සහ වාතාශ්‍ර පද්ධතිය සැපයුම්, ස්ථාපනය, පරීක්ෂා කිරීම, ක්‍රියාත්මක කිරීම සහ දෝෂ වගකීම් කාල සීමාව තුළ නඩත්තු කිරීම

කොන්ත්‍රාත්තු අංකය. MOD/KDU/01/2021

1. රන්මිලාන ජනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයීය උප කුලපති වෙනුවෙන් ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් වායු සමීකරණ සහ වාතාශ්‍ර පද්ධතිය සැපයුම්, ස්ථාපනය, පරීක්ෂා කිරීම, ක්‍රියාත්මක කිරීම සහ දෝෂ වගකීම් කාල සීමාව තුළ නඩත්තු කිරීම (කොන්ත්‍රාත්තු අංකය. **MOD/KDU/01/2021**) සඳහා යෝජනාතාදායක ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටී.

   රන්මිලාන ජනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයීය ශ්‍රවණාගාරය සඳහා වායු සමීකරණ සහ වාතාශ්‍ර පද්ධතිය සැපයුම්, ස්ථාපනය, පරීක්ෂා කිරීම, ක්‍රියාත්මක කිරීම සහ දෝෂ වගකීම් කාල සීමාව තුළ නඩත්තු කිරීම මෙහි වැඩ කටයුතුවලට අයත් වේ.

   වගකීම් ස්ථානය: **ජනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය, රන්මිලාන.**

   ඉදිකිරීම් කාලය: **දින 180 කි.**

2. ලංසු කැඳවීම ජාතික තරගකාරීත්ව ලංසු පටිපාටිය අනුව සිදු කෙරෙනු ඇත.

3. කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා සුදුසුකම් ලැබීමට, සාරිරික ලංසුකරුවා අනාඩ්‍ය ලේඛනගත වී හොඳිරිය යුතු අතර පහත අවශ්‍යතා සැපිරිය යුතුය.

   - ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA පෙර ICTAD) ලියාපදිංචි වී සිටිය යුතුය.

     ශ්‍රේණිය: **EM 1**

     විශේෂඥතාව: **යාන්ත්‍රික වාතාශ්‍ර සහ වායු සමීකරණ පද්ධති (MVAC).**

   - ලංසුකරුවාට අවම වශයෙන් ශ්‍රී ලංකාව තුළ මෙයට සමාන ස්වභාවයේ වායු සමීකරණ සහ වාතාශ්‍ර පද්ධති සැපයුම්, ස්ථාපනය, පරීක්ෂා කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සම්බන්ධ වසර දහයක **(10)** පළපුරුද්දක් සහිත විය යුතු අතර නවීන බහු සම්පීඩක ඉස්කුරුප්පු වර්ගයේ චිලර් ස්ථාපනය කිරීම, ක්‍රියාත්මක කිරීම, නඩත්තු කිරීම සහ දෝෂ විභාගය සඳහා චිලර් අංගන නිෂ්පාදන පහසුකමක පුහුණුව ලත් සුදුසුකම් ලත් කාර්මික කාර්ය මණ්ඩලයක් සහිත විය යුතුය.

   - මෙම කොන්ත්‍රාත්තුවේ ස්වභාවයට, සංකීර්ණතාවට සහ අගයට සමාන කොන්ත්‍රාත්තුවක පසුගිය වසර පහක **(05)** කාල සීමාව ඇතුලත අවම වශයෙන් එක් **(01)** අවුරුද්දක පළපුරුද්දක් සහිත විය යුතුය.

   - උපකරණ නිෂ්පාදකයා හට මෙයට සමාන වායු සමීකරණ සැලසුම් කිරීමේ සහ නිපදවීමේ වසර පහළොවක **(15)** වත් අවම පළපුරුද්ද තිබිය යුතු අතර පිරිනමන උපකරණවලට ශ්‍රී ලංකාව තුළ වසර පහක් **(05)** තහාට වූ සේවා ඉතිහාසයක් තිබිය යුතුය.

4. කොන්ත්‍රාත්තුව සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය සුදුසුකම්වලට පහත කොන්දේසි ඇතුළත් වේ.

   - පසුගිය වසර පහ **(05)** තුළ සිදු කරන ලද වායු සමීකරණ සහ වාතාශ්‍ර පද්ධති වැඩ සැපයීමේ සහ ස්ථාපනය කිරීමේ දළ වාර්ෂික වටිනාකම අවම වශයෙන් රුපියල් **මිලියන 300** ක් විය යුතුයි.

   - අවශ්‍ය අවම ද්‍රවශීල වත්කම් හෝ ණය පහසුකම් රුපියල් **මිලියන 50** ක් විය යුතුය.

5. උනන්දුවක් දක්වන යෝග්‍ය ලංසුකරුවන්ට පහත ලිපිනයෙන් වැඩි දුර තොරතුරු ලබාගත හැකිය

   ප්‍රධාන මූල්‍ය නිලධාරි,
   ආරක්ෂක අමාත්‍යාංශය,
   අංක 15/5,
   බාලදක්ෂ මාවත,
   කොළඹ 03,

   ශ්‍රී ලංකාව. (දුර: **011-2439381** ෆැක්ස් **011-2390720** ඊමේල්: **procurement@defence.lk**)

   2021.04.26 සිට 2021.05.24 දක්වා, **පැය 0900 සිට 1500** අතර කාලයේදී ඉහත ලිපිනයෙන් සහ දුරකථන අංක **011-2439381**, ෆැක්ස් **011-2390720** සහ ඊමේල් **procurement@defence.lk** ඔස්සේ ලංසු ලේඛන කොපියේ පරීක්ෂා කිරීමට හා තොරතුරු ලබාගැනීමට හැකිය.

6. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ප්‍රධාන මූල්‍ය නිලධාරි, ආරක්ෂක අමාත්‍යාංශය, අංක 15/5, බාලදක්ෂ මාවත, කොළඹ 03 වෙතින් **2021.04.26** සිට **2021.05.24** දක්වා **පැය 0900 සිට පැය 1500** අතර කාලයේදී **රු.30,000** ක (තිස්දහසක) නැවත නොගෙවන ගාස්තුවක් ගෙවීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් සැකසුණු සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලය මිලදී ගත හැකිය, ගෙවීමේ ක්‍රමය වන්නේ මුදල් ගෙවා ලබා ගත යුතුය.

   ලංසුව සමග 1987 අංක 3 දරන ඔපදු කොන්ත්‍රාත්තු පනත යටතේ වූ ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කරන මෙන් ලංසුකරුවන්ට තරයේ උපදෙස් දෙනු ලැබේ.

7. **2021.05.05 සෙ.ව. 10.00 ට** රන්මිලාන ජනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේදී පූර්ව ලංසු රැස්වීම පැවැත්වෙනු ඇත. පූර්ව ලංසු රැස්වීමට සහභාගී වීමට අපේක්ෂා කරන ලංසුකරුවන් සහභාගීවන්නන්ගේ විස්තර (නම, ජාතික හැඳුනුම්පත් අංකය, සමාගම සහ තනතුර), අධ්‍යක්ෂ කාර්ය සම්පාදන, ජනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය, හැ.අංක. 32, රන්මිලාන, ශ්‍රී ලංකාව (**දුර: 0112-632430, 0710-219384, ෆැක්ස් 0112-632430**) වෙත ඉදිරිපත් කළ යුතුය.

8. ලංසු **2021.05.25 සිට 2021.08.24** දක්වා වලංගු විය යුතුය (ලංසු ඉදිරිපත් කිරීමේ අවසන් දිනයේ සිට දින 91)

9. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත ශ්‍රී ලංකාවේ බැංකුවකින් රුපියල් මිලියන තුනක (**රු. 3,000,000.00**) වටිනාකමින් යුත් **2021.05.25 සිට 2021.09.21** දක්වා වලංගු (ලංසු විවෘත කිරීමේ දින සිට ලිත් දින 119) "**ලංසු ආරක්ෂණයක්**" කොන්දේසි විරහිත ඉල්ලුම් මත වන බැඳුම්කරයක් ලබා ලබාගෙන ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය. ලංසු ආරක්ෂණයේ ප්‍රතිලාභියා **ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය** විය යුතුය.

10. **2021.05.25** ට පෙර ලංසු සභාපති, ප්‍රසම්පාදන කමිටුව, ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කළ යුතුය.

    මුද්‍රා තබන ලද ලංසු **2021.05.25 දින 1430 පැයට** පෙර, පහත දක්වා ඇති ලිපිනයට ලැබෙන්නාට සැලැස්විය යුතු ය. නැතහොත් එම ලිපිනයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලිය යුතු ය.

    ප්‍රසම්පාදන කාර්යාලය,
    ආරක්ෂක අමාත්‍යාංශය
    බිම් මහල, අංක 15/5,
    බාලදක්ෂ මාවත, කොළඹ 03.

    ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

    ලංසු භාරගැනීම අවසන් වූ වහාම, සහභාගි වීමට අපේක්ෂා කරන ලංසුකරුවාගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කෙරෙනු ලැබේ.

11. ලංසු විවෘත කිරීමට සහභාගි වීමට අපේක්ෂා කරන අයගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය/ගමින් බලපත් අංකය ලංසු විවෘත කිරීමට අවම වශයෙන් දින තුනකට පෙර ලිඛිතව ප්‍රධාන මූල්‍ය නිලධාරි, ආරක්ෂක අමාත්‍යාංශය, අංක 15/5, බාලදක්ෂ මාවත, කොළඹ 03 ලිපිනයට දැනුම් දිය යුතුය.

    එමෙන්ම ප්‍රසම්පාදකයට අදාළ නිල කරුණු සඳහා සහභාගි වන අයගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය/ගමින් බලපත් අංකය ලංසු විවෘත කිරීමට අවම වශයෙන් දින තුනකට පෙර ලිඛිතව ප්‍රධාන මූල්‍ය නිලධාරි, ආරක්ෂක අමාත්‍යාංශය, අංක 15/5, බාලදක්ෂ මාවත, කොළඹ 03 ලිපිනයට දැනුම් දිය යුතුය.

සභාපති
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
ආරක්ෂක අමාත්‍යාංශය,
15/5, බාලදක්ෂ මාවත, කොළඹ 03.
දුරකථනඃ 0112-390719.

කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

ලංසු අවසාන දිනය දීර්ඝ කිරීමයි

ටෙන්ඩර් අංකය : MD/MR/C/36/2019-1

ටෙන්ඩර් විස්තරය : කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ සත්ත්ව විද්‍යා හා පරිසර විද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු - "අදියර 1"

මෙම දැන්වීම, ඉහත ප්‍රසම්පාදනය අවසන් කිරීමට නියමිතව තිබූ 2021.04.29 දින පස්වරු 2.30 හා 2021.04.04 දින, විරකේසරී, ඉරිදු ඔබ්සවර් හා සිළුමිණ ජාතික පුවත්පත්වල පළකරන ලද දැන්වීම සහ විශ්වවිද්‍යාලයීය නිල වෙබ් අඩවියෙහි පළ කරන ලද ප්‍රසම්පාදන දැන්වීම හා බැඳේ.

ඉහත ටෙන්ඩරය සඳහා වන ලංසු අවසන් දිනය 2021.05.13 දින පස්වරු 2.30 දක්වා දීර්ඝ කොට ඇත.

ඒ අනුව, අදාළ ලංසු ලේඛන 2021.05.12 දින දක්වා මිලදීගත හැකි අතර

සහ

මේ සම්බන්ධ පෙර - ලංසු හමුවක්, 2021 මැයි 04 වන දින, කොළඹ 03, කුමාරතුංග මුනිදාස මාවතේ අංක 94, කොලේජ් හවුස්, අධ්‍යක්ෂ මණ්ඩල කාමරයේදී පැවැත්වීමට නියමිතය.

ලැබී ඇති ලංසු, අදළ භාරගැනීමේ කාලය අවසන්වූ වහාම පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගේ ඉදිරියේ විවෘත කරනු ලැබේ.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
කොළඹ විශ්වවිද්‍යාලය,
අංක 94, කුමාරතුංග මුනිදාස මාවත,
කොළඹ 03.

ලේක්හවුස් ඡායාරූප ශිල්පීන් විසින් ඡායාරූප ගත කරන ලද කළු සුදු හා වර්ණ සේයා පත් කර්තෘ මණ්ඩල පුස්තකාලයෙන් මිලදී ලබාගැනීමට පහසුකම් සලසා ඇත.

දිනපතා සහ සතිපතා පත්‍රවල පළවූ හා පළනොව ඡායාරූපවල දළ සේයාපට 1950 සිට පුස්තකාලයේ තැන්පත් කර ඇත. ඔබටත් ඡායාරූප ලබාගැනීමට අවශ්‍ය නම් පුවත්පතේ නම, දිනය සහ ඡායාරූපයේ විස්තර සඳහන් කොට ලියා හෝ පැමිණ විමසන්න.

පුස්තකාලයාධිපති
දුරකථන අංක 2429491

ප්‍රසම්පාදන දැන්වීමයි

වෙළඳ අමාත්‍යාංශය

සමුපකාර තොග වෙළඳ සංස්ථාව

කොළඹ 02, වොක්ෂෝල් වීදියේ සමුපකාර තොග වෙළඳ සංස්ථාව සඳහා කි. ග්‍රෑ. 1,000 නැවතුම් 09 වේගය තත්පරයට / මීටර් 2.5 මගී සෝපාන යන්ත්‍ර 02 ක් සැපයීම, ගෙනැවිත් භාරදීම, ස්ථාපනය කිරීම, පරීක්ෂා කිරීම, ක්‍රියාත්මක කර පෙන්වීම සහ නඩත්තුව

1. වෙළඳ අමාත්‍යාංශයේ, ලේකම් වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් සෝපාන යන්ත්‍ර සැපයීම හා ගෙනැවිත් භාරදීම සඳහා යෝග්‍යතාපූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුදු, තබන ලද ලංසු දැන් කැඳවනු ලැබේ.
2. අභිලාෂී යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් හට, වැඩිදුර තොරතුරු සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ ප්‍රසම්පාදන ඒකකය වෙතින් විමසා ලබාගත හැකි අතර, ලංසු ලිපි ලේඛන පහත සඳහන් ලිපිනයේදී සතියේ දිනවල සඳුද සිට සිකුරාද දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා අතරතුර කොළඹ 02, වොක්ෂෝල් වීදියේ තැ. පෙ. 27 හි සමුපකාර තොග වෙළඳ සංස්ථාවේදී පරීක්ෂා කර බැලිය හැකිය.
3. ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය යටතේ පැවැත්වේ.
4. ලංසුකරුවන්ට අංගසම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් (ඉංග්‍රීසි භාෂාවෙන්) ගිණුම් අංශයට ආපසු ගෙවනු නොලබන රු. 5,000/= ක ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් අනතුරුව 2021.04.27 වන දින සිට සතියේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා අතරතුර මිලදී ගත හැකිය.
5. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසු 2021.05.12 වන දින ප.ව. 2.00 ට පෙර ලැබෙන සේ සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ 7 වන මහලේ, ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. ටෙන්ඩර් භාර ගැනීම 2021.05.12 වන දින ප.ව. 2.00 ට අවසන් වේ. ප්‍රමාද ලංසු භාර ගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු පහත ලිපිනයේදී, ලංසු භාරගන්නා අවසාන වේලාව ඉක්මවූ වහාම, පැමිණ සිටින ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරියේදී විවෘත කරනු ලැබේ.
6. සියලුම ලංසු සමග රු. 150,000/= ක වටිනාකමින් යුත් ලංසු සුරක්ෂණයක් ද ඉදිරිපත් කළ යුතුය.
7. ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වනු ඇත.

සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
සමුපකාර තොග වෙළඳ සංස්ථාව,
තැ. පෙ. 27, වොක්ෂෝල් වීදිය,
ප්‍රසම්පාදන ඒකකය, කොළඹ 02, ශ්‍රී ලංකාව.
දුරකථන /ෆැක්ස් : 0112337549

ලංකා සතොස

දේශයට මිල නියම කරන්නා

වෙළඳ අමාත්‍යාංශය

දේශයට මිල නියම කරන්නා සමඟ අත්වැල් බැඳගැනීමට ඔබට අවස්ථාවක් !

ලංකා සතොස අලෙවිසැල් ආරම්භ කිරීමට යෝග්‍ය ගොඩනැගිලි ලබා ගැනීම

අපගේ අලෙවිසැල් ජාලය ව්‍යාප්ත කිරීමේ වැඩසටහන යටතේ පහත සඳහන් බල ප්‍රදේශයන්හි තිබෙන සුදුසුකම් යුත් ගොඩනැගිලි මාසික බදු කුලී පදනම් මත ලබාගැනීමට අපේක්ෂා කරමු.

ගොඩනැගිලි අවශ්‍යය ප්‍රදේශ

01). බැලුම්මහර	06). බලංගොඩ	11). මොරටුව	16). කුරුණෑගල
02). හිට්ටඹුව	07). මුල්ලේරියාව	12). හික්කඩුව	17). සෙවනගල
03). දෙවිනුවර	08). උකුවෙල	13). පොල්ගහවෙල	18). ආගරපතන
04). හිඟොඩ	09). නුවර එළිය	14). කොටගල	19). ගම්පොළ
05). නාත්තන්ඩිය	10). පිටබැද්දර	15). කිරිබත්ගොඩ	20). පුස්සැල්ලාව
			21). පුඩළු ඔය

වඩාත්ම සුදුසු අවශ්‍යතා-

01). මුහුණත පළල අඩි 30 ක හෝ ඊට වැඩි
02). වර්ග අඩි 3500 හෝ ඊට වැඩි බිම් මහලක් විය යුතුය.
03). වාහන නැවැත්වීමේ පහසුකම් (5ක් හෝ ඊට වැඩි)
04). භාණ්ඩ ගබඩාවට ගෙන යාම සඳහා වෙනම ප්‍රවේශ මාර්ගයක් හා දොරටුවක් තිබීම.
05). ප්‍රධාන පාරට මුහුණලා පැවතීම හා නගරයට ආසන්නව ස්ථානගත වීම.
06). අපගේ ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යාමට සුදුසු ඉහත සඳහන් ප්‍රදේශයන්හි පවතින පර්චස් 50ක් හෝ ඊට වැඩි ප්‍රමාණයේ ඉඩම් අප විසින් යෝජනා කරන සැලැස්ම මත සාදා නිමකර දීර්ඝ කාලීන බදු කුලී මත ලබා ගැනීම තෙරෙහිද අවධානය යොමු කරන්නෙමු.
07). නිරවුල් ඔප්පු සහ අනුකූලතා සහතිකය (COC Certificate) අනිවාර්ය වේ.

සැලු. ඉහත බල ප්‍රදේශයන්හි නගර මධ්‍යයේ පවතින ගොඩනැගිලි සඳහා විශේෂ අවධානයක් යොමු කරන බව කාරුණිකව සලකන්න.

ගොඩනැගිල්ලේ ප්‍රමාණය/ දළ සැකසුම/ ඉදිරිපස හා ඇතුළත ඡායාරූප සමඟ විස්තර අප වෙත ලිඛිතව යොමුකරන්න. ලිපිනය වම් පස කොළවර නව ගොඩනැගිලි යන්න සඳහන් කරන්න.

අවශ්‍ය පැහැදිලි කිරීම් ලබා ගැනීම සඳහා පහත නිලධාරීන් අමතන්න.
රණසිංහ - 070 3611 460
නිල්ක්ලේෂ් - 070 1560 698

- දැන්වීම පළවූ දින සිට දින 21 ක් තුළ මේ සඳහා ඔබගේ අයදුම්පත් ඉදිරිපත්කළ යුතුය.
- ලංකා සතොස ගොඩනැගිලි කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

සභාපති, ලංකා සතොස ලිමිටඩ්,
සතොස මහලේකම් කාර්යාලය, අංක 27,
සභාපති කාර්යාලය 5 වෙනි මහල, වොක්ෂෝල් වීදිය, කොළඹ 02

BE BETTER INFORMED!



News you can trust now free on your mobile phone.

Dinamina Daily News Thinakaran

VISIT
apps.lakehouse.lk

DOWNLOAD TODAY!

AVAILABLE AT

LAKE HOUSE

ඔබ සොයන වාහනය තෝරාගන්න බලන්න

දිනමිණ වට්ටු

ලංකා සඳහා කෙරෙන ආරාධනයයි

ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව (PMMD)

මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය

ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා ජාතික සංවර්ධන තොරතුරු පද්ධතිය සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සඳහා වන ප්‍රසම්පාදනය

IFB අංකය : MOF/PMMD/IS/2021/01

1. ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා වන ජාතික සංවර්ධන තොරතුරු පද්ධතිය සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුදු, තැබූ ලංසු කැඳවනු ලැබේ. පද්ධතිය සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාත්මක කිරීමේ කාලය වසර දෙකක් වන අතර, පහසුකම් සපයන සහ නඩත්තු කාලය අවුරුදු 5 කි.
2. ලංසු තැබීම ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල දක්වා ඇති ජාතික තරඟකාරී ලංසු (එන්.සී.බී.- තනි-අදියර ලියුම් කවර දෙක ක්‍රමය මත ලංසු තැබීම) ක්‍රියා පටිපාටි හරහා සිදු කෙරෙන අතර, මාර්ගෝපදේශවල අර්ථ දක්වා ඇති පරිදි සුදුසුකම්ලත් සියලුම ලංසුකරුවන් සඳහා විවෘත වේ.

කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා ලංසුකරුවන් පහත සඳහන් අවම සුදුසුකම් සපුරාලිය යුතුය.

අ) සාමාන්‍ය පළපුරුද්ද: ලංසු ඉදිරිපත් කිරීම අවසන් වන කාල සීමාවට පෙර ලංසුකරු අවම වශයෙන් පසුගිය අවුරුදු 5 තුළ තොරතුරු තාක්ෂණ කොන්ත්‍රාත්තු යටතේ කොන්ත්‍රාත්කරුවකු, උප කොන්ත්‍රාත්කරුවකු හෝ කළමනාකරණ කොන්ත්‍රාත්කරුවකු ලෙස කටයුතු කර තිබීම;

ආ) නිශ්චිත පළපුරුද්ද: ලංසුකරු පසුගිය වසර 5 තුළ අවම වශයෙන් රුපියල් මිලියන 40 ක වටිනාකමක් සහිත එක් මෘදුකාංග / ඊආර්පී/ මානව සම්පත් ව්‍යාපෘතියක් වත් සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

ඇ) සාමාන්‍ය වාර්ෂික පිරිවැටුම: පසුගිය වසර 3 තුළ සම්පූර්ණ කරන ලද හෝ ක්‍රියාත්මක තත්වයේ පවතින කොන්ත්‍රාත්තු සඳහා මුළු සහතික කළ ගෙවීම් ලෙස ලබාගෙන ඇති ගණනය කරන ලද අවම සාමාන්‍ය වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන 75 ක් වීම.

3. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට 2021 අප්‍රේල් 27 වන දින සිට වැඩ කරන දිනවලදී පෙ.ව. 09.00 සිට ප.ව. 17.00 දක්වා වූ කාලය තුළදී ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ සී. පියරත්න මහතාගෙන් වැඩිදුර තොරතුරු ලබාගත හැක. දුරකථන අංක: 071-4415144, 0112-034424, විද්‍යුත් තැපැල් ලිපිනය : piyarathna.barc@pmmd.treasury.gov.lk. පරීක්ෂා කිරීම සඳහා පමණක් ලංසු ලේඛනය මුදල් අමාත්‍යාංශ වෙබ් අඩවියේ ඇත. (https://www.treasury.gov.lk/p/procurement-notices/1)
4. ව්‍යාපාරික ලිපි ශීර්ෂයක් සහිත ලිඛිත අයදුම් පතක් ඉදිරිපත් කිරීම සහ ආපසු නොගෙවන රු.20,000.00 ක ගාස්තුවක් ගෙවීම මත උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් ඇති සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් මිලදී ගත හැකිය. මුදල් මගින් ගෙවීම කළයුතු වේ.
5. 2021 ජූනි 01 වන දින ප.ව. 3.00 ට හෝ ඊට පෙර පහත ලිපිනයට ලංසු ගෙනවිත් භාරදිය යුතුය. ප්‍රමාද වූ ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරදීම අවසන් වූ වහාම 2021 ජූනි 01 වන දින ප.ව. 3.00 ට සහභාගී වීමට නියමිත ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ. සියලුම ලංසු සමග ශ්‍රී ලංකා රුපියල් මිලියනයකට (1,000,000.00) නොඅඩු ලංසු සුරක්ෂාවක් තැබිය යුතුය.
6. පූර්ව ලංසු රැස්වීමක් 2021 මැයි මස 11 වන දින පෙ.ව. 11.00 ට මුදල් අමාත්‍යාංශය, රන්දෙර, ශ්‍රවණාගාරය, කාමර අංක 006, බිම් මහල, මහල්කම් කාර්යාලය, කොළඹ 01 හි දී පැවැත්වේ .

සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව
ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව (PMMD)
කාමර අංක 328, තෙවන මහල,
මුදල් අමාත්‍යාංශය, මහලේකම් කාර්යාලය,
කොළඹ 01.

අප්‍රේල් 25, 2021

Srilankan Catering

ලංසු ඉදිරිපත් කිරීමේ ආරාධනය

ශ්‍රීලංකන් කේටරින් සමාගම විසින් පහත සඳහන් පාරිභෝගික භාණ්ඩ සැපයීම සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු සැඳවනු ලැබේ. ලංසු ලියවිලි 2021 අප්‍රේල් 27 දින සිට ශ්‍රීලංකන් කේටරින් සමාගමේ වෙබ් අඩවියෙන් ලබාගත හැක.

විස්තරය	ටෙන්ඩර් යොමුව	ලංසු භාරගැනීමේ අවසන් දිනය	ලංසු භාරගැනීමේ අවසන් වේලාව
KITHUL JUGGERY	SLC/CEO/GOODS/009/2021	21-ජූනි -8	පෙ.ව.10.00
CLING WRAP	SLC/CEO/GOODS/010/2021	21-ජූනි -8	පෙ.ව.10.30
BEEF TOP SIDE B/L WHOLE	SLC/JPC/GOODS/009/2021	21-ජූනි -8	පෙ.ව.11.30
JUICE ITEMS	SLC/DPC/GOODS/003/2021	21-ජූනි -8	ප.ව. 12.00
CHEESE GOUDA WITH CHILLI 400GM	SLC/JPC/GOODS/011/2021	21-ජූනි -8	ප.ව. 12.30

පිළිගත් ලංසුකරුවන්ට ඔවුන්ගේ යෝග්‍යතාවය තහවුරු කරමින් මිලගණන් ඉදිරිපත් කරන මෙන් ආරාධනය කර සිටිමු.

උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ලංසු ලියවිලි සහ වැඩිදුර විස්තර 2021 අප්‍රේල් 27 දිනයෙන් පසු **http://www.srilankancatering.com/procurement-notices** යන වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.

මුද්‍රා තබන ලද ලංසු ලියවිලි අදාළ ලංසු ලියවිලි සඳහා දෙන ලද අවසාන දිනයට පෙර, ශ්‍රීලංකන් කේටරින් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී කාර්යාලය වෙත භාර දිය යුතුය.

උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ලංසු ලියවිලි සම්බන්ධ වැඩිදුර විස්තර

තිළිණ සිරිවර්ධන - **thilina.siriwardana@srilankancatering.com** හෝ **(+94) 19 733 4241** තුළින් ලබාගත හැකිය.

ප්‍රධාන විධායක නිලධාරී,
ශ්‍රීලංකන් කේටරින් සමාගම,
ගුවන්සේවා මධ්‍යස්ථානය,
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල, කටුනායක, ශ්‍රී ලංකාව

කොන්ක්‍රීට් වැඩ පරීක්ෂකවරයෙක්

මිනුවන්ගොඩ ප්‍රදේශයේ කොන්ක්‍රීට් වැඩබිමක නැවතී වැඩ කිරීමට අවශ්‍යයි.
විමසන්න :
076-1622872
074-1175338

තේක්ක ගස් විකිණීමට

තේක්ක ගස් 50 විකිණීමට ඇත.
මූදුකටුව, මාරවිල.
0778455517

ජපන් වීසා
අර්ධ කාලීන රැකියා සමඟ අධ්‍යාපන වීසා
Sevenstar Migration
076 469 000 3 | 011 4 363 303

නිවසක නැවතී සේවයට ගෘහ සේවිකාවක් ඉන්මනින් අවශ්‍යයි.

කොළඹ - 08 බොරැල්ලේ පිහිටි සමාගම් අධ්‍යක්ෂක වරයෙකු සතු නිවසේ නැවතී, අවුරුදු 06කේ වයසැති පිරිමි දරුවකු රැකබලා ගැනීමට හා දරුවාගේ ආහාර/ඇඳුම් පිළියෙල කිරීමට දැනුමක් ඇති සොබා සම්පන්න නිරෝගී වයස අවු: 35- 50ත් අතර මහා පළපුරුද්දක් ඇති අවංක කාරුණික නෙත සේවිකාවක් උවමනායි.

නවාතැන්, ආහාර සමඟ හොඳ වැටුපක් ගෙවනු ලැබේ.
නිවසේ නැවතී සේවය කිරීමට සැමියි අය පමණක් පහත සඳහන් අංකයට අමතන්න.

විමසීම් - 077 77 27 321
011 26 99 781

MAG
saves lives builds futures

New construction of supply and modification of a new 20 feet container store furnished with 10 steel racks with analog CCTV System at Pitigala - Mathugama.

The Mines Advisory Group (MAG) is an international organisation with field offices in Sri Lanka, setting new standards for humanitarian mine clearance, advocacy and innovative approaches to logistics management. Our risk education programs, community liaison, and flexible multi-skilled mine action teams make a real difference on the ground in communities afflicted by mines and unexploded bombs in Sri Lanka.
MAG invites sealed bids from experienced and qualified construction companies to take part in this national tender process, who are registered at the Sri Lankan Construction Industry Development Authority (CIDA) at grade C7 or above to execute the project. This procurement will include:
New construction of Supply and Modification of a new 20 feet Container Store furnished with 10 steel racks with Analog CCTV system at the following location.

1.PITIGALA.

Please Note:-
- This ITT gives rise to no contractual obligation between MAG and any Tenderers.
- MAG will not be liable for any costs or expenses directly or indirectly associated with participating in this tender process.
- MAG will not be liable to any Tenderer where a Tenderer is not invited to participate in any subsequent process following completion of this Tender process.
- MAG reserves the right to make associated changes with the tender schedule and related tender documents.

MAG`s intended timeline for this procedure is as follows:
The ITT tender package will be made available **FREE OF CHARGE** for collection from 27.04.2021, between 09:00AM to 04:00PM up to 05.05.2021. (Closed on public holidays & weekends) at the address below. Final day of tender submission will be 12.05.2021 up to 04:00PM. Only one authorized officer is permitted to collect ITT documentation. ITT documentation will only be transferred upon presentation of an authorization letter on company letterhead proving identity.

Tender Evaluation Committee,
Mines Advisory Group (MAG),
30A, Pamankada Lane, Colombo 6

For questions, please contact before 07.05.2021 at 3pm only our official email:
tenderssrilanka@maginternational.org

MAG looks forward to your involvement in this innovative new project. MAG actively promotes transparent processes in all its procurement activities and readily encourages all qualified Sri Lankan companies to participate in this competition.

ආරක්ෂක අමාත්‍යාංශය

අකුරේගොඩ, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණයේ 04 ඒකකය සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ පද්ධතිය නිර්මාණය කොට ස්ථාපනය කිරීම සඳහා ලංසුව

කොන්ත්‍රාත් අංක : DHQC/DHQC/ICTS/04/2021

ලංසු භාර ගැනීමේ අවසාන දිනය දීර්ඝ කිරීම

1. ඉහත ලංසු සඳහා ආරාධනාවේ ලංසු භාරගැනීමේ / විවෘත කිරීමේ අවසාන දිනයන් පහත සඳහන් පරිදි වෙනස් වේ.

   අ) ලංසු ලිපිලේඛන නිකුත් කිරීම : 2021 මාර්තු 15 දින සිට 2021 මැයි 03 දින දක්වා

   ආ) ලංසු භාරගැනීම හා විවෘත කිරීම : 2021 මැයි 04 දින 10.00 පැය

2. ලංසු 2021-08-30 දින තෙක් වලංගු විය යුතුය. (ලංසු භාරගැනීමේ / විවෘත කිරීමේ අවසාන දිනට පසුව දින 119 කට ලංසු විවෘත කිරීමේ දින ඇතුළුව).
3. ලංසු සුරක්ෂණය 2021-09-27 දින දක්වා වලංගු විය යුතුය. (ලංසු භාර ගැනීමේ / විවෘත කිරීමේ අවසාන දිනට පසුව දින 147 කට, ලංසු විවෘත කිරීමේ දින ඇතුළුව)
4. අනෙකුත් සියලු විස්තර නොවෙනස්ව පවතී.

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
ආරක්ෂක අමාත්‍යාංශය,
නො. 15/5, බාලදක්ෂ මාවත,
කොළඹ - 03,
ශ්‍රී ලංකාව.

දුරකථන : 0094-077-3766601
ෆැක්ස් : 0094-011-2390720

KAHAWATTE PLANTATIONS PLC

කහවත්ත වැවිලි සමාගම
ඇල්බීසියා ගස් විකිණීම සඳහා මිළ ගණන් කැඳවීම

අප සමාගම මගින් පාලනය වන කහවත්ත ප්‍රදේශයේ පහතින් දැක්වෙන වගුවෙහි සඳහන් පැල්මඩුල්ල වතුයායේ හොඳින් වැඩුණු ඇල්බීසියා ගස් ඉවත් කර ගැනීම සඳහා ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

වතු යාය	කොටස	ගස් විශේෂය	ගස් ගණන
පැල්මඩුල්ල	නො. 01	ඇල්බීසියා	10
පැල්මඩුල්ල	නො. 04	ඇල්බීසියා	26
පැල්මඩුල්ල	නො. 05	ඇල්බීසියා	14
	මුලු ගස් ගණන		50

1. මිල ගණන් ඉදිරිපත්කිරීම සඳහා ආපසු නොගෙවන රු.2,500/-ක ගාස්තුවක් ගෙවා ප්‍රාදේශීය කාර්යාලයේ (පහත ලිපිනයෙන්) ටෙන්ඩර් පත්‍රිකාවක් ලබාගත යුතුය. 2021 අප්‍රේල් මස 27 වෙනි දින සිට මැයි මස 11 වෙනි දින දක්වා වන දිනයන් තුළ උදේ 9.00 සිට සවස 4.00 දක්වා වතු අධිකාරිතුමාගේ අවසරය ඇතිව ගස් පරීක්ෂා කළ හැක.
2. ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කරන අවස්ථාවේදී ආපසු ගෙවන පදනම මත රු.25,000/-ක් ගෙවා කහවත්ත වැවිලි සමාගම නමින් ලබාගත් බැංකු අණකරයක් හෝ මුදල් ඇණයුමක් මගින් මුදල් තැන්පත් කර ලබාගත් ලදුපතක් ඇමිණිය යුතුය.
3. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රිකා **2021 මැයි මස 12 වෙනි දින සවස 5.00ට පෙර** පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑල් මගින් යොමුකළ යුතුය.

අධ්‍යක්ෂ වැවිලි,
කහවත්ත වැවිලි සමාගම,
ප්‍රාදේශීය කාර්යාලය, පැල්මඩුල්ල වතුයාය, කහවත්ත.

කවරයේ වම් පස කෙළවරේ
"ගස් හෙළීම සඳහා මිල ගණන් කැඳවීම" යනුවෙන් සඳහන් කරන්න. වැඩි විස්තර සඳහා වතු අධිකාරි පැල්මඩුල්ල වතුයාය: 0453454736 සහ ප්‍රාදේශීය කාර්යාලය 0457557126/0457557127 යන අංක අමතන්න.

ටෙන්ඩර් පත්‍රිකාව **2021 මැයි මස 13** වෙනි දින විවෘත කරනු ලැබේ.

වෙළඳ අමාත්‍යාංශය

සමුපකාර තොග වෙළඳ සංස්ථාව

භාවිතා කරන ලද ද්‍රව්‍ය විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවීම

සමුපකාර තොග වෙළඳ සංස්ථාවට අයත් අබලි භාණ්ඩ සහ භාවිතා කරන ලද දැව පැලට්, භාවිත පොලිසැක් උර ප්‍රවාහන අංශය විසින් ඉවත් කරන ලද දැව් තෙල්, ටයර්, බැටරි විකිණීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

අයදුම්පත් සඳහා රු. 1,000 බැගින් වූ ආපසු නොගෙවනු ලබන ගාස්තුවක් ගෙවීමෙන් ස.තො.ස ප්‍රධාන කාර්යාලයේ ප්‍රසම්පාදන අංශය වෙතින් ටෙන්ඩර් අයදුම්පත් හා ඉහත තොග පරීක්ෂා කිරීම සඳහා විස්තර ලබා ගත හැකිය. අයදුම්පත් ලබා ගැනීමෙන් පසු තොග පරීක්ෂා කිරීම 2021-05-03 වන දින සිට 2021-05-10 වන දින දක්වා රජයේ කාර්යාල වැඩ කරන දින තුළ පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා සිදු කළ හැකිය.

ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේදී රු. 5,000.00 ක ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පතු මුදලක් ගෙවිය යුතු අතර, එය 2021-05-11 වන දින පෙ.ව. 10.00 ට පෙර ස.තො.ස ප්‍රධාන කාර්යාලයේ මුදල් අයකැමි වෙත ගෙවිය යුතුය. ටෙන්ඩර් අයදුම්පත් 2021-05-11 වන දින 12.00 පැයට ප්‍රථම අංක 04 දරන ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට කටයුතු කළ යුතුය.

අවසන් තීරණය ටෙන්ඩර් මණ්ඩලය සතුය.

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
සමුපකාර තොග වෙළඳ සංස්ථාව,
අංක 27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

Sri Lankan Catering

කොන්ත්‍රාත් පදනම මත මිනිස්බල සේවා සැපයීමේ රැකියා ඒජන්තවරු බඳවා ගැනීම සඳහා ලංසු ඉදිරිපත් කිරීමේ ආරාධනයි
SLC/PRO/SER/2021/005

අතිරේකය

2021 අප්‍රේල් 4 දින සන්ඩේ ඔබ්සර්වර් සහ සිළුමිණ යන පුවත්පත්වල ප්‍රකාශයට පත්කළ දැන්වීම් හා යොමුවේ. ඒ අනුව අතිරේකයක් නිකුත් කර ඇති බවත් අවසාන දිනය 2021 මැයි 18 දින ශ්‍රී ලංකා වේලාවෙන් පෙරවරු 10.30 (GMT +5:30) දක්වා දීර්ඝ කර ඇති බවත් මෙයින් දැන්වා සිටිමු.

නව අතිරේකය 2021 අප්‍රේල් 25 දින සිට
http://www.srilankancatering.com/procurement-notices යන ශ්‍රීලංකන් කේටරින් නිල වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.

වැඩිදුර විස්තර සඳහා (තිළිණ)
දුරකථන අංකය: - +94-019-7334241
විද්‍යුත් ලිපිනය- thilina.siriwardana@srilankancatering.com

ප්‍රධාන විධායක නිලධාරි,
ශ්‍රීලංකන් කේටරින් සමාගම,
ගුවන්සේවා මධ්‍යස්ථානය,
බණ්ඩාරනායක පාතාලේතර ගුවන් තොටුපල,
කටුනායක, ශ්‍රී ලංකාව.

ලංකා සතොස

දේශයට මිල නියම කරන්නා

මිල ගණන් කැඳවීම

ලංකා සතොස ලිමිටඩ් ඔන්ලයින් බෙදාහැරීමේ වැඩසටහන සඳහා කුරියර් සේවාව සැපයීම.

ලංකා සතොස ලිමිටඩ් ඔන්ලයින් බෙදාහැරීමේ වැඩසටහන සඳහා වර්ෂයක කාලසීමාවක් සඳහා කුරියර් සේවාව සැපයීමට උනන්දුවක් දක්වන ආයතන වෙතින් ලංකා සතොස ලිමිටඩ් සභාපති විසින් මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

පිරිවැය : ලංසු ලේඛණයේ දැක්වෙන පරිදි
අවශ්‍යතාව : ලංසු ලේඛණයේ දැක්වෙන පරිදි

මිල ගණන් ඉදිරිපත් කිරීමට උනන්දුවක් දක්වන ලංසුකරුවන් විසින් බලය පවරන ලද ලිපියක් ඉදිරිපත් කිරීම මගින් අදාළ ලංසු ලේඛණ **රු.1,000/- ක මුදලක් (ආපසු නොගෙවන) ගෙවා 2021 අප්‍රේල් මස 27 වෙනි දින සිට 2021 මැයි මස 18 වන දින** දක්වා කාලය තුළ, අංක 27, සතොස මහ ලේකම් කාර්යාල හොඩනැගිල්ල, වොක්ෂෝල් වීදිය, කොළඹ 02 හි, පිහිටි ලංකා සතොස ප්‍රධාන කාර්යාලයේ මිල දී ගැනීම් අංශයෙන් (3 වෙනි මහල) ලබා ගත යුතුය.

පූර්ව ලංසු සාකච්ඡාව **2021.05.11** වන දින **පෙ.ව. 11.00ට** පැවැත්වේ.

ඉදිරිපත් කරන මිල ගණන් **2021 මැයි මස 18 වෙනි දින ප.ව.01.00 ට** හෝ ඊට පෙර, ලංකා සතොස ලිමිටඩ්, අංක 27, සතොස මහ ලේකම් කාර්යාල හොඩනැගිල්ල, වොක්ෂෝල් වීදිය, කොළඹ 02 යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම ලිපිනයෙහි, මිල දී ගැනීම් අංශයෙහි (3 වන මහල) තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. මුද්‍රා තබන ලද මිල ගණන් බහාලන ලිපි කවරයේ වම්පස ඉහල කෙළවරෙහි **"ලංකා සතොස ලිමිටඩ් ඔන්ලයින් බෙදාහැරීමේ වැඩසටහන සඳහා කුරියර් සේවා සැපයීම"** යනුවෙන් සඳහන් කල යුතුය.

සියලුම ලංසුකරුවන් විසින් ලංසු ලේඛනය සමග ඇති **"ලංසු සුරක්ෂණ ප්‍රකාශය"** පැහැදිලිව පුරවා ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය.

මිල ගණන් භාරගැනීම **2021 මැයි මස 18 වෙනි දින ප.ව.01.00ට** අවසන් වන අතර මිල ගණන් විවෘත කිරීම, මිලගණන් භාර ගැනීම අවසන් වූ වහාම ලංසුකරුවන් ඉදිරියේ සිදු කරනු ඇත. . **ජයග්‍රාහී ලංසුකරු විසින් (ලියාපදිංචි සැපයුම්කරුවන් හැර) ලියාපදිංචි ගාස්තු වශයෙන් රු. 5,000/- ක මුදලක් සහ එම වටිනාකම මත 8%ක වැට් මුදලක් (ආපසු නොගෙවන)** ගෙවිය යුතු අතර පළමු මසට අදාල ඉන්වොයිසි වටිනාකමින් 5%ක් කාර්ය සාධන සුරක්ෂණයක් ලෙස රඳවා තබා ගනු ලැබේ **(ආපසු ගෙවන).**

වැඩි විස්තර සඳහා පහත නිලධාරියා අමතන්න.

කළමනාකරු මිල දී ගැනීම්, ජෙස්ලි - 070 3611524

ටෙන්ඩරය / කොන්ත්‍රාත්තුව පිරිනැමීමේ අවසන් තීරණය, **සභාපති, ලංකා සතොස ලිමිටඩ් සතු වේ.**

ලංකා සතොස ලිමිටඩ්,
සතොස මහලේකම් කාර්යාලය,
අංක 27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02

THE INSTITUTE OF CHARTERED ACCOUNTANTS OF SRI LANKA

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය

ලංසු සඳහා ආරාධනයයි

කාර්යාල සහ අයිසීටී (ICT) ආශ්‍රිත උපකරණ සැපයීම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී සංගමය (ශ්‍රී ලංකා CA), කොළඹ - 4, බම්බලපිටිය, ගාලුපාරේ නො. 411, 411/25 හා 411/2 යන ස්ථානයන්හි පිහිටි ශ්‍රී ලංකා CA හි ගිණුම්කරණ හා ව්‍යාපාර පාසලේ නව ගොඩනැගිල්ල සඳහා අවශ්‍ය උපකරණ සැපයීම සඳහා අභිලාෂී සැපයුම්කරුවන්ගෙන් මුද්‍ර, තැබූ ලංසු කැඳවයි.

ගිණුම්කරණ හා ව්‍යාපාර පාසල මගින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් අනුමත කළ ව්‍යාපාරික ගිණුම්කරණ BSc උපාධිය මෙහෙයවනු ලබයි.

ශ්‍රී ලංකා CA හි ගොඩනැගිලි ඉදිකිරීම් කමිටුව, අපේක්ෂිත සැපයුම්කරුවන් වෙතින් පහත සඳහන් ප්‍රභේදයන් සඳහා තම මිල ගණන් ඉදිරිපත් කරනු පිණිස මුද්‍ර, තැබූ ලංසු කැඳවනු ලබයි.

1. ගෘහ භාණ්ඩ හා වැද්දුම් කාර්යාල උපකරණ සහ භෝජනාගාර උපකරණ.
2. අයිසීටී (ICT) සැබැඳි සේවා හා උපකරණ
   - අ) සියලු සැබැඳි උපාංග ඇතුළුව දත්ත හා ශබ්ද (දුරකථන) ජාලය ක්‍රියාත්මක කිරීම.
   - ආ) සර්වර්ස්(Servers) ෆයර්වෝල්, ජාල උපකරණ සහ අනෙකුත් ආශ්‍රිත උපාංග ඇතුළුව දත්ත මධ්‍යස්ථාන උපකරණ සැපයීම, ස්ථාපනය හා වින්‍යාසය
   - ඇ) PABX පද්ධතිය හා සබැඳි උපාංග සැපයීම, ස්ථාපනය හා වින්‍යාසය.
   - ඈ) මාර්ගගත අනවරත විදුලිබල සැපයුම (UPS's) සැපයීම හා ස්ථාපනය.
   - ඉ) ලැප්ටොප් හා ඩෙස්ක්ටොප් පරිගණක සැපයීම.
   - ඊ) ආවේක්ෂණ (CCTV) පද්ධති, සියලුම සබැඳි උපකරණ සහ උපාංග සැපයීම හා වින්‍යාසය ඇතුළුව, ක්‍රියාත්මක කිරීම
3. ගිනි ආරක්ෂණ උපකරණ

රු. 2,000/= ක ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2021 අප්‍රේල් 29 දින සිට 2021 මැයි 7 දින තෙක් කාර්යාල දිනයන්හි පෙ.ව. 9.00 ත් ප.ව. 3.00 ත් අතර, කොළඹ 07, මලලසේකර මාවත, නො. 30A, ශ්‍රී ලංකා CA හි අයකැමි ස්ථානයෙන් ලංසුකරණ ලිපිලේඛන ලබාගත හැකිය.

සැපයුම්කරුවන්ගේ අවශ්‍ය නිපුණතාවයන් හා පළපුරුද්ද

අදාළ ක්ෂේත්‍රයේ සමාන ව්‍යාපෘතිවල විස්තීර්ණ හා සතාථ කළ නිපුණතා හා විශේෂඥ දැනුම සමාන ක්ෂේත්‍රයක අවම වශයෙන් වසර 10 ක වෘත්තීය පළපුරුද්ද.

නිශ්චිත අවසාන දිනට හා වේලාවට ගෙනැවිත් භාරදීමේ හැකියාව.

අභිලාෂී ලංසුකරුවන් යථා පරිදි සම්පූර්ණ කළ ජීව දත්ත ලිපිලේඛන වෙන් වෙන්ව මුද්‍ර, තැබූ කවරවල බහා ලංසුකරණ ලිපිලේඛනවල සඳහන් කර ඇති උපදෙස් පරිදි 2021 මැයි 10 දින ප.ව. 4.00 ට හෝ ඊට පෙර ශ්‍රී ලංකා CA වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

මුදල් දෙපාර්තමේන්තුව,
'ශ්‍රී ලංකාව CA'

www.casrilanka.com

ඔබ කැමති පුවත්පත් කීපයකම
දැරිය හැකි මිලකට

ලුහුඬු දැන්වීමක්

පල දරන්න - පළ කරන්න

* වචන 15ක් සඳහා

SUNDAY OBSERVER ADZ + වට පිට	රු. 500/-	- වැඩි වන වචනයක් සඳහා රු. 15/-
SUNDAY OBSERVER ADZ + Daily News	රු. 350/-	- වැඩි වන වචනයක් සඳහා රු. 15/-
වට පිට + දිනමිණ	රු. 350/-	- වැඩි වන වචනයක් සඳහා රු. 15/-
SUNDAY OBSERVER ADZ + වාරමඤ්ජරී	රු. 400/-	- වැඩි වන වචනයක් සඳහා රු. 15/-
වට පිට + වාරමඤ්ජරී	රු. 400/-	- වැඩි වන වචනයක් සඳහා රු. 15/-
Daily News + තිනකරන්	රු. 250/-	- වැඩි වන වචනයක් සඳහා රු. 10/-
දිනමිණ + තිනකරන්	රු. 250/-	- වැඩි වන වචනයක් සඳහා රු. 10/-

ඔබගේ ලුහුඬු දැන්වීම අදම අප වෙත **E-Mail** කරන්න...

classified@lakehouse.lk

වැඩි විස්තර සඳහා අමතන්න -

පියුමි - 011 2 429 383 / රමණි - 011 2 429 347

ඇනාගත සිහින සැබෑකර් ගැනීමේ එකම මග

මංගල යෝජනා තීරයයි...

වට පිට

දශක ගණනාවක විශ්වසනීය සේවාව...

සඳහා රු. 560/-

සෑම වචනයක් සඳහාම රු. 25/-

සඳහා සිදු කිරීම අප වෙත ඊ-මේල් කරන්න.

classified@lakehouse.lk

පියුමි - 011 2 429 383 , රමණි - 011 2 429 347 , ගයනි - 011 2 429 343 / 342

වර්ෂ 2021ක් වූ අප්‍රේල් මස 25 වැනි ඉරිදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.